
සවිමත් හෙට දවසකට
විධිමත් සැලැස්මක්



HDFC BANK
The Bank for your Home

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
වාර්ෂික වාර්තාව 2025

පටුන

සමාලෝචනය

වාර්තාව පිළිබඳව 2
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව 6
නිෂ්පාදන කළඹ 8
මූල්‍ය ක්‍රියාකාරිත්වයේ සුවිශේෂීතා 10
පාර්ශවකරුවන්ගේ සබඳතා සහ සම්බන්ධීකරණය 12
විදෙගත් සහ ප්‍රමුඛ කරුණු 19
උපායමාර්ග සහ සම්පත් වෙන්කිරීම 28
ව්‍යාපාරික ආකෘතිය 32
වික්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය 34

නායකත්වය

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය 40
අධ්‍යක්ෂ මණ්ඩලය 44
ආයතනික කළමනාකාරිත්වය 52
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය 55
මධ්‍යම මට්ටමේ කළමනාකාරිත්වය 56
ප්‍රාදේශීය කළමනාකරුවන් 57
ශාඛා කළමනාකරුවන් 58

කළමනාකාරීත්ව සාකච්ඡාව

සාර්ව ආර්ථික පරිසරය සහ නිවාස මූල්‍යකරණය 62
ව්‍යාපාරික ක්ෂේත්‍ර සහ ක්‍රියාකාරිත්වය 65
මූල්‍ය ප්‍රාග්ධනය 69
මානව ප්‍රාග්ධනය 75
සමාජයීය සහ සබඳතා ප්‍රාග්ධනය 85
බුද්ධිමය ප්‍රාග්ධනය 93
නිෂ්පාදිත ප්‍රාග්ධනය 97
ස්වාභාවික ප්‍රාග්ධනය 101

අවදානම් කළමනාකරණය සහ ආයතනික පාලනය

ආයතනික පාලනය 106
ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව 118
අවදානම් කළමනාකරණය 175
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 186
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය - 2025 190
අභ්‍යන්තර පාලනයන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව 192
මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු පිළිබඳ මණ්ඩල වාර්තාව 194
නාම යෝජනා සහ ආයතනික පාලන කමිටු පිළිබඳ මණ්ඩල වාර්තාව 197
අදාළ පාර්ශවීය ගනුදෙනු සමාලෝචන කමිටු පිළිබඳ මණ්ඩල වාර්තාව 200
විගණන කමිටු පිළිබඳ මණ්ඩල වාර්තාව 203
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු පිළිබඳ මණ්ඩල වාර්තාව 205
ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී වගකීම් ප්‍රකාශය - 2025 208

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය 210
2025 ඒකාබද්ධ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ස්වාධීන සහතික කිරීමේ වාර්තාව 211
විගණකාධිපතිවරයාගේ වාර්තාව 213
ආදායම් ප්‍රකාශය 220
විස්තීරණ ආදායම් ප්‍රකාශය 221
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 222
හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 223
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 225
ගිණුම්කරණ ප්‍රතිපත්ති 226
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 236

අතිරේක තොරතුරු

කොටස් පිළිබඳ තොරතුරු 292
වීකතු කළ අගය පිළිබඳ ප්‍රකාශන 295
වසර 10ක සාරාංශය 296
රැස්වීම් පිළිබඳ නිවේදනය 298
ප්‍රොක්සි පත්‍රය / නියෝජිත පත්‍රය 299
ආයතනික තොරතුරු **පසුපස කවරයේ ඇතුළු පිටුව**


සවිමත් හෙට දවසකට
විධිමත් සැලැස්මක්

HDFC බැංකුව 2025 වසරට අවතීර්ණ වන විට, ඇතිව තිබූ ප්‍රගතිය, නිවැරදිභාවය, ස්ථාවරත්වය සහ දිගුකාලීන අරමුණු මත පදනම් වූ මහා සැලැසුමක ප්‍රතිඵලයයි. මුල් කවරයේ නිරූපණය කර ඇති වාස්තුවිද්‍යාත්මක සැලසුමට සමානව, බැංකුවේ මෙම ගමන් මග තුළින් ද පූර්ව සැලසුම් සහගත ව්‍යුහය, විනයගරුක ක්‍රියාකලාපය සහ මෑතකාලීන ස්වභාවික අභියෝග හමුවේ යළි නැගී සිටින ජාතියක් ගොඩනැඟීම උදෙසා වූ කැපවීම මනාව පිළිබිඹු වේ. මෙහෙදී ගන්නා ලද සෑම තීරණයක්ම, නිශ්චිත අරමුණක් සහිතව ගෙන ඇති අතර, සෑම මුලපිරීමක්ම ඔරොත්තු දිය හැකි පරිදි ගොඩනැගූ මූලික සැලැස්මට අනුකූල වේ.

මධ්‍යම සහ ඉහළ ආදායම් ලාභී කාණ්ඩ ඉලක්ක කරගනිමින් නව්‍ය හරිත මූල්‍ය විසඳුම් තුලින් තවදුරටත් සිය සේවා පුළුල් කිරීම, තිරසාරමය සඳහාම වූ ව්‍යාපාරික ආකෘතියක් තවදුරටත් ශක්තිමත් කරයි. ගනුදෙනුකරුවන්, ප්‍රජාවන් සහ සහකරුවන් සමඟ බැංකුව පවත්වන ශක්තිමත් සබඳතා, එහි ස්ථාවර වර්ධනයට සහ ආර්ථික පුනර්ජීවනයට ශක්තියක් වන ප්‍රධාන ව්‍යුහාත්මක කුළුණු බඳුය.

මූල්‍ය සාරවත් බව, තිරසාරභාවය මෙන්ම ජාතික ප්‍රගතිය උදෙසා වූ පැහැදිලි දැක්ම යන මූලධර්මයන් පෙරදැරි කරගනිමින්, වඩාත් සුරක්ෂිත හෙට දවසක් උදෙසා සෞභාග්‍යය සැලසුම් කිරීමටත්, ස්ථාවරත්වය ගොඩනැඟීමටත්, අවශ්‍ය පසුබිම සකස් කිරීමටත් HDFC බැංකුව අඛණ්ඩව කටයුතු කරයි. මෙම ප්‍රගතිශීලී සැලැස්ම ඔස්සේ, කාලාන්තරයක් පවතින අවස්ථා නිර්මාණය කිරීමටත්, සෑම පාර්ශවකරුවෙකුටම සෞභාග්‍යය ළඟා කරගත හැකි අනාගතයක් බිහි කිරීමටත් බැංකුව නිරන්තරයෙන් කැපවී සිටියි.

වාර්තාව පිළිබඳව



2025 වාර්ෂික වාර්තාව - තීරණාත්මක බලපෑමක් ඇති කිරීම

මෙහෙයුම්වල ස්ථාවරත්වය සහ තිරසාරභාවය මගින් මෙහෙයවන ලද මූල්‍ය වර්ෂයක් නිරූපණය කරමින්, අපගේ හයවන වීකාබද්ධ වාර්ෂික වාර්තාව පාර්ශවකරුවන්ට උපායමාර්ගික තීරණ ගැනීම සඳහා අර්ථවත් වටිනාකමක් ලබා දෙයි. ජාත්‍යන්තරව මිණුම්ගත කරන ලද වීකාබද්ධ වාර්තාකරණයේ ප්‍රධාන සංකල්පවලට අනුකූලව ඉදිරිපත් කර ඇති තොරතුරු සමඟ, මෙම වාර්තාව අපගේ මෙහෙයුම් සහ කාර්යසාධනයේ සමස්ත පරාසයම වීකාබද්ධ කරයි.

මෙම වාර්ෂික වාර්තාව මගින් ගවේෂණය කරනු ලබන මූල්‍ය කවුළුව, අප නියාමන සීමාවන්ට මුහුණ දුන් ආකාරය පිළිබඳ පුළුල් දැක්මක් පාර්ශවකරුවන්ට ලබා දෙන අතර, මානව ප්‍රාග්ධන සංවර්ධනය, තිරසාර බැංකු විසඳුම් සංවර්ධනය කිරීම (හරිත ඉතුරුම් නිෂ්පාදන) සහ ස්වාභාවික පරිසරයට කිසිදු හානියක් සිදු නොවන බව සහතික කරමින් සමාජයට ලබා දෙන සහයෝගය ඇතුළු ඇතැම් ප්‍රධාන වටිනාකම් විකතු කිරීම් ඉදිරිපත් කරයි.

වාර්තාකරණ කාලසීමාව සහ සීමාවන්

පාරදෘශ්‍යභාවය සඳහා වූ අපගේ කැපවීම අඛණ්ඩව පවත්වා ගනිමින්, 2025 ජනවාරි 1 සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සිදු වූ සියලුම අදාළ ක්‍රියාකාරකම්, තීරණ සහ ප්‍රතිඵල අප විසින් ආවරණය කර ඇත.

මෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය නොවන තොරතුරු මගින් පාර්ශවකරුවන් සඳහා වටිනාකමක් උත්පාදනය කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි. මේවා ප්‍රාග්ධන වාර්තා හය තුළ ඉදිරිපත් කර ඇති අතර, 2025 වසර තුළ අපගේ මෙහෙයුම් අවධානය සහ චම කාලසීමාවට අදාළ වැදගත් කරුණු ද සන්නිවේදනය කරමින් පුළුල් ලෙස වාර්තා කර ඇත. වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය තොරතුරුවලට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ පරිපූරක තොරතුරු ඇතුළත් වන අතර, ඇතැම් මූල්‍යමය දත්ත ප්‍රාග්ධන වාර්තා හය හරහා ද අනාවරණය කර ඇත.

වාර්තා කළඹ



අපගේ පෙර වාර්ෂික වාර්තා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් අනුකූලතා සහතිකය ලබා ඇති අතර, තොරතුරුවල විශිෂ්ටත්වය සහ හොඳම වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූල වීම වෙනුවෙන් අපගේ 2023 වාර්තාව ලෝකඩ සම්මානයෙන් පිදුම් ලැබීය.

වාර්තාකරණ රාමු

මෙම වාර්තාව වාර්තාකරණය, පාලනය සහ ගණකාධිකරණය යන ක්ෂේත්‍රයන්හි ඇතැම් මූලධර්ම සහ හොඳම භාවිතයන් තවදුරටත් සම්පූර්ණ කරයි. අදාළ වන සියලුම නියාමන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලීමට අමතරව, පහත සඳහන් පරිදි (3 වන තීරුවේ) වාර්තාකරණය සහ තිරසාරභාවය පිළිබඳ ස්වේච්ඡාවෙන් අනුගමනය කරන ලද ඇතැම් ප්‍රමිතීන් සහ හොඳම භාවිතයන් මගින් මෙම වාර්තාව තවදුරටත් ගුණාත්මකව ඉහළ නංවා ඇත.

ඩිජිටල් පිටපත

මෙම වාර්ෂික වාර්තාව අපගේ නිල වෙබ් අඩවිය වන www.hdfc.lk හරහා පරිශීලනය කළ හැක

මූල්‍ය

- ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් (SLFRSs සහ LKASs)
- 1988 අංක 30 දරන බැංකු පනත සහ සංශෝධන
- 2007 අංක 07 දරන සමාගම් පනත
- 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත
- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත
- 2005 අංක 5 දරන මුදල් පනත
- 2018 අංක 19 දරන ජාතික විගණන පනත

ආයතනික පාලනය

- බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික පාලන නියෝග
- ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිසම සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම ප්‍රායෝගික සංග්‍රහය
- කොළඹ කොටස් වෙළඳපොළ විසින් ලැයිස්තුගත සමාගම් සඳහා වන ආයතනික පාලන රීති පිළිබඳ 09 වන වගන්තිය යටතේ සංශෝධිත ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා

මූල්‍ය නොවන වාර්තාකරණය සහ තිරසාරභාවය

- ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ රාමුව
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද වාර්තාකරණ මාර්ගෝපදේශ
- චික්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු

ඒකාබද්ධ වාර්තාකරණ මූලධර්ම

ශ්‍රී ලංකා HDFC බැංකුවේ 2025 වාර්ෂික වාර්තාව, ඒකාබද්ධ වාර්තාකරණය සහ පාරදෘශ්‍යභාවය සඳහා වන අපගේ කැපවීම නිරූපණය කරයි. මෙම වාර්තාව ඒකාබද්ධ වාර්තාකරණ රාමුවේ ප්‍රධාන මූලධර්ම ආවරණය කරන අතර, පහත සඳහන් මූලධර්මයන් තවදුරටත් සම්පූර්ණ කරන වාර්තාවක් ඉදිරිපත් කිරීමට අපගේ උපරිම හැකියාවෙන් අපි කටයුතු කර ඇත්තෙමු.

- **උපායමාර්ගික අවධානය සහ ඉදිරි දැක්ම**
  මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා වන බැංකුවේ මෙහෙවර කෙරෙහි මෙම වාර්තාව කේන්ද්‍රගත වේ. 2025 මූල්‍ය වර්ෂය තුළ අපගේ මෙහෙයුම් සහ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම් මෙහෙයවනු ලැබුවේ මෙම මූලධර්ම මගිනි. තවද, අපි 2026 වසරේ සිට ක්‍රියාත්මක වන උපායමාර්ගික සැලැස්මක් ද සකස් කර ඇත්තෙමු.

- **පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය**
  අප පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වන ආකාරය සහ ඔවුන් වෙනුවෙන් වටිනාකම් නිර්මාණය කර ඇති ආකාරය අපි මෙහිදී පෙන්වා දී ඇත්තෙමු.

- **වැදගත්භාවය**
  මූල්‍ය තිරසාරභාවය, ආයතනික පාලනය, අනුකූලතාව සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය මෙන්ම චික්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සමඟ අනුකූල වීම වැනි 2025 මූල්‍ය වර්ෂයට අදාළ ප්‍රධාන තේමාවන් කෙරෙහි අවධානය යොමු කර ඇත.

- **පැහැදිලි බව සහ සංක්ෂිප්ත බව**
  වාර්තාව නිරීක්ෂණය කරමින් බැංකුවේ කාර්යසාධනය පිළිබඳව පහසුවෙන් මනා අවබෝධයක් ලබා දීම සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු මෙන්ම දත්ත කෙරෙහි ද මෙහිදී බර තබා ඇත.

- **නිවැරදි බව සහ සම්පූර්ණත්වය**
  අභ්‍යන්තර තක්සේරු කිරීම් මගින් මූල්‍ය සහ මූල්‍ය නොවන දත්තවල විශ්වසනීයත්වය සහ අඛණ්ඩතාව අපි සහතික කර ඇත්තෙමු. මූල්‍ය ප්‍රකාශන සඳහා ස්වාධීන විගණකවරයෙකුගෙන් සහ විගණකාධිපතිවරයාගෙන් බාහිර සහතිකකරණය ලබාගෙන ඇත.

- **අනුකූලතාව සහ සැසඳීමේ හැකියාව**
  විශේෂයෙන්ම මූල්‍ය දර්ශක සම්බන්ධයෙන්, කාර්යසාධනය පිළිබඳ සංසන්දනාත්මක තක්සේරුවක් කිරීමට පාඨකයන්ට අවස්ථාව සලසා දෙමින්, වසර කිහිපයක ප්‍රමාණාත්මක දෘශ්‍ය ප්‍රවණතා මෙමගින් සපයයි.

මේ වසරේ අපගේ අවධානය

වාර්ෂික වාර්තාවේ සිදු කර ඇති වැඩිදියුණු කිරීම් පහත පරිදි වේ:

- සමාලෝචනයට භාජනය වන වර්ෂයේ සංශෝධිත මෙහෙයුම් අවධානයට අනුකූලව වැදගත්භාවය පෙළගැස්වීම.
- සමාලෝචිත කාලසීමාව තුළ සකස් කර සංවර්ධනය කරන ලද අපගේ නව උපායමාර්ගික දිශානතිය පිළිබඳ පැහැදිලි දළ විශ්ලේෂණයක් සැපයීම.
- වැදගත්භාවය සහ ප්‍රාග්ධන කළමනාකරණය අතර පවතින සන්නිවේදනය/සම්බන්ධතාව වැඩිදියුණු කිරීම.
- විවිධ ක්‍රියාකාරකම් සහ ප්‍රාග්ධනයන් අතර පවතින අන්‍යෝන්‍ය රඳා පැවැත්ම පෙන්වීම සඳහා පැහැදිලි සබැඳියාවන් සැපයීම.

සහතිකකරණ

නියාමන මාර්ගෝපදේශ සහ හොඳම විගණන භාවිතයන්ට අනුකූල වීම සහතික කරමින්, වාර්ෂික වාර්තාවේ පිටු 220 සිට 290 දක්වා ඇතුළත් මූල්‍ය තොරතුරු විගණකාධිපතිවරයා විසින් විගණනය කර ඇත. මෙම වාර්තාව IIRC (ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය) විසින් ස්ථාපිත කරන ලද රාමුගත මූලධර්මයන්ට අනුකූල වන බවට ඇර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනය විසින් ස්වාධීන සහතිකකරණයක් ලබා දී ඇත.

වාර්තාව පිළිබඳව

අවසාන වාර්තාව සඳහා බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිනිය/සභාපතිවරයාගේ අනුමැතිය ලැබී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සහ විධායක කණ්ඩායම විගණකවරුන්ගෙන් සම්පූර්ණයෙන්ම ස්වාධීන වගකීමක් පවත්වාගෙන යයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශය

ශ්‍රී ලංකා එච්.ඩී.එෆ්.සී. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, මෙම 2025 ඒකාබද්ධ වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය පිළිබඳව පූර්ණ තෘප්තියට පත්ව සිටී. මෙම වාර්ෂික වාර්තාව අදාළ සියලුම ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වන අතර අදාළ මූල්‍ය හා ආයතනික පාලන ප්‍රමිතීන් ආවරණය කරයි.

මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයේ, විධායක නායකත්වයේ සහ ජ්‍යෙෂ්ඨ මෙහෙයුම් කළමනාකාරිත්වයේ මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ සකස් කර ඇති අතර, අභ්‍යන්තර මෙන්ම බාහිර වශයෙන් ද දැඩි පිරික්සුමකට ලක් කර ඇත.

විගණන සහ අවදානම් කමිටු විසින් ලබා දෙන ලද තක්සේරු කිරීම් සහ සහතික කිරීම් සැලකිල්ලට ගැනීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වාර්ෂික වාර්තාව අනුමත කරන අතර, මෙම වාර්තාව ඒකාබද්ධ වාර්තාකරණ රාමුවට සහ නියාමන අවශ්‍යතාවලට, විශේෂයෙන්ම මූල්‍ය ප්‍රකාශන, ආයතනික පාලනය සහ අනුකූලතාවලට අදාළ අවශ්‍යතාවලට අනුකූල වන බව තහවුරු කරයි.

අනාගතය පිළිබඳ ප්‍රකාශ

මෙම සමාලෝචිත වාර්ෂික වාර්තාවේ, අනාගත ක්‍රියාකාරකම් සහ උපායමාර්ග මත පදනම් වූ තොරතුරු, ඇස්තමේන්තු සහ අපේක්ෂාවන් සපයන ප්‍රකාශයන් ඇතුළත් වේ. මෙම අනාගතය පිළිබඳ ප්‍රකාශයන්, අපගේ අනාගත අරමුණු, ක්‍රියාකාරී සැලසුම් සහ මෙහෙයුම් තීරණවල ප්‍රතිඵල මත පදනම් වන බැවින්, අපේක්ෂිත ප්‍රතිඵල වෙනස් වීමට ඉඩ ඇත. තවද, ඕනෑම ව්‍යාපාරික හෝ මූල්‍ය ආයතනයකට පොදු වූ සාර්ව ආර්ථික පරිසරයෙන් එල්ල වන අවදානම් සහ අවිනිශ්චිතතාවලට බැංකුවේ මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් යටත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන උපදෙස්වලට යටත්ව සහ අපගේ ප්‍රධාන මූල්‍ය නිලධාරිවරයාගේ මෙන්ම අවදානම් දෙපාර්තමේන්තුවේ සහ ණය කළමනාකරණ අංශයේ කණ්ඩායම්වල ඒකාබද්ධ අධීක්ෂණය යටතේ අප විසින් සෑම ක්‍රියාකාරී උපායමාර්ගයක්ම ගෙන තිබුණද, ඉදිරි මූල්‍ය වර්ෂය තුළ සහ ඉන් ඔබ්බට අපගේ මෙහෙයුම් සහ කාර්යසාධනය කෙරෙහි බලපෑම් කළ හැකි අවිනිශ්චිතතාවන් තවදුරටත් පවතී. එබැවින්, මෙම වාර්ෂික වාර්තාව කියවන පාඨකයන්ගෙන් අප ඉල්ලා සිටින්නේ බැංකුවේ කාර්යසාධනය ඇගයීමේදී සහ අනාගතය පිළිබඳ ප්‍රකාශයන් අර්ථකථනය කිරීමේදී, බැංකුවේ වත්මන් සහ අනාගත මෙහෙයුම් පරිසරය පිළිබඳව සැලකිලිමත් වන ලෙසයි.

ප්‍රතිපෝෂණ

මෙම වාර්තාව පිළිබඳව ඔබ ලබා දෙන සාධනීය සහ අර්ථවත් ප්‍රතිපෝෂණ අපි බෙහෙවින් අගය කරමු. ඔබගේ අදහස් සහ සාධනීය විවේචන මෙම වාර්තාවේ වටිනාකම තවදුරටත් වැඩිදියුණු කිරීමට සහ ඉහළ නැංවීමට අපට උපකාරී වනු ඇත. කරුණාකර ඔබගේ ඕනෑම අදහසක් හෝ යෝජනාවක් පහත ලිපිනයට යොමු කරන්න:

ප්‍රධාන මූල්‍ය නිලධාරී
අනුර හෙට්ටිආරච්චි මහතා
විද්‍යුත් තැපෑල: anura.h@hdfc.lk
දුරකථන: +94 11 2356802, 2446241, 2447354

වාර්තා සංචාලනය

මෙම වාර්තාවේ විවිධ කොටස් අතර ඇති සම්බන්ධතාවය දැක්වීම සඳහා පහත දැක්වෙන අයිකන (සංකේත) සහ වර්ණ භාවිතා කර ඇත:

ප්‍රාග්ධනය



මූල්‍ය | නිෂ්පාදිත | බුද්ධිමය



මානව | සමාජීය | ස්වාභාවික

පාර්ශවකරුවන්



කොටස්කරුවන් / ආයෝජකයින් | ගනුදෙනුකරුවන් | සේවකයින්




හවුල්කරුවන් සහ සේවා සපයන්නන් | නියාමකයින් (නීති සහ රීති පනවන ආයතන) | ප්‍රජාව සහ පරිසරය



ද්‍රව්‍යමය අංශ

අපේ දැක්ම

"නිරසාර නිවාස සහ ජීවන තත්ත්වයන් සහතික කිරීමේ ප්‍රමුඛතම මූලය සහකරු වීම."





අපේ මෙහෙවර

"නිරසාර ජීවන රටාවක් සඳහා මූලය විසඳුම් සැපයීමට සහ ව්‍යවසායකයින්ට වටිනාකම් එකතු කිරීම් සඳහා සහාය වීමට කැපවීම."



අපේ අගයයන්

සදාචාරාත්මක බව

කැඩිසර බව

අභියෝගවලට සහ බෙරොන්තු දීම

විවිධත්වයට ගරු කිරීම

විනිවිදභාවය



ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව


ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව - පොදු මහජනතාව වෙනුවෙන් මූල්‍යමය සහ සමාජයීය වශයෙන් වගකීම් දරන ආයතනයක්

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ (HDFC බැංකුව) ආයතනික වටිනාකම රැඳී පවතින්නේ සමාජ වගකීම් ඉටු කිරීම මතය. පොදු මහජනතාව, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ අවම පහසුකම් සහිත ජනකොටස් වෙනුවෙන් පෙනී සිටින බැංකුවක් ලෙස, අපගේ ආයතනික දැක්ම ක්‍රියාවට නැංවීම අප සතු විශ්වාසනීය සහ පරම වගකීමකි.

රාජ්‍යයේ ශක්තිය සහ මහජන විශ්වාසය පිටුබලය කොටගත් මෙම බැංකුවේ 51% ක හිමිකාරිත්වය (ප්‍රධාන වශයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා) රජය සතු වන අතර, එය රාජ්‍ය ස්ථාවරත්වයේ සහ පෞද්ගලික අංශයේ ප්‍රගතිශීලී දැක්මක සුවිශේෂී සංකලනයක් දරයි. HDFC බැංකුව කුඩා පරිමාණයේ මෙහෙයුම් ජාලයක් පවත්වාගෙන යමින්, තිරසාර ව්‍යාප්තියක් සහ බිම් මට්ටමේ සබඳතා සහිතව සිය බැංකු සේවා සපයයි.

දශක හතරකට වැඩි කාලයක් පුරා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව නිවාස මූල්‍යකරණය පිළිබඳ විශේෂිත බැංකුවක් ලෙස කටයුතු කරමින්, දහස් සංඛ්‍යාත ජනතාවකගේ නිවාස සිහිනය සැබෑ කර දී ඇත. වසර ගණනාවක් පුරා, කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වීමෙන් ලැබුණු අභාසයත් සමඟ, අඩු සහ මධ්‍යම ආදායම් ලබන ජන කොටස් සඳහා නිවාස මූල්‍ය සපයන්නෙකු ලෙස පැවති සිය මූලික අනන්‍යතාවයෙන් ඔබ්බට ගොස්, සර්වසම්පූර්ණ මූල්‍ය හවුල්කරුවෙකු ලෙස තමන්ව නැවත අර්ථකථනය කර ගැනීමට බැංකුව උත්සාහ කර ඇත.

අද වන විට, බැංකුව රාජ්‍ය අනුග්‍රහය ලත් විශ්වාසනීයත්වයේ සහ පෞද්ගලික අංශයේ ගාමක බලවේගයේ සංකේතයක් ලෙස නැගී සිටින අතර, ජාතික ආර්ථික මාරුවීම් සහ සමාජයීය කැළඹීම් පවතින කාලවලදී පවා නොසැලී සිටීමට සමත් වී ඇත. සිය පුරෝගාමී අර්ථසාධක අරමුදල් ඇපකර මත පදනම් වූ නිවාස ණයවල සිට, විශාල බැංකුවලට ළඟා විය නොහැකි තැන්වල තරඟ කරමින් ජනතාවගේ නිවසටම ගොස් සේවා සැපයීමේ බැංකුකරණ ක්‍රමවේදය දක්වා, ජනතාව කේන්ද්‍ර කරගත් මූල්‍යකරණය පිළිබඳ තමන් සතු ගැඹුරු අවබෝධය උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීමට බැංකුව අඛණ්ඩව කටයුතු කර ඇත.



ආයතනික අනන්‍යතාව

- දැක්ම: තිරසාර නිවාස සහ ජීවන තත්ත්වයන් සහතික කිරීමේ ප්‍රමුඛතම මූල්‍ය හවුල්කරු වීම.
- මෙහෙවර: තිරසාර ජීවන රටාවක් සඳහා මූල්‍ය විසඳුම් ලබා දීම සහ ව්‍යවසායකයින්ට වටිනාකම් එකතු කිරීම සඳහා සහය වීමට කැපවීම.
- මූලික අගයන්: සදාචාරාත්මක බව / කඩිසර බව/නම්‍යශීලී බව සහ ඔරොත්තු දීමේ හැකියාව/විවිධත්වයට ගරු කිරීම /විනිවිදභාවය

ස්ථාවරත්වය

- මූල්‍ය ස්ථාවරත්වය: ෆිච් රේටින්ග්ස් වෙතින් මෙම බැංකුව BB+(lka) ජාතික දිගුකාලීන ශ්‍රේණිගත කිරීමක් ලබා ඇත. එහි නවතම යාවත්කාලීන කිරීම් මඟින් බැංකුවේ ස්ථාවර ඉදිරි දැක්ම තහවුරු කරයි.
- ජාතික පිළිගැනීම: වසර ගණනාවක් පුරා, HDFC බැංකුව අවංකභාවය, නිසි පාලනය මෙන්ම ජනතාව සහ තිරසාර ලාභ පිළිබඳ සැබෑ ලැදියාව වෙනුවෙන් කැප වූ, මහන්සියෙන් උපයාගත් කීර්ති නාමයක් ගොඩනඟා ගෙන ඇත. විවිධ ඇගයීම් සහ සම්මාන හරහා මෙය මනාව පෙන්නුම් කර ඇත.

ළඟාවීම සහ ප්‍රවේශ්‍යතාවය

ගනුදෙනුකරුවන්ට වඩාත් සමීප' බැංකුවක් ලෙස ආඩම්බර වන HDFC බැංකුව, මනාව සමබර වූ සේවා ජාලයක් ඔස්සේ ක්‍රියාත්මක වේ. සාපේක්ෂව කුඩා සේවා ජාලයක් පැවතියද, බැංකුව පරිසරයට හිතකර සහ සාර්ථක භෞතික ක්‍රියාකාරිත්වයක් සහිතව කටයුතු කරයි.

- ශාඛා ජාලය : සියලුම පළාත් ආවරණය වන පරිදි උපායමාර්ගිකව පිහිටුවා ඇති ශාඛා 39ක්.
- ජංගම බැංකුකරණයේ පුරෝගාමීන්: වඩාත්ම දුරස්ථ ප්‍රදේශවල වෙසෙන ගනුදෙනුකරුවන් පවා විධිමත් බැංකු පද්ධතිය සමඟ සම්බන්ධ කර තැබීම සහතික කරමින්, නිවසටම පැමිණ මූල්‍ය සේවා සපයන 45කට අධික (2025 දෙසැම්බර් 31 දිනට) 'පාම්ටොප් බැංකුකරණ' වෘත්තිකයන්ගෙන් සමන්විත කැපවූ කණ්ඩායමක්.
- ඩිජිටල් ඒකාබද්ධතාවය: ආරක්ෂිත ඉතිරිකිරීම් සහ ණය කළමනාකරණය සඳහා 24/7 ප්‍රවේශය ලබා දෙන, අඛණ්ඩව ව්‍යාප්ත වන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර යන්ත්‍ර සහ ඩිජිටල් වේදිකා ජාලයක්.

මෑතකදී ලැබූ සම්මාන සහ ඇගයීම්





- ශ්‍රී ලංකාවේ ප්‍රථම සමාජ බැඳුම්කර නිකුතුව සඳහා ලබා දුන් සහයෝගය වෙනුවෙන් ලැබූ ඇගයීම



- TAGS සම්මාන උළෙල (2024): මූල්‍ය වාර්තාකරණයේ විනිවිදභාවය සහ විශිෂ්ටත්වය වෙනුවෙන් වන අනුකූලතා සම්මානය හිමි කර ගැනීම.
- ජාතික ව්‍යාපාරික විශිෂ්ටතා සම්මාන උළෙල: බැංකු අංශයේ කුසලතා සම්මාන ජයග්‍රාහකයා.

HDFC බැංකුව සුවිශේෂී වන්නේ ඇයි?

බැංකුවේ අනන්‍යතාවය නිර්වචනය කරන නිර්ණායක මැනිය හැක්කේ එහි ශේෂ පත්‍රයේ ඇති සංඛ්‍යාලේඛනවලින් පමණක් නොවේ. විය මූල්‍යමය වශයෙන් සවිබල ගන්වා ඇති දහස් සංඛ්‍යාත ජනතාවගේ බලාපොරොත්තු සහ අපේක්ෂාවන් තුළද අන්තර්ගත වේ.

මේ දක්වා බැංකුව දිවයින පුරා ගනුදෙනුකරුවන් 500,000 කට අධික සංඛ්‍යාවකට සේවා සපයා ඇති අතර, එහි සමස්ත ණය කළඹෙන් 70% කට වඩා වෙන් කර ඇත්තේ නිවාස මූල්‍යකරණය වෙනුවෙනි.

අංගය	HDFC බැංකුවේ ශක්තීන්
විශේෂඥතාවය	සමස්ත ණය කළඹෙන් 70% කට වඩා නිවාස සහ ගෘහස්ථ ස්ථාවරත්වය වෙනුවෙන් වෙන් කර තිබීම.
වෙළෙඳපොළ පිවිසීම	පළාත් මට්ටමින් ක්‍රියාත්මක වන ශාඛා 39ක් සහ නිවසටම පැමිණ සේවා සපයන බැංකුකරණ වෘත්තිකයන්.
ආයතනික විශ්වාසය	ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන හවුල්කරුවෙකු වීම.
තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා කැපවීම	ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ තිරසාර බැංකුකරණ මූලධර්මවලට අත්සන් තබා ඇති අතර, හරිත ණය, ඉතුරුම් සහ පරිසර හිතකාමී ඉදිකිරීම් ප්‍රවර්ධනය කිරීම.

HDFC ණය සහ තැන්පතු කළඹ පිළිබඳ දළ විශ්ලේෂණය

කාණ්ඩය	සුවිශේෂී නිෂ්පාදන
නිවාස ණය	කැදැල්ල නිවාස ණය (පාරිභෝගික අවශ්‍යතාවයට අනුව සකස් කළ මූල්‍ය පහසුකම්), ශ්‍රම උදාන (අර්ථසාධක අරමුදල් ඇපකර මත පදනම් වූ ණය).
ඉතුරුම් සැලසුම්	HDFC ප්‍රතිලාභ (දෛනික බැංකුකරණය), HDFC ස්මාර්ට් ගෝල්ස් (Smart Goals), HDFC සැලරි සේවර් (Salary Saver), HDFC සෙට් ෆෝ ලයිෆ් (Set For Life), ගෝ ග්‍රීන් ඉතුරුම් (Go Green Savings).
ආයෝජන	HDFC ස්ථාවර තැන්පතු, විශ්‍රාම උදාන (ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා), HDFC මැක්ස් , HDFC ග්‍රීන් වෙල්ත් - (තිරසාර ස්ථාවර තැන්පතු).
දරුවන්ගේ අනාගතය	HDFC තිළිණ, තිළිණ රැකවරණ (සහතික කළ ආයෝජන සැලසුම්), HDFC අරුම්බු (Arumbu).
ලීසිං සහ සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර	HDFC ලීසිං, සුපර් ඩ්‍රාෆ්ට් (Super Draft), සහ ආයතනික සංවර්ධන ණය යෝජනා ක්‍රම
ජීවන රථා	සිරිසර නිවාස ණය (ගෘහ භාණ්ඩ සහ විදුලි උපකරණ මිලදී ගැනීමට) සහ HDFC අධ්‍යාපන ණය



HDFC පාම්ටොප් සමඟින් ඔබේ නිවසටම පැමිණෙන බැංකු සේවාව අත්විඳින්න - අපගේ ජංගම සේවා ව්‍යාප්තිය

උපායමාර්ගික ඉදිරි දැක්ම

බැංකුවේ අනාගත ස්ථාවරත්වය ඉහළ නැංවීම සහ දිගුකාලීන පාර්ශවකරුවන්ගේ උනන්දුව සහ සුරක්ෂිතභාවය සහතික කිරීමේ පියවරක් ලෙස, HDFC බැංකුවේ 51% ක (රාජ්‍ය අනුග්‍රහය ලත්) කොටස් ප්‍රමාණය ලංකා බැංකුව වෙත පැවරීමට රජය අනුමැතිය ලබා දී ඇත. මෙය මෙරට විශාලතම රාජ්‍ය බැංකුවේ උපායමාර්ගික අනුබද්ධිත ආයතනයක් ලෙස HDFC බැංකුවේ නව ගමනක ආරම්භය සනිටුහන් කරනු ඇත.

අංගය	ගනුදෙනුවෙන් පසු අපේක්ෂිත තත්ත්වය
මෙහෙයුම් තත්ත්වය	HDFC බැංකුව ලංකා බැංකුවේ විශේෂිත අනුබද්ධිත ආයතනයක් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක වීමට අපේක්ෂා කරන අතර, ලංකා බැංකුව සතු දැවැන්ත සම්පත් පදනමෙන් ප්‍රතිලාභ ලබන අතරම, සිය මූලික අවධානය වූ නිවාස මූල්‍යකරණයෙහිම අඛණ්ඩව නිරත වනු ඇත.
ප්‍රාග්ධන ප්‍රමාණවත්තාවය	මෙම ඒකාබද්ධ කිරීම සඳහා මූලිකම හේතුව වූයේ අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට HDFC බැංකුව මුහුණ දුන් අභියෝගයන්ය. ලංකා බැංකුව සමඟ ඒකාබද්ධ වීම මඟින් බැංකුවට ක්ෂණික ප්‍රාග්ධන ආරක්ෂණ ජාලයක් හිමි වේ.
තැන්පතු බලමුලු ගැන්වීම	ව්‍යාපාරික ආකෘතියේ තිරසාරභාවය හේතුවෙන් මීට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් HDFC බැංකුවේ තැන්පතු ලබා ගැනීමේ හැකියාව සීමා කර තිබුණද, "ලංකා බැංකු සමූහය" යටතේ තැන්පතු රැස් කිරීමේ හැකියාව තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නිෂ්පාදන කළඹ

නිෂ්පාදන කළඹ පිළිබඳ සමාලෝචනය

ඓතිහාසික වශයෙන් නිවාස පනත මඟින් පාලනය වූ මෙම බැංකුව ස්ථාපිත කරන ලද්දේ රටේ නිවාස අවශ්‍යතා සඳහා සහය වීම පිණිසය. අද වන විට, සීමිත මූල්‍ය ප්‍රවේශයක් සහිත පුද්ගලයන් සහ සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සවිබල ගැන්වීම අරමුණු කරගනිමින්, අපගේ නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය වූ ණය සහ තැන්පතු නිෂ්පාදන එකතුවක් දක්වා පරිණාමය වී ඇත. අපගේ ප්‍රධාන පාරිභෝගික පදනම මූලික වශයෙන් සමන්විත වන්නේ අඩු සහ මධ්‍යම ආදායම් ලබන පුද්ගලයන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගෙනි. ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය කුමක් වුවද, අප ඔවුන්ට සාධාරණ ලෙස සේවා සපයමු. අපගේ මුළු ණය කළඹ පුරාම ඇතුළත් කරගත් මූල්‍ය සහයෝගයක් සහතික කරමින්, එක් එක් ගනුදෙනුකරුවන්ගේ සුවිශේෂී මූල්‍ය හැකියාවන්ට ගැලපෙන පරිදි සකස් කරන ලද නම්‍යශීලී ණය පියවීම් සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ විකල්ප අප පිරිනමන්නෙමු.

විශේෂඥතාවයන් සහ විවිධාංගීකරණය

නිවාස ආශ්‍රිත උකස් ණය සහ අර්ථසාධක අරමුදල් ඇපකර මත පදනම් වූ ණය අපගේ මෙහෙවරෙහි ප්‍රධානතම අංග ලෙස පවතින අතරම, ඉහළ ඉල්ලුමක් පවතින අනෙකුත් මූල්‍ය විසඳුම් වෙතද අප උපායමාර්ගිකව ව්‍යාප්ත වී ඇත. අපගේ වර්ධනය වන ණය කළඹට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- රන් ණය
- සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ ආයතනික සේවාදායකයන් සඳහා වන සංවර්ධන ණය
- ජීවන රථා සහ අධ්‍යාපන ණය
- ලීසිං පහසුකම්

පුළුල් පරාසයක මූල්‍ය අවශ්‍යතාවලට අනුග්‍රහය දක්වමින්, සිල්ලර සහ ආයතනික ගනුදෙනුකරුවන්යන දෙපාර්ශවයටම අවශ්‍ය විස්තීර්ණ තැන්පතු නිෂ්පාදන පෙළක්ද අප සපයන්නෙමු.

සේවක අර්ථසාධක අරමුදල ඇපකරයක් ලෙස තබා ගනිමින් නිවාස ණය පිරිනැමීමට අවසර ලත් බලපත්‍රලාභී විශේෂිත බැංකු හතරෙන් එකක් ලෙස, නිවාස ණය සඳහා පවතින ඉහළ යන ඉල්ලුම සපුරාලීමේදී අපි ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරමු. මෙම ණය ගනුදෙනුකරුවන්ගේ අර්ථසාධක අරමුදල් ශේෂයේ සුරැකුම මත ලබා දෙන බැවින්, එය ඇපකරයක් ලෙස ක්‍රියා කරන අතර පාරිභෝගිකයා මෙන්ම බැංකුව යන දෙපාර්ශවයේම ණය පැහැර හැරීමේ අවදානම අවම කරයි. තවද, සේවක අර්ථසාධක අරමුදල මඟින් හිඟ මුදල් වාර්ෂිකව ප්‍රතිපූරණය කරනු ලබන අතර, එමඟින් ණය අවදානම ඵලදායී ලෙස කළමනාකරණය කිරීමටත්, මෙම අංශය තුළ අක්‍රීය ණය මට්ටම අඩු මට්ටමක පවත්වා ගැනීමටත් අපට හැකියාව ලැබී ඇත.

ණය ප්‍රතිපත්තිය

අපගේ ණය දීමේ ප්‍රවේශය කේන්ද්‍රගත වී ඇත්තේ එක් එක් ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය තත්ත්වය, ජීවනෝපාය සහ ජීවන රටාව වටහා ගැනීම මතය. නිවාස ණය, සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායක ණය, රන් ණය, ලීසිං, අධ්‍යාපන මූල්‍යකරණය සහ අනෙකුත් නිශ්චිත අවශ්‍යතා සඳහා වන නිෂ්පාදන ඇතුළත් මනාව ව්‍යුහගත, නම්‍යශීලී මූල්‍ය විසඳුම් පිරිනැමීමට මෙය අපට මග පාදයි. අපගේ නිෂ්පාදන පාරිභෝගිකයන්ගේ සැබෑ ජීවන තත්ත්වයන්ට අනුකූලව හැඩගැස්වීම සහතික කරමින්, සැමට විවෘත මූල්‍ය සම්ප්‍රවේශයක් වෙනුවෙන් අප කැපවී සිටින්නෙමු.

ණය නිෂ්පාදන

කැදැල්ල

දේපළෙහි මූලික උකස මත පදනම් වූ නිවාස ණය යෝජනා ක්‍රමය.

ශ්‍රම උදාන

සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයින් සඳහා, ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ශේෂයේ ඇපකරය මත ලබාදෙන නිවාස ණය යෝජනා ක්‍රමය.

අධ්‍යාපන ණය

දේපළෙහි මූලික උකස මත උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා ලබාදෙන ණය යෝජනා ක්‍රමය.

ආයතනික සහ සංවර්ධන මූල්‍යකරණය

සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආයතනික අංශයට සහය වීම සඳහා වන සුවිශේෂී ණය යෝජනා ක්‍රම.

රන් ණය

ක්ෂණික මූල්‍ය අවශ්‍යතා සඳහා රන් භාණ්ඩවල වටිනාකමට එරෙහිව ලබාදෙන කඩිනම් ණය පහසුකම්.

HDFC **හරිත පුද්ගලික ණය**

පරිසර හිතකාමී ජීවන රටාවක් සඳහා ලබාදෙන තිරසාර ණය පහසුකමකි.

ලීසිං

පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා වන වාහන ලීසිං යෝජනා ක්‍රමය.

කෘෂි ලීසිං

කෘෂිකාර්මික කටයුතු සඳහාම වෙන්වූ සුවිශේෂී ලීසිං පහසුකමකි.

එඩියු ලීසිං (Edu Leasing)

අධ්‍යාපනික අවශ්‍යතා සඳහා මූල්‍ය පහසුකම් සපයන ලීසිං ක්‍රමයකි.

බිස් ලීසිං (Biz Leasing)

ව්‍යාපාරික අරමුණු සඳහා ලබාදෙන ලීසිං පහසුකමකි.

හෝම් ලීසිං (Home Leasing)

නිවාස මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් වන ජීවන රථා ලීසිං පහසුකමකි.

v2v **ලීසිං**

වාහන නවීකරණය කිරීම සඳහා වන පහසු සහ නවීකරණය වූ ලීසිං විසඳුමකි.

HDFC **සුපර් ඩ්‍රාෆ්ට්**

වාහන මූල්‍යකරණය සඳහා වන නම්‍යශීලී ලීසිං විසඳුමකි.

ඉතුරුම් සහ ආයෝජන නිෂ්පාදන

ප්‍රතිලාභ

ඉතුරුම් කිරීමේ නියම ප්‍රතිලාභ හඳුනාගැනීමට.

තිළිණ

දරුවන් සඳහාම වෙන්වූ, ඔවුන්ගේ අනන්‍යතාවයට ගැළපෙන ඉතුරුම් ගිණුමක්.

HDFC **සැලරි සේවර්**

මාසික ආදායම් ලබන්නන් සඳහාම විශේෂයෙන් සකස් කළ ඉතුරුම් විසඳුමක්.

ස්මාර්ට් ගෝල්ස්

ඔබේ කෙටි කාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා කදිම ඉතුරුම් නිෂ්පාදනයක්.

HDFC **ගෝ ග්‍රීන්**

වඩාත් හරිතවත් අනාගතයක් වෙනුවෙන් දායක විය හැකි ඉතුරුම් සැලසුමක්.

HDFC **ග්‍රීන් වෙල්ත්**

පරිසර හිතකාමී අරමුණු වෙනුවෙන් සහයෝගය දක්වන අතරම, ආකර්ෂණීය ප්‍රතිලාභ උපයා ගත හැකි සුවිශේෂී ආයෝජන සැලසුමක්.

සෙට් ෆෝ ලයිෆ්

තරුණ පරපුරට තමන්ගේ අනාගතය සැලසුම් කරගැනීමට උපකාරී වන සුවිශේෂී ධන වර්ධන සැලසුම් ක්‍රමයකි.

විශ්‍රාම රැකවරණ

විශ්වාසදායී මූල්‍ය ස්ථාවරත්වයක් සමඟින් ඔබේ අනාගතය සුරක්ෂිත කරගැනීමට.

අරුම්බු **තිළිණ රැකවරණ**

දරුවන්ගේ අනාගත සුරක්ෂිතභාවය වෙනුවෙන් වූ ආයෝජන සැලසුමක්

තැන්පතු නිෂ්පාදන

ස්ථාවර තැන්පතු

සුරක්ෂිත සහ ඉහළ ලාභදායී ආයෝජන අවස්ථා.

HDFC **මැක්ස් තැන්පතු**

උපරිම ප්‍රතිලාභ ලබාදෙන, ඔබේ අවශ්‍යතාවයට අනුව සකස් කරගත හැකි කාලීන තැන්පතු

විශ්‍රාම උදාන

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ ස්ථාවර තැන්පතු සැලසුමක්.

මුළු තැන්පතු කළඹ

රු.මි. 52,005

ස්ථාවර තැන්පතු


රු.මි. 43,165


ඉතුරුම්


රු.මි. 8,840


මූල්‍ය කාර්යසාධන විශ්ලේෂිතතා

	2025	2024	වෙනස
	(රු. මිලියන)	(රු. මිලියන)	%
වසර සඳහා			
ආදායම	**7,730**	8,507	(9)
බදු පෙර ලාභය	**329**	412	(20)
බදු සඳහා ප්‍රතිපාදන	**422**	603	(30)
බදු පසු ලාභය	**(93)**	-191	(51)
රජයට ගෙවූ ආදායම්/බදු	**422**	606	(30)
දළ ලාභාංශ			
වසර අවසානයේදී			
කොටස් හිමියන්ගේ අරමුදල	**7,552**	7,713	(2)
ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු තැන්පතු	**50,569**	52,005	(3)
ගනුදෙනුකරුවන්ට ලබාදුන් දළ ණය සහ අත්තිකාරම්	**37,457**	42,658	(12)
මුළු වත්කම්	**63,736**	65,443	(3)
සාමාන්‍ය කොටසක් වෙනුවෙන් තොරතුරු			
ඉපයීම්- මූලික (රු)	**(1.44)**	-2.95	(51)
මූල්‍ය අනුපාත			
සාමාන්‍ය කොටස් හිමියන්ගේ අරමුදල මත ප්‍රතිලාභය (%)	**(1.22)**	-2.43	(50)
සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය (%)	**(0.14)**	-0.29	(51)
මුළු වත්කම්වලට කොටස් හිමියන්ගේ හිමිකම් (%)	**11.85**	11.79	1
ව්‍යවස්ථාපිත අනුපාත			
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (%)	**217.00**	223.00	(3)
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (%)	**104.00**	128.00	(16)
ණය අනුපාතය (%)	**11.34**	11.90	(2)
පොදු කොටස් හිමිකම් පළමු පෙළ - අවම අවශ්‍යතාවය 7.00%	**32.08%**	32.53%	(1)
මුළු සමස්ත පළමු මට්ටමේ ප්‍රාග්ධනය - අවම අවශ්‍යතාවය 8.50%	**33.25%**	33.66%	(1)
මුළු ප්‍රාග්ධනය - අවම අවශ්‍යතාවය 12.50%	**34.20%**	34.65%	(1)
වෙනත් තොරතුරු			
ශාඛා	**39**	39	-
සේවකයින් (කාර්ය මණ්ඩල සංඛ්‍යාව)	**453**	494	(8)
ශ්‍රේණිගත කිරීම - ෆිච්/ලංකා රේටින්	**BB+(lka) Watch Positive**	BB+(lka) Stable	


ණය, අත්තිකාරම් සහ තැන්පතු
(රු.මි)
ණය අත්තිකාරම්
තැන්පතු
80,000
70,000
60,000
50,000
40,000
30,000
20,000
10,000
0
41,216
42,504
41,192
47,947
41,837
49,813
42,630
50,245
67,733
53,613
65,443
52,005
63,754
50,569
2019
2020
2021
2022
2023
2024
2025


බදු වලට පෙර සහ පසු ලාභය
(රු.මි)
බදුකරණයට පෙර ලාභය
බදුකරණයෙන් පසු ලාභය
3,000
2,500
2,000
1,500
1,000
500
0
(500)
919
564
1,244
476
1,381
708
1,199
547
612
326
2,650
1,302
412
(191)
329
(93)
2018
2019
2020
2021
2022
2023
2024
2025


මුළු වත්කම්
(රු.මි)
80,000
60,000
40,000
20,000
0
49,724
49,285
55,955
61,030
62,964
62,882
67,733
65,443
63,754
2017
2018
2019
2020
2021
2022
2023
2024
2025


ආදායම
(රු.මි)
දළ ආදායම
පොලී ආදායම
16,000
12,000
8,000
4,000
0
6,978
6,614
7,120
6,679
8,090
7,683
7,856
7,457
7,004
6,612
8,878
8,425
14,329
11,195
8,507
8,170
7,737
7,436
2017
2018
2019
2020
2021
2022
2023
2024
2025

පාර්ශ්වකරුවන්ගේ සබඳතා සහ සහභාගිත්වය

නිවාස මූල්‍යකරණය සඳහා විශේෂඥතාවක් දක්වන සීමිත බැංකු කිහිපය අතරින් එකක් ලෙස, HDFC බැංකුව අපේ රට සහ ආර්ථිකය කෙරෙහි දැඩි වගකීම් සහගත හැඟීමකින් යුතුව කටයුතු කරයි. අපගේ වගකීම පවතින්නේ මූල්‍යමය වටිනාකමක් නිර්මාණය කිරීම සහ අපගේ ගනුදෙනුකරුවන් මෙන්ම සමස්ත සමාජයම මූල්‍යමය වශයෙන් සබල ගැන්වීම මතය. එබැවින්, අපගේ සබඳතා ගොඩනැඟී ඇත්තේ එක් එක් පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම් වෙත මූල්‍යමය වටිනාකමක් ලබා දීමේ පදනම මතය.

අපි විවැනි වටිනාකම් ලබා දෙන සහ සන්නිවේදනය කරන ආකාරය විවිධ නියැලීමේ මාර්ග මත රඳා පවතී. ජනතාව කේන්ද්‍ර කරගත් සහ ජනතාවට මුල් තැන දෙන බැංකු ආයතනයක් ලෙස අපගේ හැකියාවන් කෙරෙහි විශ්වාසය තැබීමට මෙම මාර්ග අපගේ පාර්ශ්වකරුවන්ට ඉවහල් වේ.



කොටස් හිමියන් / ආයෝජකයින්

- 51% බහුතර කොටස් හිමිකාරිත්වය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- 49% මහජන තනි කොටස් හිමියන්



ගනුදෙනුකරුවන්

- මුළු තැන්පත්කරුවන් සංඛ්‍යාව 514,533
- ණයකරුවන්/ණය ලබාගත් අය 59,594
- 2025 වසරේ නව තැන්පත්කරුවන් 13,908
- 2025 වසරේ නව ණයකරුවන් 6,790



සේවකයින්

- 453 (ස්ථිර සේවකයින් 446, පරිවාස කාල සීමාවේ පසුවන්නන් 5, ගිවිසුම්ගත සේවකයින් 2)



හවුල්කරුවන් සහ සේවා සපයන්නන්

- සේවා සපයන්නන් සහ සැපයුම්කරුවන්-186



නියාමකයින්

- ශ්‍රී ලංකා මහ බැංකුව
- රජය
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- මුදල් හා ආර්ථික අමාත්‍යාංශය
- කොළඹ කොටස් වෙළඳපොළ
- ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය



ප්‍රජාව සහ පරිසරය

- මහජනතාව, මූල්‍ය ප්‍රජාව සහ පරිසරය

සබඳතාවල වැදගත්කම සහ ගුණාත්මකභාවය

පාර්ශ්වකරුවන්	කොටස් හිමියන් සහ ආයෝජකයින්	ගනුදෙනුකරුවන්	සේවකයින්	හවුල්කරුවන්	නියාමකයින්	ප්‍රජාව
වැදගත්කමට හේතුව - බැංකුවට පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන වටිනාකම	මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රාග්ධනය සැපයීමට ඇති හැකියාව.	ගනුදෙනුකරුවන්ගේ නිවාස අවශ්‍යතා සපුරාලීම HDFC බැංකුවේ ප්‍රධාන අරමුණයි. ඒය ව්‍යාපාරික වර්ධනය ළඟා කර ගැනීමට උපකාරී වන අතර අපගේ ව්‍යාප්ත වීමට ඇති ප්‍රධානතම හේතුවයි. ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා මත පදනම්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම් සහ නව මූල්‍ය ක්‍රමවේද හඳුන්වා දී ඇත.	බැංකුවේ කාර්යයන් වඩාත් පහසු කරවන සේවාවන් ලබා ගැනීම සඳහා. අඛණ්ඩ සහ ඒකාබද්ධ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමෙහිලා කේන්ද්‍රීය වේ. ඔවුන්ගේ දායකත්වය බැංකුවේ පැවැත්ම සහ වර්ධනය තහවුරු කරයි.	බැංකුවේ කාර්යයන් වඩාත් පහසු කරවන සේවාවන් ලබා ගැනීම සඳහා.	අනුකූලතාවය මඟින් මෙහෙයුම් සිදු කිරීම සඳහා වන වලංගු බලපත්‍රය සහතික කෙරේ.	මෙහෙයුම් සිදු කිරීම සඳහා සමාජීය අවසරය (පිළිගැනීම)

සහභාගිත්ව ක්‍රියාවලිය

අපගේ පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය කිරීමේදී, අපි පහත දැක්වෙන සහභාගිත්ව ක්‍රියාවලිය අනුගමනය කර ඇත්තෙමු. බැංකුව විසින් තමන්ගේ පාර්ශ්වකරුවන් කවුදැයි තීරණය කර ඉහත වර්ගීකරණය පවත්වාගෙන යනු ලබන අතර, සමාලෝචනයට භාජනය වන මෙම වසර තුළ කිසිදු නව පාර්ශ්වකරුවෙකු හඳුන්වා දී හෝ හඳුනාගෙන නොමැත.





කොටස් හිමියන්

අදාළ ප්‍රාග්ධනයන්



අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



ජාතික නිවාස සංවර්ධන අධිකාරිය) සතු බහුතර කොටස් හිමිකාරිත්වය සමඟින්, බැංකුවේ ප්‍රධාන කොටස් හිමි පාර්ශ්වය වන්නේ ශ්‍රී ලංකා රජයයි. කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගමක් ලෙස, මෙහි ඉතිරි කොටස් පෞද්ගලික ආයෝජකයින් සතු වන බැවින් මෙය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් බවට පත් වේ.

මෙම හිමිකාරිත්වය හේතුවෙන්, ආයෝජකයින්ගේ ආයෝජන සුරක්ෂිත කිරීම සහ රජය ඇතුළු අපගේ ආයෝජකයින් වෙත ස්ථාවර ප්‍රතිලාභ ලබා දීම කෙරෙහි අපගේ අවධානය යොමු කර ඇත. එබැවින්, මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම අපගේ ප්‍රධානතම අරමුණක් ලෙස පවතී. කෙසේ වෙතත්, පාර්ලිමේන්තු පනතක් මඟින් පිහිටුවන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස, නිවාස අවශ්‍යතා වෙනුවෙන් - විශේෂයෙන්ම අඩු මූල්‍ය හැකියාවන් ඇති අය සඳහා - සහනදායී ණය ක්‍රම ලබා දීමට රට කෙරෙහි වූ පුළුල් කැපවීමක් අප සතුය.

අකර්මණ්‍ය ණය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් (මින් වැඩි ප්‍රතිශතයක් සේවක අර්ථසාධක අරමුදල් ඇපකර මත ලබාගත් ණය වේ), අපගේ ප්‍රමුඛතාවන් මුළුමනින්ම බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය සහ අනාගත උන්නතිය තහවුරු කිරීම වෙත යොමු කර ඇත.

ප්‍රධාන අපේක්ෂාවන් සහ අපගේ ප්‍රතිචාර

ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අවධානය	2025 වසරේ අපගේ ප්‍රතිචාරය	
ප්‍රතිලාභ ලබාදීම		
වත්කම්වල ගුණාත්මකභාවය සහ අකර්මණ්‍ය ණය	අපි අපගේ ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය තීව්‍ර කර ඇත්තෙමු. එමෙන්ම, බැංකුවේ ප්‍රාග්ධනය සුරක්ෂිත කරන අතරතුර ණය තවදුරටත් පැහැර හැරීම අවම කර ගැනීම සඳහා දැඩි ණය තත්ත්ව ඇගයීම් උපකාරී වේ.	බැංකුවේ අවදානම් තත්ත්වය වැඩිදියුණු කිරීම මඟින් ශේෂ පත්‍රයේ වර්ධනයක් සඳහා මඟ පාදයි.
ආදායම් විවිධාංගීකරණය	රන් අත්තිකාරම් (රන් ණය), ලීසිං සහ හරිත පුද්ගලික ණය ඇතුළු ඉහළ ප්‍රතිලාභ ලැබෙන පුද්ගලික මූල්‍ය නිෂ්පාදන වෙත ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම.	මෙය සේවක අර්ථසාධක අරමුදල් ඇපකර මත ලබාදෙන ණය මත පමණක් යැපීම අඩු කරන අතර පොලී ආන්තිකය ඉහළ නංවයි.
නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා	අපගේ අවදානම් බරිත වත්කම් ප්‍රශස්ත කිරීම සහ රන් අත්තිකාරම් වැනි පහසුවෙන් අයකර ගත හැකි සිල්ලර නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු කිරීම මඟින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවලට වඩා බෙහෙවින් ඉහළ මට්ටමක පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතයක් පවත්වා ගෙන යන ලදී.	කෙටි කාලීන මූල්‍ය බැඳීම් සඳහා ද්‍රවශීලතාවය සුරක්ෂිත කිරීම සිදු කරයි.

අදාළ වැදගත් කරුණු

T1, T2, T3, T4, T5, T8, T13

අප සම්බන්ධ වන ආකාරය



පාර්ශ්වකරුවන්ගේ සබඳතා සහ සහභාගිත්වය

ගනුදෙනුකරුවන්

සම්බන්ධිත ප්‍රාග්ධනයන්

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



අපගේ ගනුදෙනුකරුවන් විවිධ මූල්‍ය පසුබිම්වලින් පැමිණෙන අතර, ඔවුන්ගෙන් බහුතරය විධිමත් ණය පහසුකම් ලබා ගැනීමට සීමිත අවස්ථා ඇති පුද්ගලයින් ලෙස සැලකේ. මොවුන් මධ්‍යම සහ අඩු ආදායම්ලාභී පරාසයන්ට අයත් වන පුද්ගලයින් වන අතර, බැංකුවේ ආදායම් විවිධාංගීකරණය කිරීමේ සැලසුම්වලට අනුකූලව වර්ධනය වෙමින් පවතින ඉහළ ආදායම් ලබන පුද්ගලයින්ද මීට ඇතුළත් වේ.

ප්‍රධාන අපේක්ෂාවන් සහ අපගේ ප්‍රතිචාර

ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අවධානය	2025 වසරේ අපගේ ප්‍රතිචාරය
සුරක්ෂිත, ඉහළ ප්‍රතිලාභ	අපි ආකර්ෂණීය වෙළඳපොළ පොලී අනුපාත ලබා දෙන අතර, විනිවිදභාවයෙන් යුතු ප්‍රතිලාභ කළමනාකරණයක් සහතික කිරීම සඳහා අපගේ ආයෝජන කළඹ ප්‍රශස්ත කර ඇත්තෙමු.
මූල්‍ය ස්ථාවරත්වය	ණය ගෙවීමේ හැකියාව සහතික කරමින්, අපි ශක්තිමත් පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතයක් පවත්වා ගෙන ගොස් ඇත.
යහපත් කීර්තිනාමය	ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතන 100 අතරින් එකක් ලෙස (LMD 100 ශ්‍රේණිගත කිරීම්වලට අනුව) අභිමානයෙන් යුතුව පිළිගැනීමට ලක්ව සිටිමු.
පහසු සේවාවන්	නිවසටම පැමිණ සේවා සපයන බැංකුකරණය සේවා සහ HDFC වෙබ් අඩවිය මෙන්ම ජංගම දුරකථන යෙදුම් ඇතුළත් ඩිජිටල් වේදිකා හරහා අපි සේවාවන් ලබා ගැනීමේ ප්‍රවේශයන් විවිධාංගීකරණය කර ඇත්තෙමු.

ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අවධානය	2025 වසරේ අපගේ ප්‍රතිචාරය
විවිධාංගීකරණය වූ නිෂ්පාදන	විවිධ ඉතුරුම් අරමුණු වෙනුවෙන් වූ HDFC ග්‍රීන් වෙල්ත්, HDFC ගෝ ග්‍රීන් සහ ප්‍රතිලාභ වැනි විශේෂිත නිෂ්පාදනද, විවිධ ණය අවශ්‍යතා වෙනුවෙන් කැදැල්ල (දේපළ උකස් ණය), ශ්‍රම උදාන (සේවක අර්ථසාධක අරමුදල ඇපකර මත නිවාස ණය) සහ හරිත ලීසිං ඇතුළත් HDFC ලීසිං වැනි නිෂ්පාදනද අපගේ නිෂ්පාදන එකතුවට ඇතුළත් වේ.
සහනදායී අරමුදල්/ණය	තිරසාර ලෙස ණය ලබා ගැනීම සහතික කිරීම සඳහා, පුද්ගල මූල්‍ය හැකියාවන් මත පදනම් වූ සහනදායී සහ පහසු ලෙස ණය පියවීමේ සැලසුම් අපි ලබා දෙන්නෙමු.

අදාළ වැදගත් කරුණු

T1, T2, T3, T4, T5, T6, T8, T9, T10, T11, T12, T13

අප සම්බන්ධ වන ආකාරය

ශාඛා වෙත පැමිණීම	ප්‍රධාන කාර්යාලීය රැස්වීම්	ඇමතුම් මධ්‍යස්ථානය
විද්‍යුත් තැපෑල සහ ජංගම දුරකථන සන්නිවේදනය	නිවසටම පැමිණ සේවා සපයන බැංකුකරණය	එළිමහන් ප්‍රවර්ධන කටයුතු

සේවකයින්

අදාළ ප්‍රාග්ධනයන්

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



HDFC බැංකුවේ කණ්ඩායම අප දකින්නේ හුදෙක් අපගේ සේවකයින් ලෙස පමණක් නොවේ; ඔවුන් අපගේ ස්ථාවරත්වය, වර්ධනය සහ ඔරොත්තු දීමේ හැකියාවේ ගම්‍යමාන බලවේගයන් වන අතර ජාතිය වෙනුවෙන් අප ලබා දී ඇති පොරොන්දුවේ ජීවමාන ප්‍රතිමූර්තියයි. බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සතු සම්භාවී අත්දැකීම්, නවක දක්ෂයින්ගේ නම්‍යශීලීභාවය සමඟ මුසු කිරීම මඟින්, විවිධත්වයෙන් යුත් වෙළඳපොළක අවශ්‍යතා නිවැරදිව හඳුනාගත හැකි කණ්ඩායමක් අප ඩිස්රැප්ස් කර ගෙන ඇත. විශේෂයෙන්ම, වසර ගණනාවක කැපවීම් පූර්වක සේවය තුළින් ඔවුන්ගේ මානසිකත්වය සහ ආකල්ප HDFC සංස්කෘතිය සමඟ මනාව අනුගත වී තිබේ.

එබැවින්, අපගේ සුවිශේෂී මූල්‍ය හා වෙළඳපොළ ස්ථාවරත්වය මැනවින් වටහාගත් සේවක මණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීමට, රඳවා ගැනීමට සහ සංවර්ධනය කිරීමට හැකි වන පරිදි, පුළුල් 'සේවක වටිනාකම් යෝජනාවක්' (EVP) අපගේ කණ්ඩායමට ලබා දීමට අප නිරන්තරයෙන් වෙහෙසෙන්නෙමු.

ප්‍රධාන අපේක්ෂාවන් සහ අප ඒ සඳහා ප්‍රතිචාර දක්වන ආකාරය

ප්‍රධාන පාර්ශවකරුවන්ගේ උත්සුකය	2025 වසරේ අපගේ ප්‍රතිචාරය	2025	2024
ආර්ථික වර්ධනය	රජයේ අනුග්‍රහය ලත් බැංකු ආයතනයක් තුළ ප්‍රතිලාභදායී රැකියා නියුක්තියක් උදෙසා දායක වන, ක්ෂේත්‍රයේ පිළිගත් මට්ටමේ මූල්‍ය පාරිශ්‍රමිකයන් සහ අනෙකුත් වරප්‍රසාද ලබාදීම මඟින් අපි ස්ථාවර ආර්ථික පදනමක් සපයන්නෙමු	සේවකයින් සඳහා ආර්ථික වර්ධනය 1%	10%
වෘත්තීය සහ ක්ෂේත්‍රමය දියුණුව	විධිමත් පුහුණු වැඩසටහන් මෙන්ම, විශේෂයෙන්ම ආධුනික බඳවා ගැනීම් ඉලක්ක කරගනිමින් පවත්වන පුද්ගලාන්තර සහෝදර සැසි හරහා නිරන්තරයෙන් ක්‍රියාත්මක වන පුහුණු වැඩසටහන් මඟින් අපගේ කණ්ඩායම සබලගන්වනු ලබයි	පුහුණු පැය ගණන 733.75	619
රැකියා සුරක්ෂිතතාව සහ ආර්ථික වර්ධනය	රජයේ අනුග්‍රහය ලත් බැංකුවක් ලෙස, අප සේවක මණ්ඩලය සඳහා ස්ථාවර පදනමක් සැපයීමට දිගුකාලීන රැකියා සුරක්ෂිතතාව සහතික කර ඇති අතර, අදාළ සියලුම කම්කරු නීති රීතිවලට අනුකූලව කටයුතු කර ඇත.	සේවක පිරිවැටුම 4.63%	4.14%
සාධාරණ සහ සමාන සැලකිල්ල	අපගේ සංස්කෘතිය පදනම් වී ඇත්තේ පක්ෂපාතී අදහස් හෝ විනිශ්චයන් මත නොව දක්ෂතාවය (කුසලතාවය) මතය. අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය සියලුම සේවකයින්ට ගෞරවයෙන් සැලකීමත්, ඔවුන්ට සමාන අවස්ථා ලබා දීමත් සහතික කරන අතර, කිසිදු වෙනස්කොට සැලකීමකට ඉඩක් නොතබයි	නායකත්ව භූමිකාවන්හි නියුතු කාන්තාවන් 174	195

පාර්ශ්වකරුවන්ගේ සබඳතා සහ සහභාගිත්වය

ප්‍රධාන පාර්ශවකරුවන්ගේ උත්සුකය	2025 වසරේ අපගේ ප්‍රතිචාරය	2025	2024
සාමූහික කේවල කිරීමේ අයිතිය	ලංකා බැංකු සේවක සංගමය සමඟ වෘත්තීයමය මෙන්ම තිරසාර සබඳතාවක් පවත්වා ගැනීමටත්, සේවකයින්ගේ අයිතිවාසිකම් සුරැකීමටත් අපි කැපවී සිටිමු.		
සේවා ස්වාධීනත්වය සහ විවෘත සංස්කෘතිය	විවිධ වූ සන්නිවේදන ක්‍රමවේදයන් ස්ථාපිත කරමින්, සේවකයින්ට ඔවුන්ගේ ගැටලු මතු කිරීමට සහ අදහස් බෙදාහදා ගැනීමට සෑම අවස්ථාවක්ම සලසා දීම සහතික කිරීම උදෙසා අපි විවෘත සන්නිවේදනයක් ප්‍රවර්ධනය කරන්නෙමු.		

අදාළ වැදගත් කරුණු

T1, T2, T3, T4, T5, T6, T7, T8, T9, T11, T13

අප සම්බන්ධ වන ආකාරය

- අභ්‍යන්තර ජාලය
- විද්‍යුත් තැපෑල (ඊමේල්)
- නිල ධුරාවලිය මඟහරිමින් පවත්වන සාකච්ඡා
- දිශානති වැඩසටහන්
- පුහුණු සහ සංවර්ධන වැඩසටහන්
- HDFC පුවත් පත්‍රිකාව
- ඇගයීම් සහ සම්මාන
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ සම්බන්ධීකරණ ක්‍රියාකාරකම්

හවුල්කරුවන්

අදාළ ප්‍රාග්ධනයන්

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



අපගේ ගනුදෙනුකරුවන් වෙත අඛණ්ඩ මෙහෙයුම් සහ සේවාවන් සැපයීම සහතික කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සම්පත් සහ සේවාවන් අපගේ හවුල්කරුවන් විසින් අප වෙත සපයනු ලබයි. ඔවුන් වෙළඳ භාණ්ඩ, උපකරණ මෙන්ම තාක්ෂණය, මූල්‍ය තාක්ෂණය, රක්ෂණ, උපදේශන, විගණන හා ගිණුම්කරණ සහ විදුලි සංදේශ වැනි සේවාවන් සැපයීමේ නියැලී සිටින සැපයුම්කරුවන් සහ සේවා සපයන ආයතන වේ.

ප්‍රධාන අපේක්ෂාවන් සහ අප ඒ සඳහා ප්‍රතිචාර දක්වන ආකාරය

ප්‍රධාන පාර්ශවකරුවන්ගේ උත්සුකය	2025 වසරේ අපගේ ප්‍රතිචාරය
කාලීන සහ විනිවිදභාවයෙන් යුත් ගෙවීම්	පැහැදිලි සන්නිවේදනයක් පවත්වා ගැනීම
දිගුකාලීන සහයෝගිතාවය	සාධාරණ ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කිරීම
සාධාරණ සහ තිරසාර වර්ධනය	ඩිජිටල් ඒකාබද්ධතාවය

අදාළ වැදගත් කරුණු

අප සම්බන්ධ වන ආකාරය

- ටෙන්ඩර් (මිල කැඳවීම්)
- නිෂ්පාදන ආශ්‍රිත පුහුණු වැඩසටහන්
- විද්‍යුත් තැපෑල
- පුද්ගලාන්තර / සෘජු සාකච්ඡා
- නිරීක්ෂණ සහ පරීක්ෂාවන්



නියාමකයින් සහ රාජ්‍ය බලධාරීන්

අදාළ ප්‍රාග්ධනයන්



අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



HDFC බැංකුව නියාමන අනුකූලතාවය සහ විනිවිදභාවයෙන් යුත් පාලනයක් වෙනුවෙන් පූර්ණ වශයෙන් කැපවී සිටින අතර, ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය මඟින් පනවනු ලබන නියෝග හා පැවරුම්වලට අනුකූලව කටයුතු කරයි. තවද, අපගේ මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් කොළඹ කොටස් වෙළඳපොළ සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ස්ථාපිත කර ඇති ප්‍රමිතීන්ට අනුකූලව සිදු කෙරේ.

ප්‍රධාන අපේක්ෂාවන් සහ අප ප්‍රතිචාර දක්වන ආකාරය

ප්‍රධාන පාර්ශවකරුවන්ගේ උත්සුකයන්	2025 වසරේ අපගේ ප්‍රතිචාරය
ප්‍රාග්ධන ප්‍රමාණවත්වය පවත්වා ගැනීම සහ ණය නිකුත් කිරීම් සීමා කිරීම	මැනවින් පවත්වාගෙන යන ලදී
නීති සහ රෙගුලාසිවලට පූර්ණ ලෙස අනුකූල වීම	අනුගමනය කරන ලදී
වගකීමෙන් සහ අබණ්ඩතාවයෙන් යුතුව කටයුතු කිරීම	අනුගමනය කරන ලදී
මූල්‍ය විනිවිදභාවය සහ පූර්ණ අනාවරණය කිරීම්	නියමිත වේලාවට ප්‍රකාශයට පත් කරන ලදී

අදාළ වැදගත් කරුණු

T1, T2, T3, T4, T5, T6, T8, T9, T11, T12

අප පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වන ආකාරය



පාර්ශ්වකරුවන්ගේ සබඳතා සහ සහභාගිත්වය

ප්‍රජාව සහ පරිසරය

අදාළ ප්‍රාග්ධනයන්

අදාළ තේරීම් සහ තිරසාර සංවර්ධන ඉලක්ක



සමාජීය පිළිගැනීම ලබා ගැනීම සඳහා ප්‍රජාව සමඟ සම්බන්ධ වීම සහ පරිසරය ආරක්ෂා කිරීම බැංකුවට ඉතා වැදගත් වේ

ප්‍රධාන අපේක්ෂාවන් සහ අප ප්‍රතිචාර දක්වන ආකාරය

ප්‍රධාන පාර්ශවකරුවන්ගේ උත්සුකයන්	2025 වසරේ අපගේ ප්‍රතිචාරය
පහසුවෙන් මිලදී ගත හැකි නිවාස මූල්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව	දිගුකාලීන වත්කම් කළඹක් ගොඩනැංවීමට දායක වන විශේෂිත ණය නිෂ්පාදන හඳුන්වා දීම
මූල්‍ය සාක්ෂරතාවය සහ සවිබල ගැන්වීම	ශාඛා මට්ටමින් මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
ප්‍රජා සුභසාධනය සහ ආයතනික සමාජ වගකීම් (CSR)	පරිසර හිතකාමී සහ තිරසාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
වගකීම් සහගත ණය දීමේ පියවර	හරිත මූල්‍ය නිෂ්පාදන හඳුන්වා දීම.

අදාළ වැදගත් කරුණු

අප සම්බන්ධ වන ආකාරය

- වෙබ් අඩවිය
- ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාව
- සමාජ මාධ්‍ය ප්‍රචාරණ ව්‍යාපාර
- මුද්‍රිත සන්නිවේදන (පුරප්පාඩු, වැදගත් දැන්වීම් සහ නියාමන වෙනස්කම්)
- ඩිජිටල් සංඥා පද්ධතිය

වැදගත් කරුණු

සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ, නියාමන බැඳීම්වල විකතුවක් ලෙස මෙන්ම බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය සුරැකීම සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ හා සේවකයින්ගේ අයිතිවාසිකම්/යහපැවැත්ම ආරක්ෂා කිරීම වෙනුවෙන් වඩාත් වැදගත් වන කරුණුවලට අපි ප්‍රමුඛතාවය දුන්නෙමු. බැංකුවේ මූල්‍ය තත්ත්වය මැනවින් ආරක්ෂා වී ඇති බව තහවුරු කිරීමටත්, එය නියාමන අවශ්‍යතා සහ අභ්‍යන්තර ප්‍රමුඛතාවයන් සමඟ සමපාත වන බව සහතික කිරීම කෙරෙහි අපගේ අවධානය අපි නැවත යොමු කළෙමු.

2025 වසරට අදාළ ක්‍රියාවලිය

සම්බන්ධ වීම සහ හඳුනා ගැනීම: මූල්‍ය නියාමකයාගෙන් ලැබුණු අවබෝධය හා උපදෙස් මෙන්ම, අවදානම් කළමනාකරණ අංශයෙන් සහ ණය අංශයෙන් ලැබුණු ප්‍රතිපෝෂණ ද සැලකිල්ලට ගනිමින්, වඩාත් වැදගත් මාතෘකා සඳහා ප්‍රමුඛතාවය දිය යුත්තේ කෙසේද යන්න අප විසින් තීරණය කරන ලදී.

ප්‍රමුඛතාකරණය: නියාමන අවශ්‍යතා සහ මූල්‍ය ප්‍රමුඛතාවයන්ට අනුකූල වීම සඳහා වැදගත් කරුණුවල ප්‍රමුඛතාවය විශාල ලෙස වෙනස් වී ඇති අතර, එහිදී වඩාත්ම තීරණාත්මක මාතෘකාව වන මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි විශේෂිත ප්‍රවේශයක් සහිත අවධානයක් ඇතුළත් කර ඇත.

තහවුරු කිරීම: මෙම වැදගත් මාතෘකා, වත්කම්වල ගුණාත්මකභාවය සහ ඩිජිටල් ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා 2025 වසරේ අප ඇති කරගත් උපායමාර්ගික වෙනස්කම් සමඟ සමපාත වන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථිර කරනු ලබයි.

මෙම කොටස මඟින් 2025 මූල්‍ය වර්ෂය තුළ බැංකුවට වඩාත්ම වැදගත් වූ මාතෘකා සහ එක් එක් මාතෘකාවට අදාළ කාර්යසාධන සාරාංශය ඉදිරිපත් කරයි. සමාලෝචනයට භාජනය වූ වසර තුළ බැංකුවට ඒවා පැවති අදාළත්වය සහ වැදගත්කම අනුව පහත සඳහන් මාතෘකා අනුපිළිවෙලින් දක්වා ඇත.

T1 - මූල්‍ය ස්ථාවරත්වය

අපගේ ප්‍රාග්ධන ප්‍රමාණවත්වයට කිසිදු අහිතකර බලපෑමක් ඇති නොවන පරිදි, අක්‍රීය ණය මට්ටම් තවදුරටත් ඉහළ යා නොදී පාලනය කර ගැනීම සඳහා අප නොපසුබටව කටයුතු කළ බැවින්, මෙම වසර තුළ මූල්‍ය ස්ථාවරත්වය අපගේ ඉහළම ප්‍රමුඛතාවය බවට පත් විය.

මූල්‍ය ස්ථාවරත්වය සහ මූල්‍ය තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ප්‍රධාන ප්‍රවේශයන් අත්‍යවශ්‍ය විය:

ප්‍රවේශය 1: වත්කම්වල ගුණාත්මකභාවය සහ ණය අවදානම් කළමනාකරණය

ප්‍රතිචාරය	ප්‍රතිඵල
ගුණාත්මක භාවයෙන් ඉහළ, ඇපකර සහිත ණය දීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම	ශක්තිමත් වත්කම් ගුණාත්මකභාවය සහ අඩු අක්‍රීය ණය අවදානම තුළින් ශ්ලේෂ පත්‍රයේ ස්ථාවරත්වය ඉහළ නැංවීම, ප්‍රාග්ධන චංචලතාව අවම කිරීම සහ අවදානම්වලට ගැලපෙන පරිදි සකස් කළ ප්‍රතිලාභ වැඩිදියුණු කිරීම.
ණය ගැතියන් බඳවා ගැනීමේ ප්‍රමිති ශක්තිමත් කිරීම	ප්‍රවේශම් සහගත ණය විනයක් පැහැදිලිව ප්‍රදර්ශනය කිරීම සහ වත්කම්වල ගුණාත්මකභාවය මෙන්ම ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ නියාමන අපේක්ෂාවන් සමඟ වඩා හොඳින් අනුකූල වීම.
අක්‍රීය ණය ආශ්‍රිත ප්‍රාග්ධන බලපෑම අවම කිරීම සඳහා ණය අයකර ගැනීම් වැඩිදියුණු කිරීම	තිරසාර නැවත ගෙවීමේ හැකියාවක් ඇති, ණය සුදුසුකම් ලත් ණය ගැතියන් වෙත පමණක් ණය පහසුකම් සපයන බව තහවුරු කෙරෙන වඩාත් වගකීවයුතු ණය දීමේ ක්‍රමවේදයන්.

ප්‍රවේශය 2-ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව

ප්‍රතිචාරය	අපේක්ෂිත ප්‍රතිඵල
අය නොවන ණය හේතුවෙන් ප්‍රාග්ධනයට සිදුවන පීඩනය අවම කිරීම සඳහා ප්‍රතිඵල කේන්ද්‍රීය ප්‍රතිසාධන මූලපිරිම්.	ප්‍රාග්ධනය සුරක්ෂිත කිරීම සහ බැංකුවේ කම්පන දරාගැනීමේ හැකියාව සහ කාලයත් සමඟ ලාභාංශ පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ විශ්වාසය ශක්තිමත් වීම.
කළඹ අවදානම සහ සාන්ද්‍රණ නිරාවරණය නැවත තක්සේරු කිරීම.	විචක්ෂණශීලී අපේක්ෂාවන්ට අනුකූලව වැඩිදියුණු කළ ප්‍රාග්ධන ඔරොත්තු දීමේ හැකියාව සහ පද්ධතිමය අවදානම් පිළිබඳ කනස්සල්ල අවම වීම.

ප්‍රවේශය 3: වීකාග්‍රතා අවදානම සහ ණය කළඹ විවිධාංගීකරණය

සෘජුවදබැ	ධමළුජදෂි
සේවක අර්ථසාධක අරමුදල් ඇපකර මත ලබාදෙන ණය කෙරෙහි ඇති විශ්වාසය අවම කිරීම	වීකාග්‍රතා අවදානම අඩු වීම, ඉපැයීම්වල තිරසාරභාවය වැඩිදියුණු වීම සහ නිශ්චිත ක්ෂේත්‍රයන්ට පමණක් බලපාන අහිතකර තත්ත්වයන්ට මුහුණ දීමේ අවදානම අවම වීම.
වත්කම් ඇපකර සහිත ණය කාණ්ඩ ඔස්සේ ණය කළඹ විවිධාංගීකරණය කිරීම	අවදානම් විවිධාංගීකරණය කිරීමේ අපේක්ෂාවන් සමඟ වඩාත් ශක්තිමත්ව අනුකූල වීම සහ බැංකුවේ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ ප්‍රතිරූපය ඉහළ නැංවීම.
	ඇතුළත් කරගත් සහ ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු මූල්‍ය මැදිහත්කරණයකට සහය වෙමින්, විවිධාංගීකරණය වූ ණය නිෂ්පාදන සඳහා පුළුල් ප්‍රවේශයක් ලබා ගැනීම.

ප්‍රවේශය 4: තිරසාර නිෂ්පාදන උපායමාර්ගය

ප්‍රතිචාරය	ප්‍රතිඵල
ලීසිං (බදුදීම්) සහ රන් ණය වර්ධනය කර ගැනීමට ප්‍රමුඛතාව ලබා දීම	විනිවිදභාවයෙන් යුතු සහ ආරක්ෂිත ඇපකර ව්‍යුහයන්ගෙන් සමන්විත, අවශ්‍යතා මත පදනම් වූ විවිධාංගීකරණය වූ මූල්‍ය විසඳුම් සඳහා ප්‍රවේශය ලැබීම.
වඩාත් ශක්තිමත් ඇපකර ආවරණයක් සහිත, වත්කම් පදනම් කරගත් නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු කිරීම	වඩාත් පුරෝකථනය කළ හැකි මුදල් ප්‍රවාහයන් සහ අවදානම අඩු වත්කම් කාණ්ඩවලින් ලැබෙන ආදායමේ තිරසාරභාවය ශක්තිමත් වීම.

ප්‍රවේශය 5: උපායමාර්ගික දිශානතිය සහ පරිවර්තනය

ප්‍රතිචාරය	ප්‍රතිඵල
පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මක් (2026-2030) සඳහා පදනම සකස් කිරීම	පැහැදිලි දිගුකාලීන උපායමාර්ගික දිශානතියක් ලැබීම සහ කෙටිකාලීන කාර්යසාධන චක්‍රවලින් ඔබ්බට ගිය තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම කෙරෙහි ඇති විශ්වාසය ශක්තිමත් වීම.
මූල්‍ය ස්ථාවරත්වය, ඔරොත්තු දීමේ හැකියාව සහ පරිවර්තනය කෙරෙහි විශේෂ අවධාරණයක් යොමු කරමින් ප්‍රමුඛතාවන් නැවත ඇගයීම	විනයගරුක අවදානම් සහ නියාමන රාමුවක් තුළ සිටීමින් වර්ධනය සහ පරිවර්තනය අඛණ්ඩව සිදුකරගෙන යන බවට සහතික වීම.
	පරිවර්තනීය ගමන පුරාම සේවක සහභාගිත්වය සහ පොදු අරමුණක් පිළිබඳ හැඟීමක් ඇති කරමින් වඩාත් පැහැදිලි බවක් සහ අන්‍යෝන්‍ය අනුකූලතාවක් ගොඩනැඟීම.

අදාළ වැදගත් කරුණු

ප්‍රාග්ධන සහ වටිනාකම් නිර්මාණය සමඟ ඇති සබඳතාව

ප්‍රවේශය	ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
1. වත්කම්වල ගුණාත්මකභාවය සහ ණය අවදානම් කළමනාකරණය	• මූල්‍ය ප්‍රාග්ධනය ක්‍රමයෙන් වැඩිදියුණු වන වත්කම්වල ගුණාත්මකභාවය, අඩු අක්‍රීය ණය, අනුපාතය සහ ස්ථාවර ප්‍රතිලාභ.	නියාමකයින්, කොටස්කරුවන්, ගනුදෙනුකරුවන් (තැන්පත්කරුවන් සහ ණයගැතියන්)
2. ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව	• මූල්‍ය ප්‍රාග්ධනය සුරක්ෂිත මූල්‍ය සංචිත, වැඩිදියුණු වූ ඔරොත්තු දීමේ හැකියාව සහ අබණ්ඩව ගෙවනු ලබන ලාභාංශ. • සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය නියාමකයින් සහ ආයෝජකයින් අතර බැංකුව කෙරෙහි ඇති විශ්වාසය ශක්තිමත් වීම.	කොටස්කරුවන් සහ නියාමකයින්
3. වීක්ෂණ අවදානම සහ ණය කළඹ විවිධාංගීකරණය	• මූල්‍ය ප්‍රාග්ධනය අඩු වූ වීක්ෂණ අවදානම සහ ස්ථාවර ඉපැයීම්. • සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය පුළුල් මෙන්ම වඩාත් ඇතුළත් කරගත් ණය ප්‍රවේශයක් පැවතීම.	ණයගැතියන්, ආයෝජකයින්, නියාමකයින්
4. තිරසාර නිෂ්පාදන උපායමාර්ගය	• මූල්‍ය ප්‍රාග්ධනය සුරක්ෂිත ණය දීම් තුළින් පුරෝකථනය කළ හැකි ස්ථාවර මුදල් ප්‍රවාහයන් ලැබීම. • සමාජීය ප්‍රාග්ධනය වගකීම් සහගත, ඇපකර සහිත මූල්‍ය පහසුකම් සඳහා වඩාත් පුළුල් ප්‍රවේශයක් හිමිවීම.	ගනුදෙනුකරුවන් (ණයගැතියන්), ප්‍රජාවන්, කොටස්කරුවන්
5. උපායමාර්ගික දිශානතිය සහ පරිවර්තනය	• බුද්ධිමය ප්‍රාග්ධනය ශක්තිමත් වූ උපායමාර්ගික සැලසුම්කරණය සහ ආයතනික පාලනය. • මානව සහ සමාජීය ප්‍රාග්ධනය ආයතනික අරමුණු සමඟ වඩා හොඳින් අනුකූල වීම, සේවක සහභාගිත්වය සහ ආයතනික ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය වීම.	සේවකයින්, කොටස්කරුවන්, නියාමකයින්, ගනුදෙනුකරුවන්

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



ප්‍රතිඵලය

මූල්‍ය ස්ථාවරත්වය අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇති අතර, පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු වී ඇත. උපායමාර්ගික වර්ධනයට සහය දක්වන ක්‍රියාකාරකම් සඳහා වන අරමුදල් ප්‍රතිපාදන, මූල්‍ය වර්ෂය අවසානය වන විට අනුමත කර වෙන් කර ඇති අතර, වීමඟින් බැංකුවේ ඉහළ නැංවුණු මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව ප්‍රදර්ශනය කෙරේ.

වැඩිදුර පරිශීලනය

මූල්‍ය ප්‍රාග්ධනය

ව්‍යාපාරික අංශවල කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශන සහ පරිපූරක තොරතුරු

T2 - නියාමන අවශ්‍යතා සහ සාර්ව ආර්ථික බලපෑම්

සාර්ව ආර්ථික සහ නියාමන වර්ධනයන් පිළිබඳ උපායමාර්ගික අධීක්ෂණය අපගේ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පැවතුණි. ප්‍රධාන දර්ශක සහ නිරන්තර වෙනස්වීම් විශ්ලේෂණය කිරීම මඟින්, 2025 මූල්‍ය වර්ෂය තුළ අපගේ ශේෂ පත්‍රයට සහ බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වයට සිදුවන බලපෑම් අපි පූර්ව සූදානමකින් යුතුව කළමනාකරණය කළෙමු.

අපගේ ප්‍රවේශය

- නියාමන ප්‍රතිපත්තිවලට අනුකූලව තැන්පතු බලමුලු ගැන්වීම සහ ණය දීමේ කටයුතුවලට ප්‍රමුඛතාව ලබා දීම.
- පැරැටේ නීතිය සහ ලබා දී ඇති සහන කාල මෙන්ම වීවායේ යාවත්කාලීන කිරීම් වැනි නීති සහ රෙගුලාසි මත පදනම්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ණය අයකර ගැනීම් සිදු කිරීම.
- නියාමන අවශ්‍යතාවලට අනුකූල වන පරිදි ණය මුදා හැරීම් කළමනාකරණය කිරීම.

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
මූල්‍ය ප්‍රාග්ධනය • පූර්ව සූදානමකින් යුත් නියාමන අනුකූලතාව සහ සාර්ව ආර්ථික අධීක්ෂණය තුළින් මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම. • තිරසාර ණය දීම් සඳහා සහය වීම පිණිස ද්‍රවශීලතා කළමනාකරණය සහ තැන්පතු බලමුලු ගැන්වීම ඉහළ නැංවීම. • විනයගරුක අවදානම් කළමනාකරණය සහ විචක්ෂණශීලී අවශ්‍යතාවලට අනුකූල වීම මඟින් ස්ථාවර ශේෂ පත්‍රයක් පවත්වාගෙන යාම.	නියාමකයින් (ශ්‍රී ලංකා මහ බැංකුව), රජය, ආයෝජකයින්, කොටස්කරුවන්, ගනුදෙනුකරුවන් (තැන්පත්කරුවන් සහ ණයගැතියන්), ප්‍රජාව, සේවකයින්
සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය • අදාළ රෙගුලාසිවලට අනුකූල වන පරිදි ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ණය අයකර ගැනීමේ ක්‍රමවේදයන් (උදා: පැරැටේ නීතිය , සහන කාල යාවත්කාලීන කිරීම්) ඔස්සේ ආර්ථික ස්ථාවරත්වයට සහය වීම.	ගනුදෙනුකරුවන් (ණයගැතියන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්), ප්‍රජාව, නියාමකයින්

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
බුද්ධිමය ප්‍රාග්ධනය • නියාමන රාමුවලට අනුකූල වන පරිදි වගකීම් සහගත ලෙස ණය මුදා හැරීම සහතික කිරීම.	ගනුදෙනුකරුවන් (ණයගැතියන්), නියාමකයින්, කොටස්කරුවන්

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



ප්‍රතිඵලය

ණය අයකර ගැනීම් සහ එකතු කිරීම් ඉහළ යාම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්තියට අනුකූලව අඩු ණය පොලී අනුපාත ලබා දීම.

වැඩිදුර පරිශීලනය

ආයතනික පාලන වාර්තාව

සාර්ව ආර්ථික සමාලෝචනය

අවදානම් කළමනාකරණ වාර්තා

T3 - විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය

පැහැර හරින ලද ණය අයකර ගැනීමේදී ඇතිවන අභියෝගයන්ට විරෙහිව අපගේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සහ අපගේ ප්‍රාග්‍ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ අනුපාතයන් නිසි පරිදි පවත්වාගෙන යාම තහවුරු කරනු පිණිස, අපි විවිධ පරාමිතීන් ඔස්සේ අවදානම් කළමනාකරණ සන්ධානයන් අබණ්ඩව ක්‍රියාත්මක කළෙමු. විමෙන්ම, අපගේ අවදානම් නිරාවරණයන් පිළිගත හැකි සීමාවන් තුළ පවතින බවද සහතික කළෙමු.

අපගේ ප්‍රවේශය

- අක්‍රීය ණය අයකර ගැනීම.
- සේවක අර්ථසාධක අරමුදල් ඇපකර මත ලබාදුන් ණය පියවීම් පිළිබඳ පසු විපරම් කිරීම.
- ණය අධීක්ෂණය ශක්තිමත් කිරීම සහ රෙගුලාසිවලට අනුකූල වීම.
- වගකීම් සහගත ණය දීම් සඳහා ප්‍රමුඛතාව ලබා දීම සහ ණය පැතිකඩ විවේචනාත්මකව ඇගයීමට ලක් කිරීම.
- ප්‍රාග්ධන සංචිත සුරක්ෂිත කිරීම සඳහා වියදම් සීමා කිරීම.
- තොරතුරු තාක්ෂණ පාලනය සහ ආරක්ෂාව දැඩි කිරීම.
- වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ උත්සාහයන්.
- මුදල් ප්‍රවාහ පුරෝකථනය.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ නවතම යාවත්කාලීන කිරීම්

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
මූල්‍ය ප්‍රාග්ධනය • පැහැර හරින ලද ණය අයකර ගැනීම. • ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ අනුපාතයන් අබණ්ඩව පවත්වාගෙන යාම. • ප්‍රාග්ධන සංචිත සුරක්ෂිත කිරීම සඳහා වියදම් සීමා කිරීම. • ද්‍රවශීලතාව සහ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා මුදල් ප්‍රවාහ පුරෝකථනය සිදු කිරීම. • ණය අධීක්ෂණය ශක්තිමත් කිරීම සහ රෙගුලාසිවලට අනුකූල වීම .	කොටස්කරුවන්, ආයෝජකයින්, නියාමකයින් (ශ්‍රී ලංකා මහ බැංකුව), සේවකයින්
සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය • වගකීම් සහගත ණය දීම් සඳහා ප්‍රමුඛතාව ලබා දීම සහ ණය පැතිකඩ විවේචනාත්මකව ඇගයීමට ලක් කිරීම. • අක්‍රීය ණය අයකර ගැනීම සහ සේවක අර්ථසාධක අරමුදල් ඇපකර මත ලබාදුන් ණය පියවීම් පිළිබඳ පසු විපරම් කිරීම. • පාරිභෝගික සහභාගීත්වය සහ අයකර ගැනීමේ ක්‍රමවේදයන් ඔස්සේ වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට උත්සාහ කිරීම. • ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් සහ නියෝග සමඟ අබණ්ඩව යාවත්කාලීන වීම සහ අනුකූල වීම. • තොරතුරු තාක්ෂණ පාලනය සහ ආරක්ෂාව දැඩි කිරීම.	නියාමකයින් (ශ්‍රී ලංකා මහ බැංකුව), කොටස්කරුවන්, ගනුදෙනුකරුවන්/ ණයගැතියන්, හවුල්කරුවන්

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



ප්‍රතිඵලය

HDFC බැංකුව විසින් එකතු කළ යුතු පැහැදිලි සහ වැදගත් අවදානම් කළමනාකරණ ප්‍රතිඵල - කරුණාකර මෙය අප අවදානම් වාර්තාවේ ඇතුළත් කර ඇති කරුණුවලට අනුකූල වන පරිදි සිදු කර ඇති බව තහවුරු කරගන්න.

වැඩිදුර පරිශීලනය

අවදානම් කළමනාකරණ වාර්තාව

T4 - ආයතනික පාලනය සහ අනුකූලතාව

මෙය ස්ථාවරත්වයේ මූලික පදනම බවට පත් වූ අතර, ප්‍රධාන විධායක නිලධාරී සහ සභාපති යන තනතුරුවල වෙනස්වීම් සිදු වුවද, අඛණ්ඩ වගවීම සහ නියාමන අනුකූලතාවය අපි සහතික කළෙමු.

අපගේ ප්‍රවේශය

- නියාමන උපදෙස් හේතුවෙන් පාලනය කළ හැකි මට්ටමින් ණය දීම සහ ලබා දෙන ණය ප්‍රමාණය සීමා කිරීම.
- බැංකු ක්ෂේත්‍රය සඳහා වන ආයතනික පාලන රෙගුලාසිවලට අනුකූල වීම.

අදාළ වැදගත් කරුණු

- අවදානම් දෙපාර්තමේන්තුව සහ ණය අංශයේ අධීක්ෂණය සමඟ ඒකාබද්ධ වූ අවදානම් සහ ණය කළමනාකරණය.
- මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා නියමිත වේලාවට සමාලෝචනය කර තීරණ ගැනීමට නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම.

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
මූල්‍ය ප්‍රාග්ධනය • බැංකු ක්ෂේත්‍රය සඳහා වන ආයතනික පාලන රෙගුලාසිවලට අනුකූල වීම. • අවදානම් දෙපාර්තමේන්තුව සහ ණය අංශයේ අධීක්ෂණය සමඟ ඒකාබද්ධ වූ අවදානම් සහ ණය කළමනාකරණය. • නියාමන උපදෙස් හේතුවෙන් පාලනය කළ හැකි මට්ටමින් ණය දීම සහ ලබා දෙන ණය ප්‍රමාණය සීමා කිරීම. • මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම සහ අඛණ්ඩ වගවීම සහතික කිරීම සඳහා නියමිත වේලාවට සමාලෝචනය කර තීරණ ගැනීමට නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම.	නියාමකයින් (ශ්‍රී ලංකා මහ බැංකුව), රජය, කොටස්කරුවන්, ගනුදෙනුකරුවන් (ණයගැතියන්)

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



ප්‍රතිඵලය

වැඩිදියුණු කළ අවදානම් තක්සේරුකරණය සහ ශක්තිමත් මෙන්ම ඒකාබද්ධ වූ ණය සහ අවදානම් කළමනාකරණ ප්‍රවේශය.

ආයතනික පාලනය සහ නියාමන අනුකූලතාවය සහතික කිරීම සඳහා නව සමාගම් ලේකම්වරයෙකු පත් කිරීම.

ශූන්‍ය අනනුකූලතාවය

වැඩිදියුණු කළ ණය කළමනාකරණ ක්‍රියාවලිය.

වැඩිදුර පරිශීලනය

ආයතනික පාලන වාර්තාව)

අනුකූලතා තත්ත්වය

අවදානම් කළමනාකරණ වාර්තාව

T5 - අඛණ්ඩ සන්නිවේදනය සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය

නියාමන අවශ්‍යතා, පාරිභෝගික අපේක්ෂාවන් සහ සේවක ගැටලු සමඟ නිරන්තරයෙන් අනුකූලව කටයුතු කිරීම සඳහා අඛණ්ඩ සන්නිවේදනයක් සහ අඛණ්ඩ සංවාදයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. අපගේ වගකීම් සහ වටිනාකම් නිර්මාණය කිරීම්, පාර්ශවකරුවන්ගේ උපරිම යහපත මෙන්ම බැංකුවේ මූල්‍ය අනාගතය සමඟ සමපාත වන බව සහතික කිරීම සඳහා අපි අපගේ පාර්ශවකරුවන් සමඟ සෘජුව හා නිතර සම්බන්ධ වීමට උත්සාහ කරමු.

අපගේ ප්‍රවේශය

- නියාමන අවශ්‍යතා සමඟ පූර්ණ ලෙස අනුකූල වීම සහතික කිරීම සඳහා නිතිපතා වාර්තාකරණය සහ සාකච්ඡා පවත්වාගෙන යාම, මෙන්ම අඩුපාඩු මඟහරවා ගනිමින් කඩිනම් නිවැරදි කිරීම් සිදු කිරීම.
- නිරන්තර පාරිභෝගික සහ ප්‍රජා සහභාගීත්වයන් සඳහා සමාජ මාධ්‍ය උපරිමයෙන් භාවිත කිරීම.
- නව සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් සඳහා ටෙන්ඩර් ක්‍රියාවලිය සහ විධිමත් පරීක්ෂාවන් සිදු කිරීම, මෙන්ම දැනට සිටින පාර්ශවයන් සමඟ අඛණ්ඩ සන්නිවේදනයක් පවත්වා ගැනීම.
- සේවකයින්ගේ ගැටලු, අදහස් සහ කාර්යසාධනය පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
මානව ප්‍රාග්ධනය • ගැටලු, අදහස් සහ කාර්යසාධන යාවත්කාලීන කිරීම් හුවමාරු කර ගැනීම සඳහා අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.	සේවකයින්, කළමනාකාරිත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය
සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය • නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම සහතික කිරීම සඳහා නිතිපතා වාර්තාකරණය, සාකච්ඡා පැවැත්වීම සහ කඩිනම් නිවැරදි කිරීම් සිදු කිරීම. • නිරන්තර පාරිභෝගික සහ ප්‍රජා සහභාගීත්වයන් සඳහා සමාජ මාධ්‍ය උපරිමයෙන් භාවිත කිරීම. • සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් සඳහා ටෙන්ඩර් ක්‍රියාවලිය, විධිමත් පරීක්ෂාවන් සිදු කිරීම සහ ඔවුන් සමඟ අඛණ්ඩ සන්නිවේදනයක් පවත්වා ගැනීම. • නියාමන අපේක්ෂාවන්, පාරිභෝගික අවශ්‍යතා සහ සේවක ගැටලු සමඟ නිරන්තරයෙන් අනුකූලව කටයුතු කිරීම සඳහා අඛණ්ඩ සංවාදයක් පවත්වා ගැනීම.	නියාමකයින් (ශ්‍රී ලංකා මහ බැංකුව, රජය, කොටස්කරුවන්, ගනුදෙනුකරුවන්, ප්‍රජාව, සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්, සේවකයින්, හවුල්කරුවන්

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



ප්‍රතිඵලය

නියාමන රැස්වීම් පැවැත්වීම.

මුහුණු පොත සහ ලින්ක්ඩ්ඉන් මාධ්‍ය ඔස්සේ නිරන්තරයෙන් ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වීම.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හරහා වාහන ලියාපදිංචි කිරීමේ බාහිර සේවා ලබා ගැනීමේ ටෙන්ඩර් ක්‍රියාවලිය කඩිනම් කිරීම.

වැඩිදුර පරිශීලනය

පාර්ශවකරුවන්ගේ සහභාගීත්ව ක්‍රියාවලිය

ආයතනික පාලන වාර්තාව

අනුකූලතා තත්ත්වය

සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය

මානව ප්‍රාග්ධනය

T6 - ඇතුළත් කරගත් සහ මූල්‍යමය වශයෙන් විචක්ෂණශීලී විවිධාංගීකරණයන්

උපායමාර්ගික ව්‍යාපාරික වර්ධනයක් උදෙසා ක්‍රියා කරමින්, අපි නව නිෂ්පාදන කිහිපයක් සංවර්ධනය කිරීමට සහ අපගේ පවත්නා ලීසිං (බදුදීම්) පහසුකම් විවිධාංගීකරණය කිරීමට පියවර ගත්තෙමු. එපමණක් නොව, මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කරමින්, අපගේ ණය පහසුකම් ගනුදෙනුකරුවන් ට දැරිය හැකි මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කළෙමු.

අපගේ ප්‍රවේශයන්

- විවිධාංගීකරණය වූ ලීසිං පහසුකම්.
- නව 'හරිත' මූල්‍ය නිෂ්පාදන හඳුන්වා දීම.
- පුද්ගලයන්ගේ ගෙවීම් හැකියාවන්ට අනුකූල වන පරිදි සකස් කළ, දැරිය හැකි පොලී ක්‍රම සහ නැවත ගෙවීමේ සැලසුම්.
- ඇතැම් ණය නිෂ්පාදන සඳහා ගතවන කාලය අවම වන පරිදි සකස් කළ කාර්ය පටිපාටි සහ ක්‍රියාවලි.

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
මූල්‍ය ප්‍රාග්ධනය • ආදායම් මාර්ග ශක්තිමත් කිරීම සහ ව්‍යාපාරික වර්ධනයට සහය වීම සඳහා ලීසිං පහසුකම් විවිධාංගීකරණය කිරීම. • හරිත ව්‍යාපෘති (උදා: පුනර්ජනනීය බලශක්ති උත්පාදනය) සඳහා අරමුදල් සැපයීම පිණිස හරිත පුද්ගලික ණය ඇතුළු නව හරිත මූල්‍ය නිෂ්පාදන හඳුන්වා දීම.	ගනුදෙනුකරුවන් (ණයගැතියන්), ආයෝජකයින්, නියාමකයින්
බුද්ධිමය ප්‍රාග්ධනය • ණය නිෂ්පාදන සැපයීමේදී ගතවන කාලය අවම කිරීම සහතික කිරීම සඳහා කාර්ය පටිපාටි සහ ක්‍රියාවලි විධිමත් කිරීම.	ගනුදෙනුකරුවන් සේවකයින්
සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය • මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා පුද්ගලයන්ගේ ගෙවීම් හැකියාවන්ට අනුකූල වන පරිදි සකස් කළ දැරිය හැකි පොලී ක්‍රම සහ නැවත ගෙවීමේ සැලසුම් හඳුන්වා දීම. • පහසුවෙන් ප්‍රවේශ විය හැකි සහ පාරිභෝගිකයා කේන්ද්‍ර කරගත් ණය දීමේ ක්‍රමවේදයන් ඔස්සේ මූල්‍ය අන්තර්ගතභාවය වෙනුවෙන් පෙනී සිටීම.	ගනුදෙනුකරුවන් (අඩු ආදායම්ලාභීන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්), ප්‍රජාව, නියාමකයින්

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



ප්‍රතිඵලය

වේගවත් ලීසිං සේවා සමඟින් ලීසිං (බදුදීම්) විවිධාංගීකරණයන් හතරක් හඳුන්වා දීම.

නව 'හරිත' නිෂ්පාදන තුනක් හඳුන්වා දීම.

අවම ලේඛන කටයුතු සහ නම්‍යශීලී නැවත ගෙවීමේ කොන්දේසි සහිත 'HDFC සුප ඩිරාවිඩ් නිෂ්පාදනය හඳුන්වා දීම.

ලීසිං සහ රන් ණය හරහා කෙටිකාලීන ණය දීම් කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීම.

වැඩිදුර පරිශීලනය

බුද්ධිමය ප්‍රාග්ධනය

සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය

මූල්‍ය ප්‍රාග්ධනය

T7 - විස්තීර්ණ සේවක වටිනාකම් යෝජනාව

ඉහළ කුසලතාවලින් යුත් ශ්‍රම බලකායක් ආකර්ෂණය කර ගැනීමට, රඳවා ගැනීමට සහ ඔවුන් සබල ගැන්වීමට අපට ඇති හැකියාව තහවුරු කරන ශක්තිමත් සේවක වටිනාකම් යෝජනා ක්‍රමවේදයක් අප අනුගමනය කරනු ලබන්නෙමු. පරිපූර්ණ EVP ක්‍රමවේදයක් හරහා, අපගේ සේවකයින්ට නව දැනුම, වෘත්තීය ප්‍රගතිය, සේවා ස්ථානයේ ආරක්ෂාව සහ ගරුකටයුතු අයිතිවාසිකම් සඳහා අවස්ථාවන් සලසන ඇතුළත් කරගත් පරිසරයක් ලබා දීමට අපි කැපවී සිටිමු

අපගේ ප්‍රවේශය

- උපායමාර්ගික වැදගත්කමක් ඇති ක්ෂේත්‍ර ඇතුළුව, ආයතනික පුහුණු අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සකස් කරන ලද විස්තීර්ණ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- සේවක අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ පොදු විකඟතාවන් වෙනුවෙන් සාකච්ඡා කිරීම සඳහා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම.
- විවිධත්වය සහ සමානාත්මතාවය අනුමත කිරීම මෙන්ම වෙනස්කොට සැලකීම් සහිත හැසිරීම් දැඩි ලෙස හෙළා දැකීම.
- අපගේ කාර්ය මණ්ඩලයේ මානසික සහ ශාරීරික සෞඛ්‍යය නංවාලීම සඳහා වැඩ සහ පෞද්ගලික ජීවිතය අතර සමබරතාවය රැක ගැනීමේ මූලපිරීම් දිරිමත් කිරීම.

අදාළ වැදගත් කරුණු

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
මානව ප්‍රාග්ධනය • සේවක අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ පොදු විකඟතාවන් වෙනුවෙන් සාකච්ඡා කිරීම සඳහා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම (උදා: බැංකු වෘත්තීය සමිතිය සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම). • වෙනස්කොට සැලකීම් සහිත හැසිරීම් හෙළා දකින අතරම, විවිධත්වය සහ සමානාත්මතාවය අනුමත කිරීම/අගය කිරීම. • උපායමාර්ගික වැදගත්කමක් ඇති ක්ෂේත්‍ර ඇතුළුව, ආයතනික පුහුණු අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සකස් කරන ලද විස්තීර්ණ පුහුණු වැඩසටහන් පැවැත්වීම. • කාර්ය මණ්ඩලයේ මානසික සහ ශාරීරික සුවතාවය නංවාලීම සඳහා වැඩ සහ පෞද්ගලික ජීවිතය අතර සමබරතාවය රැක ගැනීමේ මූලපිරීම් ක්‍රියාත්මක කිරීම. • සේවකයින් සබල ගන්වන සහ වෘත්තීය ප්‍රගතියට සහය දක්වන ඇතුළත් කරගත් පරිසරයක් සැපයීම.	සේවකයින් (වෘත්තීය සමිතිය සහ කළමනාකාරිත්වය ඇතුළුව), ප්‍රජාව

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



ප්‍රතිඵලය

සේවකයින් රඳවා ගැනීම් පහත වැටීම

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව මට්ටම් සඳහා බඳවා ගැනීම් සිදු කිරීම.

පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

වැඩිදුර පරිශීලනය

මානව ප්‍රාග්ධනය

T8 - ව්‍යාපාර අඛණ්ඩතාව

අනුප්‍රාප්තික සැලසුම්කරණය සහ ආපදා යථා තත්ත්වයට පත් කිරීමේ සැලසුම් යනු අපගේ මෙහෙයුම් අඛණ්ඩතාව සහ ව්‍යාපාරික ඔරොත්තු දීමේ හැකියාව සහතික කරන ප්‍රධාන අංග වේ. මෙම උපායමාර්ගයන් මඟින් අනපේක්ෂිත අවස්ථාවන්හිදී පවා නායකත්වයේ අඛණ්ඩතාව තහවුරු කරන අතර, අනාගත නායකයින් පූර්ව සූදානමකින් යුතුව හඳුනා ගැනීම සහ ශක්තිමත් යථා තත්ත්වයට පත් කිරීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම මඟින් බැංකුව සිය දිගුකාලීන ස්ථාවරත්වය සහ වර්ධනය සුරක්ෂිත කරනු ලබයි.

අපගේ ප්‍රවේශය

- නායකත්ව කුසලතා සංවර්ධනය / උපදේශකත්වය.
- කළමනාකරණ ආධුනික පුහුණු වැඩසටහන සැලසුම් වෙමින් පැවතීම.
- ආපදා යථා තත්ත්වයට පත් කිරීමේ සැලැස්ම .
- තේරීම් සහගත ලෙස බඳවා ගැනීම් සිදු කිරීම.

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
මානව ප්‍රාග්ධනය • ශක්තිමත් අනුප්‍රාප්තික නායිකාවක් ගොඩනැඟීම සඳහා නායකත්ව කුසලතා සංවර්ධනය සහ උපදේශකත්වය ලබා දීම. • අනාගත නායකයින් බිහි කිරීම සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා කළමනාකරණ ආධුනික වැඩසටහන ක්‍රියාත්මක කිරීම.	සේවකයින්, කළමනාකාරිත්වය ඇතුළුව
බුද්ධිමය ප්‍රාග්ධනය • මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ බාධාවකින් තොරව සේවා සැපයීම සහතික කිරීම සඳහා ආපදා යථා තත්ත්වයට පත් කිරීමේ සැලසුම්කරණය • ආයතනික හැකියාවන් සහ දිගුකාලීන ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා තේරීම් සහගත ලෙස බඳවා ගැනීම් සිදු කිරීම.	නියාමකයින්, ගනුදෙනුකරුවන්, ප්‍රජාව, සේවකයින්, කොට්ස්කරුවන්, හවුල්කරුවන්, සේවා සපයන්නන්

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



ප්‍රතිඵලය

විස්තීර්ණ අභ්‍යන්තර සහ බාහිර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම සකස් කිරීම.

වැඩිදුර පරිශීලනය

මානව ප්‍රාග්ධන

T9 - ගනුදෙනුකරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම

පාරිභෝගික දත්ත සහ මූල්‍ය තොරතුරු ආරක්ෂා කිරීම ඔවුන්ගේ මූලික අයිතිවාසිකමකි. වම පදනම සහතික කිරීම සඳහා අපගේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් තුළ ඇති විය හැකි සයිබර් තර්ජන සහ ජාල අවදානම් අවම කිරීමට අවශ්‍ය සියලු පියවර අපි ගෙන ඇත්තෙමු. මීට අමතරව, මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් හරහා ආරක්ෂිතව භෞතික සහ ඩිජිටල් ගනුදෙනු සිදු කරන ආකාරය පිළිබඳව අපි ගනුදෙනුකරුවන් දැනුවත් කරමු.

අපගේ ප්‍රවේශයන්

- ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූලව සයිබර් ආරක්ෂණ සහ තොරතුරු තාක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම.
- පාරිභෝගික අයිතිවාසිකම් සහ ආරක්ෂණ මාර්ගෝපදේශයන්ට අනුකූල වීම
- ණයගැතියන්ගේ දුක්ගැනවිලි සඳහා සාධාරණ සහ කඩිනම් විසඳුම් ලබා දීම.

- සේවා සහ ණය කොන්දේසි පිළිබඳව පැහැදිලි සන්නිවේදනයක් සැපයීම සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- විධිමත් අභ්‍යන්තර පැමිණිලි විසඳීමේ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම.
- ආරක්ෂිත මාර්ගගත බැංකුකරණය සහ මූල්‍ය වංචා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් (සාක්ෂරතා වැඩසටහන්) පැවැත්වීම.

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
මානව සහ සමාජීය ප්‍රාග්ධනය • සේවා සහ ණය කොන්දේසි පිළිබඳව පැහැදිලි සන්නිවේදනයක් සැපයීම සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම. • විනිවිදභාවය සහ සාධාරණත්වය සහතික කිරීම සඳහා විධිමත් අභ්‍යන්තර පැමිණිලි විසඳීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම.	සේවකයින්, නියාමකයින්
සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය • පාරිභෝගික අයිතිවාසිකම් සහ ආරක්ෂණ මාර්ගෝපදේශයන්ට අනුකූල වීම • ණයගැතියන්ගේ දුක්ගැනවිලි සඳහා සාධාරණ සහ කඩිනම් විසඳුම් ලබා දීම. • ආරක්ෂිත මාර්ගගත බැංකුකරණය සහ මූල්‍ය වංචා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් (මූල්‍ය සාක්ෂරතා මුලපිරීම්).	නියාමකයින්, ප්‍රජාව, ගනුදෙනුකරුවන් (ණයගැතියන්) බුද්ධිමය ප්‍රාග්ධනය
බුද්ධිමය ප්‍රාග්ධනය • ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූලව සයිබර් ආරක්ෂණ සහ තොරතුරු තාක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම.	ගනුදෙනුකරුවන්, නියාමකයින් (ශ්‍රී ලංකා මහ බැංකුව), ප්‍රජාව

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



ප්‍රතිඵලය

වර්ෂය තුළ පාරිභෝගික අයිතිවාසිකම් හෝ පෞද්ගලිකත්ව උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් කිසිදු සිදුවීමක් හෝ පැමිණිල්ලක් වාර්තා නොවීම.

වැඩිදුර පරිශීලනය

සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය

මානව ප්‍රාග්ධනය

T10 - ඉහළ නැංවුණු ප්‍රවේශ්‍යතාව

අතිශය විචක්ෂණශීලී සහ ප්‍රවේශම් සහගත ලෙස ඩිජිටල් වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී. බැංකුවේ මූල්‍ය නිෂ්පාදන සහ සේවාවන් පිළිබඳ නිතිපතා යාවත්කාලීන කිරීම් ද ඇතුළත් කරමින්, වෙබ් අඩවියේ පෙනුම සහ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදී.

අපගේ ප්‍රවේශය

- ඔන්ලයින් බැංකුකරණය ද ඇතුළුව වෙබ් අඩවියේ පෙනුම, තොරතුරු සහ ක්‍රියාකාරිත්වයන් වැඩිදියුණු කිරීම.
- අපගේ ඔන්ලයින් බැංකු ද්වාරය වන 'HDFC කිලික්' සහ 'ජස්ට් පේ' තාක්ෂණය පදනම් කරගත් ඇප්ස් හරහා ඩිජිටල් ගනුදෙනු දිරිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.
- නිවසටම පැමිණ සේවා සපයන බැංකු සේවාව.
- පාරිභෝගික ඇමතුම් මධ්‍යස්ථානය.
- ශාඛා මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම (දිට්වා සුළි කුණාටුව පැවති සමයේ වසා දැමූ අවස්ථාවන් හැර).

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
බුද්ධිමය ප්‍රාග්ධනය • ඔන්ලයින් බැංකුකරණය ද ඇතුළුව වෙබ් අඩවියේ පෙනුම, තොරතුරු සහ ක්‍රියාකාරිත්වයන් වැඩිදියුණු කිරීම.	
සමාජීය හා සබඳතා ප්‍රාග්ධනය / බුද්ධිමය ප්‍රාග්ධනය: • 'HDFC ක්ලික්' සහ ජස්ට් පේ තාක්ෂණය පදනම් කරගත් ඇප්ස් හරහා ඩිජිටල් ගනුදෙනු දිරිමත් කිරීම. • මූල්‍ය පහසුකම් අවම සහ දුරස්ථ ප්‍රදේශවල වෙසෙන ගනුදෙනුකරුවන් සඳහා ප්‍රවේශ්‍යතාව වැඩිදියුණු කිරීමට නිවසටම පැමිණ සේවා සපයන බැංකු සේවාව ක්‍රියාත්මක කිරීම. • පාරිභෝගික විමසීම්වලට සහය වීමට සහ සේවා ප්‍රවේශ්‍යතාව වැඩිදියුණු කිරීමට පාරිභෝගික ඇමතුම් මධ්‍යස්ථාන මෙහෙයුම් පවත්වාගෙන යාම.	හවුල්කරුවන්, ගනුදෙනුකරුවන්, ප්‍රජාව
නිෂ්පාදිත සහ සමාජීය ප්‍රාග්ධනය • සේවාවන් සඳහා බාධාවකින් තොරව ප්‍රවේශ වීමේ හැකියාව සහතික කරනු පිණිස ශාඛා මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම (මඟහැරිය නොහැකි හේතු මත වසා දැමූ අවස්ථාවන් හැර).	

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



අදාළ වැදගත් කරුණු

ප්‍රතිඵලය

වෙබ් අඩවියේ විශේෂාංග සහ ක්‍රියාකාරිත්වයන් වැඩිදියුණු වීම.

දිවයින පුරා නිවසටම පැමිණ සේවා සපයන බැංකු සේවාවන්සාර්ථකව ක්‍රියාත්මක කිරීම.

වර්ෂය තුළ කිසිදු ශාඛාවක් වසා නොදැමීම.

වැඩිදුර පරිශීලනය

නිෂ්පාදිත ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනය

සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය

T11 - පාරිසරික තිරසාරත්වය සහ වගවීම

වර්ෂය තුළ, පාරිසරික තිරසාරත්වය වෙනුවෙන් අපගේ දායකත්වය ශක්තිමත් කිරීමට අපි කටයුතු කළෙමු. මෙය අපගේ අභිලාෂයන් සහ මූල්‍ය බැඳීම් අතර නිසි සමබරතාවයක් පවත්වා ගනිමින්, දිගුකාලීන යහපත් බලපෑම් සහතික කිරීම සඳහා ක්‍රමයෙන් පියවර ගනිමින් සිදු කරන ලදී.

අපගේ ප්‍රවේශයන්

- කාර්යාල පුරා ක්‍රියාත්මක වන විනයගරුක අපද්‍රව්‍ය සහ බලශක්ති අවම කිරීමේ සන්ධාන.
- පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමට හරිත ඉතුරුම් සහ ණය නිෂ්පාදන හඳුන්වා දීම.
- බැංකු ශාඛා තුළ සූර්ය බලශක්ති උත්පාදනය.
- අපගේ කාබන් පියසටහන පාලනය කර ගත හැකි පරිදි ප්‍රශස්ත ශාඛා සංඛ්‍යාවක් පවත්වා ගැනීම.
- වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන.
- ඉවතලන ප්ලාස්ටික් බෝතල් එකතු කිරීමේ ව්‍යාපෘතිය.
- ප්‍රතිචක්‍රීකරණය සඳහා ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කරන්නන් සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම.

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
ස්වභාවික සහ සමාජීය ප්‍රාග්ධනය	
• පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමට හරිත ඉතුරුම් සහ ණය නිෂ්පාදන හඳුන්වා දීම. • පාරිසරික සංරක්ෂණයට දායක වීම සඳහා වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	ගනුදෙනුකරුවන්, ප්‍රජාව, නියාමකයින්, සේවකයින්
ස්වභාවික ප්‍රාග්ධනය	
• කාර්යාල පුරා ක්‍රියාත්මක වන විනයගරුක අපද්‍රව්‍ය සහ බලශක්ති අවම කිරීමේ ප්‍රොටෝකෝල. • කාබන් විමෝචනය අවම කිරීම සඳහා තෝරාගත් ශාඛාවල සූර්ය බලශක්තිය උත්පාදනය කිරීම. • කාබන් පියසටහන පාලනය කර පවත්වා ගැනීම සඳහා ප්‍රශස්ත ශාඛා සංඛ්‍යාවක් පවත්වා ගැනීම. • පාරිසරික දූෂණය අවම කිරීම සඳහා (බාහිර පාර්ශවීය සමාගමක් සමඟ ඒකාබද්ධව) පලාස්ටික් බෝතල් එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම.	සේවකයින්, නියාමකයින්, ප්‍රජාව, කොටස්කරුවන්

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



ප්‍රතිඵලය

හරිත ඉතුරුම් සහ මූල්‍ය නිෂ්පාදන (නිෂ්පාදන 3ක්).

ප්‍රතිචක්‍රීකරණය කරන ලද ප්ලාස්ටික් බෝතල් ප්‍රමාණය - කිලෝග්‍රෑම් 681 කි.

සමස්ත සූර්ය බලශක්ති උත්පාදනය - චීකක 6,749 කි.

සමස්ත ජල ඉතිරිය (ශාඛා සඳහාද/ප්‍රධාන කාර්යාලය සඳහාද නැතහොත් දෙකෙහිමද යන්න).

පිරිසිදු කරන ලද වෙරළ තීරය - කිලෝමීටර 2කට වඩා වැඩි.

වැඩිදුර පරිශීලනය

ස්වභාවික ප්‍රාග්ධනය

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක

T12 - ප්‍රජා සංවර්ධනය සහ සංවර්ධන මූල්‍යකරණය

විශේෂිත බැංකුවක් ලෙස, අපගේ මෙහෙවර සාමාන්‍ය මූල්‍ය ගනුදෙනුවලින් ඔබ්බට යන්නකි. අපගේ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ මූල්‍ය යහපැවැත්ම පවත්වා ගැනීම පිළිබඳව උපදෙස් ලබා දීම සහ විවිධ මූල්‍ය වංචා මෙන්ම සිදුවිය හැකි තර්ජනවලින් ඔවුන්ගේ මූල්‍ය තොරතුරු ආරක්ෂා කර ගැනීම සහතික කිරීම වෙනුවෙන් අපි කැපවී සිටිමු.

අපගේ ප්‍රවේශයන්

- මූල්‍ය සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා සාක්ෂරතාවය සහ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.
- මූල්‍ය දුෂ්කරතාවලට පත්ව සිටින ණයගැතියන් සඳහා මූල්‍ය ආරක්ෂණ ජාලයක් සැපයීම පිණිස ණය ප්‍රතිව්‍යුහගත කිරීම.

- ශාඛා වෙත ළඟාවීමට අපහසු, දුරස්ථ ප්‍රදේශවල වෙසෙන පිරිස් වෙත සමීප වීම සඳහා නිවසටම පැමිණ සේවා සපයන බැංකු සේවාවී භාවිත කිරීම.
- ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ජීවනෝපාය මාර්ග සීමිත වූ පුද්ගලයන් සඳහා ණය පහසුකම් ලබා ගැනීමේ අවස්ථා පුළුල් කිරීම.

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක් ඇති පාර්ශවකරුවන්
සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය • පාරිභෝගික සුරක්ෂිතතාවය තහවුරු කිරීම සහ වංචාවලින් ආරක්ෂා වීම සඳහා මූල්‍ය සාක්ෂරතාවය සහ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම. • ශාඛා වෙත ළඟාවීමට සීමිත අවස්ථා ඇති ගනුදෙනුකරුවන් වෙත සමීප වීම සඳහා නිවසටම පැමිණ සේවා සපයන බැංකු සේවාව භාවිත කිරීම.	ගනුදෙනුකරුවන් - (ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, අඩු ආදායම්ලාභී පුද්ගලයන්/නිවාස ඒකක, සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්), ප්‍රජාව, නියාමකයින්

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



ප්‍රතිඵලය

විවිධ ප්‍රජාවන් සමඟ ශක්තිමත් සබඳතා ගොඩනඟා ගැනීම.

වැඩිදුර පරිශීලනය

සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය

T13 - යටිතල පහසුකම් ආයෝජන

2025 මුදල් වර්ෂය තුළ කිසිදු ප්‍රාග්ධන වියදමක් සිදු නොකරමින්, අපි අඛණ්ඩව අරපිරිමැස්ම සහ විචක්ෂණශීලීභාවය සහිත මාවතක ගමන් කළෙමු. කෙසේ වුවද, අපගේ ඩෙබිට් කාඩ්පත නැවත හඳුන්වා දීම මෙම වසර තුළදී සිදු කරන ලදී. මෙවැනි විචක්ෂණශීලී පියවරයන් හේතුවෙන් අපගේ ප්‍රාග්ධන සංචිතවලට බරක් වීමට හෝ මූල්‍ය ප්‍රතිපාදන අනවශ්‍ය ලෙස වැය වීමට අපි ඉඩ නොතැබුවෙමු.

අපගේ ප්‍රවේශය

- පවත්නා ඩිජිටල් ගනුදෙනු මාර්ග මඟින් භෞතික යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය තාවකාලිකව මඟහරවා ගැනීම.
- වත්කම් නඩත්තු කිරීම සහ ඒවා උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිත කිරීම.
- වියදම් කිරීමට පෙර විචක්ෂණශීලීභාවය සහ පුළුල් සැලසුම්කරණයක් අවශ්‍ය වන විධිමත් ලංසු තැබීමේ/ටෙන්ඩර් ක්‍රියාවලියක් මත පදනම්ව ප්‍රසම්පාදන සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ප්‍රවේශයන් සහ ප්‍රාග්ධන වටිනාකම් නිර්මාණය	බලපෑමක්ඇති පාර්ශවකරුවන්
මූල්‍ය ප්‍රාග්ධනය • ප්‍රාග්ධන සංචිත මත කිසිදු බරක් ඇති නොවන බව සහතික කරමින්, ශූන්‍ය ප්‍රාග්ධන වියදම් සමඟ අඛණ්ඩව අරපිරිමැස්මෙන් කටයුතු කිරීම.	කොටස්කරුවන්, ආයෝජකයින් නියාමකයින්
බුද්ධිමය ප්‍රාග්ධනය • විශාල යටිතල පහසුකම් වියදමකින් තොරව ගනුදෙනුකරුවන්ගේ පහසුව වැඩිදියුණු කිරීම සඳහා ඩෙබිට් කාඩ්පත නැවත හඳුන්වා දීම. • භෞතික යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය තාවකාලිකව මඟහරවා ගැනීම සඳහා පවත්නා ඩිජිටල් ගනුදෙනු මාර්ග උපරිමයෙන් භාවිත කිරීම.	හවුල්කරුවන්, සේවා සපයන්නන්, ගනුදෙනුකරුවන්, ප්‍රජාව, නියාමකයින්, සේවකයින්
නිෂ්පාදිත සහ මූල්‍ය ප්‍රාග්ධනය • වත්කම්වල ආයු කාලය දීර්ඝ කිරීම සහ අනවශ්‍ය වියදම් අවම කිරීම සඳහා වත්කම් නිසි ලෙස නඩත්තු කිරීම සහ ඒවා ප්‍රශස්ත ලෙස භාවිත කිරීම.	කොටස්කරුවන්, සේවකයින්, නියාමකයින්
බුද්ධිමය / සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය: • විචක්ෂණශීලීභාවය, විනිවිදභාවය සහ වගකීම් සහගත ප්‍රසම්පාදනය සහතික කරන විධිමත් ලංසු තැබීමේ/ටෙන්ඩර් ක්‍රියාවලියක් අනුගමනය කිරීම.	සැපයුම්කරුවන්, නියාමකයින්, ප්‍රජාව

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අනුකූලතාව



ප්‍රතිඵලය

ප්‍රාග්ධන වියදම් සහිත යටිතල පහසුකම් ආයෝජනයන් කිසිවක් සිදු නොවීම.

දේපළ, පිරියත සහ උපකරණ සඳහා රුපියල් මිලියන 24.6 ක වකතු කිරීම් සිදු කර තිබීම සහ සමස්ත ජඡෑ වටිනාකම අඩු වී තිබීම.

වැඩිදුර පරිශීලනය

නිෂ්පාදිත ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනය

සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය

මූල්‍ය ප්‍රාග්ධනය

උපායමාර්ග සහ සම්පත් වෙන්කිරීම

මෙහෙයුම් අවධානය (2025)

2025 මුදල් වර්ෂය තුළදී, බැංකුවේ ණය පැතිකඩ ශක්තිමත් කිරීම කෙරෙහි අපි අපගේ විශේෂ අවධානය යොමු කළෙමු. මේ සඳහා පැහැදිලි හා සුදුසු ක්‍රියාවලි සහ සීමාවන් මඟින් සහය දක්වන, ඇපකර මත පදනම් වූ ණය දීම් කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් අපගේ ණය කළමනාකරණ විනය වඩාත් තීව්‍ර කිරීමට අපට සිදු විය (වැඩි විස්තර සඳහා කරුණාකර අවදානම් කළමනාකරණ වාර්තාව බලන්න). අපගේ මෙම විනයගරුක ණය කළමනාකරණ ක්‍රියාවලිය හේතුවෙන්, වඩා හොඳ ප්‍රතිපූරණ හැකියාවක් සහිත, ණය සුදුසුකම් සපිරෑ ගනුදෙනුකරුවන් බැංකුව වෙත බඳවා ගැනීම සඳහා ණයගැතියන් තෝරා ගැනීමේ නිර්ණායක වඩාත් දැඩි කිරීමට ද පියවර ගන්නා ලදී.

මීට සමගාමීව, අක්‍රීය ණය ආශ්‍රිත ප්‍රාග්ධනය අවම කිරීම සහ සමස්ත කළඹේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ණය අයකර ගැනීම් කෙරෙහි වූ අපගේ අවධානය අපි තවදුරටත් දැඩි කළෙමු. ණය අයකර ගැනීමේ අනුපාත වැඩිදියුණු කිරීමේ උපායමාර්ගවලට " කල් ඉකුත් වූ ණයගැතියන් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් පවත්වා ගැනීම සහ ඔවුන් සමඟ අඛණ්ඩව සම්බන්ධ වීම ඇතුළත් වූ අතර, සුදුසු අවස්ථාවන්හිදී ණය ප්‍රතිපූරණ ව්‍යුහයන් ප්‍රතිව්‍යුහගත කිරීම වැනි පූර්ව ක්‍රියාකාරී ක්‍රමවේදයන් ද භාවිත කරන ලදී. එහිදී ණය පැහැර හැරීමේ ඉහළ සම්භාවිතාවක් ඇති ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් වඩාත් දැඩි පසු විපරම් ක්‍රියාවලියක් බැංකුව විසින් අනුගමනය කරනු ලැබීය.

එපමණක් නොව, සේවක අර්ථසාධක අරමුදල මත පදනම් නොවන ණය පහසුකම් වෙත ණය කළඹෙ විවිධාංගීකරණය කිරීම මඟින්, කේන්ද්‍රගත වීමේ අවදානම අවම කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. මේ සම්බන්ධයෙන්, ලීසිං (බදුදීම්) සහ රන් ණය අංශ පුළුල් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, කොටිකාලීන වත්කම් මත පදනම් වූ ණය වර්ග ලබා ගැනීමට අපි ණයගැතියන් දිරිමත් කළෙමු. මෙය අපගේ ඇපකර ආවරණය වැඩිදියුණු කරන අතරම, බැංකුවේ ආදායම් පදනම පුළුල් කිරීමේ බර යම් දුරකට සැහැල්ලු කිරීමට ද උපකාරී විය.

මීට අමතරව, පරිවර්තනය සහ වර්ධනය කේන්ද්‍ර කරගනිමින් 2026-2030 කාලසීමාව සඳහා වන ව්‍යුහගත පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම ද 2025 වසරේදී බැංකුව විසින් සම්පූර්ණ කරන ලදී. මෙම මාර්ග සිතියම බැංකුවේ මූල්‍ය ශක්තිය සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා පැහැදිලි මාවතක් සකසා දී ඇත. මෙම සැලැස්ම මඟින් ප්‍රාග්ධන හා ද්‍රවශීලතා කළමනාකරණය මෙන්ම විනයගරුක උපායමාර්ග හරහා වත්කම්වල ගුණාත්මකභාවය ශක්තිමත් කිරීම සඳහා අප සතු කැපවීම තවදුරටත් තහවුරු කරයි. තවද, එය ඩිජිටල්කරණය, නවෝත්පාදනය සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් මූල්‍ය නොවන ඉලක්ක සහ අරමුණු ද තමන් සතු කරගනී.

- බැංකුවේ ණය පැතිකඩ ඉහළ නැංවීම කෙරෙහි දැඩි අවධාරණයක් යොමු කිරීම.
- ණය අයකර ගැනීම් වැඩිදියුණු කිරීම සහ අක්‍රීය ණය අවම කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.
- කේන්ද්‍රගත වීමේ අවදානම අවම කිරීම.
- තිරසාර වර්ධනයක් සඳහා පස් අවුරුදු සැලැස්මක් (2026-2030) සකස් කිරීම.

උපායමාර්ගික ඉදිරි දැක්ම (2026-2030)

බැංකුව මාස පහක් පුරා විහිදුණු සහ පියවර 11කින් සමන්විත, ඉහළ විධිමත්භාවයකින් සහ දැඩි ප්‍රමිතියකින් යුත් සැලසුම්කරණ ක්‍රියාවලියක නිරත විය. විවිධ දෙපාර්තමේන්තු සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා ඇතුළුව, කළමනාකාරිත්වය සහ ආයතනයේ විවිධ කාර්යභාරයන් නියෝජනය කරන අන්තර්-ක්‍රියාකාරී කණ්ඩායම්වල සාමූහික සහයෝගීතාවය සහ මැදිහත්වීම් මත මෙම සැලැස්ම සම්පූර්ණ කරන ලදී.

මෙම පස් අවුරුදු උපායමාර්ගික මාර්ග සිතියම පහත සඳහන් ක්‍රියාවලියේ ප්‍රතිඵලයකි:

- බුද්ධි කළම්බන සැසිය
- උපායමාර්ගික විශ්ලේෂණය
- ස්වොට් විශ්ලේෂණය
- උපායමාර්ගික දිශානතිය " අරමුණු සමඟ සමපාත වූ
- උපකාරක ක්‍රියාමාර්ග
- විධායක මට්ටමේ සාකච්ඡා
- ඉලක්ක සමාලෝචනය
- අවසාන තීරණවලට එළැඹීම
- සන්නිවේදනය
- ප්‍රධාන කාර්යසාධන දර්ශක ක්‍රියාත්මක කිරීම
- නියාමන ආයතන වෙත ඉදිරිපත් කිරීම

වර්ධනයේ ගාමක බලවේග (උපායමාර්ගික උත්ප්‍රේරක දහය)

නිවාස මූල්‍යකරණ ඉල්ලුම ව්‍යාප්ත වීම

මධ්‍යම පාන්තික කුටුම්භයන්ගේ වර්ධනය සහ නාගරීකරණය හේතුවෙන් දැරිය හැකි මිලකට ඇති නිවාස සඳහා වන ඉල්ලුම පුළුල් වෙමින් පවතී. සිරස් නිවාස සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීම සඳහා රජය අනුගමනය කරන ප්‍රතිපත්ති මඟින් ණය වර්ධනය වේගවත් කරයි.

ඩිජිටල් පරිවර්තනය

ඩිජිටල් බැංකුකරණය, ජංගම දුරකථන මූලික කරගත් විසඳුම් සහ ඉලෙක්ට්‍රොනිකව පාරිභෝගිකයා හඳුනා ගැනීමේ ක්‍රියාවලිය වේගයෙන් වර්ධනය වීම හේතුවෙන් අඩු පිරිවැයකින් වෙළෙඳපොළ ආක්‍රමණය කිරීමට අවස්ථාව සැලසේ. ස්වයංක්‍රියකරණය සහ දත්ත විශ්ලේෂණය මඟින් සේවා සැපයීමේ වේගය තවදුරටත් ඉහළ නංවයි.

සුළු හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර මූල්‍ය වර්ධනය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නැවත යථා තත්ත්වයට පත්වීමත් සමඟ ඉදිකිරීම් ක්ෂේත්‍රයට සම්බන්ධ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, නිවාස කොන්ත්‍රාත්කරුවන් සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් සඳහා නව අවස්ථා නිර්මාණය වේ. රජයේ ප්‍රතිමූල්‍යකරණ පහසුකම් මඟින් මේ සඳහා අඩු පිරිවැය අරමුදල් සැපයේ.

නියාමන සහ ප්‍රතිපත්තිමය අනුකූලතාව

ජාතික නිවාස ප්‍රතිපත්තිය, තිරසාර මූල්‍ය මාර්ගෝපදේශ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණ දිශානතිය සමඟ සමපාත වීම. රජයේ සහයෝගය ලබන දැරිය හැකි නිවාස යෝජනා ක්‍රම මඟින් උදාවන ව්‍යාපාරික අවස්ථා උපරිමයෙන් භාවිත කිරීම

අඩු පිරිවැය අරමුදල් සැපයීමේ මූලපිරීම්

ණයකර, කාලීන තැන්පතු සහ හරිත මූල්‍යකරණය හරහා ආයෝජන විවිධාංගීකරණය කිරීම. දැරිය හැකි මිලකට නිවාස ලබා දීමේ ව්‍යාපෘති සඳහා බහුපාර්ශවීය ආයතනවලින් දිගුකාලීන සහනදායී අරමුදල් ලබා ගැනීමට ඇති හැකියාව.

භූගෝලීය සහ වෙළෙඳපොළ ආක්‍රමණය

පිරිවැය අවම ඩිජිටල් ශාඛා සහ නියෝජිත සහය සහිත බැංකුකරණය හරහා බැංකු සේවා අවම වශයෙන් ලැබෙන පළාත් වෙත සේවාවන් ව්‍යාප්ත කිරීම. පාරිභෝගික පදනම පුළුල් කර ගැනීම සඳහා පළාත් පාලන ආයතන සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම.

ණය අවදානම සහ කළඹේ ගුණාත්මකභාවය

දියුණු අවදානම් විශ්ලේෂණ සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති මඟින් ඵලදායී ණය අවම කිරීම. ණය සුරැකුම්කරණ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම මඟින් වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ වඩාත් ශක්තිමත් ණය අයකර ගැනීමේ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම.

මෙහෙයුම් කාර්යක්ෂමතාව

කාර්ය පටිපාටි ප්‍රතිසංස්කරණය, කාර්ය ප්‍රවාහයන් ඩිජිටල්කරණය සහ පිරිවැය විනය මඟින් පිරිවැය-ආදායම් අනුපාතය වැඩිදියුණු කිරීම. පසු කාර්යාල කටයුතු ස්වයංක්‍රියකරණය කිරීම මඟින් ඵලදායීතාව ඉහළ නැංවීම.

නිෂ්පාදන විවිධාංගීකරණය

හරිත නිවාස ණය, විදේශගත ශ්‍රමික නිවාස ණය, නිවාස අලුත්වැඩියා ක්ෂුද්‍ර ණය සහ තරුණ ප්‍රජාව උදෙසා වන ආරම්භක නිවාස ණය ව්‍යාප්ත කිරීම. ගාස්තු පදනම් කරගත් සේවාවන් මඟින් පොලී නොවන ආදායම් මාර්ග ඉහළ නැංවීම.

පාරිභෝගිකයා කේන්ද්‍ර කරගත් සේවාව

තරුණයින්, කාන්තාවන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ප්‍රථම වරට නිවාස මිලදී ගන්නන් ඉලක්ක කරගත් ශක්තිමත් සන්නාම සන්නිවේදනයක් පවත්වා ගැනීම. පාරිභෝගික අත්දැකීම් ඉහළ නැංවීම මඟින් ඔවුන්ගේ විශ්වාසවන්තභාවය සහ නිර්දේශ කිරීම් වර්ධනය කර ගැනීම.

ඉහත විස්තරය මඟින් 2026-2030 කාලසීමාව තුළ වර්ධනය වේගවත් කිරීම සඳහා හඳුනාගෙන ඇති බැංකුවේ උපායමාර්ගික උත්ප්‍රේරක 10 සාරාංශගත කරයි. මේවා මඟින් ආදායම් සහ ලාභදායීත්වයේ වර්ධනය, පාරිභෝගික වර්ධනය, ඩිජිටල් හැකියාව, අවදානම් විනය සහ තිරසාරත්වය යන ප්‍රධාන සාධක අන්තර්ගත වන අතර, උපායමාර්ගික මූලපිරීම් අතරින් ප්‍රමුඛතා හඳුනා ගැනීමට මඟ පෙන්වයි.

උපායමාර්ග සහ උපායමාර්ගික මූලපිරීම් (2026-2030)

2026-2030 උපායමාර්ගය සැලසුම් කර ඇත්තේ බැංකුවේ සමස්ත උපායමාර්ගයට ඇතුළත් වන ක්ෂේත්‍ර කිහිපයක කාර්යසාධනය ශක්තිමත් කිරීම මඟින් තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම සඳහාය.

සමස්ත උපායමාර්ගයේ අංශයන්

- මූල්‍ය ස්ථාවරත්වය ශක්තිමත් කිරීම
- ප්‍රමුඛතා අංශයන්හි වර්ධනය වේගවත් කිරීම
- ඩිජිටල් සහ නවෝත්පාදන නායකත්වය ළඟා කර ගැනීම
- ලාභදායීත්වය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය ඉහළ නැංවීම

උපායමාර්ග සහ සම්පත් වෙන්කිරීම

උපායමාර්ගික මූලපිරීම් සහ ඒකාබද්ධ චින්තනය

පහත දැක්වෙන්නේ 2026-2030 පස් අවුරුදු කාලසීමාව සඳහා බැංකුවේ ප්‍රධාන ප්‍රමුඛතා පිළිබඳ දළ සටහනකි. විනිවිදභාවය ඉහළ නැංවීම සහ ඒකාබද්ධ වාර්තාකරණය සමඟ සමපාත වීම තහවුරු කරනු පිණිස, එක් එක් මූලපිරීම් ඊට අදාළ ප්‍රාග්ධනයන් සහ එම උපායමාර්ගික මූලපිරීම් ළඟා කර ගැනීමට දායක වන හෝ ඉන් බලපෑමට ලක්වන ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ අනුගත කර ඇත. මේ හරහා, අපගේ උපායමාර්ගික දැක්මේ සිට සියලුම පාර්ශවකරුවන් වෙනුවෙන් වටිනාකම් නිර්මාණය කරන ප්‍රතිඵල දක්වා පැහැදිලි සහ සෘජු මාවතක් සැපයීමට අපි අදහස් කරමු.

වගකීම් ප්‍රකාශය: මෙම උපායමාර්ගික මාවතට අනුකූල වන ප්‍රතිඵල සහ සන්ධිස්ථාන මීළඟ මුදල් වර්ෂයේදී ඉදිරිපත් කරනු ඇත. පහත සඳහන් කරුණු සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මකට අනුව ක්‍රියාවට නංවනු ලබන බැවින්, එහි පැහැදිලි ප්‍රතිඵල දැකගත හැකි වන්නේ 2026 මුදල් වර්ෂය අවසානයේදී පමණි. කෙසේ වුවද, මෙම ප්‍රගතිය ක්‍රමයෙන් සිදුවන්නක් බවත්, මෙහෙයුම් පරිසරය තුළ ඇති විය හැකි අනාගත අවිනිශ්චිතතාවන් සහ මඟහැරිය නොහැකි තත්ත්වයන් හේතුවෙන් ඇතැම් අරමුණු සපුරා ගැනීමට දීර්ඝ කාලයක් අවශ්‍ය විය හැකි බවත් සැලකිල්ලට ගන්නා ලෙස අපි අපගේ පාර්ශවකරුවන්ට දන්වා සිටිමු. සියලුම පාර්ශවකරුවන් බැංකුවේ උපායමාර්ගික දිශානතිය සමඟ නිරන්තරයෙන් යාවත්කාලීන වෙමින් එකඟතාවෙන් පසුවීම සහතික කරනු පිණිස, ප්‍රගතිය සහ ජයග්‍රහණ විනිවිදභාවයකින් යුතුව ඉදිරියටත් සන්නිවේදනය කරනු ඇත

මූල්‍ය වර්ධනය සහ ලාභදායීත්වය

- ප්‍රධාන නිවාස ණය පෝට්ෆෝලියෝව ශක්තිමත් කිරීම.
- අරමුදල් මාර්ග විවිධාංගීකරණය කිරීම සහ පිරිවැය අවම කිරීම.
- ලාභදායීත්වය සහ ව්‍යාපාරික පරිමාණය වැඩිදියුණු කිරීම.

ඩිජිටල් පරිවර්තනය සහ නවෝත්පාදනය

- ආරම්භයේ සිට අවසානය දක්වා සම්පූර්ණ ඩිජිටල් ණය ඩීමේ පද්ධතියක් ගොඩනැඟීම.
- මූලික බැංකු පද්ධතිය සහ දත්ත කළමනාකරණය නවීකරණය කිරීම.
- සයිබර් ආරක්ෂණය ශක්තිමත් කිරීම

ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් සහ අවදානම් කළමනාකරණය

- වේගවත් සහ විනිවිදභාවයෙන් යුත් නිවාස මූල්‍යකරණ සේවාවන් සැපයීම.
- ඩිජිටල්කරණය සහ බාහිර සේවා ලබා ගැනීම .
- ණය අයකර ගැනීම් සහ අක්‍රීය ණය කළමනාකරණය ශක්තිමත් කිරීම.
- ශක්තිමත් ප්‍රාග්ධන සහ අනුකූලතා පාලනයක් ගොඩනැඟීම.

පාරිසරික, සමාජීය සහ පාලන තිරසාරත්වය

- ඩිජිටල් තාක්ෂණයෙන් සබල ගැන්වූ ශ්‍රම බලකායක් බිහි කිරීම.
- කාර්යසාධනය මත පදනම් වූ ආයතනික සංස්කෘතියක් ඇති කිරීම.
- හරිත හා තිරසාර නිවාසකරණය ප්‍රවර්ධනය කිරීම.
- බැංකුවේ කාබන් පියසටහන අවම කිරීම.

1 මූල්‍ය වර්ධනය සහ ලාභදායීත්වය

මූලපිරීම	අදාළ ප්‍රාග්ධනයන්	ප්‍රධාන පාර්ශවකරුවන්
ප්‍රධාන නිවාස ණය කළඹ ශක්තිමත් කිරීම	මූල්‍ය, නිෂ්පාදිත, සමාජීයසහ සබඳතා	ගනුදෙනුකරුවන් (නිවාස මිලදී ගන්නන්), නියාමකයින්, ආයෝජකයින්
අරමුදල් මාර්ග විවිධාංගීකරණය කිරීම සහ පිරිවැය අවම කිරීම	මූල්‍ය, සමාජීය සහ සබඳතා	තැන්පත්කරුවන්, ආයෝජකයින්, ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන, නියාමකයින්
ලාභදායීත්වය සහ ව්‍යාපාරික පරිමාණය වැඩිදියුණු කිරීම	මූල්‍ය, නිෂ්පාදිත, බුද්ධිමය	කොටස්කරුවන්, සේවකයින්, නියාමකයින්

2 ඩිජිටල් පරිවර්තනය සහ නවෝත්පාදනය

මූලපිරීම	අදාළ ප්‍රාග්ධනයන්	ප්‍රධාන පාර්ශවකරුවන්
ආරම්භයේ සිට අවසානය දක්වා සම්පූර්ණ ඩිජිටල් ණය ඩීමේ පද්ධතියක් ගොඩනැඟීම	බුද්ධිමය, නිෂ්පාදිත, මානව, මූල්‍ය	සිල්ලර සහ සුළු හා මධ්‍ය පරිමාණ ගනුදෙනුකරුවන්, ෆින්ටෙක් හවුල්කරුවන්, සේවකයින්, නියාමකයින්
මූලික බැංකු පද්ධතිය සහ දත්ත කළමනාකරණය නවීකරණය කිරීම	බුද්ධිමය, නිෂ්පාදිත, මානව	තාක්ෂණික හවුල්කරුවන්, සේවකයින්, නියාමකයින්, ගනුදෙනුකරුවන්
සයිබර් ආරක්ෂණය ශක්තිමත් කිරීම	බුද්ධිමය, සමාජීය සහසබඳතා, මානව	ගනුදෙනුකරුවන්, නියාමකයින්, තාක්ෂණික හවුල්කරුවන්, සේවකයින්

3 ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් සහ අවදානම් කළමනාකරණය

මූලපිරීම	අදාළ ප්‍රාග්ධනයන්	ප්‍රධාන පාර්ශවකරුවන්
වේගවත් සහ විනිවිදභාවයෙන් යුත් නිවාස මූල්‍යකරණ සේවාවන් සැපයීම	සමාජීය සහ සබඳතා, නිෂ්පාදිත, බුද්ධිමය	ගනුදෙනුකරුවන්, හවුල්කරුවන්, නියාමකයින්
ඩිජිටල්කරණය සහ බාහිර සේවා ලබා ගැනීම	නිෂ්පාදිත, බුද්ධිමය,මානව ප්‍රාග්ධනය	සේවකයින්, හවුල්කරුවන්, ගනුදෙනුකරුවන්
ණය අයකර ගැනීම් සහ අක්‍රීය ණය කළමනාකරණය ශක්තිමත් කිරීම	මූල්‍ය, සමාජීය සහ සබඳතා, මානව	ගනුදෙනුකරුවන්/ ණයගැතියන්, නියාමකයින්, ආයෝජකයින්
ශක්තිමත් ප්‍රාග්ධන සහ අනුකූලතා පාලනයක් ගොඩනැඟීම	මූල්‍ය, සමාජීය සහ සබඳතා, බුද්ධිමය	නියාමකයින්, ආයෝජකයින්, අධ්‍යක්ෂ මණ්ඩලය

4. මානව ප්‍රාග්ධනය සහ පාරිසරික, සමාජීය සහ පාලන තිරසාරත්වය

මූලපිරීම	අදාළ ප්‍රාග්ධනයන්	ප්‍රධාන පාර්ශවකරුවන්
ඩිජිටල් තාක්ෂණයෙන් සබල ගැන්වූ ශ්‍රම බලකායක් බිහි කිරීම	මානව, බුද්ධිමය ප්‍රාග්ධනය	සේවකයින්, තාක්ෂණික හවුල්කරුවන්
කාර්යසාධනය මත පදනම් වූ ආයතනික සංස්කෘතියක් ඇති කිරීම	මානව, සමාජීය සහ සබඳතා	සේවකයින්, කොටස්කරුවන්
හරිත හා තිරසාර නිවාසකරණය ප්‍රවර්ධනය කිරීම	ස්වභාවික, සමාජීය සහ සබඳතා, මූල්‍ය	ගනුදෙනුකරුවන්, නියාමකයින්
බැංකුවේ කාබන් පියසටහන අවම කිරීම	ස්වභාවික, නිෂ්පාදිත, සමාජීය සහ සබඳතා	සේවකයින්, නියාමකයින්, ප්‍රජාව

ප්‍රධාන අරමුණු සහ ඉලක්ක

පහත දැක්වෙන්නේ ඉදිරි පස් වසර සඳහා බැංකුවේ අරමුණු සහ ඉලක්ක පිළිබඳ දළ විශ්ලේෂණයක් පමණි. මෙම තොරතුරුවල ඇති සංවේදීභාවය හේතුවෙන් මෙහි සවිස්තරාත්මක සංස්කරණයක් අනාවරණය කළ නොහැක

ආදායම සහ වර්ධනය

- සමබර අවදානම් පැතිකඩක් පවත්වා ගනිමින් ණය පෝට්ෆෝලියෝව පුළුල් කිරීම හරහා වාර්ෂිකව ද්වි-අංක ණය හෝ ආදායම් වර්ධනයක් ළඟා කර ගැනීම.

ද්‍රවශීලතාව සහ අරමුදල් ශක්තිය

- ස්ථාවර තැන්පතු වෙනුවට ඉතුරුම් තැන්පතු අනුපාතය ඉහළ නැංවීම.
- බාහිර කම්පනයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීම සඳහා ශක්තිමත් ද්‍රවශීලතා ස්වාරක්ෂකයක් ගොඩනැඟීමට උපකාරී වන අඩු පිරිවැය සහිත ස්ථාවර අරමුදල් මාර්ග ඉහළ නැංවීම

පිරිවැය කාර්යක්ෂමතාව සහ ලාභදායීත්වය

- පිරිවැය-ආදායම් අනුපාතය අවම කිරීම.
- පිරිවැය අඩු කිරීම සඳහා ස්වයංක්‍රීයකරණය සහ ඩිජිටල් කාර්ය ප්‍රවාහයන් උපරිමයෙන් භාවිත කිරීම.

ණය කළඹේ විවිධාංගීකරණය

- නිවාස නොවන වෙනත් ණය කාණ්ඩවල කොටස ඉහළ නැංවීම.
- කාඩ්පත්, ගෙවීම් පද්ධති සහ ඩිජිටල් සේවාවන් හරහා පොලී නොවන ආදායම් වර්ධනය කර ගැනීම

පාරිභෝගික පදනම පුළුල් කිරීම

- ඩිජිටල් සහ භෞතික මාර්ග ඔස්සේ බැංකු සේවාවන් ව්‍යාප්ත කිරීම.
- නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමේ සහ පවත්නා ගනුදෙනුකරුවන් රඳවා ගැනීමේ උපායමාර්ග වැඩිදියුණු කිරීම.

ඩිජිටල් පරිවර්තනය සහ නවෝත්පාදනය

- සෘජු ඩිජිටල් කාර්ය ප්‍රවාහයන් ක්‍රියාවට නැංවීම.
- ෆින්ටෙක්ල ටෙල්කෝ සහ ඊ-වාණිජ්‍ය වේදිකාවන් සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම

පාරිසරික, සමාජීය සහ පාලන තිරසාරත්වය සහ ආයතනික පාලන අනුකූලතාව

- හරිත මූල්‍යකරණය සහ පුනර්ජනනීය බලශක්ති ණය පහසුකම් පුළුල් කිරීම.
- ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම නියාමන සහ සයිබර් ආරක්ෂණ ප්‍රමිතීන් ළඟා කර ගැනීම.

ව්‍යාපාරික ආකෘතිය

ප්‍රාග්ධන යෙදවුම් → *නිර්මාණය කරන ලද වටිනාකම*

මූල්‍ය ප්‍රාග්ධනය

විවිධාංගීකරණය වූ අරමුදල් මාර්ග, ශක්තිමත් ප්‍රාග්ධන පදනම සහ විනයගරුක පිරිවැය කළමනාකරණය.

මානව ප්‍රාග්ධනය

නිපුණතා සහිත ශ්‍රම බලකාය, පුහුණු වැඩසටහන්, වෘත්තීය වර්ධනය සහ නායකත්වය තුළ සමානාත්මතාවය, ස්ථාවර රැකියා නියුක්තිය

බුද්ධිමය ප්‍රාග්ධනය

ප්‍රමුඛ පෙළේ ආයතනික සන්නාමය 100ක්, ආයතනික දැනුම, හිමිකාරිත්වයක් සහිත නිෂ්පාදන (පේටන්ට් බලපත්‍රලාභී නිෂ්පාදන), මූලික බැංකු පද්ධති

සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය

මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සහ ප්‍රජාව කේන්ද්‍ර කරගත් පාරිසරික තිරසාරත්ව මුලපිරීම්.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

දිවයින පුරා විහිදුණු ශාඛා ජාලය, ඩිජිටල් සේවා මාර්ග

ස්වභාවික ප්‍රාග්ධනය

බලශක්ති, ජලය සහ ද්‍රව්‍ය භාවිතය, පාරිසරික පියසටහන පාලනය සහ හරිත නිෂ්පාදන සංවර්ධනය කිරීම.

දැක්ම සහ මෙහෙවර

මූලික අරමුණ

ශ්‍රී ලාංකිකයන් උදෙසා දැරිය හැකි මිලකට නිවාස මූල්‍යකරණය සහ සියලු දෙනා ඇතුළත් කරගත් මූල්‍ය සේවාවන් සැපයීම.

මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් තිරසාරත්වය කෙරෙහි අවධානය යොමු කිරීම.

ප්‍රධාන අරමුණු

වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ අක්‍රීය ණය අනුපාත අවම කිරීම.

ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධන ප්‍රමාණවත්තාව ශක්තිමත් කිරීම.

වත්කම්-බැරකම් කළමනාකරණය ප්‍රශස්ත කිරීම.

අවදානම් පාලනය ඉහළ නැංවීම.

ප්‍රධාන කාර්යයන්

තැන්පතු බලමුලු ගැන්වීම, නිවාස ණය, අනෙකුත් ණය පහසුකම් සැපයීම, ඩිජිටල් බැංකුකරණය සහ පාර්ශෝභික සේවාව පවත්වාගෙන යාම.

ණය අවදානම් කළමනාකරණය

ණයගැතියන්ගේ ප්‍රතිපූරණ හැකියාවන් සහ වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා මෙන්ම, අක්‍රීය ණය මට්ටම් අවම කිරීම සඳහා ප්‍රමිතීන් සහ අධීක්ෂණ පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීම

වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම

පීඩනයට ලක්වූ ණය (පැහැර හරින ලද ණය) සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ අය කර ගැනීමේ ක්‍රමවේද හඳුන්වා දීම

බැඳීම් කළමනාකරණය

ස්ථාවර තැන්පතු පදනමක් සහ සමබර අරමුදල් කළඹක් කෙරෙහි අවධානය යොමු කිරීම

ඩිජිටල් පරිවර්තනය

පවත්නා ඩිජිටල් වේදිකාවල ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පවත්වා ගැනීම සහ නියාමන අවශ්‍යතා මෙන්ම හොඳම භාවිතයන් මත පදනම්ව ඒවායේ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම.

ආයතනික පාලනය සහ අනුකූලතාව

අවදානම් අධීක්ෂණය සහ විගණන ප්‍රවේශයන් තවදුරටත් ශක්තිමත් කිරීම.

උපායමාර්ගය

2026-2030

ප්‍රතිදානයන්

කොටස්හිමියන්
අක්‍රීය ණය අවම කිරීම, ස්ථාවර ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා අතිරික්තයන් පවත්වා ගැනීම සහ අවදානම් සහිත වත්කම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම මඟින් වැඩිදියුණු වූ මූල්‍ය ස්ථාවරත්වයක් ළඟා කර ගැනීම.

කාර්ය මණ්ඩලය
වෘත්තීය දියුණුව සහ පුහුණුවීම් ලබා දීම, මෙන්ම ආරක්ෂිත සහ සැමට පොදු වූ සේවා පරිසරයක් නිර්මාණය කිරීම.

ගනුදෙනුකරුවන්
මූල්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය පුළුල් කිරීම සහ අඩු හා මධ්‍යම ආදායම් ලාභී පවුල් සඳහා සහයෝගය දැක්වීම

ප්‍රතිඵලය

නිෂ්පාදන සහ සේවා
නිවාස සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය, ඉතුරුම් සහ තැන්පතු, ඩිජිටල් සේවා, සහ මූල්‍ය උපදෙස් ලබා දීම.

සමාජය
පාරිසරික තිරසාරත්වය සහ තිරසාර සංවර්ධනය සඳහා සහය දක්වන මූල්‍ය සාක්ෂරතාව සහ හරිත මූල්‍ය නිෂ්පාදන හඳුන්වා දීම.

නියාමකයින්
මූල්‍ය ස්ථාවරත්වය සහ උසස් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් ඇති කිරීම.

පරිසරය
හරිත මූල්‍ය සහ ඉතුරුම් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, බැංකු අංශය තුළ සාපේක්ෂව අඩු කාබන් පියසටහනක් පවත්වා ගැනීම, විද්‍යුත් අපද්‍රව්‍ය සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය, මෙන්ම රුක් රෝපණය සහ රැකබලා ගැනීම.

අනුකූලතාව

මූල්‍ය ප්‍රාග්ධනය


මානව ප්‍රාග්ධනය


බුද්ධිමය ප්‍රාග්ධනය


සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය


නිෂ්පාදිත ප්‍රාග්ධනය


ස්වභාවික ප්‍රාග්ධනය


මූල්‍යකරණ වටිනාකම - නිවාස කෙත්තු කර්ගත්, බලාගත්තු දිගේ ගැනුම්කරුවෙන් යුතු විශ්වසනීය සහ තිරසාර බැංකුකරණය

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය (SDGs)

අපගේ අරමුණු: මූල්‍ය අන්තර්ගතභාවය, වගකීම් සහගත බැංකුකරණය සහ පාරිසරික සවිඥානකත්වය

රජයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මූල්‍ය ආයතනයක් ලෙස, සමාජීය තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීමෙහිලා අප සතු කාර්යභාරයේ වැදගත්කම සහ අපගේ මෙහෙයුම් මඟින් පරිසරයට සිදුවන බලපෑම අවම කිරීම වෙනුවෙන් අප සතු වගකීම අපි මැනවින් හඳුනා ගනිමු. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අපගේ ගමන් මඟ සම්පූර්ණයෙන්ම අනුගත කිරීමේ මූලික අවධියක අප පසුවන නමුත්, අර්ථවත්, ස්ථාවර සහ ක්‍රමානුකූල ප්‍රගතියක් ළඟා කර ගැනීම වෙනුවෙන් අපගේ කැපවීම අඛණ්ඩව පවතී.

අඩු පහසුකම් සහිත ගනුදෙනුකරුවන්වෙනුවෙන් නිවසටම පැමිණ සේවා සැපයීම, ඩිජිටල් සේවා මාර්ග සඳහා ආයෝජනය කිරීම සහ ඩිජිටල් බැංකුකරණය සඳහා ඉහළ ආරක්ෂිත පියවරයන් හඳුන්වා දීම වැනි මූලපිරීම් හරහා සමාජීය තිරසාරත්වය, මූල්‍ය අන්තර්ගතභාවය සහ වගකීම් සහගත බැංකුකරණය ප්‍රවර්ධනය කිරීමට අපි දැනටමත් සරල පියවරයන් ගෙන ඇත්තෙමු. අප තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලීම උදෙසා වඩාත් පුළුල් හා වඩා ප්‍රබල ප්‍රගතියක් කරා ගමන් කිරීමට නිරන්තරයෙන් උත්සාහ කරන අතරතුර, මෙම ක්‍රියාවන් මඟින් සේවාවන් වෙත ඇති ප්‍රවේශය සහ මූල්‍ය සුරක්ෂිතතාව වර්ධනය කරමින්, තිරසාරත්වය ඔස්සේ බැංකුවේ බලපෑම ප්‍රසාරණය කිරීමට අප තුළ ඇති කැපවීම පිළිඹිමු කරමු.

අපගේ මූලික බැංකු කටයුතු සහ අරමුණට අනුකූලව, අපගේ කාර්යයන් හරහා ඉහළම බලපෑමක් ඇති කළ හැකි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා ප්‍රමුඛතා තිරසාර සංවර්ධන ඉලක්ක අපි හඳුනාගෙන ඇත්තෙමු. බැංකුව මූලික වශයෙන් අනුගත වී ඇති තිරසාර සංවර්ධන ඉලක්ක පහත දැක්වේ:

ප්‍රමුඛ තිරසාර සංවර්ධන ඉලක්ක

- SDG 1 – No Poverty
- SDG 5 – Gender Equality
- SDG 8 – Decent Work and Economic Growth
- SDG 9 – Industry, Innovation and Infrastructure
- SDG 10 – Reduced Inequalities
- SDG 16 – Peace, Justice and Strong Institutions

වගුගත දත්ත සැකිල්ල

උපායමාර්ගික මූලපිරීම්	දායකත්වය සපයන තිරසාර සංවර්ධන ඉලක්ක
හරිත බැංකු නිෂ්පාදන	*SDG 7, 12, 13*
නිවසටම පැමිණ සේවා සැපයීම	*SDG 1, 8, 10*
ඩිජිටල් සේවා මාර්ග සඳහා ආයෝජන	*SDG 9*
ඩිජිටල් බැංකුකරණයේ ආරක්ෂාව	*SDG 9, 16*
ණය සහන කාලසීමාවන්	*SDG 1, 8*
මූල්‍ය සාක්ෂරතාව	*SDG 4, 8*
අපද්‍රව්‍ය කළමනාකරණය	*SDG 12, 13, 15*
පිරිසිදු බලශක්ති උත්පාදනය	*SDG 7*
කාන්තා නායකත්වය	*SDG 5, 10*
සමාන වෘත්තීය අවස්ථා	*SDG 8, 10*
කාර්ය මණ්ඩල පුහුණුවීම්	*SDG 4, 8*
සැමට පොදු වූ ණය පහසුකම්	*SDG 1, 8, 10, 11*
නියාමන අනුකූලතාවය	*SDG 16*
අඩු හෞතික බලපෑම	*SDG 13, 15*

හරිත බැංකු නිෂ්පාදන



හරිත මූල්‍ය නිෂ්පාදන 3ක් හඳුන්වා දීම

සලකා බලනු ලබන වර්ෂය තුළ, ගනුදෙනුකරුවන් ට තිරසාරත්වය සහ ඍජුවත් මූල්‍ය ප්‍රතිලාභ ලබා දෙන හරිත-කේන්ද්‍රීත බැංකු නිෂ්පාදන හඳුන්වා දීමට සහ ක්‍රියාත්මක කිරීමට බැංකුව විශාල ප්‍රගතියක් අත්කර ගත්තේය. අපගේ සමාරම්භක විවිධාංගීකරණයන්ට තිරසාර ව්‍යාපාර සඳහා දිගුකාලීන ආයෝජන දිරිමත් කිරීම වෙනුවෙන් නිර්මාණය කරන ලද ගෝ ගිරින් ඉතුරුම් නිෂ්පාදනයක්, ගිරින් වෙල්ත් තැන්පතු නිෂ්පාදනයක් සහ හරිත පුද්ගලික ණය ඇතුළත් විය.

හඳුන්වා දුන් නිෂ්පාදන:

- HDFC ගෝ ගිරින් ඉතුරුම් ගිණුමට බැර කරන තැන්පතු හරහා පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා සෘජුවම සහයෝගය ලැබෙනු ඇත. මෙම අරමුදල් පාරිසරික වශයෙන් තිරසාර සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කෙරෙන අතර, එමඟින් තැන්පතුකරුට ජාතික හරිත වර්ධනයේ කොටස්කරුවෙකු වීමට අවස්ථාව ලැබෙයි.
- HDFC ගිරින් වෙල්ත් ස්ථාවර තැන්පතුවේ තැන්පත් කරන ලද අරමුදල් සුපරීක්ෂාකාරීව සහ ආරක්ෂිතව වෙන් කිරීම මඟින් පුනර්ජනනීය බලශක්ති ආශ්‍රිත ආයෝජන ඇතුළු දිගුකාලීන තිරසාර ව්‍යාපෘති සඳහා දායකත්වය සපයයි.
- ගනුදෙනුකරුවන් ගේ මෙම දායකත්වය අගයමින් ඔවුන් වෙත විශේෂ පොලී අනුපාත සමඟ හරිත ආයෝජන සහතිකයක් ද පිරිනමනු ලැබේ.
- හරිත මූල්‍යකරණය හරහා පරිසර හිතකාමී ජීවන රටාවකට අනුකූල වන මූල්‍ය අවශ්‍යතා සඳහා සහයෝගය දැක්වීම සඳහාම හරිත පුද්ගලික ණය විශේෂයෙන් නිර්මාණය කර ඇත

බලපෑම

- තිරසාර ප්‍රාග්ධනය බලමුලු ගැන්වීම
- තිරසාරත්වය උදෙසා පාරිභෝගික දායකත්වය වැඩිදියුණු කිරීම
- අපගේ පාරිසරික, සමාජයීය සහ පාලන කැපවීම් ඉදිරියට ගෙනයාම
- දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම තහවුරු කිරීම

ප්‍රවේශය පුළුල් කිරීම සඳහා නිවසටම පැමිණි සේවා සැපයීම



නිවසටම පැමිණි සේවා සපයන කණ්ඩායම: 45ක්

පළාත් 9 පුරා

ගනුදෙනුකරුවන් 8,144 දෙනෙකු ආවරණය කරයි

අපගේ සේවා සැපයුම් ජාලය තුළ නිවසටම පැමිණි සේවා සැපයීමේ කටයුතු සඳහා විශේෂ අවධානයක් යොමු කෙරෙන අතර, එමඟින් සේවා ලබා ගැනීමට අපහසු ගනුදෙනුකරුවන් සහ බැංකුව අතර පවතින පරතරය අවම කරයි. මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ ගැටලු, ඩිජිටල් බැංකු සේවා වෙත ප්‍රවේශ වීමේ බාධාවන් සහ බැංකු ශාඛා ජාලය සීමිත වීම වැනි කරුණු සැලකිල්ලට ගනිමින්, සේවා සැපයීම අවම මට්ටමක පවතින ප්‍රදේශවල සිටින අපගේ ගනුදෙනුකරුවන් වෙත ළඟා වීම සඳහා මැනවින් පුහුණු කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් කණ්ඩායමක් පත් කිරීමට අපි වැඩි අවධානයක් යොමු කර ඇත්තෙමු. නිවසටම පැමිණි සේවා සැපයීමේ කටයුතු මේ සඳහාම වෙන්වූ විශේෂ මෘදුකාංගයක්මඟින් පහසු කර ඇති අතර, එමඟින් ණය වාරික සහ උපයෝගිතා බිල්පත් ගෙවීම් ඇතුළු පුළුල් පරාසයක සේවාවන් සැකසීමට අපගේ කාර්ය මණ්ඩලයට හැකියාව ලැබී ඇත. අඩු සහ මධ්‍යම ආදායම් ලාභීන්ගේ ගෙවීම් ධාරිතාවන් සහ ඔවුන්ට ප්‍රතිලාභ සැලසීම සඳහා ක්‍රියාත්මක කර ඇති විවිධ ගෙවීම් ව්‍යුහයන් සහ ක්‍රමවේදයන් සැලකිල්ලට ගනිමින්, හිඟ මුදල් අයකර ගැනීම් සහ ණය ප්‍රතිපූරණයන් ඉහළ නංවා ගැනීමට හැකි වීම අපගේ මෙම නිවසටම පැමිණි සේවා සැපයීමේ කණ්ඩායමෙන් ලැබෙන වැදගත් ප්‍රතිලාභයකි

බලපෑම

- මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු වීම
- සේවා ලබා ගැනීමේදී පවතින බාධාවන් අවම වීම
- ප්‍රමාණවත් සේවා නොලබන ප්‍රජාවන් ආර්ථික වශයෙන් සබල ගැන්වීම

ඩිජිටල් සේවා මාර්ග ප්‍රශස්තකරණය



බාධාවකින් තොර සහ සැමට පොදු වූ මූල්‍ය සේවාවන් සැපයීමේ අරමුණින්, අපගේ ඩිජිටල් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා අපි වැදගත් ආයෝජනයන් සිදු කර ඇත්තෙමු. කෙසේ වුවද, 2025 වසරේදී මූල්‍යමය සීමාවන් සහ අපගේ ප්‍රාග්ධන අතිරික්තයන් සුරක්ෂිත කර ගැනීම පිළිබඳ පැවති සැලකිලිමත්භාවය හේතුවෙන්, තාක්ෂණික දියුණුව උදෙසා ආයෝජනය කිරීමේදී අපි මැනවින් ගණනය කරන ලද සහ ප්‍රවේශම්සහගත පියවරක් අනුගමනය කළෙමු.

මීට පෙර සිදු කරන ලද නවීකරණ ප්‍රයත්නයන් අතරට අපගේ ඔන්ලයින් බැංකු ද්වාරය යාවත්කාලීන කිරීම, වෙබ් අඩවිය වඩාත් දියුණු කිරීම සහ ජස්ට් පේ වැනි වේදිකාවන් සමඟ උපායමාර්ගිකව බාහිර පාර්ශවීය සේවා සම්බන්ධ කිරීම ඇතුළත් විය. මූල්‍ය සේවා අපේක්ෂාවන්හි ප්‍රවේශය, පහසුව සහ පාලනය වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කර ඇති වඩාත් ආරක්ෂිත සහ කාර්යක්ෂම බැංකු පරිසරයක් නිර්මාණය කිරීමට මේ හරහා මඟ පෑදී ඇත.

බලපෑම

- ගනුදෙනු සිදු කිරීමේදී ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය ඉහළ යාම
- ගනුදෙනුකරුවන්සඳහා ප්‍රවේශ වීමේ හැකියාව සහ පහසුව වැඩිදියුණු වීම

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය (SDGs)

වැඩිදියුණු කළ ඩිජිටල් බැංකු ආරක්ෂණ ප්‍රොටෝකෝල



ඔන්ලයින් සහ ඩිජිටල් බැංකු සේවා පරිශීලකයින් සංඛ්‍යාව: 1,933

2025 වසරේදී වාර්තා වූ ආරක්ෂක උල්ලංඝනයන් හෝ තර්ජන: කිසිවක් නැත

පරිශීලකයින්ගේ වර්ධනයෙහි 19.39% ක ඉහළ යාමක්

තාක්ෂණික සහ ඩිජිටල් යටිතල පහසුකම් සඳහා සිදුකළ ආයෝජන සහ වැඩිදියුණු කිරීම් හරහා, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි අපගේ ආරක්ෂක ප්‍රොටෝකෝල සහ හොඳම භාවිතයන් ඉහළ නැංවීමට අපට හැකි වී ඇත. ශක්තිමත් ප්‍රොටෝකෝල මඟින් පාරිභෝගික දත්ත සහ පෞද්ගලිකත්වය සුරක්ෂිත කර ඇති බව අපගේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සහතික කරනු ලබයි. මීට අමතරව, අපගේ කාර්ය මණ්ඩලය 'ඔබේ පාරිභෝගිකයා හඳුනා ගන්න' ක්‍රියාවලිය හරහා මූල්‍ය අපරාධවලට එරෙහිව සටන් කිරීම සඳහා අවශ්‍ය පියවරයන්ට අනුකූලව කටයුතු කරයි.

වමෙන්ම, ජස්ට් පේ සමඟ අත්වැල් බැඳගැනීම මඟින්, ආරක්ෂිත ජංගම දුරකථන බැංකුකරණ සේවාවක් සහතික කිරීම සඳහා ඔවුන්ගේ උසස් දත්ත සංකේතන සහ ආරක්ෂණ ප්‍රමිතීන් අප උපයෝගී කරගෙන ඇත. අභ්‍යන්තර ඩිජිටල් බැංකු ආරක්ෂණ පියවරයන් ද සමඟින්, වඩාත් ඔරොත්තු දෙන ඩිජිටල් පරිසර පද්ධතියක් නිර්මාණය කිරීමට අපි කටයුතු කර ඇත්තෙමු.

බලපෑම

- මූලික ආරක්ෂණ ප්‍රමිතීන් සමඟ අනුගත වීම
- සිදුවිය හැකි තර්ජනවලට එරෙහිව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය ප්‍රොටෝකෝල ක්‍රියාත්මක වීම

ණය සහන කාලසීමාවන්



රු.මිලියන 120.58 (2020 වසරේ සිට)

2025 වසරේ ලබා දුන් සහන මුදල: රු.මි.92.61

2025 වසරේදී ප්‍රතිලාභ ලැබූ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව: 144

එක් එක් සිදුවීම වෙන වෙනම ගෙන සිදුකරන ලද සමාලෝචන හරහා, මෙම ණය සහන කාලසීමාවන් සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම් මඟින් ප්‍රධාන තිරසාර සංවර්ධන ඉලක්ක කිහිපයකට සහය වීමට අපට හැකි වී ඇත. මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දෙන ගනුදෙනුකරුවන් ට සහනයක් සැලසීම සඳහා ලබා දෙන සහන සහ දීර්ඝ කරන ලද ගෙවීම් කාලසීමාවන් ද මෙම ණය සහන කාලසීමා සේවාවට ඇතුළත් වේ. මෙයින් පිළිඹිමු වන්නේ පීඩාවට පත් ජනතාවගේ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව සහතික කරමින්, කාරුණික සහ සහනශීලී බැංකුකරණ සේවාවක් සැපයීම උදෙසා බැංකුව සතු කැපවීමයි.

මූල්‍ය සාක්ෂරතා මුලපිරීම්



ඩිජිටල්/ඔන්ලයින් මූල්‍ය ගනුදෙනු නිවැරදිව සහ ආරක්ෂිතව සිදු කිරීම පිළිබඳව ගනුදෙනුකරුවන්සහ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා බැංකුව සිය ඔන්ලයින් සන්නිවේදන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ජාලයන් උපයෝගී කරගත්තේය.

බලපෑම

- ඩිජිටල්/ඔන්ලයින් මූල්‍ය ගනුදෙනු සහ දත්ත ආරක්ෂාව පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම.

පිරිසිදු බලශක්ති උත්පාදනය



සූර්ය බලශක්තිය මඟින් කිලෝවොට් පැය 6,749 ක විදුලිය ජනනය කරන ලදී.

කොළඹ පිහිටි අපගේ හයිඩ් පාර්ක් කෝනර් ශාඛාවේ මෙහෙයුම් කටයුතු සඳහා බලශක්තිය සැපයෙන සූර්ය බලශක්ති පද්ධතියක් අපි අඛණ්ඩව නඩත්තු කරමින් ක්‍රියාත්මක කරගෙන යන්නෙමු. මෙමඟින් ශාඛාවේ මෙහෙයුම් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් විදුලි බලයක් ජනනය කරන අතර, ජාතික විදුලි බල පද්ධතිය මත නොරැඳී සිටීමටත්, විදුලි බිඳවැටීම් පවතින අවස්ථාවලදී මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කරගෙන යාමටත් හැකියාව ලැබී ඇත.

බලපෑම

- කාබන් මුදාහැරීම අවම කිරීම සඳහා විසඳුමකි
- ඉදිරි ව්‍යාප්තීන් සඳහා ආදර්ශයකි
- අනාගත බලශක්ති අවශ්‍යතා සඳහා තිරසාර විසඳුමකි

නායකත්ව භූමිකාවන් සඳහා වැඩි කාන්තා දායකත්වයක්



නායකත්ව තනතුරු හෙබවීම සඳහා බැංකුව අපගේ කාන්තා නිලධාරිනියන් අඛණ්ඩව සබල ගන්වා ඇත. ඔවුන්ගේ කැපවීම සහ මහන්සිය නිසාම, සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ ආයතනික කළමනාකාරිත්වයේ සහ ප්‍රධාන/ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව තනතුරුවල කාන්තා නිලධාරිනියන් 11 දෙනෙකු සේවය කරන අතර, එය එම තනතුරුවලම සේවය කරන පිරිමි නිලධාරීන් සංඛ්‍යාවට සමාන වේ.

- ආයතනික කළමනාකාරිත්වය තුළ කාන්තා නියෝජනය: 50% කි
- ප්‍රධාන/ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව තනතුරු තුළ කාන්තා නියෝජනය: 54.5% කි
- විධායක නිලධාරී මණ්ඩලය තුළ කාන්තා නියෝජනය: 53.5% කි

බලපෑම

- අනුප්‍රාප්තිකයන් සඳහා අවස්ථා නිර්මාණය වීම
- සමාන සහ සාධාරණ සැලකිල්ල හේතුවෙන් දක්ෂ කාන්තා නායකත්වය ආයතනය තුළ රඳවා තබා ගැනීමට ඇති හැකියාව

වෘත්තීය සහ ආර්ථික වර්ධනය සඳහා සමාන සහ සාධාරණ අවස්ථා



ඕනෑම සේවකයෙකුගේ සමාජ පසුබිම නොසලකා, ඔවුන් සැමට වෘත්තීය සහ ආර්ථික දියුණුව සඳහා සමාන අවස්ථා ලබා දෙමින් අසමානතාවන් අවම කිරීමට බැංකුව කැපවී සිටී. සේවා ස්ථානයේ සිදුවන හිංසන, වෙනස්කොට සැලකීම් සහ ඒ හා සබැඳි ගැටලු විසඳීම සඳහා බැංකුව විසින් විස්තීරණ ක්‍රියා පටිපාටි ස්ථාපිත කර ඇත. අපගේ සමස්ත 453 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයට ආරක්ෂිත සහ සහයෝගී පරිසරයක් සහතික කිරීම සඳහා දුක්ගැනවිලි හැසිරවීමේ සහ තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇත.

මීට අමතරව, උපාධිධාරීන් 25 දෙනෙකුට බැංකු ක්ෂේත්‍රය තුළ සිය වෘත්තීය ජීවිතය ගොඩනඟා ගැනීමට අවස්ථාව සලසා දෙමින් සහ සාධාරණ ප්‍රතිලාභ මෙන්ම අවස්ථා සමඟ දිගුකාලීන වර්ධනයක් සඳහා ශක්තිමත් පදනමක් සපයමින් බැංකුව විසින් කළමනාකරණ ආධුනිකත්ව වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි. එමෙන්ම, බැංකුව විසින් සේවාස්ථ පුහුණු වන්නන් බඳවා ගන්නා අතර, ඔවුන්ට විවිධ කාර්යයන් ඔස්සේ බැංකු කටයුතු පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙයි.

බලපෑම

- වෘත්තීය වර්ධනය සඳහා සහයෝගය ලැබීම
- උසස් අධ්‍යාපනය සඳහා ප්‍රතිපාදන/ගෞරව දීමනා හිමිවීම

නිසි අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේද



1.6:1 පිරිමි සහ ගැහැණු අනුපාතය (බැංකුව පුරා)

විධායක මට්ටම තුළින් 54%ක් කාන්තා නිලධාරිනියන් වේ

ප්‍රතිචක්‍රීකරණය සඳහා එකතු කරන ලද ප්ලාස්ටික් අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 681ක්

ඵලදායී ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය මෑත වසරවලදී අපගේ විශේෂ අවධානයට ලක්වූ ක්ෂේත්‍රයක් වූ අතර, බාහිර ප්‍රතිචක්‍රීකරණ සමාගමක් සමඟ අත්වැල් බැඳගැනීම මඟින් වම කටයුතු තවදුරටත් වේගවත් කර ඇත. මේ හරහා තෝරාගත් බැංකු ශාඛාවල ප්ලාස්ටික් එකතු කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට අපට හැකි වී තිබේ. මීට අමතරව, ඊ-අපද්‍රව්‍ය (විද්‍යුත් අපද්‍රව්‍ය) ප්‍රතිචක්‍රීකරණය කරන ආයතනයක් සමඟ ඇති කරගත් තවත් තිරසාර හවුල්කාරිත්වයක් හරහා නිසි විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයක් ද තහවුරු කර ඇත. මෙම සාමූහික ප්‍රයත්නයන් ප්ලාස්ටික් සහ විද්‍යුත් අපද්‍රව්‍ය දූෂණයෙන් පරිසරය ආරක්ෂා කිරීම සඳහා අප දක්වන දායකත්වය තවදුරටත් ඉහළ නංවා තිබේ.

ප්‍රතිඵල

- ප්ලාස්ටික් එකතු කිරීමේ මධ්‍යස්ථාන: 20ක්
- විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම
- අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා බාහිර පාර්ශවීය හවුල්කාරිත්වයන් ඇති කරගැනීම

කාර්ය මණ්ඩල පුහුණුවීම් සඳහා ආයෝජනය කිරීම



ලබා දුන් සමස්ත පුහුණු කාලය: පැය 733.8 ක්

පුහුණුවීම් සඳහා ආයෝජනය කළ මුදල: රුපියල් මිලියන 4.6 ක්

අභ්‍යන්තර සහ බාහිර පුහුණු වැඩසටහන් ගණන: 139 ක්

ශ්‍රී ලංකාවේ රාජ්‍ය බැංකු අතරින් කුඩාම සේවක පිරිසක් සිටින කණ්ඩායමක් වන අපගේ සේවක මණ්ඩලයේ වෘත්තීය සහ පෞද්ගලික වර්ධනය උදෙසා, අපි අභ්‍යන්තර සහ බාහිර පුහුණු වැඩසටහන් සඳහා අවශ්‍ය ආයෝජනයන් සිදු කර ඇති අතර, වය සලකා බලන වර්ෂය තුළ ද කිසිදු බාධාවකින් තොරව අඛණ්ඩව ක්‍රියාත්මක විය.

සෑම වසරකම විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පවත්වනු ලබන අභ්‍යන්තර පුහුණු වැඩසටහන් මඟින් සේවකයින්ගේ වෘත්තීය සහ කුසලතා සංවර්ධනය සහතික කරන ලදී. මේවාට තොරතුරු ආරක්ෂණය සහ තොරතුරු තාක්ෂණය, කල්බදු සහ සුවිශේෂී නිෂ්පාදන, ණය සහ හිඟ මුදල් අයකර ගැනීම්, අනුකූලතාවය සහ අවදානම් කළමනාකරණය, උපායමාර්ගික සැලසුම්කරණය සහ වර්ධනය මෙන්ම මෙහෙයුම් කටයුතු සහ පොදු පුහුණුවීම් ඇතුළත් වේ. මීට අමතරව, බාහිර නියාමන සහ ආයතනික පුහුණුකරුවන්ට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය විසින් මෙහෙයවන ලද වැඩසටහන් කිහිපයක් ද ඇතුළුව පහත සඳහන් බාහිර පුහුණු වැඩසටහන් ද පවත්වන ලදී:

- බැංකු මෙහෙයුම් සහ සිල්ලර බැංකු සේවා
- නියාමන කටයුතු, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ අනුකූලතාවය
- තිරසාරත්වය සහ පාරිසරික, සමාජයීය සහ පාලන
- සයිබර් ආරක්ෂණය සහ ඩිජිටල් තාක්ෂණය
- මූල්‍ය, අවදානම් කළමනාකරණය සහ භාණ්ඩාගාර කටයුතු
- මානව සම්පත්, නායකත්වය සහ මෘදු කුසලතා
- කම්කරු නීතිය සහ මානව සම්පත් පරිපාලනය
- ගණකාධිකරණය සහ විගණනය
- ජාතික සම්මුතීන් සහ නීතිමය කටයුතු
- රාජ්‍ය අංශය සහ ප්‍රජා සේවා කටයුතු

බලපෑම

- පුහුණු වැඩසටහන් 139 ක් හරහා සේවක දැනුම ඉහළ නැංවීම
- විවිධ විෂයයන් ඔස්සේ විශේෂිත දැනුම ලබා දෙමින්, සේවකයින්ගේ කුසලතා යාවත්කාලීන කිරීම සහ කුසලතා වර්ධනය කිරීම
- විවිධ රැකියා ක්ෂේත්‍රවල නිරත කාර්ය මණ්ඩල සඳහා පුහුණුවීම් සහතික කිරීම

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය (SDGs)

තිරසාර ප්‍රජාවන් සඳහා සියල්ලන් ඇතුළත් වන ණය පහසුකම්



2025 වසරේදී ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන 9.02 කි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අනුග්‍රහය ඇතිව, අඩු සහ මධ්‍යම ආදායම් ලබන ගනුදෙනුකරුවන්ට ගැලපෙන පරිදි සකස් කරන ලද ණය පහසුකම් සැපයීම මඟින් HDFC බැංකුව ඉහත සඳහන් කළ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සෘජුවම දායකත්වය ලබා දෙයි. "ශ්‍රම උදාන" වැනි අපගේ නිෂ්පාදන හරහා තිරසාර ප්‍රජාවන් සවිබල ගන්වන සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවන දැරිය හැකි මිලකට ලබාගත හැකි නිවාස විසඳුම් අපි සලසා දෙන්නෙමු. මීට අමතරව, මෙයට අනුපූරක වන අනෙකුත් ණය යෝජනා ක්‍රම මඟින් මූල්‍ය සේවා මෙතෙක් නිසි ලෙස නොලැබුණු ජනගහනය වෙත ළඟා වීමට ඉඩ සලසයි. එමඟින් ශක්තිමත් සමාජ ස්ථාවරත්වයක් ගොඩනැඟෙන අතර, දිළිඳුකම අඩු කිරීමට සහ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමට අපි දායක වන්නෙමු.

බලපෑම

- මූල්‍යමය වශයෙන් අවධානයට ලක් නොවූ පුද්ගලයන් සඳහා නිවාස සහ ජීවන රටා මූල්‍යකරණ විසඳුම් සැපයීම.
- නම්‍යශීලී මෙන්ම පාරිභෝගිකයාට ගැලපෙන පරිදි සකස් කරන ලද ණය ලබාගැනීමේ සහ ආපසු ගෙවීමේ ව්‍යුහයන් හඳුන්වා දීම.

තිරසාර වර්ධනයක් සඳහා පාලනය සහ අනුකූලතාවය ශක්තිමත් කිරීම



ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියාමන මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීමට අප කටයුතු කර ඇත. අපගේ ගමන තරමක් මන්දගාමී සහ ක්‍රමානුකූල වකක් වුවද, බැංකු ක්ෂේත්‍රයේ හොඳම භාවිතයන් සමඟ පෙළගැසීමට අපි සෑම උත්සාහයක්ම ගෙන ඇත්තෙමු. පසුගිය වසර කිහිපය තුළ යම් යම් මූල්‍ය පසුබෑම් දක්නට ලැබුණද, අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට අපට ඇති හැකියාව මඟින් මෙය මැනවින් පැහැදිලි වේ.

එමෙන්ම, ශක්තිමත් "ඔබේ ගනුදෙනුකරු හඳුනාගන්න"ක්‍රියාවලීන් හරහා අපි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට විරෙහි වීමේ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර ඇත. ඒ අතරම ජාතික ගණකාධිකරණ ප්‍රමිති සහ මූල්‍ය වාර්තාකරණ මාර්ගෝපදේශවලට අනුකූලව පාලන විධානයන්, මූල්‍ය සහ ගණකාධිකරණ අවශ්‍යතාද පවත්වාගෙන ගොස් ඇත.

වලෙසම, ප්‍රමාණවත් ප්‍රාග්ධන ස්වාරක්ෂක සහ ද්‍රවශීලතාව පවත්වා ගැනීම කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරමින්, අවදානම් කළමනාකරණයේ හොඳම භාවිතයන් අපි අනුගමනය කර ඇත්තෙමු. බැංකුව විසින් තැන්පත්කරුවන්ගේ අරමුදල් සහ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සුරක්ෂිත කරනු ලබයි. අපගේ මෙහෙයුම් බලපෑම සාපේක්ෂව කුඩා වුවද, මෙමඟින් අපගේ බැංකුව තුළ වගවීම සහ විශ්වාසය ඉහළ නැංවීමට සමත් වී ඇත.

බලපෑම

- ඉහළ නැංවූ මූල්‍ය අඛණ්ඩතාව (AML/CFT අනුකූලතාවය සහ KYC ක්‍රියාවලීන් හරහා නීති විරෝධී ක්‍රියාකාරකම් සඳහා ඇති ඉඩකඩ අවම කිරීම මඟින්).
- නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම තුළින් පාර්ශවකරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීම.
- තිරසාර සංවර්ධන අරමුණු 16 වෙත ක්‍රියාකාරී දායකත්වය ලබාදීම සහ වගකිවයුතු මෙන්ම සාධාරණ මූල්‍ය හවුල්කරුවෙකු බවට පත්වීම.

අවම භෞතික පියසටහන



ශාඛා සංඛ්‍යාව: 39

ශාඛාවක සාමාන්‍ය කාර්ය මණ්ඩලය: 08

HDFC බැංකුව තමන්ගේ ආයෝජන ධාරිතාව සහ විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණයට සාපේක්ෂව අඩු භූගෝලීය ව්‍යාප්තියක් වැළඳගෙන ඇත. මීට අමතරව, අපගේ ශාඛා පිහිටුවා ඇත්තේ සාධාරණීකරණය කළ හැකි මට්ටමේ පාරිභෝගික නියෝජනයක් සහිත ප්‍රදේශවල පමණක් වන අතර, එමඟින් අවම පාරිසරික පියසටහනක් පවත්වා ගැනීමට දිරි දෙන අතර පරිසරයට සිදුවන බලපෑම සහ සම්පත් භාවිතය අඩු කරයි. කෙටි කාලීනව නව ශාඛා ව්‍යාප්ත කිරීම් සිදු නොවන අතර, එමඟින් ස්වභාවික සම්පත් ප්‍රශස්ත ලෙස භාවිත කිරීමටත්, අපගේ ස්වභාවික ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේදී සාධනීය චක්‍රයක් නිර්මාණය කිරීමටත් අපට හැකි වනු ඇත.


බලපෑම

- අධි ශාඛා ව්‍යාප්ත කිරීම්වලට සාපේක්ෂව අඩු කාබන් විමෝචනයක් පැවතීම.
- බලශක්ති කාර්යක්ෂමතාව.
- මෙහෙයුම් කටයුතුවලින් සිදුවන විමෝචනයන්හි විභව අඩුවීමක් පැවතීම (තවමත් මැන බලා නොමැති).
- ප්‍රශස්ත සම්පත් පරිභෝජනය.

අපගේ ඉදිරි ගමන

තිරසාර සංවර්ධන අරමුණු වෙනුවෙන් අප සතු ඉදිරිගාමී කැපවීම, මූල්‍ය ඇතුළත් කිරීම් සහ තිරසාර මෙහෙයුම් වර්ධනය සඳහා අප ඉටුකරන උත්ප්‍රේරක භූමිකාව පිළිබිඹු කරයි. ජංගම දුරකථන බැංකුකරණය, මාර්ගගත සහ ඩිජිටල් ගනුදෙනු සේවා හරහා මෙන්ම අපගේ ශාඛා ජාලය හරහා මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීමේ පහසුව සැලසීම සඳහා බැංකුව දැනටමත් ගෙන ඇති උත්සාහයන් අඛණ්ඩව ඉදිරියට ගෙනයාම අපගේ ආසන්නතම දැක්මෙහි අන්තර්ගත වේ.

විශේෂයෙන්ම ණය ලබාගන්නන් අතර මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා අපගේ ශාඛා සහ කාර්ය මණ්ඩලය සිදුකරන කාර්යභාරය, ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය නංවාලීමට සහ මූල්‍ය සුරක්ෂිතභාවය කරා ඔවුන්ව යොමු කිරීමට අප ගන්නා උත්සාහයන්ට කදිම උදාහරණයක් ලෙස අඛණ්ඩව පවතිනු ඇත. මීට අමතරව, විශේෂිත බැංකුවක් ලෙස, සේවකයින්ට, ගනුදෙනුකරුවන්ට සහ කොටස් හිමියන්ට ආර්ථික වර්ධනයක් සහ ප්‍රතිලාභ ලබාදීම සඳහා අපගේ මූල්‍ය තත්ත්වය සුරක්ෂිත කරගන්නා අතරම, අපගේ තිරසාරත්ව පිළිබඳ සැලසුම් රජයේ සැලසුම් සමඟ අඛණ්ඩව පෙළගැස්වීමට කටයුතු කරන්නෙමු.



ප්‍රගතිය සඳහා වන සැලසුම්

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය



හිතවත් කොටස් හිමියනි සහ හිතෛෂීවරුනි,

HDFC බැංකුවේ අලුතින්ම පත් වූ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව මම ඉතා සතුටින් ඉදිරිපත් කිරමි.

සභාපතිතුමා 2025.11.30 දින සිට විශ්‍රාම ගොස් ඇති අතර, ඉන් පසුව කිසිදු අධ්‍යක්ෂවරයෙකු සභාපති තනතුර සඳහා පත් කර නොමැත. එබැවින්, සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී වන මම බැංකුවේ ඉදිරි දැක්ම පිළිබඳව පහත පරිදි කරුණු ඉදිරිපත් කරමි.

කල් ඉකුත් වූ පහසුකම්වලින් රුපියල් මිලියන 3,479 ක් අයකර ගනිමින් ප්‍රබල ප්‍රකෘතිමත් වීමේ කාර්යසාධනයක් පෙන්නුම් කර ඇත. මෙය සමස්ත කල් ඉකුත් වූ නිෂ්පාදන එකතුව 19.6% කි.

බැංකුව සිය කල් ඉකුත් වූ පහසුකම්වලින් රුපියල් බිලියන 3.5 ක් සුරක්ෂිත කර ගනිමින් ශක්තිමත් ප්‍රතිඵලයක් අත්කර ගත් අතර, එය සමස්ත අක්‍රීය නිෂ්පාදන එකතුව 19.6% කට සමාන වේ.

වසංගත තත්ත්වය සහ ඉන් අනතුරුව ඇති වූ ආර්ථික අර්බුදයේ පවතින බලපෑම් හමුවේ, වත්කම්වල ගුණාත්මකභාවය ශක්තිමත් කිරීමට, අක්‍රීය ණය අවම කිරීමට සහ බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය ඉහළ නැංවීමට ප්‍රායෝගික පියවර අනුගමනය කරමින් බැංකුව වසර පුරා දැඩි ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළේය.

අත්‍යවශ්‍ය ශේෂ පත්‍ර ශක්තිමත් කිරීමේ පියවරයන් හේතුවෙන් වසර සඳහා පාඩුවක් වාර්තා වුවද, බැංකුව 217% ක ශක්තිමත් ද්‍රවශීලතා ආවරණ අනුපාතයක් පවත්වා ගෙන ගියේය. විමඟින් ක්ෂණික මූල්‍ය වගකීම් ඉටු කිරීමට ඇති හැකියාව පිළිබිඹු වන අතර, ණය අයකර ගැනීම්වල සැලකිය යුතු දියුණුවක් ඇති කරමින් අක්‍රීය ණය ප්‍රාග්ධනය රුපියල් මිලියන 3,479 කින් සාර්ථකව පහත හෙළීමට සමත් විය. තවද, මීට පෙර පැවති ධනාත්මක ඉදිරි දැක්මට වඩා ඉහළ අගයක් ගනිමින්, 2025 අගභාග යේදී බැංකුව වෙත ධනාත්මක ශ්‍රේණිගත කිරීමේ අවධානයක් සමඟින් (BB+(lka) ශ්‍රේණිගත කිරීම පිරිනමන ලදී.

සංකීර්ණතා හමුවේ ප්‍රායෝගිකව ගමන් කිරීම

පොලී අනුපාත පහත වැටීම, පරිභෝජනය ඉහළ යාම සහ නව ව්‍යාපාරික විශ්වාසය හේතුවෙන් ඇති වූ ණය ඉල්ලුමේ වර්ධනයත් සමඟ, ක්‍රමයෙන් යහපත් වන සාර්ව ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ බැංකුව සිය මෙහෙයුම් කටයුතු සිදු කළේය. කෙසේ වෙතත්, මූල්‍ය ස්ථාවරත්වය සුරක්ෂිත කිරීම, ණය නිකුත් කිරීම සීමා කිරීම සහ තැන්පතු බලමුලු ගැන්වීමේ ධාරිතාව අරමුණු කරගත් බාධාවන් මඟින් මෙහෙයුම් සඳහා අඛණ්ඩව බලපෑම් විල්ල විය. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, අදාළ ණය ගැතියන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ශේෂයන්ගෙන් පැහැර හරින ලද ඇපකර ණය අයකර ගැනීමේදී ව්‍යුහාත්මක අභියෝග අඛණ්ඩව පැවති අතර, වාර්තාකරණ වර්ෂය අවසානයේදී බැංකුව රුපියල් බිලියන 3.3 ක මුදලකට සම්පූර්ණයෙන්ම හිමිකම් කීවේය.

මෙම වසර තුළ අපගේ මූලික අවධානය යොමු වූයේ ණය අයකර ගැනීමේ මෙහෙයුම් ශක්තිමත් කිරීම සහ ගුණාත්මක ණය පහසුකම් අඛණ්ඩව ලබා දීම හරහා ඉහළ අවදානමක් සහිත ණය නිරාවරණයන් අවම කිරීමට පියවර ගැනීම කෙරෙහිය. ඉහළ අක්‍රීය ණය අනුපාතයට සක්‍රීයව මුහුණ දීම කෙරෙහි බැංකුව අවධානය යොමු කළ අතර, වසර තුළදී ප්‍රාග්ධනය රුපියල් මිලියන 3,479 කින් පහත හෙළීමට හැකි විය. එය බැංකුවේ සමස්ත ප්‍රාග්ධනයෙන් 19.6% කි. තවද, විචක්ෂණශීලී ණය අවදානම් තක්සේරුවක් මඟින් නව ණය ලබාදීමේ ගුණාත්මකභාවය අඛණ්ඩව ඉහළ නැංවීමටද අපි කටයුතු කළෙමු.

වසංගතය සහ ඉන් අනතුරුව ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් ගෘහස්ථ ආදායම් මට්ටම් පහත වැටී ඇති ආර්ථිකයක් තුළ, විශේෂයෙන් මීට පෙර පැවති ඉහළ පොලී අනුපාත හමුවේ, ණය දැරීමේ හැකියාව සීමිත මට්ටමක පැවතුණි. සමස්ත බැංකු ක්ෂේත්‍රයම ලීසිං සහ රන් සුරැකුම් පහසුකම් ඇතුළු කෙටි කාලීන ණය නිෂ්පාදන වෙත අඛණ්ඩව යොමු විය.

අපගේ නිෂ්පාදන එකතුව තුළද විවැනිම නිෂ්පාදන තිබුණද, HDFC බැංකුවේ සමස්ත ණය පොතෙන් 74% ක්ම තවදුරටත් කේන්ද්‍රගත වී ඇත්තේ නිවාස මූල්‍යකරණය මතය. මෙම නිවාස ණාවලින් සැලකිය යුතු කොටසක් අඩු සහ මධ්‍යම ආදායම් ලබන්නන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ශේෂයන්ට ඇප වන්නට සුරක්ෂිත කර ඇති බැවින්, හිඟ මුදල් හඳුනාගැනීම සහ අදාළ ණය ගැතියාගේ සේවක අර්ථසාධක අරමුදලෙන් එය පියවීම අතර කාලය තුළ ප්‍රමාදයන් ඇති වේ. විමඟින් අක්‍රීය ණය මට්ටම් ඉහළ යාමට දායකත්වයක් සැපයේ. මෙයට ප්‍රතිචාර වශයෙන් සහ වෙනස් වන වෙළෙඳපොළ මනාපයන්ට අනුකූලව, අවදානම අවම කර ගැනීමට සහ වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා බැංකුව සිය නිෂ්පාදන එකතුව විවිධාංගීකරණය) කිරීමට පියවර ගෙන ඇත.

නිෂ්පාදන එකතුව විවිධාංගීකරණය සහ වර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම

වාහන ආනයන තහනම ඉවත් කිරීමෙන් උපරිම ප්‍රයෝජන ගනිමින්, බැංකුව සිය ලීසිං නිෂ්පාදන එකතුව පුළුල් කළ අතර, ඉලක්කගත සහ ස්වාභාවික ගනුදෙනුකාර සම්බන්ධතා හරහා සැලකිය යුතු වර්ධනයක් අත්කර ගත්තේය. ගනුදෙනුකරුවන් අතර ලීසිං නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා අප දැක්වූ දැඩි අවධානයේ ප්‍රතිඵලයක් ලෙස එම නිෂ්පාදන එකතුව දෙගුණයකින් වැඩි කර ගැනීමට හැකි විය. ලීසිං සහ රන් ණය සඳහා මෙලෙස උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලබා දීම පිටුපස ඇති පදනම වූයේ, ඒවායේ ඇති කෙටි කාලීන ස්වභාවය මෙන්ම ඉහළ වටිනාකමකින් යුත් ඇපකරවලින් ඒවා සුරක්ෂිත වී තිබීමයි. විමඟින් ණය අවදානම් මට්ටම් පහත හෙළීමට දායකත්වයක් ලැබේ.

අයවැය, වියදම් සහ මෙහෙයුම් බාධාවන් මධ්‍යයේ වුවද, ගනුදෙනුකරුවන් සමඟ පැවැත්වූ ස්වාභාවික සම්බන්ධතා හේතුවෙන් ලීසිං සහ රන් ණය නිෂ්පාදන එකතුව ස්ථාවර වර්ධනයක් වාර්තා කිරීමට සමත් වූ අතර, ඒ සඳහා අපගේ සියලුම ශාඛා 39 හි කාර්ය මණ්ඩලයේ කැපවීම මැනවින් දායක විය. ඔවුන්ගේ උත්සාහය නිෂ්පාදන එකතුව පුළුල් කිරීමට පමණක් නොව, සතුටුදායක මට්ටමේ ණය අයකර ගැනීම් ප්‍රමාණයක් අත්කර ගැනීමටද උපකාරී විය.

කාර්යසාධනය ස්ථාවර කිරීම

ශාඛා කාර්යසාධනය ශක්තිමත් කිරීමට සහ බැංකුවේ අයවැය ඉලක්කයන් සමඟ ඒවා පෙළගැස්වීමට, අපි එක් එක් ශාඛා වෙත තනි තනි ප්‍රධාන කාර්යසාධන දර්ශක ලබා දුන් අතර, විමඟින් නියමිත ඉලක්ක කරා වැඩ කිරීමට ඔවුන්ව සවිබල ගැන්වීමු.

ශාඛාවල සහ ණය අයකර ගැනීමේ අංශයේ කැපවීම සහ දායකත්වය හේතුවෙන්, 2025 මූල්‍ය වර්ෂය අවසන් වන විට ප්‍රාග්ධනය රුපියල් මිලියන 3,479 කින් පහත හෙළීමට හැකි විය.

පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව පහත වැටීමක් දක්නට ලැබුණද, රුපියල් බිලියන 7.7 ක ආදායමක සහාය ඇතිව වසර සඳහා බදු පෙර ලාභය රුපියල් මිලියන 360 ක් ලෙස සටහන් විය. ණය සහ අත්තිකාරම් බැංකුවේ ප්‍රධාන ආදායම් මාර්ගය වන නමුත්, වසර තුළ ණය නිකුත් කිරීම් කෙරෙහි පනවා තිබූ නියාමන සීමාවන් හේතුවෙන් අපට ණය කළඹ පුළුල් කිරීමට නොහැකි විය. කෙසේ වෙතත්, පොලී වියදම් අඩු වීම හේතුවෙන් ශුද්ධ පොලී ආදායම සුළු වර්ධනයක් පෙන්වමින් රුපියල් බිලියන 2.8 ක් ලෙස වාර්තා වූ අතර, විමඟින් පොලී ආදායමේ සිදු වූ අඩුවීම සමතුලිත විය.

සීමිත භූගෝලීය ව්‍යාප්තියක් පැවතියද, පුළුල් ක්ෂේත්‍ර දැනුම සහ ශක්තිමත් ගනුදෙනුකාර සබඳතා උපදවමින් බැංකුවේ ශ්‍රම බලකාය එහි ප්‍රධානතම ශක්තියක් ලෙස තවදුරටත් පවතී. අපගේ කාර්ය මණ්ඩලය, ඔවුන්ගේ දැනුම, පළපුරුද්ද සහ විශේෂයෙන්ම නිවාස ක්ෂේත්‍රය පිළිබඳ

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

ආයතනික දැනුම මෙන්ම එහි අත්දැකීම් සමඟ වීකාබද්ධ වූ දැවැන්ත විභවයක් සතුව පවතී.බිම් මට්ටමේ සාමාන්‍ය ජනතාවගේ සිට ආයතනික මට්ටමේ ගනුදෙනුකරුවන් දක්වා විහිදුණු විවිධ පරාසයක පිරිසක් සමඟ අපගේ කාර්ය මණ්ඩලය කටයුතු කරයි. බැංකුව සතු භූගෝලීය ව්‍යාප්තිය සාපේක්ෂව කුඩා වුවද, අපගේ සේවකයින් ගනුදෙනුකරුවන් සමඟ සමීප සේවා සබඳතා ගොඩනඟා ගෙන ඇත. එමඟින් ගනුදෙනුකරුවන් සමඟ වඩා හොඳ සම්බන්ධතාවක් පවත්වා ගැනීමටත්, ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමටත්, වඩාත් ශක්තිමත් ණය අයකර ගැනීමේ ප්‍රතිඵල අත්කර ගැනීමටත් හැකි වී තිබේ.

සම්පූර්ණ නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම් නොමැති වටපිටාවක වුවද, බැංකුව විසින් දැනට පවතින පද්ධති ප්‍රශස්තකරණය කිරීමට ප්‍රමුඛතාව ලබා දුන් අතර, එමඟින් මෙහෙයුම් විශ්වසනීයත්වය සහ කාර්යසාධනය ඉහළ නංවා ගන්නා ලදී. වර්ෂය තුළදී, අනාගතයේදී තාක්ෂණය මුල් කරගනිමින් දියත් කිරීමට නියමිත වැඩපිළිවෙළවල් සඳහා සූදානම් වෙමින්, දැනට පවතින ඩිජිටල් හැකියාවන් වැඩිදියුණු කිරීම සහ පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීම කෙරෙහි විශේෂ අවධාරණයක් යොමු කරන ලදී.

හරිත නිෂ්පාදන නවෝත්පාදනයන් සහ සමාජ බැඳුම්කර ආයෝජන

අපගේ දිගුකාලීන තිරසාරත්ව උපායමාර්ගයට අනුකූලව, පරිසර හිතකාමී සහ වගකිවයුතු බැංකුකරණයක් වෙත තැන්පත්කරුවන් සවිබල ගැන්වීම සඳහා ව්‍යාපාර සංවර්ධන කණ්ඩායම හරිත මූල්‍ය නිෂ්පාදන මාලාවක් නිල වශයෙන් සකස් කරන ලදී.

ලෝක පරිසර දිනයට සමගාමීව "ගෝ ග්‍රීන්" නමින් ඉතුරුම් ගිණුමක් අප හඳුන්වා දුන් අතර, එමඟින් තැන්පත්කරුවන්ට පරිසර හිතකාමී මූලපිරිමිවල කොටස්කරුවන් වීමට අවස්ථාව සැලසේ. මන්දයත්, මෙම ගිණුම්වල ඇති අරමුදල් හරිත ව්‍යාපෘති සහ පාරිසරික වශයෙන් තිරසාර ව්‍යාපෘති සඳහා ආයෝජනය කරනු ලබන බැවිනි. මෙලෙස රැස් කරගන්නා අරමුදල් හරිත ආයෝජන වෙත යොමු කෙරෙන අතර, තැන්පත්කරුවන්ට ඕනෑම වේලාවක තමන්ගේ ඉතුරුම් ලබාගැනීමේ සම්පූර්ණ නම්‍යශීලීභාවයද හිමිවේ. තැන්පත්කරුවන් දක්වන ලද දායකත්වය අගයමින් ඔවුන් වෙත "හරිත ආයෝජන සහතිකයක්" පිරිනමන අතර, ඔවුන්ට විශේෂිත ඉහළ පොලී අනුපාතයන්හි ප්‍රතිලාභද හිමිවේ. එමඟින් මෙම නිෂ්පාදනය මූල්‍යමය වශයෙන් තැන්පත්කරුවන්ට ආකර්ෂණීය එකක් බවට පත්වෙයි.

මෙම හරිත ඉතුරුම් නිෂ්පාදනය හඳුන්වා දීම, ශ්‍රී ලාංකීය බැංකු ක්ෂේත්‍රයේ මෙම නව පරිච්ඡේදය වෙත තැබූ නිර්භීත පියවරක් සනිටුහන් කරයි. මූල්‍ය ක්ෂේත්‍රය තුළ හරිත සහ නිල් බැඳුම්කර මතු වී තිබුණද, ලංකාවේ බැංකු කර්මාන්තය තුළ පාරිභෝගිකයා මුහුණට මුහුණ හමුවන ප්‍රථම හරිත ඉතුරුම් නිෂ්පාදනය වන්නේ "ගෝ ග්‍රීන්" නිෂ්පාදනයයි. බැංකුව වසර තුළදී රුපියල් මිලියන 225 ක අගයකින් යුත් සමාජ බැඳුම්කරයකද ආයෝජනය කළේය. මෙම පියවර ශ්‍රී ලංකාවේ නැඟී එන තිරසාර මූල්‍ය ක්ෂේත්‍රය සමඟ පෙළගැසීමේ වැදගත් පියවරක් නියෝජනය කරන අතර, ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වන මහ බැංකුවේ සියල්ලන් ඇතුළත් හරිත මූල්‍යකරණ වැඩපිළිවෙළටද සහාය දක්වයි.

අලෙවිකරණ අයවැය සහ වියදම් කෙරෙහි පනවා තිබූ නියාමන සීමාවන් මධ්‍යයේ වුවද, අපගේ කණ්ඩායම මෙම නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා ස්වාභාවික ක්‍රියාකාරකම් සංවිධානය කළේය. තිරසාරත්වය සහ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සඳහා පාසල් මට්ටමින් ප්‍රජා සේවා වැඩසටහන් ඇතුළු දැනුවත් කිරීමේ ප්‍රචාරණ ව්‍යාපාර පවත්වන ලදී. පාසල් කිහිපයක ප්‍රාථමික සැසිවාර පැවැත්වුණු අතර, එහිදී මෙම නිෂ්පාදනවල ඇති වැදගත්කම පිළිබඳව දැනුවත්භාවයක් ඇති කරන ලදී.

සමාජ මාධ්‍ය ප්‍රචාරණ සහ බිම් මට්ටමේ ප්‍රවර්ධන ඇතුළු ඉලක්කගත ප්‍රවර්ධන ක්‍රියාවලීන් හරහා, 2025 වසරේදී හඳුන්වා දුන් මෙම නව නිෂ්පාදන 2026 වසරේදී වඩාත් සාර්ථක ගම්‍යතාවක් අත්කර ගනු ඇතැයි අපි සුබවාදීව බලාපොරොත්තු වෙමු.

අනාගත උපායමාර්ගික පරිවර්තනයන්

වසර 5ක උපායමාර්ගික සැලැස්ම

අපගේ ඉදිරිගාමී මාර්ග සිතියමෙහි ප්‍රතිඵලයක් ලෙස, නුදුරු අනාගතය පිළිබඳව, විශේෂයෙන්ම 2026 වසරේ කාර්යසාධනය සහ ප්‍රතිඵල පිළිබඳව මම තවදුරටත් සුබවාදීව සිටිමි. සුවිශේෂී සංක්‍රාන්ති සමයක් සනිටුහන් කරමින්, බැංකුව විසින් නව පරිවර්තනය සහ වර්ධනය කෙරෙහි අවධානය යොමු කළ විස්තීර්ණ වසර 5ක උපායමාර්ගික සැලැස්මක් ඒළිදක්වා ඇත. පවතින සියලු සීමාවන් සහ බාධාවන් මධ්‍යයේ වුවද, විශ්වාසයෙන් යුතුව අභියෝග ජය ගැනීමට බැංකුව මෙහෙයවන සැලැස්ම බවට මෙම සැලැස්ම පත්වනු ඇත. උපායමාර්ගික සංක්‍රාන්තියක් සිදු කිරීම සඳහා පවතින සියලු ගැටලු නිරාකරණය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ ඉහළ දායකත්වයකින් යුත් ව්‍යුහාත්මක සම්බන්ධීකරණ ක්‍රියාවලියක් ඇතුළුව දින 3ක වැඩමුළුවක් හරහා මෙම සැලැස්ම තහවුරු කර ගන්නා ලදී.

අවදානම් කළමනාකරණය, තිරසාර වර්ධනය සහ ආයතනික පාලනය නැංවීම

ඉදිරියට යන ගමනේදී, අපගේ අවදානම් අවම කර ගනිමින්, ඉහළ අවදානමක් සහිත අංශ වෙත නිරාවරණය වීම අඩු කරන අතරම, උසස් තත්ත්වයේ වත්කම්වලින් සුරක්ෂිත වූ ණය ලබාදීමට බැංකුව අඛණ්ඩව ප්‍රමුඛතාවය දෙනු ඇත. EPF හිමිකම් පියවීම් හේතුවෙන් සිදුවන ප්‍රමාදයන් මධ්‍යයේ වුවද, වත්කම් පදනම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා උසස් තත්ත්වයේ වත්කම්වලින් සුරක්ෂිත වූ ලීසිං සහ රන් ණය අංශ වෙත උපායමාර්ගික මාරුවක් සිදු කිරීමට බැංකුව අපේක්ෂා කරයි.

අවදානම් අවම කිරීම සම්බන්ධයෙන් අපගේ අවධානය යොමු වනුයේ, ඉහළ අවදානම් සහිත ණය ලබාදීමෙන් වැළකී, ඒ වෙනුවට ඇපකර මඟින් සුරක්ෂිත වූ සහ වඩා හොඳ ආපසු ගෙවීමේ හැකියාවක් ඇති, ඉහළ ණය සුදුසුකම් සහිත ණය ගැතියන් වෙනුවෙන් උසස් තත්ත්වයේ ණය ලබාදීමටය. මූල්‍ය ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු කිරීමට සහ නියාමන නම්‍යශීලීභාවය ලබා ගැනීම සඳහා දැනට පවතින අක්‍රීය ණය කළඹ අඩු කිරීම කෙරෙහිද උත්සාහයන් යොමු කෙරෙනු ඇත.

මූල්‍ය නිෂ්පාදන සම්බන්ධයෙන් ගත් කල, සේවක අර්ථසාදක අරමුදල් ඇපකර මත පදනම් වූ නිවාස ණය මත යැපීම අඩු කරමින් සහ උසස් තත්ත්වයේ ඇපකරවලින් සුරක්ෂිත වූ අඩු අවදානම් සහිත, ආදායම්-සුරක්ෂිත ණය අංශ වෙත ව්‍යාප්ත වෙමින් ණය කළඹේ විවිධාංගීකරණය ප්‍රධාන ප්‍රමුඛතාවයක් ලෙස පවතිනු ඇත.

අතීතයේදී, ණය ලබාදීමේදී අප සතු වූ නිෂ්පාදන විවිධාංගීකරණයේ හිඟකම, කෙටි කාලීන ණය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට, අඩු අවදානම් සහිත ණය සුදුසුකම් ඇති ණය ගැතියන් සහ උසස් තත්ත්වයේ වත්කම් ආකර්ෂණය කර ගැනීමට අපට තිබූ හැකියාව අඩපණ කළේය. දැන්, වඩාත් මූල්‍යමය වශයෙන් තිරසාර වත්කම් රැස් කරගැනීම සහ අපගේ වගකීම් වඩාත් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරන බැවින්, මධ්‍යකාලීනව මූල්‍ය ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කර ගැනීමට අපට විශ්වාසය ඇත. මීට අමතරව, දිගුකාලීන ස්ථාවරත්වය සහ ගනුදෙනුකරුවන් ට වටිනාකමක් තහවුරු කිරීම සඳහා, නිෂ්පාදන සහ සේවා යන දෙඅංශයේම වැඩිදියුණු කිරීම් කළ හැකි ක්ෂේත්‍ර අපි හඳුනා ගන්නෙමු.

ණය අනුමත කිරීමේ රාමුවට සිදු කරන ලද වැඩිදියුණු කිරීම්වල සහාය ඇතිව ක්‍රියාත්මක වන වීකාබද්ධ ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය මඟින් දැඩි අවදානම් තක්සේරුවක් සහ ඉහළ නැංවූ ණය ගුණාත්මකභාවයක් තහවුරු කරනු ඇති අතර, එමඟින් පුද්ගලික සහ ආයතනික ණය ගැතියන් විසින් ණය පැහැර හැරීමේ අවදානම සාර්ථකව අඩු කරනු ඇත.

මීට අමතරව, ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති පුද්ගලයින් සහ ආයතනික ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා විශේෂිත වීකකයක් අවධානය යොමු කරනු ඇති අතර, එමඟින් ණය ගැතියාගේ පැතිකඩ ශක්තිමත් කිරීම තහවුරු කෙරේ. මෙම වීකකය විශේෂයෙන්ම ආයතනික

සහ ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ලබාදීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. එවැනි ණය ලබාදීම්වල බලපෑම රටේ වර්ධනයේ එන්පිම බඳු වූ ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයේ ආර්ථික සවිබල ගැන්වීමට සහ ජාතික න්‍යාය පත්‍රයටද දායක වනු ඇතැයි අපි අපේක්ෂා කරමු. තවද, බැංකුවේ තිරසාරභාවය සහ ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා බැංකුව විශේෂයෙන්ම ආයතනික පාලනය, රෙගුලාසි සහ හොඳම භාවිතයන් ප්‍රමුඛතම ක්ෂේත්‍රය ලෙස අවධාරණය කරයි.

අනාගතය දෙස සුබවාදීව බලමින්, අක්‍රීය ණය විනයගරුක ලෙස අඩු කිරීම සහ උසස් තත්ත්වයේ වත්කම් සහ ණය නිරාවරණයන් වෙත උපායමාර්ගිකව මාරු වීම හරහා බැංකුව සිය ණය පැතිකඩ ශක්තිමත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර සිටියි.

මූල්‍ය සාක්ෂරතාව සහ තිරසාර මූල්‍ය නිෂ්පාදන

වගකිවයුතු මූල්‍ය හැසිරීම් සහ ඉතුරුම් පුරුදු දිරිගැන්වීම සඳහා, බැංකුව විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රජාවන් අතර මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමට අඛණ්ඩව කටයුතු කරනු ඇත. මූල්‍ය සාක්ෂරතාව ලබාදීම මඟින්, පාරිභෝගික දැනුමේ පවතින හිඩැස් පියවීම කෙරෙහි බැංකුව අවධානය යොමු කරන අතර, එය විශේෂයෙන්ම අපගේ ග්‍රාමීය ගනුදෙනුකරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වේ. තේරුම් ගැනීමට පහසු මූල්‍ය සංකල්ප භාවිත කරමින් ණය ගැතියන් දැනුවත් කිරීමත්, ඉතුරුම් සංස්කෘතියක් සහ විනයගරුක මූල්‍ය හැසිරීම් රටාවක් ප්‍රවර්ධනය කිරීම සඳහා අරපිරිමැස්ම පිළිබඳ පුරුදු දිරිගැන්වීමත් අපගේ වගකීමක් බව අප තරයේ විශ්වාස කරමු.

තිරසාරත්වයේ දෘෂ්ටිකෝණයෙන් බලන කල, ඉලක්කගත ණය වැඩසටහන් හරහා අපි ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ගැටලුවට විසඳුම් සපයන්නෙමු. එමෙන්ම කෘෂිකර්මාන්තය සහ ආහාර නිෂ්පාදනයට අදාළ ව්‍යාපෘතිවල නිරත වන ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත ණය ලබාදීමට සෘජුවම කටයුතු කරන අතර, එහිදී නැවත වන වගාව, තිරසාර ආහාර සැකසුම්කරණය සහ ගස් සිටුවීම වැනි පාරිසරික වශයෙන් වගකිවයුතු ව්‍යාපෘති කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

2026-2030 කාලසීමාව සඳහා වූ අපගේ උපායමාර්ගික දිශානතියේ සාරාංශයක් පහත දැක්වේ:

අවධානය යොමු කරන ක්ෂේත්‍රය	**ප්‍රධාන අරමුණ**
වර්ධනය	ඉලක්කගත නිෂ්පාදන නවෝත්පාදනයන් සහ ඒවා වැඩිදියුණු කිරීම් හරහා වෙළෙඳපොළ කොටස පුළුල් කිරීම.
අවධානම	සේවක අර්ථසාධක අරමුදලේ ඇපකර මත පදනම් වූ ණයවලින් ඔබ්බට විවිධාංගීකරණය වීම මඟින් කේන්ද්‍රගත වීමේ අවදානම අඩු කිරීම සහ බහු-ස්ථර අනුමත කිරීමේ රාමු හරහා ණය පාලනය ශක්තිමත් කිරීම.
ව්‍යාප්තිය	ආයතනික සහ ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ පුරා වර්ධනයක් ඇති කිරීම සඳහා විශේෂිත ව්‍යාපාරික බැංකුකරණ ඒකකයක් පිහිටුවීම.
අනුකූලතාවය	නියාමන අවශ්‍යතා සහ ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ සම්පූර්ණයෙන්ම පෙළගැසීම තහවුරු කිරීම.

කෘතඥතාව පිරිනැමීම

විශ්‍රාම ලත් සභාපති පී. ජේ. ජයසිංහ මහතා, මෑතකදී විශ්‍රාම ගිය සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සී. ආර්. පී. බාලසූරිය මහතා සහ සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ විශ්‍රාම ගිය අධ්‍යක්ෂවරුන් වෙත මාගේ අවංක කෘතඥතාව පිරිනමමි.

HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, මහ බැංකුව සහ අපගේ ප්‍රධාන කොටස් හිමිකරු වන නිවාස සහ සංවර්ධන අධිකාරී අමාත්‍යාංශය වෙත ඔවුන් අඛණ්ඩව ලබාදුන් විශ්වාසය සහ සහයෝගය වෙනුවෙන් මාගේ ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.


2025 මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ අරමුණු සමඟ පෙළගැසීමට කැපවීමෙන් කටයුතු කළ අපගේ කළමනාකාරිත්වයේ සහ කාර්ය මණ්ඩලයේ සේවයද මම අගය කරමි.

බැංකුවේ තිරසාරභාවය තහවුරු කිරීමට සහ අපගේ සියලුම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සුරක්ෂිත කිරීම සඳහා අභියෝගාත්මක මෙන්ම අත්‍යවශ්‍ය පියවර ගැනීමට අපව දිරිමත් කරමින්, විචක්ෂණශීලී නියාමන සහාය හරහා ලැබුණු මඟපෙන්වීම සහ සහයෝගයද මම කෘතඥදූපූර්වකව සිහිපත් කරමි. අප කෙරෙහි අඛණ්ඩව විශ්වාසය තැබූ සහ හවුල්කාරිත්වය පවත්වාගෙන ගිය අපගේ වටිනා ගනුදෙනුකරුවන් වෙතද මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

මීට අමතරව, මෙම මූල්‍ය වර්ෂය තුළ අතිමහත් සහයෝගයක් සහ මඟපෙන්වීමක් ලබාදුන් ජාතික විගණන කාර්යාලයේ උපදේශකවරුන් සහ මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙතද මගේ ස්තුතිය පුද කරමි.

අවසාන වශයෙන්, බැංකුව සමඟ සිය මූල්‍ය අවශ්‍යතා තවදුරටත් රඳවා තබා ගැනීම පිළිබඳව අපගේ කොටස් හිමියන්ට ස්තුති කරමි.

මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර වර්ධනය ඉහළ නැංවීමේ මුලපිරීම් අප ඉදිරියට ගෙනයන විට, ඔබ අප කෙරෙහි තැබූ අඛණ්ඩ විශ්වාසය අපි බෙහෙවින් අගය කරමු.



හේමාල් සී. ලොකුගීගන
සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී

2026 මැයි 27

අධ්‍යක්ෂ මණ්ඩලය

ආචාර්ය ක්‍රිශාන්ත පතිරාජ මහතා

විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ආචාර්ය ක්‍රිශාන්ත පතිරාජ මහතා 2022 ජූනි 30 දින සිට 2025 ජූනි දක්වා කාලය සඳහා HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලද අතර, 2025 ජූනි 23 දින සිට නැවත වරක් එම තනතුර සඳහා පත් කරනු ලැබීය.

ඔහු පිළිගත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල උපදේශකවරයෙකු ලෙස කටයුතු කර ඇති අතර කටාන, කළුතර සහ අත්තිඩිය යන ප්‍රදේශවල පිහිටි ශ්‍රී ලංකා පොලිස් ඇකඩමියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙසද, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා භාෂා පීඨයේ බාහිර පීඨ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද සේවය කර ඇත.

ඔහු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පෞද්ගලික සමාගම් කිහිපයක ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු / උපදේශකවරයෙකු ලෙස සේවය කරයි. තවද, ඔහු 2022 ජනවාරි 10 වන දින ඉන්දියාවේ තමිල්නාඩුවේ පිහිටි 'ඩී. කේ. ජාත්‍යන්තර පර්යේෂණ පදනමේ' විද්‍යාත්මක උපදෙස් මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. එමෙන්ම, 2022 දෙසැම්බර් 17 වන දින ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ 'පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර ඇමරිකානු කවුන්සිලයේ' විධායක අධ්‍යක්ෂවරයා ලෙසද පත් කරනු ලැබීය.

ආචාර්ය ක්‍රිශාන්ත මහතා ව්‍යාපාර පරිපාලනය, උපායමාර්ගික කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥයෙකි.

ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ 'කැලිෆෝනියා පබ්ලික් යුනිවර්සිටි' වෙතින් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ගෞරව ආචාර්ය උපාධියක් ලබා ඇති අතර, එම විශ්වවිද්‍යාලයේ සාමාජිකයෙකුද වෙයි. තවද ඔහු ඉන්දියාවේ 'ග්ලෝබල් පීස් යුනිවර්සිටි' වෙතින් තොරතුරු තාක්ෂණය පිළිබඳ ගෞරව ආචාර්ය උපාධියක් සහ කැම්බෝජයේ ICC තාක්ෂණික විශ්වවිද්‍යාලය' වෙතින් උපායමාර්ගික කළමනාකරණය පිළිබඳ අධ්‍යයන ආචාර්ය උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඔහු එක්සත් රාජධානියේ බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ වෘත්තීය සාමාජිකයෙකු වන අතර, තොරතුරු සන්නිවේදන තාක්ෂණ වරලත් ආයතනයේ සහ එක්සත් රාජධානියේ ජාතික පරිගණක මධ්‍යස්ථානයේ සාමාජිකයෙකුද වෙයි.

ආචාර්ය ක්‍රිශාන්ත පතිරාජ මහතා තල් සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපතිවරයෙකු වන අතර, ශ්‍රී ලංකා විදේශ කටයුතු ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ හිටපු උපදේශකවරයෙකුද වෙයි.



කේ. බී. විජයරත්න මහතා

විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

කිත්සිරි බී. විජයරත්න මහතා 2024 සැප්තැම්බර් 25 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීය.

විජයරත්න මහතා 'විජයරත්න ඇසෝසියේට්ස්' ආයතනයේ හවුල්කරුවෙකු ලෙස කටයුතු කරයි. එමෙන්ම, ඔහු දැනට රිචඩ් පීරිස් ෆයිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කරයි.

ඔහු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා ලෙස වසර 10කට ආසන්න කාලයක් සේවය කර ඇත. එසේම, ඔහු සෞදි අරාබියේ 'ට්‍රෙඩ් යූනියන් ඉන්ෂුවරන්ස් කොම්පැනි ඊසී' ආයතනයේ මූල්‍ය හා පරිපාලන ප්‍රධානියා ලෙස වසර 13කට වැඩි කාලයක් සේවය කර ඇත. එම සමාගම සෞදි අරාබි රාජධානිය පුරා ශාඛා පහක් පවත්වාගෙන යන අතර එහි ප්‍රධාන කාර්යාලය බහරේනයේ පිහිටා ඇත. විජයරත්න මහතා ප්‍රධාන වශයෙන් රක්ෂණ සහ බැංකු ක්ෂේත්‍රයන්හි පුළුල් පළපුරුද්දක් සහිතව, මෙරට සහ විදේශයන්හි ප්‍රමුඛ පෙළේ මූල්‍ය ආයතනවල ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව තනතුරු හොබවමින්, විගණන සහ මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ වසර 41කට වැඩි අත්දැකීම් ප්‍රමාණයක් සතු කරගෙන සිටියි.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු, ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු, ශ්‍රී ලංකා ගණකාධිකාරී තාක්ෂණවේදීන්ගේ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකු වෙයි. එමෙන්ම විජයරත්න මහතා වෘත්තීයවේදීන්ගේ සංගම් සංවිධානයේ විධායක සභාවේ කළමනාකාරිත්ව නියෝජිත සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය මූල්‍ය සහ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත.



අධ්‍යක්ෂ මණ්ඩලය

ඒ. එන්. හපුගල මහතා

විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ඒ. එන්. හපුගල මහතා 2025 ජනවාරි 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීය.

ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු වන ඒ. එන්. හපුගල මහතා, 1992 වසරේදී ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ගණකාධිකාරිවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරමින් වසර තිහකට වැඩි කාලයක් රාජ්‍ය ක්ෂේත්‍රයේ සේවය කර ඇත. මෙයට මහා භාණ්ඩාගාරය තුළ සේවය කළ වසර විස්සක කාලසීමාවද ඇතුළත් වේ.හපුගල මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සහ ශ්‍රී ලංකා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (B.Sc.) උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඔහු ශ්‍රී ලංකා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගණකාධිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා දෙකක් සහ සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබේ. තවද, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට අනුබද්ධ රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකුද වෙයි.



ජේ. එම්. පී. එස්. කෞෂල්‍ය මහතා

විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ජේ. එම්. පී. එස්. කෞෂල්‍ය මහතා 2025 ජූනි 23 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීය.

කෞෂල්‍ය මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් ගණකාධිකාරීවරයෙකු සහ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ශ්‍රවණාභිමානී කළමනාකරණ ගණකාධිකාරීවරයෙකු වෙයි. එමෙන්ම ඔහු චික්සත් රාජධානියේ වරලත් සහතික ලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකුද වෙයි. තවද, ඔහු ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකුද වෙයි. මීට අමතරව, ඔහු ශ්‍රී ලංකා බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයෙන් රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇත.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ චික්සත් රාජධානියේ බකිංහැම්ෂයර් නිව් යුනිවර්සිටි වෙතින් නීතිවේදී පශ්චාත් උපාධියක් ඇතුළුව ශක්තිමත් අධ්‍යයන පසුබිමකට හිමිකම් කියයි. තවද, ඔහු ශ්‍රී ලංකා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රථම පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇත.

ඔහු බැංකු, මූල්‍ය සහ උපදේශන සේවා ක්ෂේත්‍රයන්හි වසර 30කට වැඩි පළපුරුද්දක් සතු කරගෙන සිටියි. ඉන් වසර 24ක්ම බැංකු ක්ෂේත්‍රය තුළ ලබාගත් අත්දැකීම් වේ. ඔහු ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ සහ හෞ බැංකුවේ විවිධ තනතුරු හොබවා ඇත. තවද, ඔහු 'බේකර් ටිලී ඉන්ටර්නැෂනල්' හි සාමාජික සමාගමක් වන 'බේකර් ටිලී ශ්‍රී ලංකා' ආයතනයේ මූල්‍ය උපදේශන සේවා අධ්‍යක්ෂවරයෙකු ලෙසද සේවය කර ඇත. මෙයට අමතරව, ඔහු ශ්‍රී ලංකාවේ සමාගම් කිහිපයක ගණකාධිකාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ මූල්‍ය ප්‍රධානී වැනි තනතුරුද හොබවා ඇත.



අධ්‍යක්ෂ මණ්ඩලය

කේ. කේ. ගයානි ප්‍රේමතිලක මහත්මිය
විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ගයානි ප්‍රේමතිලක මහත්මිය 2025 ජූලි 18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීය.

නීතිඥ ගයානි ප්‍රේමතිලක මහත්මිය දැනට රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රධාන නීති නිලධාරිනිය ලෙස සේවය කරයි. ඇය සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේ 2007 වසරේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නීති නිලධාරිනියක වශයෙනි.

ප්‍රේමතිලක මහත්මිය අධ්‍යයන ක්ෂේත්‍රය සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ක්ෂේත්‍රය තුළ දශක දෙකකට වැඩි ප්‍රගතිශීලී පළපුරුද්දක් සහිත කැපවූ නීති නිලධාරිනියක වන අතර, ඇය බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පාලක මණ්ඩලයේ සාමාජිකාවකද වෙයි.

ඇය සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේ රත්නපුර තාක්ෂණික විද්‍යාලයේ වාණිජ නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරියක ලෙසයි (2002-2004). ඉන් අනතුරුව 2007 වසරේදී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ නීති නිලධාරිනියක ලෙස රාජ්‍ය සේවයට එක් වූ ඇය, එහි නීති උපදේශන ධාරිතාවයෙන් අඛණ්ඩව සේවය කරගෙන යනු ලබයි.

ඇය පළාත් පාලන සහ පළාත් සභා නීති පිළිබඳ විශේෂඥතාවක් දක්වන, රාජ්‍ය ක්ෂේත්‍රයේ පළපුරුදු නීති වෘත්තිකයෙකි.

රාජ්‍ය ක්ෂේත්‍රයේ වසර විස්සකට ආසන්න කාලයක් සේවය කර ඇති ඇය, නීතිමය ප්‍රතිසංස්කරණ අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීමටත්, ඵලදායී ප්‍රාදේශීය පරිපාලනයකට සහාය වීම සඳහා පනත් කෙටුම්පත් සහ සංශෝධන සකස් කිරීමටත් මැනවින් දක්ෂය.

ඇය සතු විශේෂඥ නීති දැනුම හරහා පළාත් සභ ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තහවුරු කිරීම සඳහා, උප-ජාතික මට්ටමේ පාලනයට අදාළ ව්‍යවස්ථාදායක වැඩිදියුණු කිරීම් සිදු කිරීමට ඇය කැපවී සිටියි.

ඇය කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධියක්, කොළඹ විශ්වවිද්‍යාලයෙන්ම මානව හිමිකම් පිළිබඳ පශ්චාත් උපාධියක් සහ එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී පශ්චාත් උපාධියක් ලබා ඇත.




එස්. එස්. ශිරෝමා නන්දනී මහත්මිය

විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

එස්. එස්. ශිරෝමා නන්දනී මහත්මිය 2025 නොවැම්බර් 03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීය.

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරිනියක වන එස්. එස්. ශිරෝමා නන්දනී මහත්මිය, ගණකාධිකාරී සේවය සහ රාජ්‍ය ක්ෂේත්‍රය තුළ වසර 20 ක සේවා කාලයක් සපුරා ඇත. ඇය දැනට කම්කරු අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිවරිය ලෙස කටයුතු කරයි. රජයේ ගණකාධිකාරිවරියක ලෙස පළාත් පාලන මූල්‍ය ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂඥතාවක් දක්වන ඇය, රාජ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ මනා විශේෂඥ දැනුමකින් යුක්තය. ඇය කොළඹ මහා නගර සභාවේ ප්‍රධාන නගර සභා භාණ්ඩාගාරික ලෙසද සේවය කර ඇත.

නන්දනී මහත්මිය ශ්‍රී ලංකා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ප්‍රථම පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිතව වාණිජවේදී විශේෂ උපාධියක් ලබා ඇත. ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක්ද ලබා තිබේ. තවද, ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට අනුබද්ධ රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකුද වෙයි.



අධ්‍යක්ෂ මණ්ඩලය


ජේ. කේ. අරවින්ද සිරිනාථ මහතා
විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ජේ. කේ. අරවින්ද සිරිනාථ මහතා 2025 නොවැම්බර් 21 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීය.

සිරිනාථ මහතා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ කළමනාකරණය පිළිබඳ උපාධියක් සතු කරගෙන සිටින අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලබන මධ්‍යම මට්ටමේ විභාගද සම්පූර්ණ කර ඇත. ඔහු මූල්‍ය, නිෂ්පාදන, සැපයුම් දාම කළමනාකරණය මෙන්ම විකුණුම් සහ අලෙවිකරණ යන ක්ෂේත්‍රයන්හි වසර 25 ක පළපුරුද්දක් හිමිකරගෙන සිටියි.

ජේ. කේ. අරවින්ද සිරිනාථ මහතා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ලෙස සේවය කරයි. මීට අමතරව, ඔහු වල්බී මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) සමාගම, ඩෙල්මේජ් ෆ්‍රයිට් සර්විසස් (පුද්ගලික) සමාගම, ඩෙල්මේජ් වියාර් සර්විසස් සමාගම, චිවර් පේන්ට් ඇන්ඩ් කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම සහ හෝම් බේස් ලංකා (පුද්ගලික) සමාගම යන ආයතනවල විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි.

මෙම වගකීම්වලට අමතරව, සිරිනාථ මහතා නාගරික සංවර්ධන අධිකාරිය, ඕෂන් විව් ඩිවෙලොප්මන්ට් සමාගම සහ තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලනය කිරීමේ) මණ්ඩලය ඇතුළු ප්‍රමුඛ පෙළේ ජාතික ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද සිය දායකත්වය සපයයි.



ඉංජිනේරු ආර්. ඒ. සුජීව රණවක මහතා

විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ



ආර්. ඒ. සුජීව රණවක මහතා 2026 ජනවාරි 09 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීය.

ඉංජිනේරු රණවක මහතා යටිතල පහසුකම් සංවර්ධනය, වෙරළබඩ සම්පත් කළමනාකරණය සහ රාජ්‍ය අංශයේ ඉංජිනේරු පරිපාලනය යන ක්ෂේත්‍රයන්හි දශක තුනකට ආසන්න සේවා කාලයක් සපුරා ඇති වරලත් සිවිල් ඉංජිනේරුවරයෙකි. ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන අතර, දැනට නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (නිවාස හා ඉදිකිරීම්) ලෙස සේවය කරයි. ඔහු සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේ 1995 වසරේදී මොරටුව විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ උපදේශකවරයෙකු වශයෙනි.

ඉංජිනේරු රණවක මහතා සතුව වසර 30කට වැඩි පළපුරුද්දක් ඇති අතර, එම කාලය තුළ ඔහු ශ්‍රී ලංකා වෙරළ සංරක්ෂණ හා වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්/දෙපාර්තමේන්තු ප්‍රධානී තනතුරද හොබවා ඇත. ඔහු 1995 වසරේදී මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ලබා ගත්තේය.

උපාධිය ලැබීමෙන් පසු, ඔහු මොරටුව විශ්වවිද්‍යාලයේ උපදේශකවරයෙකු ලෙස වසරකට ආසන්න කාලයක් සේවය කළ අතර, පසුව ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ක්ෂේත්‍ර ඉංජිනේරුවරයෙකු ලෙස සම්බන්ධ විය. 1997 ජනවාරි මාසයේදී ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය හරහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට චිකතු වෙමින් රාජ්‍ය සේවයට ප්‍රවේශ විය. එහි සේවා කාලය තුළ ඔහු ප්‍රාදේශීය ඉංජිනේරු (දකුණ සහ බටහිර), ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු (පර්යේෂණ හා සැලසුම්), ප්‍රධාන ඉංජිනේරු (වැඩ) සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) ඇතුළු තනතුරු රැසක් හෙබවීය.

ඔහු 2001 වසරේදී නෝර්වේහි පිහිටි 'නෝර්වීජියානු විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලයෙන්' සාගර තාක්ෂණය පිළිබඳ විද්‍යාපති පශ්චාත් උපාධිය ලබා ගත්තේය. ඔහු 2002 වසරේ සිට වරලත් ඉංජිනේරුවරයෙකුවන අතර, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකු සහ ඇමරිකානු සිවිල් ඉංජිනේරු සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකුද වෙයි.

ඔහුගේ අධ්‍යයන හා වෘත්තීය දායකත්වයන් අතරට වෙරළ තීරය කළමනාකරණය, වෙරළ බාදනය සහ වෙරළබඩ ගතිකත්වයන් සඳහා දුරස්ථ සංවේදනය සහ භූගෝලීය තොරතුරු පද්ධති භාවිත කිරීම පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රකාශන කිහිපයක් ඇතුළත් වේ. වෙරළබඩ ආකෘතිකරණය (MiKE 21, COMCOT), GIS සහ දුරස්ථ සංවේදන යෙදුම් (ArcGIS, ERDAS, Global Mapper), ව්‍යාපෘති සැලසුම්කරණ මෙවලම් (MS Project Excel) සහ AutoCAD සම්බන්ධයෙන් තාක්ෂණික වශයෙන් ඉහළ නිපුණතාවක් දක්වන ඉංජිනේරු රණවක මහතා, නවෝත්පාදනය, මනා ඉංජිනේරුමය විනිශ්චය සහ ඵලදායී ආයතනික නායකත්වය හරහා ශ්‍රී ලංකාවේ නිවාස, වෙරළ ආරක්ෂණය සහ තිරසාර නාගරික සංවර්ධන ක්ෂේත්‍රයන් ඉදිරියට ගෙනයාම සඳහා අඛණ්ඩව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. චික්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ආසියානු සංවර්ධන බැංකුව, ආහාර හා කෘෂිකර්ම සංවිධානය, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල, චික්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය-IHE, ලෝක බැංකුව සහ සාර්ක් වැනි ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් ජාතික සහ ආධාරකරුවන්ගේ අරමුදල් සහිත ව්‍යාපෘති රාශියකට සාර්ථකව දායක වී ඇති ඔහු, FIDIC මත පදනම් වූ කොන්ත්‍රාත් පරිපාලනය, ව්‍යාපෘති පාලනය, ප්‍රතිපත්ති සම්පාදනය සහ බහුවිධ වෙරළබඩ සංවර්ධනය පිළිබඳ පුළුල් විශේෂඥ දැනුමක් සතු කරගෙන සිටියි.

ඉංජිනේරු රණවක මහතා සිවිල් ඉංජිනේරු විද්‍යාව, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ පාරිසරික පාලනය පිළිබඳ අවධානය යොමු කරමින්, චික්සත් ජනපද නාවික හමුදාවේ ඉන්දු-පැසිෆික් අණදෙන මූලස්ථානය, ලෝක බැංකුව, චික්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය-IHE සහ ටෝකියෝ විශ්වවිද්‍යාලය වැනි ආයතන මඟින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර වැඩමුළු සහ සංසද 25කට වැඩි ප්‍රමාණයකදී ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත.

සංස්ථාපිත කළමනාකාරීත්වය



එච්. සී. ලොකුගීගන මහතා
සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී



කේ. එම්. කේ. දේශප්‍රිය මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ණය සහ අයකරගැනීම්



කේ. ටී. ඩී. ඩී. ද සිල්වා මෙනවිය
සහකාර සාමාන්‍යාධිකාරී - නීති



එච්. ඒ. අනුර මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරී



ඩබ්ලිව්. එම්. එල්. ආර්. විජේසුන්දර මෙනවිය
සහකාර සාමාන්‍යාධිකාරී - මහා භාණ්ඩාගාරය



අයි. නිශාන්ත මහතා
ප්‍රධාන කළමනාකරු - අවදානම් කළමනාකරණය



ආර්. පී. ජී. ලෙනෝරා මහත්මිය
අනුකූලතා නිලධාරිනී



ජී. පී. ප්‍රියදර්ශනී මෙනවිය
ප්‍රධාන අභ්‍යන්තර විගණක

එච්. සී. ලොකුගීගන මහතා

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී

කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය, රජරට විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජික, කළමනාකරණ ආයතනයේ සාමාජික, සහ පුද්ගල කළමනාකරණ ආයතනයේ වරලත් සාමාජික.

පත්වීම් දිනය - 2025 අගෝස්තු 14

හේමාල් ලොකුගීගන මහතා බැංකු ක්ෂේත්‍රය තුළ වසර 24කට වැඩි විශිෂ්ට වෘත්තීය ජීවිතයකට හිමිකම් කියන, ඉහළ ජයග්‍රහණ අත්කරගත් වෘත්තිකයෙකි. ව්‍යාපාර සහ කළමනාකරණ ක්ෂේත්‍රයේ පිළිගත් නායකයෙකු වන ඔහු, ආයතනික මෙහෙයුම් සහ උපායමාර්ගික නායකත්වය පිළිබඳ මනා අවබෝධයක් පෙන්නුම් කරමින් අඛණ්ඩව ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව තනතුරු හොබවා ඇත.

SDB බැංකුවේ ඔහුගේ වෘත්තීය ගමන, කැපී පෙනෙන වර්ධනයක් සහ වගකීම් සමුදායක් නිරූපණය කරයි. එහි ආරම්භක ප්‍රධාන අවදානම් නිලධාරී / නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස වැදගත් සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, ඔහු ව්‍යාපාරික බැංකුකරණ සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ප්‍රධානියා ලෙස සේවය කළේය. ඊට පෙර ඔහු මානව සම්පත් කළමනාකරණ සහ සංවර්ධන අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී, පුහුණු අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී සහ වයඹ පළාත් ප්‍රධානී, ප්‍රාදේශීය කළමනාකරු මෙන්ම මානව සම්පත් සහ පරිපාලන අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු යන තනතුරු රැසක් හොබවා ඇත. ලොකුගීගන මහතා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඇතුළු විවිධ ආයතනවල බාහිර කථිකාචාර්යවරයෙකු ලෙසද කටයුතු කර ඇති අතර, විභිදී ඔහු අවදානම් කළමනාකරණය, ණය කළමනාකරණය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ සිය විශේෂඥ දැනුම බෙදාගෙන ඇත. වෘත්තීය සංවර්ධනය උදෙසා ඔහුගේ ඇති කැපවීම, ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සහ සමුළුවලට සහභාගී වීමෙන් මැනවින් පැහැදිලි වේ. ඒ අතර, ජපානයේ පැවැත්වුණු ජ්‍යෙෂ්ඨ ආයතනික කළමනාකරණ නායකත්ව වැඩසටහන සඳහා ලැබුණු ශිෂ්‍යත්වය සහ ඉන්දියාවේ NIBM ආයතනයේදී ලැබූ පුහුණුව, ගෝලීය බැංකුකරණ භාවිතයන් පිළිබඳ ඔහුගේ අවබෝධය තවදුරටත් පුළුල් කිරීමට දායක විය.

ඔහු සතු පුළුල් පළපුරුද්ද සහ ඔප්පු කරන ලද නායකත්වය, මෙම තීරණාත්මක අවස්ථාවේදී බැංකුවේ ඉදිරි ගමන සඳහා වටිනා අවබෝධයක් සහ මඟපෙන්වීමක් ගෙන එනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කේ. එම්. කේ. දේශප්‍රිය මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ණය සහ අයකරගැනීම්

පත්වීම් දිනය: 2024 ජූන් 23

දේශප්‍රිය මහතා බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ දශක තුනකට වැඩි පළපුරුද්දක් ඇති වෘත්තිකයෙකි. ඔහු 1999 වසරේදී ජාතික සංවර්ධන බැංකුවේ ශාඛා ගණකාධිකාරීවරයෙකු ලෙස සිය බැංකු වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර, එතැන් සිට ශාඛා ගණකාධිකාරී, මූල්‍ය නියෝජ්‍ය කළමනාකරු, ප්‍රතිමූල්‍යකරණ කළමනාකරු සහ ප්‍රතිමූල්‍යකරණ ප්‍රධානී ඇතුළු ප්‍රධාන තනතුරු කිහිපයක්ම හොබවා ඇත. ඔහුගේ සමස්ත වෘත්තීය ජීවිතය පුරාම මූල්‍ය කළමනාකරණය සහ සංවර්ධන බැංකුකරණය පිළිබඳ ශක්තිමත් නායකත්වයක්, උපායමාර්ගික අවබෝධයක් සහ ගැඹුරු විශේෂඥතාවක් ඔහු විසින් පෙන්නුම් කර ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ එම විශ්වවිද්‍යාලයෙන්ම ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ද ආශ්‍රිත සාමාජිකයෙකු වෙයි.

දේශප්‍රිය මහතා ප්‍රමුඛ පෙළේ බහුපාර්ශ්වීය සහ සංවර්ධන මූල්‍ය ආයතන සමඟ මෙන්ම මුදල් අමාත්‍යාංශය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව වැනි ප්‍රධාන රාජ්‍ය ආයතන සමඟ සමීප වෘත්තීය සබඳතා පවත්වා ගෙන ගොස් ඇත. ශ්‍රී ලංකාව පුරා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ඔහුගේ දායකත්වය බෙහෙවින් ඉවහල් වී ඇත.

සිය බැංකු වෘත්තියට පෙර, ඔහු වීවිස් ඇන්ඩ ඇසෝසියෙට් වරලත් ගණකාධිකාරී ආයතනයේ සහකාර කළමනාකරුවෙකු ලෙස වෘත්තීය පළපුරුද්ද ලබා ගත්තේය. ඔහු සිසිපිඅයි මනේජ්මන්ඩ් හෝල්ඩිංස් ප්‍රයිවට් ලිමිටඩ් හි සාමාන්‍යාධිකාරී සහ නිකාඩෝ කම්පැණි ප්‍රයිවට් ලිමිටඩ් හි මූල්‍ය ප්‍රධානී ඇතුළු ජ්‍යෙෂ්ඨ කාර්මික තනතුරුද හොබවා ඇත.

මූල්‍ය හා ගණකාධිකාරී වෘත්තියේ සංවර්ධනය උදෙසා ඇති දැඩි කැපවීම පෙන්නුම් කරමින් දේශප්‍රිය මහතා අධ්‍යයන හා වෘත්තීය අධ්‍යාපනය සඳහා දායක වී ඇත. ඔහු ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සංවර්ධන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති අතර, ඩිපිඩ් වඩියුකේෂන් ඔන්ලයින් පාසලේ දේශකවරයෙකු මෙන්ම SLIATE ආයතනයේ බාහිර දේශකවරයෙකු ලෙසද කටයුතු කර තිබේ.

කේ. ටී. ඩී. ඩී. ද සිල්වා මෙනවිය

සහකාර සාමාන්‍යාධිකාරී - නීති

නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්, ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය, නීතිවේදී පශ්චාත් උපාධිය සහ බැංකු, මූල්‍ය හා රක්ෂණ නීති පිළිබඳ උසස් ඩිප්ලෝමාව.

පත්වීම් දිනය - 1999 සැප්තැම්බර් 01

ද සිල්වා මහත්මිය නීතිඥවරියක ලෙස වසර 30ක පළපුරුද්දක් සතු කරගෙන සිටින අතර, 1999 වසරේදී HDFC බැංකුවේ නීති දෙපාර්තමේන්තුවට අනුබද්ධ නීතිඥවරියක ලෙස සිය HDFC වෘත්තීය ජීවිතය ආරම්භ කළාය. ඉන්පසුව, ඇය 2006 වසරේදී සමාගම් ලේකම්වරිය ලෙස පත් කරන ලද අතර, පසුව මානව සම්පත් අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී තනතුර දක්වා උසස් කරනු ලැබීය. 2023 වර්ෂය තුළදී ඇය සහකාර සාමාන්‍යාධිකාරී - නීති ලෙස පත් කරන ලදී.

එච්. ඒ. අනුර මහතා

ප්‍රධාන මූල්‍ය නිලධාරී

MBA, PGDM (RJT), B.Sc. Accy (Sp) (USJ), FIPA (Au), FFA(UK), MAAT, Inter. of CA Sri Lanka.

පත්වීම් දිනය - 2004 ඔක්තෝබර් 01

අනුර මහතා බැංකුකරණය, ණය, අයකරගැනීම්, අරමුදල් සචලනය, ශාඛා මෙහෙයුම්, ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, බදුකරණය, විගණනය, මහා භාණ්ඩාගාර කළමනාකරණය, අනුකූලතාවය, ආයතනික මූල්‍ය වාර්තාකරණය සහ වාර්ෂික වාර්තා, අයවැයකරණය සහ මූල්‍ය සැලසුම්කරණය යන ක්ෂේත්‍රයන්හි දශක දෙකහමාරක සේවා පළපුරුද්දක් සතු අයෙකි. ඔහු ආයතනික මට්ටමේ කළමනාකරණය පිළිබඳ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් කිහිපයකටම සහභාගී වී ඇත.

ඔහු 1996 වසරේදී ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සහ ලංකා ධීවර සංස්ථාවේ ගණකාධිකාරණ ක්ෂේත්‍රයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර, 1998 වසරේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට බැඳී විගණන/විධායක නිලධාරී සහ සහකාර කළමනාකරු යන තනතුරුවල සේවය කළේය. පසුව ඔහු 2004 වසරේදී HDFC බැංකුවට සම්බන්ධ වූයේ ගම්පහ ශාඛාවේ කළමනාකරු වශයෙනි. 2007 වසරේ සිට ඔහු මහා භාණ්ඩාගාර ගණකාධිකාරී, මූල්‍ය ගණකාධිකාරී, ජ්‍යෙෂ්ඨ මූල්‍ය කළමනාකරු සහ ප්‍රධාන මූල්‍ය කළමනාකරු යන තනතුරුවලද සේවය කර ඇත.

සංස්ථාපිත කළමනාකාරීත්වය

ඩබ්ලිව්. එම්. එල්. ආර්. විජේසුන්දර මෙනවිය

සහකාර සාමාන්‍යාධිකාරී - මහා භාණ්ඩාගාරය සහ වැඩබලන සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පරිපාලන)

ව්‍යාපාර පරිපාලනවේදී ශාස්ත්‍රපති උපාධියල කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (USJP), උපායමාර්ගික කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී පශ්චාත් උපාධිය ල මූල්‍ය, ව්‍යාපාර සහ පරිගණක ගණිතය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය (UOC), සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී (ඕස්ට්‍රලියානු සහ නවසීලන්ත)ල බැංකුකරුවන්ගේ ආයතනයේ සහයෝගී සාමාජික (ශ්‍රී ලංකා)

පත් කළ දිනය - 2025 ජනවාරි 02

විජේසුන්දර මෙනවිය සහකාර සාමාන්‍යාධිකාරී - මහා භාණ්ඩාගාරය සහ වැඩබලන සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් සහ පරිපාලන ලෙස සේවය කරන අතර, ඇය බැංකු ක්ෂේත්‍රය තුළ වසර 20කට වැඩි පුළුල් පළපුරුද්දක් සතු කරගෙන සිටියි.

ඇය මුදල් වෙළෙඳපොළ, විදේශ විනිමය සහ ස්ථාවර ආදායම් උපකරණ යන ක්ෂේත්‍රයන් පුරා මහා භාණ්ඩාගාර මෙහෙයුම් පිළිබඳ පුළුල් විශේෂඥතාවක් සතු වන්නීය. නියාමන අනුකූලතාවන්ට අනුගත වෙමින්, බැංකුවේ දේශීය මෙහෙයුම් කටයුතුවල සම්ස්ත මුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීම, ද්‍රවශීලතාව ප්‍රශස්තකරණය සහ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා ඇය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත.

ඇය ලංකා බැංකුවේ ලන්ඩන් සහ චෙන්නායි ශාඛාවල මුදල් ව්‍යවහාරකයෙකු ලෙස සේවය කරමින් ජාත්‍යන්තර අත්දැකීම් ලබා ඇති අතර, එමඟින් ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ සහ දේශසීමා මහා භාණ්ඩාගාර මෙහෙයුම් පිළිබඳ විටිනා අවබෝධයක් ඇයට ලැබී තිබේ.

මහා භාණ්ඩාගාර වගකීම්වලට අමතරව, විජේසුන්දර මෙනවිය මානව සම්පත් සංවර්ධනය සහ දක්ෂතා හඳුනාගෙන බඳවා ගැනීම් සඳහා මෙන්ම, ණය සහ ලීසිං පහසුකම් සඳහා වන ණය යෝජනා ක්‍රම සකස් කිරීම සඳහාද සිය දායකත්වය ලබා දී ඇත.

අයි. නිශාන්ත මහතා

ප්‍රධාන කළමනාකරු - අවදානම් කළමනාකරණය

ව්‍යාපාර අධ්‍යයන ශාස්ත්‍රපති උපාධියල මූල්‍ය ආකෘතිකරණ සහ වටිනාකම් විශ්ලේෂකල ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියල බැංකුකරුවන්ගේ ආයතනයේ සහයෝගී සාමාජික ප්‍රඥප්තිගත ගණකාධිකාරී ආයතනයේ බලපත්‍රලාභී සාමාජික

පත්වීම් දිනය - 2000 ජූනි 26

නිශාන්ත මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර, කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත. මෑතකදී ඔහු කැනඩාව පදනම් කරගත් කෝපරේට් ෆයිනෑන්ස් ඉන්ස්ටිට්යුට් මඟින් පිරිනමනු ලබන මූල්‍ය ආකෘතිකරණ සහ ඇගයීම් විශ්ලේෂක තනතුරෙන්ද පිදුම් ලැබීය.

ඔහු 2000 වසරේදී HDFC බැංකුවට සම්බන්ධ වෙමින් සිය බැංකු වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර, පසුගිය වසර විසිපහක (25) කාලය තුළදී, 2011 දෙසැම්බර් මාසයේදී අවදානම් කළමනාකරණ ප්‍රධානියා ලෙස පත් වීමට පෙර, ණය අයකරගැනීම්, මූල්‍ය, ණය පරිපාලන සහ ශාඛා මෙහෙයුම් යන අංශයන්හි තනතුරු කිහිපයක්ම හොබවා ඇත. 2017 වසරේදී අවසන් කරන ලද බැංකුවේ නව මූලික බැංකු පද්ධති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළදී ඔහු ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.

ආර්. පී. ජී. ලෙනෝරා මහත්මිය

අනුකූලතා නිලධාරිනී

MSc Applμed Fμnance (USJ) කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (OUSL) ABE (UK), බැංකු ඒකාබද්ධ අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව (IBSL), අනුකූලතාව පිළිබඳ ඩිප්ලෝමාව (IBSL), ණය කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව (IBSL)

පත්වීම් දිනය - 2024 අගෝස්තු 01

ලෙනෝරා මහත්මිය බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රය තුළ වසර 23කට වැඩි පළපුරුද්දක් ඇති, ඉහළ අත්දැකීම් සහිත අනුකූලතා නිලධාරිනියකි. ඇය ශ්‍රී ලංකා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යවහාරික මූල්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් සහ (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන්) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ වෘත්තීය පුහුණු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇත. ඇයගේ වෘත්තීය සුදුසුකම් අතරට ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය මඟින් පවත්වනු ලබන ඒකාබද්ධ බැංකු අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, ණය කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව සහ අනුකූලතාවය පිළිබඳ ඩිප්ලෝමාව ඇතුළත් වේ. මීට අමතරව, ඇය චික්සත් රාජධානියේ ABE ආයතනය වෙතින් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්ද (QCF අධියර 6) ලබා තිබේ. ශක්තිමත් අධ්‍යයන පදනමක් සහ පුළුල් ප්‍රායෝගික පළපුරුද්දක් සහිතව, ලෙනෝරා මහත්මිය මූල්‍ය ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය වන නියාමන රාමු, අවදානම් කළමනාකරණය සහ අනුකූලතා භාවිතයන් පිළිබඳව ගැඹුරු අවබෝධයක් වර්ධනය කරගෙන ඇත.

ජී. පී. ප්‍රියදර්ශනී මහත්මිය

ප්‍රධාන අභ්‍යන්තර විගණක

FCA, සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී, MAAT, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජික, ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ව්‍යාපාර පරිපාලනවේදී (ගණකාධිකරණ) විශේෂ උපාධිය

පත්වීම් දිනය - 2021 ඔක්තෝබර් 25

පාලිකා ප්‍රියදර්ශනී මහත්මිය ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස සේවය කරන අතර, ඇය විගණන වෘත්තිය තුළ වසර 16කට වැඩි පුළුල් පළපුරුද්දක් සතු කරගෙන සිටියි. HDFC බැංකුවට සම්බන්ධ වීමට පෙර, ඇය ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී තනතුර හෙබවූවාය. ඇයගේ වෘත්තීය ජීවිතය බැංකු ක්ෂේත්‍රය, රාජ්‍ය ව්‍යවසායයන්, රජයේ සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළු පුළුල් පරාසයක විහිදුණු ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරයි. ප්‍රියදර්ශනී මෙනවිය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු, සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු සහ ගණකාධිකාරීවේදීන්ගේ සංගමයේ සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය විසින් පවත්වනු ලබන අනුකූලතාවය පිළිබඳ ඩිප්ලෝමාවද ලබා ඇත. ඇය රුහුණ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී (ගණකාධිකරණ විශේෂ) උපාධියක් සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය



ඩබ්ලිව්. ඩී. කේ. සෙනෙවිරත්න මහතා
ප්‍රධාන කළමනාකරු - අයකරගැනීම්



ටී. එච්. කේ. පී. ද සිල්වා මහතා
ප්‍රධාන කළමනාකරු - තොරතුරු පද්ධති



ඩී. එන්. ධර්මරත්න මහතා
ප්‍රධාන කළමනාකරු - ණය



එච්. පී. එන්. අයි. විජයපතිරණ මහතා
ප්‍රධාන කළමනාකරු - ව්‍යාපාර සංවර්ධන



එම්. යූ. එස්. ද කොස්තා මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී
(ශාඛා ජාලය සහ බැංකු මෙහෙයුම්)



යූ. කේ. සමරආරච්චි මහත්මිය
මානව සම්පත් සහ පරිපාලන ප්‍රධානී -
වැඩබලන

මධ්‍යම කළමනාකාරීත්වය



එල්. ඩී. එස්. එච්. ලියනගේ මෙනවිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී - ගෙවීම්



ජී. ඩී. කේ. එච්. පෙරේරා මහතා
කළමනාකරු
(තැන්පතු සහ ව්‍යාපාර සංවර්ධන)



බී. ඒම්. පී. පෙරේරා මහතා
කළමනාකරු - ණය පරිපාලන සහ MIS අංශ ප්‍රධානී



කේ. එච්. ඩී. ප්‍රියංකා මහත්මිය
කළමනාකාරිනී - අලෙවිකරණ



එන්. එල්. විජේසිරි මෙනවිය
කළමනාකාරිනී
(තාක්ෂණික සහ පරිශ්‍ර නඩත්තු)



ජේ. ඒ. එල්. කේ. ජයලත් මෙනවිය
අංශ කළමනාකාරිනී - රන් ණය

කලාපීය කළමනාකරුවන්



ආර්. ඒ. ජේ. එන්. රණසිංහ මහතා
1 වන කලාපය
කලාපීය කළමනාකරු



බී. ඩබ්ලිව්. එම්. සී. කුමාරසිරි මහතා
2 වන කලාපය
කලාපීය කළමනාකරු



අයි. කේ. දවටංග මහතා
3 වන කලාපය
කලාපීය කළමනාකරු



එච්. එම්. යූ. සමරවීර මහතා
4 වන කලාපය
කලාපීය කළමනාකරු

ශාඛා කළමනාකරුවන්



බී. ජී. එච්. පී. දිල්ෂාන් මහතා
අම්බලන්ගොඩ
ශාඛා කළමනාකරු



ජේ. ඒ. ඩී. ඒ. රූපසිංහ මහතා
අම්පාර
ශාඛා කළමනාකරු



කේ. එම්. ඩී. ඒ. යූ. පෙරේරා මහතා
අනුරාධපුරය
සහකාර ශාඛා කළමනාකරු



ඩී. ආර්. ජී. ඩී. බී. ජයතිලක මහතා
අවිස්සාවේල්ල
ශාඛා කළමනාකරු



එම්. ජී. ඩී. පී. සෙනෙවිරත්න මිය
බදුල්ල
ශාඛා කළමනාකරු



එල්. ජයශංකර් මහතා
මඩකලපුව
ශාඛා කළමනාකරු



ආර්. එච්. එම්. සී. ප්‍රදීප් මහතා
හලාවත
වැඩබලන ශාඛා කළමනාකරු



ඩී. කේ. පී. ද සිල්වා මහතා
කොළඹ
ශාඛා කළමනාකරු



ඩී. එස්. ආර්. දිසානායක මහතා
දඹුල්ල
ශාඛා කළමනාකරු



එච්. ඩී. එස්. සෙනරත්න මහතා
ඇඹිලිපිටිය
ශාඛා කළමනාකරු



ටී. වී. ඩී. නයනජිත් මහතා
ගාල්ල
වැඩබලන ශාඛා කළමනාකරු



ඩබ්ලිව්. බී. එම්. ඒ. ප්‍රනාන්දු මිය
ගම්පහ
ශාඛා කළමනාකරු



යූ. පී. ඒ. එම්. එස්. පස්සපෙරුම මහතා
ගම්පොළ
වැඩබලන ශාඛා කළමනාකරු



ඩබ්ලිව්. ඒ. වයි. සොයිසා මහතා
හෝමාගම
සහකාර කළමනාකරු



පී. ඒ. විරාජ් සම්පත් මහතා
හොරණ
ශාඛා කළමනාකරු



බී. එම්. එස්. සඳමාලි මිය
හයිඩ් පාර්ක්
වැඩබලන ශාඛා කළමනාකරු



කේ. ඒ. ඒ. පී. එස්. කුමාර මහතා
ජා-ඇල
ශාඛා කළමනාකරු



එස්. සුයානියා මිය
යාපනය
ශාඛා කළමනාකරු



ආර්. එස්. අයි. සිල්වා මිය
කළුතර
ශාඛා කළමනාකරු



ආර්. ඒ. සී. එස්. පුෂ්පකුමාර මහතා
මහනුවර
ශාඛා කළමනාකරු



කේ. එල්. එම්. පී. සුමනරත්න මහතා
කෑගල්ල
ශාඛා කළමනාකරු



ටී. එච්. එම්. ඒ. හේවගේ මහතා
කිරිබත්ගොඩ
ශාඛා කළමනාකරු



ඒ. එම්. යූ. එස්. බී. අත්තනායක මහතා
කුලියාපිටිය
ශාඛා කළමනාකරු



ඩී. ඒ. එන්. පී. කේ. පියදාස මහතා
කුරුණෑගල
ශාඛා කළමනාකරු



සී. ඒ. කේ. අබේකෝන් මහත්මිය
මාතලේ
වැඩබලන ශාඛා කළමනාකරු



ආර්. එල්. ඩබ්ලිව්. සී. කුමාර මහතා
මාතර
ශාඛා කළමනාකරු



ඩබ්ලිව්. ඒ. කේ. ආර්. පී. ගුණරත්න මහතා
මොණරාගල
වැඩබලන ශාඛා කළමනාකරු



ජී. ජී. එන්. ටී. නිල්ගල මහතා
නිකවැරටිය
ශාඛා කළමනාකරු



එස්. කේ. පී. සමන්ති මහත්මිය
නිට්ටඹුව
ශාඛා කළමනාකරු



ඒ. යූ. ටී. ප්‍රනාන්දු මිය
නුගේගොඩ
ශාඛා කළමනාකරු



එච්. එච්. ආර්. එම්. හෙට්ටිගේ මහතා
නුවරඑළිය
ශාඛා කළමනාකරු



එච්. ඒ. එස්. එල්. හපන්ගම මහතා
පෑලියගොඩ
ශාඛා කළමනාකරු

ශාඛා කළමනාකරුවන්



එස්. එස්. මායාහගේ මිය
පිළියන්දල
වැඩබලන ශාඛා කළමනාකරු



එච්. ආර්. එම්. තාරක මහතා
පොළොන්නරුව
ශාඛා කළමනාකරු



ඩබ්ලිව්. ඩබ්ලිව්. එල්. විතානගේ මහතා
රත්නපුරය
වැඩබලන ශාඛා කළමනාකරු



සී. පී. අතපත්තු මිය
තංගල්ල
ශාඛා කළමනාකරු




එම්. ඒ. එස්. දේශප්‍රිය මහතා
තිස්සමහාරාමය
ශාඛා කළමනාකරු



ටී. වේල්ෂ්කුමා මහතා
ත්‍රිකුණාමලය
ශාඛා කළමනාකරු



එන්. පාර්තීපන් මහතා
වවුනියාව
ශාඛා කළමනාකරු



සෞඛ්‍යය උදෙසා සැකසුම



සාර්ව ආර්ථික පරිසරය සහ නිවාස මූල්‍යකරණය

මුදල් ප්‍රතිපත්ති පරිසරය සහ ණය වර්ධනය

ආර්ථිකය නැවත ස්ථාවරත්වයට පත් කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කළේය. මෙම ප්‍රවේශය පුද්ගලයන් සහ ව්‍යාපාර වැඩි වශයෙන් ණය ලබා ගැනීමට දිරිමත් කළ අතර, 2025 වසරේ මුල් මාස කිහිපය තුළ ආර්ථික අපේක්ෂාවන් කෙරෙහි පැවති විශ්වාසය ඉහළ ගියේය.

පුද්ගලික අංශයේ ණය ලබා ගැනීම සමස්ත ආර්ථික වර්ධනයට වඩා වේගවත් බවක් පෙන්නුම් කළ අතර, එය ණය චක්‍රයේ ප්‍රසාරණ අවධියක් සංඥා කළේය. ඒ අනුව, ව්‍යාපාර සහ ජනතාවගේ වැඩිවන ණය ඉල්ලුම සපුරාලීම සඳහා බැංකු වැඩි වශයෙන් අරමුදල් සැපයීය. කෙසේ වෙතත්, විචක්ෂණශීලී ණය ප්‍රමිතීන් සහ සමස්ත සාර්ව විචක්ෂණශීලී අරමුණු වැඩිදියුණු කිරීම සඳහා, මෝටර් රථ සඳහා ලබා දෙන ණය පහසුකම්වල ණය-වටිනාකම් අනුපාත සීමාවන් මහ බැංකුව විසින් යාවත්කාලීන කරන ලදී. ක්‍රියාත්මක වූ මුදල් ප්‍රතිපත්තිය සහ වැඩිදියුණු වූ ආයෝජක විශ්වාසය හේතුවෙන් වෙළඳපල පොලී අනුපාත පහළ මට්ටමක ස්ථාවර විය.

බැංකු සහ මූල්‍ය අංශයේ කාර්යසාධනය

2025 වසරේ බැංකු සහ මූල්‍ය සමාගම් හරහා ණය ප්‍රසාරණය ප්‍රධාන අවධානයක් දිනාගත් කරුණක් විය. දෙඅංශයේම සමස්ත වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු වූ අතර, 3 වන අදියරේ ණය ප්‍රමාණය දෙඅංශයෙන්ම අඩු විය. ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධන ස්වාරක්ෂකයක් ද පහත වැටී ඇතත්, ඒවා නියාමන සීමාවන්ට වඩා ඉහළින් පවතී.

2025 වසර අවසානය වන විට ණය වර්ධනය තියුණු ලෙස ඉහළ ගිය අතර, දළ ණය සහ ලැබිය යුතු මුදල් 21.4% කින් වර්ධනය විය. එය පෙර වසරේ පැවති 4.1% හා සැසඳීමේදී සැලකිය යුතු වර්ධනයකි. මෙම වර්ධනය මූල්‍ය සේවා, වෙළඳාම සහ පරිභෝජනය ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක් හරහා පුළුල් පදනමකින් සිදු විය. මූල්‍ය සේවා අංශයට ලබා දුන් ණය ප්‍රමාණය 148% කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එය මූල්‍ය සමාගම් අංශයට අවශ්‍ය අරමුදල් වැඩිවීම පෙන්නුම් කරයි.

තවද, ණය කළඹේ ගුණාත්මකභාවය වැඩිදියුණු වූ අතර, 3 වන අදියරේ ණය ප්‍රතිශතය 2024 අවසානයේ පැවති 12.3% සිට 2025 අවසානය වන විට 9.7% දක්වා පහත වැටිණි. මෙම අඩුවීම 2022 වසරේ දෙවන කාර්තුවෙන් පසු නැවතත් වීම අගය තනි අංකයකට පැමිණීමකි.

ණය වර්ධනයට සමගාමීව, බැංකු අංශයේ ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධන ස්වාරක්ෂකයක් 2025 අවසානය වන විට මධ්‍යස්ථ මට්ටමකට පත් වුවද, ඒවා නියාමන සීමාවන්ට වඩා ඉහළින් පවතී. සියලුම බැංකු අවම නියාමන සීමාවට වඩා ඉහළින් ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගනිමින් තම ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කළේය. 2025 වසර අවසානය වන විට වීම අංශයේ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය 17.9% ක් වූ අතර, එය 2025 වසරේ සිදුවූ ශක්තිමත් ණය ප්‍රසාරණය පිළිබිඹු කරයි. ක්ෂණික ණය ප්‍රසාරණය හේතුවෙන් මෙම අනුපාතයේ අඩුවීමක් සිදුවිය.

2025 වසර අවසානය වන විට කොටස් මත ප්‍රතිලාභය 16.6% ක් වීමත් සමඟ වීම අංශයේ ලාභදායිත්වය ශක්තිමත්ව පැවතුණි.

බැංකු අංශයේ සංයුතිය

ශ්‍රී ලාංකීය බැංකු අංශය බලපත්‍රලාභී වාණිජ බැංකු 24 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6 ක් ඇතුළුව බලපත්‍රලාභී බැංකු 30 කින් සමන්විත වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 2025 වාර්ෂික ආර්ථික සමාලෝචනයට අනුව, වැඩිදියුණු වූ සාර්ව ආර්ථික තත්ත්වයන් සහ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි සහයෝගය ඇතිව, ණය සහ ලැබිය යුතු මුදල්වල දැවැන්ත වැඩිවීමට අමතරව බැංකු අංශයේ වත්කම් පදනම ද වර්ධනයක් අත්විඳින ලදී.

සමස්ත පද්ධතියම නියාමන සීමාවන්ට වඩා ඉහළින් ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් සහ ප්‍රාග්ධන ස්වාරක්ෂකයක් පවත්වා ගත් අතර, එය නියාමන විධානවලට අනුකූල වීම සහ සමස්ත මූල්‍ය පරිසර පද්ධතියේ ස්ථාවරත්වය සහතික කිරීමක් විය.

2025 වසර තුළ, නව බැංකු ශාඛා 21 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 158 ක් ස්ථාපනය කරන ලදී; අනෙක් අතට, ශාඛා 21 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 31 ක් වසා දමන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2025 වසර අවසානය වන විට දිවයින පුරා විසිරී පැවති සමස්ත බැංකු ශාඛා සංඛ්‍යාව 7,973 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 7,412 ක් විය.

බලපත්‍රලාභී විශේෂිත බැංකු පොකුරට LSB සතු ශාඛා 711 ක් අයත් වන අතර, එය 2025 වසරේදී වැඩි වී ඇත. මෙම ශාඛා වලින් 64 ක් නිවාස මූල්‍ය ආයතනවලට අයත් වේ.

බලපත්‍රලාභී විශේෂිත බැංකු

- බලපත්‍රලාභී විශේෂිත බැංකු 6 ක්
- ශාඛා 711 ක්
- නිවාස මූල්‍ය ආයතන 64 ක්

2025 වසර අවසානය වන විට බැංකු අංශයේ වගකීම් සහ ප්‍රාග්ධනයෙන් 80% ක් තැන්පතු වලින් සමන්විත විය. මුළු තැන්පතු රුපියල් බිලියන 19,927.4 ක් වූ අතර, ඉන් 65.4% ක විශාලතම දායකත්වය කාලීන තැන්පතු සතු විය ඉතිරි තැන්පතු ඉතිරි කිරීමේ තැන්පතු වේ .බැංකු අංශය පුරා මුළු වගකීම් ප්‍රමාණය රුපියල් බිලියන 24,922 ක් විය.

2025 වසර තුළ බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශය සමස්ත වත්කම්වලින් 6% ක් නියෝජනය කළ අතර, එහි වටිනාකම රුපියල් බිලියන 2,474 කි. මෙය බලපත්‍රලාභී වාණිජ බැංකු සතු 54.8% ක වත්කම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව සතු සමස්ත වත්කම්වලින් 10.5% සමඟ සැසඳිය හැක. සමස්තයක් වශයෙන්, මූල්‍ය පද්ධතිය සතු මුළු වත්කම්වලින් 71.4% ක් බැංකු අංශය විසින් පාලනය කරන ලද අතර, ඉතිරි කොටස අනෙකුත් තැන්පතු ගන්නා මූල්‍ය ආයතන, විශේෂිත මූල්‍ය ආයතන සහ ගිවිසුම්ගත ඉතුරුම් ආයතන සතු විය.

සේවකයින්ගෙන් බහුතරයක් එනම් 34%ක්, වසර 11-15 අතර කාලයක් බැංකුවට සේවය කර ඇති අතර, එම කාණ්ඩයේ වැඩි පිරිසක් පිරිමි සේවකයින් වේ. තවත් 20%ක් වසර 6-10 අතර කාලයක් සේවය කර ඇති අතර, 5%ක් වසර 5කට අඩු කාලයක් සේවය කර ඇත.





වයස අනුව සේවකයින්

වයස අනුව සලකා බැලීමේදී, 31-40 වයස් කාණ්ඩයේ ඉහළ සේවක සංඛ්‍යාවක් (53%) දක්නට ලැබෙන අතර, ඉන් පසුව 41-50 වයස් කාණ්ඩය (23%) පවතී. මෙයින් පහත කරුණු පෙන්නුම් කරයි:

- ශක්තිමත් වෘත්තීය පදනමක් පැවතීම.
- ස්ථාවර කාර්ය සාධනයක් පෙන්වීම.
- තරුණ කණ්ඩායම් හා සැසඳීමේදී සේවක හැරයාමේ ප්‍රතිශතය අඩු මට්ටමක පැවතීම.

51-60 වයස් කාණ්ඩය තුළ කාන්තා සේවිකාවන්ගේ සාන්ද්‍රණය වැඩි වන අතර, එය බැංකුව තුළ සිටින ජ්‍යෙෂ්ඨ කාන්තා විධායක නිලධාරිනියන්ගේ ඉහළ මට්ටම පෙන්නුම් කරයි.





	2025		2024	
පරාසය	**පිරිමි**	**කාන්තා**	**පිරිමි**	**කාන්තා**
51 - 60	44	58	46	64
41 - 50	57	45	55	45
31 - 40	175	67	180	77
21 - 30	3	4	18	9
ඒකතුව	279	174	299	195

කාර්ය මණ්ඩලයේ භූගෝලීය ව්‍යාප්තිය

කලාපීය ව්‍යාප්තිය

බැංකුවේ සේවකයින් කලාප 4ක් යටතේ පවතින ශාඛාවල විසිරී සිටිති.

කලාප අනුව කාර්ය මණ්ඩල ව්‍යාප්තිය :


	2025
	කාර්ය මණ්ඩලය
කලාප 1	108
කලාප 2	79
කලාප 3	69
කලාප 4	68

කලාප 1 සඳහා පැවරී ඇති ප්‍රදේශවල ශාඛා සංඛ්‍යාව වැඩි බැවින්, වැඩිම සේවකයින් සංඛ්‍යාවක් (108ක්) එම කලාපයේ සේවයේ නියුතු වේ.

දෙවන කලාපය දෙවන වැඩිම සේවක ව්‍යාප්තියක් වාර්තා කරන අතර, එම කලාපයට අයත් ශාඛාවන්හි සේවක සාමාජිකයින් 79 දෙනෙකු සේවය කරති.

කලාප 3 සහ 4 යන දෙකෙහිම ශාඛා ව්‍යාප්තිය සමාන වන අතර, එම කලාප දෙකට අයත් ශාඛාවල සේවයේ නියුතු සේවකයින් සංඛ්‍යාවද ආසන්න වශයෙන් සමාන වේ.

පළාත් අනුව ව්‍යාප්තිය



වැඩිම සේවකයින් සංඛ්‍යාවක් බස්නාහිර පළාතේ පිහිටි ශාඛාවල සහ ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු අතර එය 53%කි. දෙවනුවට වැඩිම සේවකයින් සංඛ්‍යාවක් සිටින්නේ දකුණු පළාතේ වන අතර එම ප්‍රතිශතය 11%කි.

පළාත් අනුව සේවකයින්

පළාත	සේවකයින් සංඛ්‍යාව
බස්නාහිර පළාත	240
දකුණු පළාත	49
මධ්‍යම පළාත	42
ඌව පළාත	16
සබරගමුව පළාත	27
වයඹ පළාත	40
උතුරු මැද පළාත	10
උතුරු පළාත	10
නැගෙනහිර පළාත	19

දක්ෂතා බඳවා ගැනීම, රඳවා ගැනීම සහ විශ්‍රාම ගැනීම්


සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ, බැංකුව විසින් නව සේවකයින් තිදෙනෙකු බඳවා ගෙන ඇත. ඔවුන් තිදෙනාම බැංකුවේ ආයතනික කළමනාකරණ තනතුරු සඳහා බඳවා ගත් අය වේ. මෙම නවක සේවකයින් තිදෙනාම ජ්‍යෙෂ්ඨතම වයස් කාණ්ඩවලට අයත් වන අතර, ඔවුන් අතර පිරිමි සේවකයින් දෙදෙනෙකු සහ එක් කාන්තා සේවිකාවක් ඇතුළත් වේ.

සේවකයින් රඳවා ගැනීමේ ප්‍රතිශතය

වසර තුළ, සේවකයින් රඳවා ගැනීමේ ප්‍රතිශතය 2024 වසරේ පැවති 96.11% සිට 91.89% දක්වා පහත වැටී ඇත. මෙය පිරිමි සහ කාන්තා යන සේවක කණ්ඩායම් දෙකෙහිම රඳවා ගැනීමේ ප්‍රතිශතයන්හි පහත වැටීමක් පෙන්නුම් කරයි. මුළු සේවක සංඛ්‍යාවේ සිදුවූ අඩුවීමට අනුරූපව, සේවකයින් හැරයාමේ ප්‍රතිශතය සුළු වශයෙන් ඉහළ ගොස් ඇත.

විශ්‍රාම ගැනීම්

වසර තුළදී විශ්‍රාම ගැනීම් 19ක් සිදුවී ඇති අතර, එයට පිරිමි සේවකයින් 07 දෙනෙකු සහ කාන්තා සේවිකාවන් 12 දෙනෙකු ඇතුළත් වේ.



ප්‍රතිලාභ (මුදල් සහ මුදල් නොවන)

සේවකයින් සවිබල ගැන්වීමට සහ බැංකුව වෙනුවෙන් කැපවී සේවය කිරීමට ඔවුන්ව දිරිමත් කිරීමේ අරමුණින්, උපරිම ප්‍රතිලාභ ලබා දීමේ වටිනාකම් මත පදනම්ව, මූල්‍ය ආධාර සහ ආර්ථික වර්ධනය සඳහා බැංකුව සේවකයින්ට පුළුල් ප්‍රතිලාභ මාලාවක් පිරිනමයි. HDFC බැංකුව විසින් කාර්ය සාධනය මත පදනම් වූ වැටුප් වැඩිවීම්, කාලානුරූපී වැටුප් සංශෝධන සහ අවදානම් දීමනා හා දුෂ්කර සේවා දීමනා වැනි රැකියාවට විශේෂිත දීමනා ඇතුළත් ව්‍යුහගත වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කරයි. සෘජු වන්දිවලට අමතරව, වෛද්‍ය යෝජනා ක්‍රමවලට අමතරව, සහනදායී නිවාස සහ වාහන ණය ඇතුළු විශේෂිත ණය පහසුකම් සේවකයින්ට හිමි වේ. මීට අමතරව, නිවාඩු සඳහා මුදල් ගෙවීම සහ සහායක සේවා ශක්තිමත් කිරීම සඳහා නවාතැන් දීමනා වැනි මෙහෙයුම් වරප්‍රසාද ද පිරිනැමේ.

ප්‍රතිලාභ වර්ගය	සාමාන්‍ය ප්‍රතිපාදන	ස්ථිර	පරිවාස	කොන්ත්‍රාත්
වෛද්‍ය සහ සෞඛ්‍ය	වෛද්‍ය වියදම් ආපසු ගෙවීම	√	√	-
ණය සහ අත්තිකාරම්	නිවාස ණය	√	-	-
	ආපදා ණය	√	-	-
	ඇපකරු ණය	√	√	-
	බයිසිකල් ලීසිං (පාම්ටොප් ක්‍රියාකරුවන් සඳහා)	√	√	-
	උත්සව අත්තිකාරම්	√	√	√
රැකියාවට අදාළ දීමනා	අවදානම් දීමනාව (කැෂියර් සහ පාම්ටොප් සඳහා පමණි)	√	√	√
	කොමිස් දීමනා (පාම්ටොප් ක්‍රියාකරුවන් සඳහා)	√	√	-
	වාහන ණය	√	-	-
	දුෂ්කර සේවා ප්‍රදේශ දීමනා	√	-	-
	ගෞරව දීමනා	√	-	-
	යතුරු භාර දීමනාව	√	-	-
	ශාඛා කළමනාකරු දීමනාව	√	√	-
	දෙවන නිලධාරී දීමනාව	√	√	-
ගමන් සහ ලොජිස්ටික්ස්	ජීවන වියදම් දීමනා	√	√	√
	නවාතැන් දීමනාව (කිලෝමීටර් 75කට වඩා දුර ස්ථාන මාරුවීම් සඳහා)	√	-	-
වෙනත් ප්‍රතිලාභ	නිවාඩු පඩි ගෙවීම	√	√	√

පහත දැක්වෙන්නේ ඉහත සඳහන් කළ ප්‍රතිලාභවල වර්ගීකරණය සහ ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයකි.

ප්‍රවර්ගය	ප්‍රතිපාදනය	විස්තරය
වෛද්‍ය සහ සෞඛ්‍ය	වෛද්‍ය වියදම් ආපසු ගෙවීම	බාහිර රෝගී, දන්ත සහ අක්ෂි ප්‍රතිකාර, සහ රෝහල් ගතවීම් සඳහා වාර්ෂික සීමාවන්.
ණය සහ අත්තිකාරම්	නිවාස ණය	ප්‍රධාන ප්‍රතිලාභය: නිවසක් තැනීමට හෝ මිලදී ගැනීමට සහනදායී අඩු පොලී අනුපාත.
	ආපදා ණය	පෞද්ගලික හදිසි අවස්ථා සහ මූල්‍ය දුෂ්කරතා සඳහා ණය පහසුකම්.
	ඇපකරු ණය	සෙසු සේවකයින්ගේ ඇපකරය මත ලබා දෙන ණය.
	වාහන ණය	පෞද්ගලික මෝටර් රථ සඳහා සහනදායී පොලී අනුපාත.
	බයිසිකල් ලීසිං	ක්ෂේත්‍ර කටයුතු සඳහා යතුරුපැදි ලබා ගැනීමට පාම්ටොප් ක්‍රියාකරුවන්ට ඇති විශේෂිත පහසුකම.
	උත්සව අත්තිකාරම්	ප්‍රධාන උත්සව (අලුත් අවුරුදු/නත්තල්) වලට පෙර ලබා දෙන පොලී රහිත අත්තිකාරම්.
රැකියාවට අදාළ දීමනා	ශාඛා කළමනාකරු දීමනාව	ශාඛාවක් කළමනාකරණය කිරීමේ ඉහළ වගකීම වෙනුවෙන් මාසිකව ගෙවනු ලබන දීමනාව.
	දෙවන නිලධාරී දීමනාව	දෙවන නිලධාරීන් සඳහා ලබා දෙන දීමනාව.
	අවදානම් දීමනාව	මුදල් හැසිරවීමේ රාජකාරිවල පවතින අවදානම පියවීම සඳහා ගෙවනු ලබන දීමනාව.
	යතුරු භාර දීමනාව	යතුරු භාරකාරත්වයේ වගකීම පැවරී ඇති සේවකයින් සඳහා ගෙවනු ලබන දීමනාව.
	දුෂ්කර සේවා දීමනාව	දුරස්ථ හෝ ග්‍රාමීය ශාඛාවල සේවය කරන සේවකයින් සඳහා ලබා දෙන අමතර දීමනාව.
	කොමිස් දීමනා	විකතු කිරීම් මත පදනම්ව පාම්ටොප් ක්‍රියාකරුවන් සඳහා විශේෂයෙන් ලබා දෙන කාර්ය සාධන දිරිගැන්වීම්.
	ගෞරව දීමනා	විශේෂ රාජකාරි සඳහා හෝ බැංකුව බාහිරව නියෝජනය කිරීම සඳහා කෙරෙන ගෙවීම්.
ගමන් සහ ලොජිස්ටික්ස්	ජීවන වියදම් දීමනා	නිල රාජකාරි ගමන් වලදී ආහාර සහ අනෙකුත් වියදම් සඳහා දිනපතා ලබා දෙන දීමනාව.
	නවාතැන් දීමනාව	ස්ථාන මාරුවීම්වලදී නව ස්ථානය නිවසේ සිට කි.මී. 75කට වඩා දුර නම් ලබා දෙන දීමනාව.
වෙනත් ප්‍රතිලාභ	නිවාඩු පඩි ගෙවීම	වසර අවසානයේදී භාවිත නොකළ වාර්ෂික හෝ වෛද්‍ය නිවාඩු මුදල් බවට පරිවර්තනය කර ගැනීමේ අවස්ථාව.

මාපිය නිවාඩු

2025 වසරේදී, 2024 වසරට සාපේක්ෂව පිරිමි සහ කාන්තා සේවකයින් යන දෙපිරිසම මාපිය නිවාඩු ලබා ගැනීම ඉහළ ගොස් ඇත. පිරිමි සේවකයින්ගේ සහභාගීත්වයේ කැපී පෙනෙන වැඩිවීමක් පෙන්නුම් කරන අතර, මෙය සේවා ස්ථානය තුළ මාපිය නිවාඩු පිළිබඳ පවතින දැනුවත්භාවය සහ පිළිගැනීම වැඩි වෙමින් පවතින බව ප්‍රදර්ශනය කරයි.

වැඩට නැවත වාර්තා කිරීමේ ප්‍රතිඵල

පිරිමි සේවකයින් අතර නැවත වැඩට වාර්තා කිරීමේ ප්‍රතිශතය ශක්තිමත්ව පැවතුනද, 2024 වසරට සා-පේක්ෂව සුළු පහත වැටීමක් දක්නට ලැබේ.

	2025		2024	
	පිරිමි	**කාන්තා**	**පිරිමි**	**කාන්තා**
මාපිය නිවාඩු ලබා ගත් සේවකයින් සංඛ්‍යාව	17	9	10	8
දෙසැම්බර් 31 වන දිනට පෙර නැවත වැඩට වාර්තා කළ සේවකයින් සංඛ්‍යාව	16	9	10	8

මානව ප්‍රාග්ධනය

ඉගෙනීම, සංවර්ධනය සහ නැවත පුහුණු කිරීම

බැංකු කටයුතු සඳහා කාර්යක්ෂමව දායක වීමටත්, තාක්ෂණය, පාලනය සහ අවදානම් කළමනාකරණය සම්බන්ධ තාක්ෂණික අවශ්‍යතා සපුරාලීමටත් අවශ්‍ය කුසලතා සහ විශේෂඥ දැනුම සේවකයින් තුළ වර්ධනය කිරීමේදී පුහුණුව අතිශයින් වැදගත් වේ.

සමාලෝචනයට ලක්වන වසර තුළ, අභ්‍යන්තර වැඩසටහන් 40ක් සහ බාහිර වැඩසටහන් 99ක් ඇතුළුව මුළු පුහුණු වැඩසටහන් 139ක් පවත්වන ලදී.

නායකත්ව අනුප්‍රාප්තික පෙළ

ඩිජිටල් තාක්ෂණය පුහුණුවට ඒකාබද්ධ කිරීම

සමාලෝචනයට ලක්වන වසර තුළ, අභ්‍යන්තර සහ බාහිර පුහුණු වැඩසටහන් සඳහා මුළු පුහුණු පැය 733.75ක් වෙන් කරන ලදී. මෙය පෙර වසරට සාපේක්ෂව 18.54%ක වැඩිවීමකි. පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ බාහිරින් සංවිධානය කරන ලද ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම වෙනුවෙන් රුපියල් මිලියන 4.6ක මුදලක් වැය කර ඇත.

බාහිර පුහුණු වැඩසටහන්

සියලුම වැඩසටහන් ශ්‍රී ලංකා මහ බැංකුව (නියාමන අධිකාරිය) සහ/හෝ බැංකු, මූල්‍ය සහ රක්ෂණ ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුමක් ඇති වෘත්තීය සේවා සපයන්නන් විසින් සංවිධානය කරන ලද එක්දින වැඩමුළු සහ සම්මන්ත්‍රණ විය.

සේවකයින් පහත සඳහන් නියාමන ආයතන විසින් සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා සහභාගී විය:

- බැංකු අධ්‍යයන කේන්ද්‍රය විසින් විවිධ තේමාවන් සහ මාතෘකා යටතේ සංවිධානය කරන ලද වැඩසටහන් 33ක්.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංවිධානය කරන ලද වැඩසටහන් 9ක්.
- මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය, තිරසාර බලශක්ති අධිකාරිය, දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය , EFC, CIPM ඇතුළු විවිධ ආයතන විසින් සංවිධානය කරන ලද වෙනත් වැඩසටහන් 57ක්.

බාහිර පුහුණු වැඩසටහන් මගින් ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන ලද අතර, ඉන් වැඩිම අවධානයක් යොමු වූයේ ආරක්ෂක සන්ධාන තොරතුරු ආරක්ෂණය හා තොරතුරු තාක්ෂණ අනුකූලතාව පිළිබඳ දෙපාර්තමේන්තු දැනුවත් කිරීම සඳහාය. පහත සඳහන් මාතෘකා මෙම වැඩසටහන් මගින් ආවරණය කරන ලදී.

වැඩසටහන්

අභ්‍යන්තර වැඩසටහන්

ප්‍රවර්ගය	ඇතුළත් වැඩසටහන්	වැඩසටහන් සංඛ්‍යාව
තොරතුරු ආරක්ෂණය සහ තොරතුරු තාක්ෂණය	තොරතුරු ආරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි, IS ප්‍රතිපත්ති හැඳින්වීම (දෙපාර්තමේන්තුමය), කැස්පස්කි (I සහ II), Oracle දත්ත සමුදා ආරක්ෂාව සහ උපස්ථ සේවාදායක දැනුවත් කිරීම.	18
ලීසිං සහ විශේෂිත නිෂ්පාදන	ලීසිං පිලස්, ලීසිං පද්ධතියට ඇතුළු වීමේ මාර්ග, සාමාන්‍ය ලීසිං පුහුණුව, උකස් සහ අත්පොත් පුහුණුව සහ ණය යාවත්කාලීන කිරීම්.	6
ණය සහ අයකර ගැනීම්	ණය ඇගයීම ශක්තිමත් කිරීම, විශේෂ අයකර ගැනීමේ පුහුණුව (මාර්ගගත/ පුද්ගලිකවම), සහ රිට් සහ වෙන්දේසි ක්‍රියා පටිපාටි පිළිබඳ සැසි.	5
අනුකූලතාව සහ අවදානම් කළමනාකරණය	පාරිභෝගික නිසි විමර්ශන වැඩමුළු, පාරිභෝගික සම්බාධක/කළු ලැයිස්තුගත / කිරීම, AML අවදානම් ශ්‍රේණිගත කිරීම සහ මෙහෙයුම් රාමු සැසි.	4
උපායමාර්ගික සැලසුම් සහ වර්ධනය	දින 3ක උපායමාර්ගික සැලසුම් සංවර්ධන වැඩමුළු සහ ව්‍යාපාරික වර්ධනය වේගවත් කිරීමේ පුහුණුව.	4
මෙහෙයුම් සහ සාමාන්‍ය පුහුණුව	සහකාර කළමනාකරුවන් සඳහා බැංකු මෙහෙයුම්, ජංගම බැංකු මෙහෙයුම් සහ ගිහි නිවන උපකරණ භාවිතය පිළිබඳ පුහුණුව.	3
මුළු වැඩසටහන්		40

බාහිර වැඩසටහන්

ප්‍රවර්ගය	ඇතුළත් වැඩසටහන්	වැඩසටහන් සංඛ්‍යාව
බැංකු මෙහෙයුම් සහ සිල්ලර සේවා	ශාඛා කළමනාකරුවෙකු ලෙස විශිෂ්ටත්වය ළඟා කර ගැනීම (දින 2); බැංකු ටෙලර්වරුන් සඳහා හොඳම භාවිතයන් (දින 2); උකස්/රන් ණය වැඩමුළු (විවිධ සැසි); මුදල් නෝට්ටුවල ආරක්ෂක විශේෂාංග; මූල්‍ය ලීසිංවලින් ඔබ්බට; ඩිජිටල් බැංකුකරණයේ අලෙවිකරණ විශිෂ්ටත්වය.	13
නියාමන, AML සහ අනුකූලතාව	AML/CFT අනුකූලතාව (විවිධ); අනුකූලතා සම්මන්ත්‍රණය 2025; පාරිභෝගික ආරක්ෂණ රාමුව; මූල්‍ය ආයතන සඳහා නීතිමය සහ නියාමන රාමුව (දින 2); පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත; මූලික විමර්ශන පැවැත්වීම.	14
තිරසාරභාවය සහ ESG	SLFRS S1 සහ S2 විග්‍රහය (දින 2); හරිතාගාර වායු ප්‍රමාණකරණය සහ වාර්තාකරණය (දින 3); තිරසාර මූල්‍ය මාර්ග සිතියම 2.0; හරිත මූල්‍ය ප්‍රමිතීන්; ජාතික දේශගුණික මූල්‍ය උපාය මාර්ගය 2025-2030; තිරසාරභාවය/දේශගුණික හෙළිදරව් කිරීම් පිළිබඳ වැඩමුළුව (දින 2).	11
සයිබර් ආරක්ෂණය සහ ඩිජිටල් තාක්ෂණය	වන වාර්ෂික සයිබර් ආරක්ෂණ සමුළුව (කෘතිම බුද්ධිය)I සහ සයිබර්); සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථාන; MSMEs සඳහා සයිබර් ආර-ක්ෂාව; වංචා සඳහා MNO APIs පිළිබඳ වැඩමුළුව; බැංකුකරණය සඳහා එක්දින AI උපාය මාර්ගය; දත්ත ටෙම්ප්ලේට් පුහුණුව.	7
මූල්‍ය, අවදානම් සහ භාණ්ඩාගාරය	වත්කම් සහ බැරකම් කළමනාකරණය (දින 2); භාණ්ඩාගාර පසු කාර්යාල මෙහෙයුම් (දින 3); ද්‍රවශීලතා ආතති පරීක්ෂාව (දින 2); ස්ථාවර ආදායම් ආයෝජන විශ්ලේෂණය (දින 2); මෙහෙයුම් අවදානම් කළමනාකරණය (දින 2); අගය අඩුවීමේ පාඩු කිරීමේ පුහුණුව සහ බාසල් III රාමුව.	12
මානව සම්පත්, නායකත්වය සහ මෘදු කුසලතා	CIPM ජාතික මානව සම්පත් සමුළුව (දින 2); කෘතිම බුද්ධි යුගයේ මානව සම්පත්; වැඩ කණ්ඩායම් මෙහෙයවීම; සාකච්ඡා කුසලතා; නිපුණතා ගොඩනැගීම (සන්නිවේදනය/කණ්ඩායම් වැඩ); රියදුරන්/සුළු කාර්ය මණ්ඩලය සඳහා ආචාරධර්ම සහ විනය (දින 2).	9
කම්කරු නීතිය සහ මානව සම්පත් පරිපාලනය	කම්කරු නීතිය; පරිවාස රැකියා; සේවක විනය විරෝධී ක්‍රියා සහ විනය ක්‍රියා පටිපාටිය; වැටුප් පරිපාලනයේ විශිෂ්ටත්වය; මූල්‍ය අංශය සඳහා මානව සම්පත් පෙළගැස්ම/වැටුප් විගණන.	5
ගිණුම්කරණය සහ විගණනය	46 වන වරලත් ගණකාධිකාරිවරුන්ගේ ජාතික සමුළුව (දින 3); අභ්‍යන්තර පාලන සහ විගණනය (දින 2); ව්‍යවස්ථාපිත වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම (දින 2); දත්ත විශ්ලේෂණ පුහුණුව (Ex-cel/Power BII (දින 3).	10
ජාතික සම්මේලන සහ නීතිමය	APB 35 වන සංවත්සර සම්මේලනය; ICC බේරුම්කරණ සහ මැදිහත්වීමේ සමුළුව; SLWLA සම්ම-න්ත්‍රණ (1 සහ 2); සේවා යෝජකයින්ගේ සම්මන්ත්‍රණය 2025; 2025 අංක 12 දරන සමාගම් (සංශෝධන) පනතේ ඇඟවුම්.	6
රාජ්‍ය අංශය සහ ප්‍රජා සත්කාර	නව රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ (2024); මූල්‍ය සාක්ෂරතාව සහ ආර්ථිකය (ගම්පහ/කළුතර); කාන්තා දිනය වෙනුවෙන් මූල්‍ය කළමනාකරණය; ETFB සේවා යෝජක දැනුවත් කිරීම; රක්ෂණ දැනුවත් කිරීම (IRCSL).	12
මුළු අයිතම		99

සේවක සහභාගීත්වය සහ සුබසාධනය

පිරිත් පින්කම සහ දානමය පුණ්‍යකර්මය

HDFC බැංකුවේ 41 වන සංවත්සරය සැමරීම වෙනුවෙන්, 2025 අප්‍රේල් 04 වන දින සර්ව රාත්‍රික පිරිත් පින්කමක් ද, අප්‍රේල් 05 වන දින දානමය පුණ්‍යකර්මයක් ද පවත්වන ලදී. මෙම උත්සව කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතේ පිහිටි බැංකුවේ ප්‍රධාන කාර්යාලයේදී බැංකුවේ සුබසාධක සංගමය විසින් සංවිධානය කරන ලදී. රටට, බැංකුවේ කාර්ය මණ්ඩලයට, ගනුදෙනුකරුවන් ට සහ සියලුම පාර්ශ්වකරුවන්ට මෙන්ම, වසර ගණනාවක් පුරා HDFC බැංකුවේ ගමනට දායක වූ හිටපු සේවකයින්ට ආශීර්වාද ප්‍රාර්ථනා කිරීමේ අරමුණින් මෙම පින්කම සංවිධානය කරන ලදී.



ගැබිණි මව්වරුන් සඳහා පරිත්‍යාග

අපගේ ගර්භණී සේවිකාවන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම වෙනුවෙන් සහාය වීම සඳහා මෙම වැඩසටහන දියත් කිරීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, 2025 ඔක්තෝබර් 30 වන දින අපගේ ප්‍රධාන කාර්යාලයේදී ප්‍රථම පරිත්‍යාග උත්සවය අභිමානයෙන් පවත්වන ලදී. HDFC බැංකු සුබසාධක සංගමයේ අදාළ සාමාජිකාවන් තම අදාළ ශාඛා හරහා පෝෂණ පැකේජ සාර්ථකව ලබා ගත්හ. මෙම ප්‍රයත්නය මඟින් අපගේ සියලුම සාමාජිකයින්ගේ හදවතින්ම කරන ලද දායකත්වය පිළිබිඹු වන අතර, සුබසාධක අරමුදල සඳහා ඔවුන්ගේ සහභාගීත්වය හරහා මෙවැනි වටිනා සහ මානුෂීය සහයෝගයක් අපගේ සගයන් වෙත ලබා දීමට අපට හැකි වී තිබේ.






ප්‍රාග්ධන ඉදිරි දැක්ම

බැංකු ක්ෂේත්‍රයේ තාක්ෂණික අවශ්‍යතා පිළිබඳ දක්ෂතාවයෙන් යුත් වෘත්තිකයන් සහ ඩිජිටල් හැකියාවන් හා කෘත්‍රිම බුද්ධිය සහිත නව තාක්ෂණික යුගයට අනුගත වීමට අවශ්‍ය හැකියාවන් ඇති වෘත්තිකයන් බඳවා ගැනීමට බැංකුව අපේක්ෂා කරයි. අඛණ්ඩ ඉගෙනුම් ක්‍රියාවලිය කෙරෙහි නිවැරදි මානසිකත්වයක් සහ ආකල්පයක් ඇති, මෙන්ම බැංකුව මුහුණ දෙන අභියෝග සහ සීමාවන්ගෙන් ඔබ්බට විය දියුණු කිරීමට අධිෂ්ඨානයක් ඇති පුද්ගලයින් අපට අවශ්‍ය වේ. එවැනි පුද්ගලයින් තම පෞද්ගලික සහ වෘත්තීය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන අතරම, බැංකුවේ උපරිම යහපත උදෙසා කටයුතු කළ යුතුය.

සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය



අපගේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීම

රාජ්‍ය අංශයේ ප්‍රමුඛ පසුබිමක් සහිත බලපානුලාභී විශේෂිත බැංකුවක් වශයෙන්, අපගේ ආයතනික සහ පෞද්ගලික කොටස් හිමියන්, අපගේ ගනුදෙනුකරුවන් සහ අපගේ විවිධ ව්‍යාපාරික හවුල්කරුවන් සඳහා හවුල් වටිනාකමක් නිර්මාණය කිරීමට අපගේ ඍජුවිශේෂී තත්වය අපි ප්‍රයෝජනයට ගනිමු. අපගේ මූලික අවධානය යොමු වන්නේ ගනුදෙනුකරුවන් ගේ විවිධ තත්ත්වය ඉහළ නංවන අතරම ඔවුන්ට මූල්‍ය සෙ-ීවා ලබා දීම සහ මූල්‍ය නියාමකයා, රජය සහ අපගේ පෞද්ගලික කොටස් හිමියන් කෙරෙහි පවතින ආයතනික රාජකාරී තුලනය කිරීමයි. බැංකුවේ සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය නිර්වචනය කරනු ලබන්නේ මෙම සඛදතාවල ගැඹුර සහ අපගේ පාර්ශ්වකරුවන් සමඟ පොදු පදනමක් වී ඇති හවුල් වටිනාකම් මගිනි.

තිරසාර සංවර්ධන ඉලක්ක

- GOAL 4 **Quality Education**
- GOAL 8 **Decent Work and Economic Growth**
- GOAL 9 **Industry, Innovation and Infrastructure**
- GOAL 11 **Sustainable Cities and Communities**
- GOAL 12 **Responsible Consumption and Production**
- GOAL 16 **Peace and Justice Strong Institutions**
- GOAL 17 **Partnerships for the Goals**

ප්‍රධාන මාතෘකා

T2 | T4 | T5 | T6 | T9 | T10 | T12 | T13

අදාළ ප්‍රාග්ධන වර්ග

- මූල්‍ය ප්‍රාග්ධනය
- නිෂ්පාදිත ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- සමාජ ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය

අදාළ පාර්ශ්වකරුවන්

- සේවකයින්
- ගනුදෙනුකරුවන්
- නියාමකයින්
- හවුල්කරුවන් සහ සේවා සපයන්නන්
- ප්‍රජාව සහ පරිසරය

සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

ගනුදෙනුකරුවන්

අපගේ මූලික වගකීම වන්නේ රටේ අඩු සහ මධ්‍යම ආදායම් ලබන කොටස් සඳහා නිවාස හිමිකම පහසු කිරීමයි. වසර ගණනාවක් පුරා, සංවේදී පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය සහ සදාචාරාත්මක ප්‍රවේශයන් හරහා, සාම්ප්‍රදායික බැංකු ගනුදෙනු දිගුකාලීන සබඳතා බවට පරිවර්තනය කිරීමට අපි සමත් වී ඇත්තෙමු.

අලුතින් විවෘත කළ සහ අලුත් කළ ගිණුම් - 30,737

තැන්පතුකරුවන් - 19,883

නව ණය ලබාදීම් - රු. මිලියන 12,172

ණය ලබාගත් ගනුදෙනුකරුවන් සංඛ්‍යාව - 59,594

ණය ගෙවීම් අත්හිටුවීම් - (2025) - ශූන්‍ය (0)

ප්‍රතිව්‍යුහගත කළ ණය - 3,186

සියලු අංශ ආවරණය වන පරිදි ප්‍රවේශය සහතික කිරීම

අපගේ වියදම් ප්‍රවේශමෙන් සහ මනාව ප්‍රශස්ත කරන බැංකුවක් වශයෙන්, ප්‍රවේශය යනු පසුව සිතා බැලිය යුතු ආයෝජනයක් නොවන බව අපි සහතික කර ඇත්තෙමු. මෑත වසරවලදී සහ එක් එක් විධායක නායකත්ව වෙනස්වීම් සමඟින්, භෞතික සහ ඩිජිටල් සේවා ඇතුළු අපගේ සේවාවන් අඛණ්ඩව වැඩිදියුණු කර සහ දියුණු කර ඇත.

පුද්ගලික සේවා

අපගේ ශාඛා 39ම තැන්පතුකරුවන්ගේ සහ ණය ගැතියන්ගේ අපේක්ෂාවන් සපුරාලමින් බැංකු නිෂ්පාදන සහ සේවාවන් සම්පූර්ණ පරාසයම සපයයි. 2025 මූල්‍ය වර්ෂයේ නියාමන සීමාවන් තිබියදීත්, සිල්ලර ණය නිෂ්පාදන සහ නිවාස මූල්‍යකරණය (ප්‍රශස්ත මට්ටම දක්වා) හරහා ගනුදෙනුකරුවන් ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම අපි අඛණ්ඩව සිදු කළෙමු.

ගෙයින් ගෙට බැංකු සේවාව

දිවයින පුරා සිටින අපගේ ගනුදෙනුකරුවන් ට සේවය කරමින්, නිවසටම පැමිණෙන බැංකු සේවාරූ අතේ ඇති බැංකු සේවා වීකකය HDFC ශාඛා නොමැති සහ සාම්ප්‍රදායික බැංකු ක්‍රම සීමිත ප්‍රදේශවලට මූල්‍ය ප්‍රවේශය දීර්ඝ කරයි. එය මාසිකව බැංකුවට පැමිණීමේ කරදරයකින් තොරව උපයෝගිතා බිල්පත් සහ ණය වාරික ගෙවීමට ගනුදෙනුකරුවන් ට පහසුව සලසා දෙයි.

ක්‍රියාකාරී නිලධාරීන් 45 දෙනෙකු නිවසටම පැමිණෙන බැංකු සේවාව ලබා දෙයි

උපයෝගිතා බිල්පත් ගෙවීම් - **රු.මි. 20.6**

සේවය සපයන නගර සංඛ්‍යාව - **39**

'පාම්ටොප් බැංකුකරණ' බැංකු කණ්ඩායම ප්‍රධාන කාර්යාලයට සම්බන්ධ කරන ලද අභිරුචි ලෙස සංවර්ධනය කරන ලද මෘදුකාංගයකින් සමන්විත වන අතර, එය බාධාවකින් තොරව ගෙවීම් සහ ගනුදෙනු සඳහා තත්‍ය කාලීන යාවත්කාලීන කිරීම් සක්‍රීය කරයි. බිල්පත් එකතු කිරීමට අමතරව, බැංකුවේ තැන්පතු සහ ණය නිෂ්පාදන පිළිබඳව ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට සහ වැදගත් තොරතුරු සහ නියාමන නිවේදන පාරිභෝගිකයා වෙත රැගෙන යාමට ද මෙහි හැකියාව ඇත.

ප්‍රාග්ධන සම්බන්ධතාව - නිෂ්පාදිත ප්‍රාග්ධනය

ඩිජිටල් නාලිකා යනු භෞතික ව්‍යාප්ත කිරීම්වලින් තොරව ඇට සේවා සැපයීමට ඉඩ සලසන, එමගින් භෞතික වන්කම් සහ ඉඩම් භාවිතය ප්‍රශස්ත කරන අත්‍යවශ්‍ය ඇස්පාසය වන්කමකි.

ඩිජිටල් නාලිකා

වසර ගණනාවක් පුරා, සෑම වසරකම සිදු කරන ලද වැඩිදියුණු කිරීම් සමඟින් අපි අපගේ ඩිජිටල් සේවා වපසරිය පුළුල් කර ඇත්තෙමු. 2024 වසරේදී, පාරිභෝගික පහසුව සඳහා උසස් විශේෂාංග සහ ක්‍රියාකාරිත්වයන් සහිතව අපගේ ආයතනික වෙබ් අඩවිය නැවත දියත් කරන ලදී. එපමණක් නොව, ලංකාපේ හි ජස්ට් පේ පද්ධතිය සමඟ බැංකුව ඒකාබද්ධ වීම බැංකු සේවාවන් වඩාත් ප්‍රවේශ විය හැකි සහ ඇතුළත් කර ගත් එකක් බවට පත් කර ඇත.

විශේෂාංගය	ගනුදෙනුකරුවන් ට ලැබෙන ප්‍රතිලාභ	ප්‍රවේශය
ආයතනික වෙබ් අඩවිය	පහසු සංචලනය, භාෂා තුනෙන්ම සහාය	ජංගම සහ ඩෙස්ක්ටොප්
ඔන්ලයින් බැංකු සේවා	24/7 ගිණුම් ප්‍රවේශය, මුදල් මාරු කිරීම්	වෙබ් ද්වාරය
ජස්ට් පේ ජංගම යෙදුම්	ඉක්මන්, ආරක්ෂිත ගෙවීම්	ජංගම උපාංග
ලංකා මුදල් හුවමාරුව	ඉතිරිකිරීමේ ගිණුම්වලට සම්බන්ධ කර ඇත	Linked to savings accounts

මාර්ගගත බැංකුකරණය

HDFC ක්ලික් යනු අපගේ මාර්ගගත බැංකුකරණ ද්වාරයේ වෙළඳ නාමයයි. මෙයට බැංකුවේ නිල වෙබ් අඩවිය හරහා පිවිසිය හැක. මෙම සේවාව මගින් පහත සඳහන් පහසුකම් ලබාගත හැකිය:

ගිණුම් ශේෂ විමසීම්

- ඉතුරුම් ගිණුම්
- කාලීන තැන්පතු
- ණය ගිණුම්

ගනුදෙනු වාර්තා

- දෛනික ගනුදෙනු
- පසුගිය ගනුදෙනු
- තැන්පතු සහ අත්තිකාරම්

අරමුදල් හුවමාරුව

- තමන්ගේම ගිණුම් අතර
- තුන්වන පාර්ශ්වීය ගිණුම් වෙත
- වෙනත් බැංකු වෙත

නව ඩෙබිට් පත

2025 සැප්තැම්බර් මාසයේදී, අප විසින් බැංකුවේ අලුතින් නිර්මාණය කරන ලද 'ෂොපින් ඩෙබිට් කාඩ්' පත හඳුන්වා දෙන ලදී. මෙම නිර්මාණය පිටුපස ඇති සංකල්පය වූයේ පරිසර හිතකාමී තිරසාරභාවය උදෙසා බැංකුව සතු කැපවීම විදහා දැක්වීමයි. මෙම කාඩ්පත මගින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා මුදල් ආපසු ගැනීම, අරමුදල් හුවමාරු කිරීම සහ JCB සහතික ලත් අලෙවි ස්ථාන හරහා සාප්පු සවාරි ගනුදෙනු සිදු කිරීමේ පහසුකම සැලසේ.

විවිධාංගීකරණය වූ නිෂ්පාදන

2025 මූල්‍ය වර්ෂය තුළ, අපගේ මූල්‍ය උපායමාර්ගයට සහ පවතින නියාමන අවශ්‍යතාවලට අනුකූලව අපගේ නිෂ්පාදන කළඹ පුළුල් කිරීමට අවධානය යොමු කළෙමු. වසරේ පසු භාගයේදී පනවන ලද සීමාවන් හේතුවෙන් ණය ලබා දීම සීමා වුවද, කෙටි කාලීන මූල්‍ය විසඳුම් ලෙස රන් ආභරණ උකස් ණය, කලින් වැටුප් ණය සහ සුපර් ඩ්‍රාෆ්ට් ලීසිං පහසුකම් ගනුදෙනුකරුවන් වෙත පිරිනමන ලදී. මේවා මගින් ගනුදෙනුකරුවන් ගේ තාවකාලික මුදල් අවශ්‍යතා සපුරාලීමටත්, ඒ සමඟම පාරිභෝගිකයාට සහ බැංකුවට ආරක්ෂිත සහ විශ්වාසදායී ඇපකරයක් සහතික කිරීමටත් අපට හැකි විය.

නිෂ්පාදන කාණ්ඩය	අලුත්/විශේෂාංග නිෂ්පාදන	ප්‍රධාන ප්‍රතිලාභ
ඉතුරුම්	HDFC ගෝ ග්‍රීන්	පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීම; රු. 100,000 ට වැඩි ඉතුරුම් සඳහා ඉහළ පොලී අනුපාත; විශේෂ හරිත සහතිකයක් පිරිනැමීම.
ඉතුරුම්	සැලරී සේවර්	අවම මූලික තැන්පතුවකින් (රු. 2,000) ගිණුම ඇරඹීමේ හැකියාව.
ආයෝජන	ග්‍රීන් වෙල්ත් ස්ථාවර තැන්පතු	තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කළ තරගකාරී කාලීන තැන්පතු අනුපාත; පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීම; රු. 500,000 ට වැඩි තැන්පතු සඳහා ඉහළ පොලී අනුපාත සහ විශේෂ හරිත සහතිකයක් පිරිනැමීම.
ණය	ග්‍රීන් පේසනල් ණය	පරිසර හිතකාමී නිවාස වැඩිදියුණු කිරීම් සඳහා අඩු පොලී අනුපාත

ප්‍රාග්ධන සම්බන්ධතාවය - මූල්‍ය ප්‍රාග්ධනය

ණය නිකුත් කිරීම් හරහා ලැබෙන ආදායම අපගේ මූල්‍ය ප්‍රාග්ධන මූලාශ්‍ර සැදෙන සහාය වන අතර, තැන්පතු අර්මුදල් සපයන ප්‍රධාන මූලාශ්‍රයක් වේ.

ණය සහ තැන්පතු

නියාමන සීමාවන් පැනවීමට පෙර, වසර තුළදී බැංකුව විසින් පුද්ගලයින් 21,685 දෙනෙකුට ප්‍රතිලාභ ලැබෙන පරිදි රුපියල් මිලියන 9,023ක නව ණය මුදල් නිකුත් කරන ලදී. එම සීමාවන් පැනවීමෙන් පසු තවදුරටත් ණය නිකුත් කිරීම් සීමා විය.

ඇපකර පදනම් කරගත් තැන්පතු නිෂ්පාදන

	2021	2022	2023	2024	2025
ඇපකරුවන්	2,839.67	1,255.79	72.60	172.04	394.72
මුදල්	1,761.62	3,371.18	3,745.69	3,466.56	3,648.95
රන්	718.9	730.54	1,885.98	2,576.15	3,643.97
උකස්	2,748.05	1,623.09	364.79	874.27	14.44
සේවක අර්ථසාධක අරමුදල	3,671.14	3,584.11	3,979.10	4,264.03	8.63
ලීසිං	289.57	237.42	272.28	414.66	1,312.85
මුළු එකතුව	**12,028.95**	**10,802.13**	**10,320.44**	**11,767.71**	**9,023.56**

ඇපකර වර්ගීකරණය අනුව නිෂ්පාදන

	2021	2022	2023	2024	2025
ඇපකරුවන්	3,033	1,971	455	976	1,317
මුදල්	4,025	5,344	6,422	5,271	5,054
රන්	7,696	6,602	12,166	14,012	14,830
උකස්	2,708	538	149	321	1
සේවක අර්ථසාධක අරමුදල	7,668	6,192	5,882	4,895	3
ලීසිං	169	115	153	199	480
මුළු එකතුව	**25,299**	**20,762**	**25,227**	**25,674**	**21,685**

නව නිෂ්පාදන

මෙම වසර තුළදී බැංකුව විසින් නව නිෂ්පාදන කිහිපයක් හඳුන්වා දෙන ලදී. ඒ අතර තිරසාරභාවය ඉලක්ක කරගත් නිෂ්පාදන මාලාවක් සහ අපගේ ලීසිං පහසුකම මත පදනම් වූ විවිධාංගීකරණය වූ සේවාවන් ද ඇතුළත් වේ.

HDFC ගෝ ග්‍රීන් ඉතුරුම් ගිණුම

රුපියල් 100,000ක් හෝ ඊට වැඩි ඉතුරුම් ශේෂයක් පවත්වා ගන්නා ගිණුම් සඳහා 1%ක ප්‍රසාද පොලී අනුපාතයක් හිමිවන අතර, ඒ සමඟම 'හරිත සහතිකයක්' ද පිරිනමනු ලැබේ.

HDFC ග්‍රීන් වෙල්ත් තැන්පතුව

රුපියල් 500,000ක් හෝ ඊට වැඩි තැන්පතු සඳහා සාමාන්‍ය කාලීන තැන්පතු පොලී අනුපාතයට අමතරව තවත් 0.5%ක අතිරේක පොලී අනුපාතයක් හිමිවන අතර, ඒ සමඟම 'හරිත සහතිකයක්' ද පිරිනමනු ලැබේ.

HDFC ලීසිං

අපගේ ලීසිං පහසුකම, ගනුදෙනුකරුවන් ට ලබා දිය හැකි ඉහළම පහසුකම් සහිතව විවිධාංගීකරණය කර ඇත. මෙම වසර තුළ, මූල්‍ය අවශ්‍යතා සඳහා වේගවත්ම විසඳුම ලෙස අගය වර්ධනය කිරීමේ ක්‍රියාවලිය හරහා අපගේ ලීසිං කළඹ කොටස් වශයෙන් වෙන් කර දියුණු කරන ලදී. තවද, අපගේ ලීසිං නිෂ්පාදන මගින් අවම මාසික වාරිකයන් සහිතික

සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

කෙරේ. මෝටර් රථ ආනයනය මත පනවා තිබූ තහංචි ඉවත් කිරීම සහ සීමාවන් ලිහිල් කිරීමත් සමඟ මෙම වැඩිදියුණු කිරීම් බෙහෙවින් වාසිදායක විය. ව්‍යාපාර, අධ්‍යාපනය, නිවාස සහ කෘෂිකර්මාන්තය වැනි විවිධ අරමුණු සඳහා ගනුදෙනුකරුවන් ගේ වාහනවලට එරෙහිව මූල්‍ය පහසුකම් සැපයීම සඳහා පහත නිෂ්පාදන හඳුන්වා දී ඇත:

- ව්‍යාපාරික ලීසිං
- නිවාස ලීසිං
- අධ්‍යාපන ලීසිං
- කෘෂිකාර්මික ලීසිං

ප්‍රාග්ධනය සම්බන්ධතා - බුද්ධිමය ප්‍රාග්ධනය

විශේෂයෙන්ම අලුතින් හඳුන්වා දුන් හරිත මූල්‍ය නිෂ්පාදන සමඟින්, විවිධාංගීකරණය මගින් ආයතනික ප්‍රාග්ධනය නව උසකට ඔසවා තබනු ලබයි.

ප්‍රාග්ධනය සම්බන්ධතා - බුද්ධිමය ප්‍රාග්ධනය

හරිත නිෂ්පාදන පිළිබඳ සේවක දැනුවත්භාවය ඔවුන්ගේ දැනුම ඉහළ නංවා ඇති අතර, ඔවුන්ගේ වෘත්තීය පිවිසයට සහ වෘත්තීය ගමන් මඟට විටිනාකමක් එක් කර ඇත. මෙබඳෝ දෙනෙකුට, මෙවැනි නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අත්දැකීමක් ලැබූ ප්‍රථම අවස්ථාව මෙයයි.

ප්‍රාග්ධනය සම්බන්ධතා - ස්වභාවික ප්‍රාග්ධනය

හරිත නිෂ්පාදන පාරිසරික තිරසාරභාවය සමඟ අනිවාර්යයෙන්ම බැඳී පවතී. විවිධ හරිත නිෂ්පාදන හඳුන්වා දීම තුළින්, අපි පාරිසරික හිතකාමී මූලපිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා සක්‍රීයව දායක වෙමින් ආයෝජනය කරමින් සිටින්නෙමු.

පාරිභෝගික පැමිණිලි කළමනාකරණය

සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ බැංකුව 100%ක පැමිණිලි විසඳීමේ අනුපාතයක් අත්කර ගෙන ඇති අතර, වාර්තා වූ සියලුම පැමිණිලි සාර්ථකව අවසන් කරමින්, විසඳීමට ඉතිරි වූ කිසිදු පැමිණිල්ලක් නොමැති මට්ටමට ළඟා වී ඇත. සේවාවේ ගුණාත්මකභාවය සහ පාරිභෝගික තෘප්තිය ඉහළ යාම පෙන්නුම් කරමින්, පෙර වසරට සාපේක්ෂව සමස්ත පැමිණිලි ප්‍රමාණය අඩුවීම සතුටුදායක කරුණකි.

අපගේ පැමිණිලි කළමනාකරණ ප්‍රවේශය, ස්ථර කිහිපයකින් යුත් ක්‍රමවේදයක් හරහා ඵලදායී විසඳුම් සහතික කරයි.

- මූල්‍ය පාරිභෝගික සම්බන්ධතා කළමනාකරු (අනුකූලතා අංශය) විසින් ආරවුල් විධිමත් ලෙස සමාලෝචනය කරන අතර, මෙහෙයුම් අංශය විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, විද්‍යුත් බැංකුකරණය සහ අරමුදල් හුවමාරු කිරීමේ දෝෂ වැනි තාක්ෂණික ගැටලු විසඳනු ලැබේ.
- විකේන්ද්‍රගත විසඳුම්: ප්‍රතිචාර දැක්වීමේ වේගය වැඩි දියුණු කිරීම සඳහා ශාඛා කළමනාකරුවන්ට දේශීයව ගැටලු විසඳීමේ බලය පවරා ඇති අතර, වගවීම සහතික කිරීම සඳහා අනිවාර්ය ලේඛනගත කිරීමක් සිදු කෙරේ.
- ප්‍රතිපෝෂණ සහ අධීක්ෂණය: ඇමතුම් මධ්‍යස්ථාන දත්ත සහ සමාජ මාධ්‍ය ඔස්සේ පාරිභෝගික අදහස් විශ්ලේෂණය කිරීම තුළින් සේවා මට්ටම් ක්‍රියාශීලීව තක්සේරු කරනු ලැබේ.

අලෙවිකරණය, සන්නිවේදනය සහ තොරතුරු දැනගැනීමේ අයිතිය

සමාලෝචනයට ලක් වූ කාලසීමාව තුළ, විචක්ෂණශීලී මූල්‍ය සැලසුම්කරණය මෙහෙයුම් ප්‍රමුඛතාවයක් ගත් අතර, ඒ නිසා තොරතුරු ප්‍රචාරණය කිරීම අපගේ සමාජ මාධ්‍ය වේදිකා හරහා පමණක් සිදු කිරීමට සිදු විය. මෙමගින් තරුණ පාරිභෝගික පිරිසක් වෙත අඩු වියදමකින් ළඟා වීමට අපට හැකි විය ඉඩ සලසා දුන් අතර, අපගේ ශාඛා සේවකයින් සහ පාම්ටොප් බැංකුකරණ වේකය බිම් මට්ටමේ අපගේ ශක්තිමත්ම ප්‍රචාරකයින් ලෙස දිගටම කටයුතු කළහ.

මූල්‍ය සීමාවන් ලිහිල් වීමත් සමඟ, අපි අලෙවිකරණය සහ සන්නාමකරණය සඳහා අපගේ බහුවිධ ප්‍රවේශය අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතර, සාම්ප්‍රදායික මාධ්‍ය නාලිකා හරහා තොරතුරු බෙදාහැරීමත් සමඟම ඔන්ලයින් ජාලයන් හරහා දෘශ්‍යතාව සහ ප්‍රවේශ්‍යතාව උපරිම කිරීමට බලාපොරොත්තු වෙමු.

ගනුදෙනුකරුවන් ගේ තොරතුරු දැනගැනීමේ අයිතියට පොලී අනුපාත වෙනස්වීම්, ඔවුන්ගේ ගනුදෙනු සහ මූල්‍ය අවශ්‍යතාවලට බලපාන නියාමන ප්‍රතිපත්ති, මෙන්ම සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලීන් වෙනස් විය හැකි අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි පිළිබඳ දෛනික යාවත්කාලීන කිරීම් ඇතුළත් වේ. මේවා ප්‍රධාන වශයෙන් අපගේ ආයතනික වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාල හරහා සන්නිවේදනය කරනු ලබන අතර, එමඟින් ගනුදෙනුකරුවන් සහ මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගත හැක.

අනිවාර්ය සහ ස්වේච්ඡා රෙගුලාසි සහ පිළිවෙත්

- 1949 අංක 58 දරන මුදල් නීති පනතේ කොටසක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි
- ශ්‍රී ලංකා මහ බැංකු පනත
- පොලී අනුපාත සහ ගාස්තු පිළිබඳ දෛනික යාවත්කාලීන කිරීම්

මේවා අනුගමනය කිරීම මගින් පාරිභෝගික ආරක්ෂාව සහ තොරතුරු දැනගැනීමේ අයිතිය සහතික කෙරේ.

පෞද්ගලිකත්වය, ආරක්ෂාව සහ සදාචාරාත්මක බැංකුකරණය

පාරිභෝගික පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂාව සහතික කිරීම සඳහා අපි ක්‍රියාශීලී පියවරක් ලෙස නිතිපතා උපදේශන ලබා දීම සිදු කරමු. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගනුදෙනු, විද්‍යුත් බැංකුකරණය සහ ජංගම ගෙවීම් සඳහා භාවිතා කරන පුද්ගලික හඳුනාගැනීමේ අංක සහ මුරපදවල ආරක්ෂාව තහවුරු කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ තොරතුරු ඇතුළුව, සංවේදී තොරතුරු ආරක්ෂිතව කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ මගපෙන්වීම් අපගේ ආයතනික වෙබ් අඩවිය, ශාඛා සහ ඇමතුම් මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය හරහා ලබා දෙනු ලැබේ. තවද, තොරතුරු ආරක්ෂණ උපායමාර්ගය ශක්තිමත්ව පවතින බවත්, කර්මාන්තයේ හොඳම භාවිතයන්ට සහ පාරිභෝගික පෞද්ගලිකත්වය හා ආර-ක්ෂාව පිළිබඳ රෙගුලාසිවලට අනුකූල වන බවත් සහතික කිරීම සඳහා අපගේ තොරතුරු තාක්ෂණ අංශය විසින් වරින් වර විගණනයන් සිදු කරනු ලබයි. ආරක්ෂිත ඔන්ලයින් බැංකු පිවිසුම් සඳහා විකවර භාවිතා කළ හැකි මුරපද සහ ආරක්ෂිත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ප්‍රවේශය සඳහා අනන්‍ය ජෂඟ අංක භාවිතය ඇතුළු ශක්තිමත් ආරක්ෂක පියවරයන් ක්‍රියාත්මක කිරීමෙන් පෞද්ගලිකත්වය වැඩි දියුණු කිරීමට අපි කටයුතු කර ඇත්තෙමු.

අල්ලස් සහ දූෂණ විරෝධී ක්‍රියාමාර්ග

අල්ලස් සහ දූෂණයට අදාළ සිදුවීම් විමර්ශනය සඳහා අදාළ බලධාරීන්ට වාර්තා කිරීම සේවකයින්ගේ වගකීමකි; එවැනි කරුණු වහාම ඉහළම විධායක නිලධාරීන් වෙත සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. මීට අමතරව, බැංකු වත්කම් අනිසි ලෙස භාවිතා වන ගනුදෙනුවල නිරත වීම සහ බැංකුවට අවශ්‍ය ගැටුම් ඇතිවන තත්ත්වයන්හි නිරත වීම සේවකයින්ට සහ වගකිවයුතු පුද්ගලයින්ට තහනම් වේ. මෙම ප්‍රතිපත්තිය මගින් දූෂිත සහ වංචනික ක්‍රියාවන් ලෙස සලකනු ලබන තවත් ගනුදෙනු සහ හැසිරීම් වර්ග කිහිපයක් පිළිබඳව ද දක්වා ඇත; මෙම ප්‍රතිපත්තිය HDFC ආයතනික වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

පාරිභෝගික පැමිණිලි කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසිවලට සහ අදාළ හොඳම භාවිතයන්ට බැංකුව අනුගත වේ. නියාමන වෙනස්කම්වලට අනුකූලව බැංකුව සිය පාරිභෝගික පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය සමාලෝචනය කර යාවත්කාලීන කරයි. ගනුදෙනුකරුවන් ට ශාඛා වෙත පැමිණීම, දුරකථනය සහ විද්‍යුත් තැපෑල, තැපෑල මෙන්ම වෙබ් අඩවිය සහ වට්ස් ඇප් ඇතුළු සමාජ මාධ්‍ය/ඔන්ලයින් නාලිකා ඇතුළු විවිධ ක්‍රම ඔස්සේ පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.

- වැඩ කරන දින පහක් ඇතුළත පැමිණිලි ලැබුණු බව තහවුරු කරනු ලබන අතර, ඒ සඳහා අද්විතීය යොමු අංකයක් ලබා දෙනු ලැබේ.
- අවශ්‍ය සියලුම විස්තර සහිතව පැමිණිලි කේන්ද්‍රීය පද්ධතියක ලියාපදිංචි කරනු ලැබේ.
- පැමිණිල්ල හැසිරවීම සඳහා වගකිවයුතු නිලධාරියෙකු හෝ කණ්ඩායමක් පත් කරනු ලැබේ.
- ලේඛන රැස් කිරීම සහ අවශ්‍ය නම් සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ඇතුළුව පැමිණිල්ල විමර්ශනය කරනු ලැබේ.
- දින 21ක් ඇතුළත විසඳුමක් ලබා දීමට අපේක්ෂා කෙරේ. යම් ප්‍රමාදයක් සිදුවුවහොත්, මාස 3කට නොවැඩි නව විසඳුම් දිනයක් සහිතව පාරිභෝගිකයා දැනුවත් කරනු ලැබේ.

බැංකුව විසින් සිය වෙබ් අඩවිය සහ සියලුම ශාඛා හරහා පැමිණිලි කළමනාකරණ ක්‍රියාවලිය සහ පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳව හෙළිදරව් කර ඇත.

රජයේ සහ ව්‍යවස්ථාපිත හවුල්කරුවන්

නියාමක ආයතනය	භූමිකාව	ප්‍රධාන රෙගුලාසි
ශ්‍රී ලංකා මහ බැංකුව	බලපත්‍ර ලබා දීම, විචක්ෂණශීලී අධීක්ෂණය සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා වන ප්‍රධාන නියාමකයා වේ.	1988 අංක 30 දරන බැංකු පනත, (සංශෝධිත 2024 අංක 24 දරන පනත), මූල්‍ය බුද්ධි ඒකකයේ රෙගුලාසි
කොටස් වෙළඳපොළ නියාමන කොමිෂන් සභාව	වෙළඳපොළ අනුකූලතාව සඳහා ලැයිස්තුගත සමාගම් නියාමනය කරයි.	2021 අංක 19 දරන SEC පනත, CSE ලැයිස්තුගත කිරීමේ නීති, ආයතනික පාලන සංග්‍රහය
මූල්‍ය බුද්ධි ඒකකය	මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණය වැළැක්වීමේ (AML/CFT) අනුකූලතාව බලාත්මක කරයි.	2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත CDD රීති
මුදල් අමාත්‍යාංශය / ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	රජයේ හිමිකාරිත්වය සහ නිවාස නියෝගය අධීක්ෂණය කරයි.	1997 අංක 7 දරන HDFC පනත 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත රජයේ මූල්‍ය රෙගුලාසි
විගණකාධිපති	මූල්‍ය වගවීම සඳහා රාජ්‍ය ආයතන විගණනය කරයි.	2018 අංක 19 දරන ජාතික විගණන පනත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති
මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා	පාරිභෝගික ආරවුල් විසඳයි.	පාරිභෝගික ආරක්ෂණ රාමුව ඔම්බුඩ්ස්මන් යෝජනා ක්‍රමය

මූල්‍ය නියාමන අධිකාරිය (ශ්‍රී ලංකා මහ බැංකුව)

අපගේ කටයුතු මූලික වශයෙන් නියාමන විධානයන් සහ මාර්ගෝපදේශ සමඟ පෙළගැසෙන බැවින්, රටේ මූල්‍ය නියාමකයා සමඟ පවතින සබඳතාවයට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ. මූල්‍ය ශක්‍යතාව, මෙහෙයුම් ස්ථාවරත්වය සහ පාර්ශ්වකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා අපගේ හවුල්කරු වන ශ්‍රී ලංකා මහ බැංකුව, ඔවුන්ගේ නීතිපතා ලබා දෙන මඟ පෙන්වීම් සහ ක්‍රියාමාර්ග හරහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

2025 වසරේදී, බැංකුව සහ රාජ්‍ය මූල්‍ය නියාමකයා අතර පවතින සබඳතාව රාජ්‍ය නියෝග මත සිදු වූ ප්‍රතිව්‍යුහගත කිරීමේ අවධියකට පරිවර්තනය විය. HDFC බැංකුව, ලංකා බැංකුවේ අනුබද්ධ ආයතනයක් බවට පත් කිරීමට රජය ගත් තීරණය, පුළුල් මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමට සහ ඉදිරි වසර පහ තුළ HDFC බැංකුවට සිය අනාගත මෙහෙයුම් ස්ථාවර කර ගැනීමටත්, ඉහළ මූල්‍ය කාර්ය සාධනයක් අත්කර ගැනීමටත් හැකි වන පරිදි ගනු ලැබූවකි.

ක්ෂේත්‍රය	මහ බැංකුවේ ක්‍රියාමාර්ග	HDFC බැංකුවේ ප්‍රතිචාරය
ප්‍රාග්ධනය	ලංකා බැංකුව සමඟ ඒකාබද්ධ වීමට නියම කිරීම.	අනුබද්ධිත තත්ත්වයට පත් වීමට සූදානම් වීම.
පාලනය	දැඩි "සුදුසුකම් සහ නිසිභාවය" තක්සේරු කිරීම්.	අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම.
අවදානම්	තැන්පතු සහ ණය දීමේ සීමාවන් පැනවීම.	උකස් සහ ලීසිං සේවාවන් කෙරෙහි අවධානය යොමු කිරීම.
තාක්ෂණය	ඩිජිටල් ගෙවීම් භාවිතය ප්‍රවර්ධනය කිරීම.	ජස්ට් පේ සහ ඔන්ලයින් බැංකුකරණය.

2025 වසරේදී නියාමන සීමාවන් සාමාන්‍ය දෙයක් බවට පත් වූ අතර, තැන්පතු ලබා ගැනීමේ සහ ණය නිෂ්පාදන බෙදා හැරීමේ අපගේ හැකියාව මත නියාමකයා විසින් තීරණාත්මක සීමාවන් කිහිපයක් පනවන ලදී. මේවා මූලික වශයෙන් සිදු වූයේ පවතින ප්‍රාග්ධන සපයන මට්ටම තවදුරටත් ඉහළ නැංවීමට සහ සුරක්ෂිත කිරීමට මෙන්ම බැංකුවේ ණය කළඹෙහි ණය ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය හේතුවෙනි.

සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

බැංකුව විසින් අනුගමනය කරනු ලබන අනෙකුත් නියාමන රාමු සහ නීති:

- 2024 අංක 24 දරන බැංකු පනත් විධානයන් (සංශෝධනය)
- තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වන මූලික ආරක්ෂණ ප්‍රමිතීන්
- අවම ප්‍රාග්ධන අවශ්‍යතා, ද්‍රවශීලතා අනුපාත සහ අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශ සඳහා බාසල් III ප්‍රමිතීන්
- මුදල් නීති පනත
- ආයතනික පාලනය, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදී මූල්‍යකරණය වැළැක්වීම පිළිබඳ විධානයන්, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ
- පාරිභෝගික ආරක්ෂණ මාර්ගෝපදේශ
- වාර්තාකරණ සහ විගණන ප්‍රමිතීන්

නියාමන අවශ්‍යතාවලට අපි ප්‍රතිචාර දැක්වූ සහ සුහද සබඳතා පවත්වා ගත් ආකාරය

නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා, අපි සතිපතා සහ මාසික පදනම්න් නිතිපතා සන්නිවේදනයක් පවත්වා ගෙන ගියෙමු. මෙය නියාමකයාට ඔවුන්ගේ නියාමන ඉල්ලීම්, විශේෂයෙන්ම බැංකුවේ පැහැර හරින ලද අර්ථසාධක අරමුදල් ආධාරක නිවාස ණය සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි ගැලපීම් සිදු කර ගැනීමට ඉඩ සලසා දුන්නේය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සුදුසුකම් හා නිපුණතා නිර්ණායකයන්ට අනුකූලව, ව්‍යවස්ථාපිත පාලන ප්‍රමිතීන්ට අනුකූලව විධායක නායකත්වයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍ය වෙනස්කම් බැංකුව විසින් සිදු කරන ලදී.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

බැංකුවේ මව් සමාගම සහ ප්‍රධාන කොටස් හිමිකරු මෙන්ම නිවාස මූල්‍යකරණය සඳහා ප්‍රාථමික උපායමාර්ගික හවුල්කරු වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ බැංකුව අතර පවතින සම්බන්ධතාවයන් බැංකුවේ මූලික පදනම වී ඇත.

ප්‍රාග්ධන සම්බන්ධතාවය - නිෂ්පාදිත ප්‍රාග්ධනය

නෙවන පාර්ශ්වීය සේවා සපයන්නන්ගෙන් ලබා ගන්නා ප්‍රතිපාදන සහ සේවාවන් මගින් ගනුදෙනුකරුවන් අතර සේවාවන් කාර්යක්ෂමව බෙදා හැරීමට සහ හඳුනා නොගත් වෙළඳපල කොටස් කරා ළඟා වීමට බැංකුවට හැකියාව ලැබේ. (උදාහරණ: ජස්ට් පේ මගින් සක්‍රීය කරන ලද ජංගම ටුර්කටින යෙදුම්, ශාඛා වෙත නොනිකව ප්‍රවේශ වීමේ අවශ්‍යතාවය මගහරවයි.)

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගමක් ලෙස, මූල්‍ය වාර්තාකරණය සහ වෙළඳපල අඛණ්ඩතාව පාලනය කරන SEC රෙගුලාසිවලට අපි අනුගත වන්නෙමු. SEC අවශ්‍යතාවයන්ට ගරු කරමින්, අපි පහත කරුණු සහතික කරමු:

- අනුකූලතාව: ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව විගණනය කරන ලද කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන.
- අඛණ්ඩතාව: අනිවාර්ය හෙළිදරව් කිරීම්, අභ්‍යන්තර තොරතුරු භාවිතයෙන් වෙළඳාම් කිරීම වැළැක්වීම සහ සුළුතර කොටස් හිමියන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සම්බන්ධ නීති අපි දැඩි ලෙස ක්‍රියාත්මක කරන්නෙමු.

විගණකාධිපති දෙපාර්තමේන්තුව

රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස, අපගේ මූල්‍ය කළමනාකරණය ඉහළම මට්ටමේ මහජන පරීක්ෂණයකට ලක්වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන වාර්ෂික විගණන මගින් සියලුම මූල්‍ය ගනුදෙනුවල පූර්ණ විනිවිදභාවය සහ රාජ්‍ය සතු වත්කම්වල විචක්ෂණශීලී කළමනාකරණය සහතික කෙරේ.

මූල්‍ය ඔම්බුඩ්ස්මන්

ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ස්ථාපිත කර ඇති ඔම්බුඩ්ස්මන්වරයා, පාරිභෝගික පැමිණිලි විසඳීම සඳහා විකල්ප සහ අපක්ෂපාතී ක්‍රියාවලියක් සපයන අතර, අපගේ සේවාවන් සාධාරණ, විනිවිදභාවයෙන් යුත් සහ පාරිභෝගික කේන්ද්‍රීය බව සහතික කරයි. වසර තුළදී, සැලකිය යුතු මට්ටමේ කිසිදු පාරිභෝගික පැමිණිල්ලක් බැංකුව වෙත ලැබී නොමැත.

හවුල්කරුවන්, සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්

ප්‍රාග්ධන සම්බන්ධතාවය - මූල්‍ය ප්‍රාග්ධනය

හවුල්කරුවන්, සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් සමඟ බෙදාගත් ආර්ථික වටිනාකම.

අඛණ්ඩ මෙහෙයුම් සහ සේවාවන් සඳහා ප්‍රවේශය සහතික කර ගැනීම වෙනුවෙන් අපි විවිධ ව්‍යාපාරික හවුල්කරුවන් ජාලයක් සමඟ කටයුතු කරන්නෙමු; මෙම හවුල්කාරිත්වයන් මගින් අපගේ ශාඛා ජාලයේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීමට අපට ඉඩ සැලසේ. සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් යනු අපගේ මෙහෙයුම්වල දිගුවක් වන අතර අපගේ පරිසර පද්ධතියේ වැදගත් කොටසකි.

සියලුම වැදගත් මූල්‍ය සේවාවන් සහ අභ්‍යන්තර කාර්යයන් සඳහා සහය දැක්වීමට අවශ්‍ය මනා සූදා-නමකින් සහ ස්ථාවරයකින් සිටීම සඳහා භෞතික උපකරණ සහ භාණ්ඩ, තාක්ෂණික විසඳුම්, විදුලි සං-දේශ සේවා සහ වෘත්තීය සේවාවන්වල අවශ්‍යතාවය මත අපගේ හවුල්කාරිත්වයන් පදනම් වේ.

මිලදී ගැනීමේ පිළිවෙත්

සැපයුම්කරුවන් සහ අනෙකුත් සේවා සපයන්නන් තෝරා ගැනීමේදී, රාජ්‍යය සමඟ අප පවතින සබඳතාව හේතුවෙන් රජය විසින් පාලනය කරනු ලබන ක්‍රියාවලියක් අපි දැඩි ලෙස අනුගමනය කරන්නෙමු.

රාජ්‍ය අරමුදල් භාවිතයේදී විනිවිදභාවයෙන් සහ වගවීමකින් යුතුව කටයුතු කිරීමේ රාජ්‍ය නියෝගයට අනුකූලව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ බැංකුව විසින් අනුගමනය කරනු ලැබේ. කොන්ත්‍රාත්තු සමාලෝචනය සහ ප්‍රදානය කිරීම සඳහා අනිවාර්ය ලංසු තැබීමේ ක්‍රමවේදයක් අනුගමනය කෙරේ. ටෙන්ඩර් කැඳවීම් භාෂා තුනෙන්ම ප්‍රමුඛ පුවත්පත්වල පළ කරනු ලැබේ.

සේවා සපයන්නන්

හවුල්කරු	මූලපිරීම	උපායමාර්ගික වටිනාකම
ලංකාපේ	ජස්ට් පේ සහ පොදු POS ස්විච්	'ප්‍රතිලාභ' හිමියන් සඳහා තත්‍ය කාලීන, ගාස්තු රහිත ඩිජිටල් ගනුදෙනු සක්‍රීය කරන අතර JCB සහතිකලත් POS ගෙවීම් සඳහා පහසුකම් සපයයි.
අමෑසන් වෙබ් සේවාවන්	කිලවුඩ් යටිතල පහසුකම්	99.99%ක කාලසීමාවක් සහිතව අපගේ ආයතනික වෙබ් අඩවිය බලගන්වන අතර, උසස් වෙබ් යෙදුම් ෆයර්වෝල් ආරක්ෂාව සපයයි.

තිරසාර හවුල්කාරිත්වයන් සහතික කිරීම

මෙම හවුල්කාරිත්වයන් පවත්වාගෙන යාම බැංකුව විසින් අන්‍යෝන්‍ය වටිනාකම් නිර්මාණය කිරීම සහ වගවීම සඳහා සහය වන වටිනාකම් කිහිපයක් මත පදනම් වේ:

- විවෘත සන්නිවේදනයක් පවත්වා ගැනීම සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ (ටෙන්ඩර් පදනම මත) පිළිපැදීම.
- කොන්ත්‍රාත්තු, ගිවිසුම් සහ කලින් තීරණය කරගත් ගෙවීම් කොන්දේසි සඳහා දැඩි කැපවීම.
- බදු රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා අගය වකතූ කළ බදු ලියාපදිංචි ආයතන සමඟ සහයෝගීතාවයට ප්‍රමුඛත්වය දීම.
- බැංකුවට සහ අපගේ වෙළෙන්දන්ට යන දෙපාර්ශවයටම ආර්ථික වටිනාකමක් ලැබෙන පරිදි සමතුලිත කිරීමට උත්සාහ කිරීම.

ඩිජිටල් ගනුදෙනු (ලංකා පේ - LankaPay)

ප්‍රවේශවීමේ හැකියාව සහතික කරමින් සහ පාරිභෝගික ළඟාවීම වැඩි දියුණු කරමින්, අපි ලංකා පේ හි 'ජස්ට් පේ' පද්ධතිය සමඟ හවුල් වී ඇති අතර, එය ජංගම දුරකථන හරහා ගෙවීම් සහ බැංකු සේවා සිදු කිරීමට අවස්ථාව සලසා දෙයි. භෞතික බැංකු සේවා සඳහා සීමිත ප්‍රවේශයක් ඇති ගනුදෙනුකරුවන් වෙත අපගේ නිෂ්පාදන සහ සේවාවන් ඩිජිටල් තාක්ෂණය ඔස්සේ රැගෙන යාමේ වැදගත් කොටසක් ලෙස මෙම සහයෝගිතාව පවතී.

සමාජය

ආයතනික සමාජ වගකීම් පිළිබඳ අපගේ ප්‍රවේශය සාම්ප්‍රදායික දැක්මෙන් ඔබ්බට ගොස් පරිණාමය වී ඇත.

මූල්‍ය ඇතුළත් කිරීම දැන් අපගේ සමාජ සංවර්ධන ප්‍රවේශයේ මූල්ගල බවට පත්ව ඇත. රටේ වෙහෙස මහන්සි වී වැඩ කරන ශ්‍රම බලකායට සේවය කරන බැංකුවක් ලෙස, කොන් වූ ප්‍රජාවන් සවිබල ගැන්වීම සඳහා ප්‍රවේශවීමේ හැකියාව සහ මූල්‍ය සාක්ෂරතාවයට ප්‍රමුඛත්වය දීම අපගේ විශ්වාසයයි. මූල්‍ය අස්ථාවරත්වයේ සිට ආර්ථික ස්ථාවරත්වය දක්වා සංක්‍රමණය වීමට එවැනි පුද්ගලයින්ට උපකාර කිරීම අපගේ අවධානයයි.

ඇපකර හෝ විධිමත් මූල්‍ය ඉතිහාසයක් නොමැති වීම හේතුවෙන් සාම්ප්‍රදායික බැංකු අංශය විසින් බොහෝ විට නොසලකා හරින ලද පුද්ගලයින් සඳහා අපි සේවය කරන්නෙමු.

- ඇතුළත් කරගන්නා නිෂ්පාදන: අඩු පහසුකම් සහිත ජනගහනයේ අද්විතීය මූල්‍ය තත්ත්වයන්ට විශේෂයෙන් ගැලපෙන පරිදි අපි දැරිය හැකි ණය සහ ඉතිරිකිරීමේ මෙවලම් සංවර්ධනය කර ඇත්තෙමු.
- පාම්ටොප් ක්ෂේත්‍ර සහය: බැංකු කටයුතු සඳහා පවතින භෞතික දුරස්ථභාවය අඩු කරමින්, අපගේ පාම්ටොප් බැංකුකරණ (නිවසේ දොරකඩටම බැංකු සේවාවන්) කණ්ඩායම බිම් මට්ටමේ ක්‍රියාත්මක වේ. ඔවුන් බැංකුව පාරිභෝගිකයා වෙත රැගෙන යයි. නාගරික සහ ග්‍රාමීය අඩු පහසුකම් සහිත ප්‍රජාවන්ට සේවය කිරීම සහ අපගේ ග්‍රාමීය ගනුදෙනුකරුවන් විධිමත් ආර්ථිකයෙන් බැහැර නොවන බව සහතික කිරීම ඔවුන් විසින් ඉටු කරන වැදගත් සේවාවකි.
- ඩිජිටල් පරිණාමය: ඩිජිටල් පරතරය නැති කිරීම සඳහා, අපි HDFC ක්ලික් හරහා අපගේ ඩිජිටල් යටිතල පහසුකම් වැඩි දියුණු කර ඇත්තෙමු. මෙම ද්වාරය මගින් සීමිත සම්පත් ඇති ගනුදෙනුකරුවන් ට අන්තර්ජාලය හරහා ගනුදෙනු කළමනාකරණය කිරීම සඳහා ආරක්ෂිත සහ අන්තර්ක්‍රියාකාරී දොරටුවක් සහතික කරයි.

5 වන වාර්ෂික නැගී එන මූල්‍ය වෙළඳපල සහ ප්‍රතිපත්ති පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (EFMP 2025)

ශ්‍රී ලංකා මුදල් සංගමය සමඟ එක්ව ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් සංවිධානය කරන ලද මෙම උත්සවය, නැගී එන මූල්‍ය වෙළඳපොළවල් තුළ තිරසාර වර්ධනය සහ නවෝත්පාදනය මෙහෙයවීම යන වැදගත් තේමාව කෙරෙහි අවධානය යොමු කළේය. HDFC සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී හේමල් ලොකුගීගන මහතා ප්‍රධාන කථිකයෙකු ලෙස සහභාගී වූ අතර, පරිණාමය වන ගෝලීය භූ දර්ශනයක් තුළ ඔරොත්තු දෙන සහ නව්‍ය මූල්‍ය පරිසර පද්ධතීන් පෝෂණය කිරීම පිළිබඳ වටිනා අදහස් බෙදා ගත්තේය.

මෙම සමුළුව මගින් විද්වතුන්ට, ව්‍යාත්තිකයින්ට සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඩිජිටල් නවෝත්පාදනය, මූල්‍ය ඇතුළත් කිරීම සහ වගකිවයුතු ආයෝජන පිළිවෙත් පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමට කදිම වේදිකාවක් ලබා දුන්නේය.

ලෝක සකසුරුවම් දින සැමරුම - HDFC තංගල්ල ශාඛාව

කුඩා කල සිටම මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීමට බැංකුව තුළ ඇති කැපවීම අනුව, අපගේ තංගල්ල ශාඛාව විසින් තංගල්ල රාහුල මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ සිසුන් සඳහා සකසුරුවම්කම සහ ඉතිරිකිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. අන්තර්ක්‍රියාකාරී සැසි සහ ක්‍රියාකාරකම් තුළින්, ඉතිරිකිරීමේ වටිනාකම, වගකිවයුතු ලෙස මුදල් කළමනාකරණය කිරීම සහ ජීවිතයේ මුල් අවධියේදීම යහපත් මූල්‍ය පුරුදු වර්ධනය කර ගැනීම පිළිබඳව ළමුන් ඉගෙන ගත්හ.

ලෝක සකසුරුවම් දිනය සැමරීම වෙනුවෙන් පන්නිපිටිය ක්‍රිස්තු රාජ විද්‍යාලයේ පැවති ලෝක සකසුරුවම් දින වැඩසටහන

ලෝක සකසුරුවම් දිනය සැමරීම සඳහා අපි පන්නිපිටිය ක්‍රිස්තු රාජ විද්‍යාලයේදී මූල්‍ය සාක්ෂරතා වැඩස-ටහනක් පැවැත්වුවෙමු. මෙම සැසිය සඳහා සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ යන දෙඅංශයේම සිසුන් සහභාගී වූ අතර, ඔවුන් සකසුරුවම්කමේ සහ ඉතිරිකිරීමේ පුරුදුවල වැදගත්කම පිළිබඳව ඉගෙන ගැනීමට උනන්දුවෙන් සම්බන්ධ විය.

අනාගත ස්ථාවරත්වය සඳහා මූල්‍ය සැලසුම්කරණයේ ඇති වැදගත්කම මෙහිදී සාකච්ඡා කෙරිණි. බැංකු කටයුතු පිළිබඳ අවබෝධය සහ ආරක්ෂිත මූල්‍ය අනාගතයක් සඳහා නුවණින් ඉතිරි කිරීමේ වටිනාකම මෙම වැඩසටහන මගින් වැඩි දියුණු වූ බව සඳහන් කරමින් සිසුන් තම පැසසුම් ඒකතුකළහ.

HDFC සහන සවිය

අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ගංවතුර සහ අනෙකුත් ආපදාවන්ට ලක් වූ පවුල් වෙනුවෙන් 'HDFC සහන සවිය' වැඩසටහන දියත් කර ඇත. අවතැන් වූ මහජනතාවට ආපදා සහන සැලසීම සඳහා සහ HDFC බැංකු සුබසාධක සංගමයේ මගපෙන්වීම යටතේ සමස්ත HDFC කාර්ය මණ්ඩලයේ දායකත්වයෙන්, ශ්‍රී ලංකා HDFC බැංකුව සහ බැංකු සුබසාධක සංගමය එක්ව, ආපදාවට ලක් වූ ප්‍රදේශවල ගංවතුර සහ අනෙකුත් හේතූන් මත දුෂ්කරතාවයට පත් වූ පවුල් සඳහා අත්‍යවශ්‍ය වියලි සලාක පාර්සල් ලබා දීමට උදව් උපකාර කළහ.



සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

'හරිත' නිෂ්පාදන මාලාව

2025 වසරේදී, බැංකුව විවිධ 'හරිත' නිෂ්පාදන කිහිපයක් සමඟ තිරසාරභාවය කරා දැඩි ලෙස යොමු විය. මෙම හරිත නිෂ්පාදන විශේෂයෙන් දියත් කරන ලද්දේ පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා මූල්‍යමය ආධාර ලබා දීමට සහ මූල්‍ය ප්‍රතිලාභ සහ ස්ථාවරත්වය හරහා ගනුදෙනුකරුවන් තිරසාරභාවය කරා යොමු කිරීම සඳහාය.

ළමා දින චිත්‍ර තරඟය




අනාගත පරපුර සවිබල ගැන්වීම


වැඩසටහන වර්ගය	ආවරණය කරන ලද ප්‍රධාන අන්තර්ගතය	ආවරණය වූ දිස්ත්‍රික්ක	ඉලක්කගත ප්‍රේක්ෂකයින්	මුළු සහභාගිවන්නන් සංඛ්‍යාව	අදහස්
දැනුවත් කිරීමේ සැසි	පාරිසරික විශයෙන් තිරසාර පිළිවෙත් සඳහා සහය වීම	කොළඹ	පාසල් සිසුන්/ගුරුවරුන්	140	නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලය
	පාරිසරික විශයෙන් තිරසාර පිළිවෙත් සඳහා සහය වීම	කොළඹ	පාසල් සිසුන්/ගුරුවරුන්	300	වටරැක ප්‍රාථමික විද්‍යාලය
	මූල්‍ය කළමනාකරණය, පාරිභෝගික ආරක්ෂාව සහ ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය	කොළඹ	පාසල් සිසුන්	50	පන්හිපිටිය ක්‍රිස්තු රාජ විද්‍යාලය - ප්‍රධාන කාර්යාලය විසින් පවත්වන ලදී
	මූල්‍ය කළමනාකරණය සහ පාරිභෝගික ආරක්ෂාව	හම්බන්තොට	පාසල් සිසුන්	40	තංගල්ල රාහුල ම.වි. (තංගල්ල ශාඛාව විසින් සංවිධානය කරන ලදී)
	ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය	අනුරාධපුරය	පාසල් සිසුන්	150	අනුරාධපුර ශාඛාව විසින්
	මූල්‍ය කළමනාකරණය	අනුරාධපුරය	රජයේ සේවකයින්	35	අනුරාධපුර ශාඛාව විසින්
	ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාව මූල්‍ය කළමනාකරණය පාරිභෝගික ආරක්ෂණය සහ ආර්ථික හා මූල්‍ය පරිසරය.	ත්‍රිකුණාමලය.	මහජනතාව සහ පාසල් සිසුන්	150	ත්‍රිකුණාමල ශාඛාව විසින් පවත්වනු ලබන විනෝදාත්මක ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක්

ප්‍රාග්ධන දැක්ම

අපගේ බැංකුවේ අනාගත උපායමාර්ගය හරහා ඉදිරි වසර පහ සඳහා නිශ්චිත අරමුණු සහිතව, පාර්ශ්වකරුවන්ගේ වටිනාකම ඉහළ නැංවීම සඳහා පහත කරුණු ඉතා තීරණාත්මක වේ.

- අපගේ බැංකු අත්දැකීම බාධාවකින් තොරව ලබා දීම සඳහා නූතන ඩිජිටල් මෙවලම් සහ විසඳුම් අඛණ්ඩව වැළඳ ගන්නෙමු.
- පාරිභෝගික අත්දැකීම් සහ වේගය වැඩි දියුණු කිරීම සඳහාත්, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහාත් පූර්ණ වශයෙන් ඩිජිටල්කරණය වූ බැංකු පද්ධතියක් ගොඩනැගීම අපගේ උපායමාර්ගික අවධානයට ලක්ව ඇත.
- තවද, ඩිජිටල් සහ භෞතික නාලිකා ඔස්සේ පාරිභෝගික පදනම පුළුල් කිරීම, අපගේ මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙන්ම පුළුල් ජනගහනයක් වෙත ළඟා වීමට අපට ඉවහල් වනු ඇත.
- තරුණයින්, කාන්තාවන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ප්‍රථම වරට නිවාස මිලදී ගන්නන් ඉලක්ක කර ගනිමින් ශක්තිමත් සන්නාම සන්නිවේදනයක් සිදු කෙරේ. පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම මඟින් පාරිභෝගික පක්ෂපාතිත්වය සහ නිර්දේශ කිරීම් දිරිමත් කරනු ලැබේ.
- සැහැල්ලු ඩිජිටල් ශාඛා සහ නියෝජිත සහාය ලබන බැංකුකරණය හරහා මෙතෙක් සේවාවන් නොලැබුණු පළාත් කරා අපගේ සේවාවන් ව්‍යාප්ත කරමින් පවතී. දේශීය බලධාරීන් සමඟ ඇති කර ගත් හවුල්කාරිත්වයන් අපගේ පාරිභෝගික පදනම පුළුල් කිරීමට දායක වේ

බුද්ධිමය ප්‍රාග්ධනය



අප සතු දැනුම

HDFC බැංකුව සඳහා, බුද්ධිමය ප්‍රාග්ධනය යනු පුහුණුව, ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සහ අඛණ්ඩ සේවා දියුණුව හරහා හැඩගැසුණු අපගේ සමස්ත ආයතනික දැනුමයි. එය අපගේ කණ්ඩායමේ විශේෂඥ දැනුමේ එකතුවක් වන අතර, බැංකුවට ආවේණික වූ නිෂ්පාදන, ආඥාපන්නර ක්‍රියාවලි සහ සන්නාම කීර්තිනාමය යන දේවල ප්‍රතිඵලයකි. මෙම ඇස්පෘෂ්‍ය වත්කම් පැහැර, සංකීර්ණ පරිසරයක කටයුතු කිරීමටත්, වූලප්‍ය සේවා සපයන්නෙකු ලෙස අගයක් නිර්මාණය කිරීමටත් අපට හැකියාව ලබා දෙයි.

අපගේ 453 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලය (සේවකයින්ගෙන් 71.52%ක් වයස 11කට වැඩි සේවා කාලයක් සහිත) අද්විතීය ආයතනික යකඩීන් සමූහයක් උපයෝගී කර ගැනීමට බැංකුවට ඉඩ සලසයි.

තිරසාර සංවර්ධන ඉලක්ක

- GOAL 4 **Quality Education**
- GOAL 8 **Decent Work and Economic Growth**
- GOAL 9 **Industry, Innovation and Infrastructure**
- GOAL 11 **Sustainable Cities and Communities**
- GOAL 12 **Responsible Consumption and Production**
- GOAL 16 **Peace and Justice Strong Institutions**
- GOAL 17 **Partnerships for the Goals**

අදාළ වැදගත් කරුණු

- T2
- T4
- T5
- T10
- T13

සම්බන්ධිත ප්‍රාග්ධනය

- බුද්ධිමය ප්‍රාග්ධනය
- සමාජ ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය

සම්බන්ධිත පාර්ශ්වකරුවන්

- සේවකයින්
- ගනුදෙනුකරුවන්
- ප්‍රජාව සහ පරිසරය

බුද්ධිමය ප්‍රාග්ධනය

සන්නාම අනන්‍යතාවය සහ ස්ථානගත කිරීම

නිවාස හිමිකම යන අරුත දනවන සන්නාම නාමයක් බවට පත්ව ඇති HDFC බැංකුව, මධ්‍යම සහ අඩු ආදායම්ලාභී ශ්‍රී ලාංකිකයින්ගේ නිවාස සිහින සැබෑ කරන බැංකුවක් ලෙස කීර්තියක් අත්කරගෙන ඇත. මෙම අනන්‍යතාවය හේතුවෙන් ඇතැම් සීමාවන් නිර්මාණය වුවද, අපගේ සන්නාම වටිනාකම පවතින්නේ මෙම පිළිගැනීම තුළය.

උකස් ණය සහ නිවාස ණය ලබාදීමේ විශේෂඥතාවට අමතරව, පසුගිය දශක එකහමාරක කාලය තුළ බැංකුව සැලකිය යුතු පරිවර්තනයකට ලක්ව ඇත. ඒකීය නිවාස වෙළඳපොලෙන් ඔබ්බට ගොස් වඩාත් බහුවිධ බැංකුවක් බවට පත්වීම සඳහා අපි විවිධාංගීකරණ ප්‍රවේශයක් අනුගමනය කර ඇත්තෙමු.

සන්නාමයක් ලෙස, HDFC බැංකුවේ වටිනාකම රුපියල් මිලියන 239ක් ලෙස තක්සේරු කර ඇති අතර, එය බ්‍රෑන්ට් ෆයිනෑන්ස් ශ්‍රී ලංකා (Echelon විසින් ප්‍රකාශිත) විසින් ප්‍රකාශයට පත් කරන ලද වඩාත්ම වටිනා සන්නාම 100 අතරට ශ්‍රේණිගත කර ඇත.

සන්නාම දෘශ්‍යතාව

තරුණ සහ මැදි වයසේ ගනුදෙනුකරුවන් අතර සන්නාම දෘශ්‍යතාව ඉහළ නංවමින්, අන්තර්ජාලය තුළ බැංකුව යම් ප්‍රගතියක් අත්කරගෙන ඇත. දැනට සිටින සහ අනාගත ගනුදෙනුකරුවන් වෙත ළඟා වීමට සමාජ මාධ්‍යවල ඇති වාසි බැංකුව උපරිම ලෙස භාවිතා කරයි. අපගේ LinkedIn ගිණුම හරහා 1,200කට අධික ස්වාභාවික අනුගාමිකයින් පිරිසක් අප සමඟ සම්බන්ධ වී සිටිති.

2025 වසරේදී, අපගේ මෙටා (මුහුණු පොත) ගිණුම නැරඹුම් වාර 574,959කට අධික ප්‍රමාණයක් සහ අනුගාමිකයින් 6,600කට වැඩි සංඛ්‍යාවක් අත්කර ගැනීමට සමත් විය.

HDFC බැංකුවේ උපායමාර්ගික සැලැස්ම සහ සංවර්ධන ක්‍රියාවලිය

සමාලෝචනයට ලක්වන කාලපරිච්ඡේදය තුළ අපගේ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම සංවර්ධනය කිරීම ප්‍රධාන කැපවීමක් විය. මෙම උපායමාර්ගික මාර්ග සිතියම සකස් කිරීම සඳහා වරින් වර සිදු කළ පර්යේෂණ, දෙපාර්තමේන්තුමය අවබෝධය, අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් සහ පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිපෝෂණ මෙන්ම බුද්ධි කළමනාකරණ සැසිවාරයන්හි එකතුවක් අවශ්‍ය විය. මෙයට කදිම නිදසුනක් වන්ෙ-න්, නායකත්වයේ සහ කාර්ය මණ්ඩලයේ සක්‍රීය සහභාගීත්වයෙන් පැවැත්වුණු තුන් දින උපායමාර්ගික සැලසුම් සංවර්ධන වැඩමුළුවයි. බැංකුවේ වත්මන් මෙහෙයුම් ප්‍රගතිය, පවතින අඩුපාඩු සහ අනාගත ඉලක්ක පිළිබඳ සාකච්ඡා සහ අදහස් හුවමාරු කර ගැනීම මෙහිදී සිදු කෙරිණි



සියලු මට්ටම්වල සහභාගීත්වය මෙම සැසිවාර තුළින් ලබා ගත් අතර, එය තිරසාර වර්ධනයක් සහ පරිවර්තනයක් සඳහා ශක්තිමත් සහ ඒකාබද්ධ දර්ශනයක් නිර්මාණය කිරීමට දායක විය. උත්සවය කණ්ඩායම් ගොඩනැගීමේ ක්‍රියාකාරකම් සහ වඩාත් ක්‍රියාශීලී කණ්ඩායම් ඇගයීමෙන් අවසන් වූ අතර, එය වැඩි සාර්ථකත්වයක් කරා අපගේ හවුල් කැපවීම තවදුරටත් තහවුරු කළේය.

බැංකුව ඉතා විධිමත් සහ දැඩි සැලසුම් ක්‍රියාවලියක නිරත වූ අතර, එය මාස පහක් පුරා සිදු කෙරුණු අතර පියවර 11කින් යුත් ක්‍රියාවලියක් අනුග මනය කරන ලදී. කළමනාකාරිත්වය සහ විවිධ දෙපාර්තමේන්තු මෙන්ම ප්‍රධාන විධායක නිලධාරියා ද ඇතුළත් හරස් ක්‍රියාකාරී කණ්ඩායම්වල සහයෝගීතාවය සහ මැදිහත්වීම තුළින් මෙම සැලැස්ම සම්පූර්ණ කරන ලදී.

පස් අවුරුදු උපායමාර්ගික මාර්ග සිතියම පහත ක්‍රියාවලියේ ප්‍රතිඵලයකි:

- බුද්ධි කළමනාකරණ සැසිය
- උපායමාර්ගික විශ්ලේෂණය
- SWOT විශ්ලේෂණය
- උපායමාර්ගික දිශානතිය (අරමුණු සමඟ පෙළගැසීම)
- සහායක ක්‍රියාමාර්ග
- විධායක සාකච්ඡා
- ඉලක්ක සමාලෝචනය
- අවසන් කිරීම
- සන්නිවේදනය
- KPI ක්‍රියාත්මක කිරීම
- නියාමන ඉදිරිපත් කිරීම

නිෂ්පාදන විවිධාංගීකරණ උපායමාර්ගය

නිවාස මූල්‍යකරණය කෙරෙහි ප්‍රබල මූලික අවධානයක් යොමු කරන එකම බැංකුව HDFC බැංකුව වන නමුත්, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සහ ආයතනික අංශය සඳහා විශේෂිත වූ විසඳුම් ඇතුළත් වන පරිදි අපගේ සේවාවන් නැවත සන්නාමගත කර ඇත.

	අරමුණ				කාල රාමුව		
ඉතුරුම් නිෂ්පාදනය	ඉතුරුම්	ස්ථාවර තැන්පතු / ආයෝජන සැලසුම්	විශ්‍රාම	නිවාස ණය	කෙටි කාලීන	මධ්‍ය කාලීන	දිගු කාලීන
HDFC ප්‍රතිලාභ	√						
HDFC ස්මාර්ට් ගෝල්ස්	√					√	
HDFC තිළිණ (ළමා ගිණුම)	√						√
විශ්‍රාම උද්‍යාන		√	√				√
විශ්‍රාම රක්ෂාවරණ		√	√				√
සෙට් ෆෝ ලයිෆ්		√					√

	අරමුණ			කාල රාමුව			
ණය නිෂ්පාදනය	නිවාස	නිවාස - EPF මගින් සහතික ලත්	ඇපකර අවශ්‍ය/ උකස්	කෙටි කාලීන	මධ්‍ය කාලීන	දිගු කාලීන	විශේෂ ප්‍රතිලාභ
කැදැල්ල	√				√	√	• කෘෂිකාර්මික කටයුතුවලින් ආදායම් ලබන පුද්ගලයින් ඇතුළත් වේ • කුලී ආදායම් සහ විදේශ ප්‍රේෂණ ලබන පුද්ගලයින් ඇතුළත් වේ
ශ්‍රම උදාන		√			√	√	• සේවක අර්ථසාධක අරමුදල් ශේෂයෙන් 75%ක් දක්වා ණය ගැනීමේ හැකියාව
සිරිසර			√	√	√	√	• සේවක අර්ථසාධක අරමුදල් ශේෂයෙන් 75%ක් දක්වා ණය ගැනීමේ හැකියාව
ලීසිං				√			

හිමිකාරිත්වයට යටත් ඩිජිටල් මෙවලම්

බැංකුවේ ඩිජිටල් මෙවලම් අපගේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ඩිජිටල් ස්පර්ශක ලක්ෂ්‍යයන් ලෙස ක්‍රියා කරයි. මේවා අපගේ ඩිජිටල් ගමන ගෙනහැර දක්වන අතර, වඩා හොඳ ක්‍රියාකාරිත්වයක් සඳහා මෙම වසර තුළ වීවා වැඩිදියුණු කර ඇත.

සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය කෙරෙහි ප්‍රාග්ධන සබඳතා බලපෑම

ඩිජිටල් ප්‍රවේශ්‍යතාව මගින් ගනුදෙනුකරුවන් ට පහසුව සහ ඕනෑම වේලාවක, ඕනෑම ස්ථානයක ගනුදෙනු කිරීමේ නිදහස ලැබේ.

පාම්ටොප් බැංකුකරණය

ජංගම බැංකුකරණය සඳහා ක්ෂේත්‍ර කණ්ඩායම
පාම්ටොප් කණ්ඩායම (ජංගම බැංකු කණ්ඩායම) නාගරික, උප නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන අපගේ බැංකු ශාඛා ජාලයට ළඟා විය නොහැකි ගනුදෙනුකරුවන් ගේ නිවෙස්වලට සහ සේවා ස්ථානවලට ගොස් බැංකු සේවාවන් ලබා දෙයි.

HDFC ක්ලික්

මාර්ගගත බැංකු ද්වාරය
අත්‍යවශ්‍ය ගනුදෙනු, උපයෝගිතා බිල්පත් ගෙවීම් සහ ගිණුම් ශේෂයන් විමසීම වැනි සේවාවන් සඳහා පහසුකම් සපයයි

ජස්ට් පේ ඇප්ස්

ගනුදෙනු
ඕනෑම ස්මාර්ට් උපාංගයක් හරහා තත්‍ය කාලීන ජංගම දුරකථන ගෙවීම් සිදු කිරීමට ඉඩ සලසයි.

සමාලෝචනයට ලක්වන වසර තුළ, බැංකුව විසින් තිරසාරභාවය සඳහා වූ කැපවීම සහ වැඩිදියුණු කළ පාරිභෝගික අත්දැකීමක් ලබා දීම ඉස්මතු කරමින් නව සාප්පු සවාරි ඩෙබිට් කාඩ්පතක් හඳුන්වා දෙන ලදී.





ආයතනික දැනුම

අවිධිමත් නිවාස වෙළඳපොල සහ දැනුම

අවිධිමත් ආදායම් ලබන්නන් සඳහා සේවය කිරීමේදී බැංකුව සැලකිය යුතු ආයතනික දැනුමක් අත්කරගෙන ඇත. සාම්ප්‍රදායික බැංකු විධිමත් ආදායම් මාර්ග සහිත ගනුදෙනුකරුවන් ගේ ණය සුදුසුකම් කෙරෙහි අවධානය යොමු කරන අතරතුර, HDFC බැංකුව සාම්ප්‍රදායික නොවන ගනුදෙනුකරුවන් ඇගයීමට සහ ඔවුන්ට සේවය කිරීමට අවශ්‍ය හිමිකාරිත්වයට යටත් ක්‍රියාවලීන් සහ යාන්ත්‍රණයන් සංවර්ධනය කර ඇත.

බුද්ධිමය ප්‍රාග්ධනය

මානව ප්‍රාග්ධනය කෙරෙහි ප්‍රාග්ධන සම්බන්ධතාවෙහි බලපෑම

අභ්‍යන්තර ක්‍රියාවලි සහ පුහුණුවීම්වලට නිරාවරණය වීම තුළින් වෘත්තීය වර්ධනය.

පාම්ටොප් බැංකු ඒකකය හරහා ලබා ගන්නා අවබෝධය

බැංකුවේ පාම්ටොප් බැංකු ඒකකය, ජංගම බැංකු සේවා ආශ්‍රිත දත්ත ලබා ගැනීම සඳහා අභිරුචිකරණය කළ මෘදුකාංගයකින් ක්‍රියාත්මක වන අතේ ගෙන යා හැකි උපකරණයක් භාවිතා කරයි. මෙය ජංගම බැංකු මෙවලමක් ලෙස ක්‍රියා කරන අතරම, අවිධිමත් ආදායම් මාර්ග ඇති සේවාලාභීන් පිළිබඳ දත්ත ලබා ගැනීමටත්, ඔවුන්ගේ තැන්පතු බලමුලු ගැන්වීමේ සහ ණය ආපසු ගෙවීමේ හැකියාව තක්සේරු කිරීමටත් අත්‍යවශ්‍ය වේ. ගනුදෙනුකරුවන් හමුවීමට යාමෙන්, අපගේ කණ්ඩායම්වලට ණය ගැතියන්ගේ විශ්වසනීයත්වය සහ ස්වභාවය පිළිබඳ මෘදු තොරතුරු ලබා ගත හැකි වේ. මේවා පැහැදිලි දත්ත ලෙස හඳුනාගත නොහැකි ගැඹුරු අවබෝධයන් වේ.

සේවක අර්ථසාධක අරමුදල මගින් සහතික ලත් ණය ලබා දීම

සේවක අර්ථසාධක අරමුදලේ ශේෂයන් ඇපයක් ලෙස භාවිතා කරමින් සේවක අර්ථසාධක අරමුදල මගින් සහතික ලත් ණය ලබා දීමේ ප්‍රමුඛයා බවට බැංකුව පත්ව ඇත. සේවක අර්ථසාධක අරමුදල මගින් සහතික ලත් ණය ලබා දීමේ ක්‍රියාවලිය යනු විධිමත් සහ අවිධිමත් අංශයේ සේවකයින්ට ණය පහසුකම් ලබා ගැනීමට අවස්ථාව සලසන ආයතනික ක්‍රියාවලියකි.

ණය තක්සේරු ක්‍රියාවලීන්

බැංකුවේ ණය, බැර සහ ණය අය කර ගැනීමේ නිලධාරීන් මධ්‍යම සහ අඩු ආදායම්ලාභී ණය ගැතියන්ගේ ආපසු ගෙවීමේ හැකියාවන් තක්සේරු කිරීමෙහිලා දක්ෂයෝ වෙති. බැංකුව විසින් ණය දෙපාර්තමේන්තුව සහ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව හරහා දැඩි සහ ඒකාබද්ධ ණය ඇගයීම් ක්‍රියාවලියක් පවත්වාගෙන යන අතරම, ගනුදෙනුකරුවන්, ඔවුන්ගේ මූල්‍ය අභියෝග සහ මූල්‍ය සාක්ෂරතා මට්ටම් තේරුම් ගැනීම සඳහා කාර්ය මණ්ඩලයේ දැනුම ඉතා තීරණාත්මක වේ. බැංකුවේ අභ්‍යන්තර පාලනයන් සහ රෙගුලාසි සමඟ පෙළගැසීමේදී මෙය අත්‍යවශ්‍ය වන අතර, ආපසු ගෙවීමට නිසි මාර්ග ඇති පුද්ගලයින්ට ණය ලබා දෙන අතරම බැංකුව ඉහළ අවදානම් මට්ටම්වලට ලක් නොවන බව සහතික කරයි.

නියාමන ක්‍රියාවලීන් කළමනාකරණය

HDFC බැංකුවේ අපගේ කණ්ඩායම බැංකුවෙන් අපේක්ෂා කරන නියාමන අවශ්‍යතා කළමනාකරණය කිරීමෙහිලා විශේෂයෙන් දක්ෂයෝ වෙති; මෑත වසරවලදී මෙම අවශ්‍යතා තවදුරටත් දැඩි වී ඇත. ඉහළ නියාමනයකට ලක්වන සේවා අංශයක් තුළ ක්‍රියාත්මක වන බැංකුවක් ලෙස, විශේෂිත බැංකුවක් වශයෙන් පැන නගින මූල්‍ය සීමාවන් තුලනය කරමින් අමතර නියාමන අවශ්‍යතාවල අභියෝගවලට HDFC බැංකුව මුහුණ දෙයි. වෙනත් මහා පරිමාණ සහ ලාභයම පරමාර්ථ කරගත් බැංකු හා සැසඳීමේදී, නියාමන ඉල්ලීම් සහ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සමඟ වර්ධනය තුලනය කර ගැනීමට අපගේ කාර්ය මණ්ඩලය වඩාත් ඔරොත්තු දීමේ හැකියාවෙන් යුක්ත වේ.

පද්ධතිමය අංග

කාර්ය මණ්ඩලයේ සේවය හැරයාම් සහ අනපේක්ෂිත බාධා කිරීම් තිබියදීත්, බැංකුවේ මෙහෙයුම් අඛණ්ඩතාව සහ වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීම සහතික කිරීම සඳහා ආයතනික පැහැදිලි දැනුම මූලික වේ. මේවා මෙහෙයුම් ක්‍රියා පටිපාටි හරහා ලේඛනගත කර, ගබඩා කර සහ පහසුවෙන් හුවමාරු කර ගනු ලැබේ. මෙයට ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනිවාර්ය කර ඇති ඇපකර සහිත ණය, පොලී අනුපාත ගණනය කිරීම්, ආපසු ගෙවීමේ ව්‍යුහයන් සහ ප්‍රොටෝකෝල, මෙන්ම නීතිමය අනුකූලතාව පිළිබඳ ක්‍රියා පටිපාටි සහ ප්‍රොටෝකෝල වේ.

විශේෂයෙන්ම මූල්‍ය කළමනාකරණය, වත්කම් සහ බැරකම් සහ පාරිභෝගික සබඳතා කළමනාකරණය යන ක්ෂේත්‍රවලදී මූලික බැංකු පද්ධතිය සහ ඩිජිටල් දත්ත ගබඩා මගින් දත්ත මත පදනම් වූ තීරණ ගැනීමට බැංකුවට හැකි වේ. තවද, දැනුම කළමනාකරණ පද්ධති මගින් කාර්ය මණ්ඩලයේ සේවය හැරයාම සහ දැනුම අහිමි වීම තුළින් පැන නගින අවදානම් විසඳනු ලබයි. කාර්ය මණ්ඩල ඉල්ලා අස්වීම් හේතුවෙන් අභ්‍යන්තර දැනුම රඳවා තබා ගැනීම අභියෝගාත්මක වුවද, මෙම පද්ධතිමය අංග මගින් ලේඛනගත කිරීමේ අවශ්‍යතාවලට අනුගත වීමට සහ දැනුම ගබඩා කිරීමට කාර්ය මණ්ඩලයට බල කිරීම තුළින් එම ගැටලුවට සාර්ථකව මුහුණ දෙනු ඇත.

දර්ශකය	2025
කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීම	91.89%
වසර 10කට වැඩි සේවා කාලයක් ඇති පිරිස	සමස්ත කාර්ය මණ්ඩලයෙන් 71.52%
පුහුණුව	කාර්ය මණ්ඩලය පුහුණු කළ පැය 734
උපාධි මට්ටමේ සුදුසුකම් ඇති පිරිස	125
පශ්චාත් උපාධි හෝ ඊට ඉහළ සුදුසුකම් ඇති පිරිස	222

සබඳතා ප්‍රාග්ධනය

අප බැංකුව සඳහා, අවිධිමත් මෙන්ම මධ්‍යම සහ අඩු ආදායම්ලාභී පුද්ගලයින් සමඟ පවතින සබඳතා අපගේ අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීමේ ප්‍රධාන සාධකය වී ඇත. අනෙකුත් මූල්‍ය ආයතන විසින් සාම්ප්‍රදායිකව නොසලකා හරින දහස් ගණන් ශ්‍රී ලාංකිකයින්ගේ නිවාස මූල්‍ය අවශ්‍යතා සොයා බැලීම අපගේ ව්‍යවස්ථාපිත වගකීමකි. දිවයින පුරා විසිරී සිටින විවිධ තැන්පත්කරුවන් සහ ණය ගැතියන් සමඟ වඩාත් දේශීයකරණය වූ සබඳතා ගොඩනඟා ගැනීමේදී, කළමනාකරුවන් ඇතුළු අපගේ ශාඛා කාර්ය මණ්ඩලයේ හැකියාවන් ඉතා තීරණාත්මක වී තිබේ.


සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය කෙරෙහි ප්‍රාග්ධන සබඳතාවයෙහි බලපෑම

විධිමත් සහ අවිධිමත් ආදායම් ලබන්නන් යන දෙපාර්ශවය සමඟම අප සිදු කරන කාර්යයන් අපට ඇසමයක විශ්වාසයක් අත්කර දී ඇති අතර, එය අපගේ සබඳතා ප්‍රාග්ධනය පොහොසත් කර ඇත.

ප්‍රාග්ධන දැක්ම

කාර්ය මණ්ඩලයේ හැකියාවන් වැඩිදියුණු කිරීම තුළින් බැංකුව සිය බුද්ධිමය ප්‍රාග්ධනය අඛණ්ඩව ඉහළ නංවනු ඇත. වැඩිදියුණු කළ සහ නවීකරණය කරන ලද ඩිජිටල් මෙවලම් සහ මාර්ගගත වේදිකා, පුහුණුව සහ ඩිජිටල්කරණය හරහා දැනුම සංරක්ෂණය කිරීම අපගේ බුද්ධිමය වත්කම් සඳහා දායක වනු ඇත. කෙසේ වෙතත්, අපගේ මූලික අවධානය මූල්‍ය තිරසාරභාවය මත පවතින බැවින්, මෙය අපේක්ෂා කළාට වඩා වැඩි කාලයක් ගත විය හැකිය. විවිධ ජනගහන කොටස් වෙත සේවය කිරීමේ අපගේ වෙනස් වූ විශේෂඥ දැනුම, විශේෂයෙන්ම කොටි කාලීන සිල්ලර ණය විසඳුම් හරහා ඉදිරි වසරවලදී තිරසාර වර්ධනයක් කරා යාමට අපට මග පාදනු ඇත. තවද, තිරසාර හරිත බැංකුකරණ විසඳුම් මගින් ගනුදෙනුකරුවන් සඳහා අපගේ වටිනාකම නැවත නිර්වචනය කිරීමට උපකාරී වන අතර, අපගේ නව හරිත බැංකු නිෂ්පාදන ඉදිරි වසරේදී ජනප්‍රිය වනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

නිෂ්පාදිත ප්‍රාග්ධනය



තිරසාර වර්ධනය සඳහා පදනමක්

නිෂ්පාදිත ප්‍රාග්ධනය යනු අපගේ මෙහෙයුම් ස්ථාවරත්වයේ සහ විවිධාකම් නිර්මාණය කිරීමේ තීරණාත්මක සාධකයකි. ප්‍රායෝගික ව්‍යාප්තියේ තිරසාර ආකෘතියක් මත ක්‍රියාත්මක වන අපගේ භෞතික වත්කම් සහ යටිතල පියසටහන වසර ගණනාවක් පුරා මඩසැට් ලෙස වර්ධනය වී ඇත. මෙම ප්‍රවේශය මෙහෙයුම් ස්ථාවරත්වය පවත්වාගෙන යාමටත්, කොළඹ පිහිටි අපගේ ප්‍රධාන කාර්යාලය සහ දිවයින පුරා විහිදුනු ශාඛා ජාලය හරහා ප්‍රශස්ත සේවාවන් ගනුදෙනුකරුවන් වෙත ලබා දීමට අපගේ කාර්ය මණ්ඩලයට හැකියාව ලබා දී ඇත.

තිරසාර සංවර්ධන ඉලක්ක



GOAL 8
Decent Work and Economic Growth



GOAL 9
Industry, Innovation and Infrastructure



GOAL 10
Reduced Inequality



GOAL 11
Sustainable Cities and Communities



GOAL 12
Responsible Consumption and Production



GOAL 16
Peace and Justice Strong Institutions

අදාළ වැදගත් කරුණු

T5

T10

T13

සම්බන්ධිත ප්‍රාග්ධනය



නිෂ්පාදිත ප්‍රාග්ධනය



මානව ප්‍රාග්ධනය



සමාජ ප්‍රාග්ධනය

සම්බන්ධිත පාර්ශ්වකරුවන්



සේවකයින්



ගනුදෙනුකරුවන්



ප්‍රජාව සහ පරිසරය

නිෂ්පාදිත ප්‍රාග්ධනය

ශාඛා ජාලය සහ භෞතික වත්කම්


ප්‍රාග්ධන සඛඳතාව - මානව ප්‍රාග්ධනය

ශාඛා සහ භෞතික පහසුකම් මගින් කාර්ය මණ්ඩලයට කාර්යක්ෂමව වැඩ කිරීමට හැකි වන අතර එය දිරිගන්වයි. ශාඛා 39 සහ ප්‍රධාන කාර්යාලය තුළ අවශ්‍ය සියලුම සම්පත් වෙන සේවකයින්ට ප්‍රවේශය ඇති බව අපි සහතික කර ඇත්තෙමු.

ප්‍රාග්ධන සඛඳතාව - සමාජ සහ සඛඳතා ප්‍රාග්ධනය

අපගේ ශාඛා ජාලය ගනුදෙනුකරුවන් සඳහා වන අපගේ ප්‍රථම සහ ප්‍රධාන ස්පර්ශක ලක්ෂ්‍යය වන අතර, ගනුදෙනුකරුවන් වෙත වටිනාකමක් ලබා දීමේ තීරණාත්මක සම්බන්ධකයකි.

HDFC බැංකුව වසර පුරා ශාඛා 39ක් සමඟ සිය මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, කුඩා පියසටහනක් පවත්වා ගනිමින් පළාත් 9ම පුරා විසිරී ඇති හොඳ භූගෝලීය ව්‍යාප්තියක් රඳවා ගත්තේය.



බැංකුව බස්නාහිර පළාතේ ශාඛා 13ක් හරහා ක්‍රියාත්මක වන අතර, එය මුළු ශාඛා ජාලයෙන් 33%ක සාන්ද්‍රණයකි. දකුණු සහ මධ්‍යම පළාත් ශාඛා 13% බැගින් සමාන බෙදාහැරීමක් බෙදා ගනී. 2025 මූල්‍ය වර්ෂය තුළ, කිසිදු ස්ථාන මාරුවක් හෝ සැලකිය යුතු අලුත්වැඩියාවක් සිදු වී නොමැත.

ප්‍රාග්ධන සඛඳතාව - මූල්‍ය ප්‍රාග්ධනය


කාර්යක්ෂම යටිතල පහසුකම් කළමනාකරණය මෙහෙයුම් පිරිවැය අඩු කරන අතර, එය අනෙක් අතට වඩා හොඳ ලාභ ආන්තිකයන් සඳහා දායක වී ඇත.

දේපල, පිරියත සහ උපකරණ

බැංකුවේ භෞතික යටිතල පහසුකම් මගින් කාර්ය මණ්ඩලයට විශ්වාසනීය සහ පාරිභෝගික කේන්ද්‍රීය මූල්‍ය සේවාවන් ලබා දීම සඳහා අවශ්‍ය සම්පත් සහ නාලිකා ජාලය සපයයි. අපගේ ශාඛා ජාලය සහ අපගේ ඩිජිටල් පියසටහන ඇතුළු තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් මගින්, ගනුදෙනුකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා ස්පර්ශ කළ හැකි වටිනාකම් අත්කර ගනිමින් අපගේ මෙහෙයුම් ප්‍රමුඛතා කඩිනම් කිරීමට අපට හැකි වේ.

අපගේ දේපල, පිරියත සහ උපකරණවලට අයිතිය හිමි ඉඩම් සහ ගොඩනැගිලි, පරිගණක යටිතල පහසුකම්, ගෘහ භාණ්ඩ සහ උපාංග ආදිය ඇතුළත් වේ. කාර්යාල ගොඩනැගිලි සහ අනෙකුත් මෙහෙයුම් වත්කම් දිවයින පුරා සුමටව සහ විශ්වාසනීයව ක්‍රියාත්මක වීමට අපට ඇති හැකියාව බලගන්වයි. 2025 මූල්‍ය වර්ෂය අවසානය වන විට බැංකුවේ දේපල, පිරියත සහ උපකරණවල වටිනාකම රුපියල් මිලියන 165ක් විය.


මූල්‍ය නියාමකයා විසින් නියම කර ඇති ඇතැම් මූල්‍ය සීමාවන් සහ බැංකුවේ මූල්‍ය තිරසාරභාවය පිළිබඳව උනන්දු වෙමින්, අපි අපගේ යටිතල පහසුකම් නවීකරණය කිරීම සඳහා උපායමාර්ගික ප්‍රවේශයක් අනුගමනය කර ඇති අතර, එය පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ මෙහෙයුම් අඛණ්ඩතාව සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.



සමාලෝචනයට ලක්වන වසර තුළ, මුළු දේපල, පිරියත සහ උපකරණවල වටිනාකම පසුගිය වසරේ වාර්තා වූ රුපියල් මිලියන 187 සිට රුපියල් මිලියන 165 දක්වා පහත වැටී ඇත. දේපල, පිරියත සහ උපකරණවල සමස්ත අඩුවීමක් තිබියදීත්, පසුගිය වසරේ රුපියල් මිලියන 11 හා සැසඳීමේදී, රුපියල් මිලියන 24.6ක වටිනාකමකින් යුත් දේපල, පිරියත සහ උපකරණ/අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම් සිදු කර ඇති අතර, එය ප්‍රාග්ධන වියදම්වල 50%කට වැඩි වර්ධනයක් පෙන්නුම් කරයි.

අංගය	2025 (රු. මිලියන)	2024 (රු. මිලියන)
ඉඩම් සහ ගොඩනැගිලි		10,313
පරිගණක දෘඪාංග		85,128
කාර්යාල උපකරණ, ගෘහ භාණ්ඩ සහ උපාංග		90,782
වෙනත්		975
එකතුව	165	187

වත්කම් කාණ්ඩය	උපායමාර්ගික කාර්යභාරය
ඉඩම් සහ ගොඩනැගිලි	දිගුකාලීන ස්ථාවරත්වය සහ ප්‍රාදේශීය පැවැත්ම.
පරිගණක දෘඪාංග	ඩිජිටල් ගනුදෙනු සහ දත්ත විශ්ලේෂණය බලගැන්වීම.
කාර්යාල උපකරණ, ගෘහ භාණ්ඩ සහ උපාංග	පාරිභෝගික අත්දැකීම සහ සේවක සුවපහසුව වැඩිදියුණු කිරීම.
වෙනත්	නිවාස ව්‍යාපෘති සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවන්ට පහසුකම් සැලසීම.



බැංකුවේ දේපල, පිරියත සහ උපකරණ සංයුතිය පරිගණක දෘඪාංග කෙරෙහි දැඩි ලෙස අවධානය යොමු කර ඇති අතර, එය මුළු දේපල, පිරියත සහ උපකරණ වටිනාකමින් 51%ක් වේ. තවත් 43%ක් කාර්යාල උපකරණ, ගෘහ භාණ්ඩ සහ උපාංගවල සංකේන්ද්‍රණය වී ඇති අතර, ඉඩම් සහ ගොඩනැගිලිවලට අයත් වන්නේ මුළු වටිනාකමින් 6%ක් පමණි.

තාක්ෂණික යටිතල පහසුකම්

ප්‍රාග්ධනය සඛඳතා - මූලික ප්‍රාග්ධනය

2025 වසරේ තාක්ෂණික ආයෝජන සහ උත්ශ්‍රේණිගත කිරීම් සඳහා රුපියල් මිලියන 4.1ක පිරිවැයක් දැරා ඇත.

ප්‍රාග්ධනය සඛඳතා - මානව ප්‍රාග්ධනය

තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් යටිතල පහසුකම් මගින් සේවක ඵලදායිතාව සහ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව ඉහළ නංවයි.

බැංකුවේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් දෘඪාංග සහ වැඩසටහන් සම්බන්ධයෙන් අබණ්ඩව වර්ධනය වෙමින් පවතී. ඇත්ත වශයෙන්ම, බැංකුවේ දේපල, පිරියත සහ උපකරණ පදනම පෙන්නුම් කරන්නේ එහි වත්කම් පදනමෙන් වැඩි ප්‍රමාණයක් තොරතුරු තාක්ෂණ/තාක්ෂණ ආශ්‍රිත වත්කම්වල සංකේන්ද්‍රණය වී ඇති බවයි.

මූලික බැංකු පද්ධතිය

මූලික බැංකු පද්ධතිය මගින් පාරිභෝගික සබඳතා කළමනාකරණය, ගිණුම් කළමනාකරණය, ගෙවීම් සැකසීම, ණය කළමනාකරණය සහ තැන්පතු බලමුලු ගැන්වීම සම්බන්ධ කාර්යයන් සහ ක්‍රියාවලීන් ඉටු කරනු ලැබේ.

ගෙවීම් ද්වාරය

ප්‍රාග්ධනය සඛඳතා - සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය

ලංකා පේ යනු අපගේ ප්‍රධාන සේවා සැපයුන්තන්ගෙන් එකක් වන අතර, සේවාලාභීන් සඳහා ඩිජිටල් සේවාවන් සක්‍රීය කිරීමට දායක වන ප්‍රධාන පාර්ශවයකි.

ශ්‍රී ලාංකීය ගෙවීම් යෙදුම් සඳහා ප්‍රාථමික ඩිජිටල් ද්වාරය ලෙස ක්‍රියා කරන 'JustPay' පද්ධතිය භාවිතා කිරීම සඳහා අපි උපායමාර්ගිකව ලංකා පේ සමඟ හවුල් වී සිටිමු. "ප්‍රතිලාභ" ඉතුරුම් ගිණුමේ ගනුදෙනුකරුවන්ට මෙම ජනප්‍රිය තෙවන පාර්ශවීය යෙදුම භාවිතා කරමින් තත්‍ය කාලීන සිල්ලර ගෙවීම්, උපයෝගිතා බිල්පත් පියවීම් සහ රක්ෂණ වාරික ගෙවීම් සෘජුවම තම ගිණුමෙන් සිදු කළ හැකිය.

මාර්ගගත බැංකු ද්වාරය

බැංකුව විසින් ඒකාබද්ධ බැංකු ද්වාරයක් ක්‍රියාත්මක කරන අතර, එය ණය ආපසු ගෙවීම්, අරමුදල් හුවමාරු කිරීම් සඳහා පහසුකම් සපයන අතර වෙබ් යෙදුම් ෆයර්වෝල් සහ බහු-සාධක සත්‍යාපනය හරහා ආරක්ෂාව සහතික කරයි. මෙම ද්වාරය තත්‍ය කාලීන ගනුදෙනු සඳහා CEFTS සහ අනෙකුත් දේශීය බැංකු වෙත කාණ්ඩ හුවමාරු සඳහා SLIPS පහසුකම් සපයයි.

ඩිජිටල් යටිතල පහසුකම්

පහසු ගනුදෙනු සහ බැංකු සේවාවන් සඳහා තීරණාත්මක තාක්ෂණයන් අප අනුගමනය කරන බැවින්, අපගේ ඩිජිටල් යටිතල පහසුකම් වසර ගණනාවක් පුරා විචක්ෂණශීලීව ප්‍රශස්ත කර ඇත.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

ප්‍රාග්ධන සඛඳනා - බුද්ධිමය ප්‍රාග්ධනය

ඩිජිටල් යටිතල පහසුකම්වලට පාරිභෝගික සේවාව සඳහා හිමිකාරිත්වයට යටත් ඩිජිටල් මෙවලම් ඇතුළත් වේ. (කරුණාකර 93 සිට 96 දක්වා පිටුවල ඇති බුද්ධිමය ප්‍රාග්ධන වාර්තාව වෙත යොමු වන්න.)

අපගේ ඩිජිටල් මෙවලම් සහ නාලිකා වෙබ් අඩවිය

සමස්තයක් ලෙස, මෙම වෙබ් අඩවිය මගින් පරිශීලකයින්ට/ගනුදෙනුකරුවන්ට සහ මහජනතාවට නිෂ්පාදන තොරතුරු ලබා ගැනීමටත්, ශාඛා සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිහිටි ස්ථාන වෙත ප්‍රවේශ වීමටත් හැකි වේ. අනෙකුත් ප්‍රධාන ප්‍රවේශ්‍යතා සහ තොරතුරු විශේෂාංගවලට අමතරව, මෙම වසර තුළ වෙබ් අඩවියේ යම් දියුණු කිරීම් සිදු කරන ලදී. ඒ අතර ප්‍රශස්ත දෘශ්‍යතාවක් සඳහා වඩාත් ජංගම දුරකථන ප්‍රතිචාරාත්මක වන පරිදි ප්‍රතිනිර්මාණය කරන ලද බැනර් අංශයක් ඇතුළත් වේ.

වෙබ් අඩවිය පහත සඳහන් විශේෂාංග සහ ක්‍රියාකාරිත්වයන්ගෙන් සමන්විත වේ:

වත්කම් කාණ්ඩය	තොරතුරු/ක්‍රියාකාරිත්වයන්
ඉතුරුම් සහ ආයෝජන	ඉතුරුම් ගිණුම්, ළමා සැලසුම්, විශ්‍රාම අරමුදල්, ස්ථාවර තැන්පතු
ණය	නිවාස, ලීසිං, රන් ණය සහ පුද්ගලික මූල්‍යකරණය
ඩිජිටල් මෙවලම්	ඔන්ලයින් බැංකුකරණය, කැල්කියුලේටර, චැට්බෝට්, විමසීම් පෝරම
ප්‍රවේශ්‍යතාව	භාෂා තුනෙන්ම සහය, අකුරු පාලනය, ප්‍රතිවිරුද්ධ වර්ණ සැකසුම්
සංචලනය	Google Maps සමඟ ශාඛා සොයා ගැනීමේ පහසුකම
ආරක්ෂාව	ආරක්ෂක ප්‍රමිතීන් සහිත ක්ලවුඩ් හොස්ටින්, WAF සහ ඉහළ ක්‍රියාකාරී කාලය

තවද, 2024 වසරේදී වෙබ් අඩවියේ විශේෂාංග සහ පෙනුම සංශෝධනය කරන ලද අතර, එමගින් ගනුදෙනුකරුවන්ට නව පහසුකම් කිහිපයක් ලබා ගැනීමට අවස්ථාව ලැබුණි. වෙබ් අඩවිය භාෂා තුනෙන්ම ප්‍රශස්තකරණය කර ඇති අතර, රටේ විවිධ ප්‍රදේශවල ගනුදෙනුකරුවන්ගේ භාෂා මනාපයන්ට සහාය දක්වයි. සියලුම උපාංග හරහා අනුකූලතාවයක් පවත්වා ගැනීම සඳහා ජංගම දුරකථන ප්‍රතිචාරාත්මක මෝස්තරයක් ඇතුළත් කිරීම ද අතිරේක දියුණු කිරීම්වලට අයත් විය. ශාඛා සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිහිටි ස්ථාන පහසුවෙන් හඳුනා ගැනීමට හැකි වන පරිදි ගූගල් මැප් සමඟ ඒකාබද්ධ වන ලෙස වෙබ් අඩවිය වැඩිදියුණු කරන ලදී.

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය ජාලය

වර්තමානයේ, බැංකුව සතු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර යන්ත්‍ර 23කට අමතරව, ලංකා පේ හි අන්තර් සම්බන්ධිත දිවයින පුරා පවතින ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර යටිතල පහසුකම් සමඟ බැංකුව සම්බන්ධ වී ඇත. ලංකා පේ පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචය හා සම්බන්ධ වීමෙන්, බැංකුව සතු ස්වාධීන කියොස්ක් සිය ගණනක් ඉදිකිරීමේ ප්‍රාග්ධන වියදමකින් තොරව අපගේ සේවාවන්හි වපසරිය ඵලදායී ලෙස පුළුල් කර ඇත.

ප්‍රාග්ධන දැක්ම

උසස් තත්ත්වයේ වත්කම් පදනමක් සහ අඩු අවදානම් පැතිකඩක් පවත්වා ගැනීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන බැංකුවක් ලෙස, අපි ආක්‍රමණශීලී ලෙස නවීකරණයන් සහ යටිතල පහසුකම් ආයෝජනවල නිරත නොවන්නෙමු. ඒ වෙනුවට, භෞතික යටිතල පහසුකම්වලට අදාළ ආයෝජන සහ වියදම් සඳහා අපි වම ප්‍රායෝගික ප්‍රවේශයම අඛණ්ඩව අනුගමනය කරනු ඇත. නමුත්, අපගේ ඩිජිටල් වේදිකා සහ අභ්‍යන්තර තොරතුරු කළමනාකරණ පද්ධති නවීකරණය කිරීම සඳහා අපි වඩාත් ක්‍රියාශීලී ප්‍රවේශයක් අනුගමනය කරන්නෙමු.

බැංකුවේ මූල්‍ය සහ නියාමන කැපවීම් සහ ඉලක්ක සමඟ අපගේ අනාගත සැලසුම් විකඟතාවයෙන් වර්ධනය වන බව සහතික කිරීම සඳහා, අපගේ භෞතික පැවැත්ම සහ ඩිජිටල් වේදිකා සමබර කිරීමට අපි අපේක්ෂා කරමු.

ස්වභාවික ප්‍රාග්ධනය



ස්ථාවර හා තිරසාර ප්‍රගතියක් පවත්වා ගැනීම

අපගේ මෙහෙයුම් අඛණ්ඩතාව, පුනර්ජනනීය සහ පුනර්ජනනීය නොවන බලශක්ති සහ ජල මූලාශ්‍ර මත අප රඳා පැවතීම සමඟ සමීපව බැඳී පවතී. පාරිසරික භාරකාරත්වය වැළඳ ගැනීම සඳහා අපි විවිධ භාවිතාවන් සහ දිගුකාලීන උපායමාර්ග ද අනුගමනය කර ඇත්තෙමු. මේවාට කඩදාසි, ප්ලාස්ටික් සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ඇතුළු ශාඛා අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම සහතික කරන අපද්‍රව්‍ය කළමනාකරණය වැනි ප්‍රායෝගික සහ ඵලදායී මූලපිරීම් ඇතුළත් වේ.

තවද, හරිත බැංකුකරණ මූලපිරීම් හරහා, පාරිසරික තිරසාරභාවය කෙරෙහි ඉහළ බලපෑමක් ඇති කරන දිගුකාලීන ව්‍යාපෘති සඳහා මූලිකාරණය කිරීමට අපි පියවර තබා ඇත්තෙමු. සාමූහිකව, මෙම පියවරයන් මගින් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සහ තිරසාර සංවර්ධන ඉලක්ක

හොඳම භාවිතාවන්ට අනුකූලව අපගේ කැපවීම් වැඩි කිරීමට ක්‍රමයෙන් පියවර ගනිමින්, පාරිසරික තිරසාරභාවයේ මාවතේ අප ඊදී සිටින බව සහතික කරයි.

තිරසාර සංවර්ධන ඉලක්ක



GOAL 6 **Clean Water and Sanitation**

GOAL 7 **Affordable and Clean Energy**

GOAL 11 **Sustainable Cities and Communities**

GOAL 12 **Responsible Consumption and Production**

GOAL 13 **Climate Action**

අදාළ වැදගත් කරුණු

T6

T11

සම්බන්ධිත ප්‍රාග්ධනය



බුද්ධිමය ප්‍රාග්ධනය | සමාජ ප්‍රාග්ධනය | ස්වභාවික ප්‍රාග්ධනය

සම්බන්ධිත පාර්ශ්වකරුවන්



සේවකයින් | ගනුදෙනුකරුවන් | ප්‍රජාව සහ පරිසරය

පාරිසරික භාරකාරත්වය සහ අවදානමෙන් යුත් සම්පත් කළමනාකරණය

අවදානමෙන් යුත් සම්පත් කළමනාකරණය යනු අපගේ පාරිසරික භාරකාරත්ව ප්‍රයත්නයන් පදනම් කර ගන්නා සාධකයයි. වසර ගණනාවක් පුරා, අපගේ කාර්ය මණ්ඩලය විදුලිය, ජලය, ඉන්ධන සහ අනෙකුත් සම්පත් අවදානමෙන් සහ වගකීමෙන් යුතුව පරිභෝජනය කිරීමට හුරු වී ඇත. කුඩා භෞතික ශාඛා සැලසුම් පැවතීම මගින් වසර ගණනාවක් පුරා අපගේ විදුලි සහ ජල පරිභෝජනය ස්ථාවරව පවත්වා ගැනීමට මෙය තවදුරටත් උපකාරී වී ඇත.

සම්පත් පරිභෝජන කාර්යසාධනය

විගිවිදභාවය පිළිබඳ අපගේ කැපවීමට අනුකූලව, අදාළ දර්ශක හරහා බැංකුවේ සම්පත් භාවිතය නිරීක්ෂණය කර වාර්තා කරනු ලැබේ.

දර්ශකය	2025 (ඒකක)
විදුලි පරිභෝජනය (ප්‍රධාන කාර්යාලය)	312,759
විදුලි පරිභෝජනය (ශාඛා)	571,631
ජල පරිභෝජනය (ශාඛා)	7,440

ස්වභාවික ප්‍රාග්ධනය

බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණ මූලපිරීම්

විදුලිය සහ ඉන්ධන භාවිතය හා සම්බන්ධ බලශක්ති සංරක්ෂණය ප්‍රශස්ත කිරීම සඳහා අපි උපායමාර්ග මාලාවක් ක්‍රියාත්මක කර ඇත්තෙමු. සාමූහිකව, පහත සඳහන් ක්‍රියාමාර්ග අපගේ ප්‍රධාන කාර්යාලය ඇතුළු ශාඛා 39ක ජාලය හරහා බලශක්ති තීව්‍රතාවය අඩු කිරීමට දායක වේ:

- LED ආලෝකකරණයට මාරුවීම සහ ස්වාභාවික ආලෝකය භාවිතය වැඩි කිරීම.
- ප්‍රශස්ත බලශක්ති කාර්යක්ෂම උෂ්ණත්වය වන 24°C දී වායුසමීකරණ පද්ධති පවත්වා ගැනීම.
- මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා වායුසමීකරණ සහ ආලෝක පද්ධතිවල නිත්‍ය නඩත්තුව.
- ඉන්ධන පරිභෝජනය අවම කිරීම සඳහා කාර්ය මණ්ඩල ගමන් වාර අඩු කිරීම සහ ගමන් මාර්ග වඩා හොඳින් සැලසුම් කිරීම.
- හවුල් මුද්‍රණ ජාලයක් අනුගමනය කිරීම, එමඟින් නිෂ්ක්‍රීය බලශක්ති භාවිතය අඩු කිරීම සහ උපකරණ අතිරික්තය අවම කිරීම.

ඊ-අපද්‍රව්‍ය සහ කඩදාසි භාවිතය අවම කිරීම

ප්‍රති භාවිතා කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය යනු අපගේ ඊ-අපද්‍රව්‍ය සහ කඩදාසි අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවේශයේ අංග දෙකකි. සියලුම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ඉලෙක්ට්‍රොනික උපකරණ ආරක්ෂිතව ප්‍රතිචක්‍රීකරණය කිරීමට සහ බැහැර කිරීමට හැකියාව ඇති බලයලත් මධ්‍යස්ථාන වෙත යවනු ලැබේ. සම්පත් පරිභෝජනය අවම කිරීමට සහ ප්‍රශස්ත කිරීමට, කඩදාසි ප්‍රති භාවිතා කළ හැකි අවස්ථාවලදී එසේ කිරීමට සහ අභ්‍යන්තර සන්නිවේදනය, අනුමැතිය සහ ලේඛන කටයුතු සඳහා ඩිජිටල් විකල්ප අනුගමනය කිරීමට කාර්ය මණ්ඩලය දිරිමත් කරනු ලැබේ.

අපද්‍රව්‍ය කළමනාකරණ භාවිතයන්

අපගේ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවේශය අපගේ ශාඛා තුළ ව්‍යුහගත සහ අවදානමෙන් කටයුතු කිරීමේ මූලධර්ම මත පදනම් වේ. අපගේ ප්‍රවේශයට අපද්‍රව්‍ය ප්‍රවේශමෙන් වර්ගීකරණය කිරීම සහ වගකීමෙන් යුතුව බැහැර කිරීම ඇතුළත් වන අතර, ප්ලාස්ටික් සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය තෙවන පාර්ශවීය සේවා සපයන්නන් හරහා ප්‍රතිචක්‍රීකරණය කරනු ලැබේ. සාමාන්‍ය කාර්යාලීය අපද්‍රව්‍ය ආරක්ෂිතව සහ පාරිසරික වශයෙන් නිසි ලෙස හැසිරවීම සඳහා නාගරික බලධාරීන් වෙත භාර දෙනු ලැබේ. තිරසාර ලෙස ක්‍රියාත්මක වීමට අප දරන ප්‍රයත්නයන් පහත සඳහන් ක්‍රියාමාර්ග මත පදනම් වේ:



- Eco Spindles ආයතනය සමඟ එක්ව ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ හවුල්කාරිත්වය (එකතු කිරීමේ බඳුන් 20කින් සමන්විතයි).
- සහතිකලත් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන හරහා ඊ-අපද්‍රව්‍ය බැහැර කිරීම.
- ප්‍රතිචක්‍රීකරණය කරන ලද ප්ලාස්ටික් බෝතල් කිලෝග්‍රෑම් 681ක්.
- අපද්‍රව්‍ය කඩදාසි සහ පුවත්පත් නැවත භාවිතා කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම.
- කාන්තා සනීපාරක්ෂක නිෂ්පාදන සඳහා වෙන්වූ බඳුන් ලබා දීම.
- කඩදාසි භාවිතය මත යැපීම අවම කිරීම සඳහා ඩිජිටල් ක්‍රියාවලීන් පුළුල් කිරීම.

ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ මූලපිරීම

අපගේ තිරසාර ගමනේ අර්ථවත් පියවරක් ලෙස අපි Eco Spindles ආයතනය සමඟ දිගුකාලීන හවුල්කාරිත්වයකට එළඹී සිටිමු. 2025 වසරේදී, අපි ප්ලාස්ටික් බෝතල් කිලෝග්‍රෑම් 681ක් සාර්ථකව එකතු කර ගත්තෙමු.



අපගේ ප්‍රයත්නයන් අගයමින් Eco Spindles විසින් එකතු කරන ලද ප්ලාස්ටික් බෝතල් කිලෝග්‍රෑමයකට රු. 25ක මූල්‍ය දිරිගැන්වීමක් ලබා දී ඇත. තවද, අපගේ කැපවීම අගයමින් අප වෙත 'ප්‍රතිචක්‍රීකරණ සහතිකයක්' පිරිනමා ඇත. එකතුව, මෙම ප්‍රයත්නය ප්ලාස්ටික් දූෂණය අවම කිරීමට දායක වී ඇති අතර අපගේ සමීපතම ප්‍රජාව තුළ සිටින පුද්ගලයින් තමන් පරිභෝජනය කරන ප්ලාස්ටික් පිළිබඳව අවදානයෙන් යුතුව කටයුතු කිරීමට දිරිමත් කර ඇත.

පිරිසිදු බලශක්ති උත්පාදනය

බැංකුව සතු එක් ශාඛාවක සූර්ය බලශක්ති පද්ධතියක් ස්ථාපනය කර ඇති අතර, එය ශාඛාවේ අභ්‍යන්තර මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් ධාරිතාවයකින් යුක්ත වේ. දිගුකාලීනව මෙවැනිම ස්ථාපනයන් ක්‍රියාත්මක කිරීමට අප උත්සාහ කරන බැවින්, මෙය අනෙකුත් බැංකු සඳහා ආදර්ශයක් වී ඇත.

පාරිසරික තිරසාරභාවය සඳහා ඩිජිටල් සන්නිවේදනය

අභ්‍යන්තර සන්නිවේදනය සහ මෙහෙයුම් සඳහා කඩදාසි මත අප රඳා පැවතීම ඩිජිටල් සන්නිවේදනය සහ ලේඛනගත කිරීම් හේතුවෙන් සැලකිය යුතු ලෙස අඩු වී ඇත. යෝජනා කැඳවීම්, මිල ගණන්, පිරිවැය අනුමැතිය සහ ණය සහ තැන්පතු සම්බන්ධ මෙහෙයුම් සන්නිවේදනයන් දැන් ඉලෙක්ට්‍රොනිකව සිදු කෙරෙන අතර, එමඟින් කඩදාසි භාවිතය අඩු කර තැපැල් සේවා හා සම්බන්ධ විමෝචනය ද අඩු කරනු ලැබේ

ජාතික පරිසර සතිය සැමරීම

2025 වසරේදී, අපි ජාතික පරිසර සතිය සමරනු ලැබුවේ, පරිසර සංරක්ෂණයට දායක වීමේ සහ අනාගත පරපුරට ප්‍රයෝජනවත් වන පරිදි ගස් සිටුවීම වැනි දිගුකාලීන බලපෑම් ඇති කරන ස්වභාවික සම්පත් පෝෂණය කිරීමේ අරමුණින් සංවිධානය කරන ලද වැඩසටහන් මාලාවක් හරහාය.

ප්‍රාග්ධන සඛඳතා - සමාජ සහ සඛඳතා ප්‍රාග්ධනය

පාරිසරික වැඩසටහන් මගින් ප්‍රජාවන් කිහිපයක් සමඟ වැදගත් සඛඳතා ගොඩනඟා ගැනීමට සහ ඇපගේ සඛඳතා ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීමට උපකාරී වී ඇත.

වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන

වැල්ලවත්ත වෙරළ තීරයේ වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් සාර්ථකව සංවිධානය කරන ලදී. මෙයට සභාපතිතුමා, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීතුමා සහ අනෙකුත් කාර්ය මණ්ඩලය ක්‍රියාකාරීව සහභාගී වූ අතර, එය පාරිසරික ක්‍රියාකාරකම් සහ ප්‍රජා සහභාගීත්වය සඳහා බැංකුවේ නායකත්වයේ කැපවීම අවධාරණය කළේය.





පාසල් ගස් සිටුවීමේ වැඩසටහන්



වටරුක ප්‍රාථමික විද්‍යාලය:

වටරුක ප්‍රාථමික විද්‍යාලයේ ගස් සිටුවීමේ ව්‍යාපාරයක් සංවිධානය කිරීමට බැංකු කාර්ය මණ්ඩලය ක්‍රියාකාරී දායකත්වයක් ලබා දුන්නේය. සිසුන්ගේ උද්‍යෝගිමත් සහභාගීත්වයෙන් පැවති මෙම වැඩසටහනෙන් අනතුරුව පරිසර ආරක්ෂණය සහ තිරසාරභාවය පිළිබඳව සිසුන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මෙම වැඩසටහන කුඩා කල සිටම ස්වභාවධර්මය කෙරෙහි වගකීමක් ඇති කිරීමට උපකාරී විය.



ක්‍රිස්තු රාජ විද්‍යාලය - පන්නිපිටිය:


පරිසර ආරක්ෂණයෙහි ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කිරීමට සිසුන් දිරිමත් කරමින්, පන්නිපිටිය ක්‍රිස්තු රාජ විද්‍යාලයේ සිසුන් සමඟ එක්ව, බැංකුව විසින් ගස් සිටුවීමේ වැඩසටහනක් සහ පරිසර ආරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් සංවිධානය කරන ලදී.

ශාන්ත ජෝන් විද්‍යාලය - නුගේගොඩ:

පාරිසරික වශයෙන් තිරසාර භාවිතාවන්ට සහාය වීම අරමුණු කරගනිමින් සිසුන් සඳහා ගස් සිටුවීමේ වැඩසටහනක් සහ දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී.

ස්වභාවික ප්‍රාග්ධනය

මෙම වැඩසටහන්වල බලපෑම



ප්ලාස්ටික් දූෂණය පිළිබඳ ඩිජිටල් දැනුවත් කිරීමේ ව්‍යාපාරය

පරිසර දින ජාතික තේමාවට අනුකූලව, ප්ලාස්ටික් භාවිතය අඩු කිරීම, වගකීමෙන් යුතුව ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ අර්ථවත් පාරිසරික ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකුවේ සමාජ මාධ්‍ය වේදිකා හරහා අධ්‍යාපනික අන්තර්ගතයන් බෙදා හරිමින් ඩිජිටල් දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කරන ලදී.


ගෝ ග්‍රීන් ඉතුරුම් ගිණුම හඳුන්වා දීම

තිරසාර මුලපිරීම් සඳහා බැංකුවේ පවතින කැපවීම සහාය කරමින්, බැංකුව විසින් ගෝ ග්‍රීන් ඉතුරුම් ගිණුම දියත් කරන ලදී. HDFC ගෝ ග්‍රීන් ඉතුරුම් ගිණුම හරහා ගනුදෙනුකරුවන්ට ඉහළ මූල්‍ය ප්‍රතිලාභ ලබන අතරම පාරිසරික සුබසාධනය සඳහා දායක වීමට අවස්ථාව සැලසේ.

ප්‍රාග්ධන දැක්ම

ඉදිරි වසර සඳහා අවධානය යොමු කරන ප්‍රධාන ක්ෂේත්‍ර පහත දැක්වේ:

- අපද්‍රව්‍ය වර්ගීකරණය සහ ප්‍රතිචක්‍රීකරණ පද්ධති වැඩිදියුණු කිරීම.
- කඩදාසි පරිභෝජනය තවදුරටත් අඩු කිරීම සඳහා ඩිජිටල්කරණය ඉහළ නැංවීම.
- ශාඛා හරහා අමතර බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.
- තිරසාර භාවිතාවන් සඳහා කාර්ය මණ්ඩලයේ සහ ප්‍රජාවේ සහභාගීත්වය දිරිමත් කිරීම.


RIDGE LINE
ROOF PLAN
SCALE 1:100
WALL SECTION
A-A
SECOND FLOOR
DETAIL
A
B

වගවීම් රාමුව

ආයතනික පාලන රාමුව

HDFC බැංකුවේ ආයතනික පාලන රාමුව මනාව ව්‍යුහගත වී ඇති අතර, එය මූලික විෂයෙන් වගවීම, සාධාරණත්වය සහ විනිවිදභාවය යන මූලධර්ම සහ නියමයන් මත පදනම් වේ.

HDFC අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරන්නේ බැංකුවේ තිරසාරභාවය සඳහා යහපත් පාලන ක්‍රමවේදයන් බලාත්මක කිරීම අත්‍යවශ්‍ය බවයි.

2025 මූල්‍ය වර්ෂය තුළ, සමස්ත පාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා අනුකූලතාව සහ අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ උත්සාහය සහ මගපෙන්වීම ලබා දෙන ලදී.

ආයතනික පාලනය කෙරෙහි අවධානය යොමු කිරීමේදී, ඉලක්කය සපුරා ගැනීම සඳහා පහත සඳහන් ප්‍රඥප්ති, රෙගුලාසි සහ හොඳම පිළිවෙත් පිළිබඳ සමාජ සංග්‍රහයන් ඉතා සමීපව අධ්‍යයනය කරන ලදී:

i. HDFC පනත සහ එහි සියලුම සංශෝධන.

ii. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද අනිවාර්ය ආයතනික පාලන සංග්‍රහයන් සහ බැංකු පනත යටතේ අදාළ නීතිවලට අනුකූල වීම.

iii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම පිළිවෙත් සංග්‍රහය.

iv. කොළඹ කොටස් වෙළඳපොළ විසින් නිකුත් කරන ලද සංශෝධිත ලැයිස්තුගත කිරීමේ නීතිවල 9 වන වගන්තිය යටතේ පවතින අඛණ්ඩ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයන්ට අනුකූල වීම.

නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව, අපගේ ආයතනික පාලන වාර්තාව කොටස් තුනකින් සමන්විත වේ:

- **පළමු කොටස:** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සඳහා නිකුත් කරන ලද 2024 අංක 05 දරන බැංකු පනත් විධානයට අදාළ කරුණු.
- **දෙවන කොටස:** ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම පිළිවෙත් සංග්‍රහයට අදාළ කරුණු.
- **තුන්වන කොටස:** කොළඹ කොටස් වෙළඳපොළ විසින් නිකුත් කරන ලද සංශෝධිත ලැයිස්තුගත කිරීමේ නීතිවල 09 වන වගන්තිය යටතේ පවතින අඛණ්ඩ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයන්ට අදාළ කරුණු.

අපගේ ගනුදෙනුකරුවන්, අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකාරිත්ව කණ්ඩායම සහ කාර්ය මණ්ඩලය ඉහළම මට්ටමින් හොඳම ආයතනික පාලන පිළිවෙත්වලට අනුකූල වෙමින්, අපගේ උපායමාර්ගික සැලැස්මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එක්ව කටයුතු කර ඇත.

ප්‍රාදේශීය මහ බැංකුවේ ආයතනික පාලන විධානයන්ට බැංකුවේ අනුකූලතාව පිළිබඳව බාහිර විගණකවරයා විසින් සමාලෝචනයක් සිදු කරන ලදී. "ශ්‍රී ලංකා ප්‍රමිතිය ඔස්සේ අදාළ සේවා පිළිවෙත් ප්‍රකාශය 4400" යටතේ නිකුත් කරන ලද විගණකවරුන්ගේ සත්‍ය සොයාගැනීම් වාර්තාවේ සියලුම සොයාගැනීම් මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

HDFC බැංකුව සිය නායකත්වය සහ වගවීම සඳහා අනුගමනය කරන ප්‍රබල නියාමන සහ පාලන ක්‍රමවේදයන් නිසා අභියෝග ජයගැනීම අඛණ්ඩව සිදු කරයි. පහත විස්තරය මඟින් 2024 අංක 05 දරන බැංකු පනත් විධානය සහ පාලනය පිළිබඳ කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීමේ නීතිවලට අදාළව වඩාත්ම වැදගත් පාලන කටයුතු සහ මාතෘකා පිළිබඳ විස්තර සපයයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද හොඳම පිළිවෙත් සංග්‍රහයට අනුකූල වීම සහ එය අනුගමනය කිරීම පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 157 සිට 167 දක්වා පිටුවල සවිස්තරාත්මකව දක්වා ඇත.

2025 වසර සඳහා පාලනයට අදාළ විශේෂ අවස්ථා

- නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම වළක්වා ගැනීම සඳහා අවශ්‍ය සෑම අවස්ථාවකදීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකම්ටු නැවත ප්‍රතිසංස්කරණය කිරීම.
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුවක් ස්ථාපනය කිරීම.
- ණය අවදානම් කළමනාකරණ කමිටුවක් ස්ථාපනය කිරීම.
- නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි පහත සඳහන් අභ්‍යන්තර ප්‍රතිපත්ති, අත්පොත් සහ කාර්යයන් පිළිබඳ විමර්ශන පත්‍ර සමාලෝචනය කිරීම:
  - » ආයතනික කළමනාකරණ කමිටුවේ කාර්යයන් පිළිබඳ විමර්ශන පත්‍රය (TOR)
  - » HDFC තිරසාර ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම
  - » විගණන අත්පොත සමාලෝචනය කිරීම
  - » ණය සමාලෝචන ප්‍රතිපත්තිය
  - » බැංකු මට්ටමින් අනුකූලතා අවදානම් තක්සේරුව
  - » අනුකූලතා ප්‍රතිපත්තිය
  - » වත්කම් සහ බැරකම් කමිටුවේ කාර්යයන් පිළිබඳ විමර්ශන පත්‍රය

අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම (මූලධර්ම A.1.3)

බැංකු අංශයට අදාළ නීති සහ බැංකුව ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත සංස්ථාවක් ලෙස පිහිටුවා ඇති නීති (ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත - මුලින් 1997 අංක 7 දරන පනත, පසුව 2003 අංක 15 සහ 2011 අංක 45 දරන පනත් මඟින් සංශෝධිත) අනුව බැංකුව කටයුතු කරන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කර ඇත.

බැංකු මෙහෙයුම් සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සියලුම බැංකු සහ මූල්‍ය නීති සහ රෙගුලාසි, පාලන මාර්ගෝපදේශ සහ අනෙකුත් මෙහෙයුම් ක්‍රියා පටිපාටි සමඟ ගැලපෙන බවට සහ අනුකූල වන බවට සහතික කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. තවද, අවශ්‍ය විටෙක ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට හැකියාව ඇත.

බැංකුව පහත සඳහන් නියාමන රාමුවලට අනුකූල වන අතර විවිධ ව්‍යවස්ථාපිත නියෝග මඟින් පාලනය වේ.

වර්ගය	අවශ්‍යතාවය / මූලාශ්‍රය	2025 වාර්ෂික වාර්තාවේ යොමු කිරීම්
අනිවාර්ය	1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත (2003 සංශෝධිත පරිදි)	
අනිවාර්ය	බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනත් විධානයන්	119 සිට 156 දක්වා පිටු (අනුකූලතා තත්ත්වය)*
අනිවාර්ය	කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීමේ නීති	168 සිට 174 දක්වා පිටු (අනුකූලතා තත්ත්වය)*
අනිවාර්ය	ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ	
අනිවාර්ය	ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කරන ලද වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන	220 සිට 290 දක්වා පිටු
ස්වේච්ඡා	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මඟින් නිකුත් කරන ලද හොඳම පිළිවෙත් සංග්‍රහය	157 සිට 167 දක්වා පිටු (අනුකූලතා තත්ත්වය)*
ස්වේච්ඡා	පාලන කැපවීම් ගෙනහැර දක්වන අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය	අදාළ පරිදි අනුකූල වී ඇත

*අනුකූලතා සහ අනුකූල නොවන තත්ත්වයන් හෙළිදරව් කර ඇත.

2025 වසරේදී හඳුන්වා දුන් නව නීති

- 2025 අප්‍රේල් 10 දින සිට ක්‍රියාත්මක වන කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීමේ නීති ප්‍රකාරව ආයතනික පාලන අවශ්‍යතා සහ බලාත්මක කිරීම්.
- අදාළ පාර්ශ්වීය ගනුදෙනු සහ ප්‍රතිලාභී හිමිකාරිත්ව නිර්ණායක තීරණය කිරීම පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකු විධානයන් බලාත්මක කිරීමට නියමිතය.

ආයතනික පාලන රාමුව

ආයතනික පාලන ව්‍යුහය


1. පාලන රාමුව

HDFC බැංකුවේ පාලන ව්‍යුහය හැඩගැසී ඇත්තේ පාලන හොඳම පිළිවෙත් පිළිබඳ මාර්ගෝපදේශ මගින් වන අතර, එය ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ අඛණ්ඩව යාවත්කාලීන වන නියාමන අවශ්‍යතා මගින් පාලනය වේ. මෙය බැංකු නායකත්වය, මධ්‍යම කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය අනුකූලතාව සහ වගවීම වෙත යොමු කිරීම අනිවාර්ය කර ඇති අතර, බැංකු අංශයේ දැඩි නියාමන පරිසරයට අනුකූල වන පරිදි ඔවුන්ගේ ක්‍රියාවලීන් සහ වැඩ කටයුතු පෙළගස්වා ගැනීමට සෑම මට්ටමකම සිටින පුද්ගලයින් ස්වාධීනව කැප වී සිටී.

වර්ධනය වන නියාමන සම්මතයන් සහ කර්මාන්ත ප්‍රමිතීන්, සෑම වසරකම පාහේ බැංකුවේ නායකත්වය, අධිකාරිය සහ සමස්ත පාලන විධිවිධාන පෙළගැස්වීමේදී ඉහළ අවධානයකට ලක් කෙරේ.

තවද, තීරණ ගැනීමේ ක්‍රියාවලීන් නියාමන අනුකූලතාව නොසලකා හැරීමකින් තොරව, සදාචාරාත්මකව සහ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන පරිදි පවත්වා ගැනීම සඳහා HDFC බැංකුව තුළ අවධානම් කළමනාකරණය සහ ආයතනික පාලනය විකිනෙක අත්වැල් බැඳගෙන ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යුහයේ ස්ථරවලට අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිවරයා/සභාපතිනිය විසින් මෙහෙයවනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය (උත්තරීතර ආයතනය), කළමනාකරණ කමිටු, සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම ඇතුළත් වේ.



2. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සහ ව්‍යුහය

අධ්‍යක්ෂ මණ්ඩලය යනු HDFC බැංකුවේ උත්තරීතර පාලන අධිකාරිය වන අතර, උපායමාර්ගික තීරණ ගැනීම සහ මහ බැංකුවේ සහ රාජ්‍ය රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා ඔවුන් වගකිව යුතුය.

2.1 අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

2025 දෙසැම්බර් 31 දින වන විට, අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකුගෙන් සමන්විත විය. මෙම අධ්‍යක්ෂවරුන් අතරින් 05 දෙනෙක් ස්වාධීන අධ්‍යක්ෂවරුන් වූ අතර, 02 දෙනෙක් ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් වූහ.

නම	31/12/2025 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ තත්ත්වය
පී. ජේ. ජයසිංහ මහතා (30.11.2025 දින විශ්‍රාම ගියේය)	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂ, මණ්ඩලයේ සභාපති
ආචාර්ය පී. ඒ. ක්‍රිශාන්ත මහතා	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂ
කේ. බී. විජයරත්න මහතා	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂ
ඒ. එන්. හපුගල මහතා (31.01.2025 දින පත් කරන ලදී)	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂ
ජේ. එම්. පී. එස්. කෞශල්‍ය මහතා (23.06.2025 දින පත් කරන ලදී)	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂ
කේ. කේ. ජී. ප්‍රේමතිලක මහත්මිය (18.07.2025 දින පත් කරන ලදී)	විධායක නොවන / ස්වාධීන නොවන අධ්‍යක්ෂ
එස්. එස්. එස්. නන්දනී මහත්මිය (03.11.2025 දින පත් කරන ලදී)	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂ
ජේ. කේ. ඒ. සිරිනාථ මහතා (21.11.2025 දින පත් කරන ලදී)	විධායක නොවන / ස්වාධීන නොවන අධ්‍යක්ෂ
ඩබ්ලිව්. එන්. අයි. සී. ප්‍රනාන්දු මහතා (23.06.2025 දින ඉල්ලා අස්විය)	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂ
ඩබ්ලිව්. එම්. ආනන්ද මහතා (10.08.2025 දින විශ්‍රාම ගියේය)	විධායක නොවන / ස්වාධීන නොවන අධ්‍යක්ෂ
පී. ඒ. ලයනල් මහතා (31.01.2025 දින විශ්‍රාම ගියේය)	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂ
එච්. කේ. කේ. ඒ. ජයසුන්දර මහතා (21.03.2025 දින ඉල්ලා අස්විය)	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂ

2025 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්කම්

වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පස් දෙනෙකු පත් කරන ලදී. එසේම, අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු විශ්‍රාම යාම, එක් අයෙකු ඉල්ලා අස්වීම සහ එක් අයෙකු නැවත තේරී පත්වීම සිදුවිය.

අධ්‍යක්ෂකගේ නම	පත් කළ දිනය	විශ්‍රාම දිනය	ඉල්ලා අස්වූ දිනය	සේවය අවසන් වීම	නැවත තේරී පත් වීම
ඒ. එන්. හපුගල මහතා (අධ්‍යක්ෂ)	31/01/2025	-	-	-	-
ජේ. එම්. පී. එස්. කෞශල්‍ය මහතා (අධ්‍යක්ෂ)	23/06/2025	-	-	-	-
කේ. කේ. ජී. ප්‍රේමතිලක මහත්මිය (අධ්‍යක්ෂ)	18/07/2025	-	-	-	-
එස්. එස්. එස්. නන්දනී මහත්මිය (අධ්‍යක්ෂ)	03/11/2025	-	-	-	-
ජේ. කේ. ඒ. සිරිනාථ මහතා (අධ්‍යක්ෂ)	21/11/2025	-	-	-	-
පී. ඒ. ලයනල් මහතා (අධ්‍යක්ෂ)	-	31/01/2025	-	-	-
ඩබ්ලිව්. එම්. ආනන්ද මහතා (අධ්‍යක්ෂ)	-	10/ 08/2025	-	-	-

අධ්‍යක්ෂකගේ නම	පත් කළ දිනය	විශ්‍රාම දිනය	ඉල්ලා අස්වූ දිනය	සේවය අවසන් වීම	නැවත තේරී පත් වීම
පී. ජේ. ජයසිංහ මහතා (අධ්‍යක්ෂ සහ සභාපති)	-	30/11/2025	-	-	-
එච්. කේ. කේ. ඒ. ජයසුන්දර මහතා (අධ්‍යක්ෂ)	-	-	-	21/03/2025	-
ඩබ්ලිව්. එන්. අයි. සී. ප්‍රනාන්දු මහතා	-	-	23/06/2025	-	-
ආචාර්ය පී. ඒ. ක්‍රිශාන්ත මහතා (අධ්‍යක්ෂ)	-	-	-	-	30/06/2025

2.2 අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු

බැංකුවේ පාලන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා විගණන, අවදානම්, මානව සම්පත් සහ වැටුප්, නාම යෝජනා සහ පාලන කමිටු ඇතුළු කමිටු ව්‍යුහගත කර ඇත. විශේෂිත අධීක්ෂණය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තීර්ණ කොටස් ලෙස මෙම කමිටු පහ ක්‍රියාත්මක වේ. සෑම අනුකමිටුවක් සඳහාම අදාළ අරමුණ, ව්‍යවස්ථාව, සංයුතිය, පැමිණීම, ගණපූර්ණය සහ වාර්තා තබා ගැනීමේ වගකීම් ඇතුළත් විමර්ශන පත්‍ර පවතී. (වැඩිදුර තොරතුරු සඳහා 194 සිට 207 දක්වා පිටු බලන්න).

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටු රැස්වීම් - 2025 රැස්වීම් ගණන අදාළ වේ

නම	31/12/2025 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ තත්ත්වය	2025 දී පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව	නියාමන අවශ්‍යතා/ අදාළ රැස්වීම් සංඛ්‍යාව	සහභාගී වූ රැස්වීම්
ආචාර්ය පී. ඒ. ක්‍රිශාන්ත *(Appointed to committee Chairman 29.01.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක කමිටු සභාපති)	10	10	10
ඒ. එන්. හපුගල මහතා *(Appointed to the committee on 20.03.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	10	08	08
කේ. කේ. ජී. ප්‍රේමතිලක මහත්මිය *(Appointed to committee on 11.08.2025)*	විධායක නොවන / ස්වාධීන නොවන අධ්‍යක්ෂක	10	05	04
එස්. එස්. එස්. නන්දනී මහත්මිය *(Appointed to committee on 26.11.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	10	03	02
ඩබ්ලිව්. එම්. ආනන්ද මහතා *(Retired from Board on 10.08.2025)*	විධායක නොවන / ස්වාධීන නොවන අධ්‍යක්ෂක	10	05	05
එච්. කේ. කේ. ඒ. ජයසුන්දර මහතා *(Resigned from Board on 21.03.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	10	02	02

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටු රැස්වීම් 2025

නම	31/12/2025 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ තත්ත්වය	2025 දී පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව	නියාමන අවශ්‍යතා/ අදාළ රැස්වීම් සංඛ්‍යාව	සහභාගී වූ රැස්වීම්
ඒ. එන්. හපුගල මහතා *(Appointed to committee on 24.03.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක කමිටු සභාපති)	10	10	10
කේ. බී. විජයරත්න මහතා *(Appointed to committee on 25.09.2024)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	10	08	08
කේ. කේ. ජී. ප්‍රේමතිලක මහත්මිය *(Appointed to committee on 11.08.2025)*	විධායක නොවන / ස්වාධීන නොවන අධ්‍යක්ෂක	10	05	04
ඩබ්ලිව්. එම්. ආනන්ද මහතා *(Retired from Board on 10.08.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	10	03	02
එච්. කේ. කේ. ඒ. ජයසුන්දර මහතා *(Resigned from Board on 21.03.2025)*	විධායක නොවන / ස්වාධීන නොවන අධ්‍යක්ෂක	10	05	05

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් - 2025

නම	31/12/2025 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ තත්ත්වය	2025 දී පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව	නියාමන අවශ්‍යතා/ අදාළ රැස්වීම් සංඛ්‍යාව	සහභාගී වූ රැස්වීම්
ජේ. එම්. පී. එස්. කෞශල්‍ය මහතා *(Appointed to committee on 26.06.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක (කමිටු සභාපති)	07	03	03
ආචාර්ය පී. ඒ. ක්‍රිශාන්ත මහතා	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	07	07	06
කේ. බී. විජයරත්න මහතා *(Appointed to committee on 25.09.2024)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	07	07	07
කේ. කේ. පී. ප්‍රේමතිලක මහත්මිය *(Appointed to committee on 11.08.2025)*	විධායක නොවන / ස්වාධීන නොවන අධ්‍යක්ෂක	07	02	02
ජේ. කේ. ඒ. සිරිනාථ මහතා *(Appointed to committee on 26.11.2025)*	විධායක නොවන / ස්වාධීන නොවන අධ්‍යක්ෂක	07	01	01
පී. ජේ. ජයසිංහ මහතා *(Appointed to Committee 09.05.2025 and Committee restructure on 26.11.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	07	04	04
පී. ඒ. ලයනල් මහතා *(Retired from Board on 31.01.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	07	01	01
ඩබ්ලිව්. එන්. අයි. සී. ප්‍රනාන්දු මහතා *(Resigned from Board 23.06.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	07	04	03

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් - 2025

නම	31/12/2025 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ තත්ත්වය	2025 දී පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව	නියාමන අවශ්‍යතා/ අදාළ රැස්වීම් සංඛ්‍යාව	සහභාගී වූ රැස්වීම්
කේ. බී. විජයරත්න මහතා *(Appointed to committee on 25.09.2024)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක (කමිටු සභාපති)	15	15	15
ඒ. එන්. හපුගල මහතා *Appointed to committee on 24.03.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	15	10	10
ජේ. එම්. පී. එස්. කෞශල්‍ය මහතා *(Appointed to committee on 26.06.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	15	08	08
එස්. එස්. එස්. නන්දනී මහත්මිය *Appointed to committee on 26.11.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	15	01	01
ඩබ්ලිව්. එන්. අයි. සී. ප්‍රනාන්දු මහතා *(Resigned from Board 23.06.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	15	07	07
පී. ඒ. ලයනල් මහතා *(Retired from Board on 31.01.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	15	01	01
ආචාර්ය පී. ඒ. ක්‍රිශාන්ත මහතා *(Reconstitution of the committee on 09.05.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	15	04	04

අධ්‍යක්ෂ මණ්ඩල අදාළ පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටු රැස්වීම් - 2025

නම	31/12/2025 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ තත්ත්වය	2025 දී පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව	නියාමන අවශ්‍යතා/ අදාළ රැස්වීම් සංඛ්‍යාව	සහභාගී වූ රැස්වීම්
කේ. බී. විජයරත්න මහතා	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක (කමිටු සභාපති)	05	05	05
ආචාර්ය පී. ඒ. ක්‍රිශාන්ත මහතා	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	05	05	05
කේ. කේ. ජී. ප්‍රේමතිලක මහත්මිය *(Appointed to committee on 11.08.2025)*	විධායක නොවන / ස්වාධීන නොවන අධ්‍යක්ෂක	05	03	03
එස්. එස්. එස්. නන්දනී මහත්මිය *(Appointed to committee on 26.11.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	05	01	01
ඩබ්ලිව්. එම්. ආනන්ද මහතා *(Retired from Board on 10.08.2025)*	විධායක නොවන / ස්වාධීන නොවන අධ්‍යක්ෂක	05	02	02
ඩබ්ලිව්. එන්. අයි. සී. ප්‍රනාන්දු මහතා *(Resigned from Board 23.06.2025)*	විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක	05	02	02

4. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම්

4.1 අධ්‍යක්ෂ මණ්ඩලය (මූලධර්ම A.1)

බැංකුවේ උත්තරීතර පාලන ආයතනය ලෙස ක්‍රියා කරන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය වන්නේ උපායමාර්ගික මඟපෙන්වීමක් ලබා දීමයි. බැංකුවේ මෙහෙවර සහ අගයන් සමඟ එකඟව කටයුතු කරන අතරම, තම කොටස් හිමියන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ දිගුකාලීන අවශ්‍යතා ආරක්ෂා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. බැංකුවේ ප්‍රධාන ප්‍රමුඛතා නිර්වචනය කිරීමට සහය වෙමින්, අධ්‍යක්ෂ මණ්ඩලය වසර පුරා මඟපෙන්වීමේ භූමිකාවක් ඉටු කළේය. අවදානම් තත්ත්වයන් ප්‍රතික්‍රියාශීලී නොවී, විචක්ෂණශීලීව සහ ක්‍රියාශීලීව කළමනාකරණය කරන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. එසේම, සේවකයින්ගේ, ගනුදෙනුකරුවන්ගේ සහ සමස්ත ප්‍රජාවේ විශ්වාසය පවත්වා ගැනීම සඳහා සදාචාරාත්මකව, වගකීමෙන් සහ අවංකභාවයෙන් යුතුව ක්‍රියා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා කෙරේ.

- අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීම්වලට ඉහළ මට්ටමේ මඟපෙන්වීම සහ අධීක්ෂණය ඇතුළත් වේ:
- උපායමාර්ගික දිශානතිය සහ සංස්කෘතිය: දිගුකාලීන උපායමාර්ග නිර්වචනය කිරීම, ප්‍රධාන ප්‍රතිපත්ති අනුමත කිරීම සහ යහපත් ආයතනික සංස්කෘතියක් ගොඩනැගීම.
- කාර්යසාධන අධීක්ෂණය: බැංකු මූල්‍ය කටයුතු සදාචාරාත්මකව සහ විනිවිදභාවයෙන් කළමනාකරණය කිරීම, ස්ථාවර කාර්යසාධනයක් පවත්වා ගැනීම සහ ඉලක්ක සපුරා ගැනීම සඳහා වගවීම.
- වගවීම: ක්‍රියාවන්හි අවංකභාවය සහතික කිරීම සහ කොටස් හිමියන්, තැන්පත්කරුවන් සහ පාර්ශ්වකරුවන්ගේ උපරිම අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කිරීම.
- කළමනාකරණ මඟපෙන්වීම: ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට මඟපෙන්වීම සහ අනවශ්‍ය බලතල පැවරීම වැළැක්වීම සඳහා බලය සමතුලිත කිරීම.
- අභිලාෂයන් ආරක්ෂා කිරීම: නුසුදුසු බලපෑම්වලින් බැංකුව ආරක්ෂා කිරීම සහ පාර්ශ්වකරුවන්ගේ සහ කොටස් හිමියන්ගේ නීත්‍යානුකූල අභිලාෂයන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විටෙක මැදිහත් වීම.
- මූල්‍ය මෙහෙයුම්: ණය ලබා දීම, ආයතනික අරමුදල් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සහ බැංකුවේ ස්ථාවරත්වය සහ වර්ධනය සඳහා ප්‍රාග්ධනය රැස් කිරීමේ අධිකාරිය. වත්කම් අත්පත් කර ගැනීම, බැහැර කිරීම සහ වාණිජ ගිවිසුම්වලට එළඹීමේ බලය.
- අධිකාරියේ සීමාව: දෛනික මෙහෙයුම් කටයුතුවල නිරත නොවීම.

4.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

බැංකුවේ කාර්යසාධනය සමාලෝචනය කිරීමට, අවදානම් තක්සේරු කිරීමට සහ දැනුවත් තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපතා රැස්වේ.

නම	31/12/2025 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ තත්ත්වය	2025 දී පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව	නියාමන අවශ්‍යතා/ අදාළ රැස්වීම් සංඛ්‍යාව	සහභාගී වූ රැස්වීම්
පී. ජේ. ජයසිංහ මහතා *(Retired from Board on 30.11.2025)*	(සභාපති) විධායක නොවන / ස්වාධීන	20	18	18
ආචාර්ය පී. ඒ. ක්‍රිශාන්ත මහතා	විධායක නොවන / ස්වාධීන	20	20	19
කේ. බී. විජයරත්න මහතා	විධායක නොවන / ස්වාධීන	20	20	20
ඒ. එන්. හපුගල මහතා *(Appointed to Board on 31.01.2025)*	විධායක නොවන / ස්වාධීන	20	19	18
ජේ. එම්. පී. එස්. කෞශල්‍ය මහතා *(Appointed to Board on 23.06.2025)*	විධායක නොවන / ස්වාධීන	20	12	12
කේ. කේ. ජී. ප්‍රේමතිලක මහත්මිය *(Appointed to Board on 18.07.2025)*	විධායක නොවන / ස්වාධීන නොවන	20	10	09
එස්. එස්. එස්. නන්දනී මහත්මිය *(Appointed to Board on 03.11.2025)*	විධායක නොවන / ස්වාධීන	20	05	05
ජේ. කේ. ඒ. සිරිනාථ මහතා *(Appointed to Board on 21.11.2025*	විධායක නොවන / ස්වාධීන නොවන	20	03	03
ඩබ්ලිව්. එන්. අයි. සී. ප්‍රනාන්දු මහතා *(Resigned from Board 23.06.2025)*	විධායක නොවන / ස්වාධීන	20	08	07
ඩබ්ලිව්. එම්. ආනන්ද මහතා *(Retired from Board on 10.08.2025)*	විධායක නොවන / ස්වාධීන නොවන	20	11	11
පී. ඒ. ලයනල් මහතා *(Retired from Board on 31.01.2025)*	විධායක නොවන / ස්වාධීන	20	01	01
එච්. කේ. කේ. ඒ. ජයසුන්දර මහතා *(Resigned from Board on 21.03.2025)*	විධායක නොවන / ස්වාධීන	20	02	01

4.3 ස්වාධීන විනිශ්චය (මූලධර්ම A.1.5)

ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩලයේ විෂය පථයට යටත් වන කරුණු සම්බන්ධයෙන් තම රාජකාරී සහ වගකීම් ඉටු කිරීමේදී HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන විනිශ්චයක් ලබා දෙයි.

4.4 කාලය කැප කිරීම (මූලධර්ම A.1.6)

අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අනුකමිටුවලට අදාළ ලේඛන අධ්‍යක්ෂවරුන්ට කල්තියා යොමු කරනු ලබන අතර, එමගින් ඔවුන්ගේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දේ.

4.5 පුහුණුව සහ සංවර්ධනය (මූලධර්ම A.1.7)

- වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී:
- කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීමේ නීතිවලට කරන ලද සංශෝධන පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහනක්.
- HDFC බැංකුවට අදාළ වන ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ වෙනත් නියාමන ප්‍රතිසංස්කරණ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම.
- CBS සහ AML (මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ) පද්ධති ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ ඉදිරිපත් කිරීමක්.
- තොරතුරු ආරක්ෂණ පාලනය පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

4.6 සාමූහික කුසලතා සහ විශේෂඥතාව

සාමාජිකයා	අත්දැකීම් (වසර)	විශේෂඥ ක්ෂේත්‍ර	ීැ
ආචාර්ය පී. ඒ. ක්‍රිශාන්ත	වසර 22ක්	ව්‍යාපාර මෙහෙයුම් සහ උපායමාර්ගික කළමනාකරණය අලෙවිකරණය තොරතුරු තාක්ෂණය	වසර 43ක්
කේ. බී. විජයරත්න මහතා	වසර 42ක්	වරලත් ගණකාධිකාරී	වසර 65ක්
ඒ. එන්. හපුගල මහතා	වසර 35ක්	භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය, ගිණුම්කරණය	වසර 59ක්
ජේ. එම්. පී. එස්. කෞශල්‍ය මහතා	වසර 34ක්	මූල්‍ය සැලසුම්කරණය සහ වාර්තාකරණය, වරලත් ගණකාධිකාරී	වසර 59ක්
කේ. කේ. ජී. ප්‍රේමතිලක මහත්මිය	වසර 19ක්	නීතිඥ	වසර 51ක්
එස්. එස්. එස්. නන්දනී මහත්මිය	වසර 23ක්	රාජ්‍ය මූල්‍ය ගිණුම්කරණය	වසර 49ක්
ජේ. කේ. ඒ. සිරිනාථ මහතා	වසර 41ක්	ගිණුම්කරණය සහ පරිපාලනය, අලෙවිකරණය	වසර 67ක්
ආර්. ඒ. එස්. රණවක මහතා	වසර 31ක්	සිවිල් ඉංජිනේරු විද්‍යාව	වසර 55ක්

5. නායකත්ව භූමිකාවන්

5.1 සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී

ඇමෙම ඉහළ පෙළේ නායකයින් දෙදෙනාගේ භූමිකාවන් පැහැදිලිව නිර්වචනය කර ඇත. සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි. ප්‍රධාන විධායක නිලධාරීවරයා බැංකුවේ දෛනික කළමනාකරණය සහ මෙහෙයුම් සඳහා වගකිව යුතු ඉහළම විධායක නායකයා ලෙස ක්‍රියා කරයි.

වගකීම් සහ බලතල මෙම ආකාරයෙන් බෙදා වෙන් කිරීම මගින් බලය එක් පුද්ගලයෙකු අත පමණක් සංකේන්ද්‍රණය වීම වැළැක්වේ.

5.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම

බැංකු පනත් විධානය අංක 05 (2024) ට අමතරව, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ගණපූර්ණය නිර්වචනය කර ඇත.

සභාපතිවරයා විසින් සමාගම් ලේකම්වරයා සමඟ සාකච්ඡා කර න්‍යාය පත්‍රය සකස් කිරීමේ වගකීම දරයි. ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට කරුණු සහ යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හැකිය.

සාකච්ඡා කළ මාතෘකා, ප්‍රධාන අනුමැතීන් සහ තීරණ	තත්ත්වය
නියාමකයින් වෙත නිකුත් කරන ලද හෙළිදරව් කිරීම් සහ නිවේදන	අවශ්‍ය පරිදි සාකච්ඡා කරන ලදී
HDFC බැංකුවේ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීම	සම්පූර්ණ කරන ලදී
2025 ව්‍යාපාර සංවර්ධන සහ අලෙවිකරණ සැලැස්ම	අනුමත කර ක්‍රියාත්මකයි
HDFC බැංකුවේ අවදානම් සහ පාලන ස්වයං-තක්සේරුව	අනුමත කර ක්‍රියාත්මකයි
මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාපටිපාටිය	අනුමත කර ක්‍රියාත්මකයි
2025 භාණ්ඩාගාර ප්‍රතිපත්තිය	අනුමත කර ක්‍රියාත්මකයි
භාණ්ඩාගාර මෙහෙයුම් සඳහා චර්යාධර්ම සංග්‍රහය	අනුමත කර ක්‍රියාත්මකයි
අනුකූලතා ප්‍රතිපත්තිය	අනුමත කර ක්‍රියාත්මකයි
ආපදා ප්‍රතිසාධන සැලැස්ම	අනුමත කර ක්‍රියාත්මකයි
නිෂ්පාදන සංවර්ධන යෝජනා සහ නව නිෂ්පාදන ලාංඡන	අනුමත කර ක්‍රියාත්මකයි
අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය ඇගයීම් ලේඛනය 2025	අනුමත කර ක්‍රියාත්මකයි
අනුකූලතා අත්පොත: බැංකුවේ අනුකූලතා කාර්යභාරය සඳහා ක්‍රියාපටිපාටි නිර්වචනය කිරීමේ රාමුව	අනුමත කර ක්‍රියාත්මකයි
ගබඩා කළමනාකරණය පිළිබඳ අත්පොත	අනුමත කර ක්‍රියාත්මකයි
2024 කාර්යසාධන ඇගයීම - ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්	අනුමත කරන ලදී

5.3 සමාගම් ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා නිසි ක්‍රියාපටිපාටි පවතින බව සමාගම් ලේකම්වරයා විසින් සහතික කරනු ලබන අතර, රැස්වීම්වල සිදුවීම් පිළිබඳව නිවැරදි සහ විස්තරාත්මක වාර්තා පවත්වාගෙන යාමෙහි වගකීම ඔහු/ඇය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි අනුකමිටු සම්බන්ධ පාලන කටයුතු පිළිබඳව මණ්ඩලයට උපදෙස් ලබා දීම සඳහා සමාගම් ලේකම්වරයා වගකිව යුතුය. සියලුම අධ්‍යක්ෂවරුන්ට ඔහු/ඇයව සම්බන්ධ කර ගැනීමට හැකි වන අතර, වාර්ෂික සහ අතිවිශේෂ මහා සභා රැස්වීම්වල නිසි සන්නිවේදනය සහ සම්බන්ධීකරණය සහතික කරනු ලැබේ. එසේම, අනුකූලතා කටයුතු සහතික කිරීම සඳහා අදාළ නියාමන ආයතන සමඟ සන්නිවේදනය ද ඔහු/ඇය විසින් සිදු කරනු ලබයි.

6. අධ්‍යක්ෂ මණ්ඩල කාර්යක්ෂමතාව

6.1 අධ්‍යක්ෂ මණ්ඩල සමතුලිතතාවය

2024 අංක 05 දරන බැංකු පනත් විධානයට අනුව, 2025 අවසානය වන විට HDFC අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ඔවුන්ගෙන් බහුතරයක් (100%) විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.

HDFC පනතට අනුව, නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරුන් (නිවාස අමාත්‍යාංශයෙන් සහ භාණ්ඩාගාරයෙන්), නම් කරන ලද අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන් විසින් තෝරා පත් කර ගන්නා ලද අධ්‍යක්ෂවරුන්ගෙන් මණ්ඩලය සමන්විත වේ. මෙය රාජ්‍ය අධීක්ෂණය සහ පෞද්ගලික කොටස් හිමියන්ගේ අවශ්‍යතා අතර සමතුලිතතාවයක් සහතික කරයි.

ස්වාධීනත්වය: නව මහ බැංකු මාර්ගෝපදේශවලට අනුව, 2027 ජනවාරි 01 වන විට අවම වශයෙන් 50%ක ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් මණ්ඩලයට පත් කිරීමට HDFC බැංකුව කටයුතු කරමින් සිටී. මෙහිදී ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස සැලකීමට නම්, ඔහු/ඇය වසර 9කට වඩා සේවය කර නොතිබිය යුතු අතර, පසුගිය වසර දෙක තුළ බැංකුව සමඟ කිසිදු භෞතික ව්‍යාපාරික සබඳතාවක් නොතිබිය යුතුය.

පරීක්ෂා කිරීම් සහ සමතුලිතතාවය: බලතල බෙදා හැරීම මගින් සමතුලිතතාවයක් පවත්වා ගැනීමට උත්සාහ කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස:

- සභාපති සහ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී යන භූමිකාවන් වෙන වෙනම පවතී.
- සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.
- අනුකමිටු සඳහා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් නායකත්වය ලබා දෙයි.

විවිධත්වය: මණ්ඩලය තුළ කාන්තා අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සිටින අතර, එය මණ්ඩලයේ සංයුතිය සහ සමතුලිතතාවය සහතික කරයි. විවිධත්වය සහ ඇතුළත් කිරීම් හරහා සියලුම පාර්ශ්වකරුවන්ගේ අභිලාෂයන් වෙනුවෙන් බැංකුව සිය තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කර ඇත.

6.2 තොරතුරු සැපයීම

ආයතනික පාලනය පිළිබඳ බැංකු පනත් විධානයට අනුව, නියමිත වේලාවට නිවැරදි තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දීමට බැංකු කළමනාකාරිත්වය නීත්‍යානුකූලව බැඳී සිටී.

- ලේඛන බෙදා හැරීම: අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පත්‍රිකා සහ න්‍යාය පත්‍ර අවම වශයෙන් වැඩ කරන දින 5කට පෙර බෙදා හැරිය යුතුය.
- කළමනාකාරිත්වයේ වගකීම: ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම විසින් තොරතුරු සම්පූර්ණයෙන් හෙළිදරව් කළ යුතුය. අවදානම්, අයවැය විචලනයන් සහ නියාමන අනුකූලතා තත්ත්වයන් වැනි ප්‍රමාණවත් දත්තවලින් සහාය ලබන තීරණ ගැනීමට ඔවුන් බැංකුවට සහාය විය යුතුය.
- උපදෙස්: දැනුවත් තීරණ ගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් තොරතුරු කළමනාකාරිත්වය විසින් ලබා නොදෙන්නේ නම්, බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට හැකියාව ඇත.
- සමාගම් ලේකම්: තොරතුරු හුවමාරු කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම, තොරතුරු වෙත සමාන ප්‍රවේශයක් සහ කළමනාකාරිත්වයට ප්‍රවේශය සහතික කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම සහතික කිරීම ඔහු/ඇයගේ වගකීම වේ.
- අවදානම් හෙළිදරව් කිරීම්: කාලෝචිත, සම්පූර්ණ අවදානම් රුචිකත්ව ප්‍රකාශයක් සහ නීතිපතා අවදානම් පැතිකඩයන් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ලබා දීම බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරියාගේ වගකීම වේ.
- ඩිජිටල් තොරතුරු: බැංකුවේ තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ සිදුවීම් පිළිබඳ තොරතුරු නියමිත කාලරාමුව තුළ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැපයීමට HDFC බැංකුව බැඳී සිටී.

6.3 අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම්

පත් කිරීමේ ක්‍රියාවලිය:

අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම 1997 අංක 7 දරන HDFC බැංකු පනතට අනුව පාලනය වේ.

6.4 නැවත තේරී පත් වීම

කාර්යසාධන ඇගයීම්, පළපුරුද්ද සහ දායකත්වයන් මත පදනම්ව, මෙන්ම සුදුසුකම් සහ නියාමන නිර්ණායකවලට අනුකූලව සෑම වසර තුනකට වරක් අධ්‍යක්ෂවරුන් නැවත තේරී පත් වේ.

6.5 අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධන ඇගයීම

නාම යෝජනා සහ පාලන කමිටුව විසින් අධ්‍යක්ෂවරුන් සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සඳහා වරින් වර කාර්යසාධන ඇගයීම් සිදු කරනු ඇත.

6.6 අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු හෙළිදරව් කිරීම

කුසලතා, පළපුරුද්ද සහ සුදුසුකම් ඇතුළු අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු 44 සිට 51 දක්වා පිටුවල ඇති 'අධ්‍යක්ෂ මණ්ඩල පැතිකඩ'වල සවිස්තරාත්මකව දක්වා ඇත. පත් කළ දින සහ රැස්වීම්වලට සහභාගී වීම් මෙම වාර්තාවේ හෙළිදරව් කර ඇත.

7. වැටුප් සහ කොටස් හිමියන්ගේ සබඳතා

පහත දැක්වෙන්නේ බැංකුවේ වැටුප් ප්‍රතිපත්තිය සහ කොටස් හිමියන් සමඟ නිසි සබඳතා පවත්වා ගැනීම පිළිබඳ බැංකුවේ ප්‍රවේශයයි.

7.1 අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායකයින්ගේ වැටුප්

බැංකුවේ වැටුප් ප්‍රතිපත්ති ශ්‍රී ලංකා මහ බැංකුව සහ HDFC පනත මගින් පාලනය වන අතර, සාධාරණත්වය සහ ආයතනික අරමුණු සමඟ පෙළගැසීම සහතික කරයි. බැංකුව සතුව වැටුප් කමිටුවක් පවතී. අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් පිළිබඳ විස්තර මෙම වාර්තාවේ 239 වන පිටුවෙන් සොයාගත හැකිය.

සභාපතිවරුන් සහ අධ්‍යක්ෂවරුන් සඳහා වන වැටුප් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් හරහා ලැබෙන රාජ්‍ය චක්‍රලේඛ පිළිබඳව බැංකුව දැඩි අවධානයෙන් කටයුතු කරයි.

ආයතනික පාලන රාමුව

7.2 කොටස් හිමියන් සමඟ සබඳතා

ආයතනික පාලනය පිළිබඳ බැංකු පනතට අනුව, බැංකුවේ කාර්යසාධනය පිළිබඳ සමබර තක්සේරුවක් කොටස් හිමියන්ට ලැබෙන බව සහතික කරන සන්නිවේදන ප්‍රතිපත්තියක් බැංකුව සතුව පවතී. බැංකුව වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කරන අතර, අවදානම් පැතිකඩෙහි සහ උපායමාර්ගික දිශානතියේ සිදුවන ඕනෑම වැදගත් වෙනසක් කොටස් හිමියන් වෙත සන්නිවේදනය කරනු ලැබේ. තවද, අධ්‍යක්ෂවරුන් ශ්‍රී ලංකා මහ බැංකුවේ 'සුදුසුකම් සහ නියාමන නිර්ණායක' සපුරාලන බවට කොටස් හිමියන්ට සහතික කරනු ලැබේ. කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීමේ නීති අනුගමනය කරමින්, අපි අපගේ කොටස් හිමියන් සමානව සලකමු. වාර්ෂික මහා සභා රැස්වීම්වලදී ගරු කරනු ලැබේ. කොළඹ කොටස් වෙළඳපොළේ රෙගුලාසිවලට අනුව, ලාභාංශ ප්‍රකාශ කිරීම, මණ්ඩල වෙනස්කම් හෝ ප්‍රධාන මූල්‍ය අලාභ වැනි වැදගත් තොරතුරු සියලුම කොටස් හිමියන් වෙත බෙදා හැරීම සඳහා වහාම කොළඹ කොටස් වෙළඳපොළේ වෙත හෙළිදරව් කරනු ලැබේ.

බැංකුව 2007 අංක 7 දරන සමාගම් පනතට ද අනුකූල වන අතර, ලාභාංශ ප්‍රකාශ කිරීමට පෙර බැංකුවේ ද්‍රවශීලතාව සහ සිය ණය බැඳීම් ඉටු කිරීමට ඇති හැකියාව සහතික කරයි. තවද, පනතට අනුව, සමාගම් ලේකම්වරයා හරහා සිය ගැටලු ඉදිරිපත් කිරීමට හෝ සහනයක් ලබා ගැනීමට කොටස් හිමියන් සඳහා රාමුවක් අපි නිර්මාණය කර ඇත්තෙමු.

කොටස් හිමියන් සහ ආයෝජකයින් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියක් බැංකුව සතුව පවතී.

7.3 අදාළ පාර්ශ්වීය ගනුදෙනු කළමනාකරණය

අදාළ පාර්ශ්වීය ගනුදෙනු පිළිබඳ කමිටුව, අධ්‍යක්ෂවරුන් සම්බන්ධ ගනුදෙනු හේතුවෙන් මතුවිය හැකි ඕනෑම අගතියක් බැංකුවේ උපරිම යහපත උදෙසා විචක්ෂණශීලීව විසඳා ගැනීම සහතික කරයි.

- බැංකුව 2024 අංක 05 දරන විධානයට (සහ පෙර පැවති 2007 අංක 11 දරන විධානයට) අනුකූල වන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩල අදාළ පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුවක් (BRPTRC) පිහිටුවීම අනිවාර්ය කරයි. අධ්‍යක්ෂවරුන්ට සහ අදාළ පාර්ශ්වයන්ට ලබා දෙන පහසුකම් (ණය, කල්බදු සහ ඇපකර) සම්බන්ධයෙන් මහ බැංකුවේ සීමාවන් පවතී. ගනුදෙනුකරුවන්ට ලබා දෙන කොන්දේසිවලට වඩා වාසිදායක නොවන කොන්දේසි යටතේ ගනුදෙනු සිදු වන බව බැංකුව සහතික කරයි.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ ස්වාධීන අධ්‍යක්ෂවරුන් එකතුවක් කමිටුවට ඇතුළත් විය යුතු බවට නියම කරන කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීමේ නීතිවල 9 වන වගන්තියට ද අපි බැඳී සිටින්නෙමු. RPT හැසිරවීමේදී පනත යටතේ ඇති හෙළිදරව් කිරීමේ සීමාවන්ට ද අනුකූල වේ.
- තවද, අදාළ පාර්ශ්වයේ නම, සබඳතාව සහ ගනුදෙනු වටිනාකම ඇතුළුව සියලුම RPT වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇත (RPT සඳහා 287 පිටුව බලන්න).
- මූල්‍ය වාර්තාකරණය සඳහා අපි LKAS 24: අදාළ පාර්ශ්වීය හෙළිදරව් කිරීම් ද අනුගමනය කර ඇත්තෙමු.

8 සහතික කිරීම්, පාලන සහ සදාචාරය

රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සබඳතා සහිත රාජ්‍ය අනුග්‍රහය ලබන බැංකුවක් ලෙස, නිසි අභ්‍යන්තර සහ බාහිර සහතික කිරීමේ යාන්ත්‍රණයන් සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් හරහා කොටස් හිමියන්ට සහ පාර්ශ්වකරුවන්ට සහතිකයක් ලබා දීමට බැංකුව කැපවී සිටී. ඒ සඳහා අඛණ්ඩතාව සහතික කිරීමේදී සදාචාරය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

8.1 මූල්‍ය වාර්තාකරණය

බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සහ හෙළිදරව් කිරීම්වල අඛණ්ඩතාව, නිරවද්‍යතාවය සහ විනිවිදභාවය පිළිබඳ අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මෙය පහත සඳහන් දෑ හරහා සහතික කරනු ලැබේ:

අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය: අතුරු මූල්‍ය හෙළිදරව් කිරීම්වලට අමතරව, කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ සාධාරණ බවත්, බැංකුවේ මූල්‍ය තත්ත්වයේ සැබෑ ස්වභාවය පිළිබිඹු කරන බවත් සහතික කරමින්, පරීක්ෂා කිරීමෙන් පසුව එය අනුමත කරනු ලැබේ.

නියාමන පෙළගැස්ම: ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් සහ කොළඹ කොටස් වෙළඳපොළේ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා බැංකුව මූල්‍ය හෙළිදරව් කිරීම් පෙළගස්වයි.

ප්‍රමිතීන්ට අනුකූල වීම: මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 1988 අංක 30 දරන බැංකු පනතට අනුකූලවය.

මීට අමතරව, ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාත, ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාත සහ අක්‍රීය ණය අනුපාත ඇතුළු අනුපාත බැංකුව විසින් වරින් වර සපයනු ලබයි.

8.2 අභ්‍යන්තර පාලන සහ විගණන කමිටුව

මූල්‍ය අඛණ්ඩතාව සහතික කිරීමට, බැංකුවේ වත්කම් සුරක්ෂිත කිරීමට සහ පාර්ශ්වකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා ආරක්ෂා කිරීමට, විශේෂයෙන්ම අභ්‍යන්තර පාලනය සඳහා බැංකුව දැඩි, ව්‍යුහගත ප්‍රවේශයක් අනුගමනය කරයි.

ස්වාධීන විගණන කමිටුව: අභ්‍යන්තර විගණන කාර්යය අධීක්ෂණය කරන ස්වාධීන කමිටුවක් බැංකුව සතුව පවතී. මෙම කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර, එය ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් මෙහෙයවනු ලබයි. මෙම කමිටුව විගණන කාර්යය පිළිබඳ දැඩි අධීක්ෂණයක් සහතික කරන අතර අවදානම් කළමනාකරණ රාමුවේ අඛණ්ඩතාව ද සහතික කරයි.

ශක්තිමත් අභ්‍යන්තර පාලනයන්: අවදානම් කළමනාකරණය කිරීමට, අනුකූලතාව සහතික කිරීමට සහ බැංකුවේ අවශ්‍යතා ආරක්ෂා කිරීමට ව්‍යුහගත සහ සහයෝගීතා රාමුවක් පවතින බව සහතික කිරීම සඳහා 'ආරක්ෂක ස්ථර තුනක' ආකෘතිය ක්‍රියාත්මක වේ. සෑම මට්ටමකම පැහැදිලි භූමිකාවන් නිර්වචනය කර ඇති අතර, පැහැදිලි වගවීම, ඵලදායී පාලනය සහ ආයතනික ඉලක්ක සහ අවදානම් ඉවසීම සමඟ අවදානම් කළමනාකරණයේ උපායමාර්ගික පෙළගැස්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මෙය ක්‍රියාත්මක වේ.

8.3 ව්‍යාපාරික චර්යාධර්ම සංග්‍රහය

සියලුම මට්ටම්වල අවංකභාවය සහ සදාචාරාත්මක හැසිරීම් ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකුව ව්‍යාපාරික චර්යාධර්ම සංග්‍රහයක් පවත්වාගෙන යයි. අභ්‍යන්තර ව්‍යාපාරික චර්යා සහ සදාචාරය පිළිබඳ ප්‍රතිපත්තිය හරහා මෙය සහතික කරනු ලැබේ.

ඉදිරි දැක්ම

අධ්‍යක්ෂ මණ්ඩලය සහ විධායක නායකත්වය ඇතුළු බැංකුවේ නායකත්වය, නියාමන විධානයන්ට අනුකූලව බැංකුවේ ක්‍රියාකාරකම් දැඩි ලෙස අධීක්ෂණය කිරීමට කැපවී සිටී. සමාගම් ලේකම්වරයා සහ අපගේ රාජ්‍ය මූලධර්ම සමඟ එක්ව, මූල්‍ය හෙළිදරව් කිරීම් සහ රෙගුලාසිවලට අනුකූල වීම උපරිම මට්ටමින් ඉටු කරන බව නායකත්වය සහතික කරනු ඇත.

විනිවිදභාවය සහ වගවීම සඳහා අපගේ කැපවීම විදහා දැක්වීමක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ කොළඹ කොටස් වෙළඳපොළේ නියාමන අවශ්‍යතාවයන් සමඟ අපගේ පිළිවෙත් අඛණ්ඩව පෙළගස්වනු ලබන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ බැංකු පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අපි කටයුතු කරන්නෙමු.



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. BAN/C/HDFC/2025/CG/01 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 12 May 2026

සභාපතිතුමා වෙත,

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

මධ්‍යම බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලන විධානයට අනුකූල වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව පිළිබඳ විගණකාධිපතිවරයාගේ සත්‍ය තත්ත්වයන් පිළිබඳ වාර්තාව - 2025 දෙසැම්බර් 31

මධ්‍යම බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලන විධානයේ අනුකූලතා අවශ්‍යතා සපුරාලීම සඳහා, මණ්ඩලයේ පාලන වාර්තාව සම්බන්ධයෙන් ඇමුණුම-01 හි දක්වා ඇති ක්‍රියා පටිපාටි මම සිදු කර ඇත්තෙමි. මගේ මෙම කටයුත්ත, විකඟ වූ ක්‍රියා පටිපාටි පැවරුම් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිතීන් 4400 (SLSRS 4400-සංශෝධිත) හි දක්වා ඇති මූලධර්මවලට අනුකූලව සිදු කරන ලදී. ආයතනික පාලන විධානයේ අනුකූලතා අවශ්‍යතා සපුරාලීමට ඔබට සහාය වීම සඳහා පමණක් මෙම ක්‍රියා පටිපාටි සිදු කරන ලදී.

මගේ සොයාගැනීම් මෙම වාර්තාවේ ඇමුණුම-01 හි දක්වා ඇත.

ඉහත ක්‍රියා පටිපාටි විගණනයක් හෝ සමාලෝචන පැවරුම්වලට අනුකූලව සිදු කරන ලද සමාලෝචනයක් නොවන බැවින්, මධ්‍යම බැංකුව විසින් නිකුත් කර ඇති ආයතනික පාලන විධානයන්ට අනුකූල වීම සම්බන්ධයෙන් මම කිසිදු සහතිකයක් ලබා නොදෙමි.

මම අමතර ක්‍රියා පටිපාටි සිදු කළේ නම් හෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට හෝ සමාලෝචන පැවරුම් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූලව පාලන වාර්තාව පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් සිදු කළේ නම්, ඔබට වාර්තා කළ හැකි වෙනත් කරුණු මගේ අවධානයට ලක් වන්නට ඉඩ තිබුණි.

මගේ වාර්තාව මෙම වාර්තාවේ පළමු ඡේදයේ දක්වා ඇති අරමුණ සඳහා පමණක් වන අතර, එය ඔබගේ තොරතුරු සඳහා පමණක් වන අතර වෙනත් කිසිදු අරමුණක් සඳහා භාවිතා කිරීමට හෝ වෙනත් පාර්ශවයන් වෙත බෙදා හැරීමට නොහැක.

මෙම වාර්තාව ඉහත සඳහන් කර ඇති කරුණු වලට පමණක් අදාළ වන අතර, සමස්තයක් ලෙස ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා අදාළ නොවේ.

එල්.එස්.අයි. ජයරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

අනුකූලතා සමාලෝචනය

2025 මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් වෙළඳපොළ සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට අදාළ ආයතනික පාලන රාමුව සම්බන්ධයෙන් HDFC බැංකුවේ අනුකූලතා තත්ත්වය මෙතැන් සිට නිර්වචනය කෙරේ.

පළමු කොටස

(2026 මැයි 12 දිනැති විගණන වාර්තාවේ 01 වන අමුණා ඇති ලේඛනය)

සටහන: පහත සඳහන් අංකනය භාවිතා කර ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2024 අංක 05 දරන බැංකු පනත් විධානයේ "I වන උපලේඛනය" සමඟ සමපාත වන පරිදිය.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
1. අධ්‍යක්ෂ මණ්ඩලයේ පරම වගකීම සහ වගවීම		
1.1 අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්	අ) බැංකුවේ දිගුකාලීන අරමුණු අනුව බැංකුවේ උපායමාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් අනුමත කිරීම හා අධීක්ෂණය කිරීම සහ ඒවා බැංකුව පුරා නිසි ලෙස සන්නිවේදනය කර ඇති බව සහතික කිරීම;	අනුකූල වේ උපායමාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් 2024 - 2028 කාලසීමාව සඳහා සකස් කරන ලද සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික සැලැස්මට ඇතුළත් කර ඇත. ආයතනික වටිනාකම් HDFC වෙබ් ද්වාරයෙහි ප්‍රදර්ශනය කර ඇති අතර, කාර්ය මණ්ඩලය ඔවුන්ගේ දෛනික කටයුතු වලදී ඒ වෙත යොමු වේ.
	ආ) ඉදිරි වසර තුන සඳහා අවම වශයෙන් මැනිය හැකි ඉලක්ක සහිත සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි සහ යාන්ත්‍රණ ඇතුළුව බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ගය අනුමත කිරීම;	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වසර 5ක කාලසීමාවක් (2024-2028) ආවරණය වන පරිදි ව්‍යාපාරික උපායමාර්ග, ක්‍රියාමාර්ග සහ අරමුණු ඇතුළත් උපායමාර්ගික සැලැස්මක් අනුමත කර ඇත. බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ග යට අනුකූල වන පරිදි සමස්ත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ. • ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය • පොලී අනුපාත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය • මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය • ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	ඇ)පහත දැක්වෙන දෑ මගින් ශක්තිමත් අවදානම් පාලන සංස්කෘතියක් ඇති කිරීම: i. ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම සහ අවදානම් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාත්මක කිරීම සහතික කිරීම, ii. බැංකුවේ ආරක්ෂක ස්ථර තුන සඳහා මනාව නිර්වචනය කරන ලද ආයතනික වගකීම් ස්ථාපිත කිරීම, iii. අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ අභ්‍යන්තර විගණන කාර්යයන් ස්වාධීනව, වාස්තවිකව සහ ඵලදායීව වගකීම් ඉටු කිරීම සඳහා නිසි ලෙස ස්ථානගත කර ඇති බවත්, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයකින් සහ සම්පත් වලින් සමන්විත බවත් සහතික කිරීම, iv. බැංකුවේ උපායමාර්ගික, ප්‍රාග්ධන සහ මූල්‍ය සැලසුම් වලට අනුකූලව බැංකුවේ අවදානම් රුචිය නිර්වචනය කිරීම, එය අවදානම් රුචි ප්‍රකාශයක් හරහා පැහැදිලි කිරීම, සහ v. නිශ්චිත අවදානම් රුචි සීමාවන් උල්ලංඝනය වූ විට ගත යුතු ක්‍රියාමාර්ග සහ අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දීම නියම කිරීම.	අනුකූල වේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ප්‍රධාන අවදානම් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ කළමනාකරණය කිරීම සඳහා පාලන ව්‍යුහය සකසයි. ආයතනික ව්‍යුහය මගින් ආරක්ෂක ස්ථර තුන පැහැදිලිව පිළිබිඹු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික ව්‍යුහයක් ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, අනුකූලතා, අභ්‍යන්තර විගණන සහ අවදානම් කළමනාකරණ අංශවල සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු පුරප්පාඩු වී පවතී. තවද, ඉහත අංශවල කාර්ය මණ්ඩල පුරප්පාඩු ද පවතී. සමස්ත අවදානම් දර්ශක පුවරුව පිළිබඳ අවදානම් විශ්ලේෂණය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් රුචි ප්‍රකාශය ක්‍රියාත්මක වේ. අවදානම් ඉවසීමේ සීමාවන් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් ගත යුතු අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව BIRMC විසින් උපදෙස් ලබා දෙනු ලැබේ.
	d) තැන්පත්කරුවන්ගේ, ණය හිමියන්ගේ සහ සමස්ත බැංකුවේ අවශ්‍යතාවලට අහිතකර හෝ අගතියක් වන අයුරින් අධ්‍යක්ෂවරයෙකු හෝ අධ්‍යක්ෂවරුන් පිරිසක් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය ආධිපත්‍යය දැරීම හෝ සැලකිය යුතු බලපෑමක් කිරීම වැළැක්වීම සඳහා ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම;	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියක් පවතී.
	e) නියාමකයින්, තැන්පත්කරුවන්, ණය හිමියන්, කොටස් හිමියන් සහ ණය ගැතියන් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සන්නිවේදන ප්‍රතිපත්තියක් සහ කොටස් හිමියන් සහ ආයෝජකයින් සමඟ සබඳතා පිළිබඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ.
	f) බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත් බව සහ අඛණ්ඩතාව සමාලෝචනය කිරීම;	අනුකූල වේ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණවත් බව සහ අඛණ්ඩතාව සමාලෝචනය කිරීම සඳහා බැංකුවේ විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ. බැංකුවේ විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන වාර්තා වරින් වර සමාලෝචනය කරන අතර, එමගින් අභ්‍යන්තර පාලන පද්ධති සහ සොයාගැනීම්වලට විසඳුම් ලබා දීම සඳහා අවශ්‍ය පියවර පැහැදිලි කර ඇත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	g) සම්බන්ධිත පාර්ශ්වයන්ගේ නිරාවරණයන් කළමනාකරණය කිරීම සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වලින් මතු විය හැකි ඕනෑම උනන්දුවක් ගැටුමකින් වැළකී සිටීම සඳහා ඵලදායී පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම;	අනුකූල වේ සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ බැංකුව විසින් සිදු කරන ලද ගනුදෙනු පිළිබඳව අනුකූලතා නිලධාරියා සෑම කාර්තුවකටම වරක් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවට වාර්තා කරයි. කිසියම් උනන්දුවක් ගැටුමක් වළක්වා ගැනීම සඳහා කමිටුව විසින් ගනුදෙනු සමාලෝචනය කරනු ලැබේ. තවද, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ රැස්වීම් මිනිත්තු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.
	h) මූල්‍ය ස්ථාවරත්වය, මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ ඕනෑම බාධාකාරී සිදුවීමකදී මූලික බැංකු පද්ධති ඇතුළු තීරණාත්මක මෙහෙයුම් සහ සේවාවන් ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩ පැවැත්ම සහ ආපදා ප්‍රතිසාධන සැලසුම් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම;	අනුකූල වේ මූලික බැංකු පද්ධතිය, තොරතුරු තාක්ෂණ පද්ධතිය සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය පද්ධතිය ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආපදා ප්‍රතිසාධන සැලැස්මක් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාර අඛණ්ඩ කළමනාකරණ ප්‍රතිපත්තියක් පවතී.
	i) පාරිතෝෂික ප්‍රවේශය අධීක්ෂණය කිරීම, පාරිතෝෂික අධීක්ෂණය සහ සමාලෝචනය කිරීම ඇතුළුව, සහ බැංකුවේ අවදානම් සංස්කෘතිය සහ අවදානම් රුචිය සමඟ පාරිතෝෂික පෙළගැසී ඇති බව සහතික කිරීම;	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පාරිතෝෂික මුදල් අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ මත තීරණය කරනු ලැබේ. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පාරිතෝෂික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතේ 14 වන වගන්තිය සහ එහි සංශෝධන අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරීවරයෙකු පත් කළ යුතු අතර වැටුප් සහ දීමනා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. ප්‍රධාන විධායක නිලධාරියාගේ වැටුප අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිතෝෂික කමිටුව විසින් තීරණය කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිතෝෂික කමිටුව පාරිතෝෂික සහ බඳවා ගැනීම් සඳහා වන ප්‍රවේශය අධීක්ෂණය කරයි.
	j) පහත සඳහන් දෑ කිරීමට හැකි තත්ත්වයක සිටින ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් හඳුනා ගැනීම සහ නම් කිරීම: (ස) ප්‍රතිපත්ති කෙරෙහි සැලකිය යුතු ලෙස බලපෑම් කිරීම, (සස) ක්‍රියාකාරකම් මෙහෙයවීම, සහ (සසස) ව්‍යාපාරික කටයුතු, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය පාලනය කිරීම.	අනුකූල වේ මහ බැංකුවේ ආයතනික පාලනය පිළිබඳ විධාන පත්‍රයට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් හඳුනාගෙන නම් කර ඇත. (අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ 8.1 වගන්තිය)

ආයතනික පාලන රාමුව

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	k) ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා අධිකාරී බලය සහ ප්‍රධාන වගකීම් ක්ෂේත්‍ර නිර්වචනය කිරීම;	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලයේ, ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ අධිකාරී බලය සහ ප්‍රධාන වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේනිර්වචනය කර ඇත. තවද, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ අනෙකුත් ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා ඔවුන්ගේ අධිකාරී බලය, වගකීම් සහ රාජකාරී පැහැදිලි කරන, මානව සම්පත් සහ පාරිතෝෂික කමිටුව විසින් අනුමත කරන ලද බලය පැවරීම් පවතී.
	l) බැංකුවේ කටයුතු පිළිබඳව ප්‍රධාන විධායක නිලධාරිවරයා සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් විසින් සිදු කරනු ලබන අධීක්ෂණය, අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග සහ ප්‍රතිපත්ති වලට අනුකූල වන බව සහතික කිරීම;	අනුකූල වේ 1997 අංක 07 දරන HDFC පනතේ 03 (1) වගන්තිය ප්‍රකාරව බැංකුවේ පරිපාලනය සහ කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. බැංකුවේ උපායමාර්ගික ව්‍යාපාරික සැලැස්මට සාපේක්ෂව බැංකුවේ කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරන අතර, මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය සහ වීම කමිටු වෙත පවරා ඇති වෙනත් අදාළ කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල උප-කමිටු වෙතින් වාර්තා ලබා ගනී. ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ ප්‍රධාන වගකීම් ඔවුන්ගේ අදාළ රැකියා විස්තරවල දක්වා ඇති අතර, ඔවුන්ගේ අධිකාරී බලය 'බලය පැවරීමේ සීමාවන්' යටතේ නිර්වචනය කර ඇත. 'සංශෝධිත බලය පැවරීමේ සීමාවන් - 2025' අනුමත කර ඇත. ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ කාර්යයන්ට අදාළ කරුණු පැහැදිලි කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය විටෙක ඔවුන්ව නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා කැඳවනු ලැබේ.
	m) පහත දැක්වෙන දෑ ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ තමන්ගේම පාලන පිළිවෙත්වල සඵලතාවය වරින් වර තක්සේරු කිරීම: (i) අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් තෝරා ගැනීම, නම් කිරීම සහ පත් කිරීම; (ii) ලැබැඳියාව පිළිබඳ ගැටුම් කළමනාකරණය කිරීම; සහ (iii) දුර්වලතා හඳුනා ගැනීම සහ අවශ්‍ය විටෙක වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම;	අනුකූල නොවී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ 1997 අංක 07 දරන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතේ 3(1) වගන්තිය සහ එහි සංශෝධන ප්‍රකාරවය. අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ස්වයං-ඇගයීම් ක්‍රියාවලියක් පවතින අතර වයට අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලන පිළිවෙත් ඇගයීම ද ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය පිළිබඳ ස්වයං-ඇගයීම වාර්ෂිකව සිදු කෙරේ. කෙසේ වෙතත්, 2025 වසර සඳහා වන ස්වයං-ඇගයීම සිදු කර නොමැත.
	n) චක් චක් අධ්‍යක්ෂවරයා විසින් වාර්ෂිකව සිදු කරනු ලබන ස්වයං-ඇගයීම් නිර්ණායක සඳහා අනුමැතිය ලබා දීම සහ එවැනි වාර්තා පවත්වාගෙන යාම;	අනුකූල නොවී 2025 වසර සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ඇගයීම් සමාලෝචනය සිදු කර නොමැති අතර එවැනි වාර්තා පවත්වාගෙන ගොස් නොමැත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	o) බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා සුදුසු අනුප්‍රාප්තික සැලැස්මක් පවතින බව සහතික කිරීම;	අර්ධ වශයෙන් අනුකූල වේ බැංකුවේ ආයතනික කළමනාකරණ අනුප්‍රාප්තික සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. කෙසේ වෙතත්, තනතුරු කිහිපයක් සඳහා ක්ෂණික අනුප්‍රාප්තිකයන් හඳුනාගෙන නොමැති අතර ඒවා බාහිර බඳවාගැනීම් ලෙස සඳහන් කර ඇත.
	p) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමට, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීමට සහ ආයතනික අරමුණු කරා යන ප්‍රගතිය අධීක්ෂණය කිරීමට, අවශ්‍යතාවය මත ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සමඟ නිතිපතා හමුවීම;	අනුකූල වේ ප්‍රතිපත්ති සහ ආයතනික අරමුණු අධීක්ෂණය කිරීමට සහ සමාලෝචනය කිරීමට සියලුම ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සහ අංශ ප්‍රධානීන් සමඟ ආයතනික කළමනාකරණ රැස්වීම් පවත්වනු ලැබේ.
	q) නියාමන පරිසරයේ සිදුවන වැදගත් වෙනස්කම් පිළිබඳව දැනුවත්ව සිටීම සහ නියාමකයින් සමඟ බැංකුව ඵලදායී සම්බන්ධතාවයක් පවත්වාගෙන යන බව සහතික කිරීම;	අනුකූල වේ නියාමන පරිසරයේ සිදුවන වැදගත් වෙනස්කම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඇති අතර, නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සඳහා පියවර සහ ක්‍රියාවලීන් ක්‍රියාත්මක කර ඇත. තවද, බැංකුව නියාමකයින් සමඟ සම්බන්ධතාවයක් පවත්වා ගනී.
	r) බාහිර විගණකවරුන් බඳවා ගැනීමේදී සහ අධීක්ෂණය කිරීමේදී නිසි උනන්දුවක් දැක්වීම;	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය සහ HDFC පනතේ 26 (2) වගන්තිය ප්‍රකාරව, බැංකුවේ බාහිර විගණකවරයා වන්නේ විගණකාධිපතිවරයාය.
	s) වෘත්තීය සහ සදාචාරාත්මක ආකාරයෙන් කටයුතු කිරීම සහ බැංකුවේ සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, කොටස් හිමියන් හෝ වෙනත් ඕනෑම පාර්ශ්වකරුවෙකුගෙන් දිරිගැන්වීම්, තෑගි හෝ අරමුදල් ඇතුළු අනිසි මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභ ලබා නොගැනීම;	අනුකූල වේ සියලුම අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් සඳහා අභ්‍යන්තර ව්‍යාපාරික හැසිරීම් සහ සදාචාරය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ.
	t) බැංකුව පුරා වෘත්තීය, සදාචාරාත්මක සහ විචක්ෂණශීලී හැසිරීම් සඳහා වන සම්මතයන් ශක්තිමත් කරන යහපත් ආයතනික සංස්කෘතියක් ඇති කිරීම. දත්තවල රහස්‍යභාවය, උනන්දුවක් ඇති ගැටුම්, මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ සහ තෑගි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියා පටිපාටි, වාර්තාකරණයේ අඛණ්ඩතාව සහ ගනුදෙනුකරුවන්ට සාධාරණ ලෙස සැලකීම ඇතුළු කරුණු ආමන්ත්‍රණය කරමින්, අධ්‍යක්ෂවරුන්ගේ සහ සේවකයින්ගේ වෘත්තීය සහ සදාචාරාත්මකව පිළිගත හැකි හැසිරීම් පිළිබඳ පැහැදිලි මාර්ගෝපදේශ සපයන ආයතනික වටිනාකම් මත පදනම් වූ ආචාරධර්ම සංග්‍රහයක් ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආචාරධර්ම සංග්‍රහය ක්‍රියාත්මක වේ.

ආයතනික පාලන රාමුව

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	u) නියාමකයන් විසින් මතු කරන ලද අධීක්ෂණ ගැටළු කාලෝචිත ලෙස නිවැරදි කිරීම සහතික කිරීම සහ ඒ සඳහා අදාළ උප-කමිටුවල සහාය ලබා ගැනීම;	අර්ධ වශයෙන් අනුකූල වේ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් HDFC බැංකුවේ සභාපති වෙත යවන ලද ලිපියකින්, බැංකුවේ තිරසාර නොවන ව්‍යාපාරික ආකෘතිය සහ විසඳා නොමැති නියාමන ගැටළු කිහිපයක් පෙන්වා දී ඇත. බැංකුව විසින් මතු කරන ලද ගැටළු විසඳීමට පියවර ගෙන ඇති අතර, ඉතිරිව ඇති කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා උප-කමිටුවේ සහාය ඇතිව දැනට කටයුතු සිදු කෙරෙමින් පවතී.
	v) නීති විරෝධී, සදාචාර විරෝධී හෝ ප්‍රශ්න කළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳ නීත්‍යානුකූල ගැටළු, පළිගැනීමේ අවදානමකින් තොරව රහසිගතව සන්නිවේදනය කිරීමට සේවකයින් දිරිමත් කිරීම සඳහා තොරතුරු හෙළි කරන්නන් සඳහා වන ප්‍රතිපත්තියක් අනුමත කිරීම. මෙම ප්‍රතිපත්තිය අවම වශයෙන් වාර්ෂිකව සමාලෝචනය කළ යුතුය. (i) බැංකුව තුළ ගැටළු යොමු කළ හැකි පුද්ගලයින්; (ii) සේවකයින් විසින් මතු කරන ලද නීත්‍යානුකූල කරුණු විමර්ශනය කිරීමේ ක්‍රියා පටිපාටි; (iii)හානිකර සැලකීමක් හෝ පළිගැනීමක් හේතුවෙන් ගැටළු මතු කරන සේවකයින්ගේ ආරක්ෂාව සහ නිර්නාමිකභාවය සහතික කිරීමේ ක්‍රියා පටිපාටි; සහ (iv) නියාමකයින් වෙත තොරතුරු හෙළි කිරීම සඳහා විකල්ප මාර්ග.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තොරතුරු හෙළි කරන්නන් සඳහා වන ප්‍රතිපත්තියක් පවතින අතර එය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කර ඇත.
	w) බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ග තුළ සුදුසු පාරිසරික, සමාජීය සහ පාලන කරුණු ඇතුළත් කිරීම හරහා තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම සහ වඩාත් හරිත, දේශගුණික හිතකාමී සහ සමාජීය වශයෙන් ඇතුළත් ව්‍යාපාර සඳහා සහාය වීමට ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන බව සහතික කිරීම.	අනුකූල වේ පාරිසරික, සමාජීය සහ පාලන තිරසාරභාවය පිළිබඳ ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
1.2 සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීම	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී පත් කළ යුතු අතර, මෙම විධානයන්හි 5 වන විධානයට අනුකූලව සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරී ගේ කාර්යයන් සහ වගකීම් නිර්වචනය කර අනුමත කළ යුතුය.	අනුකූල වේ 1997 අංක 07 දරන HDFC පනතේ 3 (1) ඉ (සසස) සහ 5 (1) වගන්තිවල විධිවිධාන ප්‍රකාරව, සභාපතිවරයා මුදල් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි. හිටපු සභාපතිවරයා 2025 නොවැම්බර් 30 දින විශ්‍රාම ගොස් ඇති අතර, මෙතෙක් නව සභාපතිවරයෙකු පත් කර නොමැත. 1997 අංක 07 දරන HDFC පනතේ 14 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, මුදල් අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරීවරයෙකු පත් කළ යුතුය. භාණ්ඩාගාර අංශයේ ප්‍රධානියා 2025 ජූලි 11 දක්වා වැඩබලන සාමාන්‍යාධිකාරීවරයා ලෙස කටයුතු කළේය. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය) විසින් 2025 ජූලි 12 සිට 2025 අගෝස්තු 13 දක්වා සාමාන්‍යාධිකාරීවරයාගේ රාජකාරී ආවරණය කරන ලදී. බැංකුවේ වත්මන් සාමාන්‍යාධිකාරීවරයා 2025 අගෝස්තු 14 දින පත් කරන ලදී. සභාපතිවරයාගේ කාර්යයන් සහ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ නිර්වචනය කර ඇත. ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යයන් සහ වගකීම් 1997 අංක 07 දරන HDFC පනතේ සහ එහි සංශෝධනවල නිර්වචනය කර ඇත. සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යයන් සහ වගකීම් මහ බැංකුවේ 2024 අංක 05 දරන ආයතනික පාලනය පිළිබඳ විධානයට අනුකූල වේ.
1.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	අධ්‍යක්ෂ මණ්ඩලය ආසන්න වශයෙන් මාසික කාල පරතරයකින් රැස් විය යුතු අතර, වසරකට අවම වශයෙන් දොළොස් වතාවක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතුය. සංසරණය මගින් ලබා ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන්, වීම සංසරණයට පසුව පවත්වනු ලබන පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ස්ථිර කළ යුතුය. අදාළ අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහතික කිරීමට යටත්ව සහ අවම වශයෙන් අර්ධ වාර්ෂික පදනමින් භෞතිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීමට යටත්ව, අධ්‍යක්ෂ මණ්ඩලයට රැස්වීමට සහ/හෝ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට අතථ්‍ය ලෙස රැස්වීම්වලට සහභාගී විය හැක.	අනුකූල වේ 2025 වසර සඳහා, මුළු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 20ක් පවත්වන ලදී. සංසරණය මගින් ලබා ගත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් 23ක් වහාම පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ස්ථිර කර ඇත.
1.4 අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි	a) බැංකු ව්‍යාපාර ප්‍රවර්ධනය, අවදානම් කළමනාකරණය සහ බැංකුවේ සේවකයින්ගේ හැසිරීම සම්බන්ධ කරුණු සහ යෝජනා නිත්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සියලුම අධ්‍යක්ෂවරුන්ට හැකියාව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ 6.3.2 වගන්තිය ප්‍රකාරව, සෙසු අධ්‍යක්ෂවරුන් විසින් යෝජනා කරන ලද ඕනෑම කරුණක් සැලකිල්ලට ගනිමින් එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා න්‍යාය පත්‍රය සකස් කිරීම සහ අනුමත කිරීම සඳහා සභාපතිවරයා මූලික වශයෙන් වගකිව යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා කරුණු සහ යෝජනා ඇතුළත් කිරීමට සමාගම් ලේකම්වරයා සමඟ සන්නිවේදනය කිරීමට අධ්‍යක්ෂවරුන්ට පහසුකම් සලසා ඇත.

ආයතනික පාලන රාමුව

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	b) සියලුම අධ්‍යක්ෂවරුන්ට සහභාගී වීමට අවස්ථාව ලබා දීම සඳහා නිත්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පිළිබඳ අවම වශයෙන් දින 7කට පෙර දැනුම් දීමක් ලබා දෙන බව අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි මගින් සහතික කළ යුතුය. අනෙකුත් සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ කාලයකට පෙර දැනුම් දීමක් ලබා දිය හැක.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නියමිත පරිදි දැනුම් දීම් ලබා දී ඇත. සමාගම් ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා දැනුම් දීම් යවනු ලැබේ.
	c) පෙර මාස 12 තුළ පැවති රැස්වීම්වලින් අවම වශයෙන් තුනෙන් දෙකකට සහභාගී නොවූ හෝ අඛණ්ඩව පැවති පෙර රැස්වීම් තුනකට සහභාගී නොවූ අධ්‍යක්ෂවරයෙකු අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් විය යුතු බව අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි මගින් සහතික කළ යුතුය. කෙසේ වෙතත්, විකල්ප අධ්‍යක්ෂවරයෙකු හරහා රැස්වීම්වලට සහභාගී වීම පැමිණීමක් ලෙස පිළිගත හැක.	අනුකූල වේ කෙසේ වෙතත්, සියලුම අධ්‍යක්ෂවරුන් භෞතිකව හෝ සූම් හරහා රැස්වීම්වලට සහභාගී වන බැවින් මෙම ගැටළුව මතු වී නොමැත.
1.5 සමාගම් ලේකම්වරයෙකු පත් කිරීම	a) බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන සපුරාලන සමාගම් ලේකම්වරයෙකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුතු අතර, ඔහුගේ/ඇයගේ ප්‍රධාන වගකීම් වනුයේ අධ්‍යක්ෂ මණ්ඩල සහ කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් සේවා සැපයීම සහ බලපැවැත්වෙන නීති රීතිවල දක්වා ඇති අනෙකුත් කාර්යයන් ඉටු කිරීමයි.	අනුකූල වේ 1988 අංක 30 දරන බැංකු පනතේ 44(A) වගන්තිය සමඟ කියවිය යුතු 76H වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලේකම්වරයෙකු පත් කර ඇත. ඇය ශ්‍රී ලංකාවේ ප්‍රඥප්තිගත ආයතනික ලේකම්වරුන්ගේ ආයතනයේ සාමාජිකාවකි. ඇයගේ ප්‍රධාන වගකීම වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයට ලේකම් සේවා සැපයීමයි.
	b) අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි සහ සියලුම අදාළ නීති, රීති සහ රෙගුලාසි අනුගමනය කිරීම සහතික කිරීම සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්වරයාගේ උපදෙස් සහ සේවාවන් ලබා ගැනීමට ප්‍රවේශය තිබිය යුතුය.	අනුකූල වේ සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්වරයාගේ උපදෙස් සහ සේවාවන් ලබා ගැනීමට පූර්ණ ප්‍රවේශය ඇත. මෙය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ 3.2.16 වගන්තිය යටතේ හෙළිදරව් කර ඇත.
	c) අධ්‍යක්ෂවරුන් සඳහා වන පුහුණුව, ධාරිතා ගොඩනැගීම සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් පිළිබඳව නම් කිරීම් සහ පාලන කමිටුව විසින් කරනු ලබන නිර්දේශ සමාගම් ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතුය.	අනුකූල නොවේ එවැනි පුහුණු අවශ්‍යතා හඳුනාගෙන හෝ සිදු කර නොමැත.
	d) සමාගම් ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල කාර්ය සටහන් සහ රැස්වීම්වල පටිගත කිරීම් පවත්වා ගත යුතු අතර, ඕනෑම අධ්‍යක්ෂවරයෙකුගේ හෝ නියාමකවරයෙකුගේ සාධාරණ දැනුම් දීමකින් පසු ඕනෑම සාධාරණ වේලාවක එම කාර්ය සටහන් පරීක්ෂා කිරීමට ඉඩ ලබා දිය යුතුය.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ උප-කමිටු රැස්වීම්වල සියලුම වාර්තා සමාගම් ලේකම් දෙපාර්තමේන්තුවේ තබා ඇති අතර සමාගම් ලේකම්වරයා භාරයේ පවතී. අතීත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ කාර්ය සටහන් වෙත ප්‍රවේශ වීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ඇත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
1.6 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කාර්ය සටහන් පවත්වාගෙන යාම	අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරී ඉටු කිරීමේදී මණ්ඩලය නිසි සැලකිල්ලෙන් සහ විචක්ෂණශීලීව ක්‍රියා කළේද යන්න කාර්ය සටහන් මගින් පැහැදිලි වන පරිදි ප්‍රමාණවත් විස්තර සහිතව කාර්ය සටහන් සටහන් කළ යුතුය. එම කාර්ය සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල සාකච්ඡා වල ගැඹුර තක්සේරු කිරීම සඳහා නියාමන සහ අධීක්ෂණ බලධාරීන් සඳහා යොමුවක් ලෙස ද සේවය කරනු ඇත. එබැවින්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක කාර්ය සටහන් වල පැහැදිලිව පහත සඳහන් දෑ අඩංගු විය යුතුය හෝ සඳහන් විය යුතුය: අ) මණ්ඩලය සිය සාකච්ඡා වලදී භාවිතා කළ දත්ත, තොරතුරු සහ සාධාරණීකරණයන්/හේතු දැක්වීම්වල සාරාංශයක්; ආ) මණ්ඩලය විසින් සලකා බැලූ කරුණු; ඇ) මණ්ඩලය සිය රාජකාරී නිසි සැලකිල්ලෙන් සහ විචක්ෂණශීලීව ඉටු කළේද යන්න පෙන්නුම් කරන, මතභේදාත්මක හෝ විරුද්ධ අදහස් පිළිබිඹු කරන කරුණු සොයා බැලීමේ සාකච්ඡා; ඈ) බැංකුවේ උපායමාර්ග සහ ප්‍රතිපත්ති වලට අනුකූල වීම සහ අදාළ නීති හා රෙගුලාසි වලට අනුකූල වීම පෙන්වා දෙන ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ සාක්ෂි සහ තහවුරු කිරීම්; ඉ) බැංකුව නිරාවරණය වන අවදානම් පිළිබඳ මණ්ඩලයේ දැනුම සහ අවබෝධය, සහ අනුගමනය කරන ලද අවදානම් කළමනාකරණ පියවරයන් පිළිබඳ දළ විශ්ලේෂණයක්; සහ ඊ) අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සහ තීරණ.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය සටහන් වල අවශ්‍ය සියලුම විස්තර අඩංගු වේ. අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය සටහන් ප්‍රමාණවත් විස්තර සහිතව සටහන් කර ඇති අතර යොමු කර ඇති සියලුම කරුණු ඇතුළත් වේ. සාමාන්‍යයෙන්, අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය සටහන් වල අන්තර්ගතයට පහත කරුණු ඇතුළත් වේ: I. පෙර රැස්වීමේ කාර්ය සටහන් තහවුරු කිරීම. II. පෙර රැස්වීම්වල කාර්ය සටහන් වලින් පැන නගින කරුණු. III. ප්‍රතිසාධන කටයුතු, මූල්‍ය කටයුතු, අලෙවිකරණය සහ ප්‍රකාශන කටයුතු, පරිපාලන සහ පුද්ගලික කටයුතු, ණය කටයුතු, අවදානම් කටයුතු, නීතිමය කරුණු ආදිය. IV. ප්‍රතිපත්ති සමාලෝචනය, වාර්තා, උප-කමිටු රැස්වීම් මිනිත්තු. V. වෙනත් ඕනෑම කරුණු.
1.7 ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම	සාධාරණ ඉල්ලීමක් මත, සුදුසු අවස්ථාවන්හිදී බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වූ ක්‍රියා පටිපාටියක් තිබිය යුතුය. අදාළ අධ්‍යක්ෂවරයාට හෝ අධ්‍යක්ෂවරුන්ට සිය රාජකාරී ඵලදායී ලෙස ඉටු කිරීමට සහාය වීම සඳහා ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා දීමට මණ්ඩලය තීරණය කළ යුතුය.	අර්ධ වශයෙන් අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ 3.2.17 වගන්තිය ප්‍රකාරව, සාධාරණ ඉල්ලීමක් මත, සුදුසු අවස්ථාවන්හිදී බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට හැකි වන පරිදි එකඟ වූ ක්‍රියා පටිපාටියක් තිබිය යුතුය. කෙසේ වෙතත්, අධ්‍යක්ෂවරුන්ට ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට ඇති ප්‍රවේශය සම්බන්ධ ක්‍රියා පටිපාටියක් බැංකුව තුළ නොමැත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
1.8 ලැබැඳියාව පිළිබඳ ගැටුම් කළමනාකරණය කිරීම	a) අධ්‍යක්ෂවරුන් වෙනත් සංවිධාන, සම්බන්ධිත පාර්ශ්ව සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ පවතින කටයුතු සහ කැපවීම්වලදී ලැබැඳියාව පිළිබඳ ගැටුම් හෝ එවැනි ගැටුම් ඇති විය හැකි තත්ත්වයන් මගහැරිය යුතුය.	අනුකූල වේ
	b) තමා හෝ තම සමීපතමයෙකු හෝ තමා සැලකිය යුතු ලැබැඳියාවක් දක්වන ආයතනයක් සම්බන්ධ වන කරුණක් පිළිබඳ කිසිදු සාකච්ඡාවකට අධ්‍යක්ෂවරයෙකු සහභාගී නොවිය යුතුය. තවද, එවැනි කරුණු සම්බන්ධ තොරතුරු වෙත (භෞතිකව හෝ ඉලෙක්ට්‍රොනිකව) ප්‍රවේශ වීමේ අවස්ථාවද ඔවුන්ට නොලැබිය යුතුය.	අධ්‍යක්ෂවරුන් පත් කිරීමේදී සහ වාර්ෂිකව තම උනන්දුවක් ඇති කරුණු ප්‍රකාශ කරති. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු ප්‍රඥප්තියට අනුව, යෝජිත ගනුදෙනු කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන අතර අනුකූලතා නිලධාරියා ඒ පිළිබඳ කාර්තුමය වාර්තා ඉදිරිපත් කරයි. සම්බන්ධිත පාර්ශ්වයන්ගේ විස්තර ශාඛා අතර බෙදා හරින අතර වරින් වර යාවත්කාලීන කරනු ලැබේ.
	c) අධ්‍යක්ෂවරුන් එකිනෙකා අතර මෙන්ම, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් අතර පවතින සබඳතා, අධික හුරුපුරුදු බව, නුසුදුසු බලපෑම් හෝ බලහත්කාරකම් ඇති නොවන මට්ටමක පවතින බව සහතික කළ යුතුය.	තමන්ගේ හෝ තම සමීපතමයන්ගේ ලැබැඳ ියාවක් ඇති කරුණු සම්බන්ධ සාකච්ඡා සහ තීරණ ගැනීම්වලින් අධ්‍යක්ෂවරුන් ඉවත් වන අතර, එම තොරතුරු වෙත ප්‍රවේශ වීම ඔවුන්ට සීමා කර ඇත. මීට අමතරව, නුසුදුසු බලපෑම්, අධික හුරුපුරුදු බව හෝ බලහත්කාරකම් වැළැක්වීම සඳහා අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් අතර සුදුසු වෘත්තීය සීමාවන් පවත්වා ගනු ලැබේ.
	d) උනන්දුවක් ඇති ගැටුම් හඳුනා ගැනීමට සහ කළමනාකරණය කිරීමට ප්‍රතිපත්තියක් අනුමත කිරීම සහ එහි ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම මණ්ඩලය විසින් කළ යුතුය. එයට පහත දෑ ඇතුළත් විය යුතුය: I. උනන්දුවක් ඇති ගැටුමක් ඇති විය හැකි හෝ දැනටමත් ඇති වූ ඕනෑම කරුණක් වහාම හෙළිදරව් කිරීමේ අධ්‍යක්ෂවරයෙකුගේ යුතුකම; II. දේශපාලන සම්බන්ධතා ඇතුළුව,ලැබැඳියාව පිළිබඳ ගැටුම් ඇති විය හැකි ක්‍රියාකාරකම් හැකිතාක් මගහැරීමේ අධ්‍යක්ෂවරයෙකුගේ යුතුකම; III. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරන විට ලැබැඳියාව පිළිබඳ ගැටුම් ඇති විය හැකි අවස්ථා; IV. තමා හෝ තම සමීපතමයෙකු හෝ තමා සැලකිය යුතු උනන්දුවක් දක්වන ආයතනයක් සම්බන්ධ වන අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලදී එම සාකච්ඡාවලට සහභාගී නොවීමේ අධ්‍යක්ෂවරයෙකුගේ වගකීම; සහ V. ප්‍රතිපත්තියට අනුකූල නොවීමකදී ගත යුතු පියවර.	අනුකූල වේ. බැංකුව සතුව ආශ්‍රිත පාර්ශවීය ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තියක් සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කාරණා පිළිබඳ ප්‍රතිපත්තියක් පවතී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආශ්‍රිත පාර්ශවීය ගනුදෙනු සමාලෝචන ප්‍රතිපත්තිය සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කාරණා පිළිබඳ ප්‍රතිපත්තිය සමාලෝචනය කර ඇත.
1.9 බැඳීම් ඉටු කිරීමට නොහැකි වීම පිළිබඳව දැනුම් දීමේ අවශ්‍යතාවය	බැංකුව තම බැඳීම් ඉටු කිරීමට නොහැකි බවට හෝ එසේ වීමට ඉඩ ඇති බවට, හෝ බංකොලොත් වීමට ආසන්න බවට, හෝ තැන්පත්කරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට ගෙවීම් අත්හිටුවීමට ආසන්න බවට අධ්‍යක්ෂ මණ්ඩලය සලකන්නේ නම්, ඕනෑම තීරණයක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර ඒ පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට වහාම දැනුම් දිය යුතුය.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ 3.3.4 වගන්තිය ප්‍රකාරව, බැංකුව තම මූල්‍ය බැඳීම් ඉටු කිරීමට නොහැකි බවට හෝ එසේ වීමට ඉඩ ඇති බවට, බංකොලොත් වීමේ අවදානමක් පවතින බවට, හෝ තැන්පත්කරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට ගෙවීම් අත්හිටුවීමට ඉඩ ඇති බවට තීරණය කරන්නේ නම්, ඕනෑම තීරණයක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර ඒ පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතුය. කෙසේ වෙතත්, වසර තුළ එවැනි සිදුවීමක් වාර්තා වී නොමැත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
1.10 ප්‍රාග්ධන යෝග්‍යතා අවශ්‍යතාවලට අනුකූල වීම	ප්‍රාග්ධන සප්‍රමාණතා අනුපාතය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර පනවනු ලබන අනෙකුත් ප්‍රාග්ධන යෝග්‍යතා අවශ්‍යතා අනුව බැංකුව ප්‍රාග්ධනීකරණය වී ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය.	අනුකූල වේ මාසික මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අතර කාර්තුමය මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව බැංකුවේ තත්ත්වය පවත්වා ගෙන යනු ලැබේ. ප්‍රාග ්‍රධන සප්‍රමාණතා අනුපාතය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අධීක්ෂණය කරනු ලැබේ. ප්‍රාග්ධන සප්‍රමාණතා සහ අනෙකුත් ප්‍රාග්ධන යෝග්‍යතා අවශ්‍යතා අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවශ්‍ය කරනු ලබන මට්ටමින් බැංකුව ප්‍රාග්ධනීකරණය වී ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කර ඇත. 2025 අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණතා තක්සේරු ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.
1.11 වාර්ෂික ආයතනික පාලන වාර්තාව	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම විධානයන්ට අනුකූල වීම පිළිබඳ වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් බැංකුවේ වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කළ යුතුය.	අනුකූල වේ වාර්ෂික වාර්තාවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලන විධානයට අනුකූල වීමේ අවශ්‍යතා දක්වන ආයතනික පාලන වාර්තාව ඇතුළත් වේ. බැංකුවේ 2025 වාර්ෂික වාර්තාවේ 118 සිට 156 දක්වා පිටු වල ආයතනික පාලන වාර්තාව ඇතුළත් කර ඇත.
2. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය		
2.1 අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා වන ක්‍රියා පටිපාටිය	a) නව අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම සඳහා විධිමත් සහ විනිවිදි පෙනෙන ක්‍රියා පටිපාටියක් තිබිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් සඳහා පිළිවෙළක් සහිත අනුප්‍රාප්තිකයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රියා පටිපාටි ද තිබිය යුතුය.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් සිදු කරනු ලබන්නේ 1997 අංක 07 දරන HDFC පනතේ 03(1) ⁝* (ඉ) සහ (ා) වගන්තිවලට සහ 2003 අංක 15 දරන පනතින් සංශෝධිත 04 වන වගන්තියට අනුකූලවය. තවද, අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම්, ඉල්ලා අස්වීම් සහ ඉවත් කිරීම් සම්බන්ධ විධිවිධාන ඇතුළත් වේ.
	b) බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු, වීම බැංකුවේ අනුබද්ධිත සමාගමක් හෝ සහකාර සමාගමක් හැර, වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට නොහැකිය.	අනුකූල වේ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනවලට අනුව, කිසිදු අධ්‍යක්ෂවරයෙකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කර නොමැත.
2.2 අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව	a) අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7කට අඩු නොවිය යුතු අතර 13කට වඩා වැඩි නොවිය යුතුය. අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වය සමඟ සමානුපාතික විය යුතුය.	අර්ධ වශයෙන් අනුකූල වේ 2025.12.31 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකුගෙන් සමන්විත වේ. කෙසේ වෙතත්, 21/03/2025 සිට 23/06/2025 දක්වා සහ 10/08/2025 සිට 03/11/2025 දක්වා කාලය තුළ සිටියේ අධ්‍යක්ෂවරුන් හය දෙනෙකු පමණි.
	b) 2025.12.31 වන විට අධ්‍යක්ෂ මණ්ඩලය තුළ අවම වශයෙන් එක් කාන්තා නියෝජිතවරියක් සිටිය යුතු අතර, සාමාජිකයින් 10 දෙනෙකුට වඩා සිටින අධ්‍යක්ෂ මණ්ඩලවල 2026.12.31 වන විට අවම වශයෙන් කාන්තා නියෝජිතවරියන් දෙදෙනෙකු සිටිය යුතුය.	අනුකූල වේ 2025.12.31 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලය කාන්තා නියෝජිතවරියන් 02 දෙනෙකුගෙන් සමන්විත වේ.

ආයතනික පාලන රාමුව

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
2.3 විධායක අධ්‍යක්ෂවරුන්	බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයෙකු බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස (මෙතැන් සිට "විධායක අධ්‍යක්ෂ" ලෙස හැඳින්වේ) පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට හැකිය. එහෙත් විධායක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොවැඩි විය යුතුය. එවැනි අවස්ථාවක, විධායක අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු බැංකුවේ ඍධ විය යුතුය.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලයට කිසිදු විධායක අධ්‍යක්ෂවරයෙකු පත් කර නොමැත.
2.3 විධායක අධ්‍යක්ෂවරුන්	බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයෙකු බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස (මෙතැන් සිට "විධායක අධ්‍යක්ෂ" ලෙස හැඳින්වේ) පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට හැකිය. එහෙත් විධායක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොවැඩි විය යුතුය. එවැනි අවස්ථාවක, විධායක අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු බැංකුවේ CEO විය යුතුය.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලයට කිසිදු විධායක අධ්‍යක්ෂවරයෙකු පත් කර නොමැත.
2.4 විධායක නොවන අධ්‍යක්ෂවරුන්	විධායක නොවන අධ්‍යක්ෂවරුන් යනු යහපත් හැසිරීම් සහ අඛණ්ඩතාව පිළිබඳ විශ්වාසනීය වාර්තාවක් ඇති, උපායමාර්ග, කාර්යසාධනය සහ සම්පත් පිළිබඳ ගැටළු ඵලදායී ලෙස විසඳීමට සහ බැංකුවේ තිරසාරභාවයට දායක වීමට ස්වාධීන විනිශ්චයක් ලබා දීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා සහ අත්දැකීම් ඇති සුදුසු වෘත්තිකයන් විය යුතුය.	අනුකූල වේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පැතිකඩ 2025 වාර්ෂික වාර්තාවේ 44 සිට 51 දක්වා පිටු වල ඇතුළත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ 1.5.3 (ආ) වගන්තියට අනුව, HDFC අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන්නේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණි. අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ අඛණ්ඩතාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
2.5 ස්වාධීන අධ්‍යක්ෂවරුන්	විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු පහත අවස්ථාවකදී ස්වාධීන ලෙස නොසැලකේ: I. බැංකුවේ සියයට 1කට වඩා වැඩි සෘජු සහ වක්‍ර ඡන්දය ප්‍රකාශ කළ හැකි සහ/හෝ ඡන්දය ප්‍රකාශ කළ නොහැකි කොටස් හිමිකාරිත්වයක් තිබීම; II. අධ්‍යක්ෂවරයා ලෙස පත් කිරීමට පෙර වසර දෙකක කාලය තුළ බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10කට වඩා වැඩි ප්‍රමාණයක ව්‍යාපාරික ගනුදෙනු බැංකුව සමඟ සිදු කර තිබීම; III. අධ්‍යක්ෂවරයා ලෙස පත් කිරීමට පෙර වසර දෙකක කාලය තුළ බැංකුවේ සේවය කර තිබීම; IV. අධ්‍යක්ෂවරයා ලෙස පත් කිරීමට පෙර වසර දෙකක කාලය තුළ බැංකුව සමඟ සැලකිය යුතු ව්‍යාපාරික සබඳතාවක් තිබීම; V. බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන කළමනාකරණ සාමාජිකයෙකු හෝ සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු සමීපතම ඥාතියෙකු ලෙස සිටීම. (මෙහිදී "සමීපතම ඥාතියා" යන්නෙන් කලත්‍රයා හෝ යැපෙන දරුවා අදහස් වේ); VI. බැංකුවේ නිශ්චිත පාර්ශ්වකරුවෙකු නියෝජනය කිරීම; VII. පහත සඳහන් සමාගමක හෝ ව්‍යාපාරික සංවිධානයක සේවකයෙකු, අධ්‍යක්ෂවරයෙකු, සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු වීම හෝ සැලකිය යුතු ව්‍යාපාරික සබඳතාවක් තිබීම: a බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10කට වඩා වැඩි ගනුදෙනු වර්තමානයේ පවතින සමාගමක්, හෝ b බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සේවය කරන, අධ්‍යක්ෂවරුන් වන හෝ කොටස් හිමියන් වන ආයතනයක් (මූල්‍ය අංශයේ බලධාරීන් විසින් නිර්දේශිත පත් කිරීම් හැර), හෝ c බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන්ට බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10කට වඩා වැඩි ගනුදෙනු පවතින ආයතනයක්. VIII. බැංකුවට උපදේශන සේවා සපයන ආයතනයක උපදේශකයෙකු ලෙස පත් කිරීමට පෙර වසරක කාලය තුළ සේවය කර තිබීම; සහ IX. බැංකුවට විගණන සේවා සපයන ආයතනයක හවුල්කාරයෙකු ලෙස පත් කිරීමට පෙර වසරක කාලය තුළ සේවය කර තිබීම. දීර්ඝ කළ අනුකූලතා දිනයන් සහිත උපදෙස් 2.5 ආ) හි අවශ්‍යතා V වගුවේ දක්වා ඇත.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඉන් 5 දෙනෙකු ස්වාධීන අධ්‍යක්ෂවරුන් වන අතර එමගින් බහුතරය නියෝජනය වේ.
	c) බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළි කරන සියලුම ආයතනික සන්නිවේදනයන්හිදී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් පැහැදිලිව හඳුනා ගත යුතුය.	අනුකූල වේ අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු HDFC වෙබ් ද්වාරයෙහි සහ බැංකුවේ 2025 වාර්ෂික වාර්තාවේ 44 සිට 51 දක්වා පිටු වල හෙළිදරව් කර ඇත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
2.6 විකල්ප අධ්‍යක්ෂවරුන් හරහා නියෝජනය	අ) විකල්ප අධ්‍යක්ෂවරයෙකු හරහා නියෝජනය කිරීමේ අවස්ථාව ලබා දී ඇත්තේ මණ්ඩලය විසින් අනුමත කරන ලද සුවිශේෂී අවස්ථාවන්හිදී පමණක් වන අතර, එය බැංකු පනතේ 42 වන වගන්තියේ විධිවිධාන යටතේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව උපරිම වසරක කාලයක් සඳහා පමණි. ආ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කරන්නේ නම්, පත් කරනු ලබන තැනැත්තා ද ස්වාධීන අධ්‍යක්ෂවරයාට අදාළ නිර්ණායක සපුරාලිය යුතුය. ඇ) බැංකුවේ දැනට සිටින අධ්‍යක්ෂවරයෙකු බැංකුවේම තවත් අධ්‍යක්ෂවරයෙකු වෙනුවෙන් විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ නොහැක. ඈ) එක් අධ්‍යක්ෂවරයෙකු වෙනුවෙන් විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලද පුද්ගලයෙකුට එකම මණ්ඩලයේ වෙනත් අධ්‍යක්ෂවරයෙකු වෙනුවෙන් විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ නොහැක.	අනුකූල වේ 1997 අංක 07 දරන HDFC පනත සහ එහි සංශෝධන විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා විධිවිධාන සලසා නොමැත. එබැවින්, එවැනි කිසිදු අධ්‍යක්ෂවරයෙකු පත් කර නොමැත.
2.7 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ගණපූර්ණය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් අවම වශයෙන් අඩක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ගණපූර්ණය විය යුතුය. රැස්වීම සඳහා අවශ්‍ය ගණපූර්ණය සපුරාලන සංඛ්‍යාව සිටියද, රැස්වීමේ සිටින අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වඩා වැඩි පිරිසක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් නොවේ නම්, එම රැස්වීම නිසි ලෙස පිහිටුවා ඇතැයි නොසැලකේ. බලපත්‍රලාභී බැංකු 2026.01.01 වන විට මෙම විධානයට අනුකූල විය යුතුය.	අනුකූල වේ 2025 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 5-8 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ 2.2.1 (ඇ) වගන්තියට අනුව අවශ්‍ය ගණපූර්ණය අධ්‍යක්ෂවරුන් 5 දෙනෙකි. සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍ය ගණපූර්ණය සහිතව පවත්වන ලදී. රැස්වීම් සංඛ්‍යාව පිළිබඳ විස්තර 2025 වාර්ෂික වාර්තාවේ 113 පිටුවේ දැක්වේ.
3. අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම්		
3.1 සුදුසුකම් සහ අබණ්ඩතාව තක්සේරු කිරීම සඳහා වන නිර්ණායක	බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන හෝ සේවය කිරීමට කැමති අයෙකුගේ සුදුසුකම් සහ අබණ්ඩතාව තීරණය කිරීම සඳහා බැංකු පනතේ 42 වන සහ 76H වන වගන්තියේ විධිවිධාන අදාළ වේ. අනුකූල නොවීම අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස දිගටම කටයුතු කිරීමට අදාළ පුද්ගලයා නුසුදුස්සෙකු කරනු ඇත. බැංකු පනතේ 42 සහ 76H වගන්තිවලට අනුව අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට නියමිත සෑම පුද්ගලයෙකුගේම සුදුසුකම් සහ අබණ්ඩතාව සඳහා බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.	අනුකූල වේ සියලුම අධ්‍යක්ෂ පත් කිරීම් සඳහා බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ සුදුසුකම් සහ අබණ්ඩතාව පිළිබඳ අනුමැතිය ලබාගෙන ඇත.
3.2 අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සඳහා අමතර අවශ්‍යතා	අ) අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන පුද්ගලයෙකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුය. ආ) ප්‍රධාන විධායක නිලධාරී තනතුරක් හෝ ප්‍රධාන කළමනාකරණ තනතුරක් දරන අධ්‍යක්ෂවරයෙකු හැර වෙනත් අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර නවයකට නොවැඩි විය යුතුය. ඇ) බැංකුවේ අනුබද්ධිත සමාගම් හෝ සහකාර සමාගම් ඇතුළුව සමාගම්/ආයතන 20කට වඩා වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂවරයෙකු ලෙස තනතුරු දැරිය නොහැක. ඈ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස වගකීම් ඉටු කිරීමට අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් කාලයක් තිබිය යුතුය.	අනුකූල වේ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනවලට අනුව, කිසිදු අධ්‍යක්ෂවරයෙකු අවුරුදු 70කට වඩා වැඩි වයස්ගත හෝ වසර 9ක සේවා කාලය ඉක්මවා ගිය අය නොවේ. එසේම කිසිදු අධ්‍යක්ෂවරයෙකු සමාගම් 20කට වඩා වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂ ධුර දරන්නේ නැත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
3.3 විවේකී කාලසීමාව	ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරීවරයෙකු, එම බැංකුවේ තමා දැරූ තනතුරෙන් ඉවත් වූ දින සිට මාස හයක කාලයක් අවසන් වීමට පෙර, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන තවත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරීවරයෙකු ලෙස පත් නොකළ යුතුය. ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය වන බලපත්‍රලාභී බැංකු වල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිසංස්කරණය කිරීමේදී විශ්‍රාමික බැංකුකරුවන්ගේ විශේෂඥ දැනුම අවශ්‍ය විය හැකි වැනි සුවිශේෂී අවස්ථාවන්හිදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතියට යටත්ව මෙයට ඕනෑම වෙනසක් කළ හැක.	අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රකාශනවලට අනුව, 2025 වසර තුළ එවැනි පත් කිරීම් සිදු වී නොමැත.
4. කාර්යයන් පැවරීම සිය කාර්යයන් පැවරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය පහත අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.		
4.1 වගකීම් බෙදීම	බලය සහ අධිකාරිය පිළිබඳ විශාල සමතුලිතතාවයක් සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් සහ ප්‍රධාන කළමනාකරණ මට්ටමින් වගකීම්වල පැහැදිලි බෙදීමක් තිබිය යුතුය, එවිට බලතල කිසිදු පුද්ගලයෙකු තුළ සංකේන්ද්‍රණය නොවේ.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය අධිකාරිය අධ්‍යක්ෂ මණ්ඩල උප-කමිටු වෙත පවරනු ලබන අතර, එම උප-කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරයි. සුදුසු පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් පවරා නොමැති නම්, තීරණ ගැනීමේ අධිකාරියක් ඒවා සතු නොවේ. උප-කමිටු විසින් කරනු ලබන නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු පරිදි අනුමත කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය බලය පැවරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංශෝධිත බලය පැවරීමේ අධිකාරිය අනුමත කර ඇත.
4.2 අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සඳහා විශේෂ කරුණු	බැංකුවේ මගපෙන්වීම සහ පාලනය ස්ථිරවම එහි අධිකාරිය යටතේ පවතින බව සහතික කිරීම සඳහා, තීරණ ගැනීම සඳහා පමණක් වෙන් කර ඇති කරුණු පිළිබඳ විධිමත් කාලසටහනක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු විය යුතුය.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල ක්ෂේත්‍ර HDFC පනතේ 08 සහ 13 වගන්ති මගින් පාලනය වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පමණක් විශේෂයෙන් වෙන් කර ඇති කරුණු ඇතුළත් අධිකාරී අනුකෘතියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.
4.3 පැවරීම සඳහා සීමාවන්	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කිසියම් කරුණක් උප-කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරී, විධායක අධ්‍යක්ෂවරුන්ට හෝ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ට පැවරීම මගින්, සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් ඉටු කිරීමේ හැකියාව සැලකිය යුතු ලෙස බාධාවට හෝ අඩුවීමට ලක් නොවිය යුතුය.	අනුකූල වේ බලය පැවරීමේ අනුකෘතිය, අදාළ TORs වල දක්වා ඇති අධිකාරිය සහ අදාළ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි අත්පොත් සහ අභ්‍යන්තර චක්‍රලේඛවල දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩල උප-කමිටු, කළමනාකරණ කමිටු සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් හරහා බලතල පවරා ඇත. එම බලධාරීන් විසින් කරනු ලබන නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු පරිදි අනුමත කරනු ලබයි.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
4.4 බලය පැවරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම	බැංකුවේ අවශ්‍යතාවලට අදාළව පවතින බව සහතික කිරීම සඳහා බලය පැවරීමේ ක්‍රියාවලීන් වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කළ යුතුය.	අනුකූල වේ අධිකාරී අනුකෘතිය මුලින්ම 2013.07.26 දින සම්මත කර ඇති අතර එය ක්‍රියාත්මක වේ. පසුව 2020 වසරේදී අධිකාරී අනුකෘතිය සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට ඇතුළත් කරන ලදී. එම ප්‍රතිපත්ති සහ TORs වල තීරණය කර ඇති කාලසීමාවන් අනුව බලය පැවරීම සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සතු විධිමත් ක්‍රියා පටිපාටියක් පවතී. අලුතින් බඳවාගත් නිලධාරීන්ට වගකීම් පැවරීම සඳහා මූල්‍ය බලය පැවරීම සංශෝධනය කර ඇත.
5. සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී		
	සෑම බැංකුවකම කළමනාකරණය සඳහා ප්‍රධාන අංශ දෙකක් ඇත: (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරනු ලබන සමස්ත පාලනය, සහ (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික අරමුණු, ආයතනික වටිනාකම්, සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටිවලට අනුකූලව ප්‍රධාන විධායක නිලධාරී විසින් සිදු කරනු ලබන බැංකුවේ දෛනික කළමනාකරණය.	අනුකූල වේ HDFC පනතට අනුව, සභාපතිවරයාගේ සහ සාමාන්‍යාධිකාරිවරයාගේ පත් කිරීම් සහ බලතල වෙන වෙනම සඳහන් කර ඇත. සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී රැ සාමාන්‍යාධිකාරිවරයා යන භූමිකාවන් පුද්ගලයින් දෙදෙනෙකු විසින් ඉටු කරනු ලබයි. සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත පාලනය සඳහා වගකීම් දරන අතරතුර, ප්‍රධාන විධායක නිලධාරී විසින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික අරමුණු, ආයතනික වටිනාකම්, සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටිවලට අනුකූලව බැංකුවේ දෛනික කළමනාකරණය පරීක්ෂා කරයි.
5.1 සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී අතර වගකීම් බෙදීම	සභාපතිවරයා සහ සෘධ යන භූමිකාවන් වෙන් වෙන් වශයෙන් පැවතිය යුතු අතර එම භූමිකාවන් දෙකම එකම පුද්ගලයෙකු විසින් ඉටු නොකළ යුතුය. සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී අතර වගකීම් බෙදීම පැහැදිලිව ස්ථාපිත කර ලිඛිතව දැක්විය යුතුය.	අනුකූල වේ HDFC පනත මඟින් සභාපති සහ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී යන තනතුරු වෙන් කරයි. පුද්ගලයින් දෙදෙනෙකු සභාපති සහ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී යන භූමිකාවන් දරයි. HDFC පනතට අනුව, සාමාන්‍යාධිකාරිවරයාගේ පත් කිරීම සහ බලතල 14 වන වගන්තිය යටතේ වෙන වෙනම සඳහන් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ 6.3 වගන්තිය සභාපතිවරයාගේ රාජකාරි සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කර ඇත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
5.2 සභාපතිවරයාගේ සුදුසුකම්	අ) සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය. ආරම්භක පත්වීමෙන් පසු සභාපතිවරයා ස්වාධීන නොවන තත්ත්වයට පත් වුවහොත්, මාස හයකට නොවැඩි කාලයක් සඳහා අන්තර්කාලීන සැකැස්මක් ලෙස, සුදුසු පරිදි ලේඛනගත යොමු කොන්දේසි සහිතව ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙස ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නම් කළ යුතුය. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ නාමයෝජනාව බැංකුවේ වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කළ යුතුය. ආ) ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු දැනට සභාපතිවරයා ලෙස සේවය කරන්නේ නම්, 3 වන විධානය ඇතුළු අදාළ නීති සහ රෙගුලාසිවලට යටත්ව, 2027.12.31 දිනට නොඉක්මවන කාලයක් සඳහා සභාපතිවරයා ලෙස සේවය කිරීමට ඔහුට අවසර දිය හැක. ඇ) මෙම විධානයේ බලාත්මක වීමේ දිනයෙන් පසු පත් කරනු ලබන සභාපතිවරයෙකු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය.	අනුකූල වේ මුදල් අමාත්‍යාංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කර ඇත්තේ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන පී. ජේ. ජයසිංහ මහතාය.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
5.3 සභාපතිවරයාගේ වගකීම්	සභාපතිවරයා පහත කරුණු ඉටු කළ යුතුය:	අර්ධ වශයෙන් අනුකූල වේ
	අ) මණ්ඩලයට නායකත්වය ලබා දීම සහ මණ්ඩලය ඵලදායී ලෙස ක්‍රියා කරන බවත් එහි වගකීම් නිසි ලෙස ඉටු කරන බවත් සහතික කිරීම;	අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික ස්වයං-ඇගයීම් ක්‍රියාවලිය මෙම අවශ්‍යතා ආවරණය කරයි.
	ආ) සියලුම ප්‍රධාන සහ සුදුසු කරුණු නියමිත වේලාවට මණ්ඩලය විසින් සාකච්ඡා කරන බව සහතික කිරීම;	කෙසේ වෙතත්, 2025 වසර සඳහා ස්වයං-ඇගයීම් සමාලෝචනය මණ්ඩලය විසින් සිදු කර නොමැත.
	ඇ) සෑම මණ්ඩල රැස්වීමක් සඳහාම න්‍යාය පත්‍රය අනුමත කිරීම;	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා වන න්‍යාය පත්‍රය සභාපතිවරයා සමඟ සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් සකස් කරනු ලැබේ.
	ඈ) මණ්ඩල රැස්වීම්වලදී මතු වන කරුණු පිළිබඳව සියලුම අධ්‍යක්ෂවරුන් නිසි ලෙස දැනුවත් කර ඇති බව සහ ප්‍රමාණවත් තොරතුරු නියමිත වේලාවට ලැබෙන බව සහතික කිරීම;	රැස්වීම්වලට ප්‍රථම ප්‍රමාණවත් කාලයක් ලබා දී මණ්ඩල ලේඛන ඉදිරිපත් කිරීම මගින්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී මතුවන කරුණු පිළිබඳව සියලුම අධ්‍යක්ෂවරුන්ට සුදුසු පරිදි දැනුවත් කර ඇති බව සභාපතිවරයා සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දින 07කට පෙර අධ්‍යක්ෂවරුන් වෙත යවන ලද මණ්ඩල ලේඛන/න්‍යාය පත්‍ර අපි නිරීක්ෂණය කළෙමු. මෙම ලේඛන Board Pac පද්ධතියට උඩුගත කර තිබුණි.
	ඉ) සියලුම අධ්‍යක්ෂවරුන් මණ්ඩලයේ කටයුතු සඳහා පූර්ණ සහ ක්‍රියාකාරී දායකත්වයක් ලබා දීමට දිරිමත් කිරීම;	සියලුම අධ්‍යක්ෂවරුන්ට සම්පූර්ණ සහ ක්‍රියාශීලී දායකත්වයක් ලබා දීමට දිරිගන්වන සුළු අධ්‍යක්ෂ මණ්ඩල ස්වයං-ඇගයීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, 2025 වර්ෂය සඳහා කිසිදු ඇගයීමක් සිදු කර නොතිබුණි.
	ඊ) විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී දායකත්වය පහසු කිරීම;	මණ්ඩල ලේකම්වරයා විසින් තහවුරු කරන ලද පරිදි, සභාපතිවරයා ප්‍රධාන කළමනාකාරීත්වයේ පුද්ගලයින්ගේ අධීක්ෂණයට හෝ වෙනත් කිසිදු විධායක රාජකාරියකට සෘජුව සම්බන්ධ නොවේ.
	උ) විවේචනාත්මක සහ නිර්මාණාත්මක සාකච්ඡා දිරිමත් කිරීම;	ප්‍රධාන කොටස් හිමියා ලෙස නිවාස සංවර්ධන අධිකාරිය නියෝජනය කරන සාමාජිකයෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අතර, එය ප්‍රධාන කොටස් හිමියා සහ බැංකුව අතර ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීමට උපකාරී වේ.
	ඌ) ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ සෘජු අධීක්ෂණය වැනි විධායක රාජකාරිවල නිරත නොවීම;	අනෙකුත් කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනය වාර්ෂික මහා සභා රැස්වීමේදී සිදු කෙරේ. අවසාන වාර්ෂික මහා සභා රැස්වීම 2025.06.23 දින පවත්වා ඇත.
	එ) කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීම.	
5.4 ප්‍රධාන විධායක නිලධාරී ගේ හැසිරීම	අ) ප්‍රධාන විධායක නිලධාරී බැංකුවේ දෛනික මෙහෙයුම් සහ ව්‍යාපාර කළමනාකරණය සඳහා වගකිව යුතු ඉහළම විධායක නිලධාරියා ලෙස ක්‍රියා කළ යුතු අතර වෙනත් කිසිදු විධායක කාර්යයක් නොදැරිය යුතුය.	අනුකූල වේ
	ආ) බැංකුවේ අනුබද්ධ හෝ සහකාර සමාගමක විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස හැර, වෙනත් බලපත්‍රලාභී බැංකුවක හෝ වෙනත් ආයතනයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීමට හෝ නම් කිරීමට නොහැකිය.	අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ 8.5 වගන්තියට අනුව, "ප්‍රධාන විධායක නිලධාරී " බැංකුවේ දෛනික මෙහෙයුම් සහ ව්‍යාපාර කළමනාකරණය සඳහා වගකිව යුතු ඉහළම විධායක නිලධාරියා ලෙස ක්‍රියා කරයි.
	ඇ) අනුබද්ධ සමාගමක විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් වුවහොත්, එම කටයුතු ප්‍රධාන විධායක නිලධාරී ලෙස බැංකුව තුළ දරන වගකීම්වලට බාධාවක් නොවන බව සහතික කළ යුතුය.	ප්‍රධාන විධායක නිලධාරී වෙනත් කිසිදු බලපත්‍රලාභී බැංකුවක හෝ වෙනත් ආයතනයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස කිසිදු තනතුරක් දරන්නේ නැත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
5.5 ප්‍රධාන විධායක නිලධාරී ගේ සුදුසුකම	ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් කරනු ලබන පුද්ගලයා බැංකු පනතේ 44A සහ 76H වගන්තිවලට අනුව එම තනතුර දැරීමට සුදුසු පුද්ගලයෙකු විය යුතු අතර, බැංකුවේ මෙහෙයුම්වල පරිමාණය සහ සංකීර්ණත්වය අනුව මූලික බැංකු කටයුතු පිළිබඳ ප්‍රමාණවත් අධිකාරියක්, දැනුමක්, නිපුණතාවයක් සහ විශේෂඥතාවක් තිබිය යුතුය.	අනුකූල වේ සාමාන්‍යාධිකාරී රැප්‍රධාන විධායක නිලධාරී පත් කිරීමට පෙර, ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සුදුසුකම් සහ අඛණ්ඩතාව නිසි ලෙස ලබාගෙන ඇත. සාමාන්‍යාධිකාරී වන එච්. සී. ලොකුගීගාන මහතාගේ සුදුසුකම් සහ අඛණ්ඩතාව පිළිබඳ දිවුරුම් ප්‍රකාශය ලබාගෙන ඇත
6.අධ්‍යක්ෂ මණ්ඩල කමිටු		
	සෑම බලපත්‍රලාභී බැංකුවකටම විධානයන්හි දක්වා ඇති පරිදි අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු පහක් තිබිය යුතුය.	අනුකූල වේ බැංකුව විසින් නියාමන අවශ්‍යතා පරිදි පහත සඳහන් අනිවාර්ය අධ්‍යක්ෂ මණ්ඩල උප-කමිටු පිහිටුවා ඇත: • අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව • අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වේතන කමිටුව • අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා සහ පාලන කමිටුව • අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව • අධ්‍යක්ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කාර්ය සටහන්වලට අනුව, අනුකමිටුවල කටයුතුවල සාරාංශ මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සභාගත කර සාකච්ඡා කර ඇති බව නිරීක්ෂණය විය. 2025 වාර්ෂික වාර්තාවට අනුව, එක් එක් කමිටුව පිළිබඳ වාර්තාවක්, එහි රාජකාරි, භූමිකාවන් සහ කාර්යසාධනය පිළිබඳ සාරාංශයක් ද ඇතුළුව, පිටු 194 සිට 207 දක්වා අනාවරණය කර ඇති බව නිරීක්ෂණය විය.
6.1 අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සඳහා අවශ්‍යතා	අ) සෑම කමිටුවක්ම සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය.	අනුකූල වේ සෑම අධ්‍යක්ෂ මණ්ඩල උප-කමිටුවකම වාර්තා/කාර්ය සටහන් සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ.
	ආ) සෑම කමිටුවකම අධිකාරිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කළ යුතුය. විශේෂයෙන්ම, එම කමිටුවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ක්‍රියා කිරීමට බලයක් තිබේද, නැතහොත් යම් කරුණක් පරීක්ෂා කර නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීමට පමණක් බලයක් තිබේද යන්න පැහැදිලි විය යුතුය.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩල උප-කමිටුවල රාජකාරි සහ වගකීම් ලැයිස්තුගත කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යොමු කොන්දේසි පවතී.
	ඇ) සෑම කමිටුවක් සඳහාම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යොමු කොන්දේසි පැවතිය යුතුය.	අනුකූල වේ සියලුම උප-කමිටු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද TOR පවතී.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	ඈ) සෑම කමිටුවක්ම ලේකම්වරයෙකු පත් කළ යුතුය. ඔහු/ඇය මූලික වශයෙන් රැස්වීම් සංවිධානය කිරීම, කාර්ය සටහන් පවත්වා ගැනීම සහ කමිටුවේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ වාර්තා තබා ගැනීම සිදු කළ යුතුය. සියලුම කමිටුවල කාර්ය සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.	අනුකූල වේ මණ්ඩල ලේකම්වරයා සියලුම කමිටුවල ලේකම්වරයා ලෙස කටයුතු කරයි. උප-කමිටු රැස්වීම්වල කාර්ය සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අනුමත කරනු ලැබේ.
	ඉ) සෑම කමිටුවකම ගණපූර්ණය සඳහා අවම වශයෙන් කමිටු සාමාජිකයින්ගෙන් අඩක්වත් සිටිය යුතුය.	අනුකූල වේ උප-කමිටු TOR වල ගණපූර්ණ අවශ්‍යතාවය ඇතුළත් වන අතර එය සාමාජිකයින්ගෙන් අවම වශයෙන් අඩක් විය යුතුය. උප-කමිටු පැමිණීම සහ අවශ්‍ය ගණපූර්ණය සපුරා ඇත.
	ඊ) සෑම කමිටුවකම කාර්යසාධනය, රාජකාරි සහ භූමිකාවන් පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික මහා සභා රැස්වීමේදී ඉදිරිපත් කළ යුතුය.	අනුකූල වේ බැංකුව විසින් 2025 වාර්ෂික වාර්තා කෙටුම්පතේ එක් එක් කමිටුවේ කාර්යසාධනය හෙළිදරව් කර ඇත.
6.2 විගණන කමිටුව	අ) කමිටුවේ සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර ඔහු සභාපති හෝ වෙනත් කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක සභාපති නොවිය යුතුය. ඔහු මූල්‍ය, ගිණුම්කරණ සහ/හෝ විගණන පිළිබඳ සුදුසුකම් සහ පළපුරුද්ද ඇති, පිළිගත් වෘත්තීය ගිණුම්කරණ ආයතනයක සාමාජිකයෙකු විය යුතුය.	අර්ධ වශයෙන් අනුකූල වේ විගණන කමිටුවේ සභාපති කේ. බී. විජේරත්න මහතා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වන අතර, ප්‍රධාන වශයෙන් රක්ෂණ සහ බැංකු ක්ෂේත්‍රයේ පුළුල් අත්දැකීම් සහිතව, ප්‍රමුඛ පෙළේ මූල්‍ය ආයතනවල ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව තනතුරු දරමින් දේශීය හා විදේශීය විගණන සහ මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ වසර 38කට වැඩි අත්දැකීම් කාලයක් සතු කර ගෙන ඇත. කෙසේ වෙතත්, ඔහු දැනට සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ සභාපතිවරයා ලෙස ද කටයුතු කරයි.
	ආ) කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතු අතර බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය. සාමාජිකයින් බැංකුවේ මෙහෙයුම්වල විශාලත්වය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණතාවයට ගැලපෙන පරිදි මූල්‍ය, ගණකාධිකරණය සහ විගණනය පිළිබඳ කුසලතා සහ විශේෂඥ දැනුම පිළිබඳ සාමූහික සමබරතාවයකින් යුක්ත විය යුතුය.	අනුකූල වේ කමිටුවේ සියලුම සාමාජිකයින් සුදුසුකම් ලත් විධායක නොවන සහ ස්වාධීන අධ්‍යක්ෂවරුන් වේ. අධ්‍යක්ෂවරුන්ගේ පැතිකඩ බැංකුවේ නිල වෙබ් අඩවියේ පළ කර ඇත.
	ඇ) ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්ගෙන් විගණන කමිටුවේ සාමාජිකයින් බහුතරයක් සමන්විත නොවිය යුතු අතර, අනෙක් අතට ද එසේම විය යුතුය.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙකු ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙන් ද, අනෙක් අතට ද පත් කර ඇත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	ඈ)කමිටුව විසින් පහත කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය: I. අදාළ නීතිවලට අනුකූලව විගණන සේවා සඳහා බාහිර විගණකවරයෙකු පත් කිරීම; II. මහ බැංකුව විසින් බාහිර විගණකවරුන් වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම; III. අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් යෙදීම; සහ IV. බාහිර විගණකවරයාගේ සේවා කාලය, විගණන ගාස්තු සහ ඉල්ලා අස්වීම හෝ සේවයෙන් පහ කිරීම කෙසේ වෙතත්, බාහිර විගණකවරයාගේ නියැලීම වසර 6කට නොවැඩි විය යුතු අතර, වසර තුනකට වරක් විගණන හවුල්කරු වෙනස් කළ යුතු.	අනුකූල වේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණක ලෙස කටයුතු කරයි. බාහිර විගණකවරුන් වෙත මහ බැංකුව විසින් වරින් වර නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුකූල වීම කමිටුව විසින් සහතික කරනු ලැබේ.
	ඉ) අදාළ ප්‍රමිතීන් සහ හොඳම භාවිතයන්ට අනුකූලව බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, අඛණ්ඩතාව, වෛෂයිකත්වය සහ විගණන ක්‍රියාවලීන්හි ඵලදායීතාවය කමිටුව විසින් සමාලෝචනය සහ අධීක්ෂණය කළ යුතුය.	විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණක වන බැවින්, ස්වාධීනත්වය තහවුරු වී ඇත.
	ඊ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බාහිර විගණකවරුන් වෙත නිකුත් කර ඇති මාර්ගෝපදේශ යටතේ අවසර දී ඇති විගණන නොවන සේවාවන් ලබා ගැනීම සඳහා බාහිර විගණකවරයෙකු සම්බන්ධ කර ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් කමිටුව විසින් සංවර්ධනය කර ක්‍රියාත්මක කළ යුතුය. මෙම සේවාවන් ලබා ගැනීම බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වයට බලපෑමක් නොවන බව කමිටුව සහතික කළ යුතුය. එය තක්සේරු කිරීමේදී කමිටුව සලකා බැලිය යුතු කරුණු: (i) විගණන ආයතනයේ කුසලතා සහ අත්දැකීම් අනුව එය විගණන නොවන සේවාවන් සැපයීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු ද යන්න; (ii) බාහිර විගණකවරයා විසින් එවැනි සේවාවන් සැපයීම හේතුවෙන් විගණනය සිදු කිරීමේදී එහි අපක්ෂපාතීත්වයට සහ/හෝ ස්වාධීනත්වයට කිසිදු තර්ජනයක් එල්ල නොවන බව සහතික කිරීම සඳහා සුරක්ෂිතතා පියවරයන් ක්‍රියාත්මක වේද යන්න; සහ, (iii)විගණන නොවන සේවාවන්හි ස්වභාවය මෙන්ම තනි තනිව සහ සමස්තයක් ලෙස පවතින ගාස්තු මට්ටම් විගණන ආයතනයට සාපේක්ෂව බාහිර විගණකවරයාගේ අපක්ෂපාතීත්වයට සහ/හෝ ස්වාධීනත්වයට යම් තර්ජනයක් එල්ල කරන්නේද	
	ග) විගණනය ආරම්භ කිරීමට පෙර, විගණනයේ ස්වභාවය සහ විෂය පථය පිළිබඳව බාහිර විගණකවරයා සමඟ සාකච්ඡා කර අවසන් කළ යුතුය. එයට ඇතුළත් විය යුත්තේ: I. ආයතනික පාලනය සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීම; II. අදාළ ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ වාර්තා කිරීමේ බැඳීම්; සහ III. විගණන ආයතන චකකට වඩා සම්බන්ධ වන විට ඒවා අතර සම්බන්ධීකරණයයි.	අනුකූල වේ අදාළ ප්‍රමිතීන් වෙත යොමු වෙමින් විගණකාධිපතිවරයා විසින් විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කර ඇත.

ආයතනික පාලන රාමුව

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	හ) බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ අඛණ්ඩතාව සහ ගිණුම්කරණ හා අනෙකුත් අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහතික කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති/පද්ධති සහ අභ්‍යන්තර පාලන රාමුව සමාලෝචනය කළ යුතුය.	අනුකූල වේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ විනිවිදභාවය, අඛණ්ඩතාව සහ විශ්වසනීයත්වය මෙන්ම අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහතික කිරීම සඳහා කමිටුව විසින් බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, පද්ධති සහ අභ්‍යන්තර පාලන රාමුව සමාලෝචනය කරයි. 2025.09.30 දිනට අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා වූ අතුරු මූල්‍ය ප්‍රකාශනවලට අදාළ අභ්‍යන්තර විගණන නිරීක්ෂණ කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා විමර්ශන වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරයි.
	(i) බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික වාර්තාව, ගිණුම් සහ අනාවරණය සඳහා සකස් කරන ලද කාර්තුමය වාර්තා සහ එහි අන්තර්ගත වැදගත් මූල්‍ය වාර්තාකරණ තීරණවල අඛණ්ඩතාව අධීක්ෂණය කිරීම සඳහා කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර බැංකුවේ වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තා සමාලෝචනය කිරීමේදී, කමිටුව විශේෂයෙන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය: (i) ප්‍රධාන විනිශ්චය කළ යුතු ක්ෂේත්‍ර; (ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිළිවෙත්වල සිදුවන ඕනෑම වෙනස්කමක්; (iii) විගණනයෙන් පැන නගින වැදගත් ගැලපීම්; (iv) අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය සහ (v) අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ අනෙකුත් නෛතික අවශ්‍යතාවලට අනුකූල වීම.	අනුකූල වේ කමිටුව විසින් මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනමින් මූල්‍ය තොරතුරු සමාලෝචනය කරයි. විගණන කමිටුවේ විෂය පථයට නොගැලපෙන කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මාසික මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිරීක්ෂණ විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
	ඊ) අතුරු සහ අවසන් විගණනවලින් පැන නගින ගැටළු සහ බාහිර විගණකවරයාට සාකච්ඡා කිරීමට අවශ්‍ය ඕනෑම කරුණක් සහ ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම නොමැති විට අවශ්‍ය නම් සාකච්ඡා කළ යුතු කරුණු ද ඇතුළුව කමිටුව විසින් සාකච්ඡා කළ යුතුය.	අනුකූල වේ විධායක කළමනාකාරිත්වය නොමැති අවස්ථාවන්හිදී කමිටුව විසින් බාහිර විගණකවරයා සමඟ සාකච්ඡා පවත්වා ඇත.
	ක) බාහිර විගණකවරයාගේ කළමනාකරණ ලිපිය සහ ඊට කළමනාකාරිත්වය ලබා දෙන ප්‍රතිචාර කමිටුව විසින් සමාලෝචනය කළ යුතුය.	අනුකූල වේ හඳුනාගත් ගැටළු නිසි ලෙස ආමන්ත්‍රණය කර ඇති බව සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ඵලදායී ලෙස ක්‍රියාත්මක කර ඇති බව සහතික කිරීම සඳහා කමිටුව විසින් කළමනාකරණ ලිපිය සහ ප්‍රතිචාර සමාලෝචනය කරයි. කෙසේ වෙතත්, 2024 වසරට අදාළ කළමනාකරණ ලිපිය තවමත් විගණන කමිටුවේ සාකච්ඡා වෙමින් පවතින අතර එය තවමත් අවසන් කර නොමැත.
	ල) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයන් සම්බන්ධයෙන් කමිටුව පහත පියවර ගත යුතුය:	අනුකූල වේ

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	(i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත්වල ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සහ එහි කාර්යයන් ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුවට අවශ්‍ය අධිකාරිය ඇති බව තහවුරු කර ගැනීම.	2025 වසර සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.
	(ii) අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බව සහතික කිරීම;	2025 වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන වැඩසටහන අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. 2025 වර්ෂය සඳහා වන ශාඛා විගණන සාරාංශය සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල ද විගණන කමිටුව විසින් සමාලෝචනය කර ඇති අතර, අවශ්‍ය වූ විට සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත.
	(iii)ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය පිළිබඳ ඇගයීම් සමාලෝචනය කිරීම.	බැංකුවේ අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යසාධන ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේදී (01 BAC - 2026) සාකච්ඡා කරන ලදී.
	(iv) CIA, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහ බාහිර සේවා සපයන්නන් පත් කිරීම හෝ සේවයෙන් පහ කිරීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.	වසර තුළ එවැනි තත්ත්වයක් පැන නැඟී නොමැත.
	(v) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහ ඕනෑම බාහිර සේවා සපයන්නන්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත් කර ඇති බවට සහතික කිරීම සහ ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ බාහිර සේවා සපයන්නන්ට ඉල්ලා අස්වීමට හේතු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීම; සහ,	වසර තුළ එවැනි තත්ත්වයක් පැන නැඟී නොමැත.
	(vi)අභ්‍යන්තර විගණන කාර්යයන් එය විගණනය කරන ක්‍රියාකාරකම්වලින් ස්වාධීන බව සහ එය අපක්ෂපාතීව සහ වෘත්තීය සැලකිල්ලෙන් සිදු කරන බව සහතික කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රඥප්තියේ අභ්‍යන්තර විගණන කාර්යභාරය යටතේ ඇති 11 වන කරුණට අනුව, අභ්‍යන්තර විගණන කාර්යභාරය එය විගණනය කරන ක්‍රියාකාරකම්වලින් ස්වාධීන බවත්, එය අපක්ෂපාතීව, දක්ෂතාවයෙන් සහ නිසි වෘත්තීය සැලකිල්ලෙන් සිදු කරන බවත් සහතික කරයි. ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට වාර්තා කරන අතර එය ස්වාධීනත්වය සහ අපක්ෂපාතීත්වය සුරක්ෂිත කිරීමට උපකාරී වේ.
	ම) අභ්‍යන්තර විමර්ශනවල ප්‍රධාන සොයාගැනීම් සහ ඒ සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාර කමිටුව විසින් සලකා බැලිය යුතුය.	අනුකූල වේ අභ්‍යන්තර විමර්ශනවල ප්‍රධාන සොයාගැනීම් සමාලෝචනය කර, නිසි නිවැරදි කිරීමේ පියවර ගෙන ඇති බව සහ මූලික ගැටළු ඵලදායී ලෙස විසඳා ඇති බව සහතික කිරීම සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාර කමිටුව විසින් ඇගයීමට ලක් කරයි.
	බ) අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අවදානම් නිලධාරී, ප්‍රධාන අනුකූලතා නිලධාරී, වෙනත් ඕනෑම ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් සහ බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙකු අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා කමිටුවේ ආරාධනය මත රැස්වීම්වලට සහභාගී විය හැකිය. කෙසේ වෙතත්, වසරකට අවම වශයෙන් දෙවරක්වත්, විධායක අධ්‍යක්ෂවරුන් නොමැතිව කමිටුව බාහිර විගණකවරුන් සමඟ රැස්විය යුතුය.	අනුකූල වේ කළමනාකාරිත්වයේ සාමාජිකයින් අදාළ න්‍යාය පත්‍ර අයිතම සඳහා ආරාධනයක් මත මණ්ඩල විගණන කමිටුවට සහභාගී වේ. 2025 වසර තුළ විධායක කළමනාකාරිත්වය නොමැතිව අවස්ථා දෙකකදී විගණන කමිටුව බාහිර විගණකවරයා හමු වී ඇත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	ප) කමිටුව සතු විය යුතු දෑ: I. චිහි යොමු කොන්දේසිවලට අයත් ඕනෑම කරුණක් විමර්ශනය කිරීමට පැහැදිලි අධිකාරියක්; II. ඒ සඳහා අවශ්‍ය සම්පත්; III. තොරතුරු වෙත පූර්ණ ප්‍රවේශය; සහ IV. බාහිර වෘත්තීය උපදෙස් ලබා ගැනීමට සහ අවශ්‍ය නම් අදාළ අත්දැකීම් ඇති පුද්ගලයින්ට ආරාධනා කිරීමට ඇති බලය.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මගින් මෙම කරුණු සහතික කරයි. 2025 වසරේදී ප්‍රඥප්තිය සමාලෝචනය කරන ලදී
	ප) කමිටුව නිතිපතා රැස්විය යුතු අතර, සාකච්ඡා කළ යුතු කරුණු පිළිබඳව නියමිත දැනුම් දීමක් සිදු කළ යුතු අතර, සිය රාජකාරි ඉටු කිරීමේදී ගන්නා ලද නිගමන වාර්තා කළ යුතුය.	අනුකූල වේ 2025 වසර තුළ විගණන කමිටු රැස්වීම් 15ක් පවත්වන ලදී. විස්තර බැංකුවේ 2025 වාර්ෂික වාර්තාවේ 111 පිටුවේ දැක්වේ.
	ර) කමිටුවේ ලේකම්වරයා (සමාගම් ලේකම් හෝ ප්‍රධාන අභ්‍යන්තර විගණක විය හැක) කමිටු රැස්වීම්වල සවිස්තරාත්මක කාර්ය සටහන් වාර්තා කර තබා ගත යුතුය.	අනුකූල වේ මණ්ඩල ලේකම්වරයා විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරමින් රැස්වීම්වල සවිස්තරාත්මක කාර්ය සටහන් තබා ගනී.
	ල) කමිටුව (i) මණ්ඩලය විසින් අනුමත කරන ලද තොරතුරු හෙළිකරන්නන්ගේ ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ (ii) එවැනි කරුණු පිළිබඳව සාධාරණ සහ ස්වාධීන විමර්ශනයක් සහ පසු විපරම් ක්‍රියාමාර්ග සඳහා නිසි විධිවිධාන තිබීම සහතික කිරීම.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තොරතුරු හෙළිකරන්නන්ගේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ.
	ව) බැංකුව සහ බාහිර විගණකවරයා අතර සබඳතා අධීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන නියෝජිත ආයතනය ලෙස කමිටුව ක්‍රියා කළ යුතුය.	අනුකූල වේ බැංකුව සහ බාහිර විගණකවරයා අතර සබඳතා අධීක්ෂණය කිරීම සඳහා වන ප්‍රධාන නියෝජිත ආයතනය ලෙස විගණන කමිටුව ක්‍රියා කරයි. බාහිර විගණකවරයා විගණන කමිටුවේ නිත්‍ය ආරාධිතයෙකි.
6.3 මානව සම්පත් සහ වේතන කමිටුව	අ) කමිටුවේ සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩල සභාපති නොවන සහ වඩාත් සුදුසු ලෙස ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය. ආ) කමිටුවේ බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතුය.	අනුකූල වේ කමිටුව සුදුසු ස්වාධීනත්වයකින් යුතුව ව්‍යුහගත කර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩල සභාපති නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් මුලසුන දරනු ලබන අතර බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.
	ඇ) ප්‍රධාන විධායක නිලධාරිට අදාළ කරුණු සාකච්ඡා කරන විට හැර, අනෙකුත් රැස්වීම්වලට ආරාධනය පරිදි ප්‍රධාන විධායක නිලධාරී සහභාගී කරවා ගත යුතුය.	අනුකූල වේ ප්‍රධාන විධායක නිලධාරිට අදාළ කරුණු සාකච්ඡා කරන අවස්ථාවලදී ඔහු සහභාගී නොවිය යුතු බව යොමු කොන්දේසි මගින් සපයා ඇත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	ඈ)අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා වැටුප්, දීමනා, සේවයෙන් ඉවත් වීමේදී හෝ විශ්‍රාම ගැනීමේදී ලබා දෙන විශේෂ ගෙවීම්/ප්‍රතිලාභ සහ අනෙකුත් මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ සම්බන්ධයෙන් වේතන ප්‍රතිපත්තිය තීරණය කිරීම.	අනුකූල වේ අධ්‍යක්ෂවරුන්ගේ වේතනය මුදල් අමාත්‍යාංශය විසින් සකසා ඇති මාර්ගෝපදේශ මත තීරණය කරනු ලැබේ. සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා වන වේතනය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සාමූහික ගිවිසුම මත පදනම්ව මානව සම්පත් සහ වේතන කමිටුව මගින් තීරණය කරනු ලැබේ.
	ඉ) අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා ඉලක්ක සහ අරමුණු නියම කිරීම.	අනුකූල වේ අධ්‍යක්ෂවරුන් සඳහා වන අරමුණු සහ ඉලක්ක ලේඛනගත කර නොමැති අතර, විවිධ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් (ණඑඡ) සඳහා වන අරමුණු සහ ඉලක්ක ඔවුන්ගේ පාලනය යටතේ පවතින අදාළ ඒකක හෝ දෙපාර්තමේන්තු අනුව වීම වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කර ඇත. දෙපාර්තමේන්තු/ශාඛා මට්ටමින් ප්‍රධාන කාර්යසාධන දර්ශක සකසා ඇති අතර සියලුම ්‍රධාන කළමනාකරණ පුද්ගලයින් ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා වගකිව යුතුය.
	ඊ) නියමිත ඉලක්ක සහ අරමුණු වලට වෙරෙහිව ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ කාර්යසාධනය වරින් වර ඇගයීම සහ වේතන, ප්‍රතිලාභ සහ කාර්යසාධනය මත පදනම් වූ දිරිගැන්වීම් සංශෝධනය කිරීමේ පදනම තීරණය කිරීම.	අර්ධ වශයෙන් අනුකූල වේ ප්‍රධාන අභ්‍යන්තර විගණක, අවදානම් නිලධාරී සහ අනුකූලතා නිලධාරී යන අයගේ කාර්යසාධන ඇගයීම් සිදු කර ඇත. කෙසේ වෙතත්, 2025 වසර සඳහා අනෙකුත් ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගෙ කාර්යසාධන ඇගයීම් සිදු කර නොමැත.
	උ) අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධාරිවරයාට සහ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින්ට සේවය අවසන් කිරීමේදී හෝ විශ්‍රාම ගැනීමේදී ලබා දෙන ඕනෑම විශේෂ දීමනාවක්/මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ සඳහා කොටස් හිමියන්ගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගෙන ඇති බව සහතික කිරීම. ශ්‍රී ලංකා රජය බැංකුවේ ඡන්ද බලය සහිත නිකුත් කළ ප්‍රාග ්‍රධනයෙන් සියයට පනහක් (50%) හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරන බලපත්‍රලාභී බැංකු සඳහා, එවැනි පූර්ව අනුමැතිය භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් ලබා ගත යුතුය.	අනුකූල වේ සේවයෙන් ඉවත් වීමේදී හෝ විශ්‍රාම ගැනීමේදී අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා කිසිදු විශේෂ ගෙවීමක්/මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභ ලබා දී නොමැත.
	ඌ) අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා ලබා දෙන වේතනය බැංකුවේ අවදානම් රුචිකත්වයට අනුකූල බව සහතික කිරීම සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමඟ සම්බන්ධීකරණය වීම.	වසර තුළ එවැනි තත්ත්වයක් පැන නැඟී නොමැත.
	ඍ) බලපත්‍රලාභී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත කාර්යසාධනය මත පදනම්ව ලබා දෙන ගෙවීම්, වංචා සහ අරමුදල් අනිසි ලෙස භාවිතා කිරීම් වැනි තත්ත්වයන් යටතේ බැංකුවට සිදු වූ මූල්‍ය අලාභයට සමානුපාතිකව ආපසු අය කර ගැනීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කළ යුතුය. මෙම ක්‍රියා පටිපාටිය සාධාරණ විභාගයක් සහ විනිවිදභාවයකින් යුතුව සිදු විය යුතු අතර, එය ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සේවා කොන්ත්‍රාත්තු වලට ඇතුළත් කළ යුතුය.	අර්ධ වශයෙන් අනුකූල වේ ප්‍රධාන විධායක නිලධාරී රැ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ලේඛනගත කළ ක්ලව් බැක් රාමුවක් නිරීක්ෂණය නොවීය. කෙසේ වෙතත්, වංචා හෝ අරමුදල් අනිසි ලෙස භාවිතා කිරීමක් සිදුවන විට බැංකුවේ අනුමත විනය සංග්‍රහය අනුව ක්‍රියාමාර්ග ගනු ලැබේ.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
6.4 නාමයෝජනා සහ පාලන කමිටුව	අ) කමිටුවේ සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩල සභාපති නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරී ට ඔහුට අදාළ කරුණු සාකච්ඡා කරන විට හැර ආරාධනය පරිදි සහභාගී විය හැක	අනුකූල වේ කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් මෙහෙයවනු ලබන අතර බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. නාමයෝජනා සහ පාලන කමිටු රැස්වීම්වලට ප්‍රධාන විධායක නිලධාරී සහභාගී වී නොමැත.
	ආ) නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හඳුනා ගැනීමට, නම් කිරීමට සහ නිර්දේශ කිරීමට විධිමත් සහ විනිවිද පෙනෙන ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීම.	අනුකූල වේ අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ 1997 අංක 07 දරන HDFC පනතේ 03(1) වගන්තිය සහ එහි සංශෝධනවලට අනුවය. බැංකුවේ බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය මගින් සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය ආවරණය කරයි. HDFC පනතේ 14 වන වගන්තියට අනුව, බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරන සුදුසු පුද්ගලයෙකු සාමාන්‍යාධිකාරී ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුතුය. බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීම සඳහා ද අදාළ වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ නිර්දේශය මත ඔවුන් පත් කරනු ලැබේ.
	ඇ) අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් 3 සහ 8.2 විධානයන්හි දක්වා ඇති නිර්ණායකයන්ට සහ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුව එම තනතුරු දැරීමට සුදුසු පුද්ගලයින් බව සහතික කිරීම.	අනුකූල වේ 2025 වසර සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ අඛණ්ඩතාව පිළිබඳ දිවුරුම් ප්‍රකාශ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගෙන ඇත. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වරුන්ගෙ න් අත්සන් කළ ප්‍රකාශන ලබාගෙන ඇති අතර, ඔවුන් ප්‍රථම වරට ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ලෙස පත් වූ විට සහ උසස්වීම් ලැබූ අවස්ථාවලදී CBSL වෙතින් ඔවුන්ගේ සුදුසුකම් සහ අඛණ්ඩතාව පිළිබඳ අනුමැතිය ලබාගෙන ඇත.
	ඈ) ප්‍රධාන අවදානම් නිලධාරී සහ ප්‍රධාන අනුකූලතා නිලධාරී තෝරා ගැනීමේදී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ අදහස් ද, ප්‍රධාන අභ්‍යන්තර විගණක තෝරා ගැනීමේදී විගණන කමිටුවේ අදහස් ද ලබා ගැනීම.	අනුකූල වේ 2025 මූල්‍ය වර්ෂය තුළ ප්‍රධාන අවදානම් නිලධාරී, ප්‍රධාන අනුකූලතා නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරුවල කිසිදු වෙනසක් සිදු නොවීය.
	ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් සමස්තයක් ලෙස ඉටු කිරීම සඳහා අදාළ අධ්‍යක්ෂවරයා විසින් ලබා දී ඇති කාර්යසාධනය සහ දායකත්වය වරින් වර ඇගයීම හරහා වත්මන් අධ්‍යක්ෂවරුන් නැවත තේරී පත්වීම සඳහා නිර්දේශ කිරීම (හෝ නොකිරීම).	අනුකූල වේ HDFC පනතේ 3(4) (e) වගන්තියට අනුව, තේරී පත් වූ අධ්‍යක්ෂවරයෙකු තම නිල කාලය අවසන් වී ඉවත් වන විට තවත් අයෙකු නැවත තේරී පත්වීමට සුදුසුකම් ලබයි. ආචාර්ය ක්‍රිශාන්ත මහතා කොටස් හිමි අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත තේරී පත් වූ අතර, ඔහුගේ එම නැවත පත් වීම නාමයෝජනා සහ පාලන කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	f) උපදෙස් 2.5 ආ) අනුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයේ තත්ත්වය කාර්තුමය වශයෙන් ඇගයීම සහ එවැනි අධ්‍යක්ෂවරුන්ට ස්වාධීනව රාජකාරි ඉටු කිරීමේ හැකියාවට බාධාවක් විය හැකි කිසියම් අභිලාෂයන් ගැටුමක් තිබේද යන්න විමර්ශනය කිරීම සහ ස්වාධීන තත්ත්වයේ වෙනස්කම් (ඇත්නම්) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දීම;	අනුකූල වේ බැංකුව විසින් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ වාර්ෂික ඇගයීම් සිදු කරනු ලබන අතර, ඔවුන්ගේ තීරණවලට බලපෑම් කළ හැකි කිසිදු අභිලාෂයන් ගැටුමක් නොමැති බව සහතික කරයි. ස්වාධීනත්වයේ කිසියම් වෙනසක් පවතින්නේ නම් එය බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත වාර්තා කරයි.
	g) ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක නියම කිරීම.	අනුකූල වේ කමිටුව විසින් ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ගුණාංග පිළිබඳ නිර්ණායක සකසා ඇත. සාමාන්‍යාධිකාරි සහ වක් වක් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තනතුරු සඳහා වන බඳවා ගැනීමේ ක්‍රමවේදවල සහ රාජකාරි විස්තරවල මේවා ඇතුළත් වේ.
	ඌ) අධ්‍යක්ෂ මණ්ඩලයට අමතර/නව විශේෂඥ දැනුමක් අවශ්‍ය වන විට ඒ පිළිබඳව වරින් වර සලකා බැලීම සහ විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සඳහා අනුප්‍රාප්තික සැලසුම් නිර්දේශ කිරීම.	අනුකූල වේ නාමයෝජනා සහ පාලන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩු සහ මණ්ඩලයට අවශ්‍ය අමතර/නව විශේෂඥ දැනුම පිළිබඳ නිර්දේශ ලබා දී ඇත.
	(i) ඵලදායී සහ විනිවිද පෙනෙන ක්‍රියාවලියක් සහිතව ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් සඳහා ශක්තිමත් අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුව සතු බව සහතික කිරීම. (i) බැංකුවේ ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ මෙහෙයුම්වල සංකීර්ණතාවය සැලකිල්ලට ගනිමින් කෙටි, මධ්‍යම සහ දිගු කාලීන අනුප්‍රාප්තිය සඳහා ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකාරිත්ව තනතුරු පිරවීම සඳහා සුදුසුකම් ලත් සහ නිපුණ පුද්ගලයින් (අභ්‍යන්තර/බාහිර) හඳුනා ගැනීමට; (ii) අදාළ ක්ෂේත්‍ර සඳහා කුසලතා/දැනුමෙහි පවතින හිඩැස් හඳුනා ගැනීම සහ අවම කිරීම මගින් තෝරාගත් අනුප්‍රාප්තිකයින් එම තනතුරු සඳහා පුහුණු කිරීමට; සහ (iii) අවම වශයෙන් වාර්ෂිකව අනුප්‍රාප්තික සැලැස්ම සමාලෝචනය කිරීමට,	අර්ධ වශයෙන් අනුකූල වේ අනුප්‍රාප්තික සැලැස්මක් ක්‍රියාත්මක වන අතර 2025 සැලැස්ම මණ්ඩලය විසින් අනුමත කර ඇත. කෙසේ වෙතත්, සමහර තනතුරු සඳහා වහාම පත් කළ හැකි අනුප්‍රාප්තිකයින් හඳුනාගෙන නොමැති අතර ඒවා සඳහා බාහිර බඳවා ගැනීම් අවශ්‍ය බව සඳහන් වේ.
	ඎ) බැංකු කර්මාන්තයට අදාළ නීති, රෙගුලාසි, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, තාක්ෂණික දියුණුව සහ මූල්‍ය අංශයේ වෙනස්කම් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ව නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම.	අනුකූල වේ අනුකූලතා නිලධාරියා නවතම නීති, රෙගුලාසි ආදිය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය යාවත්කාලීන කරයි.
	ඏ) අධ්‍යක්ෂවරුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඔවුන් සඳහා පුහුණු, ධාරිතා වර්ධන සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිර්දේශ කිරීම.	අනුකූල නොවේ එවැනි කිසිදු පුහුණු අවශ්‍යතාවයක් හඳුනාගෙන හෝ සිදු කර නොමැත.
	ඐ) වගකීම් සහ රාජකාරි ඵලදායී ලෙස ඉටු කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ මණ්ඩල කමිටුවල ව්‍යුහය, ප්‍රමාණය, සුදුසුකම් සහ සංයුතිය සමාලෝචනය කිරීම.	අනුකූල වේ නව අධ්‍යක්ෂවරයෙකු පත් කරන සෑම අවස්ථාවකම වගකීම් සහ රාජකාරි ඉටු කිරීම විධිමත් කිරීම සඳහා කමිටු ප්‍රතිව්‍යුහගත කරනු ලැබේ.

ආයතනික පාලන රාමුව

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	ප) බැංකුවේ සමස්ත ආයතනික පාලන රාමුව සහ ප්‍රතිපත්ති, අදාළ සියලුම නීති සහ රෙගුලාසි සහ කර්මාන්තයේ/ජාත්‍යන්තර හොඳම භාවිතයන් සැලකිල්ලට ගනිමින් සමාලෝචනය කර, යාවත්කාලීන කර, ඵලදායී ලෙස ක්‍රියාත්මක කර ඇති බව සහතික කිරීම.	අනුකූල වේ සමස්ත පාලන රාමුව ආවරණය වන පරිදි මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රඥප්තියක් පවතී. ආයතනික පාලනය, නාමයෝජනා සහ නැවත තේරී පත්වීම පිළිබඳ ප්‍රතිපත්ති ද ක්‍රියාත්මක වේ.
6.5 ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	අ) කමිටුවේ සභාපතිවරයා මණ්ඩලයේ හෝ වෙනත් කමිටුවක සභාපති නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය.	අනුකූල නොවේ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වන කේ. බී. විජේරත්න මහතා 2025.03.14 සිට 2025.06.11 දක්වා මෙම කමිටුවේ සභාපතිවරයා ලෙස සේවය කළේය. ඔහු එම කාලය තුළ 2025.05.23 දින පවත්වන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ සභාපතිවරයා ලෙස ද සේවය කර ඇත.
	ඉ) අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර ඉන් බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය. කමිටු සාමාජිකයින් බැංකු සහ/හෝ මූල්‍ය සේවා සම්බන්ධ අවදානම් කළමනාකරණ ගැටළු සහ භාවිතයන් පිළිබඳ ශක්තිමත් සාමූහික අත්දැකීම් සහිත විය යුතුය.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන් ඇතුළුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. ඔවුන් බැංකු සහ මූල්‍ය අංශයේ අවදානම් කළමනාකරණය පිළිබඳ ශක්තිමත් අත්දැකීම් දරයි.
	ඊ) කමිටුවේ සාමාජිකයින්ගෙන් බහුතරයක් විගණන කමිටුවේ සාමාජිකයින්ගෙන් සමන්විත නොවිය යුතු අතර, අනෙක් අතට ද එය එසේම විය යුතුය	අනුකූල වේ සාමාජිකයින්ගෙන් බහුතරයක් විගණන කමිටුවේ සාමාජිකයින් නොවේ.
	ඌ) ප්‍රධාන විධායක නිලධාරි, ප්‍රධාන අවදානම් නිලධාරි, ප්‍රධාන අනුකූලතා නිලධාරි සහ ණය, වෙළඳපල, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් යන අංශ අධීක්ෂණය කරන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අවශ්‍යතාවය මත රැස්වීම්වලට සහභාගී කරවා ගත යුතුය.	අනුකූල වේ අදාළ න්‍යාය පත්‍ර අයිතම සඳහා කළමනාකාරිත්වයේ සාමාජිකයින් ආරාධනය පරිදි මණ්ඩලයේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගී වේ. සාමාන්‍යාධිකාරි, ප්‍රධාන අවදානම් නිලධාරි , ප්‍රධාන අනුකූලතා නිලධාරි ,ප්‍රධාන මූල්‍ය නිලධාරි, භාණ්ඩාගාර සහ මානව සම්පත් අංශවල අතිරේකසාමාන්‍යාධිකාරිවරුන් සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක යන නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව රැස්වීම්වලදී අවදානම් වර්ග පිළිබඳව සාකච්ඡා කරයි.
	ඍ) කමිටුවට පවරා ඇති බලතල සහ වගකීම් රාමුව තුළ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ සමීපව කටයුතු කිරීම සහ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගැනීම. ඎ) බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සඳහා ස්වාධීන අවදානම් කළමනාකරණ කාර්යයක් ස්ථාපිත කිරීම. ඏ) ණය, වෙළඳපල, ද්‍රවශීලතාව, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂණය සහ උපායමාර්ගික අවදානම් යන සියලුම අවදානම් මසකට වරක් සුදුසු අවදානම් දර්ශක හරහා ඇගයීම.	අනුකූල වේ කමිටුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ සමීපව කටයුතු කරමින් පවරා ඇති අධිකාරිය යටතේ තීරණ ගනී. එය ස්වාධීන අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් සහතික කරන අතර මසකට වරක් සුදුසු දර්ශක භාවිතා කරමින් ණය, වෙළඳපල, ද්‍රවශීලතාව, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂණ සහ උපායමාර්ගික අවදානම් ඇගයීමට ලක් කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව රැස්වීම්වලදී ණය අවදානම සහ ආයෝජන කළඹ පිළිබඳ අවදානම් විශ්ලේෂණයන් විශ්ලේෂණය කරනු ලබන බව නිරීක්ෂණය විය.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	ඌ) බැංකුවේ අවදානම් රුචිකත්වයට එරෙහිව බැංකුවේ නිරාවරණයන් පිළිබඳව මණ්ඩලයට උපදෙස් දීම සහ වාර්තා කිරීම.	අනුකූල වේ ප්‍රධාන අවදානම් නිලධාරී විසින් අවදානම් රුචිකත්වයට සාපේක්ෂව බැංකුවේ නිරාවරණයන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරන අතර අවශ්‍ය විටෙක මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. 2025.10.31 දිනට අදාළ සමස්ත අවදානම් කළමනාකරණ පුවරුව සමාලෝචනය කර ඇත.
	එ) ප්‍රධාන අවදානම් නිලධාරී ගේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම. අවදානම් පැතිකඩ, ස්ථාපිත අවදානම් සීමාවන් සහ සීමා උල්ලංඝනය කිරීම් පිළිබඳව ප්‍රධාන අවදානම් නිලධාරී සහ අනෙකුත් අදාළ අංශවලින් වාර්තා ලබා ගැනීම.	අනුකූල වේ ප්‍රධාන අවදානම් නිලධාරී විසින් අවදානම් විශ්ලේෂණයන් සහිත වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් රැස්වීම්වලට ඉදිරිපත් කරන ලද සමස්ත අවදානම් කළමනාකරණ පුවරුව සමාලෝචනය කරයි.
	ව) බැංකුවේ ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම සඳහා සහ ණය, වෙළඳපල, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂාව සහ උපායමාර්ගික අවදානම් වැනි බැංකුවේ අදාළ සියලුම අවදානම් කළමනාකරණය කිරීම සඳහා ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් විසින් ක්‍රියාත්මක කරන උපාය මාර්ග අධීක්ෂණය කිරීම; න) අවදානම් ගැනීම සම්බන්ධ කළමනාකාරිත්ව මට්ටමේ සියලුම කමිටුවල (ණය කමිටුව සහ වත්කම්-බැරකම් කමිටුව වැනි) ප්‍රමාණවත් බව සහ කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීම, එවැනි කමිටු මගින් විශේෂිත අවදානම් ආමන්ත්‍රණය කිරීම සහ කමිටුව විසින් නියම කර ඇති ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එම අවදානම් කළමනාකරණය කිරීම සහතික කිරීම; ක) බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන හා අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරනු ලබන ප්‍රවේශම් සහගත මට්ටම්වලට වඩා ඉහළ මට්ටමක අවදානම් පවතින විට, එම අවදානම්වල බලපෑම අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ පියවර ගැනීම;	අනුකූල වේ. බැංකුවේ අවදානම් රුචියට අනුකූලව ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ සියලුම ප්‍රධාන අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා ඍධ සහ ප්‍රධාන කළමනාකාරිත්වය විසින් ක්‍රියාත්මක කරන උපාය මාර්ග කමිටුව විසින් අධීක්ෂණය කරයි. එය කළමනාකාරිත්ව මට්ටමේ අවදානම් කමිටුවල කාර්යක්ෂමතාව සමාලෝචනය කරන අතර අවදානම් ස්ථාපිත සීමාවන් තුළ කළමනාකරණය වන බව සහතික කරයි. අවදානම් පිළිගත හැකි මට්ටමට වඩා වැඩි වූ විට, කමිටුව අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව කාලෝචිත නිවැරදි කිරීමේ පියවර ගනී. අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව රැස්වීම්වලදී පහත කරුණු සාකච්ඡා කරන ලදී: • අනුමැතිය සඳහා ප්‍රමිතිගත භාණ්ඩාගාර ගනුදෙනු පත්‍රිකාව ඉදිරිපත් කිරීම. • ALCO හි ප්‍රඥප්තියට (TOR) සංශෝධන යෝජනා කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.
	ම) අවදානම් කළමනාකරණයේ සියලුම අංශ සහ යාවත්කාලීන කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීම සඳහා අවම වශයෙන් කාර්තුමය වශයෙන් රැස්වීම.	අනුකූල වේ 2025 වසර තුළ රැස්වීම් හතක් පවත්වන ලදී.
	න) කමිටුව විසින් නිර්දේශ කරනු ලබන පරිදි, නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වන නිලධාරීන්ට එරෙහිව වහාම නිවැරදි කිරීමේ පියවර ගැනීම.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කමිටු TOR හි 21 වන වගන්තිය යටතේ මෙය කමිටුවේ අධිකාරියක් ලෙස පිළිගෙන ඇත.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	ද) සෑම රැස්වීමකින්ම සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර, එම වාර්තාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාව සහ/හෝ නිශ්චිත උපදෙස් ලබා ගැනීම;	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (බැංකු ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු) රැස්වීම් සටහන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාව ලබා ගැනීම සඳහා මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරනු ලැබේ.
	ච) ව්‍යාපාරික මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍රයන්හි නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ සහ අනුමත ප්‍රතිපත්තිවලට බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා අනුකූලතා කාර්යභාරයක් ස්ථාපිත කිරීම. ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් අතරින් තෝරාගත් කැපවූ අනුකූලතා නිලධාරියෙකු විසින් මෙම අනුකූලතා කාර්යභාරය ඉටු කරනු ලබන අතර වරින් වර කමිටුවට වාර්තා කරනු ඇත.	අනුකූල වේ අනුකූලතා නිලධාරියා අලුත්ම ව්‍යවස්ථාපිත සහ නියාමන අනුකූලතා පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි. ගැටළු විසඳීමේ ප්‍රගතිය පිළිබඳව ද අනුකූලතා නිලධාරියා අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කර ඇත.
	q) පැන නගින අවදානම් ඇතුළු සියලුම අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවට අවශ්‍ය ඕනෑම ගැලපීමක් සිදු කිරීම සඳහා තොරතුරු හුවමාරුව පහසු කිරීමට විගණන කමිටුව සමඟ ඵලදායී සන්නිවේදන සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම; සහ, r) මානව සම්පත් සහ වැටුප් කමිටුවේ කාර්යයන්ට හානියක් නොවන පරිදි, සේවකයින්ට ලබා දෙන දිරිගැන්වීම් බැංකුවේ අවදානම්, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ ඉපැයීම් මට්ටම් සැලකිල්ලට ගෙන තිබේද යන්න පරීක්ෂා කිරීම	අනුකූල වේ. පැන නගින අවදානම් සහ අවදානම් රාමුවට අවශ්‍ය ගැලපීම් ඇතුළුව පුළුල් අවදානම් කළමනාකරණය සහතික කිරීම සඳහා කමිටුව විගණන කමිටුව සමඟ ඵලදායී සම්බන්ධීකරණයක් සහ තොරතුරු හුවමාරුවක් පවත්වා ගනී. එසේම, බැංකුවේ අවදානම් පැතිකඩ, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ ඉපැයීම් සමඟ පෙළගැසීම සහතික කිරීම සඳහා සේවක දිරිගැන්වීමේ ව්‍යුහයන් ඒය සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව රැස්වීමේදී සමස්ත අවදානම් කළමනාකරණ දර්ශක සමාලෝචනය කරන ලද අතර, එම අවදානම් දර්ශකවල මූල්‍ය අංශ 2025.03.14 දින පැවති BAC (විගණන කමිටු) රැස්වීමේදී සාකච්ඡා කරන ලදී.
6.6 සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව	a) කමිටුව විසින්: අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් සභාපතිත්වය දැරිය යුතුය; b) අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර ඉන් බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරී (CEO) සහ අදාළ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ට අවශ්‍යතාවය මත අදාළ න්‍යාය පත්‍ර අයිතම සඳහා පමණක් රැස්වීම්වලට සහභාගී විය හැකිය.	අනුකූල වේ. කමිටුවේ සභාපතිත්වය දරන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වන අතර, එය විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, ඉන් බහුතරයක් ස්වාධීන වේ. ප්‍රධාන විධායක නිලධාරී සහ අදාළ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් අවශ්‍යතාවය මත පමණක් අදාළ න්‍යාය පත්‍ර අයිතමවලට සීමා වී රැස්වීම්වලට සහභාගී වේ. කේ. බී. විජේරත්න මහතා ආශ්‍රිත පාර්ශවීය ගනුදෙනු සමාලෝචන කමිටුවහි සභාපති වන අතර ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු එහි සිටී. සාමාන්‍යාධිකාරී) සහ අනුකූලතා නිලධාරී වැනි ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් අවශ්‍යතාවය මත සහභාගී වේ.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
	c) අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා පැහැදිලි ප්‍රතිපත්තියක් සහ ක්‍රියාවලීන් තිබීම.	අනුකූල වේ 2024 වසරේ අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ.
	d) එවැනි ගනුදෙනු මගින් පැන නැගිය හැකි ඕනෑම අහිලාෂයන් ගැටුමක් වළක්වා ගැනීමේ අරමුණින්, 7.2 වන උපදෙස්වල අර්ථ දක්වා ඇති ගනුදෙනු ඇතුළුව බැංකුවේ ආශ්‍රිත පාර්ශවීය ගනුදෙනු සමාලෝචනය කිරීම, විශේෂයෙන්ම 7.1 වන උපදෙස්වල අර්ථ දක්වා ඇති පරිදි "ආශ්‍රිත පාර්ශවයන්" ලෙස සැලකිය යුතු පුද්ගලයින් සම්බන්ධ ගනුදෙනු; ඇ) ආශ්‍රිත පාර්ශවයන්, ආශ්‍රිත පාර්ශවීය ගනුදෙනු සහ එම ගනුදෙනුවල ආර්ථික ප්‍රතිවිපාක පිළිබඳ විස්තර කාර්තුමය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.	අනුකූල වේ. බැංකුවේ ආශ්‍රිත පාර්ශවීය ගනුදෙනු සමාලෝචනය කිරීම සඳහා කමිටුව කාර්තුමය පදනමින් රැස්වේ.
	f) අධ්‍යක්ෂවරයෙකු තමාට හෝ ඔහුගේ/ඇයගේ සමීපතමයෙකුට හෝ එම අධ්‍යක්ෂවරයාට සැලකිය යුතු අහිලාෂයක් පවතින ආයතනයකට සම්බන්ධ ගනුදෙනු පිළිබඳව ගන්නා ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් සඳහා වන සාකච්ඡාවලට සහභාගී වීමෙන් වැළකී සිටින බව සහතික කිරීම; සහ,	අනුකූල වේ තමන්ට අදාළ ගනුදෙනු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේදී අධ්‍යක්ෂවරුන් එම සාකච්ඡාවලට සහභාගී වීමෙන් වැළකී සිටිති.
	g) 7.1 වන උපදෙස්වල අර්ථ දක්වා ඇති ආශ්‍රිත පාර්ශවයන් සමඟ බැංකුව කටයුතු කිරීමේදී, එම පාර්ශවයන්ට බැංකුවේ එකම ව්‍යාපාරයක නියුතු අනෙකුත් පාර්ශවයන්ට ලබා දෙන ප්‍රතිලාභවලට වඩා "වැඩි වාසිදායක සැලකීමක්" නොලැබෙන බව සහතික කිරීම. මෙම සන්දර්භය තුළ, "වැඩි වාසිදායක සැලකීම" යන්නෙන් අදහස් වන්නේ:	අනුකූල වේ සම්බන්ධිත පාර්ශ්වයන්ට අනෙකුත් ගනුදෙනුකරුවන්ට වඩා වාසි සහගත කොන්දේසි මත ගනුදෙනු සිදු නොවන බව කමිටුව සහතික කරයි. මෙයට නිරාවරණයන් මත සාධාරණ සීමාවන් පවත්වා ගැනීම, වෙළඳපල මත පදනම් වූ පොලී අනුපාත යෙදීම, විශේෂ සැලකීම් හෝ ගාස්තු අත්හැරීම් වළක්වා ගැනීම සහ සියලුම ගනුදෙනු නිසි ඇගයීමකින් සහ විනිවිදභාවයකින් සිදු කිරීම ඇතුළත් වේ. නීත්‍යානුකූල අරමුණු සඳහා මිස, සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ නුසුදුසු තොරතුරු හුවමාරු වීම් ද මෙයින් වළක්වයි. අනුකූලතා දෙපාර්තමේන්තුවට අනුව, බැංකුවේ සේවකයින් සඳහා ලබා දෙන සාමාන්‍ය සේවක ප්‍රතිලාභ හැර වෙනත් කිසිදු අමතර වාසි සහගත සැලකීමක් හෝ පහසුකමක් ලබා දී නොමැත.
	(h) බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සාධාරණ ප්‍රතිශතයකට වඩා වැඩි "මුළු ශුද්ධ පහසුකම්" ආශ්‍රිත පාර්ශවයන්ට ලබා දීම. මෙම උපදෙස් සඳහා;	
	a. "පහසුකම්" යනු උපරිම පහසුකම් ප්‍රමාණය/විශාල නිරාවරණයන් පිළිබඳ බැංකු පනතේ උපදෙස්වල අර්ථ දක්වා ඇති පරිදි වේ.	
	b. "මුළු ශුද්ධ පහසුකම්" ගණනය කරනු ලබන්නේ මුළු පහසුකම්වලින්, මුදල් ඇපකර සහ එවැනි ආශ්‍රිත පාර්ශවයන් විසින් බැංකුවේ කොටස් ප්‍රාග්ධනය සහ වසර 5ක් හෝ ඊට වැඩි කාලයකින් කල් පිරෙන ණය උපකරණවල සිදු කර ඇති ආයෝජන අඩු කිරීමෙනි.	
	(i) බැංකුවේ හොඳම ණය අනුපාතයට වඩා අඩු පොලී අනුපාතයක් අය කිරීම හෝ අසම්බන්ධිත සමාන ප්‍රති පාර්ශවකරුවෙකු සමඟ කෙරෙන සමාන ගනුදෙනුවකට වඩා වැඩි බැංකු තැන්පතු අනුපාතයක් ගෙවීම;	
	(j) අසම්බන්ධිත පාර්ශවයන් සමඟ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ලබා දෙන කොන්දේසිවලට වඩා පුළුල් වූ, වෙළඳ අලාභ ආවරණය කිරීම සහ/හෝ ගාස්තු/කොමිස් මුදල් අත්හැරීම වැනි වාසිදායක කොන්දේසි ලබා දීම;	
	(k) ඇගයීම් ක්‍රියාවලියකින් තොරව ආශ්‍රිත පාර්ශවයකට සේවා සැපයීම හෝ සේවාවන් ලබා ගැනීම; සහ	
	(l) නීත්‍යානුකූල රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වුවහොත් මිස, ආශ්‍රිත පාර්ශවයන් සමඟ හිමිකාරිත්වයක් සහිත, රහසිගත හෝ වෙනත් ආකාරයකින් සංවේදී තොරතුරු බෙදා ගැනීමට තුඩු දිය හැකි වාර්තාකරණ සහ තොරතුරු හුවමාරු කිරීමේ මාර්ග පවත්වා ගැනීම. ලැයිස්තුගත බලපත්‍රලාභී බැංකු සහ ලැයිස්තුගත නොකළ බලපත්‍රලාභී බැංකු පිළිවෙළින් 2025.01.01 සහ 2027.01.01 දින වන විට 6.6 වන උපදෙස් වලට අනුකූල විය යුතුය.	

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
7		
7.1 සම්බන්ධිත මෙම විධානය සඳහා "සම්බන්ධිත පාර්ශ්වයන්" ලෙස සැලකෙන පුද්ගලයින්ගේ කාණ්ඩ පහත දැක්වේ:	a) බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු; b) එවැනි අධ්‍යක්ෂවරයෙකුගේ සමීපතමයන්; c) බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු විසින්, එම බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් වීමට පෙර හෝ පසුව අත්පත් කරගත් සැලකිය යුතු අභිලාෂයක් පවතින ආයතනයක්; d) බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකුගේ සමීපතමයෙකුට සැලකිය යුතු අභිලාෂයක් පවතින ආයතනයක්; e) එවැනි බලපත්‍රලාභී බැංකුවක සේවකයින්ට අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ ලබා දී ඇති පහසුකම් හැර, වෙනත් ඕනෑම පහසුකමක් සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකුවක ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ විධායක කාර්යයන් ඉටු කරන නිලධාරියෙකු; f) තනි පුද්ගලයෙකු හෝ ආයතනයක් ලෙස මූල්‍යමය අභිලාෂයක් සහිත බලපත්‍රලාභී බැංකුවක කොටස් හිමියෙකු; g) බලපත්‍රලාභී බැංකුවේ අනුබද්ධිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක්; h) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත බැංකුවක මව් බැංකුව සහ එහි අනුබද්ධිත සමාගම් හැර, මව් සමාගම ඇතුළු එහි අනුබද්ධිත සමාගම්; i) බලපත්‍රලාභී බැංකුවේ අනුබද්ධිත හෝ ආශ්‍රිත සමාගමක අධ්‍යක්ෂවරයෙකු; j) බලපත්‍රලාභී බැංකුවේ මව් සමාගමේ සහ එහි අනුබද්ධිත සමාගම්වල අධ්‍යක්ෂවරයෙකු; k) ඉහත 7.1 (ඇ) සහ (ඉ) හි දක්වා ඇති පුද්ගලයින්ගේ සමීපතමයෙකු; l) අධ්‍යක්ෂවරයෙකු හෝ හවුල්කරුවෙකු එම බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු වන ආයතනයක්; m) බලපත්‍රලාභී බැංකුවක මූල්‍යමය අභිලාෂයක් සහිත කොටස් හිමියෙකුට සැලකිය යුතු අභිලාෂයක් පවතින ආයතනයක්; සහ, n) මූල්‍යමය අභිලාෂයක් සහිත කොටස් හිමියෙකුගේ සමීපතමයෙකුට සැලකිය යුතු අභිලාෂයක් පවතින ආයතනයක්.	අනුකූල වේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන ප්‍රතිපත්තිය තුළ මෙය පැහැදිලිව ස්ථාපිත කර ඇත. බැංකුවේ සම්බන්ධිත පාර්ශ්වයන්ට අධ්‍යක්ෂවරුන් සහ ඔවුන්ගේ සමීපතමයින්, ඔවුන් සැලකිය යුතු අභිලාෂයන් දරන ආයතන, සහ ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අයත් වේ. එය සැලකිය යුතු කොටස් හිමියන් සහ ඔවුන්ගේ අදාළ ආයතන, මෙන්ම බැංකුවේ අනුබද්ධ, සහකාර සහ මව් සමාගම් ද ආවරණය කරයි. මීට අමතරව, මෙම ආයතනවල අධ්‍යක්ෂවරුන් සහ සම්බන්ධිත පුද්ගලයින්, හිමිකාරිත්වය හෝ අධ්‍යක්ෂණය හරහා සම්බන්ධ වී ඇති ආයතන මෙම විධානය යටතේ සම්බන්ධිත පාර්ශ්වයන් ලෙස සැලකේ.
7.2 සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වර්ග මෙම විධානය මගින් ආවරණය වන සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ සිදු කරන ගනුදෙනු වර්ග වලට පහත දෑ ඇතුළත් වේ:	අ) බලපත්‍රලාභී බැංකුවල උපරිම ණය මුදල්/විශාල නිරාවරණයන් පිළිබඳ බැංකු පනතේ නිර්වචනය කර ඇති ඕනෑම ආකාරයක පහසුකම් ප්‍රදානය කිරීම. ආ) තැන්පතු, ණය ගැනීම් සහ ආයෝජන ආකාරයෙන් බැංකුවේ වගකීම් ඇති කිරීම. ඇ) බැංකුවට සපයනු ලබන හෝ බැංකුවෙන් ලබා ගන්නා මූල්‍ය හෝ මූල්‍ය නොවන ස්වභාවයේ ඕනෑම සේවාවක්. ඈ) බැංකුව සහ ඕනෑම ආශ්‍රිත පාර්ශවයක් අතර වාර්තාකරණ මාර්ග සහ තොරතුරු ගලායාම් නිර්මාණය කිරීම හෝ පවත්වාගෙන යාම, එමඟින් ආශ්‍රිත පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබා දිය හැකි හිමිකාරිත්වයට යටත්, රහසිගත හෝ වෙනත් ආකාරයකින් සංවේදී තොරතුරු හුවමාරු වීමට ඉඩ ඇත.	අනුකූල වේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වර්ග බැංකුවේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන ප්‍රතිපත්තියේ 6 වන වගන්තිය යටතේ ආවරණය වේ.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
7.3 බැංකු පනතේ විධිවිධානවල අදාළත්වය	බලපත්‍රලාභී බැංකු විසින් 7.1 විධානය යටතේ නිර්වචනය කර ඇති සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දෙන පහසුකම් සම්බන්ධයෙන් බැංකු පනතේ 47 සහ 76දරණ වගන්තිවලට අනුකූල වීම සහතික කළ යුතුය.(බැංකු සේවකයින් සඳහා වන පොදු යෝජනා ක්‍රමයකට අනුව ප්‍රධාන විධායක නිලධාරී හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ලබා දෙන පහසුකම් මෙයට ඇතුළත් නොවේ.	අනුකූල වේ බැංකුවේ සියලුම සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළව කාර්තුමය වාර්තා ආශ්‍රිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කෙරේ. 2025 වසරේ අනුකූලතා නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව, සමාලෝචනයට ලක්වන වසර තුළ බැංකුවේ අධ්‍යක්ෂවරුන්ට සම්බන්ධ ව්‍යාපාර, ආයතන හෝ සමාගම් වෙත කිසිදු ආකාරයක පහසුකම් ලබා දී නොමැත.
7.4 අධ්‍යක්ෂවරුන් සහ සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දෙන පහසුකම්	බලපත්‍රලාභී බැංකුවක් විසින් යම් පුද්ගලයෙකුට හෝ එවැනි පුද්ගලයෙකුගේ සමීපතමයෙකුට හෝ එම පුද්ගලයාට සැලකිය යුතු අභිලාෂයක් පවතින ඕනෑම ආයතනයකට කිසියම් පහසුකමක් ලබා දී ඇති විටෙක, සහ එම පුද්ගලයා පසුව බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබුවහොත්, පහත කරුණු සිදුවුවහොත්: a) එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ දින සිට වසරක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද අවශ්‍ය ඇපකර ලබා දී නොමැති නම්; සහ, b) එවැනි පහසුකම් සඳහා ගෙවිය යුතු මුදල, අදාළ පොලී ද සහිතව, පහසුකම ලබා දුන් අවස්ථාවේ නියම කළ කාල සීමාව ඇතුළත හෝ එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් වූ දින සිට මාස දහඅටක කාලයක් අවසානයේදී (ඉහත a හි දක්වා ඇති පරිදි එම කාලය ඇතුළත ඇපකර ලබා දී නොමැති නම්), මේ දෙකෙන් කුමන කාල සීමාව කලින් එළඹේද එම කාලය ඇතුළත පියවා නොමැති නම්; එම අධ්‍යක්ෂවරයා තමා දැරූ අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්වූවා ලෙස සලකනු ලැබේ. කෙසේ වෙතත්, මෙම උපදෙස, පහසුකම ලබා දුන් අවස්ථාවේ බැංකුවේ සේවකයෙකු වූ සහ බැංකුවේ සියලුම සේවකයින්ට අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ එම පහසුකම ලබා ගත් අධ්‍යක්ෂවරයෙකුට අදාළ නොවේ.	අනුකූල වේ අනුකූලතා නිලධාරියාට අනුව, 2025 වසර තුළ එවැනි තත්ත්වයක් පැන නැඟී නොමැත.
7.5	සේවකයින් සඳහා ලබා දෙන පහසුකම්: බැංකුවක් විසින් කිසිදු සේවකයෙකුට, හෝ එවැනි සේවකයෙකුගේ සමීපතමයෙකුට, හෝ එම සේවකයාට හෝ සමීපතමයෙකුට සැලකිය යුතු අභිලාෂයක් පවතින ආයතනයකට, බැංකුවේ සේවකයින් සඳහා අදාළ වන යෝජනා ක්‍රමයක පදනම මත හෝ බැංකු පනතේ 47(3) සහ (5) වගන්තිවලට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ඇපකරයක් මගින් සුරක්ෂිත කර ඇති විටෙක මිස, ගාස්තු සහ/හෝ කොමිස් මුදල් අත්හැරීම සම්බන්ධයෙන් කිසිදු පහසුකමක් හෝ "වැඩි වාසිදායක සැලකීමක්" ලබා නොදිය යුතුය.	අනුකූල වේ මෙම අවශ්‍යතාවය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 'ආශ්‍රිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන ප්‍රතිපත්තියේ' 3.3 වන වගන්තිය යටතේ පැහැදිලිව ස්ථාපිත කර ඇත. 2025 වර්ෂය තුළ අනුකූලතා නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද ආශ්‍රිත පාර්ශ්වීය ගනුදෙනු වාර්තාවලට අනුව, බැංකුවේ සේවකයින් සඳහා ඒකාකාරව අදාළ වන යෝජනා ක්‍රමයක පදනම මත මිස, කිසිදු සේවකයෙකුට හෝ එවැනි සේවකයෙකුගේ සමීපතමයෙකුට හෝ එම සේවකයාට හෝ සමීපතමයින්ට සැලකිය යුතු අභිලාෂයක් පවතින ආයතනයකට බැංකුව විසින් වැඩි වාසිදායක සැලකීමක් ලබා දී නොමැත.
7.6	සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ණය කපා හැරීම 7.1 විධානයෙහි දක්වා ඇති සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති පහසුකම් හෝ ඒවායේ පොලී මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතියකින් තොරව කපා හැරිය නොහැක. එවැනි අනුමැතියකින් තොරව සිදු කරන ඕනෑම කපා හැරීමක් බල රහිත වේ.	2025 වසර තුළ එවැනි සිදුවීමක් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව වෙත වාර්තා වී නොමැත.
8 ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය		
	මෙම විධානය සඳහා "ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය" යන්නෙන් ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අදහස් වේ.	

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
8.1 ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය	අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම යනු දෛනික කටයුතු පරීක්ෂා කිරීමේ බැඳීමක් ලෙස අර්ථ නොදැක්විය යුතු අතර, එය ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපාය මාර්ග සහ ප්‍රතිපත්තිවලට අනුකූලව ආරක්ෂිත සහ නිවැරදි ආකාරයෙන් දෛනික කටයුතු සිදු කරන්නේද යන්න අධීක්ෂණය කිරීම සහ සහතික කිරීමේ වගකීමක් ලෙස වටහා ගත යුතුය. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්: a) ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අධිකාරිය සහ වගකීම් ක්ෂේත්‍ර අර්ථ දැක්විය යුතුය; b) ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ ක්‍රියාමාර්ග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාරික උපාය මාර්ග සහ ප්‍රතිපත්තිවලට අනුකූල බව සහතික කළ යුතුය; c) ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ නිතිපතා හෝ අවශ්‍යතාවය මත රැස්විය යුතුය; d) ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සපයනු ලබන පැහැදිලි කිරීම් සහ තොරතුරු ප්‍රශ්න කර විවේචනාත්මකව සමාලෝචනය කළ යුතුය; e) බැංකුවේ මෙහෙයුම්වල විශාලත්වය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණතාවය සැලකිල්ලට ගනිමින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමූහික දැනුම සහ විශේෂඥතාව තවදුරටත් සුදුසු දැයි තක්සේරු කළ යුතුය; සහ, f) ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමාජිකයින් ඔවුන්ගේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වගකිව යුතු බව තහවුරු කළ යුතුය.	අනුකූල වේ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා වන බලතල අප විසින් නිරීක්ෂණය කරන ලදී. ඔවුන්ගේ වගකීම් බැංකුවේ උපායමාර්ග සමඟ පෙළගැසී පවතී.
8.2 ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සුදුසුකම් සහ අබණ්ඩතාව	බැංකු පනතේ 44අ සහ 76ඒඒ වගන්තිවලට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි, බලපත්‍රලාභී බැංකුවල ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අදාළ තනතුරු දැරීමට සුදුසු සහ නිසි ගුණාංගවලින් යුත් පුද්ගලයින් විය යුතු අතර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමාජිකයින් එවැනි සුදුසුකම් සපුරාලන්නේ දැයි තීරණය කිරීමේදී බැංකු පනතේ 42(2) වගන්තියේ විධිවිධාන අදාළ වේ.	අනුකූල වේ ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු ප්‍රථම වරට පත් කරන අවස්ථාවේදී සුදුසුකම් සහ අබණ්ඩතාව පිළිබඳ තක්සේරුවක් ලබා ගන්නා බවත්, උසස්වීම් ලැබීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විය නැවත තක්සේරු කරන බවත් නිරීක්ෂණය විය.

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
8.3 ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ වගකීම් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමාජිකයින් පහත කරුණු ඉටු කළ යුතුය:	a) පුද්ගලික හැසිරීම තුළින් බලපත්‍රලාභී බැංකුවක ශක්තිමත් ආයතනික පාලන රාමුවකට සැලකිය යුතු දායකත්වයක් ලබා දීම;	
	b) බලපත්‍රලාභී බැංකුවේ සිය රාජකාරී ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් වෘත්තීය කාලයක් කැප කිරීම. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමාජිකයෙකු බලපත්‍රලාභී බැංකුවක අනුබද්ධිත හෝ ආශ්‍රිත සමාගමක විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබුවහොත්, ඔහු/ඇය එම රාජකාරී බැංකුවට ඉටු කළ යුතු වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට බාධාවක් නොවන බව සහතික කළ යුතුය;	
	c) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති උපදෙස් යටතේ මූල්‍ය සහ මූල්‍ය නොවන යන දෙඅංශයේම අවදානම් කළමනාකරණය සඳහා ව්‍යාපාරික උපාය මාර්ග, අවදානම් කළමනාකරණ පද්ධති, අවදානම් සහ අනුකූලතා සංස්කෘතිය, ක්‍රියාවලි සහ පාලනයන් ක්‍රියාත්මක කිරීම;	
	d) අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ අභ්‍යන්තර විගණන කාර්යයන්හි ස්වාධීන රාජකාරී හඳුනා ගැනීම සහ ගරු කිරීම, සහ එවැනි රාජකාරී ඉටු කිරීමට කිසිදු ආකාරයකින් බාධා නොකිරීම;	
	e) තම නිපුණතා පවත්වා ගැනීමට සහ වැඩිදියුණු කිරීමට මෙන්ම අදාළ වගකීම් ක්ෂේත්‍රවල සිදුවන වෙනස්කම් පිළිබඳව යාවත්කාලීන වීමට නිතිපතා පුහුණුවීම් ලබා ගැනීම;	
	f) කාර්ය මණ්ඩලය වෙත රාජකාරී පැවරීමට සහ එම පවරා ඇති රාජකාරී අධීක්ෂණය කිරීමට වගකිව යුතු වීම;	
	g) බැංකුව පුරා වගවීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කරන කළමනාකරණ ව්‍යුහයක් ස්ථාපිත කිරීම;	
	h) යම් උල්ලංඝනයක් හඳුනා ගන්නේ නම්, සුදුසු නිවැරදි කිරීමේ හෝ විනයානුකූල පියවර ගෙන ඇති බව සහතික කිරීම;	
	i) අදාළ පරිදි පහත කරුණු ඇතුළුව, නමුත් ඒවාට පමණක් සීමා නොවී, වැදගත් කරුණු පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවලට නිතිපතා සැපයීම: (i) ව්‍යාපාරික උපාය මාර්ගයේ, අවදානම් උපාය මාර්ග යේ/අවදානම් රුචියෙහි වෙනස්කම්, (ii) බැංකුවේ කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය, (iii)අවදානම් සීමාවන් හෝ අනුකූලතා නීති උල්ලංඝනය කිරීම්, (iv)අභ්‍යන්තර පාලන අසාර්ථකත්වයන්, සහ (v) නීතිමය හෝ නියාමන ගැටළු;	
	j) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ හෝ වෙනත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව සාමාජිකයෙකුගේ යෝග්‍යතාවයට අහිතකර ලෙස බලපෑ හැකි ඕනෑම වැදගත් තොරතුරක් පිළිබඳව දැනුවත් වූ වහාම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දීම.	

ආයතනික පාලන රාමුව

වගන්තිය	ආයතනික පාලනයේ අවශ්‍යතාවය	අනුකූලතා මට්ටම
9 හෙළිදරව් කිරීම් බලපත්‍රලාභී බැංකු පහත සඳහන් තොරතුරු හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.		
9.1 හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්	ප්‍රධාන කාර්ය සාධන දර්ශක, ප්‍රාග්ධන ප්‍රමාණවත් බව, ද්‍රවශීලතාවය, ව්‍යාපාරික සාන්ද්‍රණය, අදාළ පාර්ශ්වයන් සමඟ ගනුදෙනු, ආයතනික පාලනය, මූල්‍ය ප්‍රකාශන ඇතුළු නමුත් ඒවාට පමණක් සීමා නොවූ අදාළ තොරතුරු, බැංකුවේ ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ මෙහෙයුම්වල සංකීර්ණතාවයට අනුකූලව වෙළඳපල විනය සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා කාලෝචිත සහ ප්‍රමාණවත් ලෙස ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය. වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන, අධීක්ෂණ සහ නියාමන අධිකාරීන් විසින් නියම කර ඇති ආකෘති සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ප්‍රකාශයට පත් කරන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය.	අනුකූල වේ බැංකුව ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ප්‍රකාශයට පත් කරයි. කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පුවත්පත්වල කෙටි ආකාරයෙන් ප්‍රකාශයට පත් කර ඇත.
9.2 වාර්ෂික වාර්තාවේ කළ යුතු අවම හෙළිදරව් කිරීම්	වාර්ෂික වාර්තාවේ පහත සඳහන් අවම හෙළිදරව් කිරීම් සිදු කරන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය.	
	a) වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, විශේෂිත හෙළිදරව් කිරීම් ඇතුළුව, අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇති බවට වන ප්‍රකාශයක්.	අනුකූල වේ මේ පිළිබඳ ප්‍රකාශය බැංකුවේ වාර්ෂික වාර්තාවේ 210 පිටුවේ ඇති 'මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම' යටතේ ඇතුළත් කර ඇත.
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

මූලික කාර්යයන්:

- බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව සැලසුම් කිරීමට සහ වැඩිදියුණු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම.
- අවදානම් දරාගැනීමේ සීමාවන් ඉක්මවා යාමට පෙර, දුර්වලතා මඟහරවා ගැනීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.
- අනිවාර්ය දේශීය රෙගුලාසි සහ අභ්‍යන්තර අවදානම් අවම කිරීමේ ප්‍රොටෝකෝලවලට දැඩි ලෙස අනුගත වීම සහතික කිරීම.

CORE FUNCTIONS:

- Assisting the Board in designing and evolving the Bank's Risk Management Framework.
- Implementing corrective actions to address vulnerabilities before they breach tolerance levels.
- Guaranteeing strict adherence to mandatory local regulations and internal risk mitigation protocols.

අවදානම් රුචිය සහ අධීක්ෂණය

බැංකුවේ අවදානම් සීමාවන් නිර්වචනය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් රුචි රාමුවක් මගිනි, එය සෑම අවදානමක් සඳහාම සීමාවන් ස්ථාපිත කරයි. එහි අධීක්ෂණය මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සතු වන අතර, අධීක්ෂණ සීමාවන් හොඳම භාවිතයන් සහ බැංකුවේ ආයතනික ඉලක්ක සමඟ පෙළගැසී ඇති බව එය සහතික කරයි. යම් අවදානමක් දරාගැනීමේ සීමාවන් ඉක්මවා ගියහොත්, අවදානම් දෙපාර්තමේන්තුව විසින් ඒවා සමාලෝචනය කර, සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව

මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන අවදානම් නිලධාරී විසින් මෙහෙයවනු ලබන අතර, ඔහු මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවට ඔවුන්ගේ අවදානම් වගකීම් ඉටු කිරීමට සහාය වේ. දෙපාර්තමේන්තුව රාමු සහ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමට වැඩිදුර සහාය ලබා දෙන අතර, තීරණාත්මක අවදානම් ගැටළු නිරීක්ෂණය කර වාර්තා කරයි.

ඔවුන් දෙවන ආරක්ෂක ස්ථරය ලෙස ක්‍රියා කරන අතර, බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව තුළ අන්තර්ගත දෛනික අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කරන නිරීක්ෂණ ඒකකයක් ලෙස කටයුතු කරයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන මෙම අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමඟ බාධාවකින් තොරව ඒකාබද්ධ කර ඇත.

අවදානම් ලේඛනය

අවදානම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින මෙම ලේඛනය, තක්සේරු මෙවලම් භාවිතා කරමින් බැංකුවේ මූලික අවදානම් කාණ්ඩ හඳුනා ගැනීම සහ ඇගයීම සඳහා වන ප්‍රධාන ගබඩාව ලෙස සේවය කරයි. ලේඛනයෙන් ලබා ගන්නා සවිස්තරාත්මක වාර්තා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අතර, පැන නගින අහියෝග සහ අවම කිරීමේ උපාය මාර්ග පිළිබඳ විනිවිද පෙනෙන දළ විශ්ලේෂණයක් සපයයි.

අවදානම් කළමනාකරණයේ අදාළ ක්ෂේත්‍ර අධීක්ෂණය කරන අනෙකුත් කළමනාකරණ කමිටු

කමිටුව	අධීක්ෂණ විෂය පථය
ආයතනික කළමනාකරණ කමිටුව	අවදානම් කළමනාකරණ රාමුව තුළ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපාය මාර්ගය මෙහෙයවීම සහ එය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරයි.
වත්කම් සහ බැරකම් කමිටුව	ද්‍රවශීලතාවය සහ නියාමන අනුකූලතාව සහතික කිරීම සඳහා වත්කම් සහ බැරකම් නීතිපතා කළමනාකරණය කරයි.
ණය කමිටුව	නියාමන අනුකූලතාව, බැංකුවේ ණය ප්‍රතිපත්ති සහ අවදානම් රුචිය සමඟ අනුකූල වීම සඳහා ණය සමාලෝචනය කරන අතර ණය ගැතියන්ගේ තොරතුරු තක්සේරු කිරීම සහ පැහැර හරින ලද ණය සම්බන්ධයෙන් ද කටයුතු කරයි.

කමිටුව	අධීක්ෂණ විෂය පථය
තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව	සයිබර් ආරක්ෂණ අවදානම් සහ අදාළ ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරයි.
තොරතුරු තාක්ෂණ ආරක්ෂණ කමිටුව	තොරතුරු ආරක්ෂාවට අදාළ ප්‍රතිපත්ති නිරීක්ෂණය කිරීම සහ යාවත්කාලීන කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් ඇගයීම සහ වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.
ප්‍රකෘතිමත් කිරීමේ මෙහෙයුම් කමිටුව	බැංකුවේ උපාය මාර්ග සහ අවදානම් කළමනාකරණය සමඟ ඒකාබද්ධ කරමින් බැංකුවේ ප්‍රකෘතිමත් කිරීමේ සැලැස්ම සකස් කිරීම, පරීක්ෂා කිරීම සහ යාවත්කාලීන කරයි.
අලෙවිකරණ සහ සන්නිවේදන කමිටුව	බැංකුවේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ඵලදායී අලෙවිකරණ සහ සන්නිවේදන උපාය මාර්ග පිළිබඳ මගපෙන්වීම් සපයයි.

අනුකූලතාවය සහ ප්‍රතිපත්ති

නියාමන අවශ්‍යතා සහ අභ්‍යන්තර ව්‍යාපාරික හා මූල්‍ය ප්‍රොටෝකෝල අතර අවදානම් කළමනාකරණය සමතුලිත කිරීමේදී බැංකුව බාහිර රෙගුලාසි සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති කිහිපයකට අනුගත වී ඇත.

අනුකූලතාවය

බැංකුව පහත රෙගුලාසිවලට අනුකූල වේ:

- බාසල් II අවශ්‍යතා සඳහා අර්ධ අනුකූලතාවය.
- මහ බැංකුවේ සහ ICAAP නියාමන මාර්ගෝපදේශ සඳහා පූර්ණ අනුකූලතාවය.

එසේම, අදාළ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සහ ප්‍රමුඛතා සැකසීමේදී බැංකුව පහත රෙගුලාසි ද සැලකිල්ලට ගනී:

- බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ප්‍රකෘතිමත් කිරීමේ සැලසුම් පිළිබඳ 2021 අංක 9 දරන බැංකු පනත් විධානය
- බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව පිළිබඳ 2021 අංක 16 දරන බැංකු පනත් විධානය
- බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ 2016 අංක 1 දරන බැංකු පනත් විධාන.

අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති

නවතම මහ බැංකු විධානයන් සහ කර්මාන්ත රෙගුලාසි පිළිබිඹු වන පරිදි යාවත්කාලීන කරන ලද, විශේෂිත අවදානම් කාණ්ඩ ආමන්ත්‍රණය කිරීම සඳහා බැංකුව සතුව පහත ප්‍රතිපත්ති පවතී:

ණය	• ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, • ණය සමාලෝචන යාන්ත්‍රණ ප්‍රතිපත්තිය.
මූල්‍ය අවදානම්	• ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, • පොලී අනුපාත අවදානම් ප්‍රතිපත්තිය.
මෙහෙයුම්	• මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, • ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය.

වසර තුළ සමාලෝචනය කරන ලද ප්‍රතිපත්ති	සමාලෝචනය වීමට නියමිත ප්‍රතිපත්ති
ණය සමාලෝචන යාන්ත්‍රණ ප්‍රතිපත්තිය	අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය ඇගයීම් ක්‍රියාවලිය
ව්‍යාපාර ප්‍රකෘතිමත් කිරීමේ සැලැස්ම	ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය
අවදානම් රුචි රාමුව	ණය අවදානම් කළමනාකරණය
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව	මෙහෙයුම් අවදානම් කළමනාකරණය
	පොලී අනුපාත අවදානම් කළමනාකරණය
	ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

ආතති පරීක්ෂණ

වඩ වඩාත් අස්ථාවර වන සාර්ව ආර්ථික සහ නියාමන පරිසරයක් තුළ බැංකුවට කොතෙක් දුරට ඔරොත්තු දීමේ හැකියාවක් පවතින්නේද යන්න වටහා ගැනීම සඳහා ආතති පරීක්ෂණ මෙවලමක් ලෙස භාවිතා කෙරේ. අහිතකර ආර්ථික තත්ත්වයන් අනුකරණය කිරීම මඟින් වෙළඳපල සිදුවීම් හමුවේ අපගේ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ තීරණාත්මක අවබෝධයක් ලබා ගැනීමටත්, ව්‍යාපාර, ප්‍රාග්ධනය, ආදායම් සහ ආයෝජනවලට බලපෑම් කළ හැකි නව නියාමන අවශ්‍යතා වැනි සැඟවුණු අවදානම් හෙළි කර ගැනීමටත් මෙය ඉවහල් වේ.

සංරචකය	කාර්යය සහ වැදගත්කම
දුර්වලතා තක්සේරුව	සාමාන්‍ය වෙළඳපල තත්ත්වයන්ට පමණක් නොව, "අසාමාන්‍ය සිදුවීම්" හමුවේ බැංකුව ප්‍රතිචාර දක්වන ආකාරය හඳුනා ගැනීම.
උපායමාර්ගික අන්තර් ක්‍රියාකාරිත්වය	ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ අවදානම අතර පවතින ගණිතමය සහ මෙහෙයුම් සම්බන්ධතාවය අවබෝධ කර ගැනීම.
පාලනය	පරීක්ෂණ ප්‍රතිඵල සැබෑ තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඒකාබද්ධ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ (BOD) අධීක්ෂණය සහතික කිරීම.
අන්ත-අවදානම් අවම කිරීම	අඩු සම්භාවිතාවක් සහිත එහෙත් ඉහළ බලපෑමක් ඇති කරන අවදානම් හැසිරවීම සඳහා විශේෂ යාන්ත්‍රණ (හදිසි සැලසුම්) සංවර්ධනය කිරීම.

අදාළ අවදානම් කළමනාකරණය

සාර්ව ආර්ථික අභියෝග සහ අභ්‍යන්තර වෙනස්කම් පවතින කාලවලදී අපගේ අවදානම් පැතිකඩ නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා බැංකුව පහත අවදානම් කල්තියා කළමනාකරණය කරයි.

1. උපායමාර්ගික අවදානම

බැංකුවේ දිගුකාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ ව්‍යාපාරික ආකෘතිය ක්‍රියාත්මක කිරීමට ඇති මූලික හැකියාවට තර්ජනයක් වන ඉහළ මට්ටමේ අවිනිශ්චිතතාවයන් සහිත අවදානම් උපායමාර්ගික අවදානම් ලෙස බැංකුව සලකයි. වෙනස්වන රෙගුලාසි, කඩාකප්පල්කාරී තාක්ෂණයන් සහ පාරිභෝගික මනාපයන් ඇතුළු වෙළඳපල හැසිරීම් වැනි බාහිර වෙනස්කම් මෙම අවදානම් සඳහා හේතු වේ.

අවදානම් කළමනාකරණය

එවැනි අවදානම් කළමනාකරණයකින් තොරව පැවතියහොත් බැංකුවේ ලාභදායීත්වයට හානි විය හැකි බව HDFC බැංකුව තේරුම් ගනී. කෙසේ වෙතත්, කඩිනම් අනුවර්තනයන් හරහා එවැනි අවදානම්වලට කාලෝචිත ලෙස විසඳුම් සෙවීමෙන් සහ ඒවා අවම කිරීමෙන්, තරඟකාරී වෙනස්කම් සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා අවස්ථා ද අපට හඳුනාගත හැක.

කල්තියා අවදානම් අවම කිරීම

මෙම අවදානම් සාර්ථකව කළමනාකරණය කිරීම සඳහා, අපි විදිනෙදා මෙහෙයුම්වලින් ඔබ්බට ගොස් පුළුල් පරිසරය කෙරෙහි අවධානය යොමු කර ඇත්තෙමු. පහත දැක්වෙන පුළුල් පදනම් කරගත් අවධානයන් හරහා අපි මේවා ආමන්ත්‍රණය කරමු:

- ආර්ථිකයේ හෝ කර්මාන්තයේ විය හැකි වෙනස්කම් අර්බුදයක් බවට පත්වීමට පෙර හඳුනා ගැනීම.
- මූලික බැංකුකරණයෙන් (නිවාස ණය) විවිධාංගීකරණය වූ උප-නිෂ්පාදන වෙත මාරුවීම වැනි සම්පත් වෙනස් කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක නම්‍යශීලී බවක් තිබීම.
- දැඩි පීඩන කාලසීමාවන්හිදී ඔරොත්තු දීම සඳහා මූල්‍ය ප්‍රාග්ධනය සහ මානව ප්‍රාග්ධනය සඳහා ආරක්ෂිත ස්ථර ගොඩනැගීම.

බැංකුවේ උපායමාර්ගික දිශානතිය සමඟ අවදානම් කළමනාකරණය පෙළගැස්වීම

2026-2030 කාලසීමාව සඳහා නව උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීමත් සමඟ, සමාලෝචනයට ලක් වූ වසර පුරා බැංකුවේ අවදානම් කළමනාකරණය පහත ආකාරයෙන් උපායමාර්ගික අවධානය සමඟ පෙළඟ ස්වන ලදී:

- කාලෝචිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රධාන අවදානම් දර්ශක සහ පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා කළමනාකරණ වාර්තාකරණයට ඇතුළත් කරන ලදී.
- අවදානම් රුචි ප්‍රකාශය බැංකුවේ උපායමාර්ගික සැලැස්ම සමඟ පෙළගස්වන ලදී.
- උපායමාර්ගික තීරණ සඳහා සහාය වීමට ආතති පරීක්ෂණ සහ I අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය ඇගයීම් ක්‍රියාවලිය ප්‍රතිඵල භාවිතා කරන ලදී.
- අවදානම් කළමනාකරණ භාවිතයන් මහ බැංකු රෙගුලාසි සහ අපේක්ෂාවන් සමඟ පෙළගස්වන ලදී.

2025 වසරේ ප්‍රධාන විශේෂ අවස්ථාව

බැංකුව 2026-2030 සඳහා නව උපායමාර්ගික සැලැස්මක් කෙටුම්පත් කරන ලද අතර, එය වැඩිදියුණු කළ ලාභදායීතාව සහ මූල්‍ය පරාමිතීන් ඇතුළත් ශක්තිමත් මූල්‍ය සැලැස්මක් අපේක්ෂා කරයි. එය වේගයෙන් විකාශනය වන සහ කඩාකප්පල්කාරී මූල්‍ය තාක්ෂණික අවස්ථා කෙරෙහි ද අවධානය යොමු කරන අතර, කඩිසර බව සහ කාර්යක්ෂම පිරිවැය ව්‍යුහයන් සඳහා වැදගත් ඩිජිටල් සහ අනෙකුත් තාක්ෂණික යෙදවුම් වේගවත් කිරීම එහි අරමුණු අතර වේ.

2. ණය අවදානම් කළමනාකරණය

ණය ගැතියන් හෝ ගනුදෙනුකරුවන් තම ව්‍යාපාරික බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීම නිසා සිදුවිය හැකි මූල්‍ය අලාභයන් ණය අවදානම ලෙස අපි හඳුනා ගනිමු. බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස, අඩු සිට මධ්‍යම ආදායම් ලබන ණය ගැතියන් සමඟ පෙළගැසුණු අවදානම් අපි කළමනාකරණය කරමු. එවැනි අවදානම් අවම කිරීම සඳහා, ණය අනුමත කිරීමේ සිට මූල්‍ය බෙදා හැරීම සහ ආපසු ගෙවීම් කළමනාකරණය දක්වා සමස්ත ණය ජීවන චක්‍රය පාලනය කරන ශක්තිමත් පාලන රාමුවක් අප සතුය.

අදාළ කාර්යයන්

- ණයට පෙර අවදානම් කළමනාකරණය
- රුපියල් මිලියන 1.5 ඉක්මවන සියලුම ණය සඳහා අභ්‍යන්තර ණය අවදානම් ශ්‍රේණිගත කිරීමක් සිදු කිරීම.
- ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම ඇතුළුව, ණය අවදානම් ප්‍රතිපත්ති සහ අධිකාරිය පැවරීම.
- කාර්ය මණ්ඩල පුහුණුව සහ දැනුම හුවමාරු කර ගැනීමේ සැසි පැවැත්වීම.
- ණය පරිපාලන අංශය යටතේ ණය බෙදා හැරීම මධ්‍යගත කිරීම
- ණයට පසු අවදානම් කළමනාකරණය:
- ණය සමාලෝචන යාන්ත්‍රණය.
- අවදානම් ශ්‍රේණිගත කිරීමේ ආකෘති වලංගු කිරීම.
- අවදානම් රුචි සීමාවන් අධීක්ෂණය කිරීම.
- අවදානම් සහිත ණය ලැයිස්තුව සමාලෝචනය කිරීම.
- අවදානම් පදනම් කරගත් මිල නියම කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම.

වීකාබද්ධ අවදානම් රාමුව

ණය ආශ්‍රිත අවදානම් හඳුනා ගැනීමට, ඇගයීමට සහ සීමා කිරීමට අපි වීකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කර ඇත්තෙමු. මෙම ක්‍රියාවලියේ කේන්ද්‍රස්ථානය වන්නේ අවසාන ණය අනුමැතිය සඳහා අධිකාරිය දරන අවදානම් නිලධාරියා ය. ඉහළ වත්කම් ගුණාත්මකභාවයක් පවත්වා ගැනීම සඳහා අනුමත කරන ලද සෑම ණය පහසුකමක්ම ණය ගැතියාගේ නිශ්චිත අවදානම් පැතිකඩට සාපේක්ෂව ඉතා සූක්ෂම ලෙස ඇගයීමට ලක් කරන බව මෙම භූමිකාව සහතික කරයි.

ප්‍රධාන උපායමාර්ගික කුළුණු

ණය කළමනාකරණ උපාය මාර්ගය දත්ත කේන්ද්‍ර කරගත් අධීක්ෂණය සහ දැඩි නිසි විමර්ශනය මගින් මෙහෙයවනු ලැබේ:

- මාසික අවදානම් දර්ශක පුවරුව : ණය නිරාවරණයන් අධීක්ෂණය කිරීම සඳහා අවදානම් දෙපාර්තමේන්තුව සතුව පුළුල් දර්ශක පුවරුවක් පවතී. මෙම මෙවලම නිතිපතා සමාලෝචනය කිරීමට ඉඩ සලසන අතර අභ්‍යන්තර පාලනයන් වෙළඳපල වෙනස්කම්වලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව සහ ඵලදායීතාවය සහතික කරයි.
- ප්‍රමාණාත්මක ණය ශ්‍රේණිගත කිරීම : සෑම ණය ගැතියෙකුම පුළුල් නිසි විමර්ශනයකින් සහාය ලබන අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලියකට භාජනය වේ. ණය බෙදා හැරීම සඳහා සුදුසුකම් සහ තිරසාර ආපසු ගෙවීමක් සහතික කිරීම සඳහා සුදුසු පොලී අනුපාත තීරණය කිරීමට අපි ඔවුන්ගේ ණය ශක්‍යතාව ප්‍රමාණාත්මකව ඇගයීමට ලක් කරමු.
- වැඩිදියුණු කළ ඇගයීම් ප්‍රමිතීන්: වඩාත් දැඩි නිසි විමර්ශන පරීක්ෂාවන් ක්‍රියාත්මක කිරීම මගින් අපගේ මූලික ආරක්ෂක ප්‍රමිතීන් ශක්තිමත් කර ඇත. මෙයට උසස් තත්ත්වයේ ඇපකර සුරක්ෂිත කිරීම සහ පැහැර හැරීමේ අවදානමක් ඇති ණය සඳහා කල්තියා ප්‍රතිව්‍යුහගත කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම ඇතුළත් වේ.

ණය අනුමත කිරීම් සහ සීමාවන්

අනුමැතියට පෙර	රුපියල් මිලියන 1.5 ට වැඩි ණය පහසුකම් සඳහා ණය අවදානම් ශ්‍රේණිගත කිරීම සිදු කෙරේ.
අනුමැතිය	ණය බෙදා හැරීමේ අනුමැතිය සඳහා මධ්‍යගත ක්‍රියාවලියක් අනුගමනය කෙරේ.
අනුමැතියෙන් පසු	ණය සමාලෝචන ක්‍රියාවලිය සහ මධ්‍යගත ණය පියවීම් අනුමත කිරීමේ ක්‍රියාවලිය.

ණය අනුමැති මට්ටම්

ණය අනුමැති මට්ටම් ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේ විවිධ අවධීන් සඳහා බැංකුව විසින් නිශ්චිත පෞද්ගලික සීමාවන් සහ මට්ටම් ස්ථාපිත කර ඇත.

- ණය කමිටුව විසින් නියම කර ඇති පූර්ව නිශ්චිත සීමාවන් ඉක්මවන ණය ඉල්ලීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය.
- බැංකුව විසින් රුපියල් මිලියන 100ක වැදගත් ණය සීමාවක් අනුග මනය කරන අතර එය වරින් වර සමාලෝචනයට ලක් කෙරේ.

ද්වි-මාර්ග අවදානම් ශ්‍රේණිගත කිරීමේ ආකෘතිය

මෙම ශ්‍රේණිගත කිරීමේ ආකෘතිය ණය ගැතියෙකුගේ ආපසු ගෙවීමේ හැකියාවෙන් මතු විය හැකි අලාභයන් පුරෝකථනය කිරීම සඳහා සංඛ්‍යානමය මූලධර්ම මත පදනම් වේ. මෙය පැහැර හැරීමේ සම්භාවිතාව (PD), පැහැර හැරීමක් සිදුවුවහොත් අයකර ගත යුතු ඇපකරයේ වටිනාකම සහ පැහැර හැරීමකදී වන අලාභය (LGD) යන කරුණු සලකා බලයි. ආකෘතිය මගින් ග්‍රහණය කර නොගන්නා පැහැර හැරීමේ සම්භාවිතාව සහ පැහැර හැරීමකදී වන අලාභය පිළිබඳ කරුණු ඒකාබද්ධ කරන ලකුණු පුවරුවක් ද මෙයට ඇතුළත් වේ.

ඇපකර කළමනාකරණය

ණය අවදානම් අවම කිරීම සහ වත්කම්වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා බැංකුව ඵලදායී ඇපකර තක්සේරු කිරීම් සහ කළමනාකරණය සිදු කරයි. බැංකුව පහත මාර්ගෝපදේශ අනුගමනය කරයි:

- අභ්‍යන්තර තක්සේරුව: බැංකුවේ පළමු පෙළ කොටස් ප්‍රාග්ධනයෙන් 0.1%කට වඩා අඩු වටිනාකමක් ඇති ඇපකර මගින් සුරක්ෂිත ණය, අභ්‍යන්තර තක්සේරු නිලධාරීන් විසින් ඇගයීමට ලක් කෙරේ.
- බාහිර තක්සේරුව: බැංකුවේ පළමු පෙළ කොටස් ප්‍රාග්ධනයෙන් 0.1% ඉක්මවන දේපල සඳහා, බාහිර තක්සේරු විශේෂඥයින් විසින් තක්සේරු කිරීම් සිදු කරනු ලැබේ.

මධ්‍යගත ණය බෙදා හැරීම

ණය ගැතියන් වෙත අරමුදල් නිසි ලෙස වෙන් කිරීම සහතික කිරීමට, අරමුදල් අයථා පරිහරණය වැළැක්වීමට සහ අනුමත ණය අරමුණු සඳහා පමණක් අරමුදල් භාවිත කරන බව සහතික කිරීමට ණය පරිපාලන අංශය සියලුම බෙදා හැරීම් අධීක්ෂණය කරයි. මෙය මූල්‍ය විනය පවත්වා ගන්නා අතර අක්‍රිය ණය අවදානම අවම කරයි. මෙම මධ්‍යගත බෙදා හැරීමේ ප්‍රවේශය වගවීම ද සහතික කරයි.

ණය අවදානම පිළිබඳ දර්ශනීය නිරූපණය

- වත්කම්වල ගුණාත්මකභාවය - අඩපණ වූ ණය අනුපාතය - රේඛීය ප්‍රස්ථාරය
- සේවක අර්ථසාධක අරමුදල් ණය සහ අනෙකුත් සිල්ලර ණය පෙන්වන පේළිගත තීරු ප්‍රස්ථාරය
- ණය සහ තැන්පතු අනුපාතය

විශේෂ කරුණු

අවදානම් අවම කර ගැනීමේ වර්ධනයක් කෙරෙහි අප දක්වන කැපවීම පිළිබිඹු කරමින්, 2024 වසරට සාපේක්ෂව මුළු ණය කළඹ අඩු විය. මෙම වෙනස සිදුවූයේ ආක්‍රමණශීලී ව්‍යාප්තියට වඩා ස්ථාවරත්වයට ප්‍රමුඛත්වය දීම සඳහා නව ණය ලබා දීම මත පනවන ලද උපායමාර්ගික සීමාවන් හේතුවෙනි. 2025 දෙසැම්බර් 31 වන විට, බැංකුවේ ණය කළඹ 2024 දෙසැම්බර් 31 දින පැවති රුපියල් බිලියන 43.22 සිට රුපියල් බිලියන 37.52 දක්වා අඩු විය. එම කාලය තුළම, අගය අඩුවීමේ අනුපාතය 22.98% සිට 27.28% දක්වා අයහපත් අතට හැරුණි.

අයවැයගත මුදලට සාපේක්ෂව නියමිත ණය ආපසු ගෙවීම්වලින් අප විසින් අයකර ගැනීමට සමත් වූ ප්‍රමාණය දැක්වෙන "අයවැය ණය අයකර ගැනීමේ අනුපාතය" 50% ක් විය. මෙය අවදානම් රුචිය තුළ පවතී.

වැදගත් අනුපාතය	**සීමාව**	**2025**	**2024**
අක්‍රීය ණය අනුපාතය (සේවක අර්ථසාධක අරමුදල හැර)	20.0%	22.4	20.9%
වොච් ප්ලස් අනුපාතය (සේවක අර්ථසාධක අරමුදල හැර)			
ඇපකරුවන්ගේ ණය සාන්ද්‍රණය	20.0%	13.2	19.40%
අගය අඩුවීමේ ආවරණය	30.0%		34.30%
කපා හැරීමේ අනුපාතය	10.0%	4.9	2.8
අයවැය ණය අයකර ගැනීමේ අනුපාතය	50%	අවදානම් රුචිය තුළ පවතී	

අක්‍රීය ණය බලපෑම අවම කිරීමට ගත් පියවර:

- කල්තියා අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීම.
- ණය කළඹ අබණ්ඩව අධීක්ෂණය කිරීම.
- ප්‍රමාණවත් පරිදි අගය අඩුවීමේ විධිවිධාන පවත්වා ගැනීම.
- වැඩිදියුණු කළ ණය ඇගයීම් ප්‍රමිතීන්.

ශුද්ධ පොලී ආදායම NII මත කපා හැරීම්	10.00%	සීමාව තුළ පවතී.
ණය සමාලෝචන ක්‍රියාවලිය	50%	සීමාව තුළ පවතී.

අවදානම් කළමනාකරණය

ණය දීමේ ක්‍රියාකාරකම්

නියාමන ප්‍රමිතීන් සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති සමඟ පෙළගැසෙමින් ණය සමාලෝචනය කිරීම සඳහා බැංකුව බහු-ස්ථර සහ දැඩි ප්‍රවේශයක් පවත්වා ගනී. සමාලෝචන ප්‍රධාන ආකාර දෙකකින් සිදු කෙරේ:

- වාර්ෂික සමාලෝචන: සෑම ණය නිරාවරණයක්ම අවදානම් පදනම් කරගත් නිශ්චිත වාර්ෂික සමාලෝචනයකට භාජනය වේ. මෙයට ආයතනික මූල්‍ය ප්‍රකාශනවල විස්තීර්ණ පරීක්ෂාවක්, ක්ෂේත්‍ර ඇගයීම් සහ ගිවිසුම් අනුකූලතාව පිළිබඳ මනා තක්සේරුවක් ඇතුළත් වේ. මෙම ක්‍රියාවලියෙන් නිදහස් කිරීම් සඳහා නම් කරන ලද බලධාරීන්ගෙන් අනුමැතිය අවශ්‍ය වේ.
- අහඹු සහ සැලකිය යුතු ණය සමාලෝචන: අනුමත කිරීමෙන් මාස තුනක් ඇතුළත හෝ ණය ගුණාත්මකභාවය අඩුවීමේ කිසියම් ඇඟවීමක් ලැබුණු විහාම, සැලකිය යුතු ණය ප්‍රමාණයන් සඳහා බැංකුව ඉලක්කගත සමාලෝචන සිදු කරයි. මෙම සමාලෝචන මගින් ණය අනුමැතියන්හි ඵලදායීතාවය ඇගයීමට ලක් කරන අතර කළඹ පිරිහීම නිරීක්ෂණය කරයි.

ස්වාධීන අධීක්ෂණය

පක්ෂග්‍රාහී නොවන ඇගයීමක් සහතික කිරීම සඳහා, බැංකු ප්‍රතිපත්ති සහ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව ණය පහසුකම් පිළිබඳ පුළුල් තාක්ෂණික විශේෂඥතාවක් ඇති විශේෂඥ නිලධාරීන් විසින් ණය සමාලෝචන සිදු කරනු ලබයි. පක්ෂග්‍රාහී බවක් නොමැති බව සහතික කිරීම සඳහා, ණය අනුමත කිරීමේ ක්‍රියාවලියෙන් දැඩි ලෙස බැහැර කරන ලද සහ මුල් ණය සමාලෝචනය හෝ අනුමැතිය සමඟ සම්බන්ධ වූවන්ගෙන් බලපෑමක් නොමැති විශේෂඥ නිලධාරීන් විසින් මෙම සමාලෝචන සිදු කරනු ලැබේ.

තීරණාත්මක සමාලෝචන පරාමිතීන්

සමාලෝචන ක්‍රියාවලිය පහත ක්ෂේත්‍ර කෙරෙහි සමස්ත අවධානයක් යොමු කරමින් සිදු කෙරේ:

- වත්කම්වල ගුණාත්මකභාවය: ණය ගුණාත්මක ප්‍රවණතා සහ පවරා ඇති ණය ශ්‍රේණිවල නිරවද්‍යතාවය/කාලෝචිත බව.
- ලේඛනගත කිරීම සහ නීතිමය කරුණු: ඇපකර ලේඛනවල ප්‍රමාණවත් බව සහ නිසි අයිතිවාසිකම් තහවුරු කිරීම.
- අනුකූලතාවය: අභ්‍යන්තර ක්‍රියාපටිපාටි, ණය කොන්දේසි සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ රෙගුලාසිවලට අනුකූල වීම.
- කළඹ කළමනාකරණය: කළඹෙහි ගුණාත්මකභාවය සහ වම ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ.

වාර්තාකරණය සහ නිවැරදි කිරීම්

සමාලෝචනයෙන් පසු සොයාගැනීම්, මණ්ඩල වීකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට පෙර අදාළ ශාඛාව සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කරනු ලැබේ. සැලකිය යුතු කරුණු කඩිනමින් විසඳා නොමැති නම්, ක්ෂණික නිවැරදි කිරීමේ පියවර ගැනීම සඳහා වම ගැටලුව ඉහළ කළමනාකාරිත්වය වෙත යොමු කරනු ලැබේ.

COLLECTIONS AND RECOVERIES

අයකර ගැනීම් සහ ප්‍රතිසාධනයන්

- ණය ආපසු ගෙවීම් සුරක්ෂිත කිරීමට සහ පැහැර හරින ලද ගිණුම් කළමනාකරණය කිරීමට බැංකුව සතු අදියරෙන් අදියර වූ සදාචාරාත්මක ප්‍රවේශය:
- මූලික සම්බන්ධීකරණය: ආපසු ගෙවීම් දිරිගැන්වීම සඳහා නිල මතක් කිරීමේ ලිපි නිකුත් කිරීම සහ බලහත්කාරයෙන් තොරව පුද්ගලික දුරකථන ඇමතුම් ලබා දීම.
- ණය කාලසටහන්ගත කිරීම: දැඩි මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දෙන ගනුදෙනුකරුවන් සඳහා, ආපසු ගෙවීම් පහසු කිරීමට සහ සම්පූර්ණයෙන්ම පැහැර හැරීමේ අවදානම අවම කිරීමට බැංකුව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ නැවත කාලසටහන්ගත කිරීමේ විකල්ප ලබා දෙයි.
- පරාටේ නීතිය හරහා අයකර ගැනීම්: දිගින් දිගටම ණය පැහැර හරින අවස්ථාවලදී, නීතිමය විධිවිධාන සහ නිසි ක්‍රියා පටිපාටියට අනුකූලව, අධිකරණ මැදිහත්වීමකින් තොරව උකස් කළ දේපල අත්පත් කර ගැනීමට සහ විකිණීමට හැකි වන පරිදි අදාළ පරාටේ නීතිය යටතේ බැංකුවට අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කළ හැක.

3. ප්‍රාග්ධන අවදානම් කළමනාකරණය

බැංකුවේ ස්ථාවරත්වය සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන සංචිත පවත්වා ගැනීම අත්‍යවශ්‍ය බව බැංකුව පිළිගන්නා අතර, එය තැන්පත්කරුවන් සහ ණයහිමියන් සඳහා තීරණාත්මක ආරක්ෂාවක් සලසයි. මීට අමතරව, ශක්තිමත් ප්‍රාග්ධන මට්ටමක් කොටස් හිමියන්ගේ මූල්‍ය ආයෝජන ආරක්ෂා කරන අතර ආර්ථික පසුබෑම් හමුවේ ආයෝජන ආරක්ෂා කිරීමට අමතර ආරක්ෂිත ස්ථරයක් එක් කරයි.

අදාළ කාර්යයන්

- අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය ඇගයීම් ක්‍රියාවලිය (ICAAP) සමාලෝචනය කිරීම.
- නියාමන ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ තත්ත්වය සහ සීමාවන්ට සාපේක්ෂව පවතින ප්‍රවණතා.
- නියාමන සහ උපදේශාත්මක/අභ්‍යන්තර සීමාවන් ඇතුළු සමස්ත අවදානම් සීමා පද්ධතිය.
- ප්‍රධාන අවදානම් පිළිබඳ ආතති පරීක්ෂණ සහ ඉහළ මට්ටමේ/නව උපායමාර්ගික අවදානම් විශ්ලේෂණ පිළිබඳ වාර්තා.

2019 අංක 11 දරන බැංකු පනත් විධානයන්ට අනුව, සංශෝධිත බාසල් III පදනම් කරගත් ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශ මගින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා 12.50%ක අවම නියාමන ප්‍රාග්ධනයක් පවත්වා ගැනීම අනිවාර්ය කර ඇත. මෙයට ප්‍රාග්ධන සංරක්ෂණ ස්ථරය ඇතුළුව 7%ක පොදු කොටස් ප්‍රාග්ධන ස්ථර 1 සහ ප්‍රාග්ධන සංරක්ෂණ ස්ථරය ඇතුළුව 8.50%ක මුළු ප්‍රාග්ධන ස්ථර 1ක් අයත් වේ.

වැඩිදියුණු කළ ප්‍රාග්ධන කළමනාකරණය

2025 වසරේදී, නියාමන අවශ්‍යතා මගින් මෙහෙයවනු ලබන සහ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීමේ මූලික කුළුණක් ලෙස ප්‍රාග්ධන කළමනාකරණය වෙත අපි දැඩි අවධානයක් යොමු කළෙමු.

- නියාමන අනුකූලතාව: බැංකුව රුපියල් බිලියන 7.5ක අවම ප්‍රාග ්ධන අවශ්‍යතාවය සාර්ථකව පවත්වා ගත් අතර, එය 2023 නියමිත කාලසීමාව තුළ සපුරන ලදී.
- ප්‍රාග්ධන අනුපාත: 2025 වසර අවසානය වන විට ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය (CAR) 35.10%ක් විය. මෙය අවම නියාමන සීමාවන් සැලකිය යුතු ලෙස ඉක්මවා යාමකි.
- බාසල් III වීකාබද්ධ කිරීම: අභ්‍යන්තර ප්‍රාග්ධන ඇගයීම් ක්‍රියාවලීන් බාසල් III ප්‍රමිතීන්ට අනුකූලව දැඩි ලෙස පවත්වා ගන්නා ලදී.


- තිරසාර වර්ධනය: ශක්තිමත් අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනය සහ වෙනස් වන වෙළඳපල තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් අවදානම් බරිත වත්කම් (RWA) උපායමාර්ගිකව ප්‍රශස්ත කිරීම හරහා ප්‍රාග්ධන ස්ථර තවදුරටත් ශක්තිමත් කරන ලදී.

විශේෂ කරුණු

12.5%ක අවම නියාමන අවශ්‍යතාවයට වඩා සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවති ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය අඛණ්ඩව අධීක්ෂණය කිරීම හරහා බැංකුව ප්‍රමාණවත් ප්‍රාග්ධන ස්ථර සහතික කළේය. අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය ඇගයීම් ක්‍රියාවලිය , නිතිපතා ආතති පරීක්ෂණ සහ අවදානම් රුචි රාමුව හරහා ප්‍රාග ්ධන සැලසුම්කරණයට සහාය ලැබුණු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් අඛණ්ඩ අධීක්ෂණය සිදු කරන ලදී.

දර්ශකය	කාර්යසාධනය / තත්ත්වය
ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය	34.20% (12.5%ක නියාමන අවම මට්ටමට වඩා බෙහෙවින් ඉහළයි)
අවම ප්‍රාග්ධන ඉලක්කය	රු.බි. 7.5 (2023 අවසානය වන විට සාක්ෂාත් කර ඇත) රු.බි. 7.5 (2025 මුදල් වසර අවසානය වන විට)
රාමුව	බාසල් III අනුකූල වේ
ප්‍රාථමික උපාය මාර්ගය	අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනය සහ අවදානම් බරිත වත්කම් ගැලපීම

	ඒකකය	2025	2024	2023
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ස්ථර 1 අනුපාතය	%	32.08%	32.53%	35.84%
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ස්ථර 1 අගය	රු. මිලියන	6,879	7,142	7,577
ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය	%	32.08%	32.53%	35.84%
ස්ථර 1 ප්‍රාග්ධන අගය	රු. මිලියන	7,129	7,392	7,828
මුළු ප්‍රාග්ධන අනුපාතය	%	34.20	34.65%	39.03%
මුළු ප්‍රාග්ධන අගය	රු. මිලියන	7,333	7,608	8,253



4. වෙළඳපල අවදානම

වෙළඳපල අවදානම යනු භාණ්ඩවල වෙළඳපල මිල, විදේශ විනිමය අනුපාත, පොලී අනුපාත සහ ණය පැතිරීම් කෙරෙහි බලපෑම් කළ හැකි ගෝලීය, දේශීය හෝ කර්මාන්ත මට්ටමේ සිදුවීම් වැනි අනපේක්ෂිත, මධ්‍යම සිට ඉහළ මට්ටමේ බලපෑමක් ඇති කරන ඕනෑම සිදුවීමකින් සිදුවිය හැකි මූල්‍ය අලාභයන් නියෝජනය කරයි.

දේශීය සහ ගෝලීය සිදුවීම් නිතර සිදුවන බැවින්, පැහැදිලි රටාවන් හඳුනා ගැනීම අතිශය අභියෝගාත්මක වී ඇත. එබැවින්, අපගේ මූල්‍ය කාර්යසාධනය සහ ප්‍රාග්ධන මට්ටම් කෙරෙහි වෙළඳපල අවදානම් ඇති කරන බලපෑම් අවබෝධ කර ගැනීම සඳහා නිරන්තර නිරීක්ෂණය සහ විශ්ලේෂණය හරහා එවැනි බාහිර සිදුවීම් කළමනාකරණය කිරීමට බැංකුව අඛණ්ඩව කටයුතු කරයි.

2025 මුදල් වසර පුරා අපගේ වෙළඳපල සහ පොලී අනුපාත නිරාවරණයන් පිළිබඳ අධීක්ෂණය වත්කම්-බැරකම් කමිටුව විසින් ඉතා සුපරීක්ෂාකාරීව සිදු කරන ලදී.

අදාළ කාර්යයන්:

- ද්‍රවශීලතා සහ වෙළඳපල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- ද්‍රවශීලතාවය සහ භාණ්ඩාගාර වෙළඳපල අවදානම් විශ්ලේෂණය පිළිබඳ වාර්තා.
- මධ්‍යම කාර්යාල කාර්යභාරය
- ALCO විසින් කරනු ලබන නිර්දේශ සමාලෝචනය කිරීම.
- බාසල් III අවශ්‍යතා මත පදනම් වූ ද්‍රවශීලතා අවදානම් නිරීක්ෂණය.

වත්කම් නිරාවරණය සහ ද්‍රාව්‍යතාව

වෙළඳපල අවදානම් වත්කම් නිරාවරණයන් හරහා අපගේ ද්‍රාව්‍යතාවයට සෘජුවම බලපෑම් කරයි. එබැවින්, වෙළඳපල වෙනස්වීම්වලට නිරාවරණය වන මූල්‍ය වත්කම් පිළිබඳ කල්තියා අධීක්ෂණය කිරීම හරහා බැංකුවේ අඛණ්ඩ ද්‍රාව්‍යතාව සුරක්ෂිත කෙරේ. මෙයට පහත සඳහන් වෙළඳ නොවන කළඹ ඇතුළත් වේ:

- මුදල් සහ මුදල්වලට සමාන වත්කම්.
- වෙනත් මූල්‍ය ආයතනවල තැන්පත් කර ඇති මුදල්.
- ණය සහ අත්තිකාරම් (අවප්‍රමාණකරණ පිරිවැය මත).
- ණය සුරැකුම්පත් සහ විවිධ අනෙකුත් වත්කම්.

පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු පුළුල් වෙළඳපල අවදානම් පැතිකඩ තුළ පවතින උප කාණ්ඩයකි. මෙය විශේෂිත සහ විශේෂිත නොවන බැංකු යන දෙකටම බලපායි. මෙම අවදානම පැන නගින්නේ අස්ථාවර අනුපාත චලනයන් හේතුවෙන් අපගේ ශුද්ධ පොලී ආදායමට විල්ල විය හැකි තර්ජනවලට විසඳුම් සෙවීම සම්බන්ධයෙනි.

අවදානම් අවම කිරීමේ උපාය මාර්ග:

- සංවේදීතා විශ්ලේෂණය: විවිධ පොලී අනුපාත අවස්ථාවන්ට සාපේක්ෂව මූල්‍ය වත්කම් සහ බැරකම් නිතිපතා පරීක්ෂා කිරීම.
- සමාන ආයතන සමඟ සැසඳීම: ආයෝජන උපාය මාර්ග නැවත සකස් කිරීම සඳහා අදාළ ආයතනික කණ්ඩායම්වල විශ්ලේෂණ කාර්තුමය වශයෙන් සමාලෝචනය කිරීම.

අවදානම් කළමනාකරණය

- කළඹ නැවත තුලනය කිරීම: වත්මන් වෙළඳපල තත්ත්වයන්ට අනුකූලව ණය සහ තැන්පතු මිශ්‍රණය ගැලපීම.
- උපායමාර්ගික මාරුවීම්: අධික අස්ථාවර කාලවලදී ආයෝජන වඩාත් ඔරොත්තු දෙන, කෙටි කාලීන සුරැකුම්පත් වෙත මාරු කිරීම.

දර්ශකය	සීමාව	2025	2024
පොළී සංවේදී අනුපාතය (ISR)	40%	111%	113%
පොළී ආදායමට සාපේක්ෂව පොළී වියදම (%)	70%	61.9%	66.0%

2025 වසරේ මූල්‍ය ප්‍රතිපත්ති අනුපාත

වසර ආරම්භයේදී, ණය දීමේ පොළී අනුපාතය 8.66%ක් ලෙස පැවති අතර, වසර අවසානය වන විට එය 8.87% දක්වා වැඩි විය. මෙය මූලික ලක්ෂ්‍ය 21ක වෙනසකි. ඒ අනුව, ණය දීමේ අනුපාතවල සිදුවූ මෙම වෙනස ණය කළඹ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේ නැත.

කාලරේඛාව	ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගය (ශ්‍රී ලංකා මහ බැංකුව)	සන්දර්භය
2025 ජනවාරි	8.00% මට්ටමේ පවත්වා ගන්නා ලදී	පවතින ආර්ථික ප්‍රකෘතිය සමතුලිත කිරීමට සහ මධ්‍ය කාලීනව උද්ධමනය 5% ඉලක්කය කරා ගෙන යාමට.
2025 මාර්තු	ස්ථාවර මට්ටමක්පවතින ආර්ථික ප්‍රකෘතිය සමතුලිත කිරීමට සහ උද්ධමන පීඩනය කළමනාකරණය කිරීමට.	
2025 මැයි	7.75% දක්වා අඩු	ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කරන ලදී කිරීමට, ආර්ථික ප්‍රකෘතියට සහය වීමට සහ 5% ඉලක්කය කරා යොමු වීමට.
2025 ජූලි / සැප්තැම්බර්	7.75% මට්ටමේ පවත්වා ගන්නා ලදී	ආර්ථික ප්‍රකෘතිය සමතුලිත කිරීමට සහ ක්‍රමයෙන් ධනාත්මක උද්ධමනයක් කරා ළඟා වීමට.
2025 නොවැම්බර්	7.75% මට්ටමේ පවත්වා ගන්නා ලදී	ආර්ථික ප්‍රකෘතිය සමතුලිත කිරීමට සහ මධ්‍ය කාලීනව 5% ඉලක්කය සපුරා ගැනීමට.

වසර අවසානය වන විට අනුපාතය 8.31% ක් වූ අතර එය මූලික ලක්ෂ්‍ය 66 ක අඩුවීමකි. එම කාලය තුළ භාණ්ඩාගාර බිල්පත් අනුපාතය 8.47% සිට 8.19% දක්වා මූලික ලක්ෂ්‍ය 28 කින් අඩු විය. ඒ අනුව, ස්ථාවර තැන්පතු සහ ආයෝජන අනුපාතවල සිදුවූ වෙනස්කම් බැංකුවේ තැන්පතු සහ ආයෝජන කළඹ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේ නැත.

බැංකුව මුහුණ දෙන වෙළඳපල අවදානම් නිරාවරණයට බලපාන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ අනුපාත පහත දැක්වේ.

5. ද්‍රවශීලතා අවදානම

බසුමසාසවිහ රසිනි දජජමර රෙදජ"බ සබ්ෂසකසවිහ වීද පැවැ"යදරවී-වීරජ සෙබ්බජස්ක ද්‍රවශීලතා අවදානම් ඇතිවන්නේ කෙටි කාලීන මූල්‍ය බැඳීම් ඉටු කිරීමට ඇති නොහැකියාව හේතුවෙනි. ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම, ප්‍රාග්ධනය හිඟකම සහ විවිධාංගීකරණය වූ අරමුදල් මූලාශ්‍ර ස්වල්පයක් තිබීම වැනි සාධක සාමාන්‍යයෙන් ද්‍රවශීලතා අවදානමට බලපායි. එබැවින්, මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සහ ණයහිමියන් ආරක්ෂා කිරීම සඳහා, අපි අපගේ ද්‍රවශීලතා මිනුම් සහ මූල්‍ය තත්ත්වය නිතිපතා සමීපව නිරීක්ෂණය කරන්නෙමු.

ආතති පරීක්ෂණ යනු ද්‍රවශීලතා අවදානම කල්තියා කළමනාකරණය කිරීමේ එක් ක්‍රමයකි. මීට අමතරව, කෙටි කාලීන බැඳීම් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් මූලාශ්‍ර ඇති බව සහතික කර ගැනීමට විවිධ තීරණාත්මක ඇගයීම් සිදු කරනු ලැබේ.

අපගේ වත්කම් කළඹ විවිධ කල්පිරීම් කාලවලට විහිදී යන පරිදි ඉතා ද්‍රවශීලීව ව්‍යුහගත කර ඇති අතර, පාරිභෝගික තැන්පතු, වෙළඳපල ණය ගැනීම් සහ හදිසි පහසුකම්වලින් සමන්විත විවිධාංගීකරණය වූ අරමුදල් පදනමක් අපි පවත්වා ගනිමු. ද්‍රවශීලී වත්කම්වලට මුදල්, මුදල්වලට සමාන වත්කම්, කෙටි කාලීන තැන්පතු සහ ද්‍රවශීලී ණය සුරැකුම්පත් ඇතුළත් වන අතර, කෙටි කාලීන අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මේවා ඕනෑම මොහොතක ලබාගත හැකිය. තවද, බැංකුවේ ව්‍යුත්පන්න නොවන මූල්‍ය බැඳීම් වීවායේ ගිවිසුම්ගත කල්පිරීම් සමඟ පෙළගස්වා ඇති අතර, සමතුලිත ද්‍රවශීලතා පැතිකඩක් සහතික කෙරේ.

ව්‍යුහාත්මක ස්ථාවරත්වය සහතික කිරීම සඳහා බැංකුව විශ්ලේෂණාත්මක මෙවලම් කිහිපයක් භාවිතා කරයි:

- කල්පිරීමේ පරතරය විශ්ලේෂණය වත්කම් සහ බැරකම් අතර කාල පරතරයන් නිරීක්ෂණය කිරීම සඳහා 2025 දී මෙම විශ්ලේෂණය සිදු කරන ලදී.
- නිතිපතා නිරීක්ෂණය කරන අනුපාත: , ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය විශ්ලේෂණය කරයි.
- ව්‍යවස්ථාපිත අවශ්‍යතා - බාසල් III ද්‍රවශීලතා අවශ්‍යතාවලට අනුව ද්‍රවශීලතා අනුපාත නිරීක්ෂණය කිරීම, කල්පිරීමේ නොගැලපීම් තක්සේරු කිරීම සහ ඇපකර ලෙස තැබිය නොහැකි වත්කම් හඳුනා ගැනීම සිදු කෙරේ.
- මුදල් ප්‍රවාහ අනාවැකි: මේවා කලින් කලට සිදු කරනු ලැබේ.

2025 වසර පුරාම, බැංකුව අවදානම් අධීක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියාශීලී ස්ථාවරයක් පවත්වා ගෙන ගියේය. ඒ යටතේ අපි පහත ක්‍රියාකාරකම් සිදු කළෙමු:

- ප්‍රතිපත්ති සමාලෝචන: 2025 වසර තුළ බැංකුව සිය ද්‍රවශීලතා සහ වෙළඳපල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය කළේය.
- ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම්: 2025 සමාලෝචනයෙන් පසු මෙම ප්‍රතිපත්තිවල සැලකිය යුතු වෙනස්කම් හෝ යාවත්කාලීන කිරීම් සිදු නොවීය.
- ආතති පරීක්ෂණ : වසර තුළ පොළී අනුපාත අවදානම් ආතති පරීක්ෂණ සිදු කරන ලදී.
- නිරාවරණය : 2025 වසරේදී නැවත මිල නියම කිරීම් මත පදනම් වූ නිරාවරණයන් හෝ භාණ්ඩ ආශ්‍රිත මිල අවදානම් කිසිවක් බැංකුව වාර්තා කර නොමැත.

නියාමන ද්‍රවශීලතා අනුපාතවලට අනුකූල වීම හරහා මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීමට බැංකුව පියවර කිහිපයක් ගත්තේය:

- ද්‍රවශීලතා ආතති පරීක්ෂණ: අභියෝගාත්මක කාලවලදී මූල්‍ය බැඳීම් ඉටු කිරීමට බැංකුවේ ඇති හැකියාව තක්සේරු කිරීම සඳහා අනුකරණය කරන ලද අවස්ථාවන් භාවිතා කරන ලදී.
- මධ්‍යම කාර්යාල කාර්යභාරය : අනුකූලතාව සහ සුමට මෙහෙයුම් සහතික කිරීම සඳහා අවදානම් නිරීක්ෂණය සහ කළමනාකරණය කරන ලදී.
- මෙහෙයුම් සහ මාසික අවදානම් දර්ශක පුවරු: මෙහෙයුම් සහ සමස්ත අවදානම් පිළිබඳ අවබෝධයක් ලබා දෙමින් කල්තියා කළමනාකරණයට ඉඩ සලසයි.
- කෙටි කාලීන අරමුදල් විධිවිධාන: අවශ්‍ය නම් අමතර අරමුදල් ඉක්මනින් ලබා ගැනීමේ උපාය මාර්ග ගවේෂණය කරන ලදී.

- බැංකුව විවිධාංගීකරණය වූ අරමුදල් පදනමක් පවත්වා ගත් අතර, වෙළඳපල අස්ථාවරත්වයට ප්‍රතිචාර වශයෙන් ද්‍රවශීලී වත්කම් වැඩි කළ අතර, ආතති සහගත තත්ත්වයන් යටතේ ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් සහතික කළේය.

වත්කම්-බැරකම් කළමනාකරණය

	මාස 3ට අඩු	මාස 3-12	වසර 1-3	වසර 3-5	වසර 5ට වැඩි
මුළු ව්‍යුත්පන්න නොවන බැරකම් (රු. මිලියන)	15,577	15,100	8,415	5,833	10,978

217%ක ද්‍රවශීලතා ආවරණ අනුපාතය ඉතා ශක්තිමත් මට්ටමක පවතින අතර, දින 30ක ආතති සහගත අරමුදල් අවස්ථාවකදී පවා බැංකුවට පැවතිය හැකි උසස් තත්ත්වයේ ද්‍රවශීලී වත්කම්වල සැලකිය යුතු සංචිතයක් ඇති බව එයින් පෙන්නුම් කෙරේ.

දර්ශකය	සීමාව	2025	2024
ද්‍රවශීලතා සහ නියාමන අනුපාත			
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය			
ද්‍රවශීලතා ආවරණ අනුපාතය	100%	217%	223%
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය	100%	107%	128%
ණය සහ තැන්පතු ව්‍යුහය			
ශුද්ධ ණය සහ තැන්පතු අනුපාතය	70%	74%	77%
ස්ථාවර තැන්පතු සහ ණය අනුපාතය			
ස්ථාවර තැන්පතු සාන්ද්‍රණය (කල්පිරීම අනුව)			
CASA අනුපාතය	20%	19%	17%
වත්කම් සංයුතිය			
ආයෝජන සහ සමස්ත වත්කම් අනුපාතය	30%	41.20%	34%
ණය ගැනීම් සහ සමස්ත වත්කම් අනුපාතය	20%	5.4%	4.7%
ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය			
කොටස් සහ සමස්ත වත්කම් අනුපාතය	5%	12.5%	12.2%

6. මෙහෙයුම් අවදානම්

මෙහෙයුම් අවදානම් මගින් මෙහෙයුම් කටයුතුවල බාධා ඇති කිරීමේ හැකියාවක් පවතී. මේවා ඍණාත්මක අභ්‍යන්තර සහ බාහිර තත්ත්වයන් නිසා ඇතිවිය හැකි අතර, මානව දෝෂ, තාක්ෂණික බාධා, පද්ධතිමය අසාර්ථකත්වයන්, යටිතල පහසුකම්වල දුර්වලතා සහ නියාමන වෙනස්කම්වලට අනුගත වීමට ඇති නොහැකියාව යන කරුණු මගින් පැන නඟී.

මෙහෙයුම් අවදානම් සහිත විවිධ කාර්යයන් කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා, අපි ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් කෙරෙහි අවධානය යොමු කරමු:

7.1 මානව අවදානම

දෝෂ, අහඵපෘවීම්, වංචා, දැනුමේ පරිහරියන් සහ විනිශ්චය, සංජානනය සහ හැසිරීම්වල පවතින මූලික මානව වැරදි ඇතුළු මානව සාධකවලින් පැන නඟින අවදානම්වලට නිරාවරණය වීම.

7.2 තොරතුරු තාක්ෂණ අවදානම

සිව්වල් සහ තාක්ෂණික පද්ධති, දත්ත කඩවීම්, දෘඩාංග අසාර්ථකවීම් සහ සේවාවන්ගි අඛණ්ඩතාව, ලබා ගැනීමේ හැකියාව සහ විශ්වසනීයත්වය අඛිපණ කළ හැකි යටිතල පහසුකම්වල දුර්වලතා සම්බන්ධ අවදානම්.

7.3 නීති මය සහ අනුකූලතා අවදානම

ව්‍යවස්ථාපිත අවශ්‍යතා, නීති සම්පාදනයේ වෙනස්කම් සහ රෙගුලාසිවලට අනුකූල නොවීම ඇතුළු බාහිර පරිසරයෙන් එල්ල වන තර්ජන - මේවා නීතිමය ක්‍රියාමාර්ග හෝ දඩ මුදල්වලට තුඩු දිය හැකිය.

2025 වසරේ ප්‍රගතිය

අවදානම් දර්ශක / පරාමිතීන්	සීමාව	අදහස්
කාර්ය මණ්ඩල හැරයාමේ අනුපාතය	10.00%	ඉවසීමේ සීමාව තුළ
ණය සේවාදායකයින් හැරයාමේ අනුපාතය	15.00%	ඉවසීමේ සීමාව තුළ
ශේෂ පත්‍රයේ වර්ධනය	10.00%	ඉවසීමේ සීමාව ඉක්මවා ඇත
ඒක පුද්ගල ලාභය (රු. මිලියන)	1 Mn	ඉවසීමේ සීමාව ඉක්මවා ඇත
ශුද්ධ පොලී ආදායම NII මත කපා හැරීම්	10.00%	අවදානම් රුචිය තුළ

මෙහෙයුම් අවදානම් කළමනාකරණය

දිට්වා සුළි කුණාටුවේ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ව්‍යාපාර බහුතරයක් තාවකාලිකව වසා දැමීමට සිදුවිය. මෙහි බලපෑම අපගේ දිවයින පුරා විහිදුනු ශාඛා ජාලයටද දැනුණු අතර, මෙහෙයුම් කටයුතු තාවකාලිකව අඩාල විය. කෙසේ වෙතත්, අවම වර්ෂාපතනයක් සහ ගංවතුර බලපෑමක් ඇති ප්‍රදේශවල බැංකුව අඛණ්ඩව සිය මෙහෙයුම් පවත්වා ගෙන ගියේය. මීට අමතරව, සමාලෝචනයට ලක් වූ වසර පුරා පහත දියුණු කිරීම් සිදු විය.

අවදානම් කළමනාකරණය


කාණ්ඩය	විස්තර / ප්‍රතිඵල
BCP අභ්‍යාස (2025)	ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ ප්‍රධාන කාර්ය මණ්ඩලය සහභාගී විය. ව්‍යාපාර අඛණ්ඩ පැවැත්මේ සැලැස්මට අනුකූලව, 'දිට්වා' සුළි කුණාටුව අතරතුර සහ ඉන් පසුව, විකල්ප ශාඛා සහ දුරස්ථ ප්‍රවේශ හරහා කාර්ය මණ්ඩලය මෙහෙයුම් පවත්වා ගෙන ගියේය.
ආපදා ප්‍රකෘතිමත් කිරීමේ අභ්‍යාස	ගිනි නිවන හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ සහාය ඇතිව BCP කණ්ඩායම විසින් ගිනි නිවීමේ අභ්‍යාසයක් පවත්වන ලදී.
මෙහෙයුම් අවදානම්	බැංකුව මූලික දර්ශක ප්‍රවේශය භාවිතා කළේය. මෙහෙයුම් අවදානම සඳහා වන මෙහෙයුම් අවදානම් වියදම රු. 5,106,952,000ක් ලෙස ගණනය කරන ලදී.
අලාභ ඉවසීමේ සීමාවන්	කාර්ය මණ්ඩල හැරයාමේ අනුපාතය, NII මත කපා හැරීම් (%), ණය සේවාදායකයින් හැරයාමේ අනුපාතය, ශේෂ පත්‍රයේ වර්ධනය සහ ඒක පුද්ගල ලාභය හරහා අධීක්ෂණය කෙරේ.
මෙහෙයුම් අලාභයන්	2025 අවසානය වන විට රු. මිලියන 80.70ක මුළු මෙහෙයුම් අලාභයක් වාර්තා විය.

6.1 මානව අවදානම් කළමනාකරණය

මානව අවදානම් අවම කිරීම, මානව සම්පත් සහ වේතන කමිටුවේ අධීක්ෂණය යටතේ සහතික කෙරේ. සේවක බලකායේ ශක්තිය වැඩි දියුණු කිරීම සහ දියුණු කිරීම සඳහා අවස්ථා හඳුනා ගැනීම සඳහා මෙම කමිටුව උපායමාර්ගික නිර්දේශ ලබා දෙයි.

- දක්ෂතා අත්පත් කර ගැනීම: බැංකුකරණය සහ විශේෂිත ක්‍රියාකාරී විෂයයන් හරහා ඉහළ සුදුසුකම් ලත්, පළපුරුදු වෘත්තිකයන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට අවධානය යොමු කිරීම.
- නායකත්ව පසු පෙළ සූදානම් කිරීම: බැංකුවේ අනාගත නායකත්වය පෝෂණය කිරීම සඳහා ශක්තිමත් අනුප්‍රාප්තික සැලසුම්කරණය සහ විස්තීර්ණ පුහුණු වැඩසටහන්. මීට අමතරව, අනුප්‍රාප්තික ප්‍රතිපත්තිය බැංකුව සඳහා තීරණාත්මක භූමිකාවන් හඳුනා ගන්නා අතර, අනාගත නායකත්ව වෙනස්කම් අපේක්ෂා කරමින් දක්ෂතා සංවර්ධනය සඳහා රාමුවක් ස්ථාපිත කර ඇත.
- නිපුණතා සංවර්ධනය: තාක්ෂණික බැංකු දැනුම, අනුකූලතාව, අවදානම් කළමනාකරණය සහ නිෂ්පාදන විශේෂඥතාව පිළිබඳ පරතරයන් පියවා ගැනීම සඳහා අඛණ්ඩ පුහුණු සහ සංවර්ධන මුලපිරීම් සිදු කෙරේ.
- චර්යා ප්‍රමිතීන්: චකමුතුකම සහ ගෞරවය සහිත සාධාරණ සේවා පරිසරයක් සහතික කරන මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති ඇතුළු ආයතනික චර්යා නීති සංග්‍රහය සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති ක්‍රියාත්මක වේ. මේවා අභ්‍යන්තර ක්‍රියාපටිපාටිවලට සේවක අනුකූලතාව සහතික කරයි.
- සේවක කළමනාකරණය: බැංකු ප්‍රතිපත්ති සහ සේවක කළමනාකරණය පිළිබඳ හොඳම භාවිතයන්ට අනුකූලව විස්තීර්ණ මානව සම්පත් කළමනාකරණ උපාය මාර්ගයක් හරහා ධනාත්මක සේවා පරිසරයක් පවත්වා ගෙන යනු ලැබේ. බැංකුව සිය සේවකයින්ට ණය, සාමාජික ගාස්තු ආපසු ගෙවීම් සහ ගෞරව දීමනා වැනි මූල්‍ය සහ මූල්‍ය නොවන දිරිගැන්වීම්වලට අමතරව, පුහුණුව සහ අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් ලබා දෙයි.

මෙයට කාර්යසාධන පිළිගැනීම ද ඇතුළත් වන අතර, එය සේවක නියුක්තිය සහ වෘත්තීය දියුණුව දිරිමත් කරමින් සුවිශේෂී කාර්යසාධනයන් ඇගයීමට ලක් කරන ඉලක්කගත වැඩසටහන් වේ. අපගේ මෙම ප්‍රයත්නයන් 6.81%ක් වැනි ඉතා අඩු සේවක හැරයාමේ අනුපාතයකින් පිළිබිඹු වේ.



	2021	2022	2023	2024	2025
හැරයාමේ අනුපාතය	2.57%	4.98%	6.81%	1.41%	8.2%

6.2 තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය

අපගේ අභ්‍යන්තර කාර්ය ප්‍රවාහයන්, කාර්යයන් සහ සේවාවන් ඩිජිටල් සහ තොරතුරු තාක්ෂණ විසඳුම් වෙත මාරුවීමත් සමඟ, සයිබර් තර්ජනවලට නිරාවරණය වීමේ වැඩි ඉඩකඩක් සහ මෙහෙයුම් අඛණ්ඩතාවයට තර්ජනයක් වන උපකරණ අක්‍රිය වීම වැනි තාක්ෂණික බාධා අපට මුහුණ දීමට සිදු වේ. දත්ත නැතිවීම, වංචා, අනන්‍යතා සොරකම් සහ තොරතුරු වෙත අනවසරයෙන් ප්‍රවේශ වීම බැංකුවේ කීර්තිනාමයට ද දැඩි හානි සිදු කළ හැකිය. තවද, මතුවෙමින් පවතින තාක්ෂණයන්ට අනුවර්තනය වීමට සහ කාලෝචිත ලෙස වීවා ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම වර්ධනයට බාධාවක් විය හැකි අතර මෙහෙයුම් පරිමාණය කිරීම අඩපණ කළ හැකිය.

අවදානම් අවම කිරීම සහ පාලනය

තොරතුරු තාක්ෂණ අවදානම්වලට නිරාවරණය වීම අවම කිරීමට සහ අවදානම්වලින් ඔබ්බට පවතින දුර්වලතා වැළැක්වීමට අපි පහත පියවර අනුගමනය කරන්නෙමු:

- නියාමන අනුකූලතාව: ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශවල මූලික ආරක්ෂක ප්‍රමිතීන් අප අඛණ්ඩව ඒකාබද්ධ කරමු.
- විගණනය සහ සමාලෝචනය: පද්ධති අඛණ්ඩතාව සහතික කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය විසින් නිතිපතා යටිතල පහසුකම් විගණනයන් සහ මාසික අභ්‍යන්තර සමාලෝචන සිදු කරනු ලැබේ.
- ජාල ආරක්ෂාව : අපි ආරක්ෂිත දුරස්ථ සම්බන්ධතා , නිතර ෆයර්වෝල් යාවත්කාලීන කිරීම් සහ නවතම ආරක්ෂක මෘදුකාංග ස්ථාපනය කරමු.
- ප්‍රතික්‍රියාශීලී අධීක්ෂණය: තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව විසින් ආරක්ෂක මාර්ගෝපදේශවලට අනුකූලව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය නිරීක්ෂණය කරයි.

2025 මූල්‍ය වර්ෂය තුළ කිසිදු ප්‍රධාන අවදානම් සිදුවීමක් වාර්තා නොවූ අතර, අවශ්‍ය සියලුම වාර්තා ශ්‍රී ලංකා මූල්‍ය අංශයේ පරිගණක ආරක්ෂණ සිදුවීම් ප්‍රතිචාර කණ්ඩායම වෙත ඉදිරිපත් කරන ලදී.

අවධානය යොමු කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර	ප්‍රධාන පියවර
පද්ධති දුර්වලතා ආමන්ත්‍රණය කිරීම	අනවසර ප්‍රවේශයන් වැළැක්වීම සඳහා ප්‍රවේශ පාලනයන්, පරිශීලක වරප්‍රසාද කළමනාකරණය සහ පද්ධති ලොග් කිරීම වැඩිදියුණු කිරීම.
	අබණ්ඩ පද්ධති අධීක්ෂණය සහ සිදුවීම් ප්‍රතිචාර ක්‍රියා පටිපාටි මගින් පද්ධති ගැටලු කාලෝචිත ලෙස හඳුනා ගැනීම සහ විසඳීම.
	පද්ධති ආරක්ෂක භාවිතයන් CBSL ICT අවදානම් කළමනාකරණය සහ සයිබර් ආරක්ෂණ මාර්ගෝපදේශ සමඟ පෙළගැස්වීම.
	නිතිපතා දත්ත උපස්ථ කිරීම , ආපදා ප්‍රකෘතිමත් කිරීමේ පරීක්ෂණ සහ ව්‍යාපාර අඛණ්ඩ පැවැත්මේ සැලසුම්කරණය හරහා පද්ධති ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම.
සයිබර් ආරක්ෂාව	අනවසර ප්‍රවේශයන් වැළැක්වීම සඳහා ශක්තිමත් මුරපද ප්‍රතිපත්ති, බහු-සාධක සත්‍යාපනය සහ භූමිකාව පදනම් කරගත් ප්‍රවේශ පාලනයන් ක්‍රියාත්මක කිරීම.
	සයිබර් සිදුවීම් අතරතුර පද්ධතියේ ලබා ගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා ශක්තිමත් උපස්ථ ක්‍රියා පටිපාටි සහ ආපදා ප්‍රකෘතිමත් කිරීමේ සැලසුම්.
	ෆිෂින්, සමාජ ඉංජිනේරු විද්‍යාව සහ මානව-ආශ්‍රිත අවදානම් අවම කිරීම සඳහා නිතිපතා සයිබර් ආරක්ෂණ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
	අවම වශයෙන් වසරකට වරක් විගණනයන් සහ විනිවිද යාමේ පරීක්ෂණ සිදු කිරීම.
	JustPay පද්ධතිය සඳහා CBSL විසින් අනිවාර්ය කරන ලද ආරක්ෂක වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම.
සංවේදී මූල්‍ය දත්තවල ආරක්ෂාව	ශක්තිමත් ප්‍රවේශ පාලනයන්, දත්ත සංකේතනය සහ රාජකාරි වෙන් කිරීම හරහා ආරක්ෂාව.
	දත්ත වර්ගීකරණ භාවිතයන්, අඛණ්ඩ අධීක්ෂණය, නිතිපතා ආරක්ෂක ඇගයීම් සහ කාර්ය මණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහන්.
	CBSL නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම.
දත්ත ආරක්ෂාව	අදාළ දත්ත ආරක්ෂණ රෙගුලාසි සහ නියාමන මාර්ගෝපදේශවලට අනුකූල වීම සහතික කිරීම සඳහා බැංකුව විස්තීර්ණ දත්ත ආරක්ෂණ සහ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති ස්ථාපිත කර ඇත. මේවාට දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තිය, තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය, සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය, දත්ත පෞද්ගලිකත්ව ප්‍රතිපත්තිය, දත්ත වර්ගීකරණ ප්‍රතිපත්තිය සහ ප්‍රවේශ පාලන ප්‍රතිපත්තිය ඇතුළත් වේ.
	කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූලව බැංකුවේ ආරක්ෂක තත්ත්වය පෙළගැස්වීම සඳහා ප්‍රතිපත්ති සංශෝධනය කර ඇත
	GDPR ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි ප්‍රතිපත්ති යාවත්කාලීන කර ඇත.
කාර්ය මණ්ඩල පුහුණුව:	සයිබර් ආරක්ෂණ හොඳම භාවිතයන් පිළිබඳ ව්‍යුහගත පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්. මෙම වැඩසටහන් මගින් තොරතුරු ආරක්ෂණය, දත්ත ආරක්ෂාව සහ පෞද්ගලිකත්වය, මුරපද කළමනාකරණය, ෆිෂින් සහ සමාජ ඉංජිනේරු අවදානම්, විද්‍යුත් තැපෑල සහ අන්තර්ජාලය ආරක්ෂිතව භාවිත කිරීම සහ සිදුවීම් වාර්තා කිරීමේ ක්‍රියා පටිපාටි වැනි ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය කරන ලදී.

6.3 නීතිමය සහ අනුකූලතා අවදානම

මූල්‍ය අලාභ සහ නියාමන අනුකූල නොවීම් අවම කිරීමට බැංකුව අඛණ්ඩව කටයුතු කරයි. වසර තුළදී, අධිකරණ ක්‍රියාමාර්ග හරහා රුපියල් බිලියන 6.2ක මුළු මුදලක් අයකර ගැනීමේ නීතිමය අවදානමකට බැංකුව මුහුණ දුන් අතර, මෙය පෙර සේවක අර්ථසාධක අරමුදල අක්‍රීය ණය හි මුළු පොරොත්තු හිඟ මුදලෙන් 62% කි.

වසර තුළ අපි සියලුම නියාමන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කළෙමු.

නීතිමය සහ අනුකූලතා අවධානය:

- වත්කම් අයකර ගැනීම: පොරොත්තු ණය බැඳීම් අයකර ගැනීම සඳහා 2024 අධිකරණ ක්‍රියාමාර්ග සක්‍රීයව කළමනාකරණය කිරීම.
- නියාමන පෙළගැස්ම: දේශීය නීති සහ 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතට අනුකූල වීම සහතික කිරීම සඳහා අධීක්ෂණ පද්ධති අඛණ්ඩව යාවත්කාලීන කිරීම.
- විගණනය සහ අධීක්ෂණය: නියාමන උපදේශනවලට සහභාගී වීම සහ ව්‍යවස්ථාපිත වෙනස්කම්වලට වඩා ඉදිරියෙන් සිටීම සඳහා නිතිපතා අභ්‍යන්තර/බාහිර විගණන සිදු කිරීම.

7. කීර්තිනාම අවදානම

මහජන විශ්වාසය ආරක්ෂා කිරීමට සහ වැඩිදියුණු කිරීමට අපි පහත ප්‍රවේශයන් අනුගමනය කරමු:

- සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුගත වීම: සියලුම මෙහෙයුම් ශක්තිමත් සදාචාරාත්මක මූලධර්ම සහ නියාමන රාමු වලට අනුකූලව මෙහෙයවනු ලැබේ.
- නිවැරදි තොරතුරු කාලෝචිත ලෙස හෙළිදරව් කිරීම: කාලෝචිත සන්නිවේදනය මගින් පාර්ශවකරුවන්ට සහ නියාමන අධිකාරීන්ට විශ්වාසදායක සහ යාවත්කාලීන තොරතුරු ලැබෙන බව සහතික කෙරේ.
- (CSR) ක්‍රියාකාරකම්
- තිරසාර මූල්‍යකරණ ක්‍රියාකාරකම් : පාරිසරික භාරකාරත්වය සහ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කරන ව්‍යාපෘති සඳහා සහාය වීම.

බැංකුව තම කීර්ති නාමයට විල්ල විය හැකි අවදානම් කල්තියා හඳුනාගෙන නිසි පාලනයන් ක්‍රියාත්මක කර ඇත.

තර්ජනය	වැළැක්වීමේ / පාලන ක්‍රියාමාර්ග
වංචනික සිදුවීම්	විමසිලිමත් බව ශක්තිමත් කිරීම සඳහා නිතිපතා අධීක්ෂණය, අභ්‍යන්තර විගණන සහ කාර්ය මණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහන්.
පාරිභෝගික පැමිණිලි	කාලෝචිත විසඳුම් සහ පාරිභෝගික විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණ.
සයිබර් අවදානම්	වැඩිදියුණු කළ සයිබර් ආරක්ෂණ පියවර, අඛණ්ඩ අධීක්ෂණය සහ උසස් තාක්ෂණයන් සඳහා ආයෝජනය.
සේවා බාධා	බාධාවකින් තොරව සේවා සැපයීම පවත්වා ගැනීම සඳහා විස්තීර්ණ ව්‍යාපාර අඛණ්ඩ පැවැත්මේ සැලසුම්.

2026 මූල්‍ය වර්ෂය සඳහා උපායමාර්ගික අවදානම් දැක්ම

මීළඟ මූල්‍ය වර්ෂයේ ප්‍රධාන ඉලක්කය වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෙන්වා දී ඇති දීර්ඝකාලීන ගැටලු අඛණ්ඩව විසඳීමයි - එනම් 2025 වසරේ ප්‍රමුඛ වූ ප්‍රාග්ධන සහ නියාමන අවදානම් නිවැරදි කිරීමයි.

ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා නිරාවරණයන්ට බලපෑ හැකි වෙළඳපල අවදානම් කල්තියා අධීක්ෂණය කරමින් සහ ඒවා කළමනාකරණය කරමින්, ප්‍රාග්ධන අවදානම් සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කෙරෙහි අපගේ අවධානය දැඩි ලෙස යොමු වනු ඇත. මීට අමතරව, බැංකුවේ කෙටි කාලීන වත්කම්-බැරකම් අභියෝග විසඳා ගැනීම සඳහා කෙටි කාලීන ආදායම් උත්පාදනය කරන ණය නිෂ්පාදන ඇතුළු අරමුදල් මූලාශ්‍ර ප්‍රමාණවත් ලෙස විවිධාංගීකරණය කිරීම ද ක්‍රියාශීලීව සිදු කරනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව HDFC බැංකුවේ (ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව) අධ්‍යක්ෂ මණ්ඩලය, සැලකිය යුතු අභියෝගවලට මුහුණ දෙමින්, 2025 මූල්‍ය වර්ෂය සඳහා වන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ විගණක වාර්තාව සමඟින් 2025 වාර්ෂික වාර්තාව කොටස් හිමියන් වෙත ඉදිරිපත් කරයි.

01. සාමාන්‍ය තොරතුරු

- HDFC යනු 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ලැයිස්තුගත කර ඇති පොදු සමාගමකි. මෙම බැංකුව 2019 දෙසැම්බර් 10 දක්වා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ පැවති අතර, ඉන් පසුව මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.
- මෙම වාර්ෂික වාර්තාව 2025 මූල්‍ය වර්ෂය (2025 ජනවාරි 01 සිට 2025 දෙසැම්බර් 31 දක්වා) ආවරණය කරන අතර, එය ව්‍යවස්ථාපිත, නියාමන අවශ්‍යතා සහ පවතින හොඳම ගිණුම්කරණ භාවිතයන්ට අනුකූලව සකස් කර ඇත.
- තවද, මෙම වාර්ෂික වාර්තාව 1997 අංක 07 දරන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත (සංශෝධන), 2007 අංක 07 දරන සමාගම් පනත, 1988 අංක 30 දරන බැංකු පනත සහ කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීමේ නීති රීතිවලට අනුකූල වේ.
- කොටස් හිමියන්ගේ සහ බැංකුවේ යහපත උදෙසා වැදගත් වන සියලුම තොරතුරු හෙළිදරව් කර ඇති අතර, අදාළ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර අනුමත කර ඇත.

02. ප්‍රධාන කාර්යයන්

- බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරය වන්නේ නිවාස අවශ්‍යතා සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ආධාර සැපයීම වන අතර, බැංකුවේ අරමුණෙහි කිසිදු වෙනසක් සිදු කර නොමැත. මීට අමතරව, බැංකු පනතේ උපලේඛනයේ දක්වා ඇති පරිදි බැංකුව ව්‍යාපාරික කටයුතුවල නිරත වේ. සමාලෝචනයට ලක් වූ කාලය තුළ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනස්කම් කිසිවක් සිදුවී නොමැත.

03. ව්‍යාපාර සමාලෝචනය

- බැංකුවේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශයන් වාර්ෂික වාර්තාවේ 5 වන පිටුවේ දැක්වේ.
- සාමාන්‍ය කළමනාකරු/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය (41 සිට 43 දක්වා පිටු) මඟින් සමාලෝචනයට ලක් වූ කාලය තුළ බැංකුවේ සමස්ත මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය, තත්ත්වය සහ වැදගත් සිදුවීම් සාකච්ඡා කෙරේ.
- 2025 මූල්‍ය වර්ෂය තුළ මෙහෙයුම් සමාලෝචනය සහ මෙහෙයුම් ප්‍රතිඵල 220 සිට 221 දක්වා පිටු වල ඇති ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත. මෙම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අනිවාර්ය අංගයක් වේ.

04. අනාගත සංවර්ධන කටයුතු

- බැංකුවේ අනාගත සංවර්ධන කටයුතු ඉහත සඳහන් HDFC පනත සහ එහි සංශෝධනවලටත්, බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු දියුණු කිරීම සඳහා රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලටත් අනුකූලව සිදුවනු ඇත. වැඩිදුර තොරතුරු සභාපතිවරයාගේ පණිවිඩය සහ සාමාන්‍ය කළමනාකරු/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය තුළ අන්තර්ගත වේ.

05. මූල්‍ය ප්‍රකාශන

- මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සහ 2007 අංක 07 දරන සමාගම් පනත සහ 1988 අංක 30 දරන බැංකු පනතට අනුකූලව සකස් කර ඇත. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අනිවාර්ය අංගයක් වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවේ 220 සිට 290 දක්වා පිටු වල දක්වා ඇත.

06. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

- වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වාර්ෂික වාර්තාවේ 220 සිට 290 දක්වා පිටු වල දක්වා ඇත. කොටස්වල වෙනස්වීම්වල බලපෑම වාර්ෂික වාර්තාවේ 223 සිට 224 දක්වා පිටු වල දක්වා ඇත.

07. විගණක වාර්තාව

- HDFC බැංකුවේ බාහිර විගණකවරයා වන ශ්‍රී ලංකා විගණකාධිපතිවරයා විසින් සමාලෝචනයට ලක් වූ කාලය සඳහා HDFC බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය සිදු කරන ලද අතර, අදාළ විගණක වාර්තාව වාර්ෂික වාර්තාවේ 213 සිට 219 දක්වා පිටු වල අන්තර්ගත වේ.

08. අඛණ්ඩ පැවැත්ම

- අවශ්‍ය විමසීම් කිරීමෙන් පසු, අනාගතයේදීත් බැංකුවේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් බැංකුව සතු බව අධ්‍යක්ෂවරුන් සාධාරණ අපේක්ෂාවක් දරයි. එබැවින්, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්මේ පදනම භාවිතා කර ඇත.

09. ආදායම

- 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ ආදායම රුපියල් මිලියන 7,730 ක් විය. ආදායම පිළිබඳ විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශනවල 4 සිට 9 දක්වා සටහන් වල දැක්වේ.

10. ලාභය සහ ප්‍රතිපාදනය

- 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය සේවා මත වැට් සහ SSCL බදු සහ ආදායම් බදු වලට පෙර බැංකුවේ ලාභය රුපියල් මිලියන 329 ක් වූ අතර, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය රුපියල් මිලියන 93 ක් විය.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය	2024 රු. මිලියන	2025 රු. මිලියන
මූල්‍ය සේවා මත වැට්, DRL සහ NBT	298	319
බදු සඳහා ප්‍රතිපාදන	254	103
බදු ගෙවීමෙන් පසු සාමාන්‍ය ක්‍රියාකාරකම්වල ලාභය	(191)	(93)
පෙර ගෙන ආ රඳවා ගත් ලාභය / (සමුච්චිත අලාභ)	6,056	5,866
ප්‍රතිපාදන සඳහා පවතින ලාභය	(191)	(93)
යෝජිත පළමු සහ අවසාන ලාභාංශ	-	-
රක්ෂිත අරමුදල් වෙත මාරු කිරීම්	-	-
ඉදිරියට ගෙන යන ලද රඳවා ගත් ලාභය	5,866	5,773

11. සංචිත

- 2025 දෙසැම්බර් 31 වන විට මුළු සංචිත ප්‍රමාණය රුපියල් මිලියන 6,591 කි. ඒ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල 46 සිට 48 දක්වා සටහන්වල සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇත.

12. ව්‍යවස්ථාපිත ගෙවීම්

- රජයට සහ සේවකයින්ට අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් මේ දක්වා සිදු කර ඇති බව අධ්‍යක්ෂවරුන් තම දැනුමේ සහ විශ්වාසයේ හැටියට තහවුරු කරයි.

13. බදු සඳහා ප්‍රතිපාදන

- 2025 වර්ෂය සඳහා ආදායම් බදු, බැංකුවේ මෙහෙයුම්වලින් ලැබෙන බදු අය කළ හැකි ආදායමෙන් 30%ක අනුපාතයකට ගණනය කර ඇති අතර, එය මෙම වාර්ෂික වාර්තාවේ 240 සිට 241 දක්වා පිටුවල ඇති මූල්‍ය ප්‍රකාශනවල 13 වන සටහනේ හෙළිදරව් කර ඇත.

14. ලාභාංශ

- බැංකුවේ ප්‍රාග්ධන ශක්තිය සහ තත්ත්වය සලකා බලා, 2025 මූල්‍ය වර්ෂය සඳහා ලාභාංශ යෝජනා නොකරන ලදී.

15. දේපල, පිරියත් සහ උපකරණ

- දේපල, පිරියත සහ උපකරණ සඳහා වූ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 193 ක් වන අතර, ඒ පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ 251 සිට 254 දක්වා පිටුවල ඇති මූල්‍ය ප්‍රකාශනවල 26 සහ 27 යන සටහන්වල දක්වා ඇත.

16. නිදහස් දේපලවල වෙළඳපල වටිනාකම

- නිදහස් දේපලවල වෙළඳපල වටිනාකම පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ 252 පිටුවේ ඇති මූල්‍ය ප්‍රකාශනවල 26B සටහනේ දක්වා ඇත.

17. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනයට පසුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන පරිදි කිසිදු සැලකිය යුතු සිදුවීමක් සිදුවී නොමැත.

18. ප්‍රකාශිත ප්‍රාග්ධනය

- 2025 දෙසැම්බර් 31 වන විට බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් 64,710,520 කින් සමන්විතව රුපියල් මිලියන 962 ක් විය.

19. කොටස් සහ බැඳුම්කර පිළිබඳ තොරතුරු

- කොටස් සහ බැඳුම්කර හිමිකාරිත්වය සම්බන්ධ තොරතුරු මෙම වාර්තාවේ 292 සිට 294 දක්වා පිටුවල දක්වා ඇත.

20. සියලුම පාර්ශ්වකරුවන් සඳහා සාධාරණ සැලකීම

- සියලුම කොටස් හිමියන්ට ඔවුන් වෙත නිකුත් කරන ලද මුල් නියමයන්ට අනුකූලව සාධාරණ ලෙස සලකා ඇත.

21. අධ්‍යක්ෂ මණ්ඩලය

- අධ්‍යක්ෂවරුන්ගේ සම්පූර්ණ ලැයිස්තුව සහ ඔවුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද සඳහා වාර්ෂික වාර්තාවේ 44 සිට 51 දක්වා පිටුවල ඇති "අධ්‍යක්ෂ මණ්ඩලය" යන පරිච්ඡේදය බලන්න.

සමාලෝචන කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ පත්වීම්, ඉල්ලා අස්වීම් සහ විශ්‍රාම ගැනීම්

අංකය	නම	පත්වීම් (2025/12/31 දක්වා සමාලෝචන කාලය තුළ)	ඉල්ලා අස්වීම් (2025/12/31 දක්වා සමාලෝචන කාලය තුළ)	විශ්‍රාම ගැනීම් (2025/12/31 දක්වා සමාලෝචන කාලය තුළ)
01.	පී. ඒ. ලයනල් මහතා (අධ්‍යක්ෂ)	-	-	31/01/2025
02.	එච්. කේ. කේ. ඒ. ජයසුන්දර මහතා (අධ්‍යක්ෂ)	-	21/03/2025	-
03.	ඩබ්ලිව්. එන්. අයි. සී. ප්‍රනාන්දු මහතා (අධ්‍යක්ෂ)	-	23/06/2025	-
04.	ඩබ්ලිව්. එම්. ආනන්ද මහතා (අධ්‍යක්ෂ)	-	-	10/08/2025
05.	පී. ජේ. ජයසිංහ මහතා (සභාපති)	-	-	30/11/2025
06.	ඒ. එන්. හපුගාල මහතා (අධ්‍යක්ෂ)	31/01/2025	-	-
07.	ජේ. එම්. පී. එස්. කෞශල්‍යා මහතා (අධ්‍යක්ෂ)	23/06/2025	-	-
08.	ආචාර්ය පී. ඒ. ක්‍රිශාන්ත (අධ්‍යක්ෂ) (නැවත පත් කිරීම)	23/06/2025	-	-
09.	කේ. කේ. ගයානි ප්‍රේමතිලක මහත්මිය (අධ්‍යක්ෂ)	18/07/2025	-	-
10.	එස්. එස්. ශිරෝමා නන්දනි මහත්මිය (අධ්‍යක්ෂ)	03/11/2025		
11.	ජේ. කේ. ඒ. සිරිනාථ මහතා (අධ්‍යක්ෂ)	21/11/2025		

22. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු

- ශ්‍රී ලංකා මහ බැංකුව සහ කොළඹ කොටස් වෙළඳපොළේ ආයතනික පාලන විධානයන් යටතේ නියම කර ඇති පරිදි, අදාළ අනුකමිටු පිහිටුවා ඇති අතර, එම අනුකමිටුවල සාමාජිකත්වය, රාජකාරි, වගකීම් සහ කාර්යසාධනය පිළිබඳ තොරතුරු වාර්ෂික වාර්තාවේ 194 සිට 204 දක්වා පිටුවල දැක්වේ.

23. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

- අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම්වලට සහභාගී වීම පිළිබඳ කොටස සඳහා වාර්ෂික වාර්තාවේ 110 සිට 113 දක්වා පිටු බලන්න.

24. මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

- HDFC බැංකුවේ කටයුතුවල සැබෑ සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් වගකිව යුතුය. මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය සඳහා 210 වන පිටුව බලන්න; එය අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාවේ අනිවාර්ය අංගයකි.

25. අධ්‍යක්ෂවරුන්ගේ ළැබැඳියාව

- බැංකුව විසින් අධ්‍යක්ෂවරුන්ගේ ළැබැඳියාව පිළිබඳ අවශ්‍ය ප්‍රකාශයන් වාර්ෂික වාර්තාවේ 44 සිට 51 දක්වා පිටුවල ලබා දී ඇත. හෙළිදරව් කරන ලද තොරතුරු හැරුණු විට, කොටස් හිමියන් වෙත හෙළිදරව් කළ යුතු කොන්ත්‍රාත්තුවක් හෝ යෝජිත කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට සෘජු හෝ වක්‍ර ළැබැඳියාව නොමැත. තමන් උනන්දුවක් දක්වන කරුණු හෝ කොන්ත්‍රාත්තු සම්බන්ධ සාකච්ඡාවලට සහභාගී වීමෙන්, අනුමත කිරීමේ ක්‍රියාවලියෙන් හෝ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අධ්‍යක්ෂවරුන් ඉවත් විය.
- තමන් ළැබැඳියාව දක්වන ගැටලු සම්බන්ධ සාකච්ඡා කිරීමෙන් හෝ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් ඉවත්ව සිටින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් තම ළැබැඳියාව (ඇත්නම්) හෙළිදරව් කළහ.

26. කොටස් හිමිකාරිත්වය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

- අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරිත්වය පහත පරිදි වේ:

	31/12/2025	01/01/2025
ආචාර්ය පී. ඒ. ක්‍රිශාන්ත (අධ්‍යක්ෂ)	1,000	1,000
කේ. බී. විජේරත්න මහතා (අධ්‍යක්ෂ)	2,000	2,000
ඒ. එන්. හපුගාල මහතා (අධ්‍යක්ෂ)	නැත	-
ජේ. එම්. පී. එස්. කෞශල්‍යා මහතා (අධ්‍යක්ෂ)	1,100	-
කේ. කේ. ගයානි ප්‍රේමතිලක මහත්මිය (අධ්‍යක්ෂ)	නැත	-
එස්. එස්. ශිරෝමා නන්දනි මහත්මිය (අධ්‍යක්ෂ)	නැත	-
ජේ. කේ. ඒ. සිරිනාථ මහතා (අධ්‍යක්ෂ)	නැත	-
මුළු එකතුව	4,100	3,000

27. බැඳුම්කර සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ළැබැඳියාව

- අධ්‍යක්ෂවරුන්ගේ තනි පුද්ගල බැඳුම්කර හිමිකාරිත්වය පහත පරිදි වේ

(2025 දෙසැම්බර් 31 වන විට):	බැඳුම්කර සංඛ්‍යාව	වටිනාකම (රු.)
ඒ. එන්. හපුගාල මහතා (අධ්‍යක්ෂ)	නැත	නැත
කේ. බී. විජේරත්න මහතා (අධ්‍යක්ෂ)	නැත	නැත
ආචාර්ය පී. ඒ. ක්‍රිශාන්ත (අධ්‍යක්ෂ)	නැත	නැත
ජේ. එම්. පී. එස්. කෞශල්‍යා මහතා (අධ්‍යක්ෂ)	නැත	නැත
කේ. කේ. ගයානි ප්‍රේමතිලක මහත්මිය (අධ්‍යක්ෂ)	නැත	නැත
එස්. එස්. ශිරෝමා නන්දනි මහත්මිය (අධ්‍යක්ෂ)	නැත	නැත
ජේ. කේ. ඒ. සිරිනාථ මහතා (අධ්‍යක්ෂ)	නැත	නැත
මුළු එකතුව	නැත	නැත

28. අදාළ පාර්ශ්වයන් සමඟ ගනුදෙනු

- අදාළ පාර්ශ්වයන් සමඟ සිදුකරන ගනුදෙනු පිළිබඳව කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීමේ නීතිවලට සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති විධානයන්ට අනුකූලව බැංකුව කටයුතු කළ බව අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු. සැලකිය යුතු අදාළ පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ 287 වන පිටුවේ දැක්වේ.

29. අධ්‍යක්ෂවරුන්ගේ වේතනය

- 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වේතනය වාර්ෂික වාර්තාවේ 239 වන පිටුවේ ඇති මූල්‍ය ප්‍රකාශනවල 12b සටහනේ දැක්වේ.

30. පාරිසරික ආරක්ෂණය

- අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම සහ විශ්වාසය අනුව, බැංකුව අදාළ පාරිසරික නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර ඇත. පරිසරයට හානිකර හෝ උපද්‍රවකාරී කිසිදු ක්‍රියාකාරකමක බැංකුව නිරත වී නොමැත.

31. අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

- සමාලෝචනයට ලක් වූ කාලය තුළ, බැංකුවේ අවදානම් දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළව අවශ්‍ය මුලපිරීම් ගත්තේය. කරුණාකර වාර්ෂික වාර්තාවේ 175 සිට 185 දක්වා පිටුවල ඇති අවදානම් තක්සේරු වාර්තාව බලන්න.
- තවද, සමාලෝචනයට ලක් වූ කාලය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය නිතිපතා සමාලෝචනය කරන ලදී. BIRMC සහ BAC යන දෙකම තම කමිටු කාර්ය සටහන් සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.
- අභ්‍යන්තර පාලනයන් පිළිබඳ වැඩිදුර විස්තර සඳහා වාර්ෂික වාර්තාවේ 203 සිට 204 දක්වා පිටුවල ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව සහ 192 සිට 193 දක්වා පිටුවල ඇති ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව බලන්න.

32. ආයතනික පාලනය

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කර ඇති ආයතනික පාලන විධානයන් මගින් අවශ්‍ය කර ඇති පරිදි, 118 සිට 156 දක්වා පිටුවල දැක්වෙන ආයතනික පාලන වාර්තාව සහ 4,400 (SLSRS) යටතේ විගණකවරුන් විසින් නිකුත් කරන ලද "සත්‍ය කරුණු පිළිබඳ වාර්තාවේ" සොයාගැනීම් බලන්න.

33. අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම

- බැංකුවේ අනුකූලතා නිලධාරියා, පාලන නීතිවලට අදාළව බැංකුවේ අනුකූලතා තත්ත්වය පිළිබඳව BIRMC සහ අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි. අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුම අනුව, බැංකුව හෙළිදරව් කිරීමට බැඳී සිටින කිසිදු අධිකරණ බල ප්‍රදේශයක නීති හෝ රෙගුලාසි සෘජුව හෝ වක්‍රව උල්ලංඝනය වී නොමැති අතර, බැංකුවට සැලකිය යුතු මූල්‍ය බලපෑමක් ඇති කළ හැකි ආකාරයේ සේවක කළමනාකරණය සම්බන්ධ අක්‍රමිකතා ද සිදුවී නොමැත.

- 1997 අංක 7 දරන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත (සහ එහි සියලුම සංශෝධන), 1988 අංක 30 දරන බැංකු පනත, බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයන් සහ තීරණයන්, 2007 අංක 7 දරන සමාගම් පනත, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදී මූල්‍යකරණය මර්දනය කිරීමේ සම්මුති පනත, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත, 2002 අංක 14 දරන වීකතු කළ අගය මත බදු (වැට්) පනත, 2005 අංක 5 දරන මූල්‍ය පනත, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ නීති, 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත, 2000 අංක 56 දරන මූල්‍ය ලීසිං පනත, 1983 අංක 12 දරන සේවා නියුක්තයන්ගේ පාරිතෝෂික දීමනා පනත, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත, 1980 අංක 46 දරන සේවක භාර අරමුදල් පනත යනාදී පනත් සහ ඒවායේ සංශෝධනවලට බැංකුව අනුකූලව කටයුතු කර ඇත.

34. විගණකවරුන් පත් කිරීම

- 1997 අංක 07 දරන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතේ සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා ලෙස අඛණ්ඩව කටයුතු කරයි.

35. විගණකවරුන්ගේ වේතනය සහ බැංකුව සමඟ ඇති කොන්ත්‍රාත්තු සම්බන්ධ ළැබැඳියාව

- 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණන ගාස්තු වශයෙන් බැංකුව විසින් විගණකවරුන් වෙත රුපියල් මිලියන 3.5 ක් ගෙවන ලදී. විගණකවරුන්ට බැංකුව සමඟ වෙනත් කිසිදු සම්බන්ධයක් හෝ කොන්ත්‍රාත්තු සම්බන්ධ ළැබැඳියාව නොමැත.

- ඉහත හෙළිදරව් කර ඇති දේ හැරුණු විට, බැංකුව සමඟ විගණකවරුන්ට කිසිදු සම්බන්ධයක් හෝ ළැබැඳියාවක් නොමැති බව අධ්‍යක්ෂවරුන්ගේ දැනුමේ හැටියට තහවුරු කරයි.

36. විගණන කමිටුව

- විගණන කමිටුවේ සංයුතිය සහ ඔවුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 203 සිට 204 දක්වා පිටුවල දැක්වේ.

37. රැස්වීම් දැන්වීම

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ :HDFC බැංකුව") හතළිස් එක්වන (41 වන) වාර්ෂික මහා සභා රැස්වීම 2026 ජූනි මස විසිහය (26) වන සිකුරාදා පෙ.ව. 10.00 ට, ශ්‍රී ලංකා පදනම (නව ශාලාව), අංක 100, ශ්‍රී ලංකා පදනම් මාවත, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 යන ස්ථානයේදී පැවැත්වේ.

රැස්වීම පිළිබඳ දැන්වීම වාර්ෂික වාර්තාවේ 298 වන පිටුවේ දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුකූලව අත්සන් කරන ලදී.



H. M. S. B. Karunarathna
වැඩබලන සමාගම් ලේකම්

2026 මැයි 26

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය-2025

වගකීම

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, 2024 අංක 05 දරන බැංකු පනතේ විධානයෙහි 9.2 (ඉ) වගන්තියට අනුකූලව, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ මෙම අභ්‍යන්තර පාලන ප්‍රකාශය ඉදිරිපත් කරයි.

බැංකුවේ පවතින අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය සම්බන්ධයෙන් වගකීම දරන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයයි. මෙම අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය සලකා බැලීමේදී, බැංකු ව්‍යාපාරයකදී අවදානම කළමනාකරණය කරමින් ලාභය සමතුලිත කර ගැනීම අත්‍යවශ්‍ය බවත්, එමනිසා අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් සැලසුම් කර ඇත්තේ බැංකුවේ අවදානම් රුචියට අයත් සීමාවන් සහ දර්ශකවලින් සිදුවන ඕනෑම අපගමනයක් හඳුනා ගැනීම සඳහා බවත් අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී.

ඒ අනුව අභ්‍යන්තර පාලන පද්ධතියට මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ සහතික විය හැක්කේ සාධාරණ සහතිකයක් පමණි; නිරපේක්ෂ සහතිකයක් නොවේ. බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව සිදු කර ඇත.

බැංකුව මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩ ක්‍රියාවලියක් ස්ථාපිත කර ඇත. මෙම ක්‍රියාවලියට ව්‍යාපාරික පරිසරයේ හෝ නියාමන මාර්ගෝපදේශවල සිදුවන වෙනස්කම්වලට අනුකූලව මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීම ද ඇතුළත් වේ. මෙම ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලබන අතර, විය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති 'අභ්‍යන්තර පාලනය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශයට' අනුකූල වේ. එම මාර්ගෝපදේශයේ දක්වා ඇති අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීම සඳහා වූ මූලධර්ම සැලකිල්ලට ගනිමින්, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇත.

මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දීමට සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව සිදු කිරීමට අවශ්‍ය වන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් සහ ප්‍රමාණවත් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි.

බැංකුව මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම සහ ඇගයීම මගින්, සහ මෙම අවදානම් අවම කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලන පද්ධති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම මගින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ අවදානම් හා අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමට කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

ප්‍රධාන අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන්

මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්භාවය සහ අඛණ්ඩතාව සමාලෝචනය කිරීම සඳහා ස්ථාපිත කර ඇති ප්‍රධාන ක්‍රියාවලීන්ට පහත දැ ඇතුළත් වේ:

- බැංකුවේ දෛනික මෙහෙයුම්වල සඵලතාවය සහතික කිරීමටත්, බැංකුවේ මෙහෙයුම් ආයතනික අරමුණු, උපාය මාර්ග සහ වාර්ෂික අයවැයට මෙන්ම අනුමත කර ඇති ප්‍රතිපත්ති සහ ව්‍යාපාරික උපදෙස්වලට අනුකූල බව තහවුරු කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවා ඇත.
    - » අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
    - » අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව
    - » අධ්‍යක්ෂ මණ්ඩල නම් කිරීමේ සහ පාලන කමිටුව
    - » අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව
    - » අධ්‍යක්ෂ මණ්ඩල අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව
- බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව ඔවුන්ගේ විගණන කටයුතු සිදුකරන අතරතුර, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය අඛණ්ඩව සත්‍යාපනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අනුමත කරන ලද අවදානම් පදනම් කරගත් වාර්ෂික විගණන සැලැස්මට අනුව, තොරතුරු පද්ධති විගණන සහ මූල්‍ය විගණන ඇතුළුව බැංකුවේ සියලුම ශාඛා සහ දෙපාර්තමේන්තු ආවරණය වන පරිදි විගණන සිදු කරනු ලැබේ. අභ්‍යන්තර විගණන පැවරුම්වල සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. එම කමිටුව විසින් අනුමත විගණන සැලැස්මේ විෂය පථය සහ ආවරණයේ ප්‍රමාණවත්භාවය ද සමාලෝචනය කර, ඒ සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් යෝජනා කරයි. තවද, බැංකුවේ සියලුම කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින්, සතුටුදායක නොවන ඕනෑම විගණනයක් පිළිබඳව විස්තරාත්මකව සාකච්ඡා කිරීම, එම ක්ෂේත්‍රවලට විසඳුම් සෙවීමේ ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.
- බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් බාහිර විගණකවරුන්, නියාමන ආයතන, අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සහ කළමනාකාරිත්වය විසින් හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලන ගැටලු ද සමාලෝචනය කරන අතර, අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය ඇගයීමට ලක් කරයි. එසේම, අවදානම් තක්සේරුව සහ අභ්‍යන්තර විගණනවල ගුණාත්මකභාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අභ්‍යන්තර විගණන කාර්යයන් ද කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්වල කාර්ය සටහන් වරින් වර බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ඉදිරිපත් කරනු ලැබේ. බැංකුවේ විගණන කමිටුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වැඩිදුර තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 203 සිට 204 දක්වා පිටුවල 'අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ' දක්වා ඇත.
- මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය තක්සේරු කිරීමේදී, සැලකිය යුතු ගිණුම්කරණ සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවන්ට සම්බන්ධ සියලුම ක්‍රියා පටිපාටි සහ පාලනයන්ට අනුකූල බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මේවා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සහ අවදානම් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සැලසුම්වල පැවැත්ම සහ සඵලතාවය පිළිබඳ අධීක්ෂණයට යටත් වේ. වසර තුළ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකවරුන් විසින් ලබා දෙන අදහස්/නිර්දේශ, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීමට සැලකිල්ලට ගනු ලැබේ.
- LKAS සහ SLFRS ඇතුළත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීමේදී, පිළිගැනීම, මැනීම, වර්ගීකරණය සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා ක්‍රියාවලීන්හි ප්‍රගතිශීලී වැඩිදියුණු කිරීම් සිදු කරනු ලබන අතර, ණය සහ අත්තිකාරම්වල අගය අඩුවීම සහ අවදානම් කළමනාකරණය සම්බන්ධ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම්වලට අදාළ ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීම සිදු කෙරේ.
- 2018 වසරේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය-SLFRS 9 (මූල්‍ය උපකරණ) හි අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය පියවර ගත්තේය. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඵලදායී කළමනාකරණය, වලංගුකරණය සහ අනුකූලතාව සඳහා අවශ්‍ය කළමනාකරණ තොරතුරු පද්ධති සහ වාර්තා වටා ඇති ක්‍රියාවලීන් සහ පාලනයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩව ශක්තිමත් කරනු ඇත.


මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීමට තරම් ශක්තිමත් සහ ප්‍රමාණවත් බවත්, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූල බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි.

තහවුරු කිරීම


ඉහත ක්‍රියාවලීන් මත පදනම්ව, බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා සැලසුම් කර ඇති බවත්, එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සිදු කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.



ප්‍රධාන අභ්‍යන්තර විගණක



ප්‍රධාන මූල්‍ය නිලධාරී



සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩල නියෝගය පරිදි,



කේ. බී. විජේරත්න
සභාපති,
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව



ජේ. එම්. පී. එස්. කෞශල්‍යා
අධ්‍යක්ෂ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/C/HDFC/2025/IC/01 මගේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 29 April 2026

සභාපතිතුමා වෙත,

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය මත විගණකාධිපතිවරයාගේ ස්වාධීන සහතික කිරීමේ වාර්තාව.

හැඳින්වීම

මෙම වාර්තාවේ අරමුණ වන්නේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ("බැංකුව") මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය ("ප්‍රකාශය") පිළිබඳ සහතිකයක් ලබා දීමයි.

කළමනාකාරිත්වයේ වගකීම

බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 5 දරන බැංකු පනතේ 9.2(ආ) වගන්තියට අනුකූලව මෙම ප්‍රකාශය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකිව යුතුය.

මගේ වගකීම සහ SLSAE 3050 (සංශෝධිත) සමඟ අනුකූලතාවය

මෙම ප්‍රකාශය සකස් කරන ලද ලේඛන මගින් තහවුරු කරන්නේද සහ බැංකුවේ අභ්‍යන්තර පාලනයන්හි සැලසුම සහ කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් අනුගමනය කළ ක්‍රියාවලිය වියින් නිසි ලෙස පිළිබිඹු වන්නේද යන්න තක්සේරු කිරීම මගේ වගකීම වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති, සහතික කිරීමේ පැවරුම් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිතිය (SLSAE) 3050 (සංශෝධිත), "අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලන ප්‍රකාශය මත බැංකු සඳහා සහතික කිරීමේ වාර්තාව" ට අනුකූලව මම මගේ පැවරුම සිදු කළෙමි.

මෙම ප්‍රමිතියට අනුව, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධ මෙම ප්‍රකාශය කළමනාකාරිත්වය විසින් සියලුම ද්‍රව්‍යමය කරුණු සම්බන්ධයෙන් සකස් කර ඇත්ද යන්න පිළිබඳ සීමිත සහතිකයක් ලබා ගැනීම සඳහා ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මා විසින් සිදු කළ යුතුය.

මෙම පැවරුමේ අරමුණ සඳහා, කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීමට හෝ නැවත නිකුත් කිරීමට මම වගකිව යුතු නොවන අතර, මෙම පැවරුම අතරතුර මම මූල්‍ය තොරතුරු පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් සිදු නොකළෙමි.

අංක 306/72, පොළduව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සිදු කරන ලද කාර්යයන් පිළිබඳ සාරාංශය

මෙම ප්‍රකාශය අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් සකස් කරන ලද ලේඛන මඟින් තහවුරු කරන්නේද යන්න සහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් අනුගමනය කළ ක්‍රියාවලිය එයින් නිසි ලෙස පිළිබිඹු වන්නේද යන්න තක්සේරු කිරීම සඳහා මම මගේ පැවරුම සිදු කළෙමි.

සිදු කරන ලද ක්‍රියා පටිපාටි මූලික වශයෙන් බැංකු නිලධාරීන්ගෙන් විමසීම් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලියට සහාය වන ලේඛන නියැදි පදනමින් පරීක්ෂා කිරීම දක්වා සීමා විය.

මෙම ප්‍රකාශය සියලුම අවදානම් සහ පාලනයන් ආවරණය කරන්නේද යන්න සලකා බැලීමට හෝ බැංකුවේ අවදානම් සහ පාලන ක්‍රියා පටිපාටිවල කාර්යක්ෂමතාව පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට SLSAE 3050 (සංශෝධිත) මඟින් මාගෙන් බලාපොරොත්තු නොවේ. වාර්ෂික වාර්තාවේ හෙළි කර ඇති වැදගත් ගැටළු විසඳීම සඳහා විස්තර කර ඇති ක්‍රියාවලීන් මඟින් එම ගැටළු සැබවින්ම නිරාකරණය වේද යන්න සලකා බැලීමට ද SLSAE 3050 (සංශෝධිත) මඟින් මාගෙන් බලාපොරොත්තු නොවේ.

තෝරා ගන්නා ලද ක්‍රියා පටිපාටි බැංකුවේ ස්වභාවය සහ මෙම ප්‍රකාශය සකස් කර ඇති සිදුවීම් හෝ ගනුදෙනුව පිළිබඳ මගේ අවබෝධය මත පදනම්ව මගේ විනිශ්චය අනුව සිදු කරන ලදී.

මගේ නිගමනය සඳහා පදනමක් සැපයීමට මා ලබාගත් සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව මම විශ්වාස කරමි.

නිගමනය

සිදු කරන ලද ක්‍රියා පටිපාටි මත පදනම්ව, වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති ප්‍රකාශය, බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන්හි සැලසුම සහ කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය පිළිබඳ මගේ අවබෝධයට පටහැනි බව විශ්වාස කිරීමට හේතු වන කිසිවක් මගේ අවධානයට ලක්ව නොමැත.

එල්.එස්.අයි. ජයරත්න
විගණකාධිපති

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ (HDFC බැංකුව) අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව, ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනතේ විධානයෙහි 6.3 වගන්තිය, කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීමේ නීති ඊති 9.12 සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද 2023 ආයතනික පාලනය පිළිබඳ හොඳම භාවිතයන් සඳහා වන සංග්‍රහයේ ඊ.2 වගන්තිය සමඟ අනුකූල වේ. කමිටුවේ යොමු නියමයන් මගින්, ඉහත සඳහන් නියාමන මාර්ගෝපදේශවලට අනුකූලව කමිටුවේ සංයුතිය සහ කාර්යභාරය විස්තර කර ඇත.

HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුවේ ("කමිටුව") මූලික අරමුණ වන්නේ, වැටුප් ප්‍රතිපත්තියක් සහ මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනයට අදාළ අනෙකුත් ප්‍රධාන ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සඳහා වන රාමුව තීරණය කිරීමයි. කමිටුව විසින් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් සඳහා ඉලක්ක සහ අරමුණු සකස් කිරීම, ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩල ව්‍යුහය සහ ආයතනික ව්‍යුහයට අනුකූලව තනතුරු සහ/හෝ පදවි නාම තීරණය කිරීම සිදු කරනු ලබයි.

සංයුතිය

HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවේ සාමාජිකයින් පත් කරනු ලැබේ. 2025 දෙසැම්බර් 31 වන දින වන විට, කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

නම	අධ්‍යක්ෂක තත්ත්වය	සාමාජිකත්ව තත්ත්වය
ආචාර්ය පී.ඒ. ක්‍රිශාන්ත (29.01.2025 දින කමිටු සභාපති ලෙෂ පත් කරන ලදී)	විධායක නොවන, ස්වාධීන	සභාපති
ඒ.ඩබ්. හපුගල මහතා (20.03.2025 දින කමිටුවට පත් කරන ලදී)	විධායක නොවන, ස්වාධීන	අධ්‍යක්ෂ
කේ.කේ.ඒ. ප්‍රේමතිලක මහත්මිය (11.08.2025 දින කමිටුවට පත් කරන ලදී)	විධායක නොවන, ස්වාධීන නොවන	අධ්‍යක්ෂ
එස්.එස්.එස්. නන්දනී මහත්මිය (26.11.2025 දින කමිටුවට පත් කරන ලදී)	විධායක නොවන, ස්වාධීන	අධ්‍යක්ෂ

අධ්‍යක්ෂවරුන්ගේ කෙටි පැතිකඩ වාර්තාවේ 44 සිට 51 දක්වා පිටුවල දැක්වේ.

කමිටු රැස්වීම්

සමාලෝචනයට ලක්වන වසර තුළ කමිටුව දස (10) වතාවක් රැස් විය. මෙම කාල සීමාව තුළ කමිටුවේ සේවය කළ අධ්‍යක්ෂවරුන් සහ එම රැස්වීම් සඳහා ඔවුන්ගේ සහභාගීත්වය පහත දැක්වේ.

	අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව											
	රැස්වීම් දිනයන්										නියමිත අවශ්‍යතා/ රැස්වීම් ගණන අදාළ වේ	සහභාගී වූ රැස්වීම් ගණන
සාමාජිකයාගේ නම	07.02.2025	11.03.2025	24.03.2025	15.05.2025	16.06.2025	11.08.2025	17.10.2025	09.12.2025	22.12.2025	23.12.2025		
ආචාර්ය පී.ඒ. ක්‍රිශාන්ත	P	P	P	P	P	P	P	P	P	P	10	10
ඒ.ඩබ්. හපුගල මහතා (20.03.2025 දින පත් විය)	N/A	N/A	P	P	P	P	P	P	P	P	08	08
කේ.කේ.ඒ. ප්‍රේමතිලක මහත්මිය (11.08.2025 දින පත් විය)	N/A	N/A	N/A	N/A	N/A	P	P	P	E	P	05	04
එස්.එස්.එස්. නන්දනී මහත්මිය (26.11.2025 දින පත් විය)	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	P	P	P	03	03
ඩබ්ලිව්.එම්. ආනන්ද මහතා (10.08.2025 දින විශ්‍රාම ගියේය)	P	P	P	P	P	N/A	N/A	N/A	N/A	N/A	05	05
එච්.කේ.කේ.ඒ. ජයසුන්දර මහතා (21.03.2025 දින ඉල්ලා අස්විය)	P	P	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	02	02

සටහන: P - සහභාගී විය A - නොපැමිණියේය E - නිදහසට කරුණු ඉදිරිපත් කර ඇත N/A - අදාළ නොවේ (Not applıcable)

කමිටුවේ ලේකම්

බැංකුවේ සමාගම් ලේකම්වරයා කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

කමිටුවේ යොමු නියමයන්

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද එහි යොමු නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක වේ. බැංකුවේ වැටුප් ව්‍යුහයන් සාධාරණ, තරඟකාරී සහ කර්මාන්තයේ මිණුම් දණ්ඩට සහ බැංකුවේ සමස්ත කාර්යසාධනයට අනුකූල වන බව සහතික කරමින්, වගවීම සහ විනිවිදභාවය යන මූලධර්ම කෙරෙහි කමිටුව දැඩි ලෙස කැපවී සිටී.

ආරාධිත නිත්‍ය සහභාගිවන්නන්

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ මානව සම්පත් ප්‍රධානී යන තනතුරුවලට අදාළ කරුණු සාකච්ඡා කරන අවස්ථාවන් හැර, අනෙකුත් කමිටු රැස්වීම් සඳහා ඔවුන්ගේ සහභාගිත්වය අනිවාර්ය වේ.

රාජකාරී සහ වගකීම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත නිකුත් කර ඇති විධානයන්ට අනුව:

කමිටුව විසින් පහත දෑ සිදු කළ යුතුය:

1. බැංකුවේ අධ්‍යක්ෂවරුන්, සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්ට අදාළ වැටුප් ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා, සේවය අවසන් කිරීමේදී හෝ විශ්‍රාම ගැනීමේදී ලබා දෙන විශේෂ ගෙවීම් / ප්‍රතිලාභ සහ වෙනත් මූල්‍යමය සහ මූල්‍යමය නොවන ප්‍රතිලාභ) තීරණය කිරීම.
2. අධ්‍යක්ෂවරුන්, GM/CEO සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් සඳහා ඉලක්ක සහ අරමුණු සැකසීම.
3. GM/CEO සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්ගේ කාර්යසාධනය, නියමිත ඉලක්ක සහ අරමුණු සමඟ සැසඳීමෙන් වරින් වර ඇගයීම සහ වැටුප්, ප්‍රතිලාභ සහ අනෙකුත් කාර්යසාධනය පදනම් කරගත් දිරි දීමනා සංශෝධනය කිරීමේ පදනම තීරණය කිරීම.
4. පහත කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ / තොරතුරු ඉදිරිපත් කිරීම:
   i. පදවි නාම වෙනස් කිරීම, විශේෂයෙන්ම බැංකුවේ අනුමත කාර්ය මණ්ඩල / ආයතනික ව්‍යුහයේ නොමැති නව තනතුරක් හෝ පදවි නාමයක් නම්.
   ii. බැංකුව මගින් අනුග්‍රහය දක්වන විදේශ පුහුණු වීම් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් විදේශීය සම්මන්ත්‍රණවලට සහභාගී වීම සම්බන්ධයෙන්.
   iii. සේවා දිගු කිරීමේ අභියාචනා.
   iv. බැංකුවේ විනය සංග්‍රහයට අනුකූලව විනයානුකූල කරුණු සහ සේවක පැමිණිලි පිළිබඳ තීරණ ගැනීම හෝ අභියාචනා නිරාකරණය කිරීම.
   v. කළමනාකරණ අධිකාරී මට්ටමෙන් ඔබ්බට යන සියලුම සේවක සම්බන්ධ කරුණු (අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරියට යටත් කර ඇති නිශ්චිත කරුණු හැර).
   vi. කමිටුව සඳහා සුදුසු යොමු නියමයන් සම්මත කර ගැනීම සහ ඒවා සමාලෝචනය කිරීම / සංශෝධනය කිරීම.
5 අධ්‍යක්ෂවරුන්, සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්ගේ සේවය අවසන් කිරීමේදී හෝ විශ්‍රාම ගැනීමේදී සිදු කරන ඕනෑම විශේෂ ගෙවීමක් / මූල්‍යමය සහ මූල්‍යමය නොවන ප්‍රතිලාභ සඳහා කොටස් හිමියන්ගේ පූර්ව අනුමැතිය ලබා ගන්නා බව සහතික කිරීම. මහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතිය ද ලබා ගත යුතුය.
6. අධ්‍යක්ෂවරුන්, සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්ට සිදු කරන වන්දි ගෙවීම් බැංකුවේ අවදානම් රුචිය සීමාවන් තුළ පවතින බව සහතික කිරීම සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමඟ සම්බන්ධීකරණය කිරීම.
7. වංචා කිරීම සහ අරමුදල් අවභාවිත කිරීම වැනි අවස්ථාවන්හිදී, බැංකුවට සිදු වූ මූල්‍ය අලාභයට අදාළව, සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්ට ලබා දී ඇති කාර්යසාධනය මත පදනම් වූ ගෙවීම් ආපසු අය කර ගැනීමේ ක්‍රමවේදයක් සඳහා ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම. එවැනි ප්‍රතිපත්තියක් මගින් ක්‍රියා පටිපාටිවල නිසි බව, සාධාරණ නඩු විභාගයක් සහ විනිවිදභාවය සහතික කරමින්, ආපසු අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට පෙර බලපත්‍රලාභී බැංකුව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාවලිය පැහැදිලි කළ යුතුය.

   මෙම ආපසු අය කර ගැනීමේ ක්‍රියා පටිපාටිය ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්ගේ සේවා කොන්ත්‍රාත්තු තුළ ඇතුළත් කළ යුතු අතර, දැනට සිටින ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ද සමාන ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කළ යුතුය.

   කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පහත කරුණු නිර්දේශ කරනු ඇත:

   කමිටුව වෙත යොමු කරන ලද ඕනෑම කරුණක් සහ විශේෂයෙන් පහත සඳහන් දෑ;

   (අ) ලංකා බැංකු සේවක සංගමය සමඟ බැංකුවේ පවතින සාමූහික ගිවිසුම.

   (ආ) බැංකුවේ ආයතනික ව්‍යුහය.

   (ඇ) අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, බඳවා ගැනීමේ ක්‍රමවේද

   (ඈ) නව තනතුරු හෝ පදවි නිර්මාණය කිරීම, ස්ථානගත කිරීම්, කාර්ය මණ්ඩලය සහ කාර්ය මණ්ඩල අයවැය.

   (ඉ) සියලුම මානව සම්පත් කරුණු සම්බන්ධ අදාළ ප්‍රතිපත්ති.

   (ඊ) කළමනාකරණ සහ මානව සම්පත් කමිටු අධිකාරී මට්ටමෙන් ඔබ්බට යන සියලුම සේවක සම්බන්ධ කරුණු.

2025 වසරේ ක්‍රියාකාරකම් සාරාංශය

සමාලෝචනයට ලක්වන වසර තුළ, බැංකුවේ මානව සම්පත් කාර්යයට අදාළ පුළුල් පරාසයක කරුණු සම්බන්ධ යෝජනා කමිටුව විසින් අනුමත කරන ලදී. මානව සම්පත් උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම, කාර්ය මණ්ඩල පුහුණුව, බැංකුවේ නියාමන සහ ව්‍යවස්ථාපිත රාමුවට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තිවලට අනුකූලව විනයානුකූල කරුණු සහ සේවක පැමිණිලි සම්බන්ධ අභියාචනා අධීක්ෂණය කිරීම වසර පුරා සිදු කරන ලද මූලපිරීම් කිහිපයකි.


තමන් වෙත පවරා ඇති වගකීම් කමිටුව විසින් ඉටු කළ අතර, ඒ අනුව 2025 වසර සඳහා අනුප්‍රාප්තික සැලැස්ම, 2025/2026 කාර්ය මණ්ඩල සහ ආයතනික ව්‍යුහය, ස්ථාන මාරු සහ උසස්වීම් ප්‍රතිපත්තිවලට සංශෝධන වැනි සේවකයින්ට අදාළ වැදගත් ප්‍රතිපත්ති කිහිපයක් නිර්දේශ කරන ලදී. වසර තුළ පුරප්පාඩු වූ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්තනතුරු කිහිපයක් පිරවීම සඳහා කමිටුව පියවර ගත් අතර, සුදුසුකම්, පළපුරුද්ද, පෙර දරන ලද තනතුරු සහ පුද්ගලයින් කිහිප දෙනෙකුගේ අදාළ යෝග්‍යතාවය කෙරෙහි අවධානය යොමු කරමින්, වසර තුළදී ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් බඳවා ගැනීම සඳහා නිර්දේශ කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව

සේවා නියුක්ති වාර්තාව

2025 දෙසැම්බර් 31 වන දින වන විට බැංකුවේ සේවා නියුක්ති වාර්තාව පහත වගුවේ දැක්වේ.


	2025 දෙසැම්බර් 31 වන විට එකතුව	
කාණ්ඩය	**පිරිමි**	**කාන්තා**
ආයතනික කළමනාකාරිත්වය	05	05
ප්‍රධාන/ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	05	06
ප්‍රාදේශීය කළමනාකරුවන්	04	00
විධායක කාර්ය මණ්ඩලය	101	116
විධායක නොවන කාර්ය මණ්ඩලය (ලේකම්වරුන්, බැංකු සහායකයින්, පොදු කම්කරුවන්, කාර්යාල සහායකයින්, රියදුරන්, ව්‍යාපාර ප්‍රවර්ධන සහායකයින්, කනිෂ්ඨ ව්‍යාපාර ප්‍රවර්ධන සහායකයින්, ව්‍යාපාර ප්‍රවර්ධන ආධුනිකයින්, පාම්ටොප් සහායකයින්)	164	47
එකතුව	279	174



(women make up 38.4% and men make up 61.6% of our workforce.)

JHIA LDKAV WKQJ J¾.SLRKH ^2025 FOIEÏN¾ 31 JK ÈK JK ÚG&

වයස	කාන්තා	පිරිමි
51-60	44	58
41-50	57	45
31-40	175	67
21-30	03	04
20ට අඩු	0	0
එකතුව	279	174



නිගමනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික පාලන නීති, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ නීති රීති සහ අනෙකුත් සියලුම නියාමන අවශ්‍යතා යටතේ නියම කර ඇති ආයතනික පාලන අවශ්‍යතාවලට අනුකූලව, බැංකුවේ 2026 වර්ෂය සඳහා වන උපායමාර්ගික දැක්ම සහ ඉලක්ක පෙළගස්වා ඇති බව කමිටුව ප්‍රකාශ කරයි.



ජී. ඒ. ක්‍රිශාන්ත

විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ සහ කමිටු සභාපති

මානව සම්පත් සහ වැටුප් කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුව

ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනතේ විධානයෙහි 6.4 වගන්තිය සහ කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ නීති ඊති 9.11 ට අනුකූලව, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ (HDFC බැංකුව) අධ්‍යක්ෂ මණ්ඩල නම් කිරීමේ සහ පාලන කමිටුව ස්ථාපිත කර ඇත. මෙම කමිටුවේ සංයුතිය සහ කාර්යභාරය ඉහත සඳහන් නියාමන මාර්ගෝපදේශ සහ කමිටු යොමු නියමයන්ට අනුකූල වේ.

සංයුතිය සහ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල නම් කිරීමේ සහ පාලන කමිටුව HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලදී. 2025 දෙසැම්බර් 31 වන දින වන විට, අධ්‍යක්ෂ මණ්ඩල නම් කිරීමේ සහ පාලන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ:

නම	අධ්‍යක්ෂක තත්ත්වය	සාමාජිකත්ව තත්ත්වය
ඒ.එන්. හපුගල මහතා (24.03.2025 දින පත් කරන ලදී)	විධායක නොවන, ස්වාධීන	සභාපති
කේ. බී. විජයරත්න මහතා (25.09.2024 දින පත් කරන ලදී)	විධායක නොවන, ස්වාධීන	අධ්‍යක්ෂ
කේ.කේ.ඒ. ප්‍රේමතිලක මහත්මිය (11.08.2025 දින පත් කරන ලදී)	විධායක නොවන, ස්වාධීන නොවන	අධ්‍යක්ෂ
ජේ.එම්.පී.එස්. කෞශල්‍ය මහතා (26.11.2025 දින පත් කරන ලදී)	විධායක නොවන, ස්වාධීන	අධ්‍යක්ෂ

කමිටු සාමාජිකයින්ගේ කෙටි පැතිකඩ වාර්තාවේ 44 සිට 51 දක්වා පිටුවල දැක්වේ.

කමිටුවේ ලේකම්

බැංකුවේ මණ්ඩල ලේකම්/සමාගම් ලේකම්වරයා කමිටුවේ ලේකම් ලෙස සේවය කරයි.

කමිටුවේ යොමු නියමයන්

මෙම යොමු නියමයන්ගේ අරමුණ වන්නේ HDFC බැංකුවේ (බැංකුව) අධ්‍යක්ෂ මණ්ඩල නම් කිරීමේ සහ පාලන කමිටුවේ ("කමිටුව") ක්‍රියා පටිපාටි, භාවිතයන් සහ ප්‍රතිපත්ති විධිමත් කිරීම සහ ක්‌තගත කිරීම මෙන්ම කමිටුවේ ව්‍යවස්ථාව, අධිකාරිය, වගකීම් සහ ක්‍රියාත්මක වන ආකාරය සකස් කිරීමයි. පහත දක්වා ඇති යොමු නියමයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්වචනය කර ඇති අතර, වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංශෝධනය කළ හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩල නම් කිරීමේ සහ පාලන කමිටුවේ භූමිකාවන් සහ වගකීම් මෙම යොමු නියමයන් තුළ නිර්වචනය කර ඇත්තේ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා 2024 අංක 05 දරන විධානය (ආයතනික පාලනය) මඟින් නියම කර ඇති නීති ඊති මත පදනම්වය.

මෙම යොමු නියමයන් කමිටුව විසින් වරින් වර (වසර තුනකට වරක්) සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලැබේ.

කමිටු රැස්වීම්

පහත සඳහන් අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුවේ සේවය කරයි/සේවය කර ඇත. වසර තුළ කමිටුව අට (08) වතාවක් රැස් වූ අතර, රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ සහභාගීත්වය පහත වගුවේ දැක්වේ

	කමිටු රැස්වීම් සහ සහභාගීත්වය									
කමිටු සාමාජිකයාගේ නම	20.02.2025	04.04.2025	15.05.2025	26.06.2025	25.07.2025	26.09.2025	17.10.2025	26.11.2025	සහභාගී වීමට සුදුසු	සහභාගී වූ
ඒ.එන්. හපුගල මහතා (24.03.2025 දින පත් විය)	N/A	P	P	P	P	P	P	P	07	07
කේ. බී. විජයරත්න මහතා (25.09.2024 දින පත් විය)	P	P	P	P	P	P	P	P	08	08
කේ.කේ.ඒ. ප්‍රේමතිලක මහත්මිය (11.08.2025 දින පත් විය)	N/A	N/A	N/A	N/A	N/A	P	P	P	03	03
ජේ.එම්.පී.එස්. කෞශල්‍ය මහතා (26.11.2025 දින පත් විය)	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	00	00
ඩබ්ලිව්.එම්. ආනන්ද මහතා (10.08.2025 දින විශ්‍රාම ගියේය)	P	P	P	P	P	N/A	N/A	N/A	05	05
ඩබ්.කේ.කේ.ඒ. ජයසුන්දර මහතා (21.03.2025 දින ඉල්ලා අස්විය)	P	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	01	01

සටහන: P - සහභාගී විය A - නොපැමිණියේය E - නිදහසට කරුණු ඉදිරිපත් කර ඇත N/A - අදාළ නොවේ (Not applιcable)

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුව

කමිටුවේ වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩල නම් කිරීමේ සහ පාලන කමිටුව ප්‍රධාන වශයෙන් අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ සාමාජිකයින් සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීමට වගකිව යුතු අතර, පහත සඳහන් කරුණු සඳහා ද වගකීම දරයි:

සාමාන්‍ය පාලන කටයුතු

1. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරනු ලබන ආයතනික පාලනය සම්බන්ධයෙන් සාමාන්‍ය අධීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම.
2. නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් හඳුනා ගැනීම, නම් කිරීම සහ නිර්දේශ කිරීම සඳහා විනිවිද පෙනෙන ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීම.
3. අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පහත කරුණු සමාලෝචනය කර නිර්දේශ කිරීම:
   අ. භාවිතයන්, මූලධර්ම, මාර්ගෝපදේශ සහ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති ඇතුළුව බැංකුවේ ආයතනික පාලනය සඳහා වන ප්‍රවේශය සහ අනුකූලතාව අධීක්ෂණය කර බැහැර කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.
   ආ. ආයතනික හෝ ප්‍රධාන තොරතුරු සන්නිවේදනය, හෙළිදරව් කිරීම් සහ රහස්‍යභාවය ආමන්ත්‍රණය කරන වැදගත් ආයතනික ප්‍රතිපත්ති සහ අනුකූලතාව අධීක්ෂණය කර බැහැර කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.
   ඇ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීම සහ රැස්වීම් ද්‍රව්‍ය කල්තියා සමාලෝචනය කිරීම සම්බන්ධ මූලික රාජකාරී සහ වගකීම් ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ අපේක්ෂිත හැකියාවන් සහ වගකීම්.
4. අධ්‍යක්ෂ මණ්ඩල යොමු නියමයන් නිරන්තරයෙන් සමාලෝචනය කිරීම සහ අවශ්‍ය සංශෝධන අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.
5. විධානය 2.5 (ආ) අනුව ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයේ තත්ත්වය කාර්තුවකට වරක් ඇගයීම සහ එවැනි අධ්‍යක්ෂවරුන්ට තම රාජකාරී ස්වාධීනව ඉටු කිරීමේ හැකියාවට බාධාවක් විය හැකි කිසියම් දේශපාලන හෝ වෙනත් අවශ්‍යතා ගැටුමක් පවතීද යන්න පරීක්ෂා කිරීම. ස්වාධීන තත්ත්වයේ වෙනසක් (ඇත්නම්) ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දීම.
6. අධ්‍යක්ෂවරුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුව, ධාරිතා ගොඩනැංවීම සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් පිළිබඳව නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.
7. රාජකාරී සහ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල ව්‍යුහය, ප්‍රමාණය, සුදුසුකම් සහ සංයුතිය සමාලෝචනය කිරීම.
8. බැංකුවේ ආයතනික පාලන පිළිවෙත් සහ පාලන මාර්ගෝපදේශවලට සහ අදාළ ඕනෑම නීතියකට සහ රෙගුලාසියකට අනුකූල වීම පිළිබඳ සන්නිවේදනය සහ හෙළිදරව් කිරීම් සමාලෝචනය කිරීම.

දිශානතිය සහ අඛණ්ඩ අධ්‍යාපනය

9. අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ කුසලතා සහ හැකියාවන් පවත්වා ගැනීමට සහ වැඩිදියුණු කිරීමට හැකි වන පරිදි ඔවුන්ගේ දිශානතිය, පුහුණුව සහ අඛණ්ඩ අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති අනුමත කිරීම සහ බැංකුවේ ව්‍යාපාර පිළිබඳ ඔවුන්ගේ දැනුම සහ අවබෝධය යාවත්කාලීනව පවතින බව සහතික කිරීම.
10. සියලුම නව අධ්‍යක්ෂවරුන්ට පුළුල් දිශානතියක් ලැබෙන බව සහතික කිරීමට සාධාරණ පියවර ගැනීම. ඒ මගින් බැංකුවේ ව්‍යාපාරයේ ස්වභාවය සහ මෙහෙයුම්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල කාර්යභාරය සහ සෑම අධ්‍යක්ෂවරයෙකුගෙන්ම බලාපොරොත්තු වන දායකත්වය (විශේෂයෙන්, බැංකුව විසින් ඔවුන්ගේ අධ්‍යක්ෂවරුන්ගෙන් බලාපොරොත්තු වන කාලය සහ සම්පත් පිළිබඳ කැපවීම) පිළිබඳව සෑම අධ්‍යක්ෂවරයෙකුටම සම්පූර්ණ අවබෝධයක් ලබා දීම.
11. අධ්‍යක්ෂවරුන්ට අදාළ නීති, රෙගුලාසි, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, නවතම තාක්ෂණික දියුණුව සහ බැංකු කර්මාන්තයට අදාළ මතුවෙමින් පවතින මූල්‍ය අංශයේ සහ වෙළඳපොළ වර්ධනයන් පිළිබඳව අඛණ්ඩව යාවත්කාලීන වන බව සහතික කිරීම.

අධ්‍යක්ෂවරුන් නම් කිරීම:

12. අවම වශයෙන් කාර්තුවකට වරක්වත් යාවත්කාලීන කරනු ලබන 'අධ්‍යක්ෂ මණ්ඩල නිපුණතා සිතියමක්' පවත්වාගෙන යාම, එමගින් නව යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත නිපුණතා මට්ටම්වලට ප්‍රතිලාභ ලැබෙන පරිදි සහ බැංකුවටම ප්‍රතිලාභ ලැබෙන පරිදි පෙරහන් කිරීම; හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට තේරී පත්වීම/නැවත තේරී පත්වීම හෝ පත් කිරීම සඳහා යෝජිත අපේක්ෂක(යින්) නිර්දේශ කිරීමට පෙර, පහත ක්‍රියාවලිය අනුගමනය කිරීම:
    i. සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය සතු විය යුතු නිපුණතා සහ කුසලතා මොනවාදැයි සලකා බැලීම;
    ii. අතිරේක/නව විශේෂඥ දැනුම පිළිබඳ අවශ්‍යතා සහ විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සඳහා අනුප්‍රාප්තික සැලසුම් වරින් වර සලකා බැලීම සහ නිර්දේශ කිරීම; සහ
    iii. පවතින සෑම අධ්‍යක්ෂවරයෙකු සතු නිපුණතා සහ කුසලතා මොනවාදැයි ඇගයීම.
13. අධ්‍යක්ෂ මණ්ඩලය සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සමඟ සාකච්ඡා කරමින්, අඛණ්ඩ පදනමක් මත නව අධ්‍යක්ෂවරුන් වීමට සුදුසුකම් ලත් පුද්ගලයින් හඳුනා ගැනීම, ඒ සඳහා:
    i. විභව අපේක්ෂකයින්ගේ අත්දැකීම්, විශේෂඥ දැනුම සහ කර්මාන්ත දැනුම ඇතුළු පුද්ගලික ගුණාංග සහ සුදුසුකම් සැලකිල්ලට ගැනීම; සහ
    ii. අධ්‍යක්ෂක ස්වාධීනත්වය සහ මූල්‍ය සාක්ෂරතාවයට අදාළ කරුණු ඇතුළු ඕනෑම නීතිමය අවශ්‍යතාවක් සලකා බැලීම.
    iii අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්, ශ්‍රී ලංකා මහ බැංකු විධානයන් 3 සහ 8.2 හි දක්වා ඇති පරිදි සහ අදාළ නීති සහ රෙගුලාසිවල දක්වා ඇති පරිදි, තනතුරු දැරීමට සුදුසු සහ නිසි පුද්ගලයින් බව සහතික කිරීම.
14. බැංකුවේ මීළඟ වාර්ෂික කොටස් හිමියන්ගේ රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට තේරී පත්වීම/නැවත තේරී පත්වීම සඳහා හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් පිරවීම සඳහා යෝජිත අපේක්ෂක(යින්) හඳුනා ගැනීම සහ අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම. සිය නිර්දේශ ඉදිරිපත් කිරීමේදී, කමිටුව විසින් පහත දෑ ඇගයීමට සහ සලකා බැලීමට පියවර ගනු ඇත:
    i. සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය සතු විය යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකන නිපුණතා සහ කුසලතා;
    ii. පවතින සෑම අධ්‍යක්ෂවරයෙකුම සතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකන නිපුණතා සහ කුසලතා;
    iii. සෑම නව නාමයෝජනා ලාභියෙකුම අධ්‍යක්ෂ මණ්ඩලයට රැගෙන එන නිපුණතා සහ කුසලතා; සහ
    iv. සෑම නව නාමයෝජනා ලාභියෙකුටම අධ්‍යක්ෂවරයෙකු ලෙස තම රාජකාරී සඳහා ප්‍රමාණවත් කාලයක් සහ සම්පත් කැප කිරීමට ඇති හැකියාව.

v. ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට දැරිය හැකි උපරිම ලැයිස්තුගත බැංකු අධ්‍යක්ෂ මණ්ඩල නියෝජනයන් ගණන යෝජනා කිරීම සහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ මෙය හෙළිදරව් කිරීම;

vi. අදාළ අධ්‍යක්ෂවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් සමස්තයක් ලෙස ඉටු කිරීම සඳහා ලබා දී ඇති දායකත්වය සහ කාර්යසාධනය පිළිබඳ වරින් වර ඇගයීමක් සිදු කර, වත්මන් අධ්‍යක්ෂවරුන් නැවත තේරී පත්වීම නිර්දේශ කිරීම (හෝ නිර්දේශ නොකිරීම).

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් නම් කිරීම

15. නව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් තෝරා ගැනීම/පත් කිරීම සඳහා කමිටුව විසින් ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කළ යුතුය.

16. ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ තනතුරු සඳහා පත් කිරීම් හෝ උසස්වීම් සලකා බැලීමට අවශ්‍ය වන සුදුසුකම්, අත්දැකීම් සහ ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක කමිටුව විසින් නියම කළ යුතුය.

17. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්, ශ්‍රී ලංකා මහ බැංකු විධානයන් 3 සහ 8.2 හි දක්වා ඇති පරිදි සහ අදාළ නීති සහ රෙගුලාසිවල දක්වා ඇති පරිදි, තනතුරු දැරීමට සුදුසු සහ නිසි පුද්ගලයින් බව කමිටුව විසින් සහතික කළ යුතුය.

18. බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් සඳහා ශක්තිමත් අනුප්‍රාප්තික සැලසුමක් පවතින බව සහතික කිරීම සඳහා ඵලදායී සහ විනිවිද පෙනෙන ක්‍රියාවලියක් කමිටුව විසින් අනුගමනය කළ යුතුය. එම ක්‍රියාවලිය පහත කරුණු සඳහා විය යුතුය:

i. බැංකුවේ මෙහෙයුම්වල විශාලත්වය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින් කෙටි, මධ්‍යම සහ දිගු කාලීන අනුප්‍රාප්තිය සඳහා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්ගේ තනතුරු පිරවීම සඳහා සුදුසුකම් ලත් සහ නිපුණ පුද්ගලයින් (අභ්‍යන්තර/බාහිර) හඳුනා ගැනීම;

ii. අදාළ ක්ෂේත්‍රවල පවතින කුසලතා/දැනුම පරතරයන් හඳුනාගෙන ඒවා අවම කිරීම මගින් තෝරාගත් අනුප්‍රාප්තිකයින් වම තනතුරු සඳහා සුදානම් කිරීම; සහ

iii. අවම වශයෙන් වාර්ෂිකව අනුප්‍රාප්තික සැලසුම සමාලෝචනය කිරීම.

19. අතිරේක/නව විශේෂඥ දැනුම පිළිබඳ අවශ්‍යතා සහ විශ්‍රාම යන ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් සඳහා අනුප්‍රාප්තික සැලසුම් වරින් වර සලකා බැලීම සහ නිර්දේශ කිරීම කමිටුව විසින් සිදු කළ යුතුය.

20. කමිටුව සඳහා සුදුසු යොමු නියමයන් සම්මත කර ගැනීම සහ ඒවා සමාලෝචනය කිරීම / සංශෝධනය කිරීම.

සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ, ඉහත දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩල නම් කිරීමේ සහ පාලන කමිටුවේ වරම අනුව කමිටුව විසින් අවශ්‍ය මුලපිරීම් ගනු ලැබීය.

2025 වසරේ ක්‍රියාකාරකම් සාරාංශය

වසර තුළදී, කමිටුව විසින් අපේක්ෂකයින් කිහිප දෙනෙකුගේ යෝග්‍යතාවය සලකා බලා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු පත් කිරීම සඳහා නිර්දේශ කරන ලද අතර, බැංකුවේ අධ්‍යක්ෂවරුන් පත් කිරීම සහ ඔවුන්ගේ තනතුරුවල අඛණ්ඩ පැවැත්ම තවදුරටත් සමාලෝචනය කර නිර්දේශ කරන ලදී. මෙම ක්‍රියාවලියේදී, අදාළ ඕනෑම නියාමන අවශ්‍යතාවයකට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩලවල පවතින පරතරයන් සහ අවශ්‍යතා අනුව අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම්, අත්දැකීම්, කුසලතා සහ නිපුණතා කමිටුව විසින් ඇගයීමට ලක් කරන ලදී. ඒ අනුව, මෙම වාර්ෂික වාර්තාවේ සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සාමාජිකයින් ඔවුන් සතු දැනුම, කුසලතා සහ නිපුණතා සැලකිල්ලට ගනිමින් පත් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලවල සමස්ත සංයුතිය පිළිබඳව සහ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විශේෂඥ දැනුම සහ අත්දැකීම් අතින් වඩාත් සුදුසු සමතුලිතතාවයක් ඇති කිරීම පිළිබඳව කමිටුව දැඩි අවධානයක් යොමු කළේය.

එසේම, බැංකුවේ වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය (තීරණ ගැනීම්වලට චරදෘෂ්ටිවාදී ලෙස දායක වීමේ හැකියාව) කමිටුව විසින් තක්සේරු කරන ලද අතර, රෙගුලාසිවලට අනුව නියාමකයාගේ අනුමැතිය සඳහා අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශ සහ ප්‍රකාශන යොමු කරන ලදී.

වසර තුළ බැංකුවේ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් පත් කිරීම සම්බන්ධයෙන් කමිටුව වැඩිදුරටත් සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කරන ලදී.



ඒ. එන්. හපුගල
විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ සහ කමිටු සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල නම් කිරීමේ සහ පාලන කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව

අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව ("කමිටුව"), සමාන හෝ සමාන තත්වයන් යටතේ සම්බන්ධ නොවන තෙවන පාර්ශවයකට ලබා ගත හැකි කොන්දේසිවලට වඩා වාසිදායක කොන්දේසි මත ගනුදෙනුවක් පවතින්නේද යන්න තීරණය කිරීම සඳහා, යෝජිත අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") විසින් පිහිටුවා ඇත. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ජූනි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව පිහිටුවන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ භූමිකාවන් සහ වගකීම්, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු සඳහා 2024 අංක 05 දරන විධානය (ආයතනික පාලනය), කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ නීති, සහ 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත සහ එහි සියලුම සංශෝධන මගින් නියම කර ඇති අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව පාලනය කරන නීති මත පදනම්ව යොමු නියමයන් තුළ නිර්වචනය කර ඇත.

සංයුතිය සහ රැස්වීම් සහභාගීත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව, කමිටුවේ සභාපතිවරයා ඇතුළු විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සහ එක් විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත වේ. 2025 දෙසැම්බර් 31 වන දින වන විට කමිටුවේ සංයුතිය පහත පරිදි විය:

අධ්‍යක්ෂ මණ්ඩල අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද අතර එහි සංයුතිය පහත පරිදි වේ.

නම	අධ්‍යක්ෂක තත්ත්වය	සාමාජිකත්ව තත්ත්වය
එස්.එස්.එස්. නන්දනී මහත්මිය (26.11.2025 දින පත් විය)	විධායක නොවන, ස්වාධීන	සභාපති
කේ.බී. විජයරත්න මහතා (27.01.2025 දින පත් විය)	විධායක නොවන, ස්වාධීන	අධ්‍යක්ෂ
ආචාර්ය පී.ඒ. ක්‍රිශාන්ත (17.05.2023 දින පත් විය)	විධායක නොවන, ස්වාධීන	අධ්‍යක්ෂ
කේ.කේ.ඒ. ප්‍රේමතිලක මහත්මිය (11.08.2025 දින පත් විය)	විධායක නොවන, ස්වාධීන නොවන	අධ්‍යක්ෂ

අධ්‍යක්ෂවරුන්ගේ කෙටි පැතිකඩ වාර්තාවේ 44 සිට 51 දක්වා පිටුවල දැක්වේ.

කමිටුවේ ලේකම්

බැංකු මණ්ඩල ලේකම්වරයා ("සමාගම් ලේකම්" ලෙසද හැඳින්වේ) කමිටුවේ ලේකම්වරයා ලෙස රාජකාරි ඉටු කළේය.

කමිටුවේ යොමු නියමයන්

අධ්‍යක්ෂ මණ්ඩල අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ රාජකාරි සහ වගකීම් එහි යොමු නියමයන් තුළ නිර්වචනය කර ඇත.

2016 ජනවාරි 01 දින සිට අනිවාර්ය අනුකූලතාවය අවශ්‍ය වූ කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ නීතිවල 9වන කොටසේ දක්වා ඇති අදාළ පාර්ශ්ව ගනුදෙනු සම්බන්ධ නීතිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා මෙම යොමු නියමයන් සකස් කර ඇත. කමිටුවේ සංයුතිය සහ කාර්යභාරය එම නීතිවලට අනුකූල වේ.

කමිටුවේ අරමුණ වන්නේ සියලුම පාර්ශ්වකරුවන් සඳහා විනිවිදභාවය සහ සාධාරණත්වය සහතික කිරීමයි. බැංකු සේවකයින්ට අදාළ යෝජනා ක්‍රමයක් යටතේ ප්‍රධාන විධායක නිලධාරියෙකුට හෝ ප්‍රධාන කළමනාකාරීත්වයේ සාමාජිකයෙකුට ලබා දෙන දීමනා හැර, බැංකු පනතේ 47 සහ 76ණ වගන්තිවල විධිවිධානවලට, 2024 අංක 05 දරන විධානයේ 7.1 වගන්තිය (ආයතනික පාලනය), 2024 අංක 04 දරන විධානයේ 2 වන වගන්තිය (අදාළ පාර්ශ්ව ගනුදෙනු සඳහා අනුමත සුරැකුම්පත්) සහ අදාළ වන පරිදි කොළඹ කොටස් වෙළඳපොලේ 9 වන රීතිය (ආයතනික පාලනය) හි 9.14 වගන්තිය අනුව අදාළ පාර්ශ්ව වෙත ලබා දෙන පහසුකම් සම්බන්ධයෙන් අනුකූලතාවය සහතික කිරීමට කමිටුව වග බලා ගනී.

කමිටු රැස්වීම්

සමාලෝචනයට ලක්වන වසර තුළ කමිටුව පහ (05) වතාවක් රැස් විය. මෙම කමිටුවේ සේවය කළ/සේවය කරන අධ්‍යක්ෂවරුන් සහ එම රැස්වීම්වලට සහභාගී වීම පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ..

සාමාජිකයාගේ නම	කමිටු රැස්වීම් සහ සහභාගිත්වය (2025)						
	20.02.2025	23.05.2025	26.08.2025	20.11.2025	09.12.2025	සහභාගී වීමට සුදුසු	සහභාගී වූ ගණන
කේ.බී. විජයරත්න මහතා (27.01.2025 දින පත් විය)	P	P	P	P	P	05	05
ආචාර්ය පී.ඒ. ක්‍රිශාන්ත (17.05.2023 දින පත් විය)	P	P	P	P	P	05	05
කේ.කේ.ජී. ප්‍රේමතිලක මහත්මිය (11.08.2025 දින පත් විය)	N/A	N/A	P	P	P	03	03
එස්.එස්.එස්. නන්දනී මහත්මිය (26.11.2025 දින පත් විය)	N/A	N/A	N/A	N/A	P	01	01
ඩබ්ලිව්.එම්. ආනන්ද මහතා (10.08.2025 දින විශ්‍රාම ගියේය)	P	P	N/A	N/A	N/A	02	02
ඩබ්ලිව්.එන්.අයි.සී. ප්‍රනාන්දු මහතා (23.06.2025 දින ඉල්ලා අස්විය)	P	P	N/A	N/A	N/A	02	02

සටහන: P - සහභාගී විය A - නොපැමිණියේය E - නිදහසට කරුණු ඉදිරිපත් කර ඇත N/A - අදාළ නොවේ (Not applıcable)

කමිටුවේ රාජකාරි සහ වගකීම්

1. කමිටුව විසින් යෝජිත අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචනය කරනු ලබයි.
   - අ. යෝජිත ගනුදෙනුව විශ්ලේෂණය කිරීමේදී සහ ඇගයීමේදී, කමිටුව පහත කරුණු සලකා බැලිය යුතුය: ගනුදෙනුවට සම්බන්ධ පාර්ශ්වයන්ගේ අනන්‍යතාවය;
     - i. අදාළ පාර්ශ්ව සම්බන්ධතාවයේ ස්වභාවය/පදනම;
     - ii. අන්තර් සම්බන්ධිත නිලධාරි තනතුරු/අධ්‍යක්ෂක තනතුරු;
     - iii. ගනුදෙනුව පිළිබඳ විස්තරය;
     - iv. ගනුදෙනුවේ ප්‍රතිලාභ සහ අරමුණ
     - v. ගනුදෙනුවේ වටිනාකම;
     - vi. භාවිතා කරන ලද මිල නියම කිරීමේ ක්‍රමය සහ ඒ සඳහා වන තාර්කික පදනම;
     - vii. අදාළ වන විට, සමාන තත්වයන් යටතේ සිදු වූ සම්බන්ධ නොවන ගනුදෙනුවල ලේඛනගත මිණුම් දණ්ඩ්/සංසන්දනාත්මක මිල ගණන්;
     - viii. අදාළ පාර්ශ්ව ගනුදෙනුව නිසා හෝ ඒ හා සම්බන්ධව ඇති විය හැකි විභව අවදානම්; සහ
     - ix. ගනුදෙනුව පිළිබඳ වෙනත් අදාළ තොරතුරු.
   - ආ. අදාළ පාර්ශ්ව ගනුදෙනුව මගින් විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුගේ ස්වාධීනත්වයට හානියක් සිදුවේද යන්න.
   - ඇ. ගනුදෙනුවේ ප්‍රමාණය, අධ්‍යක්ෂවරයාගේ, ප්‍රධාන වගකිවයුතු පුද්ගලයින්ගේ හෝ අදාළ පාර්ශ්වයේ සමස්ත මූල්‍ය තත්ත්වය, ගනුදෙනුව තුළ අධ්‍යක්ෂවරයාගේ, නිලධාරියාගේ හෝ අදාළ පාර්ශ්වයේ සෘජු හෝ වක්‍ර ස්වභාවය සහ යෝජිත සම්බන්ධතාවයේ පවතින ස්වභාවය සැලකිල්ලට ගනිමින්, එම ගනුදෙනුව සමාග මේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට හෝ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්ට අවශ්‍යතා ගැටුමක් ඇති කරන්නේද යන්න.
2. යෝජිත අදාළ පාර්ශ්ව ගනුදෙනුවල සියලුම අංශ ඇගයීමට අවශ්‍ය දැනුම හෝ විශේෂඥතාව කමිටුව සතු බව හෝ ඒවාට ප්‍රවේශ වීමේ හැකියාව ඇති බව කමිටුව සහතික කරයි. අවශ්‍ය විටෙක, ඔවුන් සුදුසුකම් ලත් පුද්ගලයෙකුගෙන් ස්වාධීන වෘත්තීය සහ විශේෂඥ උපදෙස් ලබා ගත යුතුය.
3. කමිටුවේ සෑම පසුකාලීන නියමිත රැස්වීමකදීම, මීට පෙර සමාලෝචනය කරන ලද ඕනෑම අදාළ පාර්ශ්ව ගනුදෙනුවක සිදුවීමට නියමිත සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව කළමනාකාරිත්වය විසින් කමිටුව දැනුවත් කළ යුතු අතර, ගනුදෙනුව සම්පූර්ණ කිරීමට පෙර එවැනි යෝජිත සැලකිය යුතු වෙනස්කම් සඳහා කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය.
4. අවශ්‍ය අවස්ථාවලදී, අදාළ පාර්ශ්ව ගනුදෙනු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කමිටුව විසින් ඉල්ලා සිටිය යුතුය. එවැනි අවස්ථාවලදී, අදාළ අදාළ පාර්ශ්ව ගනුදෙනුවට එළඹීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය.
5. අදාළ පාර්ශ්ව ගනුදෙනුවක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුද යන්න තීරණය කිරීමේදී, සුදුසු යැයි සැලකෙන අනෙකුත් සාධක අතර පහත කරුණු කමිටුව විසින් සැලකිල්ලට ගත යුතුය:
   - අ) ඉහත විස්තර කර ඇති පරිදි ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සපයන ලද කරුණු සහ තත්වයන්.
   - ආ) අධ්‍යක්ෂ මණ්ඩල සභාපති සහ නම් කිරීමේ සහ/හෝ විගණන කමිටුවේ සභාපති සමඟ උපදෙස් ලබා ගැනීමෙන් පසු, යෝජිත අදාළ පාර්ශ්ව ගනුදෙනුව අධ්‍යක්ෂවරයෙකුගේ ස්වාධීනත්වයට ඇති කරන බලපෑම (අදාළ පාර්ශ්වය අධ්‍යක්ෂවරයෙකු, අධ්‍යක්ෂවරයෙකුගේ පවුලේ සමීපතම සාමාජිකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හවුල්කරුවෙකු, කොටස් හිමියෙකු හෝ ප්‍රධාන වගකිවයුතු පුද්ගලයෙකු වන ආයතනයක් නම්).
   - ඇ) කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ නීතිවල 08 වන වගන්තිය යටතේ විස්තර කර ඇති පරිදි, අදාළ පාර්ශ්ව ගනුදෙනුව සඳහා ක්ෂණික වෙළඳපොළ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වේද යන්න.
6. කිසිදු අධ්‍යක්ෂවරයෙකු තමා සම්බන්ධ පාර්ශ්වයක් වන යෝජිත අදාළ පාර්ශ්ව ගනුදෙනුවක් පිළිබඳ ඕනෑම සාකච්ඡාවකට සහභාගී නොවිය යුතුය. කෙසේ වෙතත්, අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ ඉල්ලීම පරිදි, අදාළ පාර්ශ්ව ගනුදෙනුව පිළිබඳ තොරතුරු කමිටුවට ලබා දීමේ පැහැදිලි අරමුණ සඳහා එම අධ්‍යක්ෂවරයාට සාකච්ඡාවලට සහභාගී විය හැකිය. එවැනි තත්වයන් යටතේ, එම ගනුදෙනුව අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කළ යුතුය.
7. අදාළ පාර්ශ්ව සමඟ පවත්වන අඛණ්ඩ ගනුදෙනු වලදී ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් අනුගමනය කළ යුතු පුනරාවර්තන අදාළ පාර්ශ්ව ගනුදෙනු සඳහා මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම කමිටුව විසින් සිදු කළ යුතුය. ඉන් අනතුරුව, අදාළ පාර්ශ්ව සමඟ පවතින සබඳතා කමිටුවේ මාර්ගෝපදේශවලට අනුකූලද යන්න සහ අදාළ පාර්ශ්ව ගනුදෙනුව තවදුරටත් උචිතද යන්න පරීක්ෂා කිරීම සඳහා කමිටුව විසින් වාර්ෂිකව එම සබඳතා සමාලෝචනය කර ඇගයිය යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව

8. ලැයිස්තුගත කිරීමේ නීති, සමාගම් පනත සහ වෙනත් ඕනෑම රෙගුලාසියකට අනුව අවශ්‍ය වන පරිදි, ඕනෑම මූල්‍ය ප්‍රකාශනයක කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කරනු ලබන සහ සමාගම විසින් ප්‍රකාශයට පත් කරනු ලබන හෙළිදරව් කිරීම් සමාලෝචනය කිරීම කමිටුව විසින් සිදු කළ යුතුය.
9. පුනරාවර්තන සහ පුනරාවර්තන නොවන අදාළ පාර්ශ්ව ගනුදෙනු සම්බන්ධයෙන් සහ සැලකිය යුතු වත්කම් අත්පත් කර ගැනීම හෝ බැහැර කිරීම සම්බන්ධයෙන් ලැයිස්තුගත කිරීමේ නීති, සමාගම් පනත සහ වෙනත් ඕනෑම රෙගුලාසියකට අනුව අවශ්‍ය වන පරිදි කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් සහ නිර්දේශ ලබා දීම කමිටුව විසින් සිදු කළ යුතුය.
10. අධ්‍යක්ෂවරුන්ට සහ සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දෙන පහසුකම්, සේවකයින්ට ලබා දෙන පහසුකම් සහ අදාළ පාර්ශ්වයන්ට ලබා දී ඇති පහසුකම් කපා හැරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ 2024 අංක 05 දරන විධානයේ දක්වා ඇති මාර්ගෝපදේශ කමිටුව විසින් අනුගමනය කළ යුතුය.

අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ සාරාංශය

යහපාලනය විදහා දක්වමින්, කොළඹ කොටස් වෙළඳපොලේ ආයතනික පාලන විධානයන් සහ බැංකු පනතේ විධානයන් යටතේ කමිටුවේ අවධානයට ලක් විය යුතු අදාළ පාර්ශ්ව ගනුදෙනු කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

එස්. එස්. එස්. නන්දනී
විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ සහ කමිටු සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව

විගණන කමිටු වාර්තාව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සඳහා නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනතේ විධානය, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ නීතිවල 9.13 වගන්තිය සහ ශ්‍රී ලංකාවේ ප්‍රඥප්ති වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ 2023 හොඳම පිළිවෙත් පිළිබඳ සංග්‍රහය යන කරුණු වලට අනුකූලව, 2025 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා මෙම වාර්තාව විගණන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබේ.

2025 වර්ෂය අවසානයේදී, කමිටුව විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් සිව්දෙනෙකුගෙන් (04) සමන්විත විය.

- කේ. බී. විජයරත්න මහතා (සභාපති)
- ඒ. එන්. හපුගල මහතා (අධ්‍යක්ෂ)
- ජේ. එම්. පී. එස්. කෞශල්‍ය මහතා (අධ්‍යක්ෂ)
- එස්. එස්. එස්. නන්දනී මහත්මිය (අධ්‍යක්ෂ)

2025 වසර තුළ කමිටු සාමාජිකත්වය

නම	31/12/2025 වන විට අධ්‍යක්ෂක තත්ත්වය	සහභාගීත්වය (සහභාගී වූ / සහභාගී විය හැකි)
එරග ණග ඊග උසවැහ්ර්වබැ :අගැගගෙ 25වැය්ැචවැපෟැර 2024*	විධායක නොවන / ස්වාධීන (කමිටු සභාපති)	15/15
ඒ. එන්. හපුගල මහතා (2025 මාර්තු 24 සිට)	විධායක නොවන / ස්වාධීන	10/15
ජේ. එම්. පී. එස්. කෞශල්‍ය මහතා (2025 ජූනි 26 සිට)	විධායක නොවන / ස්වාධීන	08/15
එස්. එස්. එස්. නන්දනී මහත්මිය (2025 නොවැම්බර් 26 සිට)	විධායක නොවන / ස්වාධීන	01/15
ඩබ්ලිව්. එන්. අයි. සී. ප්‍රනාන්දු මහතා (2025 ජූනි 23 දක්වා)	විධායක නොවන / ස්වාධීන	07/15
පී. ඒ. ලයනල් මහතා (2025 ජනවාරි 31 දින විශ්‍රාම ගියේය)	විධායක නොවන / ස්වාධීන	01/15
ආචාර්ය පී. ඒ. ක්‍රිෂාන්ත (2025 මැයි 09 දින කමිටුව ප්‍රතිසංවිධානය කරන ලදී)	විධායක නොවන / ස්වාධීන	04/15

විගණන කමිටු රැස්වීම්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් පහළොවක් (15) පවත්වන ලද අතර, කමිටු සාමාජිකයින්ගේ සහභාගීත්වය වාර්ෂික වාර්තාවේ ආයතනික පාලන අංශයේ දක්වා ඇත.

ආරාධිතයින් ලෙස කමිටු රැස්වීම්වලට නිතිපතා සහභාගී වූවන්:

- සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී
- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- ජාතික විගණන කාර්යාලයේ නියෝජිත (බාහිර විගණක)
- ප්‍රධාන අවදානම් නිලධාරී, ප්‍රධාන අනුකූලතා නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ අවශ්‍යතාවය අනුව අනෙකුත් ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්.

සමාගම් ලේකම්වරිය කමිටුවේ ලේකම්වරිය ලෙස කටයුතු කළ අතර, ඇය නොමැති අවස්ථාවන්හිදී හෝ සමාලෝචනයට ලක්වන වසර තුළදී ප්‍රධාන අභ්‍යන්තර විගණක ලේකම්වරයා ලෙස කටයුතු කළේය.

බාහිර විගණන සහ අනෙකුත් ව්‍යවස්ථාපිත විගණන

බැංකුවේ බාහිර විගණනය රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබයි.

කමිටුව විසින් බාහිර විගණකවරුන්ගේ සොයාගැනීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ සමාලෝචනය කරන ලද අතර, උල්ලංඝනය කිරීම්, වංචා සහ දෝෂ මගහරවා ගැනීම සඳහා ක්‍රියාශීලී පියවර ගැනීමට ආයතනික කළමනාකාරිත්වය සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කරන ලදී.

අභ්‍යන්තර මූල්‍ය පාලනය, ගිණුම්කරණ පිළිවෙත් සහ බැංකු මූල්‍ය ප්‍රකාශන

බැංකුවේ සහතික සපයන්නන්ගේ කාර්යයන් මත පදනම්ව, බැංකුවේ අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතිය සහ ගිණුම්කරණ පිළිවෙත් විශ්වාස කළ නොහැකි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා පදනමක් සපයන බවට කිසිදු කරුණක් කමිටුවේ අවධානයට ලක්වී නොමැත. බැංකුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාගම් පනතේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයන්ට සියලුම ද්‍රව්‍යමය අංශවලින් අනුකූල වන බව කමිටුව සෑහීමකට පත්වන අතර, එම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

මූල්‍ය වාර්තා සමාලෝචනය කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති අධීක්ෂණය කිරීම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම තක්සේරු කිරීම මගින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව කමිටුව සහතික කරයි. නිවැරදි හෙළිදරව් කිරීම් සහතික කරමින් වය විගණන සොයාගැනීම්, සැලකිය යුතු ගනුදෙනු සහ විනිශ්චය කළ යුතු ක්ෂේත්‍ර පිළිබඳව සාකච්ඡා කරයි. කමිටුව ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් ලැබෙන සහතික මත පදනම්ව අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනයන් ඇගයීමට ලක් කරන අතර විගණකාධිපතිවරයාගේ වාර්තාවලට දක්වා ඇති ප්‍රතිචාර සමාලෝචනය කරයි.

විගණන කමිටු වාර්තාව

වසර තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශය

මූල්‍ය වාර්තාකරණය

වාර්ෂික, අන්තර්කාලීන සහ මාසික මූල්‍ය ප්‍රකාශන ඇතුළු මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව සහ මූල්‍ය කාර්යසාධනය සම්බන්ධ ඕනෑම විධිමත් නිවේදනයක්, සැලකිය යුතු මූල්‍ය වාර්තාකරණ ගැටළු, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිළිවෙත්වල සිදුවන වෙනස්කම් සහ මූල්‍ය වාර්තාකරණයට අදාළ වෙනත් කරුණු අධීක්ෂණය කිරීම මගින් කමිටුව විසින් සහතික කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශවලට අනුකූල වීම සහ අවශ්‍ය මූල්‍ය වාර්තාකරණ වැඩිදියුණු කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම සිදු කරන ලදී.

අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණ පද්ධති සහ අනුකූලතා අවශ්‍යතා

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ගේ අවශ්‍යතා සපුරාලීමට සහ බැංකුව මුහුණ දෙන සියලුම සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීමට සහ කළමනාකරණය කිරීමට පටිපාටි ප්‍රමාණවත් බව සහතික කරමින් බැංකුවේ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධති කමිටුවේ සමාලෝචනයට යටත් කරන ලදී. අභිචාර්ය අවශ්‍යතාවලට අනුකූල වීම සහ එවැනි අවශ්‍යතා ඉටු කිරීම සහතික කිරීම සඳහා පද්ධති සහ ක්‍රියා පටිපාටි පිළිබඳව ද කමිටුව අධීක්ෂණය කළේය.

අභ්‍යන්තර විගණන කාර්යභාරය

අභ්‍යන්තර විගණන කාර්යභාරය මගින් බැංකුව තුළ ඵලදායී පාලනයක්, අවදානම් කළමනාකරණයක් සහ අනුකූලතාවයක් සහතික කරනු ලබයි. මෙයට විගණනයේ විෂය පථය, සම්පත් සහ අධිකාරියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම, විගණන සැලසුම් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම සහ විගණන සොයාගැනීම් නිසි ලෙස ආමන්ත්‍රණය කර ඇති බව සහතික කිරීම ඇතුළත් වේ. එමෙන්ම, අභ්‍යන්තර පාලනයන්, තොරතුරු තාක්ෂණ අවදානම් සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව ද එය අධීක්ෂණය කරයි. කමිටුව විසින් ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධනය ඇගයීමට ලක් කරන අතර විගණනයේදී ස්වාධීනත්වය සහතික කරයි. මීට අමතරව, එය බැංකුවේ වත්කම් සුරක්ෂිත කරයි, ද්‍රවශීලතා අවදානම අවම කරයි සහ උපායමාර්ගික සැලසුම් සහ අයවැය ප්‍රධාන කළමනාකරණ මෙවලම් ලෙස ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කරයි.

අනෙකුත් කාර්යයන්

කමිටුව අභ්‍යන්තර විමර්ශන, කාර්ය මණ්ඩල විනය සහ පිරිවැය අඩු කිරීම් අධීක්ෂණය කරන අතරම කළමනාකාරිත්වය විසින් ප්‍රධාන සොයාගැනීම් ආමන්ත්‍රණය කරන බව සහතික කරයි. කරුණු විමර්ශනය කිරීමට, අවශ්‍ය සම්පත් ලබා ගැනීමට සහ බාහිර විශේෂඥ දැනුම ලබා ගැනීමට කමිටුවට පූර්ණ බලතල ඇත. විගණකාධිපතිවරයාගේ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය යටතේ නිර්දේශ සහිත විගණකාධිපතිවරයාගේ වාර්තාව කමිටුව විසින් සමාලෝචනය කරයි. එසේම, එය බාහිර විගණකවරුන් සමඟ සබඳතා කළමනාකරණය කරයි, අනවසර තොරතුරු කාන්දුවීම් වළක්වයි, සහ පාලනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සඳහා අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනයන් සහ ව්‍යාපාර අඛණ්ඩ පැවැත්මේ සැලසුම් තක්සේරු කරයි.

පැමිණිලි ඉදිරිපත් කිරීම

බැංකුවේ පැමිණිලි ඉදිරිපත් කිරීමේ ප්‍රතිපත්තිය, ආයතනික වංචා අවදානම් කළමනාකරණ රාමුවේ අනිවාර්ය අංගයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, බැංකුව තුළ සිදුවන ඕනෑම වැරදි ක්‍රියාවක් පිළිබඳව නීත්‍යානුකූල කරුණු වාර්තා කිරීමට සේවකයින්ට අවස්ථාව සලසා දෙන ලදී. කණ්ඩායම් සාමාජිකයින්ට ඔවුන්ගේ අනන්‍යතාවය රහසිගතව තබා ගනිමින්, සමාගම් ලේකම්වරයා හෝ ප්‍රධාන අභ්‍යන්තර විගණක හරහා විගණන කමිටු සභාපති වෙත ස්වේච්ඡාවෙන් කරුණු ඉදිරිපත් කළ හැකිය. වාර්තා වූ ගැටළු සම්මත ක්‍රියාපටිපාටි අනුගමනය කරමින් විමර්ශනය කරන ලදී. 2025 වසරේදී, විගණන කමිටුව විසින් මෙම ප්‍රතිපත්තිය සමාලෝචනය කරන ලද අතර, සැබෑ කරුණු වාර්තා කිරීම සඳහා විනිවිද පෙනෙන සහ ඵලදායී සන්නිවේදන මාර්ගයක් ලෙස එය ශක්තිමත් කිරීම සඳහා වැඩිදියුණු කිරීම් යෝජනා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාකරණය

කමිටු රැස්වීම්වල තීරණ සහ සාකච්ඡා පිළිබඳ අවබෝධයක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ලැබෙන බව සහතික කිරීම සඳහා, කමිටු රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ඉදිරිපත් කරන ලදී.

කමිටුවේ කාර්යසාධන ඇගයීම

කමිටුවේ සාමාජිකයින් විසින් වසර අවසානයේදී කමිටුවේ වාර්ෂික ස්වයං-ඇගයීම සිදු කරන ලදී. ප්‍රතිඵල කමිටුව තුළ සාකච්ඡා කරන ලද අතර, අවශ්‍ය අවස්ථාවලදී දියුණු කළ යුතු අංශ හඳුනා ගනිමින් එම දියුණු කිරීමේ සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දෙන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙනුවෙන්,



කේ. බී. විජයරත්න මහතා
සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

26 මැයි 2026
කොළඹ, ශ්‍රී ලංකාව

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

ශ්‍රී ලංකා එච්.ඩී.එෆ්.සී. බැංකුවේ (බැංකුව) අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ("කමිටුව") මූලික අරමුණ වන්නේ, බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව සහ සමස්ත උපායමාර්ග තීරණය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමයි. වීමෙන්ම, ප්‍රතිපත්ති සහ එම උපායමාර්ග කළමනාකාරිත්වයට පැහැදිලිව සන්නිවේදනය කිරීම තුළින්, බැංකුවේ වත්කම් සහ අවශ්‍යතා සුරක්ෂිත කිරීම සඳහා අවදානම් හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට සහ කළමනාකරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල සහ කළමනාකාරිත්ව මට්ටමේ ක්‍රියා පටිපාටි පවතින බව සහතික කිරීම මෙහි අරමුණයි.

සංයුතිය සහ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, කමිටුවේ සභාපතිවරයා ඇතුළුව විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සහ විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. 2025 දෙසැම්බර් 31 වන දින වන විට කමිටුව පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය.

නම	අධ්‍යක්ෂක තත්ත්වය	සාමාජිකත්ව තත්ත්වය
ජේ.එම්.පී.එස්. කෞශල්‍ය මහතා (26.06.2025 දින පත් විය)	විධායක නොවන, ස්වාධීන	සභාපති
ආචාර්ය පී.ඒ. ක්‍රිශාන්ත (24.08.2022 දින පත් විය)	විධායක නොවන, ස්වාධීන	අධ්‍යක්ෂ
කේ.බී. විජයරත්න මහතා (25.09.2024 දින පත් විය)	විධායක නොවන, ස්වාධීන	අධ්‍යක්ෂ
කේ.කේ.ඒ. ප්‍රේමතිලක මහත්මිය (11.08.2025 දින පත් විය)	විධායක නොවන, ස්වාධීන නොවන	අධ්‍යක්ෂ
ජේ.කේ.ඒ. සිරිනාථ මහතා (26.11.2025 දින පත් විය)	විධායක නොවන, ස්වාධීන නොවන	අධ්‍යක්ෂ

කමිටුවේ ලේකම්

බැංකු මණ්ඩල ලේකම්වරයා ("සමාගම් ලේකම්" ලෙසද හැඳින්වේ).

කමිටුවේ යොමු නියමයන්

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ රාජකාරි සහ වගකීම් එහි යොමු නියමයන් තුළ නිර්වචනය කර ඇත. මෙම යොමු නියමයන් සකස් කර ඇත්තේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2024 සැප්තැම්බර් 30 වන දින නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනතේ විධානයෙහි සහ කොළඹ කොටස් වෙළඳපොළේ ආයතනික පාලනය පිළිබඳ ලැයිස්තුගත කිරීමේ නීතිවල අදාළ 09 වන වගන්තියෙහි දක්වා ඇති නීති පදනම් කරගෙන ය.

මෙම යොමු නියමයන් කමිටුව විසින් වරින් වර සෑම වසර දෙකකට වරක් සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය.

කාරක සභාවේ රැස්වීම්

අදාළ වර්ෂය තුළ කාරක සභාව හත් වතාවක් (07) රැස් විය. පහත සඳහන් අධ්‍යක්ෂවරුන් කාරක සභාවේ සේවය කරයි/සේවය කර ඇත අතර, රැස්වීම් සඳහා පැමිණීම පහත වගුවේ දක්වා ඇත.

කමිටු සාමාජිකයාගේ නම	සහභාගී වීමට සුදුසු	සහභාගී වූ
ජේ.එම්.පී.එස්. කෞශල්‍ය මහතා (26.06.2025 දින පත් විය)	03	03
ආචාර්ය පී.ඒ. ක්‍රිශාන්ත (24.08.2022 දින පත් විය)	06	05
කේ.බී. විජයරත්න මහතා (25.09.2024 දින පත් විය)	07	07
කේ.කේ.ඒ. ප්‍රේමතිලක මහත්මිය (11.08.2025 දින පත් විය)	02	02
ජේ.කේ.ඒ. සිරිනාථ මහතා (26.11.2025 දින පත් විය)	01	01
පී. ජේ. ජයසිංහ මහතා (09.05.2025 පත් විය, 26.11.2025 ප්‍රතිසංවිධානය විය)	04	04
ඩබ්ලිව්.එම්. ආනන්ද මහතා (09.05.2025 පත් විය, 10.08.2025 විශ්‍රාම ගියේය)	03	03
පී.ඒ. ලයනල් මහතා (31.01.2025 දින විශ්‍රාම ගියේය)	01	01
ඩබ්ලිව්.එන්.අයි.සී. ප්‍රනාන්දු මහතා (23.06.2025 දින ඉල්ලා අස්විය)	04	03

කමිටුවේ රාජකාරි සහ වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව තම කාර්යභාරය ඉටු කරමින්, පහත සඳහන් ක්ෂේත්‍රවලට අදාළ වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වනු ඇත:

1. බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සඳහා වගකිවයුතු ස්වාධීන අවදානම් කළමනාකරණ කාර්යභාරයක් ස්ථාපිත කිරීම.
2. යාවත්කාලීන කරන ලද ව්‍යාපාර අඛණ්ඩ පැවැත්මේ සැලසුම ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියලුම අංශ කාර්තුමය රැස්වීම්වලදී ඇගයීමට ලක් කිරීම.
3. ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් සමඟ සමීපව කටයුතු කිරීම සහ කමිටුවට පවරා ඇති බලතල සහ වගකීම් රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගැනීම.
4. ණය අවදානම, වෙළඳපල අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම, තොරතුරු ආරක්ෂණ අවදානම, උපායමාර්ගික අවදානම, කීර්තිනාම අවදානම, අනුකූලතා අවදානම, භාරකාර සහ නියාමන අවදානම් ඇතුළු නමුත් ඒවාට පමණක් සීමා නොවූ බැංකුවට අදාළ සියලුම අවදානම් ක්ෂේත්‍ර, සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු භාවිතයෙන් තක්සේරු කිරීම.
5. බැංකුවේ උපායමාර්ගික ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව විසින් පිළිගන්නා හෝ මගහරින අවදානම්වල ස්වභාවය සහ මට්ටම් පැහැදිලි කරන, බැංකුවේ අවදානම් රුචිකත්ව ප්‍රකාශනය සංවර්ධනය කිරීම. මෙයට ඉපැයීම්, ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව වැනි දේට අදාළ ප්‍රමාණාත්මක මිනුම් මෙන්ම, කීර්තිනාම අවදානම, අනුකූලතා අවදානම, මුදල් විශුද්ධිකරණය සහ අනීතික පිළිවෙත් ආමන්ත්‍රණය කරන ගුණාත්මක මිනුම් ද ඇතුළත් වේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

6. බැංකුවේ අවදානම් රුචිකත්වයට එරෙහිව බැංකුවේ පවතින අවදානම් නිරාවරණයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දීම සහ වාර්තා කිරීම.
7. අවදානම් රුචිකත්ව ප්‍රකාශනය ඇතුළු බැංකුවේ අවදානම් ප්‍රතිපත්ති වාර්ෂිකව සමාලෝචනය කිරීම.
8. බලයලත් නොවන පුද්ගලයින් වෙත ද්‍රව්‍යමය තොරතුරු කාන්දු වීම වැළැක්වීම සඳහා පවතින අභ්‍යන්තර පාලනයන් සමාලෝචනය කිරීම.
9. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ගේ අවශ්‍යතා සපුරාලීමට බැංකුවේ අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය ප්‍රමාණවත් බව සහතික කිරීමේ ක්‍රියාවලීන් අධීක්ෂණය කිරීම.
10. බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, සැලකිය යුතු අවදානම් සහිත ක්ෂේත්‍රවල සමස්ත පරිසරය සහ පාලනයන්හි ප්‍රමාණවත් බව මෙන්ම යාවත්කාලීන කරන ලද ව්‍යාපාර අඛණ්ඩ පැවැත්මේ සැලසුම සමාලෝචනය සහ ඇගයීම.
11. ප්‍රධාන අවදානම් නිලධාරියාගේ කාර්යභාරය අධීක්ෂණය කිරීම. බැංකුවේ අවදානම් පැතිකඩ, ස්ථාපිත අවදානම් රුචිකත්ව සීමාවන් සහ එම සීමාවන් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් සහ අනෙකුත් අදාළ අංශවලින් නිතිපතා වාර්තා සහ සන්නිවේදනයන් ලබා ගැනීම.
12. බැංකුවේ අදාළ අවදානම් ස්වාධීනව හඳුනා ගැනීම සහ ඒ පිළිබඳව කමිටුව දැනුවත් කිරීම බැංකුවේ කළමනාකාරිත්වයේ වගකීමකි. කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා ඇති අධිකාරිය සහ වගකීම් රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගනු ලැබේ.
13. වත්කම් සහ බැරකම් කළමනාකරණ කමිටුව, ණය කමිටුව, තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටු වැනි සියලුම කළමනාකාරිත්ව මට්ටමේ කමිටුවල ප්‍රමාණවත් බව සහ කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීම.
14. ව්‍යාපාර අඛණ්ඩ පැවැත්මේ සැලසුම් සහ ආපදා ප්‍රතිසාධන සැලසුම් ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියලුම අංශ අවම වශයෙන් වසරකට වරක් තක්සේරු කිරීම. ඒවා ක්‍රියාත්මක කිරීම අවම වශයෙන් කාර්තුමය වශයෙන් තක්සේරු කළ යුතුය.
15. කම්පු රැස්වීමේදී සාකච්ඡා කරන ලද කරුණු පිළිබඳව පසුකාලීන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී දැනුවත් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, චිකඟතාවය සහ නිශ්චිත උපදෙස් ලබා ගැනීම. රැස්වීම්වල මිනිත්තු සටහන් කමිටු රැස්වීමෙන් පසුව චින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.
16. තම යොමු නියමයන් තුළ පවතින ඕනෑම කරුණක් හෝ ක්‍රියාකාරකමක් සමාලෝචනය කිරීමට සහ/හෝ විමර්ශනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවට බලය පවරා ඇත. ඕනෑම විමර්ශනයක් පැවැත්වීමට හෝ අවශ්‍ය වුවහොත් උපදෙස් හෝ විශේෂඥ දැනුම ලබා ගැනීමට බාහිර නීති උපදේශකයින් හෝ වෙනත් ස්වාධීන වෘත්තිකයන් රඳවා ගැනීමට කමිටුවට බලය ඇත.
17. ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් විසින් ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා කළමනාකරණය සඳහා ක්‍රියාත්මක කරන උපායමාර්ග අධීක්ෂණය කිරීම. බැංකුවේ අවදානම් රුචිකත්වයට අනුකූල බව සහතික කිරීම සඳහා ණය, වෙළඳපල, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂණ සහ උපායමාර්ගික අවදානම් වැනි බැංකුවේ සියලුම අදාළ අවදානම් කළමනාකරණය කිරීම අධීක්ෂණය කිරීම. ණය කමිටුව සහ වත්කම්-බැරකම් කමිටුව වැනි අවදානම් ගන්නා ක්‍රියාකාරකම්වලට සම්බන්ධ සියලුම කළමනාකාරිත්ව මට්ටමේ කමිටුවල කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීම සහ කමිටුව විසින් නියම කර ඇති ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එම අවදානම් කළමනාකරණය කිරීම.
18. බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන හා අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරනු ලබන සාධාරණ මට්ටම්වලින් ඔබ්බට අවදානම් පවතින අවස්ථාවන්හිදී, එම නිශ්චිත අවදානම්වල බලපෑම අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ පියවර ගැනීම.
19. කම්පුවේ විෂය පථයට අයත් වන කරුණු සම්බන්ධයෙන් අභියෝග කිරීම, විමර්ශනය කිරීම සහ ඉන්පසු තීන්දු තීරණ ගැනීම.
20. කම්පුව විසින් නිර්දේශ කර ඇති පරිදි නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වන වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව කඩිනම් නිවැරදි කිරීමේ පියවර ගැනීම.
21. අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, චිකඟතාවය සහ/හෝ නිශ්චිත උපදෙස් ලබා ගැනීම සඳහා අවශ්‍ය කාලසීමාවන් තුළ අවදානම් තක්සේරු වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.
22. ව්‍යාපාරික මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍රවලදී නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ සහ අනුමත ප්‍රතිපත්තිවලට බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා ස්වාධීන අනුකූලතා කාර්යභාරයක් ස්ථාපිත කිරීම. ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්ගෙන් තෝරාගත් කැපවූ අනුකූලතා නිලධාරියෙකු විසින් මෙම කාර්යය ඉටු කළ යුතු අතර කම්පුව වෙත වරින් වර වාර්තා කළ යුතුය.
23. සියලුම අවදානම් (මතු වෙමින් පවතින අවදානම් ද ඇතුළුව) ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවට අවශ්‍ය ඕනෑම ගැලපීමක් සහතික කිරීම සඳහා, තොරතුරු හුවමාරුව පහසු කරවන පරිදි විගණන කම්පුව සමඟ ඵලදායී සන්නිවේදන සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
24. මානව සම්පත් සහ වේතන කම්පුවේ කාර්යයන්ට හානියක් නොවන පරිදි, සේවකයින්ට ලබා දෙන දිරිගැන්වීම් බැංකුවේ අවදානම්, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ ඉපැයීම් මට්ටම් සැලකිල්ලට ගෙන තිබේද යන්න විමර්ශනය කිරීම.
25. ප්‍රධාන අවදානම් නිලධාරියෙකු හෝ අවදානම් කළමනාකරණ ප්‍රධානියෙකු ප්‍රධාන වගකිවයුතු පුද්ගලයෙකු ලෙස පත් කළ යුතු අතර, ඔහු අවදානම් කාර්යයන් ඉටු කරමින් කම්පුව වෙත වරින් වර වාර්තා කළ යුතුය.
26. ප්‍රධාන වගකිවයුතු පුද්ගලයෙකු ලෙස නම් කරන ලද කැපවූ අනුකූලතා නිලධාරියෙකු අනුකූලතා කාර්යයන් ඉටු කළ යුතු අතර කම්පුව වෙත වරින් වර වාර්තා කළ යුතුය.
27. ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියෙකු ප්‍රධාන වගකිවයුතු පුද්ගලයෙකු ලෙස පත් කළ යුතු අතර, බැංකුවේ තොරතුරු තාක්ෂණ සහ තොරතුරු ආරක්ෂණ සුරක්ෂිතතාව සම්බන්ධයෙන් කම්පුවට වගකිව යුතු අතර කම්පුව වෙත වරින් වර වාර්තා කළ යුතුය.
28. අනුකූලතා නිලධාරියාගේ, ප්‍රධාන අවදානම් නිලධාරියාගේ සහ ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියාගේ කාර්යසාධනය වාර්ෂිකව ඇගයීමට ලක් කිරීම.
29. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන බව කම්පුව සහතික කළ යුතුය.
30. ඉදිරියේදී පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් සහ නිශ්චිත උපදෙස් ලබා ගැනීම සඳහා අවදානම් තක්සේරු වාර්තාවක් කම්පුව විසින් ඉදිරිපත් කළ යුතුය.
31. බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවට යැවීම සඳහා සමාලෝචනය කර අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.

2025 වසරේ ක්‍රියාකාරකම් වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, බැංකුවේ අවදානම් පැතිකඩ පිළිබඳ ස්වාධීන අධීක්ෂණයක් අඛණ්ඩව සිදු කළ අතර, අවදානම් ගන්නා ක්‍රියාකාරකම් අනුමත අවදානම් රුචිකත්වය තුළ පවතින බවත්, බැංකුවේ උපායමාර්ගික අරමුණු සහ නියාමන අපේක්ෂාවන්ට අනුකූලව පවතින බවත් සහතික කරන ලදී.

සමාලෝචනයට ලක් වූ වසර තුළ, බාසල් මාර්ගෝපදේශ සහ අධීක්ෂණ අපේක්ෂාවන්ට අනුකූලව, අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය පුළුල් ලෙස ඇගයීම හරහා බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ සමස්ත අවදානම් දරා ගැනීමේ හැකියාව කමිටුව විසින් සමීපව අධීක්ෂණය කරන ලදී. විකාශනය වන ව්‍යාපාරික තත්වයන් සහ මතුවන නව අවදානම් ගතිකයන් පිළිබිඹු කිරීම සඳහා අවදානම් රුචිකත්ව රාමුව ද සමාලෝචනය කර පිරිපහදු කරන ලදී.

ණය අවදානම් කළමනාකරණය, භාණ්ඩාගාර සහ ආයෝජන කළමනාකරණය, පාරිභෝගික ආරක්ෂාව සහ ණය සමාලෝචන යාන්ත්‍රණයන් ඇතුළු ප්‍රධාන ප්‍රතිපත්තිමය රාමු සමාලෝචනය කර නිර්දේශ කිරීම මගින් බැංකුවේ අවදානම් පාලන ව්‍යුහය කමිටුව විසින් ශක්තිමත් කරන ලදී. මෙම මුලපිරීම්වල අරමුණ වූයේ අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කිරීම, අවදානම් විනය වැඩි කිරීම සහ බැංකුව පුරා තීරණ ගැනීමේදී අනුකූලතාව සහතික කිරීමයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ දත්ත පුවරු සහ කළමනාකාරිත්ව තොරතුරු පද්ධති හරහා අඛණ්ඩ අධීක්ෂණයක් පවත්වා ගෙන ගිය අතර, විමඟින් ණය, වෙළඳපල, මෙහෙයුම් සහ ද්‍රවශීලතා අවදානම් යන ක්ෂේත්‍ර ඔස්සේ ප්‍රධාන අවදානම් නිරාවරණයන් තක්සේරු කිරීමට කමිටුවට හැකි විය. වත්කම්වල ගුණාත්මකභාවය, කළඹ මට්ටමේ ණය අවදානම් විශ්ලේෂණය, නොගෙවන ණය ප්‍රවණතා සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලද අගය අඩු වීමේ වෙන් කිරීම්වල ප්‍රමාණවත්භාවය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලදී.

එසේම, ණය, වෙළඳපල සහ පොලී අනුපාත අවදානම් මෙන්ම ඉපැයීම් සංවේදීතාව ඇතුළු ප්‍රධාන අවදානම් කාණ්ඩ හරහා සිදු කරන ලද පීඩන පරීක්ෂණ අභ්‍යාසවල ප්‍රතිඵල කමිටුව සමාලෝචනය කළේය. මෙම තක්සේරු කිරීම් අහිතකර තත්වයන් යටතේ අනාගතයට ගැළපෙන අවදානම් කළමනාකරණයට සහ ප්‍රාග්ධන සැලසුම් කිරීමට සහාය විය.

තම නියාමන අධීක්ෂණ වගකීම් ඉටු කිරීමේදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නිරීක්ෂණ සහ උපදෙස් කමිටුව විසින් සමීපව අධීක්ෂණය කළ අතර, හඳුනාගත් අඩුපාඩු විසඳීමට සහ අනුකූලතා මට්ටම් ශක්තිමත් කිරීමට කාලෝචිත සහ සුදුසු නිවැරදි කිරීමේ පියවර ගෙන ඇති බව සහතික කළේය.

තවද, බැංකුවේ ආයෝජන කළඹ සහ භාණ්ඩාගාර මෙහෙයුම්වලට සම්බන්ධ අවදානම් කමිටුව විසින් ඇගයීමට ලක් කළ අතර, අවදානම් දත්ත පුවරු සහ සිදුවීම් අධීක්ෂණ යාන්ත්‍රණ භාවිතය ඇතුළු මෙහෙයුම් අවදානම් කළමනාකරණයේ වර්ධනයන් ද අධීක්ෂණය කරන ලදී.

තාක්ෂණය කෙරෙහි වැඩි වන යැපීම හඳුනා ගනිමින්, තාක්ෂණයට සම්බන්ධ අවදානම් කමිටුව විසින් සමාලෝචනය කරන ලද අතර, බැංකුවේ තොරතුරු තාක්ෂණ ඔරොත්තු දීමේ හැකියාව, සයිබර් ආරක්ෂණ තත්ත්වය සහ තීරණාත්මක යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී. පීඩන තත්වයන් යටතේ මෙහෙයුම් සූදානම සහතික කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩ පැවැත්ම සහ ප්‍රතිසාධන සැලසුම් ද සමාලෝචනය කරන ලදී.

සමස්ත තක්සේරුව

වගකිවයුතු අවදානම් ගැනීම ප්‍රවර්ධනය කිරීම, ශක්තිමත් වාර්තාකරණ රාමු හරහා විනිවිදභාවය වැඩි කිරීම සහ නියාමන අවශ්‍යතා සහ අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහතික කිරීම මගින් බැංකුව පුරා ශක්තිමත් අවදානම් සංස්කෘතියක් පෝෂණය කිරීමට ඊඍඈඑක කැපවී සිටී. බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය සහ දිගුකාලීන තිරසාරභාවය සඳහා සහාය වෙමින්, අවදානම් කළමනාකරණය සඳහා ක්‍රියාශීලී සහ අනාගතයට ගැළපෙන ප්‍රවේශයක් කමිටුව විසින් අඛණ්ඩව අනුගමනය කරනු ඇත.



ජේ. එම්. පී. එස්. කෞශල්‍ය
විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ සහ කමිටු සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී වගකීම් ප්‍රකාශනය - 2025

2025 දෙසැම්බර් 31 දින වන විට පවතින බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, පහත සඳහන් නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත:

I. ශ්‍රී ලංකා ප්‍රඥප්ති වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/ LKAS).

II. 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් පනත.

III. 1997 අංක 7 දරන HDFC බැංකු පනත, 2003 අංක 15 දරන සංශෝධිත පනත සහ 2011 අංක 45 දරන සංශෝධිත පනත.

IV. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද විධානයන්, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ.

V. කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ නීති.

VI. ශ්‍රී ලංකා ප්‍රඥප්ති වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ගිණුම්කරණය පිළිබඳ විකල්ප ප්‍රතිකාර ප්‍රකාශ .

VII. 2007 අංක 7 දරන සමාගම් පනත.

VIII. 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන.

IX. ශ්‍රී ලංකා ප්‍රඥප්ති වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම පිළිවෙත් පිළිබඳ සංග්‍රහය (2017).

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, ශ්‍රී ලංකා ප්‍රඥප්ති වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන අතර බැංකුව විසින් අඛණ්ඩව ඒවා අනුගමනය කර ඇත.

ඉහළ මට්ටමේ විනිශ්චයක් සහ සංකීර්ණත්වයක් අඩංගු සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඇස්තමේන්තු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ බාහිර විගණකවරුන් සමඟ සාකච්ඡා කරන ලදී. සියලුම සැලකිය යුතු අයිතමයන් මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් මඟින් හෙළිදරව් කර සහ පැහැදිලි කර ඇත.

අපගේ උපරිම දැනුම අනුව, මෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය තත්ත්වය, ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳ සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ලබා දෙන බව අපි සහතික කරමු. බැංකුවේ මෙහෙයුම් අනාගතයේදී අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් බැංකුව සතු බවත්, ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ ව්‍යාපාරික පදනම අනුගමනය කරන බවත් අපි තවදුරටත් සහතික කරමු.

මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව සහ වෛෂයිකභාවය සඳහා වන වගකීම අපි භාර ගනිමු. මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ඇස්තමේන්තු සහ විනිශ්චයන් සාධාරණ සහ සුපරීක්ෂාකාරී පදනමක් මත සිදු කර ඇත; එමඟින් මූල්‍ය ප්‍රකාශන මඟින් සත්‍ය සහ සාධාරණ දර්ශනයක්, ගනුදෙනුවල ස්වරූපය සහ සාරය සහ බැංකුවේ තත්ත්වය සාධාරණ ලෙස ඉදිරිපත් කෙරේ. මෙය සහතික කිරීම සඳහා, වත්කම් සුරක්ෂිත කිරීම සහ වංචා මෙන්ම වෙනත් අක්‍රමිකතා වැළැක්වීම සහ හඳුනා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධති ක්‍රියාත්මක කිරීමේදී බැංකුව නිසි සහ ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා ඇති අතර, ඒවා අඛණ්ඩ පදනමකින් සමාලෝචනය, ඇගයීම සහ යාවත්කාලීන කරනු ලැබේ. සමාගමේ ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අඛණ්ඩව අනුගමනය කරනු ලබන බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා බැංකුවේ අභ්‍යන්තර විගණක විසින් වරින් වර විගණන සිදු කර ඇත. කෙසේ වෙතත්, ඕනෑම අභ්‍යන්තර පාලන සහ ගිණුම්කරණ පද්ධතියක් මඟින් ලබා දෙන සහතිකය තක්සේරු කිරීමේදී හඳුනාගත යුතු සහජ සීමාවන් පවතින බව ද සඳහන් කළ යුතුය.

තවද, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම කළමනාකාරිත්වය විසින් භාර ගන්නා අතර, මෙම මූල්‍ය ප්‍රකාශන බැංකුවේ පද්ධතිවලින් උපුටා ගෙන ඇති බවත්, නියාමන අවශ්‍යතාවලට අනුකූල බවත්, ද්‍රව්‍යමය වැරදි ප්‍රකාශනයන්ගෙන් තොර බවත් අපි සහතික කරමු.


බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලදී. ඔවුන් විසින් නිකුත් කරන ලද වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 213 සිට 219 දක්වා පිටුවල දැක්වේ. විගණකාධිපතිවරයා විසින් සපයනු ලබන විගණන සහ විගණන නොවන සේවාවන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ උල්ලංඝනය නොකරන බව හෝ විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වයට හානියක් නොවන බව සහතික කිරීම සඳහා එම සේවාවන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අනුමත කර ඇත.

සියලුම ගනුදෙනු ගිණුම් පොත්වල නිවැරදිව සහ සම්පූර්ණයෙන් සටහන් කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන්හි කාර්යක්ෂමතාව ඇතුළු අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය සහ කාර්යක්ෂමතාව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. තවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ මූල්‍ය වාර්තාකරණය සහ හෙළිදරව් කිරීම්වලට අදාළ අනෙකුත් නියාමන ප්‍රතිපාදනවලට අනුකූල වීම සහතික කරන ක්‍රියාවලීන් ද ඔවුන් විසින් සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් වේ. පූර්ණ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා, බාහිර විගණකවරුන්ට සහ අභ්‍යන්තර විගණකවරුන්ට ඕනෑම වැදගත් කරුණක් සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයින් වෙත පූර්ණ සහ නිදහස් ප්‍රවේශයක් ඇත.


බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව සහ වෛෂයිකභාවය සඳහා වගකීම භාර ගනී.

අපගේ උපරිම දැනුම අනුව පහත කරුණු අපි සහතික කරමු:

- බැංකුව අදාළ සියලුම නීති, රීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කර ඇත;
- කිසිදු ද්‍රව්‍යමය අනුකූල නොවීමක් නොමැත;
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල 51 සහ 53 වන සටහන්වල හෙළිදරව් කර ඇති දේ හැර, බැංකුවට එරෙහිව කිසිදු ද්‍රව්‍යමය නඩු පැවරීමක් නොමැත.
- වාර්තාකරණ දිනය වන විට බැංකුව විසින් ගෙවිය යුතු සියලුම බදු, ගාස්තු, බදු අයකිරීම් සහ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් මෙන්ම බැංකුවේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම දායකත්වයන්, බදු සහ ගාස්තු ගෙවා ඇත, නැතහොත් අදාළ අවස්ථාවලදී ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.




අනුර හෙට්ටිආරච්චි
ප්‍රධාන මූල්‍ය නිලධාරී



හේමල් සී. ලොකුගීගාන
සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී

ඉංජිනේරුමය ස්ථායීකාවය



මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ප්‍රකාශනය

මෙම ප්‍රකාශනය මගින් මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ සහ විගණකවරුන්ගේ වගකීම් වෙන් කර හඳුනා ගනු ලබයි. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පහත සඳහන් ප්‍රකාශනයෙහි දක්වා ඇත.

2003 අංක 15 දරන පනතින් සහ 2011 අංක 45 දරන පනතින් සංශෝධිත 1997 අංක 7 දරන HDFC පනතේ විධිවිධානවලට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ පටිපාටියට අනුව බැංකුවේ නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාම සඳහා බැංකුවේ අධ්‍යක්ෂවරු වගකිව යුතුය. කොටස් හිමියන්ගෙන් සමන්විත වාර්ෂික මහා සභා රැස්වීමට වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

ඒ අනුව, බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පහත කරුණු පිළිබඳව සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ලබා දෙන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි:

- 2025 දෙසැම්බර් 31 වන දින වන විට බැංකුවේ මූල්‍ය තත්ත්වය; සහ
- 2025 මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය කාර්යසාධනය.

බැංකුවේ නිකුත් කරන ලද කොටස්වලින් බහුතරයක් ශ්‍රී ලංකා රජය සතු වන තාක් කල්, බැංකුවේ ගිණුම් පිළිබඳ විගණනය සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයා බාහිර විගණක ලෙස පත් කර ඇත.

බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණවත්භාවය සහ කාර්යක්ෂමතාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙයට නිතිපතා සමාලෝචනය කිරීම, අභ්‍යන්තර විගණනය, බැංකුවේ වත්කම් සුරක්ෂිත කිරීම සහ බැංකුවේ අවදානම් රුචිකත්වයට අයත් සීමාවන්ගෙන් සහ දර්ශකවලින් සිදුවන ඕනෑම අපගමනයක් ඉස්මතු කිරීමට නිර්මාණය කර ඇති අභ්‍යන්තර පාලන පද්ධති ඇතුළත් වේ. එවැනි සමාලෝචනවල ප්‍රතිඵල වාර්ෂික වාර්තාවේ 190 සිට 191 දක්වා පිටුවල "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රකාශනය" යටතේ දැක්වෙන අතර, 192 සිට 193 දක්වා පිටුවල "අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව" ලබා දී ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ සකස් කර ඉදිරිපත් කර ඇති 2025 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රඥප්ති වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS) සහ LKAS මත පදනම්ව සකස් කර ඇති අතර, ඒවා මූලික ගිණුම් පොත් සමඟ එකඟ වේ. එමෙන්ම ඒවා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, 2007 අංක 07 දරන සමාගම් පනත, 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ නීති සහ ශ්‍රී ලංකා ප්‍රඥප්ති වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම පිළිවෙත් පිළිබඳ සංග්‍රහය යන අවශ්‍යතාවලට අනුකූල වේ.

මීට අමතරව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති නියමිත ආකෘතියට මෙම මූල්‍ය ප්‍රකාශන අනුකූල වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 7 දරන සමාගම් පනතේ 150(1) සහ 151 වගන්තිවල දක්වා ඇති පරිදි ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී විසින් සහතික කර ඇත.

තවද, 2025 වර්ෂයේදී අදාළ වන පරිදි, කොළඹ කොටස් වෙළඳපොලේ නවතම ලැයිස්තුගත කිරීමේ නීතිවල 9 වන වගන්තියේ "ආයතනික පාලනය" යටතේ ඇති අවශ්‍යතා සපුරාලීමට බැංකුව කටයුතු කර ඇති බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා කරයි.

බැංකුව විසින් ප්‍රවේශම් සහගත අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන්ට අනුකූලව කටයුතු කර ඇති බවත්, ද්‍රව්‍යමය අනුකූල නොවීම් කිසිවක් නොමැති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය තවදුරටත් සහතික කරයි.

මෙම ප්‍රකාශනයෙහි දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂවරුන් තමන් වෙත පැවරී ඇති උපරිම වගකීම් ඉටු කර ඇති බව ඔවුන් විශ්වාස කරයි.



අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,
වැඩබලන සමාගම් ලේකම්

26 මැයි 2026
කොළඹ.

HDFC බැංකුවේ 2025 ඒකාබද්ධ වාර්ෂික වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ස්වාධීන සහතික කිරීමේ වාර්තාව

EY
Shape the future with confidence

Ernst & Young
Chartered Accountants
Rotunda Towers
No. 109, Galle Road
P.O. Box 101
Colombo 03, Sri Lanka

Tel: +94 11 246 3500
Fax: +94 11 768 7869
Email: eysl@lk.ey.com
ey.com

2025 මූල්‍ය වර්ෂය සඳහා වූ ඒකාබද්ධ වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති තිරසාර වාර්තාකරණ නිර්ණායක පිළිබඳව ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ (HDFC බැංකුව) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ස්වාධීන වෘත්තිකයන්ගේ සහතික කිරීමේ වාර්තාව.

විෂය පථය

ශ්‍රී ලංකා සහතික කිරීමේ කාර්යයන් පිළිබඳ ප්‍රමිතියෙන් අර්ථ දක්වා ඇති පරිදි, 'සීමිත සහතික කිරීමේ කාර්යයක්' සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් අපව යොදවා ඇත. ඒ අනුව, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ("ආයතනය") ඒකාබද්ධ වාර්ෂික වාර්තාවේ ("වාර්තාව") අඩංගු, විහි උපායමාර්ගය, පාලනය, කාර්යසාධනය සහ අපේක්ෂාවන් පිළිබඳ තොරතුරු, බාහිර පරිසරයේ සන්දර්භය තුළ කෙටි, මධ්‍යම සහ දිගු කාලීනව අගය නිර්මාණය කිරීම, සංරක්ෂණය කිරීම හෝ ක්ෂය වීම සිදු කරන්නේ කෙසේද යන්න පිළිබඳව ("විෂය කරුණු") වාර්තා කිරීමට අපි කටයුතු කරමු.

අපගේ කාර්යයේ විෂය පථය දක්වා ඇති ඉහත ඡේදයේ විස්තර කර ඇති කරුණු හැර, වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු පිළිබඳව අපි සහතික කිරීමේ පටිපාටි සිදු කර නොමැති අතර, ඒ අනුව එම තොරතුරු පිළිබඳව අපි කිසිදු නිගමනයක් ප්‍රකාශ නොකරමු.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් අනුගමනය කරන ලද නිර්ණායක

මෙම විෂය කරුණු සකස් කිරීමේදී, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය (IIRC) විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ වාර්තාකරණ රාමුව ("නිර්ණායක") අනුගමනය කර ඇත.

මෙම නිර්ණායක විශේෂයෙන්ම නිර්මාණය කර ඇත්තේ, ඒකාබද්ධ වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති ප්‍රාග්ධන කළමනාකරණය, පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධවීම, ව්‍යාපාරික ආකෘතිය, උපායමාර්ගය, ආයතනික දළ විශ්ලේෂණය සහ බාහිර පරිසර දැක්ම අදාළ නිර්ණායකවලට අනුව ඉදිරිපත් කර ඇත්ද යන්න තීරණය කිරීමට සහාය වීම සඳහා ය. විහි ප්‍රතිඵලයක් ලෙස, මෙම විෂය කරුණු සම්බන්ධ තොරතුරු වෙනත් අරමුණක් සඳහා සුදුසු නොවීමට ඉඩ ඇත.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ වගකීම්

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ කළමනාකාරිත්වය, නිර්ණායක තෝරා ගැනීම සඳහා සහ එම නිර්ණායකවලට අනුකූලව, සියලුම ද්‍රව්‍යමය අංශවලින් විෂය කරුණු ඉදිරිපත් කිරීම සඳහා වගකිව යුතුය. මෙම වගකීමට අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම, ප්‍රමාණවත් වාර්තා පවත්වා ගැනීම සහ විෂය කරුණු සකස් කිරීම සඳහා අදාළ වන ඇස්තමේන්තු සකස් කිරීම ඇතුළත් වේ. එමගින්, වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් සිදු විය හැකි ද්‍රව්‍යමය වැරදි ප්‍රකාශනයන්ගෙන් විෂය කරුණු නිදහස් බව සහතික කෙරේ.

අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනයේ වගකීම්

අප විසින් ලබාගෙන ඇති සාක්ෂි මත පදනම්ව, විෂය කරුණුහි ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් නිගමනයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වේ.

අපි අපගේ කාර්යය සිදු කළේ, වෙතිහාසික මූල්‍ය තොරතුරු පිළිබඳ විගණන හෝ සමාලෝචන හැර අනෙකුත් සහතික කිරීමේ කාර්යයන් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිතියට (SLSAE 3000 (සංශෝධිත)) සහ 2026 අප්‍රේල් 7 වන දින ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව සමඟ එකඟ වූ පරිදි මෙම කාර්යය සඳහා වන යොමු නියමයන්ට අනුකූලවය. මෙම ප්‍රමිතීන්ට අනුව, විෂය කරුණු නිර්ණායකවලට අනුකූල වීම සඳහා විහි සිදු කළ යුතු කිසියම් ද්‍රව්‍යමය වෙනස් කිරීම් පිළිබඳව අප දැනුවත් දැයි නිගමනයකට එළඹීමට සහ වාර්තාවක් නිකුත් කිරීමට අපගේ කාර්යය සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. අප විසින් තෝරා ගන්නා පටිපාටිවල ස්වභාවය, කාලය සහ ප්‍රමාණය රඳා පවතින්නේ අපගේ විනිශ්චය මත වන අතර, වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් ඇතිවිය හැකි ද්‍රව්‍යමය වැරදි ප්‍රකාශනයන්හි අවදානම් තක්සේරුවක් ද ඊට ඇතුළත් වේ.

අපගේ සීමිත සහතික කිරීමේ නිගමන සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු සාක්ෂි අප විසින් ලබාගෙන ඇති බව අපි විශ්වාස කරමු.

Partners: D K Hulangamuwa FCA FCMA LLB (London), Ms. Y A De Silva FCA, Ms. G G S Manatunga FCA, W K B S P Fernando FCA FCMA FCCA, B E Wijesuriya FCA FCMA, R N de Saram ACA FCMA, N M Sulaiman FCA FCMA, Ms. L K H L Fonseka FCA, Ms. P V K N Sajeewani FCA, A A J R Perera FCA ACMA, N Y R L Fernando ACA, D N Gamage ACA ACMA, C A Yalagala ACA ACMA, Ms. P S Paranavitane ACA ACMA LLB (Colombo), B Vasanthan ACA ACMA, W D P L Perera ACA, M U M Mansoor ACA

Principals: T P M Ruberu FCMA FCCA MBA, G B Goudian ACMA, D L B Karunathilaka ACMA, W S J De Silva Bsc (Hons) - MIS Msc - IT, V Shakthivel B.Com (Sp)

A member firm of Ernst & Young Global Limited

HDFC බැංකුවේ 2025 වීකාබද්ධ වාර්ෂික වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ස්වාධීන සහතික කිරීමේ වාර්තාව

අපගේ ස්වාධීනත්වය සහ තත්ත්ව කළමනාකරණය

අපගේ ස්වාධීනත්වය අපි අඛණ්ඩව පවත්වා ගෙන ඇති අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද වෘත්තීය ගණකාධිකාරිවරුන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහයේ අවශ්‍යතා අප සපුරා ඇති බවත්, මෙම සහතික කිරීමේ කාර්යය ඉටු කිරීමට අවශ්‍ය නිපුණතා සහ අත්දැකීම් අප සතු බවත් තහවුරු කරමු.

ආර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනය, මූල්‍ය ප්‍රකාශන හෝ වෙනත් සහතික කිරීමේ හෝ ආශ්‍රිත සේවා කාර්යයන් සඳහා විගණන හෝ සමාලෝචන සිදු කරන ආයතන සඳහා වන 'තත්ත්ව කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතිය 1 ද අනුගමනය කරයි. එමගින් අපට ආචාරධර්මීය අවශ්‍යතා, වෘත්තීය ප්‍රමිතීන් සහ අදාළ නීතිමය සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම පිළිබඳ ප්‍රතිපත්ති හෝ ක්‍රියා පටිපාටි ඇතුළත් තත්ත්ව කළමනාකරණ පද්ධතියක් සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ පවත්වාගෙන යාමට අවශ්‍ය වේ.

සිදු කරන ලද ක්‍රියා පටිපාටි පිළිබඳ විස්තරය

සීමිත සහතික කිරීමේ කාර්යයකදී සිදු කරන ක්‍රියා පටිපාටි, සාධාරණ සහතික කිරීමේ කාර්යයකට සාපේක්ෂව ස්වභාවයෙන් සහ කාලසීමාවෙන් වෙනස් වන අතර වීවායේ ප්‍රමාණය ද අඩු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, සීමිත සහතික කිරීමේ කාර්යයකදී ලැබෙන සහතික කිරීමේ මට්ටම, සාධාරණ සහතික කිරීමේ කාර්යයක් සිදු කළේ නම් ලැබෙන සහතිකයට වඩා සැලකිය යුතු ලෙස අඩුය. අපගේ ක්‍රියා පටිපාටි සැලසුම් කර ඇත්තේ අපගේ නිගමනය සඳහා පදනම් කර ගත හැකි සීමිත සහතික කිරීමේ මට්ටමක් ලබා ගැනීමට වන අතර, සාධාරණ සහතික කිරීමේ මට්ටමක් ලබා දීමට අවශ්‍ය සියලු සාක්ෂි වීවා මගින් සැපයෙන්නේ නැත.

අපගේ ක්‍රියා පටිපාටිවල ස්වභාවය සහ ප්‍රමාණය තීරණය කිරීමේදී කළමනාකාරිත්වයේ අභ්‍යන්තර පාලනයන්හි කාර්යක්ෂමතාව අප සැලකිල්ලට ගත්තද, අපගේ සහතික කිරීමේ කාර්යය අභ්‍යන්තර පාලනයන් පිළිබඳ සහතිකයක් ලබා දීම සඳහා සැලසුම් කර නොමැත. අපගේ ක්‍රියා පටිපාටිවලට පාලනයන් පරීක්ෂා කිරීම හෝ තොරතුරු තාක්ෂණ පද්ධති තුළ දත්ත එකතු කිරීම හෝ ගණනය කිරීම් පරීක්ෂා කිරීම සම්බන්ධ ක්‍රියා පටිපාටි ඇතුළත් නොවීය.

සීමිත සහතික කිරීමේ කාර්යයකට මූලික වශයෙන් විෂය කරුණ සහ ආශ්‍රිත තොරතුරු සකස් කිරීම සඳහා වගකිවයුතු පුද්ගලයින්ගෙන් විමසීම් කිරීම සහ විශ්ලේෂණාත්මක හා අනෙකුත් සුදුසු ක්‍රියා පටිපාටි යෙදීම ඇතුළත් වේ.

අපගේ ක්‍රියා පටිපාටිවලට පහත දෑ ඇතුළත් විය:

- වීකාබද්ධ වාර්තාකරණ රාමුව තුළ දක්වා ඇති මඟ පෙන්වීමේ මූලධර්ම සහ අන්තර්ගත මූලද්‍රව්‍යවලට විරෙහිව වීකාබද්ධ වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය සැසඳීමක් සිදු කරන ලදී.
- වීකාබද්ධ වාර්ෂික වාර්තාවේ ඇතුළත් 'මූල්‍ය ප්‍රාග්ධන' මූලද්‍රව්‍යයට අදාළ තොරතුරු විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් නිසි ලෙස උපුටා ගෙන ඇත්දැයි පරීක්ෂා කරන ලදී.
- තෝරාගත් ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් සහ අදාළ කාර්ය මණ්ඩලය සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලද අතර වීකාබද්ධ වාර්තාවට අදාළ අභ්‍යන්තර පාලනයන්, පාලන ව්‍යුහය සහ වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.
- පාර්ශ්වකරුවන්ට වඩාත්ම වැදගත් දේ තීරණය කිරීම, ආයතනය වටිනාකමක් නිර්මාණය කරන්නේ කෙසේද, බාහිර පරිසරය, උපායමාර්ගය, සාමාජිකයින්ට මුල් තැන දීම, පාලනය සහ වාර්තාකරණය වැනි දේට අදාළව සංවර්ධනය කරන ලද අදාළ අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.
- ආයතනයේ උපායමාර්ගය සහ ආයතනය වටිනාකමක් නිර්මාණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ විස්තරය සහ පාර්ශ්වකරුවන්ට වඩාත්ම වැදගත් දේ පිළිබඳ අවබෝධයක් ලබා ගත් අතර, වීකාබද්ධ වාර්තාවේ ඇති විස්තරය ඔවුන්ගේ අවබෝධය නිවැරදිව පිළිබිඹු කරන්නේද යන්න පිළිබඳව කළමනාකාරිත්වයෙන් විමසන ලදී.
- වීකාබද්ධ වාර්තාවේ අන්තර්ගතය සමඟ අනුකූලතාව සහතික කිරීම සඳහා මූල්‍ය වර්ෂය තුළ පැවති අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය සටහන් පරීක්ෂා කරන ලදී.
- හඳුනාගත් ද්‍රව්‍යමය අංශවලට විරෙහිව වීකාබද්ධ වාර්තාව තුළ ඇති ගුණාත්මක සහ ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම්වලට අදාළ සාක්ෂි පරීක්ෂා කරන ලදී.
- සහතික කිරීමේ කාර්යය අතරතුර අප ලබා ගත් සමස්ත දැනුම සමඟ අනුකූලතාව සඳහා සම්පූර්ණ වීකාබද්ධ වාර්තාව කියවන ලදී.

පවතින තත්වයන් යටතේ අවශ්‍ය යැයි අප සැලකූ අනෙකුත් ක්‍රියා පටිපාටි ද අපි සිදු කළෙමු.

කරුණු අවධාරණය කිරීම

ආර්ථික, පාරිසරික, සමාජීය සහ බුද්ධිමය ප්‍රාග්ධන කළමනාකරණ දත්ත/තොරතුරු වීවායේ ස්වභාවය සහ එම දත්ත තීරණය කිරීමට, ගණනය කිරීමට සහ ඇස්තමේන්තු කිරීමට භාවිතා කරන ක්‍රම නිසා සහජ සීමාවන්ට යටත් වේ. මෙවැනි සහජ සීමාවන් ශ්‍රී ලංකාවේ පොදු වේ.

ආයතනයේ වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති අනාගත තොරතුරු සම්බන්ධ උපකල්පන සහ වීවා සාක්ෂාත් කර ගැනීමේ හැකියාව පිළිබඳව ද අපි කිසිදු සහතිකයක් ලබා නොදෙමු.

නිගමනය

අපගේ ක්‍රියා පටිපාටි සහ ලබා ගත් සාක්ෂි මත පදනම්ව, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ වීකාබද්ධ වාර්ෂික වාර්තාවේ අඩංගු තොරතුරු, අදාළ නිර්ණායකවලට අනුකූල වීමට නම් වීවායේ සිදු කළ යුතු කිසිදු ද්‍රව්‍යමය වෙනස් කිරීමක් පිළිබඳව අප දැනුවත් නැත.

Ernst + Young

15 මැයි 2026
කොළඹ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAN/C/HDFC/FA/2025/01

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date දිනය: 2026 මාර්තු 10

සභාපති,

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2025 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව.

□□ මූල්‍ය ප්‍රකාශන

□□□ මතය

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මෙන්ම මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් (වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු ඇතුළත්ව) සමන්විත නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු පරිදි, මගේ මඟ පෙන්වීම යටතේ සිදු කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු මගේ වාර්තාව නියමිත වේලාවට ඉදිරිපත් කරනු ලැබේ.

මගේ මතය අනුව, අමුණා ඇති බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මඟින් 2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වේ.

□□□ මතය සඳහා පදනම

මම මගේ විගණනය සිදු කළේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලවය. එම ප්‍රමිතීන් යටතේ මගේ වගකීම් පිළිබඳ වැඩිදුර විස්තර මෙම වාර්තාවේ "මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපතිගේ වගකීම්" යන කොටසේ දක්වා ඇත. මගේ මතය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි මා විසින් ලබාගෙන ඇති බව මම විශ්වාස කරමි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය

□□□ ප්‍රධාන විගණන කරුණු

ප්‍රධාන විගණන කරුණු යනු මගේ වෘත්තීය විනිශ්චයට අනුව, වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී වඩාත්ම වැදගත් වූ කරුණු වේ. මෙම කරුණු සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ සන්දර්භය තුළ සහ මගේ විගණන මතය ගොඩනැගීමේදී ආමන්ත්‍රණය කරන ලද අතර, මෙම කරුණු සම්බන්ධයෙන් මම වෙනම මතයක් ලබා නොදෙමි. පහත දැක්වෙන සෑම කරුණක් සඳහාම, මගේ විගණනය එම කරුණ ආමන්ත්‍රණය කළ ආකාරය පිළිබඳ විස්තරයක් මෙහි දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපතිගේ වගකීම් කොටසේ විස්තර කර ඇති වගකීම් මම ඉටු කර ඇත. ඒ අනුව, මගේ විගණනයට මූල්‍ය ප්‍රකාශනවල වැදගත් වැරදි ප්‍රකාශයන් සිදුවීමේ අවදානම පිළිබඳ මගේ තක්සේරුවට ප්‍රතිචාර දැක්වීම සඳහා නිර්මාණය කරන ලද ක්‍රියා පටිපාටි ඇතුළත් විය. පහත සඳහන් කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියා පටිපාටි ඇතුළුව, මගේ විගණන ක්‍රියා පටිපාටිවල ප්‍රතිඵල, අමුණා ඇති මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණන මතය සඳහා පදනම සපයයි.

ප්‍රධාන විගණන කරුණ	**මගේ විගණනය ප්‍රධාන විගණන කරුණ ආමන්ත්‍රණය කළ ආකාරය**
අමෝර්ටීකරණය කළ පිරිවැයෙන් මනිනු ලබන ණය සහ අත්තිකාරම් සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා වන දීමනා අමෝර්ටීකරණය කළ පිරිවැයෙන් මනිනු ලබන ණය සහ අත්තිකාරම් සඳහා වන අපේක්ෂිත ණය අලාභ දීමනා (සටහන් 21 හි හෙළිදරව් කර ඇති පරිදි) කළමනාකාරිත්වය විසින් තීරණය කරනු ලබන්නේ මූල්‍ය ප්‍රකාශන සඳහා වන 3.B.i සටහනේ විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මත පදනම්වය. මෙය ප්‍රධාන විගණන කරුණක් වූයේ: • ණය සහ අත්තිකාරම්වල අනාගත අය කර ගත හැකි බව තක්සේරු කිරීමේදී අදාළ වන සැලකිය යුතු කළමනාකාරිත්ව විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තුගත අවිනිශ්චිතතාවයන් නිසා; සහ • අපේක්ෂිත ණය අලාභ දීමනාව ලෙස වාර්තා කර ඇති මුදලේ ද්‍රව්‍යමය වැදගත්කම නිසාය.	අමෝර්ටීකරණය කළ පිරිවැයෙන් මනිනු ලබන ණය සහ අත්තිකාරම් සඳහා වන අපේක්ෂිත ණය අලාභ දීමනා ආමන්ත්‍රණය කිරීමේදී, මගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන පියවර ඇතුළත් විය: අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම්වලදී බැංකුවේ දීමනා, මගේ වාර්තාව නිකුත් කරන දිනය වන විට පවතින හොඳම තොරතුරු මත පදනම් වූ අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් සමඟ එකඟ වන්නේ දැයි තක්සේරු කරන ලදී. • අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තු කිරීමේදී පාලනයන්හි සැලසුම, ක්‍රියාත්මක කිරීම සහ ඒවායේ සඵලතාවය ඇගයීමට ලක් කරන ලදී. • අපේක්ෂිත ණය අලාභ, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සඳහා මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් සිදු කරනු ලබන අධීක්ෂණය, සමාලෝචනය සහ අනුමැතියේ මට්ටම තක්සේරු කරන ලදී. • අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම්වලදී භාවිතා කරන දත්තවල සම්පූර්ණත්වය, නිරවද්‍යතාවය සහ සාධාරණත්වය, අදාළ මූලික ලේඛන සහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ ගැළපීමෙන් පරීක්ෂා කරන ලදී. • ණය ගුණාත්මක තක්සේරු කිරීම්වලදී සහ අදාළ අදියර වර්ගීකරණයන්හිදී භාවිතා කරන ලද ගුණාත්මක සහ ප්‍රමාණාත්මක සාධකවල සාධාරණත්වය ඇගයීමට ලක් කරන ලදී.

ප්‍රධාන විගණන කරුණ	මගේ විගණනය ප්‍රධාන විගණන කරුණ ආමන්ත්‍රණය කළ ආකාරය
අපේක්ෂිත ණය අලාභ සඳහා අගය හීනවීම තක්සේරු කිරීමේදී කළමනාකාරිත්වය විසින් භාවිතා කරන ලද සැලකිය යුතු විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු සඳහා වන ප්‍රධාන ක්ෂේත්‍රවලට, ණය අවදානමෙහි සැලකිය යුතු වැඩිවීමක් සිදුවී ඇත්ද යන්න තීරණය කිරීම, පුළුල් පරාසයක පවතින අනාගතය දෙස බලන සාර්ව ආර්ථික ආදාන භාවිතා කිරීම සහ ඒවාට අදාළ බර තැබීම් ඇතුළත් වේ. මේවා ඇස්තමේන්තුගත අවිනිශ්චිතතාවය සහ ආත්මීයත්වය ඉහළ මට්ටමක පවතින ක්ෂේත්‍ර වේ.	• ඉහත සඳහන් දේට අමතරව, පහත සඳහන් ක්‍රියා පටිපාටි සිදු කරන ලදී: • තනි පදනමක් මත අගය හීනවීම සඳහා තක්සේරු කරන ලද ණය සහ අත්තිකාරම් සඳහා: • සිදු කර ඇති අපේක්ෂිත ණය අලාභ දීමනාවලදී භාවිතා කරන ලද ප්‍රධාන ආදානවල සාධාරණත්වය ඇගයීමට ලක් කරන ලදී. එවැනි ඇගයීම් සිදු කරන ලද්දේ, විශේෂයෙන්ම ඉහළ අවදානම් සහිත කර්මාන්ත සහ ඇපකර අය කර ගැනීමේ තත්ත්වය සැලකිල්ලට ගනිමින්, මුදල් ප්‍රවාහ අනාවැකිවල වටිනාකම සහ කාලසීමාව සලකා බලමිනි. • යටින් පවතින තනි පුද්ගල අගය හීනවීම පිළිබඳ ගණනය කිරීම්වල අංක ගණිතමය නිරවද්‍යතාවය පරීක්ෂා කරන ලදී. • සාමූහික පදනමක් මත අගය හීනවීම සඳහා තක්සේරු කරන ලද ණය සහ අත්තිකාරම් සඳහා: • අපේක්ෂිත ණය අලාභ දීමනාවලදී භාවිතා කරන ලද ප්‍රධාන ආදාන සහ ගණනය කිරීම් පරීක්ෂා කරන ලදී. • "දිත්වා" සුළි කුණාටුවෙන් ඇති වූ බලපෑම සැලකිල්ලට ගැනීම ඇතුළුව, කළමනාකාරිත්වය විසින් යටින් පවතින ක්‍රමවේදය සහ කළමනාකරණ අතිරේකයන් සඳහා භාවිතා කරන ලද විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීමට ලක් කරන ලදී. • භාවිතා කරන ලද අනාගත තොරතුරු, සලකා බැලූ ආර්ථික අවස්ථා සහ එම එක් එක් අවස්ථාව සඳහා පවරා ඇති සම්භාවිතා බර තැබීම්වල සාධාරණත්වය ඇගයීම මගේ පරීක්ෂණවලට ඇතුළත් විය. • 3.B.i සහ 21 යන සටහන්වල දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව තක්සේරු කරන ලදී.

□□□ බැංකු□ □□□□ වාර්□ික වාර්තාව□ ඇතුළත් කර ඇති වෙනත් තොරතුරු

වෙනත් තොරතුරුවලට බැංකුවේ 2025 වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති තොරතුරු අයත් වන නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳ මගේ විගණන වාර්තාව එයට ඇතුළත් නොවන අතර, මෙම විගණක වාර්තාවේ දිනයෙන් පසු එය මට ලබා ගත හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කළමනාකාරිත්වය වෙනත් තොරතුරු සඳහා වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු ආකාරයක සහතික කිරීමේ මතයක් මම ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන්, ඉහත හඳුනාගත් වෙනත් තොරතුරු ලබා ගත හැකි වූ විට එය කියවීම සහ එසේ කිරීමේදී, වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී මා ලබා ගත් දැනුම සමඟ ද්‍රව්‍යමය වශයෙන් නොගැලපේද යන්න හෝ ද්‍රව්‍යමය වශයෙන් වැරදි ලෙස ප්‍රකාශ වී ඇත්දැයි සලකා බැලීම මගේ වගකීම වේ.

මම බැංකුවේ 2025 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ද්‍රව්‍යමය වැරදි ප්‍රකාශයන් ඇතැයි මම නිගමනය කරන්නේ නම්, නිවැරදි කිරීම සඳහා පාලනය භාරව සිටින අයට එම කාරණය දැනුම් දීමට මම බැඳී සිටිමි. නිවැරදි නොකළ තවදුරටත් පවතින ද්‍රව්‍යමය වැරදි ප්‍රකාශයන් තිබේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත මගේ වාර්තාවේ ඒවා ඇතුළත් කෙරෙනු ඇත.

□□□ මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකා□ත්වයේ සහ පාලනය □ාරව සිටින අයගේ වගකී□

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහාත්, වංචා හෝ දෝෂ නිසා ඇති වන ද්‍රව්‍යමය වැරදි ප්‍රකාශයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි කළමනාකාරිත්වය විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් සඳහාත් කළමනාකාරිත්වය වගකිව යුතුය.

කළමනාකාරිත්වය බැංකුව ද්‍රවකරණය කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අදහස් කරන්නේ නම් හෝ එසේ කිරීමට හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැති නම් මිස මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, බැංකුවේ අඛණ්ඩ පැවැත්ම සඳහා ඇති හැකියාව තක්සේරු කිරීමටත්, අදාළ වන විට, අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු හෙළිදරව් කිරීමටත්, අඛණ්ඩ පැවැත්මේ ගිණුම්කරණ පදනම භාවිතා කළ යුතුය;

පාලනය භාරව සිටින අය බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තියට අනුව, බැංකුවේ වාර්ෂික සහ වරින් වර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා, බැංකුවේ සියලුම ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් පිළිබඳ නිසි පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාමට බැංකුව බැඳී සිටී.

□□□ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකා□පතිගේ වගකී□

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හෝ දෝෂ නිසා ඇති වන ද්‍රව්‍යමය වැරදි ප්‍රකාශයන්ගෙන් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා ගැනීම සහ මගේ මතය ඇතුළත් විගණක වාර්තාවක් නිකුත් කිරීම මගේ අරමුණයි. සාධාරණ සහතිකය යනු ඉහළ මට්ටමේ සහතිකයක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලද විගණනයකදී ද්‍රව්‍යමය වැරදි ප්‍රකාශයක් පවතින විට සෑම විටම එය හඳුනා ගන්නා බවට සහතිකයක් නොවේ. වැරදි ප්‍රකාශයන් වංචාවකින් හෝ දෝෂයකින් ඇති විය හැකි අතර, ඒවා තනිව හෝ එකතුව ගත් කල, මෙම මූල්‍ය ප්‍රකාශනවල පදනම මත පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණවලට බලපෑම් කිරීමට ඉඩ ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්, ඒවා ද්‍රව්‍යමය වශයෙන් සැලකේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනයක කොටසක් ලෙස, මම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරන අතර විගණනය පුරාම වෘත්තීය සැකය පවත්වා ගනිමි. මම ද:

- වංචාව හෝ දෝෂය නිසා ඇති වූ මූල්‍ය ප්‍රකාශනවල ද්‍රව්‍යමය වැරදි ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගෙන තක්සේරු කරමි, එම අවදානම්වලට ප්‍රතිචාර දැක්වීමට විගණන ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කරමි, සහ මගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගනිමි. වංචාව හේතුවෙන් සිදුවන ද්‍රව්‍යමය වැරදි ප්‍රකාශයක් හඳුනා නොගැනීමේ අවදානම, දෝෂයකින් සිදුවන අවදානමට වඩා වැඩි ය. මන්ද යත්, වංචාවට කුමන්ත්‍රණය, ව්‍යාජ ලේඛන සැකසීම, හිතාමතාම කරුණු වසන් කිරීම, වැරදි ලෙස නිරූපණය කිරීම හෝ අභ්‍යන්තර පාලනය මඟ හැරීම ඇතුළත් විය හැකි බැවිනි.
- බැංකුවේ අභ්‍යන්තර පාලනයන්හි සඵලතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොව, තත්ත්වයන්ට ගැලපෙන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අවබෝධයක් ලබා ගනිමි.
- භාවිතා කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාකාරිත්වය විසින් සිදු කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ අදාළ හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීමට ලක් කරමි.
- කළමනාකාරිත්වය විසින් අඛණ්ඩ පැවැත්මේ ගිණුම්කරණ පදනම භාවිතා කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව නිගමනය කරමි. ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව, බැංකුවේ අඛණ්ඩ පැවැත්මට සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිදුවීම් හෝ කොන්දේසි සම්බන්ධයෙන් ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවයක් පවතීද යන්න තීරණය කරමි. ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවයක් පවතී යැයි මම නිගමනය කරන්නේ නම්, අදාළ කරුණු සම්බන්ධයෙන් මගේ විගණක වාර්තාවේ අවධානය යොමු කිරීමට මට සිදු වේ.මූල්‍ය ප්‍රකාශනවල ඇති හෙළිදරව් කිරීම් හෝ එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මගේ මතය වෙනස් කිරීමට ද මම කටයුතු කරමි. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ කොන්දේසි බැංකුවේ අඛණ්ඩ පැවැත්ම නතර වීමට හේතු විය හැක.
- හෙළිදරව් කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන මගින් යටින් පවතින ගනුදෙනු සහ සිදුවීම් සාධාරණ ඉදිරිපත් කිරීමක් ලබා ගන්නා ආකාරයකින් නිරූපණය කරන්නේ දැයි ඇගයීමට ලක් කරමි.

පාලනය භාරව සිටින අය සමඟ මම, වෙනත් කරුණු අතර, මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ ඕනෑම වැදගත් අඩුපාඩුවක් ඇතුළුව, වැදගත් විගණන සොයාගැනීම් පිළිබඳව සන්නිවේදනය කරමි.

□□ වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

□□□ □□□□ අංක □□ දරන □ාතික විගණන පනතේ□හත අවශ්‍යතා සඳහා නිශ්□ත වි□විධාන ඇතුළත් □□

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන ඇති අතර, මගේ පරීක්ෂාවෙන් පෙනී යන පරිදි, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව බැංකුව විසින් නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් ඇත.

2.1.2 ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ අවශ්‍යතාවයට අනුව පෙර වසර සමඟ අනුකූල වේ.

2.1.3 ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ අවශ්‍යතාවයට අනුව පෙර වසරේ මා විසින් ලබා දුන් සියලුම නිර්දේශ ඇතුළත් වේ.

□□□1988 අංක 30 දරන බැංකු පනතේ (2024 අංක 24 දරන බැංකු පනත මඟින් සංශෝධිත) 39 වන වගන්තියේ පහත අවශ්‍යතාවය සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ;

2.2.1 අමුණා ඇති මූල්‍ය ප්‍රකාශනවල කර ඇති හෙළිදරව් කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2024 අංක 05 දරන චක්‍රලේඛයේ අවශ්‍යතාවන්ට අනුකූල වේ.

□□□සිදු කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබා ගත් සාක්ෂි මත පදනම්ව, ද්‍රව්‍යමය වශයෙන් වැදගත් වන කරුණු පමණක් මගේ අවධානයට යොමු වී ඇත;

2.3.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලින් පිටත බැංකුව විසින් ඇතුළත් කරනු ලබන ඕනෑම කොන්ත්‍රාත්තුවක, බැංකුවේ පාලක මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් (ආශාවක්) පවතින්නේ දැයි ප්‍රකාශ කිරීම.

2.3.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (f) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, බැංකුව විසින් අදාළ වන ඕනෑම ලිඛිත නීතියකට, බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන පොදු සහ විශේෂ උපදෙස්වලට අනුකූලව කටයුතු කර නොමැති බව ප්‍රකාශ කිරීම.

2.3.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (g) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, බැංකුව එහි බලතල, කාර්යයන් සහ රාජකාරිවලට අනුකූලව කටයුතු කර නොමැති බව ප්‍රකාශ කිරීම.

2.3.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (h) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, බැංකුවේ සම්පත් නියමිත කාල රාමු තුළ සහ අදාළ නීතිවලට අනුකූලව ආර්ථිකමය වශයෙන්, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස මිලදී ගෙන භාවිතා කර නොමැති බව ප්‍රකාශ කිරීම.

□ල්□ □ස්□ අයි□ □යරත්න

විගණකාධිපති

ආදායම් ප්‍රකාශය

		බැංකුව	
□□□□ දෙසැ□බර් □□ වන □නෙන් අවසන් වූ වර්□ය සඳහා	ස□හන්	□□□□ රුපියල්	□□□□ රුපියල්
දළ ආදායම		**7,729,971,559**	8,506,638,243
පොලී ආදායම		**7,428,895,249**	8,169,744,660
පොලී වියදම්		**(4,606,086,176)**	(5,387,994,800)
ශුද්ධ පොලී ආදායම	04	**2,822,809,073**	2,781,749,859
ගාස්තු සහ කොමිස් ආදායම		**250,223,478**	330,337,224
ගාස්තු සහ කොමිස් වියදම්		**-**	-
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	05	**250,223,478**	330,337,224
වෙළඳාමෙන් ලැබුණු ශුද්ධ ලාභ/(අලාභ)	06	**-**	-
සාධාරණ අගයෙන් ලාභ හෝ අලාභ වාර්තා කෙරෙන මූල්‍ය උපකරණවලින් ලැබුණු ශුද්ධ ලාභ/(අලාභ)	07	**-**	-
මූල්‍ය වත්කම් අවලංගු කිරීමෙන් ලැබුණු ශුද්ධ ලාභ/(අලාභ)	08	**-**	-
අනෙකුත් ශුද්ධ මෙහෙයුම් ආදායම	09	**50,852,832**	6,556,360
මු□ මෙහෙයු□ ආදායම		**3,123,885,383**	3,118,643,443
අඩු කරන්න: අගය අඩු වීමේ ගාස්තු	10	**420,928,306**	278,006,812
ශුද්ධ මෙහෙයු□ ආදායම		**2,702,957,078**	2,840,636,631
ඇ□ කරන්න□ මෙහෙයු□ වියද□			
පිරිස් වියදම්	11	**1,598,732,491**	1,646,378,472
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂිත වියදම්	12. a	**166,588,587**	172,764,178
අනෙකුත් වියදම්	12. b	**608,417,406**	609,279,768
මු□ මෙහෙයු□ වියද□		**2,373,738,484**	2,428,422,418
මූල්‍ය සේවා සඳහා වැ□ සහ SSCL බදු පෙර මෙහෙයු□ ලා□ය□□අලා□ය□		**329,218,594**	412,214,213
